# පාර්ලිමේන්තු විවාද

නිල වාර්තාව

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**අට වන පාර්ලිමේන්තුව - තුන්වන සභා වාරය**

# பாராளுமன்ற விவாதங்கள்

அதிகார அறிக்கை

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்

எட்டாவது பாராளுமன்றம் - மூன்றாவது கூட்டத் தொடர்

# PARLIAMENTARY DEBATES

OFFICIAL REPORT

**THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**EIGHTH PARLIAMENT - THIRD SESSION**

**270** වන කාණ්ඩය | தொகுதி 270 | **VOLUME 270**


## පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

**2019 මාර්තු 13වන බදාදා**

2019 மார்ச் 13, புதன்கிழமை

Wednesday, 13th March, 2019

පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப.9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### අය වැය කාරක සභා විවාදයේදී මන්ත්‍රීවරුන් අසුන් ගැනීම පිළිබඳ රීති
### வரவு செலவுத் திட்டக் குழுநிலை விவாதத்தின் பொழுது உறுப்பினர்களின் இருக்கை தொடர்பான விதிகள்
### RULES REGARDING SEATING OF MEMBERS DURING COMMITTEE STAGE DEBATE OF THE BUDGET

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, 2019 වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස කාරක සභා අවස්ථා විවාදය අද දින ආරම්භ කිරීමට නියමිත බැවින් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා අවස්ථා විවාදයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් සභා ගර්භය තුළ අසුන් ගැනීම පිළිබඳ රීති සම්බන්ධයෙන් පසුගිය වසරවලදී මෙන්ම මේ වසරේදීද සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සහ අවධානය සඳහා මතු සඳහන් නිවේදනය මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

සෑම මන්ත්‍රීවරයකුටම වෙන් කරන ලද ආසනයේ සිට පමණක් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා විවාදයේදී කථා කළ යුතු බවට හත්වන පාර්ලිමේන්තුවේදී අවස්ථා දෙකකදීම මාගේ පූර්වගාමී කථානායකවරයා විසින් අසුන් ගැනීම සම්බන්ධයෙන් කරන ලද තීරණය මෙන්ම, මවිසින් 2017 නොවැම්බර් 17 වන සිකුරාදා කරන ලද තීරණයද තවදුරටත් තහවුරු කරමින් යෝග්‍ය පරිදි ඉදිරියටත් එලෙසින්ම එකී තීරණ අනුගමනය කළ යුතු බවටත් මම අවධාරණය කරමි.

තවද, පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා ක්‍රියා පිළිවෙළ සම්බන්ධ පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 93 සිට 99 දක්වා විධිවිධාන එලෙසින්ම බලපවත්වන බවද වැඩිදුරටත් සඳහන් කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2019 කෙටුම්පත් ඇස්තමේන්තුවල පාය ආදියෙහි යෝජිත වෙනස් කිරීම් ලැයිස්තුව.- [මුදල් අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු වඩිවේල් සුරේෂ් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்- பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vadivel Suresh - State Minister of Plantation Industries)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Education and Human Resources Development on,

**(i)** Orders under Sections 20 (4) (b), 24 (a), 24 (b), 24 (a) (1), 25( a) and 27(1) of the Universities Act, No. 16 of 1978;

**(ii)** Annual Report of the Gampaha Wickramarachchi Ayurveda Institute for the year 2015;

**(iii)** Annual Report of the University of Colombo for the year 2016;

**(iv)** Annual Report of the University of Sri Jayewardenepura for the year 2016;

**(v)** Annual Report and Annual Accounts of the Postgraduate Institute of English of the Open University of Sri Lanka for the year 2016;

**(vi)** Annual Report of the National Institute of Library and Information Sciences of the University of Colombo for the year 2016;

**(vii)** Annual Report of the University of Colombo Institute for Agro-Technology and Rural Sciences for the year 2016;

**(viii)** Annual Report of the Swami Vipulananda Institute of Aesthetic Studies, Eastern University for the year 2016;

**(ix)** Annual Performance Report of the Ministry of Higher Education and Highways for the year 2017;

**(x)** Annual Report and Accounts of the Rajarata University of Sri Lanka for the year 2015;

**(xi)** Annual Report of the South Eastern University of Sri Lanka for the year 2016;

**(xii)** Annual Report of the University of the Visual and Performing Arts for the year 2016;

**(xiii)** Annual Report of the University of Ruhuna for the year 2016;

**(xiv)** Annual Report of the Postgraduate Institute of Pali and Buddhist Studies of University of Kelaniya for the year 2016;

**(xv)** Annual Report of the Postgraduate Institute of Archaeology of University of Kelaniya for the year 2016;

**(xvi)** Annual Report of the Gampaha Wickramarachchi Ayurveda Institute for the year 2016;

**(xvii)** Annual Report and Accounts of the Sabaragamuwa University of Sri Lanka for the year 2016;

**(xviii)** Annual Report of the Uva Wellassa University for the year 2016;

**(xix)** Annual Report and Annual Accounts of the Institute of Human Resource Advancement of University of Colombo for the year 2016;

**(xx)** Annual Report of the University of Colombo School of Computing for the year 2016;

**(xxi)** Twelfth Annual Report of the National Centre for Advanced Studies in Humanities and Social Sciences for the year 2016;

**(xxii)** Annual Report and Statement of Accounts of the University Moratuwa for the year 2016;

**(xxiii)** Annual Report of the Postgraduate Institute of Medicine for the year 2016;

**(xxiv)** Annual Report of the Institute of Indigenous Medicine of University of Colombo for the year 2016;

**(xxv)** Annual Report of the Postgraduate Institute of Archaeology of University of Kelaniya for the year 2014;

**(xxvi)** Annual Report of the Open University of Sri Lanka for the year 2016;

**(xxvii)** Annual Report of the University of Peradeniya for the year 2016; and

**(xxviii)** Annual Report of the Postgraduate Institute of Management of University of Sri Jayawardenepura for the year 2016

which were referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු කථානායකතුමනි, මම ත්‍රිකුණාමලය, භාරතී වීදිය, අංක 17/50 දරන ස්ථානයෙහි පදිංචි රාමසාමි සදීස් කුමාරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු සිසිර කුමාර අබේසේකර මහතා**
(மாண்புமிகு சிசிர குமார அபேசேகர)
(The Hon. Sisira Kumara Abeysekara)

ගරු කථානායකතුමනි, මම බිංගිරිය, තල්ගහපිටිය, අංක 406/1 දරන ස්ථානයෙහි පදිංචි ජී.ඩබ්ලිව්. ප්‍රේමතිලක කුමාරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චන්දිම ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 - 17/'18 - (1), ගරු හේෂා විතානගේ මහතා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளு மன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
ගරු කථානායකතුමනි, විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නියඟයෙන් විනාශ වූ පොල් ගස් සංඛ්‍යාව: සංගණනය
## வரட்சியால் பாதிக்கப்பட்ட தென்னை மரங்கள்: கணக்கெடுப்பு
## COCONUT TREES DESTROYED BY DROUGHT: SURVEY

78/'18

**2. ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 සහ 2017 වර්ෂවලදී ඇති වූ නියං සහිත කාලගුණ තත්ත්වය හේතුවෙන් විනාශයට පත් වූ පොල් ගස් සංඛ්‍යාව පිළිබඳව සංගණනයක් කර තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කවරේද;

(iii) නියඟය හේතුවෙන් දැඩි හානියට ලක් වූ දිස්ත්‍රික්ක කවරේද;

(iv) එම හානිය මත පොල් නිෂ්පාදනයට සිදුව ඇති බලපෑම පැහැදිලි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) විනාශ වූ පොල් ගස් වෙනුවට අලුතින් පැළ සිටුවීමට මේ වනවිට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, බෙදා දී ඇති පොල් පැළ සංඛ්‍යාව කොපමණද;

(iii) එම පොල් පැළ සම්පූර්ණයෙන්ම නොමිලේ ලබා දී තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා රජය වැය කළ මුදල කොපමණද;

(v) නොඑසේ නම් පැළයක් සඳහා අය කළ මුදල කොපමණද;

(vi) මේ වනතෙක් පොල් පැළ ලබා දී නොමැති නම්, පොල් පැළ ලබාදෙනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 2016 மற்றும் 2017 ஆண்டில் ஏற்பட்ட வரட்சியான காலநிலை காரணமாக பாதிக்கப் பட்ட தென்னை மரங்களின் எண்ணிக்கை பற்றி கணக்கெடுப்பு மேற்கொள்ளபட்டுள்ளதா என்ப தையும்;

(ii) ஆமெனின், இவ்வெண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) வறட்சியால் வெகுவாக பாதிக்கப்பட்ட மாவட் டங்கள் யாவை என்பதையும்;

(iv) அவ்வறட்சியினால் தெங்கு உற்பத்திக்கு ஏற் பட்ட பாதிப்பினையும் தெளிவுபடுத்துவாரா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) பாதிக்கப்பட்ட தென்னை மரங்களுக்குப் பதிலாக புதிய தென்னங்கன்றுகளை நடுவதற்கு இன்று வரை நடவடிக்கை மேற்கொள்ளப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனின், பகிர்ந்தளிக்கப்பட்டுள்ள தென்னங் கன்றுகளின் எண்ணிக்கை எவ்வளவென் பதையும்;

(iii) மேற்படி கன்றுகள் முழுமையாக இலவசமாக வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) ஆமெனின், இதற்காக அரசாங்கம் செல விட்டுள்ள தொகை எவ்வளவென்பதையும் ;

(v) இன்றேல், தென்னங்கன்று ஒன்றிற்காக அறவிடப்பட்ட தொகை எவ்வளவென்பதையும்;

(vi) இற்றைவரையில் தென்னங்கன்றுகள் பெற்றுக் கொடுக்கப்படாவிடின், அவை பெற்றுக் கொடுக் கப்படும் திகதி யாதென்பதையும்;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Will he inform this House-

(i) whether a survey has been conducted on the number of coconut trees that were destroyed by the drought condition in 2016 and 2017;

(ii) if so, that number;

(iii) the districts that were severely affected by the drought; and

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(iv) whether he will explain the impact the said harm caused on the coconut production?

(b) Will he also inform this House -

(i) whether steps have been taken to plant coconut saplings in place of the destroyed coconut trees, by now;

(ii) if so, the number of coconut saplings distributed;

(iii) whether those coconut saplings have been distributed free of charge;

(iv) if so, the amount of money spent by the Government on that;

(v) if not, the amount charged on a coconut sapling; and

(vi) if coconut saplings have not yet been distributed, the date they will be distributed?

(c) If not, why?

**ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் )
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)
What happened to you yesterday, my dear Friend? I was waiting for you.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Why?

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
There was a Question of yours and you did not come.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please reply.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
Hon. Speaker, I was waiting for him; he did not turn up yesterday.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You can reply now.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
I was ready for him yesterday, but he did not come.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Now,let us get back to the Question. Time is important.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
Hon. Member, do you want me to answer the full Question.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Yes.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) නියඟයෙන් හානියට ලක් වූ පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර ඇත.

(ii) 175,000කි (එක්ලක්ෂ හැත්තෑපන්දහසකි.)

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය කාර්යාලය | හානි වූ පොල් ගස් ගණන |
|---|---|---|
| පුත්තලම | මාරවිල | 25,000 (විසිපන්දහස) |
| කුරුණෑගල | කුරුණෑගල | 100,000 (ලක්ෂය) |
| | කුලියාපිටිය | 50,000 (පනස්දහස) |
| **එකතුව** | | **175,000 (එක්ලක්ෂ හැත්තෑපන්දහස)** |

(iii) ප්‍රධාන වශයෙන් පුත්තලම හා කුරුණෑගල.

(iv) ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික පොල් නිෂ්පාදනය මිලියන 2,800ක් (දෙදහස්අටසියයක්) පමණ වන අතර, 2017 වර්ෂයේ වාර්තා වූ පොල් ප්‍රමාණය මිලියන 2,450කි. (දෙදහස්හාරසියපනහකි.) මෙය සාමාන්‍ය වාර්ෂික පොල් අස්වැන්නට වඩා සියයට 12.5ක පමණ අඩුවීමකි.

- සාමාන්‍ය පොල් අස්වැන්නට සාපේක්ෂව 2018 වර්ෂය සැලකූ විට 2018 වර්ෂයේ ලැබූ පොල් අස්වැන්න මිලියන 2,736.9 (දෙදහස් හත්සිය තිස්හයයි දශම නවය)ක් බවට ගණනය කර ඇති අතර, එය සාමාන්‍ය අස්වැන්නට වඩා සියයට 2ක පමණ අඩු වීමකි.
  - 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ අස්වනු වැඩි වීමට හේතු වූයේ 2017 වසර අගදී හා 2018 වසර තුළදී පැවති හිතකර දේශගුණික සාධක වේ. කෙසේ වුවද සාමාන්‍ය වාර්ෂික අස්වැන්නට වඩා අඩු අගයක් 2018 වසරේදී පෙන්නුම් කරයි.
  - පොල් පර්යේෂණ ආයතනය විසින් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිදු කළ අධ්‍යයනයකට අනුව නියඟයෙන් සිදු වන හානියේ තීව්‍රතාව තීරණය වනුයේ නියඟය පැවති දින ගණන හා නියඟයට පාත්‍ර වූ අක්කර ගණන අනුවයි.
  - වැඩි අක්කර ගණනක් සඳහා ඉතා අඩු නියං තත්ත්වයක් බලපෑවද එයින් මුළු අස්වැන්නට සිදු

කරන බලපෑම ඉහළ අගයක් ගන්නා බව අනාවරණය විය.

- ජල හිඟ තත්ත්ව යටතේ ගසක ආහාර නිපදවීමේ ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය සීමාකාරී වීමේ ප්‍රතිඵලයක් ලෙස පොල් ගසක වර්ධන ක්‍රියාවලිය කෙරෙහි මෙන්ම, එහි ප්‍රජනක කොටස්වල (මල් සහ ගෙඩි) වර්ධනය කෙරෙහි ද දැඩි බලපෑමක් ඇති කරයි.
- මෙහි ප්‍රතිඵලයක් ලෙස ඉතා අඩු එලදාවක් හෝ ප්‍රමාණයෙන් කුඩා ගෙඩි සහිත දුර්වල එලදාවක් ඇති විය හැක.
- ඒ අතරම වායුගෝලීය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 33ට වඩා ඉහළ අගයකට වැඩි වීම, ස්ත්‍රීරවම ගැහැනු මල් (බැට්ටා) සහ පරාග ගුණාත්මක බව කෙරෙහි මෙන්ම, පරාගන ක්‍රියාවලිය කෙරෙහිද අහිතකර බලපෑම ඇති කරයි.
- මෙහි ප්‍රතිඵලයක් ලෙස බැට්ටා වියළී යාම හෝ විශාල ලෙස බැට්ටා හැලී යාම සිදු වන අතර, එමඟින් අවසාන ජාතික පොල් අස්වැන්න කෙරෙහි දැඩි බලපෑම් ඇති කරයි.

(ආ) (i) පියවර ගෙන තිබේ.

(ii) පොල් ඉඩමේ විනාශ වන පොල් ගස් හෝ පොල් පැළවලින් ඇති වන පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පාළු පැළ සිටුවීමේ වැඩසටහනක් පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරයි. එහි ප්‍රගතිය පහතින් දක්වා ඇත.

| වර්ෂය | පාළු පැළ ලෙස සිටුවනු ලැබූ පැළ ගණන |
|---|---|
| 2016 | 240,390 (දෙලක්ෂ හතළිස්දහස් තුන්සිය අනූව) |
| 2017 | 401,921 (හාරලක්ෂ එක්දහස් නවසිය විසි එක) |
| 2018 | 198,998 (එක්ලක්ෂ අනූඅටදහස් නවසිය අනූ අට) |

ඊට අමතරව ක්‍රමවත් පොල් වගාව සහ ගෙවතු වගාව ලෙසද පහත ලෙස දිවයින පුරා පොල් පැළ සිටුවා ඇත.

| වර්ෂය | අනිකුත් සහනාධාර යටතේ සිටවූ පැළ ගණන |
|---|---|
| 2016 | 2,163,457 (විසිඑක්ලක්ෂ හැටතුන්දහස් හාරසිය පනස් හත) |
| 2017 | 2,950,775 (විසිනවලක්ෂ පනස්දහස් හත්සිය හැත්තෑ පහ) |
| 2018 | 1,714,695 (දාහත්ලක්ෂ දාහතරදහස් හයසිය අනූ පහ) |

(iii) සම්පූර්ණයෙන්ම නොමිලේ ලබා දී ඇත.

(iv)

| වර්ෂය | පාළු පොල් පැළ සහනාධාර සඳහා වැය කළ මුදල (රුපියල් මිලියන) | සෙසු පැළ සිටුවීමේ අවශ්‍යතාවය සඳහා වැය කළ මුදල (රුපියල් මිලියන) |
|---|---|---|
| 2016 | 24.24 (විසිහතරයි දශම දෙකයි හතර) | 237.83 (දෙසිය තිස් හතයි දශම අටයි තුන) |
| 2017 | 40.39 (හතළිහයි දශම තුනයි නවය) | 310.88 (තුන්සිය දහයයි දශම අටයි අට) |
| 2018 | 26.16 (විසිහයයි දශම එකයි හය) | 248.03 (දෙසිය හතළිස් අටයි දශම බින්දුවයි තුන) |

(v) මුදල් අය කරගෙන නොමැත.

(vi) මේ වනවිට සහනාධාර යටතේ අවශ්‍ය ප්‍රමාණයට පොල් පැළ ලබා දී ඇත. 2019 වසරේදී පාළු පැළ ලෙස පොල් පැළ 200,000ක් (දෙලක්ෂයක්) සිටුවනු ලබන අතර, සෙසු වැඩසටහන් යටතේ පැළ 2,800,000 (දෙලක්ෂ අසූ දහසක්) සිටුවනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, මම අතුරු ප්‍රශ්න දෙකක් අහන්න බලාපොරොත්තු වෙනවා, ඔබතුමා ප්‍රකාශ කරපු කාරණාත් එක්ක. ඇත්තවශයෙන්ම නියඟය නිසා පොල් ත්‍රිකෝණයට අයත් අපේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළත් පොල් ගස් එක්ලක්ෂ හැත්තෑපන්දහසක් විතර විනාශ වුණා. ඒ වාගේම, පොල් එලදාවේ සියයට 12.5ක අඩුවීමක් තිබෙනවා. මයිටා උවදුර නිසාත් විශාල අර්බුදයක් ඇති වුණා. ඔබතුමාත්, අපිත් මේ ගැන සාකච්ඡා කරලා තිබෙනවා. මේ නිසා විශාල අර්බුද ගණනාවක් පොල් ත්‍රිකෝණය තුළ ඇතිවෙලා තිබෙනවා. හැබැයි, මේ කාරණාත් එක්කම මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි, අපේ අකිල විරාජ් කාරියවසම් මැතිතුමාත් මෙතැන සිටින නිසා. එතුමාගේ ආසනයේ කවදාවත් ඉදි නොවන වොක්ස්වැගන් කර්මාන්ත ශාලා වැඩ පිළිවෙළ සඳහා අක්කර 44ක් යෙදවීම නිසා, පොල් ගස් 4,640ක් කැපුවා. අපේ නලින් බණ්ඩාර නියෝජ්‍ය ඇමතිතුමාගේ ආසනයේ වතුවත්තේත්, හීන්වැලියාගාරවත්තේත් අක්කර 1,200ක පොල් ගස් කපනවා, විශාල ව්‍යාපෘතියක් සඳහා. එතැන පොල් ගස් 96,000ක් තිබෙනවා. ඇත්තවශයෙන්ම පොල් ත්‍රිකෝණයට අයත් පොල් ගස් තමයි මේ කැපෙන්නේ. ඒ නිසා අද වනවිට පොල් එලදාව විශාල වශයෙන් පහළ වැටී තිබෙනවා.

ගරු ඇමතිතුමනි, අද පොල් ගෙඩියක මිල රුපියල් 32ට වැටී තිබෙනවා. පොල් වගා කරන මිනිසුන්ට මේ නිසා විශාල අර්බුද ගණනාවක් ඇති වෙලා තිබෙනවා. දැන් ඔබතුමා කිව්වා පොල් පැළ මිලියන දෙකක් විතර සිටුවනවාය කියලා. නමුත් මට තිබෙන ප්‍රශ්නය මේකයි. ඔබතුමන්ලා පැළ දුන්නාට, කිසියම් වැඩ පිළිවෙළක් තිබෙනවාද, ඒ ක්‍රියාදාමය සිද්ධ වුණා කියලා හොයන්න? ඒ වාගේම එම පොල් පැළ මිලියන දෙකම වගා වෙලා තිබෙනවාද කියාත් මා දැන ගන්න කැමැතියි. මේ විධියට කුරුණෑගල දිස්ත්‍රික්කයේ අක්කර 1,200ක, අක්කර 40ක, 50ක පොල් ගස් මේ විධියට කප-කපා අයින් කරනකොට, එය පිරිමැහෙන විධියේ මොකක් හරි වැඩ පිළිවෙළක් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවාද?

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

එතැන ගැටලු දෙකක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, එකක් කාර්මීකරණය. කර්මාන්තශාලා බිහි කරන්න විශාල වශයෙන් පොල් ගස් කපනකොට, පොල් සම්බන්ධ ඇමති හැටියට එක පැත්තකින් මට ලොකු ප්‍රශ්නයක් මතු වනවා. මොකද, මම ඉන්නේ පොල් ගහ ආරක්ෂා කරන්න. අනෙක් පැත්තෙන්, කාර්මීකරණය නිසා වෙළෙඳ කලාප පිහිටුවීමට තිබෙන අවශ්‍යතාව. වෙළෙඳ කලාප පිහිටුවීමෙන් ලැබෙන ප්‍රතිලාභ නිසා, විශේෂයෙන්ම රැකී රක්ෂා බිහි වීමෙන් ආර්ථිකයට ලැබෙන රුකුල නිසා මටත් අමාරුයි ඒවා නවත්වන්න. ඒක ජාතික ප්‍රතිපත්තියක්. අපේ පක්ෂයේ ප්‍රතිපත්තියක්. රජයේ ප්‍රතිපත්තිය තමයි, නිදහස් වෙළෙඳ කලාප ඇති කිරීම. නමුත්, පොල් පැළ විනාශ කරනවා නම් ඊට

[ගරු නවීන් දිසානායක මහතා]

සරිලන ප්‍රමාණයක් වගා කරන්න අවශ්‍යයි කියලා මම දැඩි කොන්දේසි දමා තිබෙනවා. ඒ පළමු කාරණය.

දෙවැනි කාරණය තමයි, ඉඩම් කැබලිකරණයට ලක් වීම. ගරු මන්ත්‍රීතුමනි, කුරුණෑගල ප්‍රදේශයේත් සිදු වන නිසා ඒ බව ඔබතුමාත් දන්නවා. ඉඩම් කැබලිකරණය නිසා ගස් විශාල ප්‍රමාණයක් නැති වනවා. Fragmentation Board එකේ ක්‍රියාත්මක කිරීම් සම්බන්ධව පළාත් සභාවයි, මධ්‍යම රජයයි අතර පරස්පරතාවක් තිබුණා. දැන් මම ගොඩක් දුරට ඒ කටයුතු සමාන්තරව යන්න කටයුතු කරනවා. Fragmentation Board එකට දැඩි ලෙස උපදෙස් දීලා තිබෙනවා, පොල් ගස් කපනකොට, අවශ්‍යම තැන්වලට පමණක් අවසරය ලබා දෙන්න කියලා. ඊටත් වඩා ඔබ්බට ගිහිල්ලා අපි ගත් පියවර සම්බන්ධව මම ඔබතුමාට දත්ත ඉදිරිපත් කළා. ඔබතුමාත් දන්නවා, සාමාන්‍යයෙන් අපේ පොල් නිෂ්පාදනය මිලියන 2.8 - 3 අතර තමයි දෝලනය වෙන්නේ.

එයින් අපට විශාල value addition එකකට යන්න බැහැ. ඔබතුමාත් දන්නවා, අද පොල් කියන්නේ superfood එකක් කියලා. මම හිතන හැටියට යම් කිසි දවසක -තව අවුරුදු 10කින්, 15කින්- තේ වලට වඩා අපට විදේශ විනිමයක් පොල්වලින් ගන්න පුළුවන් වෙයි. යම් ප්‍රදේශයකින් ගසක් කැපෙනවා නම්, අපි හදන්නේ කොහොම හරි ඒ වෙනුවෙන් ගසක් හදන්නයි. මම TNA මන්ත්‍රීවරුන් සමඟ මේ ගැන නිරන්තරයෙන්ම සාකච්ඡා කරනවා. අපි එතුමන්ලා එක්ක සම්බන්ධයක් ඇති කරගෙන, එතුමන්ලා කැමැත්තෙන් පොල් වගා කිරීමේ වැඩ කටයුතු උතුරු පළාතේ කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා විශාල ඉඩම් ප්‍රමාණයක් අපට දමිළ සහෝදරයන්ගෙන් ගන්න පුළුවන්. ඔවුන් ඉතා කැමැත්තෙන් ඉන්නේ පොල් ගහේ නිෂ්පාදනවලට. ඒ නිසා අක්කර 40,000ක් 50,000ක්, 100,000 පමණ උතුරු නැගෙනහිරින් අරගෙන දීර්ඝ කාලීන සැලසුමකට යන්න පුළුවන්. ඒකයි මගේ සැලසුම.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමා දීර්ඝ, හොඳ උත්තරයක් ලබා දුන්නා. ඒ ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මම ඔබතුමාගෙන් අහන්න හදපු ඉඩම් සම්බන්ධ කාරණයට තමයි ඔබතුමා පිළිතුරු දුන්නේ. තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලනය කිරීම) මණ්ඩලය ඔබතුමා යටතේ තිබෙන්නේ. කුරුණෑගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ රැස්වීම තිබුණු වෙලාවේ අතිගරු ජනාධිපතිතුමා පැමිණියාම අපි කිව්වා, "මේක නවත්වන්න. අඩුම තරමින් අක්කර දෙකකට සීමා වෙන විධියට මේ නිර්ණායක හදන්න" කියලා. ගරු ඇමතිතුමනි, දැනට මාස දෙකකට විතර කලින් සිට නාරම්මල ඉඳලා කුරුණෑගලට යන පාරේ අක්කර 40ක් පමණ කිසිම වැඩ පිළිවෙළක් නැතිව එක දිගට ඉඩම් කට්ටි කරනවා. මම දන්නේ නැහැ, කවුරු මේකට අනුමැතිය දීලා ද කියලා. මේකත් ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. ඔබතුමාට මම පෞද්ගලිකවම කියන්නේ කරුණාකරලා මේ පිළිබඳ හොයා බලන්න කියලායි.

ඒ වාගේම, palm oil ගෙන්වීම නිසාත් විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා පොල් නිෂ්පාදන කරන අයට, තෙල් නිෂ්පාදනය කරන අයට, DC මෝල්වලට මේක විශාල අර්බුදයක් වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඒ නිසා ඔවුන්ගේ ඉල්ලීම වන්නේ palm oil ගෙන්වීම සම්පූර්ණයෙන්ම නතර කරවන වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න කියලායි.

ඒ වාගේම තව කාරණයක් තිබෙනවා. පොල් නිෂ්පාදන, ඒ ආශ්‍රිත අතුරු නිෂ්පාදන export කරන අය, විශේෂයෙන්ම ගඩොල් නිෂ්පාදනය කරලා පිට රට යවන අයගෙත් විශාල අඩුවක් තිබෙනවා. ඒවා නිෂ්පාදනයෙන් ලැබෙන මුදලෙත් විශාල අඩුවක් තිබෙනවා. වෙනදා රුපියල් 80ක් ලැබුණු එක අද ලැබෙන්නේ රුපියල් 27යි. මේකත් විශාල අර්බුදයක්. කුරුණෑගල දිස්ත්‍රික්කයේ මේ පොල් නිෂ්පාදන අපනයනය කිරීම තුළින් විශාල විදේශ විනිමයක් ලබා ගන්න පුළුවන්. අපේ ගරු අග්‍රාමාත්‍යතුමා පසුගිය දිනක ඔවුන් හමු වෙලා කියලා තිබුණා, මේ exportsවලින් ගන්න ආදායම ඩොලර් බිලියන දෙක, තුනකින් තව වැඩි කර ගන්න කියලා කියලා. නමුත්, ඔවුන් කියන්නේ, "අපි එහෙම කරන්නේ කොහොමද? මේ අය වැයෙන්වත් අපේ exportsවලට කිසිම සහයෝගයක්, සහනයක් දීලා නැහැ" කියලයි. ඒ නිසා ඔබතුමා අගමැතිතුමා එක්කත් සාකච්ඡා කරලා මේ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රමවේදයක් හැදුවොත්, විශේෂයෙන් කුරුණෑගල ඇතුළු පොල් ත්‍රිකෝණයේ අපේ නිෂ්පාදකයන්ගේ තත්ත්වය දියුණු වේවි කියලා මා විශ්වාස කරනවා.

**ගරු නවීන් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, අර අක්කර 40 ගැන ඔබතුමා මට විස්තර දෙන්න. මම ඒ ගැන වාර්තාවක් ඔබතුමාට දෙන්නම්. විශේෂයෙන්ම වැවිලි කර්මාන්තය සම්බන්ධයෙන් බොහෝ අවස්ථාවල ජනාධිපතිතුමා යම්කිසි ප්‍රකාශ කර තිබෙනවා. දැන් ඔබතුමාත් ජනාධිපතිතුමා ගැන ප්‍රකාශ කළා. මම එක උදාහරණයක් දෙන්නම්. මේක වැරදියට තේරුම් ගන්න එපා. වැවිලි ක්ෂේත්‍රයේ යම්කිසි ස්ථිරසාර ප්‍රතිපත්තියක් තිබෙන්නට ඕනෑ. කෘෂිකර්මයටත් එහෙමයි. දැන් දිගටම පැවැති ක්‍රමයක් තමයි වල් නාශක යෙදීම. වල් නාශක අනිවාර්යයෙන්ම රටට අවශ්‍යයි. එතකොට හදිසියේම පැය 24න්, දවස් 7න් වල්නාශක නවත්වන්න කටයුතු කරන කොට, ඒකට විරුද්ධව සටන් කළ එකම පුද්ගලයා මමයි. ඔබතුමාත් ඒ ගැන කථා කළේ නැහැ. ග්ලයිපොසේට් ගෙන ඒම තහනම් කළාම විශාල වශයෙන් හානි වුණේ තේ නිෂ්පාදකයාටයි. ඒ ගැන මම සටන් කරලා දැන් තේවලටයි, රබර්වලටයි පමණක් සීමිත ප්‍රමාණයක් වල්නාශක ගෙන්වනවා. හදිසියේම මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ පාම් වගාව සම්බන්ධව හෙක්ටෙයාර් 20,000කට පමණක් අවසරය ලබා දුන්නා. ඊයේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා මේ ගැන ප්‍රශ්නයක් මතු කරන්න සිටියා. නමුත්, එතුමා ආවේ නැහැ. 27(2) යටතේ palm oil සම්බන්ධ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න මම ලැහැස්ති වෙලායි ආවේ.

මහින්ද රාජපක්ෂ මහත්මයා ඒ කාලයේ හෙක්ටෙයාර් 20,000ක පාම් වගාව සඳහා පමණක් අවසර ලබා දුන්නා. ඒ කැබිනට්ටුවේත් ජනාධිපතිතුමා හිටියා. හදිසියේ පැය 24න්, දවස් හතෙන් පරිසරය සම්බන්ධව ප්‍රශ්න නිසා මේ ප්‍රතිපත්තිය, මේ තීරණය වෙනස් කරනවා. එයින් හානි වෙන්නේ කාටද? දීර්ඝ කාලීන සැලසුම් හදනවා. විශේෂයෙන්ම තේ මිල අඩු වුණාම ඒකට සරිලන ආකාරයේ ආදායමක් ලැබෙන විධියට ඒ සමාගම් කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතිව, සමාගම් කඩා වැටුණොත් මුළු ආර්ථික chain එකම කඩා වැටෙනවා. හෙක්ටෙයාර් 20,000ක් කියන්නේ විශාල ප්‍රමාණයක් නොවෙයි. මම වගකීම භාරගන්නවා, විශේෂයෙන්ම පාම් වගාව සම්බන්ධයෙන් රෙගුලාසි ඉදිරිපත් කර, කිසිම පරිසර හානියක් නොවන විධියට ක්‍රියා කරන්න. මේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙනුත් දැන් අවුරුදු දෙකක් තිස්සේ අපි කථා කරනවා. නමුත්, ඒ වෙනුවෙන් කිසිම තීරණයක් ගන්නේ නැහැ.

විශේෂයෙන්ම ගැලරි එකට කථා කරලා ප්‍රතිපත්ති හදන්න බැහැ. අපේ රටට හිතකර; අපේ රටට අනුකූල, ජාතික ප්‍රතිපත්ති විශේෂයෙන්ම අපේ පක්ෂ දෙකෙන්ම අපි සැදිය යුතුයි.

අනුර කුමාර දිසානායක මැතිතුමනි, ඔබතුමාත් කෘෂිකර්ම ඇමතිවරයා හැටියට කටයුතු කර තිබෙනවා. මම "ගූගල්" එකේ search කරලා බැලුවා. කෘෂිකර්ම ඇමතිවරයා හැටියට කටයුතු කළ අවුරුදු එකහමාරක කාලය තුළ ඔබතුමා palm oilවලට විරුද්ධව වචනයක්වත් කියලා නැහැ. ඒ නිසා මම කියන්නේ, දේශපාලන ගැලරි එක බලලා මේ ප්‍රතිපත්ති හදන්න බැහැ කියලායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද අය වැය විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳව විවාදයට ගැනීමට නියමිතව තිබෙනවා. ඒ නිසා, -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් මේ ප්‍රශ්නය ගැන විවාදයකට යන්නේ නැතිව, පැහැදිලි කිරීම කරලා අවසන් කරමු.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මිනිස්සු යම් කිසි දෙයක් ඉල්ලන කොට අපි ඔළුව නවාගෙන - [බාධා කිරීමක්] ඒ අය හිතනවා, එක හරි කියලා. ඒක නොවෙයි විය යුත්තේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්න දෙක අවසන්. එතුමා පැහැදිලි කිරීමක් කරයි. මේ ගැන විවාදයකට යන්න බැහැ. [බාධා කිරීමක්] ඊට පසුව අනුර කුමාර දිසානායක මැතිතුමා, - ඔබතුමාට කථා කරන්න අවශ්‍ය නැහැ නේ? අපි ප්‍රධාන කටයුතුවලට යමු. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තර දුන්නා නේ. Palm oil පිළිබඳ විවාදයක් වෙනම කරමු ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. කරුණාකරලා සහාය දෙන්න. අද ඉතාමත් වැදගත් විවාදයක් තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් විතරයි අවශ්‍ය වන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Palm oil සම්බන්ධයෙන් දැන් පැහැදිලි කළා නේ. ගරු ඇමතිතුමනි, මෙතුමාට මිනිත්තු දෙකක පැහැදිලි කිරීමක් ලබා දෙන්න ඔබතුමා කැමතිද?

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
කමක් නැහැ, මෙතුමාට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හැබැයි, දේශනයක් කරන්න අමාරුයි. පැහැදිලි කිරීමක් සඳහා අවස්ථාව දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මමත් එදා එම කැබිනට් මණ්ඩලයේ ඉන්න කොට ග්ලයිපොසේට් පිළිබඳව කථා කළා. ගරු ඇමතිතුමා ඒ ගැන බොහොම සටන් කළා. මම ඒ ගැන දන්නවා. හැබැයි, මතක තියාගන්න ඕනෑ කාරණය තමයි, ඔබතුමාගේ fund එකේ තිබුණු බිලියන ගණනක මුදලින් අඩුම ගණනේ තේවලට අවශ්‍ය building එකක් හදාගන්න මිලියන 400ක් ඉල්ලුවාම ඒකට ඉඩ දුන්නේත් නැහැ. ඉතින් එහෙම කැබිනට් මණ්ඩලයක් නේ. ඔබතුමාට සලකපු හැටි මට මතකයි. මම ඒ අවස්ථාවේ support කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ, මේකට අදාළ පැහැදිලි කිරීම කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ලංකාවේ palm oil පිළිබඳව ඇති වෙලා තිබෙන ප්‍රශ්නය ගැන කථා කරනවා නම්, මැලේසියාවේ, ඉන්දුනීසියාවේ palm oil සෑදීම සම්බන්ධයෙන් ඇතිවෙලා තිබෙන අර්බුදය අපි හොඳට දැකලා තිබෙනවා. එම නිසා තමයි අපි කිව්වේ, ලංකාවේ පාම් පැළ සෑදීම පිළිබඳව රට ඇතුළේ විශාල විරෝධයක් තිබෙනවා කියලා. ඒ සම්බන්ධයෙන් ඔබතුමා ඊළඟ තීන්දුව ගන්න. අපට ප්‍රශ්නයක් නැහැ. නමුත්, ඒ පිළිබඳව අපේ විශාල විරෝධයක් තිබෙනවාය කියන කාරණයයි මම මතු කළේ. එම නිසා palm oil ගෙන්වීමත් නතර කරන්න කියන එක තමයි අපේ අදහස.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

සමහර පාරිසරික සංවිධානවලින් තමයි අන්තිමට විරෝධය එන්නේ. ඒ ගොල්ලන් පිටුපස කවුද ඉන්නේ? ඒ පිළිබඳවත් අපි සෙවිය යුතුයි. මැලේසියාවේ, ඉන්දුනීසියාවේ තත්ත්වය ගැන ඔබතුමා කියනවා. ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස්. 1960 ගණන්වල, 1970 ගණන්වල සුහර්තෝ විශාල වශයෙන් ඒ රටවල්වල වනාන්තර විනාශ කරලා තමයි බලහත්කාරයෙන් පාම් වගාව කළේ. අපි එහෙම කරන්නේ නැහැ. පරිසරය ආරක්ෂා කරගෙන හෙක්ටෙයාර් 20,000ක් වගා කිරීම ගැනයි අපි කථා කරන්නේ. හෙක්ටෙයාර් 20,000ක් පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න බැරි රටක් මේක. එපමණයි මට කියන්න තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -129/'18- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -198/'18- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -257/'18- (1), ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## මිරිදිය ධීවරයන් සඳහා නිවාස ව්‍යාපෘතිය : අනුරාධපුර දිස්ත්‍රික්කය
### நன்னீர் மீன்பிடியாளர்களுக்கான வீட்டுத் திட்டம்: அனுராதபுரம் மாவட்டம்
### HOUSING PROJECT FOR FISHERMEN ENGAGED IN FRESH WATER FISHING : ANURADHAPURA DISTRICT

332/'18

**6.** **ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් ආශ්‍රිතව මිරිදිය කර්මාන්තයේ යෙදෙන ධීවරයන් විශාල පිරිසකට තවමත් ස්ථිර නිවාස නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) ඒ සඳහා නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அனுராதபுரம் மாவட்டத்தில் வாவிகளைத் தழுவியதாக நன்னீர் மீன்பிடித் தொழிலில் ஈடுபடுகின்ற பெரும் தொகையான மீனவர் களுக்கு இற்றைவரை நிரந்தர வீடுகள் இல்லை யென்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி வீடுகள் தொடர்பான பிரச்சினையைத் தீர்ப்பதற்கு மேற்கொண்டுள்ள நடவடிக்கை யாதென்பதையும்;

(iii) இதற்கான வீடமைப்புக் கருத்திட்டமொன்றை நடைமுறைப்படுத்த எதிர்பார்க்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) whether he is aware of the fact that a large number of fishermen engaged in fresh water fishing in the tanks of Anuradhapura District do not have permanent housing still;

(ii) if so, the steps taken to address that housing problem; and

(iii) the date by which housing project in this regard is expected to be implemented?

(b) If not, why?

**ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත්

සංවර්ධන අමාත්‍යාංශයේ ධීවර අංශය මඟින් "දියවර පියස" නිවාස වැඩසටහන ආරම්භ කර ඇත. මේ යටතේ ධීවරයන් සඳහා නව නිවසක් සාදා ගැනීමට රුපියල් ලක්ෂ තුනක මුදලක්ද (රු.300,000.00), පවතින නිවසක් අලුත්වැඩියා කරගැනීමට රුපියල් 100,000.00ක මුදලක්ද, වැසිකිළියක් සකසා ගැනීමට රුපියල් 30,000.00ක මුදලක්ද ආධාර වශයෙන් ලබා දෙනු ලැබේ. මෙම වැඩසටහන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

(iii) "දියවර පියස" නිවාස වැඩසටහන 2017 වර්ෂයේ ආරම්භ කර, 2018 වර්ෂයේදී ද පහත පරිදි ක්‍රියාත්මක කර ඇත. 2019 වසර සඳහා ද 2019.03.05 දින ඉදිරිපත් කරන ලද අය වැය යෝජනාව මඟින් රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට යෝජනා කර ඇත.

| | 2017 | 2018 |
|---|---|---|
| නව නිවාස | 71 | ක්‍රියාත්මක කර නැත |
| නිවාස අලුත්වැඩියා | 1,160 | 535 |
| වැසිකිළි | 896 | 115 |

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න තිබෙනවාද?

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
තිබෙනවා, ගරු කථානායකතුමනි.

සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මේ අය වෙනුවෙන් නිවාස හදා තිබෙනවාය, ඔවුන්ට සනීපාරක්ෂක පහසුකම් ලබා දී තිබෙනවාය කියා ගරු ඇමතිතුමා කිව්වා. හැබැයි, මම පාර්ලිමේන්තුවට පැමිණි දවසේ ඉඳලාම මේ සම්බන්ධයෙන් ඉල්ලීම් කළා. නමුත් අද වෙනතුරු ඒවා ඉෂ්ට වෙලා නැහැ.

ගරු ඇමතිතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් විශාල සංඛ්‍යාවක් තිබෙන බව ඔබතුමාත් දන්නවා නේ. ඒ වැව් ආශ්‍රිත ගෙවල්වල අඩු පාඩු රැසක් තිබෙනවා; සනීපාරක්ෂක පහසුකම්වල අඩු පාඩු තිබෙනවා. ඔබතුමා පිළිතුරේදී කියූ දේවල් පිට කොහේ හෝ හදා තිබෙනවාද දන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මම දන්නා විධියට නම් මේ පහසුකම් ඉල්ලන තැන්වලට ලබා දීලා නැහැ. ඒ නිසා ඒකට ඔබතුමා විශේෂ උදව්වක් කරන්න.

මේ වැව්වල මාළු පැටව් හිඟයක් තිබෙනවාය කියා මහජන දිනයට මාව හමුවන්න එන මිනිස්සු හැම දාම කියනවා,. ඒ සම්බන්ධවත් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න කියා මම ඉල්ලීමක් කරනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජලාශ 25කට මාළු පැටව් දැමීමේ වැඩසටහනක් ලබන සෙනසුරාදා අපි ක්‍රියාත්මක කරනවා. ඔබතුමාටත් ඒකට ආරාධනා කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම, ඔබතුමා ජීවත් වෙන ප්‍රදේශයේ ධීවර නිවාස ගම්මානයකුත් අපි ඉදිකර තිබෙනවා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු ඇමතිතුමනි, අපේ රටේ තිබෙන වැව් අයිති වන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශයටයි. ඊළඟට, වගා ළිං අයිති වන්නේත් ඒ අමාත්‍යාංශයටයි. මේ වගා ළිං පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. මම මේ පාර්ලිමේන්තුවට පැමිණි දවසේ සිටම මේ සම්බන්ධයෙන් ලියුම් දීලා, දීලා දැන් මට එපා වෙලායි තිබෙන්නේ.

ඒ ගොවි මහත්වරුන්ට අවශ්‍ය වැව් ටිකයි, වගා ළිං ටිකයි හදා දෙන්න. මීට කලිනුත් මම ප්‍රශ්නයක් ඇහුවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා එදා මේ ගරු සභාවේ හිටියේ නැහැ, උත්තර දෙන්න. අපේ ගයන්ත කරුණාතිලක ඇමතිතුමායි එදා ඒ ප්‍රශ්නයට උත්තර දුන්නේ. අපේ ප්‍රදේශයට ළිං 1,000ක් දුන්නාය කිව්වා; එයින් 296ක් හැදුවාය කිව්වා. ඉතිරි ළිංවල මුදල් කොහාටද ගියේ, ඒ ළිං හැදුවේ කොහේද කියා මා ඇහුවා. ඒ වාගේම වැව් ගැනත් ඇහුවා. එතුමා තමයි උත්තර දුන්නේ. ඒකට ඔබතුමාගේ උත්තරය මොකක්ද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, එතුමා මේ ගැන ලැයිස්තුවක් දීලා තිබෙනවා. මේ වනවිටත් ඒ ලැයිස්තුව ඇස්තමේන්තු කරලා තිබෙන්නේ. අප්‍රේල් මාසය වන විට අපි වැව් හැදීමේ වැඩ පිළිවෙළ පටන් ගන්නවා. ඔබතුමා ළිං වගයක විස්තරයකුත් දීලා තිබෙනවා. මම ඒ ටිකත් ලැහැස්ති කරලා දෙන්නම්.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
බොහොම ස්තුතියි, ඇමතිතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -461/19- (1) , ගරු අශෝක ප්‍රියන්ත මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

## ආරක්ෂණ ආයෝජන ගිණුම් ක්‍රමය: අහෝසි කිරීම
பாதுகாப்பு முதலீட்டுக் கணக்கு முறை: இரத்துச் செய்தல்
SECURITIES INVESTMENT ACCOUNT SYSTEM: ABOLITION

585/'19

**8.** **ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 208ට අනුව, ආරක්ෂණ ආයෝජන ගිණුම් ක්‍රමය අහෝසි කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

(iii) උක්ත යෝජනාවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරව ස්වකීය මුදල් තබාගෙන සිටින ශ්‍රී ලාංකිකයන්ට එම මුදල් මව් බිමට රැගෙන එන ලෙසට කරන ලද ඉල්ලීමට මෙතෙක් ලැබී ඇති ප්‍රතිචාර කවරේද;

(iv) උක්ත අයවැය යෝජනාවට අනුව, බැංකු ගිණුම් ක්‍රමය හරහා පිටරට තබාගෙන තිබෙන මුදල් මෙරටට ප්‍රේෂණය කරන කිසිම පුද්ගලයෙකුට එරෙහිව රජය විසින් නෛතික පියවර නොගන්නා බව නිශ්චිතව සඳහන් කිරීමට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා නෛතික බලය ලබාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 2016 ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தின் 208 ஆம் இலக்க முன்மொழிவின்படி, பாதுகாப்பு முதலீட்டுக் கணக்கு முறை இரத்துச் செய்யப்பட்டதா;

(ii) ஆமெனில், அத் திகதி யாது;

(iii) மேற்படி முன்மொழிவின் மூலம் இலங்கைக்கு வெளியே தமது நிதியை வைத்திருக்கும் இலங்கையர்களுக்கு அந்நிதியை தாய் நாட்டுக்கு எடுத்துவரும்படி செய்யப்பட்ட வேண்டு கோளுக்கு இதுவரை கிடைத்துள்ள பிரதிபலிப் புகள் யாவை;

(iv) மேற்படி வரவு செலவுத்திட்ட முன்மொழிவின் படி, வங்கிக் கணக்கு முறையினூடாக வெளி நாட்டில் வைத்திருக்கும் பணத்தை இந்நாட்டிற்கு அனுப்பும் எந்தவொரு ஆளுக்கும் எதிராக அரசாங்கத்தினால் சட்ட நடவடிக்கை மேற் கொள்ளப்படுவதில்லை என திட்டவட்டமாகக் குறிப்பிடுவதற்கு நிதி அமைச்சர் சட்ட ரீதியான அதிகாரத்தைப் பெற்றுக்கொண்ட முறை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House-

(i) whether the Securities Investment Account System was abolished in accordance with the Budget proposal No. 208 of 2016;

(ii) if so, the date on which it was done;

(iii) the responses received so far to the request made to Sri Lankans who keep their money overseas to bring them back to Sri Lanka by the above proposal; and

(iv) the manner through which the Minister of Finance obtained the legal power to precisely mention that legal measures will not be taken by the Government against any person who remits the money kept overseas through the bank account system to Sri Lanka, in accordance with the above Budget Proposal?

(b) If not, why?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) නැත.

(ii) ඉහත (i) අනුව අදාළ නොවේ.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මේක පුදුම වැඩක් නේ. 2016 අය වැය යෝජනාවල, අංක 208හි සඳහන් වන කාරණය පිළිබඳව තමයි මම මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ. අය වැය යෝජනා වශයෙන් මේ ගරු සභාවට ඉදිරිපත් කර, ඒ අනුව අය වැය විවාදය පවත්වා, මේ රටට වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා, එය ක්‍රියාත්මක වීම පිළිබඳව හෝ නොවීම පිළිබඳව ප්‍රශ්නයක් ඇහුවාම, "අදාළ නොවේ", "අදාළ නොවේ", පැන නොනඟී" කියා කියනවා. ඒක හරි අසාධාරණයි නේ. අඩු ගණනේ ඔබතුමාට ඒ ගැන පැහැදිලි කිරීමක්වත් කරන්න තිබුණා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

මා ඒ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ, 2016 අයවැය යෝජනා අංක 208ට අනුව, ආරක්ෂණ ආයෝජන ගිණුම් ක්‍රමය අහෝසි කිරීම පිළිබඳවයි. ඒ ප්‍රශ්නයෙන් තවදුරටත් මෙසේ අසා තිබෙනවා:

> "(iii) උක්ත යෝජනාවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරව ස්වකීය මුදල් තබාගෙන සිටින ශ්‍රී ලාංකිකයන්ට එම මුදල් මව්බිමට රැගෙන එන ලෙසට කරන ලද ඉල්ලීමට මෙතෙක් ලැබී ඇති ප්‍රතිචාර කවරේද;
>
> (iv) උක්ත අයවැය යෝජනාවට අනුව, බැංකු ගිණුම් ක්‍රමය හරහා පිටරට තබාගෙන තිබෙන මුදල් මෙරටට ප්‍රේෂණය කරන කිසිම පුද්ගලයෙකුට එරෙහිව රජය විසින් නෛතික පියවර නොගන්නා බව නිශ්චිතව සඳහන් කිරීමට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා නෛතික බලය ලබාගත් ආකාරය කවරේද;"

ගරු කථානායකතුමනි, මා ඉතා වැදගත් අය වැය යෝජනාවක් ගැනයි අහන්නේ. මොකද, මුදලේ අගය ආරක්ෂා කරන්න විදේශවල තිබෙන මුදල් අපේ රටට ගෙන්වා ගැනීම තමයි අද දවසේ තිබෙන අත්‍යවශ්‍ය ජාතික වැදගත්කමකින් යුතු කාර්ය භාරය වන්නේ. ඒ සඳහා යෝජනාවක් ඉදිරිපත් කරනවා, මේ මුදල් ගෙනෙන්නය කියා. ඒ යෝජනාව 2016 අවුරුද්දේදීයි ඉදිරිපත් කරන්නේ. දැන් අපි ඉන්නේ 2019 අවුරුද්දේයි. අඩු ගණනේ යෝජනාවට මොකද වුණේ කියාවත් මුදල් අමාත්‍යාංශය කියන්න ඕනෑ නේ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ මෙය පුදුම ප්‍රශ්නයක්. ඔබතුමා කියන්නේ මෙය ක්‍රියාත්මක නොවුණාය කියායි. මා කියන්න කැමැතියි, 2018 අය වැය ලේඛනයේ සඳහන් යෝජනා නම් දැන් සියයට 92ක්ම එක්කෝ ක්‍රියාත්මකවෙලා තිබෙනවා,

එහෙම නැත්නම් ක්‍රියාත්මක වෙමින් පවතිනවාය කියා. සියයට 8ක් විතරයි ක්‍රියාත්මකවෙලා නැත්තේ. නමුත් මෙය 2016 අය වැය යෝජනාවක්. මෙය ක්‍රියාත්මක වුණේ නැහැ. නමුත් මෙයට විකල්පයක් තිබුණා. ඒ විකල්පය තමයි, 2017දී Foreign Exchange Act එක ඉදිරිපත් කළ එක. ඒ Foreign Exchange Act එක වාගේම ගැසට් පත්‍රයකුත් නිකුත් කළා. ඒකෙන් Inward Investment Account කියා අලුත් යෝජනා කිහිපයක් ඉදිරිපත් වුණා, මේ කටයුතු පහසු කරන්න. ඒ කියන්නේ, ආයෝජකයන්ට මුදල් ගෙනෙන්න. 2016 අය වැය ලේඛනයේ 208 වන යෝජනාව එසේ ක්‍රියාත්මක නොවුණත්, ඒ විකල්පය අලුත් සංශෝධනයක් හරහා ක්‍රියාත්මකවෙලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. විනිමය පාලන පනත සංශෝධනය කරන අවස්ථාවේදී එයින් බලාපොරොත්තු වුණේ, විනිමය පාලනය - exchange control - කියන එක පාවිච්චි කරන්නේ නැතුව ගෙවුම් ශේෂය ප්‍රාග්ධන ගිණුමත් සමඟ liberalize කරන එකයි. ඒ තුළ මේ රටේ විදේශ විනිමය පාලනය පිළිබඳව පැවති නීති රෙගුලාසි ලිහිල්කරණය කිරීම තුළින් "විනිමය පාලන දෙපාර්තමේන්තුව" කියන එකේ "පාලන" කියන වචනය අත් හැරලා, "විනිමය දෙපාර්තමේන්තුව" කියා වෙනම දෙපාර්තමේන්තුවක් ශ්‍රී ලංකා මහ බැංකුවට දුන්නා. ඒ විනිමය පාලන පනත සංශෝධනය කිරීම තුළින් අද දවසේ රජයේ සුරැකුම් පත් හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබෙන මුදල් ගෙන යනවා, කොටස් වෙළෙඳ පොළේ මුදල් ගෙන යනවා. ඒ ගෙන යන මුදල් ටිකවත් පාලනය කරගන්න බැරි තත්ත්වයක් තමයි ඒකෙන් ඇති වුණේ.

තමුන්නාන්සේලා පොරොන්දු වුණේ මේ රට ඇතුළට එන මුදල් ප්‍රමාණය ආරක්ෂා කිරීම සඳහා විශේෂ ගිණුම් ක්‍රමයක් ආරම්භ කරනවා කියලා. ඒකට උත්තරය විදේශ විනිමය පාලන පනත සංශෝධනය කිරීම නොවෙයි. විදේශ විනිමය පාලන පනත සංශෝධනය කිරීමෙන් මේ ප්‍රශ්නය තව උග්‍රවෙලා තිබෙනවා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු මන්ත්‍රීතුමනි, රට ඇතුළට එන මුදල් ආරක්ෂා වෙනවා. මම කිව්වා වාගේ ගෙනාපු අලුත් පනතේ Inward Investment Account කියලා එකක් තිබෙනවා. ඒකෙන් මුදල් දාලා අපි ඒ මුදල් පාලනය කරනවා. ඒකෙන් මුදල් කොටස් වෙළෙඳ පොළට දාන්නට පුළුවන්; ඍජු ආයෝජනවලට දාන්නට පුළුවන්; ඕනෑම එකකට දාන්නට පුළුවන්; අවශ්‍ය වෙලාවට ගෙනියන්නත් පුළුවන්. ඒ අනුව අපි ලිහිල් කරලා තිබෙන්නේ. නමුත් මුදල් විශුද්ධිකරණය කරන්නට බැහැ. ඒ කියන්නේ හොර, බොරු, වංචාවෙන් මුදල් රට තුළට ගේන්නට බැහැ. විදේශ විනිමය පාලනය වෙලා තිබෙන්නේ, 2018 අප්‍රේල් මාසයේ තමයි මේ රටේ වැඩිම විදේශ සංචිත ශේෂය තිබුණේ. ඒ මුදල ඇමෙරිකානු ඩොලර් බිලියන 9.9යි. 2018 ඔක්තෝබර් 26වෙනි දා වුණු කුමන්ත්‍රණයෙන් පසු ඒක ඇමෙරිකානු ඩොලර් බිලියන 6.9ට බැස්සා. ඒක තමයි ඇත්තටම ඇති වුණු ප්‍රශ්නය. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ඒක තමයි, ඊයේ හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමා කිව්වේ ශ්‍රී ලංකා මහ බැංකුව ආණ්ඩුවයි, කැබිනට් මණ්ඩලයයි නොමඟ යවලා කියලා. කැබිනට් ඇමතිවරයෙක් කියන්නේ. තව මොනවාද කථා කරන්නේ?

**කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, පිළිතුර දීලා අවසානයි. බොහොම ස්තූතියි.

දෙවන වටය.

## ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල: නඩත්තු වියදම්
## வெளிநாட்டுத் தூதுவராலய அலுவலகங்கள்: பராமரிப்புச் செலவு
## SRI LANKAN FOREIGN MISSIONS: MAINTENANCE COST

198/'18

**4. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා වෙනුවට)**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. (Dr.) Nalinda Jayathissa)

විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) විදේශයන්හි පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලය නඩත්තු කිරීම සඳහා 2017 වර්ෂයේදී වියදම් කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්ෂ 2013 සිට 2017 දක්වා විදේශ දූත මණ්ඩල කාර්යාල නඩත්තු කිරීම වෙනුවෙන් වියදම් කළ මුළු මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வெளிநாடுகளில் இயங்கி வருகின்ற வெளி நாட்டுத் தூதுவராலய அலுவலகங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு அலுவலகத்தையும் பராமரிக்க 2017 ஆம் ஆண்டில் செலவிடப் பட்டுள்ள தொகை தனித்தனியாக எவ்வள வென்பதையும்;

(iii) 2013 முதல் 2017 வரை வெளிநாட்டுத் தூதுவராலய அலுவலகங்களைப் பராமரிக்க செலவிடப்பட்டுள்ள மொத்தத் தொகை எவ்வள வென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House -

(i) the number of Sri Lankan Foreign Missions functioning overseas;

(ii) separately the amount of money that has been spent on the maintenance of each of the aforesaid Missions in the year 2017; and

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

(iii) the amount of money that has been spent for the maintenance of the Foreign Missions from the year 2013 to 2017?

(b) If not, why?

**ගරු තිලක් මාරපන මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலக் மாரபன - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Tilak Marapana -Minister of Foreign Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම සභාගත* කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
**සභාපீடத்தில் வைக்கப்பட்ட விடை :**
**Answer tabled:*

(අ) (i) විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල සංඛ්‍යාව 67කි.

(ii) ඇමුණුම 01* ලෙස ඉදිරිපත් කරමි.

(iii) ශ්‍රී.ලං. රුපියල් 38,678,103,000.00 (විස්තර ඇමුණුම් අංක 02* ලෙස ඉදිරිපත් කර ඇත.)

(ආ) පැන නොනඟී.

## 2015-2017 ප්‍රතිසංස්කරණය කළ වාරිමාර්ග: මඩකළපුව දිස්ත්‍රික්කය
## 2015 - 2017 வரை புனரமைக்கப்பட்ட நீர்ப்பாசனத் திட்டங்கள்: மட்டக்களப்பு மாவட்டம்
## IRRIGATION SCHEMES RENOVATED FROM 2015-2017: BATTICALOA DISTRICT

257/'18

5. **ගරු මහින්ද අමරවීර මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Mahinda Amaraweera on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී මඩකළපුව දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 2015, 2016 மற்றும் 2017 ஆம் ஆண்டுகளில் மட்டக்களப்பு மாவட்டத்தில் புனரமைக்கப்பட்ட சிறிய, மத்திய மற்றும் பாரிய அளவிலான நீர்ப்பாசனத் திட்டங்கள் யாவையென்பதையும்;

(ii) ஒவ்வொரு புனரமைப்புப் பணிக்காகவும் மதிப்பிடப்பட்ட பணத்தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iii) மேற்படி புனரமைப்புப் பணிகளுக்காக கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா என்பதையும்;

(iv) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களைப் பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டிய லொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

(v) மேற்படி ஒவ்வொரு வருடத்துக்கும் ஏற்புடைய தான புனரமைப்புப் பணிகளின் பௌதீக மற்றும் நிதிசார் முன்னேற்றம் தனித்தனியாக யாதென் பதையும்;

(vi) மேற்படி புனரமைப்புப் பணிகளுக்கான சாத்தியக்கூறு ஆய்வு, சுற்றாடல் மற்றும் பொறியியல் அறிக்கைகளை சமர்ப்பிப்பாரா என்பதையும்;

(vii) மேற்படி புனரமைப்புப் பணிகளின் போது அகற்றப்பட்ட வண்டல் படிவு, மண் அல்லது மணலுக்காக கேள்விப் பத்திரங்கள் கோரப் பட்டனவா என்பதையும்;

(viii) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களை பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டிய லொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) the minor, medium and major irrigation schemes renovated in Batticaloa District in the years 2015, 2016 and 2017;

(ii) the estimated amount for each renovation work, separately;

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

(iii) whether tenders were called for the said rehabilitation work;

(iv) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted;

(v) the physical and financial progress of the rehabilitation work of that contract with relevance to each of the aforesaid years;

(vi) whether the feasibility study, environmental and engineering reports relevant to that renovation work will be submitted;

(vii) whether tenders were called for the silt, soil or sand removed in renovation work; and

(viii) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted?

(b) If not, why?

**ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම සභාගත* කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | සුළු පරිමාණ වාරිමාර්ග |
|---|---|
| 2015 | සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය |
| 2016 | වැව් ප්‍රතිසංස්කරණය |
| | අත්හරින ලද වැව් ප්‍රතිසංස්කරණය |
| | ගං වතුර හානි වූ වැව් ප්‍රතිසංස්කරණය |
| | ඇල මාර්ග සකස් කිරීම |
| 2017 | නව අමුණු ඉදිකිරීම |
| | වැව් ප්‍රතිසංස්කරණය |
| | සැපයුම් ඇළ මාර්ග තැනීම |
| | |
| **වර්ෂය** | **මධ්‍යම පරිමාණ වාරිමාර්ග** |
| 2015 කඩ්ඩුමුරිවූ වඩමුනෙයි කිතුල්වැව වැලිගහකන්ඩිය තුන්බන්කර්නි | වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු සිදු කිරීම |
| | ගං වතුර හානි අලුත්වැඩියාවන් සිදු කිරීම |
| 2016 කඩ්ඩුමුරිවූ වඩමුනෙයි කිතුල්වැව වැලිගහකන්ඩිය තුන්බන්කර්නි | වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු සිදු කිරීම |
| | වාරි ව්‍යාපාරවල නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු කිරීම |
| | ගං වතුර හානි අලුත්වැඩියාවන් සිදු කිරීම |
| 2017 කඩ්ඩුමුරිවූ වඩමුනෙයි කිතුල්වැව වැලිගහකන්ඩිය තුන්බන්කර්නි | වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු කිරීම |
| | වාරි ව්‍යාපාරවල නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු කිරීම |
| | ගං වතුර හානි අලුත්වැඩියාවන් සිදු කිරීම |
| | |
| **වර්ෂය** | **මහා පරිමාණ වාරිමාර්ග** |
| 2015 | වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු සිදු කිරීම |

| | |
|---|---|
| නවකිරි උන්නවවෙයි රුගම් යහතෝරි පුනානි | වාරි ව්‍යාපාරවල නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය |
| | ගං වතුර හානි අලුත් වැඩියාවන් සිදු කිරීම |
| | ව්‍යාපාරයන්හි කෘෂි මාර්ග නඩත්තු කටයුතු සිදු කිරීම |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු සිදු කිරීම |
| | වාරි ව්‍යාපෘතින්හි ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනීම |
| | දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ රුගම් හා නවගිරි ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම |
| 2016 නවකිරි උන්නවවෙයි රුගම් යහතෝරි පුනානි | වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු |
| | වාරි ව්‍යාපාරවල නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය |
| | ගං වතුර හානි අලුත් වැඩියාවන් සිදු කිරීම |
| | ව්‍යාපාරයන්හි කෘෂි මාර්ග නඩත්තු කටයුතු සිදු කිරීම |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු සිදු කිරීම |
| | වාරි ව්‍යාපෘතින්හි ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනීම |
| | දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ රුගම් හා නවගිරි ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම |
| 2017 නවකිරි උන්නවවෙයි රුගම් යහතෝරි පුනානි | වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු සිදු කිරීම |
| | වාරි ව්‍යාපාරවල නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය |
| | ගං වතුර හානි අලුත් වැඩියාවන් |
| | ව්‍යාපාරයන්හි කෘෂි මාර්ග නඩත්තු කටයුතු සිදු කිරීම |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු සිදු කිරීම |

(ii)

| වර්ෂය | සුළු පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල |
|---|---|---|---|
| 2015 | සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය | 46,790,000.00 | 46,790,000.00 |
| 2016 | වැව් ප්‍රතිසංස්කරණය | 52,413,000.00 | 161,954,105.00 |
| | අත්හරින ලද වැව් ප්‍රතිසංස්කරණය | 41,379,105.00 | |
| | ගං වතුර හානි වූ වැව් ප්‍රතිසංස්කරණය | 48,000,000.00 | |
| | ඇල මාර්ග සකස් කිරීම | 20,162,000.00 | |
| 2017 | නව අමුණු ඉදිකිරීම් | 5,000,000.00 | 200,765,000.00 |
| | වැව් ප්‍රතිසංස්කරණය | 182,715,000.00 | |
| | සැපයුම් ඇළ මාර්ග තැනීම | 13,050,000.00 | |

| වර්ෂය | මධ්‍යම පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල |
|---|---|---|---|
| 2015 | වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු සිදු කිරීම | 3,894,200.00 | 21,579,379.00 |
| | ගං වතුර හානි අලුත්වැඩියාවන් සිදු කිරීම | 17,685,179.00 | |
| 2016 | වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු කිරීම | 9,257,000.00 | 52,605,500.00 |
| | වාරි ව්‍යාපාරවල නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය | 37,750,000.00 | |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු කිරීම | 3,737,000.00 | |
| | ගං වතුර හානි අලුත්වැඩියාවන් කිරීම | 1,861,500.00 | |
| 2017 | වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු කිරීම | 1,503,000.00 | 8,359,000.00 |
| | වාරි ව්‍යාපාරවල නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය | 5,000,000.00 | |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු කිරීම | 244,000.00 | |
| | ගං වතුර හානි අලුත්වැඩියාවන් කිරීම | 1,612,000.00 | |

| වර්ෂය | මහා පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල |
|---|---|---|---|
| 2015 | වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු කිරීම | 16,731,527.00 | 532,168,026.00 |
| | වාරි ව්‍යාපාරවල නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය | 15,916,000.00 | |
| | ගං වතුර හානි අලුත් වැඩියාවන් කිරීම | 76,556,500.00 | |
| | ව්‍යාපාරයන්හි කෘෂි මාර්ග නඩත්තු කටයුතු කිරීම | 2,238,000.00 | |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු කිරීම | 10,080,500.00 | |
| | වාරි ව්‍යාපෘතින්හි ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනීම | 960,000.00 | |
| | දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ රුගම් හා නවගිරි ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම | 409,685,499.00 | |
| 2016 | වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු කිරීම | 40,649,520.00 | 352,020,735.00 |
| | වාරි ව්‍යාපාරවල නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය | 127,716,726.00 | |
| | ගං වතුර හානි අලුත් වැඩියාවන් කිරීම | 8,148,000.00 | |
| | ව්‍යාපාරයන්හි කෘෂි මාර්ග නඩත්තු කටයුතු කිරීම | 4,527,000.00 | |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු කිරීම | 27,412,000.00 | |
| | වාරි ව්‍යාපෘතින්හි ඉඩම් හා අනෙකුත් වත්කම් ආර්ක්ෂා කර ගැනීම | 5,405,000.00 | |

[ගරු පී. හැරිසන් මහතා]

| | | | |
|---|---|---|---|
| | දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ රුගම් හා නවගිරි ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම | 138,162,489.00 | |
| 2017 | වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු කිරීම | 23,779,209.00 | 85,927,745.00 |
| | වාරි ව්‍යාපාරවල නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය | 24,414,936.00 | |
| | ගං වතුර හානි අලුත් වැඩියාවන් කිරීම | 29,021,000.00 | |
| | ව්‍යාපාරයන්හි කෘෂි මාර්ග නඩත්තු කටයුතු කිරීම | 997,000.00 | |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම කටයුතු කිරීම | 7,715,600.00 | |

(iii) සුළු පරිමාණ වාරිමාර්ග - ක්‍රියාත්මක කරන ලද රු. මිලියන 05ට අඩු ව්‍යාපෘති සෘජු කොන්ත්‍රාත් ලෙස අදාළ ගොවි සංවිධාන වෙත පවරා ඉටු කරන ලද අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අදාළ දිස්ත්‍රික්කයන් වෙත ලබා දෙන අතර, දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරු විසින් අදාළ කොන්ත්‍රාත් පිරිනමනු ලබයි.

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - ඔව්.

(iv) සුළු පරිමාණ වාරිමාර්ග- ඉදිරිපත් කළ හැකිය. (ඇමුණුම 01හි දැක්වේ)

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග -

| කාර්යය | කොන්ත්‍රාත්කරුගේ නම |
|---|---|
| දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය | ඇසෙස් ඉංජිනියරින් Access Engineering PLC. |
| වෙලි ආරක්ෂණ | රුහුණු සංවර්ධන කන්ට්‍රැක්ටර්ස් සහ ඉංජිනියර්ස් පුද්ගලික සමාගම. |
| නවකිරි ව්‍යාපාරයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු | තර්ෂාන්ත් කන්ස්ට්‍රක්ෂන්ස් |

(v) සුළු පරිමාණ වාරිමාර්ග

| වර්ෂය | වියදම (රුපියල්) | මූල්‍ය ප්‍රතිශතය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | වැඩ අවසන් | අවිච්ඡේද |
| 2015 | 20,148,746,94 | 43.06 | 18 | - |
| 2016 | 107,021,380.29 | 66.08 | 33 | - |
| 2017 | 75,693,629.38 | 37.70 | 21 | 8 |

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - 2015, 2016 සහ 2017 වර්ෂවල සියලුම කාර්යයන් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ අවසන් කර ඇති අතර, භෞතික හා මූල්‍ය ප්‍රගතිය සියයට 100 දක්වා ලඟා කර ගෙන ඇත.

(vi) සුළු පරිමාණ වාරිමාර්ග - අදාළ නොවේ.

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - අදාළ වාරි ව්‍යාපාරවල සුළු අලුත්වැඩියා කටයුතු හා සුළු ඉදි කිරීම් සිදු කර ඇති බැවින් අදාළ වාර්තා අවශ්‍ය නොවන අතර, සියලු කාර්යයන් සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කර සැලසුම් කිරීමෙන් අනතුරුව ඇස්තමේන්තු සකස් කර ඇත. දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP) සහ වෙලි ආරක්ෂණ (DSWRP) ව්‍යාපෘතිය සඳහා පමණක් අදාළ වාර්තා සකස් කර ඇති බව කාරුණිකව දන්වමි.

(vii) සුළු පරිමාණ වාරිමාර්ග - අදාළ නොවේ.

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - ඔව්.

(viii) සුළු පරිමාණ වාරිමාර්ග - අදාළ නොවේ.
මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - ඔව්.Access Engineering PLC.

(ආ) අදාළ නොවේ.

***[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This reply is also placed in the Library.]*

## වයඹ පළාත් සභාව: ආදායම සහ වියදම
## வடமேல் மாகாண சபை: வருமானம் மற்றும் செலவு
## NORTH WESTERN PROVINCIAL COUNCIL: INCOME AND EXPENDITURE

461/'19

**7. ගරු මහින්ද අමරවීර මහතා (ගරු අශෝක ප්‍රියන්ත මහතා වෙනුවට)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - மாண்புமிகு அசோக்க பிரியந்த சார்பாக)
(The Hon. Mahinda Amaraweera on behalf of the Hon. Ashoka Priyantha)

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) වර්ෂ 2010 සිට අද දක්වා,

(i) වයඹ පළාත් සභාවට ආදායම් ලැබුණු මූලාශ්‍ර කවරේද;

(ii) වයඹ පළාත් සභාවේ ආදායම හා වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වයඹ පළාත් සභාවේ වාර්ෂික පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) පුනරාවර්තන වියදම හා ප්‍රාග්ධන වියදම යටතේ මුදල් වැය කරනු ලැබූ ක්ෂේත්‍ර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) යහපාලන රජයේ යහපත් මූල්‍ය කළමණාකරණ ප්‍රතිපත්ති අනුව වයඹ පළාත් සභාව මෙහෙයවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்டவினா:

(அ) 2010ஆம் ஆண்டு தொடக்கம் இன்று வரை,

(i) வடமேல் மாகாண சபைக்கு வருமானம் கிடைக்கப்பெற்ற மூலங்கள் யாவையென்பதையும்;

(ii) வடமேல் மாகாண சபையின் வருமானம் மற்றும் செலவு ஒவ்வொரு ஆண்டின் பிரகாரம் தனித்தனியாக யாதென்பதையும்;

(iii) வடமேல் மாகாண சபையின் வருடாந்த மீண்டெழும் செலவினம் மற்றும் மூலதனச் செலவினம் தனித்தனியாக யாதென்பதையும்;

(iv) மீண்டெழும் செலவினம் மற்றும் மூலதனச் செலவினத்தின் கீழ் பணம் செலவிடப்பட்ட துறைகள் தனித்தனியாக யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) நல்லாட்சி அரசாங்கத்தின் சிறந்த நிதி முகாமைத்துவக் கொள்கையின் பிரகாரம் வடமேல் மாகாண சபையை வழிநடாத்துவதற்காக அமைச்சினால் மேற்கொள் ளப்படும் நடவடிக்கை யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Will he inform this House in regard to the period from the year 2010 up to now-

(i) the sources of income of the North Western Provincial Council;

(ii) the income and the expenditure of the North Western Provincial Council in each year, separately;

(iii) the annual recurrent and capital expenditure of the North Western Provincial Council, separately; and

(iv) the fields in which expenses were made under recurrent and capital expenditure, separately?

(b) Will he also inform this House the steps that are taken by the Ministry to guide the North Western Provincial Council in accordance with the best financial management policies of the Government of Good Governance ?

(c) If not, why?

**ගරු වජිර අබේවර්ධන මහතා (අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
The Hon. Wajira Abeywardana - (Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වර්ෂ 2010 සිට අද දක්වා වයඹ පළාත් සභාවට ආදායම් ලැබුණු මූලාශ්‍ර අංක 01 ඇමුණුම* මඟින් දක්වා ඇත.

(ii) වයඹ පළාත් සභාවේ ආදායම් හා වියදම් එක් එක් වර්ෂ අනුව-

| වර්ෂය | ආදායම (රු) | වියදම (රු) |
|---|---|---|
| 2010 | 17,228,872,386.00 | 17,050,681,204.00 |
| 2011 | 19,050,922,958.00 | 18,489,398,057.00 |
| 2012 | 18,041,185,981.00 | 18,664,459,637.00 |
| 2013 | 21,034,028,322.00 | 20,758,047,028.00 |
| 2014 | 25,112,820,329.00 | 25,067,910,652.00 |
| 2015 | 30,799,759,748.00 | 29,399,292,718.00 |
| 2016 | 33,219,017,819.00 | 33,002,120,397.00 |
| 2017 | 36,863,767,282.00 | 35,456,150,454.00 |
| 2018 | 36,053,872,330.00 | 35,731,237,958.00 |

(iii) වයඹ පළාත් සභාවේ වාර්ෂික පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම-

| වර්ෂය | පුනරාවර්ථන වියදම(රු) | ප්‍රාග්ධන වියදම(රු) | එකතුව(රු) |
|---|---|---|---|
| 2010 | 15,022,297,479.00 | 2,028,383,725.00 | 17,050,681,204.00 |
| 2011 | 16,555,550,506.00 | 1,933,847,551.00 | 18,489,398,057.00 |
| 2012 | 17,314,044,101.00 | 1,350,415,536.00 | 18,664,459,637.00 |
| 2013 | 19,169,847,002.00 | 1,588,200,026.00 | 20,758,047,028.00 |
| 2014 | 21,198,581,206.00 | 3,869,329,445.00 | 25,067,910,652.00 |
| 2015 | 26,688,728,353.00 | 2,710,564,365.00 | 29,399,292,718.00 |
| 2016 | 28,224,060,882.00 | 4,778,059,516.00 | 33,002,120,397.00 |
| 2017 | 28,806,338,091.00 | 6,649,812,362.00 | 35,456,150,454.00 |
| 2018 | 30,560,249,848.00 | 5,170,988,110.00 | 35,731,237,958.00 |

(iv) ඔව්. වයඹ පළාත් සභාවේ වාර්ෂික පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම යටතේ මුදල් වෙන් කරනු ලැබූ ක්ෂේත්‍ර වෙන් වෙන් වශයෙන් ඇමුණුම් අංක 02 (i-iii) මඟින් දක්වා ඇත.

(ආ) වයඹ පළාත් සභාව මෙන්ම සියලුම පළාත් සභා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයන් වේ. මුදල් කොමිෂම නමැති ස්වාධීන ආයතනය විසින් ලබාදෙන නිර්දේශ මත වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කරන අතර, එම ප්‍රතිපාදනයන්ද ප්‍රදානයන් වශයෙන් ලබා දීම සිදු වේ. ඒ පිළිබඳව ප්‍රධාන ලේකම්වරයා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරන අතර, ඒ සඳහා කිසිදු මැදිහත්වීමක් මෙම අමාත්‍යාංශය සිදු නොකරයි.

එසේ වුවද, රේඛීය අමාත්‍යාංශයක් ලෙස මම අමාත්‍යාංශයට 1933/13 දරන 2015/09/12 දරන ගැසට් නිවේදනයෙන් පවරා ඇති වගකීම්, මෙහෙයවීම සිදු කරයි. ඊට අමතරව පළාත් සභා සඳහා විදේශ ගිවිසුම්වලට එළඹීමට බලයක් නොමැති අතර, ජාත්‍යන්තර ආයතන සමඟ සංවර්ධන ගිවිසුම්වලට එළඹීමේදී පළාත් සභා වෙනුවෙන් එම ගිවිසුම් අත්සන් කර විදේශ ව්‍යාපෘති, පළාත් සභා සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කිරීම මෙම අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි. එහිදී විදේශ ව්‍යාපෘතිවල මූල්‍ය වගකීම මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් දරන අතර, පසු විපරම් හා සම්බන්ධීකරණ කටයුතු ප්‍රධාන ලේකම්වරුන් මඟින් සිදු කරයි.

එමෙන්ම සෑම පළාත් සභාවක්ම පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවට කැඳවීමට බලය ඇති බැවින් එහිදී විගණන කටයුතු සම්බන්ධීකරණය හා පසුවිපරම් කටයුතු කිරීමද මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත්ව ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ ගරු අගමැතිතුමාත් සභා ගර්භයේ ඉන්න නිසා -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මැතිතුමනි, සාමාන්‍යයෙන් මේ වාගේ ප්‍රශ්නවලට කල් තියා notice දෙන්නට ඕනෑ. ස්ථාවර නියෝගවල කාර්ය පටිපාටිය තිබෙනවානේ. ඊයේත් මේ ප්‍රශ්නය මතු වුණා, දැන් මේ සම්බන්ධයෙන් මත ගැටුමක් එනවා.

***[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This reply is also placed in the Library.]*

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේක ඉතා වැදගත් කාරණයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බැහැ. අපි කාරක සභා අවස්ථාවට යමු.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමා මේ කාරණයට පිළිතුරු දෙන්නට කැමැතිද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசியக் கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி, தொழில் பயிற்சி, திறன்கள் அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development, Vocational Training and Skills Development and Youth Affairs.)
කාලය දීලා නැත්නම්, කරන්නට බැරි වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි සම්ප්‍රදාය. මම ගරු මන්ත්‍රීතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මීට පස්සේවත්, ප්‍රශ්නයක් තිබෙනවා නම් උදේට ලිපියකින් දැනුම් දෙන්න කියලා. එතකොට වැඩ කටයුතු පහසුයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, this is a very important matter.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Everything is important here. මොකක්ද ප්‍රශ්නය?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මෙතැනදී වැදගත් වෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 2.8ක් ගන්න හදනවා, බොහොම පැහැදිලිව ගත්තොත්, 7.8 පොලියට. ඒ වැඩ පිළිවෙළ ගැන ඊයේ ගරු රවි කරුණානායක මැතිතුමා කරුණු ඉදිරිපත් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එය ඔබතුමාගේ කථාවේදී කියන්න පුළුවන්. ඒකට පිළිතුරු ඒ අවස්ථාවේ දෙන්න පුළුවන් ගරු මන්ත්‍රීතුමා. ගරු මුදල් ඇමතිතුමා පිළිතුරු දෙයි. බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, I object.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I asked it even from the Prime Minister. Hon. Dayasiri Jayasekara, you can raise that in your speech and the Hon. Minister will reply.

## විසර්ජන පනත් කෙටුම්පත, 2019
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2019
## APPROPRIATION BILL, 2019

**කාරක සභාවේදී සලකා බලන ලදී.**
**[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]**
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]
Considered in Committee -
[HON. SPEAKER in the Chair.]

***1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 1 ordered to stand part of the Bill.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)
ගරු සභාපතිතුමනි, මම ගරු මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් 1 වන උපලේඛනය, 2 වන උපලේඛනය සහ 3 වන උපලේඛනය සලකා බලන තෙක් 2 වන වගන්තියේ සිට 12 වන වගන්තිය දක්වා වගන්ති සලකා බැලීම කල් තැබිය යුතුයි යෝජනා කර සිටිනවා.

***2 සිට 12 තෙක් වගන්ති උපලේඛන සලකා බැලීමෙන් පසු ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***

*2ஆம் வாசகத்திலிருந்து 12ஆம் வாசகம் வரை அட்டவணைகள் பரிசீலிக்கப்படும் வரை ஒத்திவைக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 2 to 12 ordered to be postponed until after consideration of the Schedules.*

## පළමුවන උපලේඛනය
## පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්
முதலாம் அட்டவணை
பொதுச்சேவைகளுக்குக் கொடுக்கத்தக்க தொகைகள்
FIRST SCHEDULE
SUMS PAYABLE FOR GENERAL SERVICES

**1 වන ශීර්ෂය.- අතිගරු ජනාධිපති**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 2,829,880,000

**தலைப்பு 1.- அதிமேதகு சனாதிபதி**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபா 2,829,880,000

**HEAD 01. - HIS EXCELLENCY THE PRESIDENT**

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 2,829,880,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

පළමුවන උපලේඛනය - ශීර්ෂ 1, 2, 4 - 13 සහ 16 - 25 දක්වා සලකා බැලීම - පූ.භා. 10.00 සිට අ.භා 12.30 දක්වා සහ අ.භා.1.00 සිට අ.භා.7.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා.

[පූ.භා.10.09]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු සභාපතිතුමනි, "2019 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2019.03.13 බදාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලින්, අදාළ අංක 1, 2, 4, 5, 6, 7, 8, 9, 10, 11 ,12, 13 සහ 16, 17, 18, 19, 20, 21, 22, 23, 24, 25 දරන වැය ශීර්ෂයන්ගෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්හි සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය"යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, අද දින කාරක සභා අවස්ථාවේ විවාදයට ගනු ලබන්නේ ගරු ජනාධිපති, අග්‍රාමාත්‍ය කාර්යාලය, ඒ වාගේම උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු ඇතුළු ආයතන 25ක් පිළිබඳවයි. රටක ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය යහපත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන කුලුනු තුනක් තිබෙනවා. ඒ තමයි රටේ විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය. ගරු සභාපතිතුමනි, අපි පිළිගන්න ඕනෑ, මේ ආයතන තුන එකට ගියොත් තමයි රටට ඉදිරියට යන්න පුළුවන් වන්නේ කියන කාරණය. මේ ආයතන අතර ගැටුම් ඇතිවන තාක් කල් ආණ්ඩුවකට ඉදිරියට යන්න බැහැ. ඔබතුමා දන්නවා, අද විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර අර්බුදයක් තිබෙනවා; විධායකය සහ අධිකරණය අතර අර්බුදයක් තිබෙනවා කියලා. අද මේ ආයතන තුන ඇතුළේ බරපතළ ගැටුමක්. මේක ආණ්ඩුවක් වුණාට, එළියෙන් බලන කට්ටියට පෙනෙන්නේ නිකම් සියඔලාණ්ඩුවක් වාගේ. දැන් බලන්න, ගරු සභාපතිතුමනි, ව්‍යවස්ථාදායකය එනම් අපි මේ ඉන්න පාර්ලිමේන්තුව ඇතුළේ අර්බුදයක්. ඊයේ, අය වැය දෙවෙනිවර කියවීම පිළිබඳ ඡන්දයේදී අපි දැක්කා; රජය ඡන්ද 119කින් ජයග්‍රහණය කළා, TNA එක ඊයේ ඡන්දය දුන්නේ නැත්නම් අය වැය පරාදයි කියන එක. ඊයේ 113,- [බාධා කිරීම්] හරි. හරි. පොඩ්ඩක් ඉන්නකෝ. තමුන්නාන්සේලාට TNA එක ඡන්දය නොදී, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉතුරු කට්ටියත් එක්ක හිටියා නම්, ඒක බලා ගන්න තිබුණා. [බාධා කිරීම්] හරි. පොඩ්ඩක් ඉන්න කෝ. හොඳයි, ඊයේ ගොඩක් හිටියා නේ. අද තමුන්නාන්සේලා මොකද කරන්නේ? ගරු මුජිබුරු රහුමාන් මන්ත්‍රීතුමා, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට ඔබතුමා මොකද කරන්නේ? තමුන්නාන්සේ මොකද කරන්නේ?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

විරුද්ධයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

තමුන්නාන්සේ ඡන්දය දෙනවාද, පරාජය කරනවාද කියලා කියන්න කෝ. තමුන්නාන්සේ TV එකට ගිහින් මොනවාද, කිව්වේ? ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය පරාජය කරනවා කියලා කිව්වා නේ. දැන් තමුන්නාන්සේ ඡන්දය දෙනවාද? තමුන්නාන්සේ රෙදි ඇඳගෙන ද ඡන්දය දෙන්නේ? තමුන්නාන්සේ කෝට් එක ඇඳගෙන ද, ගලවලා ද ඡන්දය දෙන්නේ? තමුන්නාන්සේට අගමැතිතුමා කියනවා, "ඡන්දය දෙන්න" කියලා. එතකොට තමුන්නාන්සේ ඡන්දය දෙන්න ඕනෑ. නැත්නම් තමුන්නාන්සේගේ මන්ත්‍රී ධුරය ඉවරයි.

ගරු සභාපතිතුමනි, ආණ්ඩුව ඇතුළේ බරපතළ අර්බුදයක්. ආණ්ඩුව ඇතුළේ පසු පෙළ මන්ත්‍රීවරු කියනවා, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය පරාජය කරනවා කියලා. පසු පෙළ මන්ත්‍රීවරු තිස් දෙනෙක් ඡන්දය දෙන්නේ නැහැයි කියනවා. තමුන්නාන්සේලාගේ ඉදිරි පෙළ මන්ත්‍රීවරු කථා කරලා කියනවා, "නැහැ, අපි ඡන්දය දෙනවා" කියලා. ඉතින් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඇතුළේ අද අර්බුදයක් නැද්ද? ව්‍යවස්ථාදායකය ඇතුළේ අර්බුදයක් නැහැ කියලාද කියන්නේ ?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ප්‍රජාතන්ත්‍රවාදය.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ආ! ඒකට කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදය. අගමැතිවරයාගේ කට්ටිය ජනාධිපතිතුමගේ වැය ශීර්ෂය පරාජය කරනවා කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදය. බොහොම ලස්සනයි. අපි බලාගෙන ඉන්නවා, ප්‍රජාතන්ත්‍රවාදය එළිදැක්වෙන තෙක්. තමුන්නාන්සේලාගේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන අපි හොඳට දන්නවා. ගරු සභාපතිතුමනි, මම කිව්වේ, ආණ්ඩුව, ව්‍යවස්ථාදායකය ඇතුළේ අර්බුදයක් කියන එක. ව්‍යවස්ථාදායකය ඇතුළේ පසු පෙළ මන්ත්‍රීතුමන්ලා දැන් උත්සාහ කරනවා, ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය පරාජය කරන්න. ඉදිරි පෙළ මන්ත්‍රීතුමන්ලා උත්සාහ කරනවා, ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය ජයග්‍රහණය කරවන්න. ඉතින් පාර්ලිමේන්තුව ඇතුළේ අර්බුදයක්! කැබිනට් මණ්ඩලය ඇතුළේ අර්බුදයක්! කැබිනට් මණ්ඩලය තීන්දුවක් ගන්නවා, -අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා වාගේ,- සියයට 7.8ක පොලියට ණයක් ගන්න. ඊයේ රවි

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

කරුණානායක හිටපු මුදල් ඇමතිවරයා කියනවා, "මහ බැංකුව මොනවාද මේ කරන්නේ, මහ බැංකුව කරන දේවල් වැරදියි, මේ වාගේ අධික පොලියට ණය ගන්න එක වැරදියි" කියලා. කැබිනට් මණ්ඩලය ඇතුළේ එකඟතාවක් නැහැ. ඒ නිසා ව්‍යවස්ථාදායකය ඇතුළේ අර්බුදයක්. ඊළඟට, ව්‍යවස්ථාදායකයයි, විධායකයයි අතර අර්බුදයක්. දැන් බලන්න, ජනාධිපතිවරයාත්, අග්‍රාමාත්‍යතුමාත් අතර ගැටුමක්. මේ කාරණය රට දන්නා දෙයක්. මෙහෙම ආණ්ඩුවක් ගෙනියන්න පුළුවන්ද කියා තමුන්නාන්සේලාම කියන්න. තමුන්නාන්සේලා මේ ආයතන කොහොමද ගෙනියන්නේ? එහෙම යන්න බැහැ. අද විධායකයයි, ව්‍යවස්ථාදායකයයි, අධිකරණයයි අතර අර්බුදයක්. අද ජනාධිපතිතුමා ඇවිල්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විවේචනය කරනවා; ව්‍යවස්ථා සභාවෙන් පත් කරන විනිශ්චයකාරවරු පිළිබඳව කථා කරනවා. ඒ පිළිබඳව විවේචන තිබෙනවා. ඒ නිසා මේ විධියට විධායකයත්, ව්‍යවස්ථාදායකයත්, අධිකරණයත් අතර ගැටුමක් යනකොට තමුන්නාන්සේලා කොහොමද ආණ්ඩුවක් ගෙනියන්නේ? ඒ නිසා අපි ඔබතුමන්ලාට කියනවා, එහෙම ආණ්ඩුවක් ගෙනියන්න බැහැ කියලා. මේක ප්‍රායෝගිකව තේරුම් ගන්න. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඇතුළේ මෙහෙම ගැටුමක් තිබෙනකොට කොහොමද ආණ්ඩුවක් ගෙනියන්නේ? අපි දැක්කා, පසුගිය දවස්වල තමුන්නාන්සේලා දිගින් දිගටම [බාධා කිරීමක්] මොකක්ද?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ජනාධිපතිතුමාට කියලා පුතාව නිදහස් කර ගත්තා නේද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම දැක්කා, අගමැතිතුමා තමුන්නාන්සේට අඬ ගහලා කියනවා, මේක කියන්න කියලා. අගමැතිතුමා තමුන්නාන්සේට අඬ ගහලා කිව්වා, "ජනාධිපතිතුමාට කියලා නිදහස් කර ගත්තා කියලා ගිහිල්ලා කියන්න" කියලා. හැබැයි, ඔබතුමාට මම තව එකක් කියන්නම්. අගමැතිතුමා කථා කරලා තමයි ඇතුළට දමන්න කිව්වේත්. ඒකත් මම කියන්නම්. හැබැයි, ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවට දෙවෙනි වාහනයේ යන මිනිසුන් හිරේට දමනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවාද, ඒ වාහනයේ අගමැතිතුමාගේ ගමේ මන්ත්‍රීතුමෙකුත් සිටිය බව. අගමැතිතුමා එක්සත් ජාතික පක්ෂයෙන් පත්කරපු මන්ත්‍රීතුමෙකුත් ඒ වාහනයේ සිටියා. ඒ, එතුමාගේ ඥාතියෙක්. ඒ ගැන කථා කරන්නේ නැහැ. එම නිසා අපිත් ඒ පිළිබඳව කථා නොකර ඉඳිමු. ඔබතුමා කියනවා, ජනාධිපතිතුමාට කථා කරලා නිදහස් කළා කියලා. අගමැතිතුමා අපව හිරේ දමනවා. අගමැතිතුමාටයි, මටයි ප්‍රශ්නයක් තිබෙනවා. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා හිරේට දමන තෙක් අගමැතිතුමාට නින්ද යන්නේ නැහැ. එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. හරි, අපි ඒක බලා ගනිමු. ඔබතුමන්ලා එහෙම සිහිනි සතුටක් ගන්නවා නම්, තමුන්නාන්සේලා එහෙම සතුටුවන්න. ඒ සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් නැහැ.

ගරු සභාපතිතුමනි, මේ අර්බුදය දිගට ගෙන යන්න බැහැ. එහෙම ගැටුමක් නැහැයි කියලා තමුන්නාන්සේලා කිව්වාට, ගැටුමක් තිබෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ. විධායකයයි, ව්‍යවස්ථාදායකයයි, අධිකරණයයි අතර ගැටුමක් තිබෙනවා කියලා අපි පිළිගන්න ඕනෑ. එහෙම ගැටුමක් තිබෙන කොට රටකට ඉදිරියට යන්න බැහැ. එහෙම ගැටුමක් තිබෙන කොට රටක් ඉදිරියට යන්නේ කොහොමද? එහෙම ගැටුමක් තිබෙන කොට අපේ රටට ආයෝජකයෝ එන්නේ නැහැ. අපේ රටේ සිටින ව්‍යාපාරිකයෝ ව්‍යාපාරවලට වියදම් කරන්නේ නැහැ. එහෙම වුණාම රටකට ඉදිරියට යන්න බැහැ. එම නිසා අපි කියන්නේ තමුන්නාන්සේලාගේ ගෙදර තිබෙන මේ රණ්ඩුව නවත්වා ගන්න කියලායි. මේ රණ්ඩුව අපට ඕනෑ නැහැ. අපි කියන්නේ නැහැ, මේ රණ්ඩුව දිගට ගෙන යන්න කියලා. අපි කැමැති නැහැ, මේ රණ්ඩුව ඇතිවනවා දකින්න.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! Field Marshal Hon. Sarath Fonseka, what is your point of Order?

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කථාවේ සමහර තැන්වල ඇත්තක් තිබෙනවා. ජනාධිපතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට බණිනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
That is not a point of Order. We will continue with the Debate. Go ahead, Hon. Member.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු සභාපතිතුමනි, දැන් පෙනෙනවා නේ, මේක තමයි තිබෙන ගැටුම. ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහත්තයා ජනාධිපතිතුමාට බණිනවා. ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහත්තයාට ඇමති ධුරයක් දුන්නේ නැති නිසා එතුමාට තිබෙන ඒ වේදනාව සාධාරණයි නේ? එතුමාගේ දුක සාධාරණයි නේ? ගරු සභාපතිතුමනි, අඩු ගණනේ එතුමාගේ දුක කියන්නවත් ඔබතුමා ඉඩ දෙන්නේ නැහැ නේ? ඇමතිකමත් නැහැ, දුක කියන්න දෙන්නේත් නැහැ. එතුමාගේ ඉල්ලීම සාධාරණයි. ඒක මම පිළිගන්නවා. මම ඉන්නේත් එතුමා එක්ක. ඉතින් ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහත්තයා අද ඡන්දය දෙන්නේ කොහොමද? අද ඔබතුමා ඡන්දයක් දෙනවාද? [බාධා කිරීමක්] නැහැ, අන්න කියනවා, දෙන්නේ නැහැයි කියලා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
මම එහෙම කිව්වේ නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම කථා කළේ එතුමා වෙනුවෙනුයි. මේක තමයි අර්බුදය.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අය වැය කියන්නේ වැදගත් විවාදයක්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු සභාපතිතුමනි, මීට වඩා වැදගත් වන්නේ මොකක්ද? විධායකයයි, ව්‍යවස්ථාදායකයයි, අධිකරණයයි අතර තිබෙන අර්බුදය ගැන කථා කරන්නේ නැත්නම්, වෙන මොකක් ගැනද කථා කරන්නේ, ගරු සභාපතිතුමනි?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
එහෙම අර්බුදයක් නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
රටේ පාර්ලිමේන්තුවයි, ජනාධිපතිතුමායි, අධිකරණයයි අතර තිබෙන ගැටුම ගැන මෙතැනදී කථා කරන්නේ නැතිව ගෙදර ගිහිල්ලා කථා කරන්නද? අපි අගමැතිතුමාට කියන්නේ, මේ අර්බුදය විසඳාගන්න කියලායි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
අර්බුදයක් නැහැ. අධිකරණය ස්වාධීනයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමන්ලා මතක තියාගන්න, මේ රටේ ජන මතය කාටද ලැබුණේ කියන එක. [බාධා කිරීම්] මේ රටේ ජන මතය තිබෙන්නේ කාටද? මේ රටේ ජන මතය ලැබුණේ ජනාධිපතිතුමාටයි. 2015 ජනවාරි මාසයේ 8වන දා ජන මතය තිබෙන්නේ ජනාධිපතිවරයාටයි. එතුමාට විතරයි ජන මතයක් ලැබුණේ. තමුන්නාන්සේලාට 2015 අගෝස්තු මාසයේ 17වන දා මන්ත්‍රී ධුර 113ක් ලැබුණාද? තමුන්නාන්සේලාට බහුතරයක් නැහැ. තමුන්නාන්සේලාට ජන මතයක් නැහැ. ඒ නිසා හොඳට මතක තියාගන්න, මේ ආණ්ඩුව බලයට පත් කරන්න ජන මතය ලැබුණේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටයි කියන එක. එතුමා ජනාධිපති වූ නිසා තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වුණේ. නමුත් අද එතැන ගැටුමක්. අපට මේ ගැටුම අවුස්සන්න ඕනෑ නැහැ; කොටවන්න ඕනෑත් නැහැ; රණ්ඩු කරවන්න ඕනෑත් නැහැ. ඒ කිසි දෙයක් කරන්න අවශ්‍යතාවක් අපට නැහැ. අප කියන්නේ මේ ගැටුම සමථයකට පත් කරගන්න කියායි. මේ ගැටුම සමථයකට පත් කළේ නැත්නම් මේ රටට ඉදිරියට යන්න බැහැ. මේ රටට ආයෝජකයන් එන්නේ නැහැ. තමුන්නාන්සේලා කියන්න, පසු ගිය අවුරුදු 4 තුළ තමුන්නාන්සේලා ගෙන ඇමෙරිකානු ඩොලර් බිලියන 50ක අලුත් විදේශ ආයෝජනයක් ගැන. අප ගෙන ආ ආයෝජනවලට අමතරව තමුන්නාන්සේලා ගෙන ආ ආයෝජනයක් ගැන කියන්න. මේ ගැටුම නිසා රට ඉස්සරහට යන්නේ නැහැ. රට නැවතිලා. රට හිටලා. ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා, එතුමාට වූ අසාධාරණය ගැන කතා කරනවා; ඒ වාගේම, පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා කතා කරනවා; පසු පෙළ මන්ත්‍රීවරුත් කතා කරනවා. මේ ගැටුම සමථයකට පත් කර ගන්න. මේ ගැටුම සමඟ යන්න බැහැ. ආණ්ඩුව ඇතුළෙන් ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය පරාජයට පත් කරන්න ගියොත් මොකද වෙන්නේ? "අග්‍රාමාත්‍ය කාර්යාලය" වැය ශීර්ෂය තිබෙන්නේත් "අතිගරු ජනාධිපති" වැය ශීර්ෂය ඇතුළත් ශීර්ෂ 1 - 25 අතරයි. එහෙම නම්, අගමැතිතුමාත් ආණ්ඩුව ඇතුළෙන්ම පරාජය කරන්න හදනවාද? පසු පෙළ මන්ත්‍රීවරුන් එකතු වෙලා අගමැතිතුමා පරාජය කරන්න හදනවා.

ගරු සභාපතිතුමනි, අප අද දිනයේ මුලින්ම කිව යුතු කාරණයක් තිබෙනවා. අතිගරු ජනාධිපති, අග්‍රාමාත්‍ය කාර්යාලය, අධිකරණ සේවා කොමිෂන් සභාව කියන ප්‍රධාන ආයතන තුනේත් වැය ශීර්ෂ පිළිබඳ විවාද කරන මේ අවස්ථාවේ අප ඔබතුමන්ලාට කියන්නේ රටක් හැටියට මේ අර්බුදය නතර කරගන්න තමුන්නාන්සේලා කටයුතු කරන්න කියලායි. මේ අර්බුදය හොඳ දෙයක් නොවෙයි. මේ අර්බුදය ඉදිරියට ගියොත් හොඳ නැහැ. ඒ නිසා කරුණාකර මේ ගැටුම නවත්වන්න. මෙහෙම යන්න බැහැ. මේ විධියට යන්න බැහැ. ඒක තමයි අප හොඳම විසඳුම ලෙස කියන්නේ, " මැතිවරණකට යමු" කියා. අපි ඔක්කෝම එක්කාසු වෙලා මැතිවරණයකට යමු. හොඳම දේ ඒකයි. අද විවාදයට ගැනෙන ආයතන අතර තිබෙනවා, මැතිවරණ කොමිෂන් සභාවත්. මැතිවරණ කොමිෂන් සභාවේ වැය ශීර්ෂයත් අද විවාදයට ගන්නවා. මං නම් කියන්නේ 'අපි පුළුවන් නම් මේකට විතරක් විරුද්ධව ඡන්දය දෙමු' කියලායි. ඇයි ඒ? මැතිවරණ සිතියම අකුළා තිබෙනවා. පළාත් පාලන මැතිවරණය අවුරුදු දෙකහමාරක් යන කල් පැවැත්වූයේ නැහැ. තමුන්නාන්සේලා ප්‍රාදේශීය සභා ඡන්ද අවුරුදු එකහමාරක් යන කල් පැවැත්වූයේ නැහැ. උතුරුමැද පළාත් සභාවේ කාලය අවසන් වෙලා අවුරුද්දකුත් මාස හයක් වනවා. 2017 ඔක්තෝබර් මාසය වන විටයි උතුරුමැද පළාත් සභාවේ, නැඟෙනහිර පළාත් සභාවේ කාලය අවසන් වුණේ. අද පළාත් සභාවල වැඩ සිදු වන්නේ නැහැ. නිලධාරින් වැඩ කරන්නේ නැහැ. ආණ්ඩුකාරතුමන්ලා පත් කරලායි තිබෙන්නේ. අද පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල නිලධාරින් තීන්දු ගන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. තමුන්නාන්සේලා බලයට පත් වන කොට ගෙන ආ මූලිකම මාතෘකාව තමයි, "ප්‍රජාතන්ත්‍රවාදය". තමුන්නාන්සේලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරලා ඡන්දය ගත් මිනිස්සු. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරලා, මැතිවරණ පැවැත්වීම ගැන කතා කරලා තමුන්නාන්සේලා මැතිවරණ සිතියම අකුළා දැම්මා. එම නිසා ඒ පිළිබඳව කටයුතු කරන්න කියන ඉල්ලීම අපි තමුන්නාන්සේලාට කරනවා. ගරු සභාපතිතුමනි, අද විවාදයේදී,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි. අවසාන විනාඩි තුනේදී මම තව කාරණයක් කියන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම පිළිබඳවත් අද විවාදයට ගන්නවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම කටයුතු කරන ආකාරය අපි දැක්කා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම කටයුතු කරන්නේ විපක්ෂයට විතරයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ආණ්ඩුවට කටයුතු කරන්නේ නැහැ. අපි 2016 ඔක්තෝබර් 26වැනි දා ඉඳලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ආණ්ඩුවේ මැති ඇමතිතුමන්ලාට එල්ල වී තිබෙන චෝදනා සම්බන්ධයෙන් පැමිණිලි 10ක් ඉදිරිපත් කළා. මේ වනතුරු එක පැමිණිල්ලක් විභාග කරලා නැහැ; කිසි කෙනෙකු කැඳවලා නැහැ. හැබැයි, අනික් අය කොමිසමට කැඳවනවා; අනික් අයට විරුද්ධව නඩු දානවා; අනික් අයට විරුද්ධව විශේෂ අධිකරණ හදනවා; ඒ සියල්ල කරනවා. හැබැයි, ඔබතුමන්ලාගේ පැත්තේ කාටවත් විරුද්ධව කටයුතු කරන්නේ නැහැ. "මේ ආණ්ඩුව තිබෙන කල් මේ ආණ්ඩුවේ ඉන්න

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

මිනිසුන්ට දඬුවම් දෙන්න බැහැ" කියලා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා කියලා තිබෙනවා අපි දැක්කා. රටේ ජනාධිපතිතුමා තමයි එහෙම කියන්නේ.

මේ ආණ්ඩුව බලයට පත් වෙච්ච ගමන්ම තමුන්නාන්සේලා ස්වාධීන කොමිෂන් සභා පත් කළා. අද මේ ස්වාධීන කොමිෂන් සභාවලට මොනවාද වෙලා තිබෙන්නේ? අද මැතිවරණ කොමිසමේ සාමාජිකයෙක් "ඡන්දය තියන්න එපා" කියලා උසාවියට යනවා. තමුන්නාන්සේලා ස්වාධීන කොමිෂන් සභාවකින් බලාපොරොත්තු වුණේ මේකද? ඊයේ - පෙරේදා කැබිනට් මණ්ඩලයේදී තමුන්නාන්සේලාම මේ ස්වාධීන කොමිෂන් සභා සම්බන්ධයෙන් විවේචනය කර ගත්තා නේද? තමුන්නාන්සේලාගේම කැබිනට් මණ්ඩලයේදී ජනාධිපතිතුමායි, ඇමතිවරුයි මේ ස්වාධීන කොමිෂන් සභා අසාර්ථකයි කියලා පිළිගත්තා නේද? මැතිවරණ කොමිසමට පත් කරපු සාමාජිකයන් අද "ඡන්දය එපා" කියලා උසාවියට යනවා. අද ජාතික පොලිස් කොමිසම පිළිබඳව විශාල විවේචන තිබෙනවා; පොලිස්පතිවරයා පත් කිරීම පිළිබඳව විශාල විවේචන තිබෙනවා; ව්‍යවස්ථාදායක සභාව පිළිබඳව විශාල විවේචන තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම පැමිණිලි සම්බන්ධයෙන් සාධාරණව විභාග කරනවා නම්, පරීක්ෂණ පවත්වනවා නම් සියලු දෙනාට එක නීතියක් අනුගමනය කරන්න ඕනෑ කියලා අපි කියනවා. "කාටත් එක නීතියක් අනුගමනය කරනවා"ය කියලා අල්ලස් කොමසාරිස්තුමා කථා කරපු ආකාරය ඊයේ මම රූපවාහිනියෙන් දැක්කා. කාටත් එක නීතියක් තිබෙන්නේ කොහේද? අවුරුදු තුනක් ගතවෙලාත්, එක් පැමිණිල්ලක්, කටඋත්තරයක් අරගෙන නැහැ. අද වනකොට ආණ්ඩුවේ මැතිඇමතිවරු 10 දෙනෙකුට විරුද්ධව පැමිණිලි ඉදිරිපත් කරලා තිබෙනවා. ඔවුන්ට සියලු චෝදනා එල්ල කරලා තිබෙනවා. ඒ කිසිවක් සම්බන්ධයෙන් අඩු ගණනේ ඔවුන්ට කැඳවීමක් කරලා නැහැ. එහෙම තිබියදී තමුන්නාන්සේලා ඒ ගැන කථා කරන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලැබී ඇති වේලාව අවසාන වීගෙන එනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ආණ්ඩුව ගැන කියන කොට වැඩි වේලාවක්,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ආණ්ඩුව ගැන කියනවාට නොවෙයි. වේලාව, වේලාවමයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මට කථා කරන්න වේලාව නැති බව මට තේරෙනවා. ඔබතුමන්ලාගේ කට්ටිය ගැන කියනකොට වේලාව නැති වනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අසාධාරණ චෝදනා කරන්න එපා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ. සාධාරණයි, සාධාරණයි. ගරු සභාපතිතුමනි, ඔබතුමා හරිම සාධාරණයි. ඔබතුමා තරම් සාධාරණ වෙනත් කවුරුවත් නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමා කථා කරන්න. වර්ණනා කරන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හරි, හරි. ඔබතුමා සාධාරණයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ජනාධිපතිවරයා යටතේ තිබෙන්නේ. ඒ නිසා මේ කොමිසමට කරපු සියලු දෙනාගේ පැමිණිලි එක දිගට විභාග කරන්න ඕනෑ. අද එක් එක් පුද්ගලයන් අරලියගහ මන්දිරයට කැඳවලා, වෙන වෙනම ෆයිල් ගෙනැල්ලා, progress එක බලලා, නීතිපති ගෙනැල්ලා -කට්ටිය ගෙනැල්ලා- විභාග කරනවා. "මොහුට නඩු දාන්න. මොහුට විශේෂ අධිකරණ දාන්න" කියලා එක් එක් කෙනා විශේෂයෙන් ඉලක්ක කරලා කියනවා. කමක් නැහැ. අපි උසාවියට යන්නම් -අධිකරණයට යන්නම්-. ඒකේ ගැටලුවක් නැහැ. හැබැයි, අපි කියන්නේ රටේ හැමෝටම එක නීතියක් තිබෙන්න ඕනෑය කියලායි.

රටේ ආණ්ඩුවට එක නීතියක්; විපක්ෂයට එක නීතියක් වෙන්න බැහැ. එහෙම නම් විපක්ෂයටත් සාධාරණයක් වෙන්න ඕනෑ. ආණ්ඩුවටත් ඒක තිබෙන්න ඕනෑ. අද ආණ්ඩුවේ කිසි කෙනෙකුට විරුද්ධව පරීක්ෂණ පවත්වන්නේ නැහැ. අපි CID එකට -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම අවසන් කරන්නම්. අපි CID එකට පැමිණිලි ඉදිරිපත් කළා. ඒ එක පරීක්ෂණයක්වත් ආරම්භ කරලා නැහැ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම කිසිම පරීක්ෂණයක් ආරම්භ කරලා නැහැ. ඒ නිසා අපි මේ විවාදය වේලාවේදී ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපි දැක්කා, එතුමා පසුගිය කාලයේ කුඩු සහ මත් ද්‍රව්‍ය නැවැත්වීමට විශාල වැඩ පිළිවෙළක් කරනවා; ඒ වාගේම හොරකම් නවත්වන්න එතුමා විශාල වැඩ පිළිවෙළක් කරනවා. ඒ නිසා එතුමාගේ විෂයපථයට ඇතුළත් ආයතනයක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම අවුරුදු තුනක් පරීක්ෂණ කර යට ගසා තිබෙන ෆයිල් ටික එළියට අරගෙන මේ පිළිබඳවත් පරීක්ෂණ කරන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හොඳයි. බොහොම ස්තුතියි. ගරු අග්‍රාමාත්‍යතුමා.

[පූ.භා.10.24]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசியக் கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி, தொழில் பயிற்சி, திறன்கள் அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development, Vocational Training and Skills Development and Youth Affairs.)

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම මම කියන්න කැමැතියි, බොරැල්ලේ සිද්ධිය සම්බන්ධව මම කවුරුවත් ඇතුළට දමන්න කිව්වේත් නැහැ; එළියට දමන්න කිව්වේත් නැහැ කියන කාරණය. එහෙම කියන්න මට වුවමනා නැහැ. [බාධා කිරීමක්] මම කියන්නම්. ඔබතුමා කියන දේවල් අපි අහගෙන සිටියා නේ. ඇත්තවශයෙන්ම එතැන පළමුවැනි කාර් එක දෙවැනි කාර් එක කියලා දෙකක් තිබුණේ නැහැ. එකක අපේ ප්‍රදේශයේ අපේ පක්ෂයේ නගර සභා මන්ත්‍රීවරයෙකුත් සිටියා. එක වාහනයකින් ඔය කියන පුද්ගලයාව යට කරගෙන ගියා. දවස් කිහිපයක් රෝහලේ ඉඳලා ඔහු මිය ගියා. එතැන හිටපු නිලධාරියා ඒක දැක්කාට වාර්තා කළේත් නැහැ; උදව් කළේත් නැහැ. දෙකම අපරාධ. අපි එකක්වත් අනුමත කරන්නේ නැහැ. මම දැන් කියපු පුද්ගලයාත් ඇත්තවශයෙන්ම පොලිසියෙන් ගෙනැල්ලා මම දන්නා විධියට එක රැයක් අත් අඩංගුවේ තබාගෙන ඉඳලා තමයි එළියට දමා තිබුණේ. නගරාධිපතිතුමාත් ඔහුට කථා කරන්න ඕනෑය කියා කැඳවා මේ පිළිබඳව කථා කරලා තිබෙනවා. මේ සිද්ධිය මුළු රටටම කැළලක්. වග කිව යුතු, යම්කිසි තත්ත්වයක් තිබෙන පුද්ගලයන් කරපු දෙයක් මේක. අපිට කවුරුවත් ඇතුළට දමන්න ඕනෑත් නැහැ. මේ මන්ත්‍රීතුමා පොලිසියේ සිටියා, පුතා වෙනුවෙන්. අපිට ඒක තේරෙනවා. අපට කවුරුවත් ඇතුළට දමන්න වුවමනා වුණේත් නැහැ; එළියට දමන්න වුවමනා වුණේත් නැහැ. මේ සිද්ධිය දිහා බලා නීතිය අනුව ක්‍රියා කරන්න. අපි ගිහින් කිව්වේ නැහැ අපේ මේ සභික මැතිතුමාව බේරන්න කියලා.

දෙවනුව, නීතිපතිතුමා අරලියගහ මන්දිරයට කැඳවා මම අහන්නේ නැහැ, කාටද නඩු දමන්නේ, කාටද නඩු දමන්නේ නැත්තේ කියලා. ලොකු ඔළුවේ අමාරුවක් තිබෙනවා නම් මට කරන්න දෙයක් නැහැ. ඒවා තමන් විතරයි දන්නේ. වෙන එකක් නොවෙයි. අනෙක් එක, ඊයේ කිව්වානේ, මේ ආණ්ඩුව වට්ටනවා කියලා. වට්ටනවා කිව්වානේ. [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

කවුද කිව්වේ? අපි කිව්වේ නැහැ වට්ටනවා කියලා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඔය අමාරුව නේ, මෙතැන තිබෙන්නේ. වෙන එකක් නොවෙයි නේ. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

හිතේ අමාරුව.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

අනෙක, අහනවා, TNA එක ඡන්දය දුන්නාද කියලා. ගිය වතාවේ විශ්වාස භංගය පරද්දන්නත් ඒ අය ඡන්දය දුන්නා. මම එක කාරණයයි අහන්නේ. ඊයේ අය වැය දෙවැනිවර කියවීමට විරුද්ධව ඡන්ද 77ක් තිබුණා.

ජනතා විමුක්ති පෙරමුණේ ඡන්ද හය ඉවත් කළා නම්, තමුන්නාන්සේලාට ඡන්ද 71යි. ඡන්ද 75ක්වත් නැහැ. ඡන්ද තුනෙන් එකක්වත් නැති අය තමයි මෙතැන ඇවිල්ලා කථා කරන්නේ. [බාධා කිරීම්] ඡන්ද තුනෙන් එකක්වත් ගන්න බැරි වුණා නේ. දැන් මෙතැන කෑ ගහලා වැඩක් නැහැ නේ. ඊයේ හිටියේ මහනුවර රැස්වීමට හිටපු භාගයක්. [බාධා කිරීම්] එච්චරයි හිටියේ. [බාධා කිරීම්] මම ඔබතුමා ගැන කිව්වේ නැහැ. අහගෙන ඉන්න. එච්චයි. ජනතාව නැහැ. එදා කොහොමද ජනතාව ගෙනාවේ කියලා අපි දන්නවා නේ. අපි ගමට යනවා. හැබැයි, අපි මිනිස්සු රැස්වීම්වලට ඇදගෙන එන්න යන්නේ නැහැ.

ඊළඟට කියනවා, මේක සියඹලා ආණ්ඩුවක් ලු. මේක මිරිස් කුඩු ගහන විපක්ෂයක් නේ. අපි කියන්නේ, මේ රුපියල් 10 කපා හරින්න ඕනෑ අපෙන් නොවෙයි, මෙතුමන්ලාගෙන්. එදා රුපියල් ලක්ෂ 5ක - 6ක පාඩුවක් මෙතැනට වෙලා තිබෙනවා. එදා මොකටද ආවේ? පාර්ලිමේන්තුව නවත්වන්න; පාර්ලිමේන්තුවට ගහන්න. කථානායකතුමාට ගහන්න ගියා. එතුමාගේ පුටුව එතැනින් ගෙනිච්චා. එහෙමයි කටයුතු කළේ. පාර්ලිමේන්තුව නැති කරන්න හැදුවේ. ඒක සාර්ථක වුණා නම්, මේ වැය ශීර්ෂය ගැන කථා කරන්න අද පාර්ලිමේන්තුවක් නැහැ.

අද පාර්ලිමේන්තුව ගැන කථා කරනවා. එදා මොකක්ද වුණේ? මේක, "සියඹලා ආණ්ඩුවක්" නොවෙයි. "මිරිස් කුඩු ගහන විපක්ෂයක්" මෙතැන ඉන්නේ. ඒක අපි හෙළා දකින්න ඕනෑ. ඒවාට ඉඩ දෙන්න බැහැ. පාර්ලිමේන්තුවට ඇවිල්ලා ක්‍රියා කරන්නේ එහෙමද? එදා මේ උත්තරීතර සභාව පෙන්නුවා, පාර්ලිමේන්තුව ස්වාධීනයි; ජනතා වරම අනුව ක්‍රියා කරනවා කියලා. පාර්ලිමේන්තුව තිබෙන්නේ ජනතා වරම අනුව ක්‍රියා කරන්න.

**ගරු ලොහාන් රත්වත්තේ මහතා**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)

අගමැතිතුමනි,-

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඔබතුමාගේ කථාවේදී පිළිතුරු දෙන්න පුළුවන්.

පාර්ලිමේන්තුව තිබෙන්නේ, ජනතා වරම අනුව ක්‍රියා කරන්න.

මේ වාගේ එක එක අවස්ථා තිබුණා. අපේ විජේතුංග මැතිතුමාගේ අවසාන කාලයේ එතුමා ජනාධිපතිවරයා ලෙස හිටියා. එතකොට මෙතැන අගමැති පුටුවේ වාඩි වෙලා හිටියේ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය. මේ තත්ත්වය අලුත් එකක් නොවෙයි. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනාධිපති වුණාම, මම මේ අගමැති පුටුවේ වාඩි වෙලා හිටියා. විටින් විට එවැනි තත්ත්ව ඇති වුණා. ජනාධිපති එක පක්ෂයක; අනෙක් පක්ෂයෙන් අගමැති. එහෙම අවස්ථා තිබෙනවා. මෙම ක්‍රමවේදය නොදැන කථා කරන්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ. ක්‍රමවේදය නොදැන කොහොමද කථා කරන්නේ? ආණ්ඩු පක්ෂයට තමයි පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන්නේ. නමුත්, සමහර අවස්ථාවල ආණ්ඩු පක්ෂයට පාර්ලිමේන්තුවේ බහුතරය නැති වනවා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ප්‍රංශය වාගේ රටවල ඒ ක්‍රමය පවතිනවා. අපිත් දැන ගන්න ඕනෑ, ඒවා තිබුණත් නැතත් අපි ක්‍රියා කරගෙන යන්නේ කොහොමද කියලා. විශේෂයෙන්ම අපේ පාර්ලිමේන්තුව ගැන ආඩම්බර වෙන්න ඕනෑ. ගරු කථානායකතුමා දුන්න තීන්දු අපි අගය කරන්න ඕනෑ. මේ සභාවේ ස්වාධීනවයි වැඩ කරන්න තිබෙන්නේ. අපි වගකියන්නේ මේ රටේ ඡන්දදායකයන්ට පමණයි. වෙනත් කාටවත් අපි වගකියන්නේ නැහැ. ඔබතුමන්ලාත් කරන්නේත් ඒක; අපි කරන්නේත් එක. ඒ ක්‍රියාදාමය ආරක්ෂා කරලා මේ පාර්ලිමේන්තුවට අපි ශක්තිය ලබා දෙන්න ඕනෑ. මම විශේෂයෙන්ම මෙතැනට ආවේ ඒ ගැන සඳහන් කරන්න.

ගරු සභාපතිතුමනි, අපේ ශ්‍රේෂ්ඨාධිකරණය ස්වාධීන ශ්‍රේෂ්ඨාධිකරණයක් බව පෙන්නුවා. මීට අවුරුදු 10කට ඉස්සෙල්ලා අග්‍රවිනිශ්චයකාරතුමිය පන්නලා දැම්මා; ශ්‍රේෂ්ඨාධිකරණය නැති කරන්න හැදුවා. නමුත් අපට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරන්න පුළුවන් කියලා එදා පෙන්නුවා. ශ්‍රේෂ්ඨාධිකරණය නඩු තීන්දුවක් දෙන්නේ ආණ්ඩුව ආරක්ෂා කරන්න නොවෙයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරන්නයි. අපට විරුද්ධවත් නඩු තීන්දු දීලා තිබෙනවා. ලංකාවේ විතරක් නොවෙයි ඕනෑම රටක ශ්‍රේෂ්ඨාධිකරණයට තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරලා, ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කරන්නයි. එතකොට ආණ්ඩුවට තිබෙන්නේ ඒ අනුව ක්‍රියා කරන්නයි. ශ්‍රේෂ්ඨාධිකරණය ආණ්ඩුව යන මාර්ගය වැරදියි කිව්වාට විධායකයයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි අතර සට්ටනයක් නැහැ. මෙතුමාට ඕනෑ කියන්නේ "එහෙයි" කියන එකක්. අවශ්‍ය නඩු තීන්දුව දුන්නේ නැත්නම් ශිරානි බණ්ඩාරනායක මැතිනිය පැන්නුවා වාගේ පන්නන්න ඕනෑ කියයි. අනෙක, ඒ නඩු තීන්දුවෙන් පෙන්නුවේ මොකක්ද? ඒ නඩු තීන්දුවෙන් පෙන්නුවේ කරපු හොරය මොකක්ද කියලායි. ඒක කුමන්ත්‍රණයක් නේ. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225ක් ඉන්නවා. ඒ මන්ත්‍රීවරු 225න් මන්ත්‍රීවරු 71දෙනෙක් බලනවා ආණ්ඩුවක් හදන්න. ඒක නේ කරලා තිබෙන්නේ? 71දෙනෙක් බැලුවා, බලය ගන්න. ඒක වැරදියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පුළුවන්ද එහෙම ආණ්ඩු හදන්න?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
පක්ෂ භේදයෙන් තොරව මේ සභාවේදී කිව්වා, ඒ ආණ්ඩුවට බහුතරයක් නැහැ කියලා. ඒක නේ සිදු වුණේ. 71 දෙනෙක් බලය ගන්න හැදුවා. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ලජ්ජයි. ලජ්ජයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපට කියනවා, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය පරාජය කරන්න කියලා. ඇයි? ඊයේ තරහා වුණා නේද? ඔබතුමන්ලා හිතුවා, ඊයේ ඇවිල්ලා ඔබතුමන්ලාට ඡන්දය දෙයි කියලා. ඔබතුමා විතරක් නොවෙයි අනෙක් අයත් දැන් තරහා වෙලා, අද අපේ මන්ත්‍රීවරුන්ට කලින්ම -උදේ ඉඳන්ම- කියනවා ලු මේ අය වැය පරාද කරන්න කියලා. ඒකනේ ඇත්ත. අපට කියන්න දෙයක් තිබෙනවා නම් කියන්න. ඒකට ප්‍රශ්නයක් නැහැ. මම දන්නවා අද ඔබතුමාගේ හිතේ තිබෙන වේදනාව. අපි ඒක දන්නවා. ඒක දැනගෙන තමයි මෙතැනට ආවේ.

මෙතැනදී ඕනෑම කෙනකුට විවේචන ඉදිරිපත් කරන්න පුළුවන්. ඒත් නඩුකාරවරුන්ගේ නම් කියන්න, බනින්න, ඒකට ඉඩ දෙන්න බැහැ. කොමිෂන් සභාවල ඉන්න අයට විරුද්ධව නඩු කියන්න කථා කරනවා. අද පොලිස් කොමිෂන් සභාව නොතිබුණා නම් පොලිසිය මත්ද්‍රව්‍යවලට විරුද්ධව මේ විධියට වැඩ කරන්නේ නැහැනේ. ජනතාව ඉස්සෙල්ලාම අපෙන් ඉල්ලුවේ ඒක. මේවා හරියට ක්‍රියාත්මක කරන්න ඕනෑ, මේවායින් අපි ආරක්ෂා වෙන්න ඕනෑ කියලා අපි කිව්වේ ඒකයි. ඒ ලැබුණු ශක්තියෙන් තමයි අවුරුදු දෙකක් තුනක් තිස්සේ කටයුතු කරන්නේ.

ගරු සභාපතිතුමනි, ඔබතුමාත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඉන්න නිසා මා ඒ ගැන වැඩිපුර කියන්න යන්නේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළින් අපි වැඩ කරලා ඒ වාර්තා සියල්ලම තිබෙනවා. යම් කිසි තනතුරකට නමක් යෝජනා කරන එක සහ නමක් සුදුසුද, නැද්ද කියන එක අපේ යුතුකම. ඒ අනුව අපි ක්‍රියා කරගෙන යනවා. අපි ඇමෙරිකාවේ වාගේ මාධ්‍ය මෙතැනට ගෙනැල්ලා මේ වැඩ කටයුතු කරන්නේ නැහැ. අපි කථා කරනවා; ඒ වාර්තා තිබෙනවා; ඒ අනුව වැඩ කටයුතු කරනවා. අපි හැම වෙලාවේම යම්කිසි පදනමක් අනුවයි කටයුතු කර තිබෙන්නේ. අපි එකඟ වන කාරණා තිබෙනවා. විරුද්ධ වන කාරණා තිබෙනවා. ඒත් යම්කිසි පදනමක් උඩ තමයි තීරණ ගෙන තිබෙන්නේ. සමහර අවස්ථාවල අපට නම් දෙක තුනක් ලැබී තිබෙනවා, කොයි නමද සුදුසු කියලා තීරණය කරන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් වරදක් සිදු වෙලා නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේත්, කොමිෂන් සභාවලත්, අධිකරණයේත්, පාර්ලිමේන්තුවේත් ස්වාධීනත්වය තිබෙන නිසා තමයි මේ වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන් වෙලා තිබෙන්නේ. අද පෙන්වනවා ජනතාවගේ කැමැත්ත තිබෙන්නේ කොහේද කියලා. ජනතාව ඉන්නේ අපි එක්ක.

ඊළඟට, ආයෝජන ගැන මගෙන් ඇහුවා. බලන්න, තව සති කිහිපයකින් ලංකාවේ දෙවැනි තෙල් පිරිපහදුව පටන් ගන්නවා. වෙන කොහේවත් නොවෙයි, හම්බන්තොට. තවත් ඒවා තිබෙනවා. දැන් තමයි ඒ ඔක්කෝම එන්නේ. අපි අලුත් වෙළෙඳ කලාපයක් බිංගිරියේ පටන් ගත්තා. ඒ ගැන මෙතැන කියන්න වුවමනා නැහැ. ඒ ගැන ඇහුව නිසායි කිව්වේ. මිනිස්සු භය වෙලායි ඉන්නේ කිව්වා. මිනිස්සු භය වෙලා නැහැ, මිනිස්සු කැමැතියි. එදා මාධ්‍යවලිනුත් බැලුවේ ඒ මාර්ගයේ යන්නයි. එදා 71දෙනක් ආණ්ඩුවක් හදන්න හදන කොට හැම මාධ්‍යයකින්ම සම්පූර්ණ සහයෝගය දුන්නා. අද ඒ ගැන ලියන්න යන්නේ නැහැ, කියන්න යන්නේ නැහැ. ඒත් ජනතාව කිව්වා, නැහැ, ඒක වැරදියි කියලා. ඒකයි බලන්න ඕනෑ. මාධ්‍ය ගැන අපි කථා කරමු ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡාවට ගන්න දවසට. එදා මොකක්ද සිද්ධ වුණේ, කවුද කළේ කියලා ඔක්කෝම ඒ වෙලාවට අපට කියන්න පුළුවන්. ඒත් දැන් මෙතැන වෙලා තිබෙන්නේ මොකක්ද?

ඊයේ එතුමන්ලා පැරදුණා. එතුමන්ලාට සිටියේ 71යි. ආණ්ඩුවක් ගන්න නොවෙයි, එතුමන්ලාට විපක්ෂය වෙන්නවත් බැරි වෙන තත්ත්වයක් තිබෙන්නේ. දැන් ඇවිල්ලා කෑ ගහනවා. මම ඒ ගැන මීට වඩා කථා කරන්නේ නැහැ.

මම යෝජනා කරන්නේ මේ වැය ශීර්ෂය පරාජය කරන එක නොවෙයි, පසුගිය දා මිරිස් කුඩු ගහපු මන්ත්‍රීවරුන්ගෙන් රුපියල් දහය ගණනේ කපන්න කියලායි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The next speaker is the Hon. M. A. Sumanthiran. You have 25 minutes. Before that the Hon. Deputy Chairman of Committees will take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[10.36 a.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you Mr. Deputy Chairman for the opportunity given to speak a few words at the Committee Stage Discussion on the allocations made to several important institutions: the Office of His Excellency the President, the Office of the Prime Minister, Judges of the Superior Courts, Public Service Commission, Judicial Service Commission, National Police Commission, Administrative Appeals Tribunal, Commission to Investigate Allegations of Bribery or Corruption, Human Rights Commission of Sri Lanka, Elections Commission, National Audit Office, importantly the Parliament itself and many other institutions.

So, this is an important Head of expenditure that has been proposed in this Budget, and when one scans the figures that have been proposed, one can see that the President's Office has the lion's share, only second to the Elections Secretariat. It is almost Rs.3000 million, Rs.2929 million, more than the allocation for Parliament itself which is Rs. 2776 million.

I want to raise a few issues that have already been raised by the speaker who opened the Discussion today with regard to the disputes that exist among several personalities for whom these expenditures have been proposed.So, there is the Office of the President, then there is the Office of the Prime Minister, there is the Office of the Supreme Court and so on. All of these important Offices seem to be at logger heads. All of a sudden, the smooth functioning has been disrupted, thanks to the plot that started on the 26th of October, last year. We are still reeling under that onslaught and all of these important institutions are at each other's throats.

One important issue is the present Sessions that are going on in the UN Human Rights Council and the announcement by His Excellency the President that he intends sending three members to represent himself and to move away from the commitment that Sri Lanka has given twice before with his blessings and then counter to that, the Prime Minister's and the Foreign Affairs Minister's Offices are stating clearly that they would co-sponsor a new Resolution at the Human Rights Council Session, this year. We would like to know what the real situation is, we would like to know from the President whether, indeed, he is sending another delegation and what legal authority such a delegation would have, when two Members of Parliament from the Opposition go to represent the country at this important Sessions in Geneva.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Yes, the Hon. Leader of the House wants to say something.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනාධිපතිතුමා නියෝජනය කරමින් වෙනම කණ්ඩායමක් යනවාද කියලා මම මහින්ද සමරසිංහ මැතිතුමාගෙන් අහන්න කැමැතියි. මේක අපි අද දැනගන්න ඕනෑ. එතකොට තමයි විවාදය හරියට යන්නේ.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඒකට උත්තරයක් දෙන්නම්. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාගෙන් පසුව කථා කරන්න නියමිතව තිබෙන්නේ මටයි. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

No, no. එහෙම බැහැ, එහෙම බැහැ.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

මගේ කථාවේ දී මම උත්තරයක් දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මේ විවාදය ආරම්භයේ දීම අපි දැනගන්න ඕනෑ. අපි පාර්ලිමේන්තුවක් හැටියට දැනගන්න ඕනෑ, වෙනම කණ්ඩායමක් යනවාද කියලා.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

ගරු සභානායකතුමනි, ඊයේ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්තුවා. ජනාධිපතිතුමා,- [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ඊර්ෂ්‍යා නැහැ. නමුත් දැනගන්න අයිතියක් තිබෙනවා.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
ගරු ජනාධිපතිතුමා මට වගකීම භාර දීලා තිබෙනවා, ඒ පිළිබඳ ප්‍රකාශයක් අද කරන්න. ඔබතුමා කියන කියන වෙලාවල්වලට මට ඒක කරන්න බැහැ. [බාධා කිරීමක්] නැහැ, නැහැ. මගේ කථාවේදී මම ඒක කියන්නම්. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ. අපි විවාදය,-

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
මම ඔබතුමාට පිළිතුරක් දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, before we start the Committee Stage Discussion, we would like to know whether there is an official delegation.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
නැහැ, නැහැ. එහෙම දෙයක් නැහැ. මේ Discussion එක ජනාධිපති වැය ශීර්ෂය පිළිබඳව කරන Discussion එකක්. සුමන්තිරන් මන්ත්‍රීතුමා කළ කථාවට මම පිළිතුරක් දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙනම්, ඔබතුමා ඊට පසුව කථා කරන්න කෝ.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
හරි, හරි.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Let me speak. This shows the Leader of the House does not know whether His Excellency the President is sending a separate delegation and whether-[*Interruption.*] I am raising here an issue of propriety as to whether we can authorize expenditure for the President's Office, if the President intends to send -

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Yes, Hon. Mahinda Samarasinghe.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
Sir, I want to ask the Hon. Leader of the House-

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
No. You cannot disturb my speech. How can he disturb my speech, Sir?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
Sir, I would like to know from the Leader of the House, since he is so insistent that I must reply right now, whether he is willing to give me the time from the Government side, so that I can deal with this issue before I speak, simple as that. Otherwise, wait till I speak.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Sumanthiran, please.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Whatever you do between yourselves, do not take my time away from me, please. So, this confusion, the Leader of the House does not know- We are discussing the Head of Expenditure of President's Office. If the President intends to send Members from the Opposition ranks - not to represent the Government, but himself - can we authorize that expenditure today? I think that it would be improper for any of these monies to be utilized for the President to be sending unofficial delegations to personally represent him to a bilateral body like the UN Human Rights Council and that such expenditure should be disallowed by Parliament and that is why I am raising the issue.

My question is to His Excellency the President. I do not know why he is not here today. I intend asking the President a number of questions for clarification while we discuss the expenditures that have been proposed for his Office. So, this is one of those. He has proposed two names from the Opposition. Can Members from the Opposition represent the Government? I understand that the Minister of Foreign Affairs is going for the UN Human Rights Council. So, that would be proper for the Minister of Foreign Affairs to go for the Session and to represent the Government. But, how can anybody else represent the Government? It is obvious that they cannot, and if they cannot, can this Parliament authorize that expenditure?

Then, this raises another issue. His Excellency the President is the Head of the Executive. He is the Chair of

the Cabinet. He is the Head of the Cabinet. He is the Head of the Government. Now we raise this issue with regard to the Leader of the Opposition. Can another Member of his own party also function as the Head of the Opposition: two members from the same party, one the Head of the Government and the other the Head of the Opposition? Now we are seeing how that is working. The Head of the Government is seeking to send members of this so called main Opposition to represent him. So, this shows the ridiculous state of affairs that this Parliament has been brought into.

He also wishes to send the Governor of the Northern Province and the Governor of the Northern Province is sending letters - I got a letter from the Governor of the Northern Province - saying that he is going there to represent the people of the Northern Province. How can the Governor represent the people? The Governor is the agent of the President. The Province has elected representatives at various levels. They will represent the people. We will represent the people. The Governor is merely an agent of the President to carry out certain constitutional functions. The Governor also, I understand, has proposed himself to go to India on an official trip to meet with the refugees in India. Is the Governor authorized under the Constitution to do things like that? He has sought the permission to go to India with a delegation and he has suggested persons who must go with him on that delegation. That list strangely includes a member of the Judiciary. The Governor of the Northern Province has sought permission to go to India to meet refugees living in India with a team of persons, which also includes a sitting member of the Judiciary. So, this is the ridiculous state, as I said before, to which the Executive has come.

Now, this is being extended. We are also discussing the Head of Expenditure of the Supreme Court. Last month, when we had a debate here, there were Members from both sides who said the Supreme Court is independent now, see how they ruled in the months of November and December and, therefore, we do not need international judges for accountability. They said, “Our judges are independent. That has been established. We can go on with any inquiry with regard to wartime atrocities by a local judicial system”. In that debate itself, I intervened and said, “That may be so when the contesting parties are two political parties in this country. But, when it comes to the issue of the State of Sri Lanka and an armed rebel group, the local Judiciary will not be independent”. This has been proved yet again by certain court proceedings that happened last week. Since those court proceedings have been terminated, the matter is not *sub judice* and I can speak about it in this House.

I refer to the case of former Navy Commander Wasantha Karannagoda going to the Supreme Court to prevent his arrest. It has become a joke now, that people run to the Supreme Court. They do not go to the Magistrate’s Court, where under the Bail Act, you can ask for anticipatory bail. This is a new trend, that you go to the apex court of the country and prevent arrest. In this instance, he was named as a suspect in the Magistrate’s Court for having had knowledge of the abduction, disappearance and subsequent killing of eleven Tamil-speaking youths in and around Colombo. They had nothing to do with the LTTE. In this case, where the abducted persons were not members of the LTTE - they had nothing to with the war - the suspects were members of an armed force, of the Sri Lanka Navy, who were running a racket of abduction and extortion of money for ransom and it was revealed that the Commander of the Navy at that time knew about it. He himself made the complaint to the police; he knew about it. You cannot say no to that because the first complaint was by him. Because he was a wartime Commander, a position was taken up in the Supreme Court that he is a war hero and he should not be arrested. I want to ask, if a person had been a Commander of an armed force during the war, does that give him immunity from arrest? I did not see that happening in the case of Field Marshal Sarath Fonseka. But here, these were Tamil-speaking youths and they were done to their death in the secret detention camp "Gunsite" in the Trincomalee Naval Headquarters. That is known. Several more had been done to their deaths in that secret detention camp in the Naval Headquarters. There is ample evidence for that. Those may have been members of the LTTE. We have not even got there or anywhere. But, here is a case of very young men, their parents have been looking for them, crying out for justice and then eventually, after ten long years, the machinery moved. But, when it came close to a wartime Commander, immediately the whole State apparatus including the Supreme Court, I repeat, including the Supreme Court, has acted in a partisan manner entirely without justification to prevent his arrest. In that public forum, in open court, Karannagoda’s lawyer has publicly stated that the Attorney-General and the Solicitor General go to the President everyday asking for promotions and therefore, their view must not be taken into account, and the Additional Solicitor General who appeared for the Attorney-General did not even counter that and in fact, did a summersault when the previous day he insisted on the arrest and after this was stated, he agreed that Mr. Karannagoda need not be arrested. This shows the partisan manner in which the Judiciary, the Attorney-General’s Department, all function when it comes to matters like this.

If this is the case with regard to Tamil-speaking youth who were not involved with the LTTE, how much more partisanship will be seen when it involves the LTTE itself and that is why we insist that the undertakings given to the UN Human Rights Council in Geneva must be fulfilled, must be implemented. The Government has given undertakings that the participation of international judges, these accountability issues will be addressed and that must be done and the Government must cooperate with it. Whatever the President might say, whoever non-official representatives of his might go - I do not know where they will say this in Geneva, perhaps, on the streets - whatever they say, that must be done; that is an obligation undertaken by the Government. Karannagoda’s Supreme Court case has shown to the whole world - I want the UN Human Rights Council to take note of this - that there will be no justice when it comes to issues such as this and in broad daylight, in open court, it was stated by Karannagoda’s lawyer, “It

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

was the wartime. He could have committed any murder. Why did he have to complain to the police?", stating the obvious that any murder went without punishing, would not have been punished, even now the Commander has immunity and this could have been done with impunity.

Thank you

[පූ.භා. 10.56]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකාවට සම අනුග්‍රහය දක්වන යෝජනාවක් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කර තිබෙනවා. පසුගිය දවස්වල එම යෝජනාව ගැන පාර්ලිමේන්තුවේදී විවිධ මත ප්‍රකාශ වෙනවා මම දැක්කා. ඒ වාගේම මෙම යෝජනාව ලංකාවට විරුද්ධව ගෙනෙන යෝජනාවක් හැටියට හඳුන්වා දීලා තිබෙනවා. හැබැයි, එම යෝජනාව මේ ගරු සභාවට කියවන්න මම කැමැතියි. ඇත්තෙන්ම එම යෝජනාව මඟින් ලංකා ආණ්ඩුව ප්‍රශංසා කර තිබෙනවා. විවේචනය කරන අය මොන යෝජනාව කියෙව්වාද කියා මම දන්නේ නැහැ. එම යෝජනාව මඟින් 11වතාවක් අපට ප්‍රශංසා කර තිබෙනවා. ඉස්සෙල්ලාම මෙහෙම කියා තිබෙනවා. මම පරිවර්තනයක් තමයි කියවන්නේ. It is a translation.

"2018 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදයේදී ශ්‍රී ලංකාව තුළ ඉස්මතු වූ දේශපාලන තත්ත්වය සාමකාමී ලෙස නිරාකරණය කිරීමෙහිලා ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික ආයතන විසින් ඉටු කරන ලද ප්‍රබල කාර්ය භාරය පිළිගනිමි." අපේ රටේ ආයතන, විශේෂයෙන්ම අධිකරණය, පාර්ලිමේන්තුව 2018 ඔක්තෝබර් 26වැනිදා කුමන්ත්‍රණය පරාජය කිරීමට ගත් සාමකාමී වෑයම ප්‍රශංසාවට ලක්කොට තිබෙනවා. ඊළඟට, "2017 සැප්තැම්බර් මාසයේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම, 2018 පෙබරවාරි මාසයේදී එහි කොමසාරිස්වරුන් පත් කිරීම හා එහි වරපත්‍රය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ඒ ආයතනයට අදාළ කටයුතු ආරම්භ කිරීම සාදරයෙන් පිළිගනිමි." කියලා තිබෙනවා. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ආරම්භ කිරීම Human Rights Commission එක පිළිගන්නවා. ඒ තමයි දෙවැනි එක. තුන්වැනි එකත් මම කියවන්නම්. "2017 ජුලි මස 10 සිට 14 දක්වා මානව හිමිකම් හා ත්‍රස්ත විරෝධී කාර්යයන් පිළිබඳ විශේෂ වාර්තා සම්පාදකවරයා විසින්ද, 2017 ඔක්තෝබර් මස 10වැනිදා සිට 23වැනිදා දක්වා සත්‍යය, යුක්තිය, සාධාරණත්වය, හානිපූරණය ප්‍රවර්ධනය හා එම සිදුවීම් නැවත සිදු නොවීම පිළිබඳ සහතික වීම සම්බන්ධ විශේෂ වාර්තා සම්පාදකවරයා විසින්ද, 2017 දෙසැම්බර් මස 4 සිට 15 දක්වා අත්තනෝමතිකව රඳවා තබා ගැනීම පිළිබඳ කාර්ය කණ්ඩායම විසින්ද, 2018 සැප්තැම්බර් 3 සිට 11 දක්වා මානව හිමිකම් පූර්ණ වශයෙන් භුක්ති විඳීම විෂයයෙහි විදේශ ණයවල බලපෑම සම්බන්ධ ස්වාධීන විශේෂඥවරයා විසින්ද සිදු කරන ලද පැමිණිලි සාදරයෙන් පිළිගනිමි." කියා තිබෙනවා. ඒ කියන්නේ ලංකා ආණ්ඩුව අරගෙන තිබෙන පියවර මානව හිමිකම් කොමිසම පිළිගෙන තිබෙනවා.

ඊට පස්සේ තව එකක් තිබෙනවා. "දේශීය ජනතාවට නැවත සිය ජීවනෝපාය ආරම්භ කිරීමේ හැකියාව ලබා දෙනු පිණිස සන්නද්ධ අංශ රැඳී සිටින පෞද්ගලික ඉඩම් සියල්ල නිදහස් කිරීම විෂයයෙහි ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නැවත නැවතත් සිදු කරන ලද පොදු කැපවීම සිහිපත් කරමි." ඒ කියන්නේ, උතුරු ප්‍රදේශයේ ඉඩම් ජනතාවට ලබා දීමට ආණ්ඩුවේ කැපවීම සිහිපත් කරමින්, පෙරදී සන්නද්ධ අංශ රැඳී සිටි ඇතැම් පෞද්ගලික ඉඩම් සිවිල් පුරවැසියන්ගේ හිමිකාරිත්වයට ආපසු භාරදීම අගය කරනවා කියායි. විශේෂයෙන්ම උතුරුකරයේ ඉඩම් ජනතාවට ආපසු ලබා දීම අගය කර තිබෙනවා.

"මෙම පසුබිම තුළ තවදුරටත් වැදගත් ප්‍රගතීන් අත්පත් කර ගනිමින් කාල රාමුවක් සහිතව අදාළ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා විධික්‍රම සම්මත කර ගැනීම දිරිමත් කරමින් හානිපූරණය පිළිබඳ කාර්යාලයක් පිහිටුවීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවරයන්හි ප්‍රගතිය ද ඇතුළත්ව සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් සම්බන්ධ සංකල්ප පත්‍රයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම, 1978 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කිරීම සඳහා වූ යෝජනාව ද ඇතුළත්ව අංක 30/01 දරන මානව හිමිකම් කවුන්සිල යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ලද වෙනත් පියවරයන් සැලකිල්ලට ගනිමින්, අගය කරමි." කියා අපි ගත් පියවර වර්ණනා කරනවා. මේ වාගේ තව වගන්ති ගණනාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

මම අහන්නේ, ඇයි මේ යෝජනාව වෙනස් කරන්න යන්නේ කියන එකයි. ඇයි මේක වෙනස් කරන්නේ? පසුගිය අවුරුදු තුන හතරේ ඇති වෙලා තිබෙන ප්‍රගතිය වර්ණනා කර තිබෙනවා. අපි මේක තව තවත් දියුණු කරන්නට ඕනෑ. We must go step by step. We must develop this.

ඇයි, මේක වෙනස් කරන්න යන්නේ කියා ගරු මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමාගෙන් මම අහන්න කැමතියි. ඔබතුමාත් එහි නියෝජිතයෙක්. මොකද, මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වශයෙන් සිටි කාලයේ අපි ආර්ථික සම්බාධක අබියසයි හිටියේ.

මම කලින් පාර්ලිමේන්තුවේදී කිව්වා, 2012, 2013, 2014 - අවුරුදු තුනක්- ශ්‍රී ලංකාවට විරුද්ධව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනා සම්මත වුණු බව. ඔබතුමාගේ ගියේ? ඔබතුමාගේ කියෙව්වේ. 2012, 2013, 2014 වර්ෂවල ශ්‍රී ලංකාවට විරුද්ධව යෝජනා තුනක් සම්මත වුණා. මේවාගේ අගයමින් නොවෙයි, විරුද්ධව. 2015 වර්ෂයේ අපි කොහේද හිටියේ? 2015 වර්ෂයේ අපි හිටියේ ආර්ථික සම්බාධක අබියස. 2015 වර්ෂයේ මහින්ද රාජපක්ෂ මැතිතුමා දිනුවා නම් ආර්ථික සම්බාධක ලංකාවට තමයි එන්නේ. එම නිසායි අවුරුදු දෙකකට කලින් ඡන්දයකට ගියේ. ආර්ථික සම්බාධක ආවා නම් අපේ මුළු රටම ව්‍යසනයකට යටත් වෙනවා. එතුමාට ඒකට මුහුණ දෙන්නට බැහැ. ස්වාසීලන්තය හැරෙන්නට ලෝකයේ වැදගත් රටවල් තරහ වෙලා.

අනෙක් කාරණය මෙයයි. මම ගරු මහින්ද සමරසිංහ මැතිතුමාට කියනවා. ඔබතුමාට මතක ඇති. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවේ තමුන්නාන්සේලා අවුරුදු ගණනාවක් සිටියා. ත්‍රිකුණාමලයේ ශිෂ්‍යයන් ඝාතනය කළ වෙලාවේ ආණ්ඩුවේ ඇමතිවරු ඒ මැරුණු ශිෂ්‍යයන්ගේ දෙමව්පියන්ට දුරකථනයෙන් කථා කළා. Dr. Manoharan සිටිනවා. ඔහුගේ පුතා නැති වුණා. ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරු Dr. Manoharanට කථා කර කියනවා, "මේක ගැන පැමිණිලි කරන්න එපා. අපි ඔබට කොළඹින් ගෙයක් දෙන්නම්. වාහනයක් දෙන්නම්." කියා. ලජ්ජයි. මට ඕනෑ නම් ඇමතිවරුන්ගේ නම් කියන්න පුළුවන්. මම

කැමති නැහැ, නම් කියන්න. මහින්ද රාජපක්ෂ මැතිතුමාට මානව හිමිකම් කවුන්සිලය පැත්තේවත් යන්න බැරිවයි සිටියේ. දැන් මේ අද ජනාධිපතිතුමා අරින්න හදන මන්ත්‍රීවරුත් ඒ කාලයේ ආණ්ඩුවේ හිටියා. මහින්ද සමරසිංහ මැතිතුමා තමයි අවුරුදු දහයක්ම මානව හිමිකම් කවුන්සිලයට ගියේ. ඔබතුමානේ ගියේ? ගිහිල්ලා අන්තිමට මොකද වුණේ? අවුරුදු දහයක් ගිහිල්ලා, 2012, 2013, 2014 වර්ෂවල යෝජනා තුනක් ලංකාවට විරුද්ධව සම්මත වුණා. ඕක තමයි තමුන්නාන්සේලා ලබාගත් ජයග්‍රහණය. 2015 වර්ෂයේ හිටියේ ආර්ථික සම්බාධක අබියස. ලෝක නායකයින්ට රට යන්නට බැහැ. එම නිසා මේක ආපස්සට හරවන්නට හදන්නට එපා. අපි අපේ වගකීම් තේරුම් ගන්නට ඕනෑ. විධායකයේ වගකීම එකක්. පාර්ලිමේන්තුවේ වගකීම එකක්. අධිකරණයේ වගකීම තව එකක්. අපි මේවා අභිභවා යන්නට ගියොත් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
ගරු සභානායකතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක් තියෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I will speak for another five minutes, Sir. අපේ වගකීම් තෝරා ගන්නේ නැතිව- දැන් බලන්න, ජනාධිපතිතුමා. එතුමා එතුමාගේ සීමාවන් හඳුනා ගත්තේ නැහැ. ජනාධිපතිතුමා එතුමාගේ සීමාවන් හඳුනා ගන්න ඕනෑ. පාර්ලිමේන්තුව හැටියට අපි අපේ සීමාවන් දැන ගන්නට ඕනෑ. අධිකරණය තමන්ගේ සීමාවන් හඳුනාගන්න ඕනෑ. අපි අනෙක් කෙනාගේ සීමාවට ගියොත් අර්බුදයක් ඇති වෙනවා. ගරු මහින්දානන්ද මන්ත්‍රීතුමා කිව්වා අර්බුදයක් ඇති වෙලා තිබෙනවා කියා. අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. අර්බුදයක් ඇති වෙලා තිබෙන්නේ - විධායකයයි, ව්‍යවස්ථාදායකයයි, අධිකරණයයි තමන්ගේ සීමාවන් දන්නේ නැතිව අනෙක් කෙනාගේ සීමාවට ගිහින් වැඩ කරන්නට හැදුවොත් අර්බුදයක් ඇති වෙනවා.

ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, මන්ත්‍රී සංඛ්‍යාව 71 ක් තියාගෙන; දැන් ඊයේ පෙනුණාගේ 71යි ඉන්නේ. මන්ත්‍රී සංඛ්‍යාව 71ක් තියාගෙන ආණ්ඩුව දුන්නා මහින්ද රාජපක්ෂ මහත්මයාට. එතකොට අර්බුදයක් ඇති වෙනවානේ. අර්බුදයක් ඇති වෙනවා. සුළුතරයකට ආණ්ඩුවක් දුන්නා. කවුද අර්බුදය ඇති කළේ අපිද? අපි තමයි එතුමාව දිනෙව්වේ. මගේ දිස්ත්‍රික්කයෙන් සියයට 56ක් ඡන්ද අරගෙන දුන්නා. වැඩිම සිංහල බෞද්ධ දිස්ත්‍රික්කය. එතුමාට වැඩිම බහුතරය අරගෙන දුන්නේ මහනුවර දිස්ත්‍රික්කයෙන්. ඡන්ද 91,000ක් අපි අරගෙන දුන්නා, බහුතරය. අපියි එතුමාව දිනෙව්වේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා නොවෙයි. පරාජය කළ එක්කෙනා අගමැති කළාම දැන් එතුමාට ජනවරමක් තිබෙනවා ද? ජනවරමක් නැහැ. පරාජය කරපු එක්කෙනා අගමැති කළා. තමන්ගේ සීමාවන් දන්නේ නැතිව වැඩ කරනකොට මෙය සිද්ධ වෙනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එනකොට එතුමාට මම කිව්වා."මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නිර්මාතෘ ඔබතුමා." කියා. ඇත්ත වශයෙන්ම ඒ අවුරුද්දේ එතුමා අපි කියන දෙය ඇහුවා. එතුමාගේ බලතල සියයට අනූනවයක් අගමැතිට දුන්නා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Please do not disturb me. I cannot give you time. ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එනකොට ඔබතුමා පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. ජනාධිපතිතුමාට,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Shantha Bandara, what is your point of Order?

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මේ පාර්ලිමේන්තුවේ ඒ වෙලාවේ හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට මම කියන්නේ. ජනාධිපතිතුමා ජයග්‍රහණය කරලා 43 දෙනෙක් හිටපු එක්සත් ජාතික පක්ෂය,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
There is no point of Order in it. Hon. Kiriella, you go ahead.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අයියෝ! මේ, සිල්ලර කථා; පොල් කථා; කුරුණෑගල සිල්ලර කථා. ඕවා තමයි ඔබතුමා දන්නේ. ඔබතුමා වාඩි වෙන්න. මම ජනාධිපතිතුමා ගැන නරකක් කිව්වේ නැහැ. මම කිව්වේ, 2015 යහ පාලන ආණ්ඩුව ආපු විගස එතුමා එතුමාගේ බලතල සියල්ලම අගමැතිතුමාට දෙන්න කැමැති වුණා කියලයි. එහෙම නේද, ඉරාන් අමාත්‍යතුමා?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ඔව්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණය තමයි කිව්වේ මේ බලතල දෙන්න බැහැ කියලා. එතුමා ඒ මට්ටමේ හිටියේ, He wanted to give all his powers to the Hon. Prime Minister. It was the Supreme Court that said, "You cannot give these powers because you have a mandate." ඒ කාලයේ එතුමා ඒ විධියට වැඩ කෙරුවා. නමුත්, පසුව එතුමාගේ සීමාව ඉක්මවා ගිය නිසා මේ තත්ත්වය ඇති වුණා. මේක අපි කරපු දෙයක් නොවෙයි. අපට දොස් කියලා වැඩක් නැහැ. එතුමා සීමාව ඉක්මවා ගියාම අපට මැදිහත් වෙන්න සිද්ධ වුණා. මම ගරු මහින්ද සමරසිංහ මැතිතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වෙනවා. මේ යෝජනාව වෙනස් කරන්න එපා. අපට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ ප්‍රධාන අය කියලා තිබෙනවා, මේ යෝජනා තවදුරටත් ලිහිල් කරන්න පුළුවන් කියලා. ලංකාවට ගැළපෙන, සියලු ජාතීන්ට පිළිගන්න පුළුවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදලා බලය විමධ්‍යගත කළොත්, මේ සමහර බරපතළ චෝදනා අපට ලිහිල් කරගන්න පුළුවන් කියලා

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ ප්‍රධානීන් අපට කියලා තිබෙනවා.

දැන් බලන්න, එදා ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපි හමු වුණා. හමු වුණාම, විධායක ජනාධිපති ක්‍රමය ගැන එකඟතාවක් නැහැ; මැතිවරණ ක්‍රමය ගැන එකඟතාවක් නැහැ. නමුත් බලය බෙදීම - sharing of power - ගැන සියලු දෙනාම එකඟයි. මොකද, අපි මෙහෙයුම් කමිටුවේදී ෆෙඩරල් ක්‍රමයක් ගැන සාකච්ඡා කෙරුවේ නැහැ; උතුරු නැඟෙනහිර ඒකාබද්ධ කිරීම ගැන සාකච්ඡා කෙරුවේ නැහැ. අපි සාකච්ඡා කෙරුවේ පළාත් සභා ශක්තිමත් කරන්නේ කොහොමද කියලයි. ඒකට සියලු දෙනාම කැමැතියි. දකුණත් කැමැතියි. දකුණේ මහ ඇමතිවරු උතුරේ අයට වඩා ප්‍රගතිශීලී යෝජනා ඉදිරිපත් කරලා තිබුණා. මේ ගැන ලියවිල්ලක් පාර්ලිමේන්තුවට දාලා, සියලු දෙනාගේ කැමැත්ත ගන්න පුළුවන් නම්, අපට ඉදිරි ගමනක් තිබෙනවා. හැබැයි, මම කියනවා, මේ යෝජනා වෙනස් කරන්න එපා කියලා. එහෙම කළොත් විශාල ආපස්සට යෑමක් සිද්ධ කරන්නේ.

මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ඇමතිතුමා කිව්වා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගැන.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
ගරු සභානායකතුමනි, ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Okay, I will finish.

පසුගිය අවුරුදු 10 තුළ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට මැති-ඇමතිවරු 39දෙනෙකුට විරුද්ධව චෝදනා එල්ල වුණා. විජයදාස රාජපක්ෂ මහත්තයාගේ කථාව මා ළඟ තිබෙනවා. මම එම කථාව **සභාගත*** කරනවා.

එතුමා කියලා තිබෙනවා, ඒ 39ම නිදොස් කොට නිදහස් කෙරුවා කියලා. නිදොස් කොට නිදහස් කෙරුවා කියලා, විජයදාස රාජපක්ෂ මැතිතුමා අධිකරණ ඇමති කාලයේ මේ පාර්ලිමේන්තුවේදී කථාවක් කරමින් සඳහන් කරලා තිබෙනවා. මම නැවත වරක් මහින්ද මැතිතුමාගෙන් ඉල්ලන්නේ, මේ යෝජනාව වෙනස් කරන්න එපා කියන එකයි. You are making a big mistake. Our journey in the last four years has been constructive. There are problems, but we are going step by step. If you try to change this, then you are doing a great disservice to the country.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
බොහොම ස්තුතියි.

ඊළඟට ගරු අනුර දිසානායක මහතා.

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[පූ.භා.11.11]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් අද සාකච්ඡාවට බඳුන් කරන අපේ රටේ ආයතන ගණනාවක් වාගේම ජනාධිපතිගේ වැය ශීර්ෂය, අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාලයේ වැය ශීර්ෂය ආදී වැදගත් ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව කාරක සභා විවාදයට සහභාගී වෙන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආයතන කිහිපයක් ගැන කථා කරන්න තිබෙන නිසා මා කෙටියෙන් එකින් එක කරුණු ඉදිරිපත් කරන්න සූදානම්. පළමු කොටම විගණන සේවා කොමිෂන් සභාව පිළිබඳව මා සඳහන් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපිත කිරීමේදී විශාල ලෙස සාකච්ඡාවට බඳුන් වූ කරුණක් තමයි, අපේ රටේ විගණන සේවාව ස්වාධීනත්වයට පත් කළ යුතුයි කියන ස්ථාවරත්වය. ඒ මොකද? අපි මේ පාර්ලිමේන්තුවෙන් වෙන් කරලා දෙන විශාල මුදල් ප්‍රමාණයක් -ඒවා මහජනයාගේ බදු මුදල්.- හැසිරවීමේදී පැවැති ආණ්ඩු මෙන්ම පවතින ආණ්ඩු විශාල ලෙස ඒවා අවභාවිතාවේ යෙදවීමත්, නාස්ති කිරීමත්, හොරකම් කිරීමත් සිදු වී තිබෙනවා. එයට යම් ප්‍රමාණයකට හෝ බාධාවක් ඇති කරන්න පරීක්ෂාවකට භාජන කිරීම වෙනුවෙන් ස්වාධීන විගණන කොමිෂන් සභාවක් පිළිබඳව පෙනී හිටපු දේශපාලන ව්‍යාපාරයක් තමයි ජනතා විමුක්ති පෙරමුණ. දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ස්වාධීන විගණන කොමිෂන් සභාව ස්ථාපිත කළත්, අදාළ පනත සම්මත කරගන්න පසු ගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ 1වැනි දා වෙන කල් දීර්ඝ කාලයක් -අවුරුදු තුනකට ආසන්න කාලයක්,- ගත වුණා.

මෙහිදී විශේෂයෙන්ම කාර්යයන් දෙකක් බලාපොරොත්තු වුණා. පළමුවන කාර්යය තමයි, ජාතික විගණන කාර්යාලය පිහිටුවා ඊට මූල්‍ය ස්වාධීනත්වය ලබාදීම. ඒ කියන්නේ, මීට පෙර මුදල් අමාත්‍යාංශය හරහා මුදල් වෙන් කරනු ලැබුවා නම්, මුදල් අමාත්‍යාංශයට හැකියාව ලැබෙනවා, මුදල් දීම හෝ නොදීම මත යම් ප්‍රමාණයකට විගණනය පාලනය කරන්න. එම නිසා මුදල් වෙන්කර ගැනීම බලාපොරොත්තු වුණා. ගරු කථානායකතුමා හරහා ඒකාබද්ධ අරමුදලින් මුදල් වෙන්කර ගැනීමේ අපේක්ෂාවක් තිබුණා. ඒ වාගේම විගණන සේවයත් ස්ථාපිතකොට ඒ නිලධාරින්ගේ බඳවා ගැනීම්, උසස් කිරීම්, මාරු කිරීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවට විගණන සේවා කොමිෂන් සභාවට පවරා ගැනීම අපේක්ෂාව වුණා. මේ කාර්යයන් දෙක තමයි විගණන සේවා කොමිසමට පැවරී තිබෙන ප්‍රධානම කාර්යයන් දෙක. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් ඉවත් කිරීමේ බලය, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයන් බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම හා ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමයි විගණන සේවා කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යය. නමුත් ලක්ෂ 15කට ආසන්න මුළු රාජ්‍ය සේවයේ නිලධාරින්ගේ කාර්ය සාධනයේ මූල්‍ය වගවීම පරීක්ෂා කරන විගණන කාර්යාල හා බැඳුණු විගණන සේවා කොමිසම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පවරා ඇති ඉහත කාර්යයන් තුනම මේ දක්වා ඉටු කර නැහැ. මාසයකට රුපියල් ලක්ෂ 22කට -රුපියල් මිලියන 2.2කට- ආසන්න මුදලක් විගණන සේවා කොමිෂන් සභාව වෙනුවෙන් වැයකොට තිබෙනවා. මේ වනවිට රුපියල් මිලියන 80කට -රුපියල් ලක්ෂ 800කට- ආසන්න මුදලක් විගණන සේවා කොමිසම වෙනුවෙන් දරා තිබෙනවා. හැබැයි 2018 අගෝස්තු මාසයේ 01 දා සිට

ක්‍රියාත්මක වන විගණන පනත මඟින් මාස 3ක් ඇතළත ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටු විය යුතු බව ජාතික විගණන පනතේ 54 (5) (අ) වගන්තිය ප්‍රකාරව සඳහන් වී තිබුණද, එයද ඉක්මවා මාස 4ක් ගොස් තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ඇති කරලීමට කොමිසම අපොහොසත් වී තිබෙනවා. ගරු සභාපතිතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ මෙම විගණන සේවා කොමිෂන් සභාවක් පිළිබඳ කරුණු ඉදිරිපත් කර තිබුණා. ඒ නිසා අවුරුදු තුනකට ආසන්න කාලයක් විගණන සේවා කොමිසම නිස්කාරණේ කාලය ගත කරනවා වෙනුවට අඩුම තරමේ ඔවුන්ට සේවා ව්‍යවස්ථාවක් සකස් කළ යුතුව තිබුණා. නමුත් පනතේ තිබෙනවා, අගෝස්තු මාසයේ 01 දා සිට මාස තුනක් ඇතුළත ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටු වන්න ඕනෑය කියලා. නමුත් දැන් මාස හතකට ආසන්න කාලයක් ගතවෙමින් තිබෙනවා. තවමත් විගණන සේවා කොමිසම ස්ථාපිත කරන්න සමත්වෙලා නැහැ. ඒ වෙනුවට මොකක්ද කරන්නේ? 2018.10.04 දින විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා එම සේවකයන් එයට ඇතුළත් කරගන්න කියලා නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කරන තෙක් මෙසේ කටයුතු කිරීම සම්බන්ධයෙන් කරුණු දක්වමින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වෘත්තීය සමිතිය ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා තිබෙනවා. ඒ නඩුව සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් විගණන සේවා කොමිසමට කරුණු දක්වා ඇත්තේ කොමිසම බලයක් නොමැතිව කටයුතු කර ඇති බවයි. හැබැයි එවැනි කිසිදු බලයක් නැතුව, සේවා ව්‍යවස්ථාවක් සකස් කර ගන්නේ නැතුව, ශ්‍රී ලංකා විගණන සේවය ස්ථාපිත කරන්නේ නැතුව මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් විනය පරීක්ෂණවලට මැදිහත් වීම දක්වා වර්ධනය වී තිබෙනවා. රාජකාරි වෙලාව තුළ කොමිෂන් සභාවට විරුද්ධව විරෝධතාවක් පැවැත්වීම ඇතුළු ජාතික විගණන කාර්යාල නිලධාරින්ගේ අවිධිමත් ක්‍රියාවන් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වන්න කියලා, විගණකාධිපති මඟින් ඩබ්ලිව්.එස්.එම්.කේ. සිල්වා අධ්‍යක්ෂ (පාලන) ජාතික විගණන කාර්යාලය වෙත එම්.ඩබ්ලිව්. කාන්ති ගුණතිලක ලේකම්, විගණන සේවා කොමිෂන් සභාව විසින් යොමු කරලා තිබෙනවා. විගණන සේවා කොමිෂන් සභාව හරහා අපේක්ෂා කළේ, විගණන නිලධාරින්ගේ ස්වාධීනත්වයත්, ගරුත්වයත්, ඔවුන්ගේ වටිනාකමත් ආරක්ෂා කරමින් ඔවුන්ගේ කාර්ය භාරයත් කාර්යක්ෂම කිරීමයි. හැබැයි කියන්න කනගාටුයි, තමන් තෝරා ගන්නා ලද කණ්ඩායමක් වෙත යම් යම් සැලකිල්ලක් දක්වමින් විගණන සේවා කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය අඩපණ කිරීමේ දිසාවට තමයි ගමන් කරමින් තිබෙන්නේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැනත් මා කියන්න ඕනෑ. මේ අවස්ථාවේදී කථානායකතුමා සිටියා නම් වඩා හොඳයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තීරණයක් ගත්තා, අවුරුදු තුනෙන් පසුව සියලු කොමිෂන් සභා යළි තහවුරු කරන්නත්, යළි පත්කරන්නත්. නමුත්, එම කොමිෂන් සභාවම දීර්ඝ ලෙස ඉදිරියට යන්නට තමයි තීරණය අරගෙන තිබෙන්නේ. අඩුම තරමින් එම කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වයත්, එම කොමිෂන් සභාවල තනි තනි සාමාජිකයාගේ ක්‍රියාකාරිත්වය පිළිබඳවත් මීට වඩා යම් ඇගැයීමකින් පසුව තමයි මෙම පත් කිරීම් දීර්ඝ කළ යුතුව තිබුණේ. නමුත්, දහනව වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ජනාධිපතිවරයා විසින් නම් එවන්නේ නැත්නම් තිබෙන කොමිෂන් සභාවම ඉස්සරහාට යන තත්ත්වයක් නිර්මාණය වී තිබුණා. ඒ නිසා සියලු කොමිෂන් සභාවලට අදාළව යම් ඇගැයීමකට භාජනය කිරීමෙන් පසුව ඒ සාමාජිකයන්ගේ පත් කිරීම් දීර්ඝ කළ යුතුව තිබුණත්, එසේ ඇගැයීමකට භාජනය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අසමත් වී තිබෙනවා. ඒ පිළිබඳව කථානායකවරයාත් යම් ප්‍රමාණයකට වග කිව යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගැනත් යමක් කිව යුතුයි. ඉස්සෙල්ලාම මම එහි නිලධාරින්ගේ ගැටලු පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්නම්. නීතිපති දෙපාර්තමේන්තුවේ, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරින් සියලුදෙනාම 1994 සිට නීති නිලධාරි සේවා ගණයේ පිහිටුවා තිබුණා; 2006 සහ 2016 වැටුප් චක්‍ර ලේඛන මඟින් SL5 වැටුප් තලයේ, නීති නිලධාරි සේවා ගණයේ තබා තිබුණා. නමුත්, 2018 සිට නීතිපති දෙපාර්තමේන්තුවේ සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට වෙනම වැටුප් ලබා දීම සිදු වුණා. ඊට අමතරව අධිකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ 01/2018 මඟින් විශාල ප්‍රමාණයක් දීමනා ලබා දී තිබෙනවා. අධිචෝදනා පත්‍ර ඉදිරිපත් කිරීමට බලය ඇත්තේ නීතිපති දෙපාර්තමේන්තුවට සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පමණි. මෙම නීති නිලධාරින් දෙගොල්ලන්ගේම මූලික රාජකාරිය විමර්ශනවලට උපදෙස් ලබා දී, නඩු පවරා, අධිකරණයේ පැමිණිල්ල මෙහෙයවීමයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරින් දිවයින පුරාම අල්ලස් හා දූෂණ වැළැක්වීමේ කටයුතුවල නිරතවෙමින් සිටිනවා. අල්ලස් හා දූෂණ තුරන් කිරීම ගැන බොහෝ කථා තිබුණත් නීතිපති දෙපාර්තමේන්තුවේ සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නීති නිලධාරින්ට ලබා දුන් වැටුප් වැඩි කිරීම් හා දීමනා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරින් 28 දෙනාට ලබා නොදෙන්නේ ඇයි කියලා මම දැන ගන්නට කැමැතියි. මොකද, මීට පෙර නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරිනුත් හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරිනුත් සමාන්තර වැටුප් තලයක පිහිටුවා තිබුණත් අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කටයුතු කරන නීති නිලධාරින් 28 දෙනාට යම් අසාධාරණයක් සිදුවෙලා තිබෙනවා.

ඔවුන්ගේ වැටුප් තල පිළිබඳව එවැනි අසාධාරණයක් තිබෙන අතර, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කාර්ය භාරය ගැන මම අවධානය යොමු කරවන්නට කැමැතියි. අපේ රටේ මහ ජනයාගේ දේපොළ හොරකම් කිරීම, රාජ්‍යයෙන් කාර්යයක් කර ගැනීම සඳහා අල්ලස් ලබා දීම ආදී ඉතාමත් බරපතළ ගණයේ චෝදනා, පැවති හැම ආණ්ඩුවකටම එල්ල වී තිබෙනවා. පැවති හැම ආණ්ඩුවකම අමාත්‍යවරුන්ට, ජනාධිපතිවරයාට, අග්‍රාමාත්‍යවරයාට මෙවැනි චෝදනා එල්ල වී තිබුණා. පසුගිය දශක ගණනාව මුළුල්ලේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවනු ලැබූ දවසේ සිට අමාත්‍යවරුන්, ඉහළ නිලධාරින් පිළිබඳව විශාල පැමිණිලි ප්‍රමාණයක් ගොනු කොට තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා සතුව තිබෙන වාර්තාව අනුව 2018 වසරේ නඩු පවරා තිබෙන්නේ කාටද? මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 16ක් පවරලා තිබෙනවා. ඒ 16 තුළ, විදුලිබල අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා, හිටපු නීතිපතිවරයා, අභියාචනාධිකරණයේ විනිසුරුවරු, හිටපු නගරාධිපති, හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙකු, පොලිස් පරීක්ෂක, පොලිස් කොස්තාපල්, රජයේ සේවකයන් නොවන දෙදෙනෙකු, හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙකු, පොලිස් ආරක්ෂක සහායකයකු, කාර්යාල කාර්ය සහායක කෙනෙකු සහ ග්‍රාම නිලධාරිවරයෙක් සිටිනවා. මේ අයට තමයි මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 16 පවරා තිබෙන්නේ. පහත් තැනින් යයි ගලා, ජලේ වාගේ තමයි. කල්පනා කරලා බලන්න.

ඊළඟට, මහාධිකරණයේ නඩු 36ක් පවරලා තිබෙනවා. කාටද මහාධිකරණයේ නඩු පවරා තිබෙන්නේ? පොලිස්

[ගරු අනුර දිසානායක මහතා]

පරීක්ෂකවරයෙකුට - IP මහත්මයෙකුට - විදුලි අධිකාරී කෙනෙකුට, විදුහල්පතිවරයෙකුට, මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරීන් දෙදෙනෙකුට, බිට්ටු වන නිලධාරියකුට, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුට, උප පොලිස් පරීක්ෂක මහත්මයෙකුට, සෞඛ්‍ය කාර්ය සහායක කෙනෙකුට, ග්‍රාම නිලධාරීන් පස් දෙනෙකුට, පොලිස් සාජන්ට්ලා පස් දෙනෙකුට, තාක්ෂණ නිලධාරියෙකුට, නියෝජ්‍ය විදුහල්පතිවරයෙකුට, සහකාර විකුණුම් කළමනාකාරවරයෙකුට, සිවිල් පුද්ගලයන් හත් දෙනෙකුට, පොලිස් කොස්තාපල්වරුන් තුන් දෙනෙකුට, යුද හමුදා සෙබළෙකුට, කාර්යාල කාර්ය සහායක කෙනෙකුට, - ලිපි එහෙට මෙහෙට ගෙන යන කෙනෙකුට-, විදුලි ශිල්පියෙකුට, කම්කරු නිලධාරියෙකුට, ගබඩා භාරකරුවෙකුට සහ පවිත්‍රාගාර යන්ත්‍ර ක්‍රියාකරුවෙකුට. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් මහේස්ත්‍රාත් අධිකරණයේත්, මහාධිකරණයේත් නඩු පවරා තිබෙන්නේ කාටද? හැබැයි, අපි ඉතා වගකීමෙන් කියනවා 2015න් පසුව "දූෂණ විරෝධී හඬ" විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කළ බව. ඒක ඇතුළේ හිටපු ජනාධිපතිගේ ආර්යාව ඉන්නවා; හිටපු ජනාධිපතිගේ පුත්තු ඉන්නවා; ඇමතිවරු ඉන්නවා; නියෝජ්‍ය ඇමතිවරු ඉන්නවා. 2015ට පෙර පැවති ආණ්ඩුව පිළිබඳව විශාල ප්‍රමාණයක් චෝදනා ඉදිරිපත් වුණා. 2015න් පසුව පැමිණිලි ඉදිරිපත් කළ අය අතර අග්‍රාමාත්‍යවරු ඉන්නවා; සෞඛ්‍ය අමාත්‍යවරු ඉන්නවා.

කිරිඇල්ල ඇමතිතුමාගේ කාලයේ නොවෙයි, ඊට පෙර මාස අටේ මාර්ග සංවර්ධන ඇමතිතුමා ඉන්නවා. 2015 අගෝස්තු, මාසය දක්වා සිටි මාර්ග සංවර්ධන ඇමතිතුමා ඉන්නවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම නැහැනේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඊට්පස්සේ ඔබතුමාගේ තියෙන්නේ. මෙහෙම නේ වෙලා තියෙන්නේ. දැන් මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව නඩු පවරන්නේ කාටද? මේ අය කවුද? කොස්තාපල්වරු තුන්දෙනායි; ග්‍රාම නිලධාරීන් 5 දෙනායි; කාර්යාල කාර්ය සහායකවරයෙක්; TO මහත්වරු දෙන්නෙක්. මෙහෙමද, වංචා දූෂණ තිබෙන්නේ? අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යම් දේශපාලන හස්තයක වුවමනාව මත මැදිහත් වෙන ආයතනයක් බවට පත් වී තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ඉතා වගකීමෙන් කියන්නේ. පැමිණිලි විශාල සංඛ්‍යාවක විමර්ශන කටයුතු අවසන්කොට තිබුණත් කොමිෂන් සභාව විසින් නිසි අනුමැතිය ලබා දෙන්නේ නැහැ, නඩු ගොනු කරන්න. ඒක, දේශපාලන හස්තයන් විසින් මෙහෙයවනු ලබනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ දේශපාලන හස්තයන්ට අවශ්‍ය වෙන පරිදි අල්ලස් නඩුව දමන්නේ මොකකටද, අල්ලස් නඩුව ඉවත් කරන්නේ මොකකටද, පරීක්ෂණ කරන්නේ මොකකටද, පරීක්ෂණ පැත්තක තියන්නේ මොකකටද කියන්න මේ පාර්ලිමේන්තුව සල්ලි වෙන් කරලා දෙන්න ඕනෑද? ඒ නිසා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අද ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේ ඉතාම පහළ ගණයේ රාජ්‍ය නිලධාරියෙක් හෝ පොලිස් කොස්තාපල්වරයෙකු හෝ කාර්යාල කාර්ය සහායකයෙකුට එරෙහිව නඩු පවරන්නයි. ඒ ඇරුණුකොට මේ රටේ මහාපරිමාණ වංචා දූෂණවලට හවුල් වූ දේශපාලනඥයන් කිසිම කෙනෙකුට විරුද්ධව නඩුවක් පවරන්න සූදානම් වෙලා නැහැ, 2018 වසරේම. කවුරු හරි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙනුවෙන් පාර්ලිමේන්තුවේ පිළිතුරු දෙයි. මා හිතනවා, ජනාධිපතිවරයා මේ ගැන පිළිතුරු දෙන්න ඕනෑ කියලා. මොකද, එතුමා තවමත් මේ පාර්ලිමේන්තුවට නොකියූ කථාවක් තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරිය ඉවත්කොට නව අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත් කළේ ඇයි කියා එතුමා මේ පාර්ලිමේන්තුවට කියන්න ඕනෑ. මොකද, පාර්ලිමේන්තුව තමයි මුදල් වෙන් කරලා තියෙන්නේ; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සම්මත කරලා දුන්නේ; ඊට අමතරව, ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තා මත පදනම්ව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට නඩු පවරන්න පුළුවන් කියා මීට මාසයකට පෙර නීති සම්පාදනය කර දුන්නා. පාර්ලිමේන්තුව සල්ලි වෙන් කර දෙනවා නම්, පාර්ලිමේන්තුව නීති සම්පාදනය කර දීලා තිබෙනවා නම්, ඒ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය වෙනුවට වෙන කෙනෙක් දැම්මේ ඇයි කියලා මේ පාර්ලිමේන්තුවට ජනාධිපතිවරයා කියන්න ඕනෑ. මම අද බොහොම කැමැත්තෙන් මේ විවාදයට සම්බන්ධ වුණේ. මොකද, මේ විවාදයේ බොහෝ කරුණු තිබෙනවා, ජනාධිපතිවරයාත් එක්ක බේරාගන්න. ඒ නිසා අපි අපේක්ෂාවකින් සිටියා, අඩුම තරමේ අදවත් ජනාධිපතිවරයා ඇවිල්ලා තමන්ගේ වැය ශීර්ෂය, තමන්ට පැවරී තිබෙන කාර්යභාරයන් පිළිබඳව සාකච්ඡා කරනකොට මේ පාර්ලිමේන්තුවේ සිට ඒවාට නිසි පිළිතුරු ලබාදේවි කියා. හැබැයි, මා දන්නේ නැහැ, එතුමා අද එනවාද නැද්ද කියන්න. ඒකයි මම කියන්නේ. ඒ නිසා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අක්‍රිය වීම පිළිබඳව ජනාධිපතිවරයා සෘජුවම වග කිව යුතුව තිබෙනවා. ඒ නිසා ඒ වගකීමට එතුමා මේ පාර්ලිමේන්තුවට පිළිතුරු සැපයිය යුතුව තිබෙනවා. නමුත් තවමත් පිළිතුරු සපයා තිබෙන බවක් පෙන්නුම් කරන්නේ නැහැ.

ඊළඟට, මේ පාර්ලිමේන්තුව ගැන කෙටියෙන් කියන්න මම කැමැතියි, මේ වේලාවේ පාර්ලිමේන්තු මහ ලේකම්තුමාත් ඉන්නා නිසා. පාර්ලිමේන්තු නිලධාරීන්ගේ වැටුප් සංශෝධනයන් පිළිබඳව හොයා බලන්න හෙට්ටිආරච්චි කමිටුව පත් කළා. ඒ වාර්තාව මත පදනම්ව ඔවුන්ගේ දීමනාවන් සහ වැටුප් පිළිබඳව ඇති වී තිබෙන ගැටලු ඉදිරියේදී ඉතා ඉක්මනින් නිරාකරණය කරාවි කියා බලාපොරොත්තු වෙනවා. ඊළඟට, පාර්ලිමේන්තුවේ තවත් කාරණා කිහිපයක් සම්බන්ධයෙන් මම අවධානය යොමු කරවන්න කැමැතියි. එකක් තමයි ලොකු TV සවි කිරීම. මේ සභාවේ තිබුණු ඔරලෝසුවත් ගලවා අලුත් ඔරලෝසුවක් සවි කළා. ඒ ඔර්ලෝසුවෙන් ඒ කාලයේත් අපි වේලාව බැලුවා. අපට වේලාවේ ප්‍රශ්නයක් ආවේ නැහැ. නමුත් තිබුණු ඔරලෝසු ගලවා අලුත් ඔරලෝසු සවි කළා. මෙහි ඇති sound system එක වෙනස් කළා. විද්‍යුත් ක්‍රමයට ඡන්දය පාවිච්චි කරන්න අවස්ථාවක් හදලා දුන්නා. දැන් අවස්ථා ගණනාවක්ම විද්‍යුත් ක්‍රමයට ඡන්දය පාවිච්චි කළා. විද්‍යුත් ක්‍රමයට ඡන්දය පාවිච්චි කරලා මොකද කරන්නේ? නැවත අත ඔසවන්න ඕනෑ. නම කියැවුණේ නැති අය කවුද, ඡන්දය සඳහන් නොවුණු අය කවුද කියා සොයන්න ඕනෑ. භාගෙට විද්‍යුත්; භාගෙට අතින් තමයි වැඩ කරන්නේ. මෙහෙම යන්ත්‍රයක් මොකටද? මහජනයාගේ ධනය අපේ ඇස් ඉදිරිපිටත් මේ විධියට නාස්ති වෙමින් තිබෙනවා. මම එක නිලධාරී මහත්මයෙක්ගෙන් ඇහුවා, ඒක වැඩ කරන්නේ නැත්තේ ඇයි කියලා. සමහර අයගේ ඇඟිලිවල රේඛා මැකිලා ලු. සියයට10 ලු sensitive වෙන්නේ. එහෙම නම්, ගේන්න ඕනෑ එක ඒකද? මේකේ ඉන්න අය ගැන අපි හොඳට දන්නවා. 70 පැනපු අය ඉන්නවා; 80 පැනපු අය ඉන්නවා; 80ට කිට්ටු අය ඉන්නවා. රේඛා මැකිලා නම්, ඒකට ගැළපෙන එකක් සවි කරන්න සමත් වෙන්න ඕනෑ. හැමදාම මේ විද්‍යුත් ක්‍රමය උපයෝගී කර ගන්නවා, ඡන්දය ගණන් කිරීම සඳහා. ඊළඟට, සේවක මහත්වරු එක එක්කෙනා ළඟට ගිහිල්ලා ඇඟිලි

තියලා ඔබ්බවන්න ඕනෑ. එහෙම නැත්නම් අනික් අය නැගිටලා අත උස්සන්න ඕනෑ. අත උස්සපු අය වෙන වෙනම කියන්න ඕනෑ. ඊට පස්සේ අත උස්සනකොට කියනවා, මගේ ඡන්දය ප්‍රකාශයට පත් වෙලා නැහැ කියලා. ඒ නිසා මම නිකම් අත උස්සන්න ඕනෑ. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නාස්තිකාර වියදම් අපේ ඇස් ඉදිරිපිටත් මේක ඇතුළේ සිද්ධ වෙන බව මම මතක් කරන්න කැමැතියි.

ඊළඟට, උපරිමාධිකරණවල විනිසුරුවන් පිළිබඳව කියන්න ඕනෑ. පසුගිය කාලයේ උපරිමාධිකරණ විනිසුරුවන් සඳහා විශාල වැටුප් වැඩි කිරීමක් ලබා දී තිබුණා. හැබැයි, අද අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයේ තත්ත්වය බලන්න. යම් වින්දිතයෙකුට සාධාරණයක් ඉටු කර ගැනීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම අද අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය ගන්නා ක්‍රියාමාර්ගය පිළිබඳව සෑහීමකට පත්විය හැකිද? ගරු සභාපතිතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණය හැර අනෙක් ඕනෑම අධිකරණයක් නඩුවක් අසා, නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත් කරන දිනය ප්‍රකාශ කරනවා. නඩුව අහලා, අහවල් දිනයේ තීන්දුව දෙනවා කියනවා. නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණය නඩුව අහනවා; නඩුව අවසන් කරනවා; තීන්දුව දෙන දිනයක් කියන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර තීන්දු දෙන්න ශ්‍රේෂ්ඨාධිකරණය අවුරුදු දෙක තුන පමා වෙලා තිබෙනවා. ඒ නඩුවේ තීන්දුව දෙනකොට ඒ නඩුව ඇසූ විනිසුරුවරයා විශ්‍රාම ගිහිල්ලා.

විනිසුරුවරුන්ගේ වැටුප් වැඩි කර තිබෙන්නේ වින්දිතයන්ට යම් සාධාරණයක් ඉටු කර ගැනීමේ අරමුණින්. අද වනවිට බොහෝ අවස්ථාවල ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඒ අරමුණ ඉටු නොවන බව තමයි පෙන්නුම් කරමින් තිබෙන්නේ. මා, අධිකරණ පද්ධතිය පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගන්නා අවස්ථාවේදී වෙනම කථා කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නේ. අධිකරණ පද්ධතිය නඩු අහපු විධිය, නඩුවලට තීන්දු දෙන විධිය සම්බන්ධයෙන් මම ඒ අවස්ථාවේදී කියන්නම්.

දැන් තවත් සම්ප්‍රදායක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණ පවත්වනවා. ඒ පරීක්ෂණවලින් හෙළිවන කරුණු මත පදනම්ව නීතිපති දෙපාර්තමේන්තුව නඩුවක් ගොනු කරනවා. නීතිපති දෙපාර්තමේන්තුව ගොනු කරන ලද නඩුව මත පදනම්ව අධිකරණය එය වග විභාගයට ලක් කොට තීන්දුවක් ලබා දෙනවා. පරීක්ෂණ පැවැත්වීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවකුත්, ඒ පරීක්ෂණ මත පදනම්ව නඩු ගොනු කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවකුත්, ඒ ගොනුවන නඩු වග විභාග කරන්න අධිකරණ පද්ධතියකුත් අපට තිබෙනවා. හැබැයි, දැන් අපේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇතිවී තිබෙන සුලබම ක්‍රියාදාමය බවට පත්වී තිබෙන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණයේ ඉදිරි කටයුතු කරමින්-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අපේ අනෙක් මන්ත්‍රීතුමාගේ කාලයත් ගන්නවා.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණය සිදුවෙමින් තිබෙන අතර, ඒ පරීක්ෂණයේ එක් පියවරක් තමයි, යම් සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම. ඒක පරීක්ෂණ ක්‍රියාවලියේ කොටසක්. හැබැයි, දැන් ශ්‍රේෂ්ඨාධිකරණයේ සම්ප්‍රදායක් බවට පත්වෙමින් තිබෙනවා, එම පරීක්ෂණ ක්‍රියාවලිය හා සම්බන්ධ අත්අඩංගුවට ගැනීම අත්හිටුවමින් නියෝග දෙන එක. පසුගිය කාලය පුරාවටම ධනවත්, බලවත් අයට ඒ දේ කළා. දැන් ගමේ පොලිසිය හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණයක් කරන කොට සැකකරුවෙකු අත්අඩංගුවට ගන්නවා; මහේස්ත්‍රාත් අධිකරණයේදී ඒ සැකකරු රිමාන්ඩ්භාරයට දමන්න නියම කරනවා. ඒක සාමාන්‍ය ක්‍රියාදාමය. හැබැයි, අපේ රටේ ධනවත්, බලවත් අය විශාල මුදලක් දී මිලදී ගත හැකි රටේ සිටින ප්‍රසිද්ධ lawyersලා මිලදී ගන්නවා. ඔවුන් හරහා ශ්‍රේෂ්ඨාධිකරණයට යනවා. එලෙස ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා අත් අඩංගුවට ගැනීම වැළැක්වීමේ නියෝග ගන්න අද පටන් ගෙන තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයත් අද ඒ වර්ගයේ නියෝග දෙනවා. සමහර නියෝග ලබා දී තිබෙනවා, එම නඩුව අසා අවසන් වන තෙක් සමහර සැකකරුවන් අත්අඩංගුවට ගන්න බැහැයි කියලා. හැබැයි, ඒ නඩුව අහන දිනයකුත් නැහැ. සමහර විට ඒ විනිසුරුවරයා ඒ නඩුවෙන් ඉවත්වනවා; සමහර අය විශ්‍රාම යනවා. හැබැයි, නඩුව අහන්නේ නැහැ, අත්අඩංගුවට ගැනීමට වාරණ ඉදිරිපත් කර තිබෙනවා. එම නිසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලියට අද ශ්‍රේෂ්ඨාධිකරණය අනියම් මැදිහත්වීමක් කරමින් තිබෙනවා. හැබැයි, හැම සැකකරුවෙකුටම මේ අවස්ථාව ලැබෙන්නේ නැහැ. විශේෂයෙන් ගමේ සාමාන්‍ය කෙනෙකුට මෙහෙම අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. අද ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දෙන මෙවැනි තීන්දු උපයෝගී කර ගෙන සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පරීක්ෂණ පැවැත්වීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තිබෙන බලයට, ධනය ඇති, බලය ඇති කණ්ඩායම් මැදිහත් වෙමින් සිටිනවා. එම නිසා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ වැටුප් වැඩි කර දෙනවා වාගේම, මේ ක්‍රියාදාමයත් අපි සැලකිල්ලට භාජන කළ යුතුව තිබෙනවාය කියලා මා හිතනවා.

ඊ ළඟට, මම තවත් කරුණකට අවධානය යොමු කරනවා. අභියාචනාධිකරණයට ජනාධිපතිවරයාගේ මැදිහත්වීම මේ වනවිට විශාල ලෙස ආන්දෝලනයට තුඩු දී තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අභියාචනාධිකරණයේ සභාපතිවරයා විශ්‍රාම ගියාට පසුව, අභියාචනාධිකරණයේ ඇතිවන ඕනෑම පුරප්පාඩුවක් පිරවිය හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවටයි. ජනාධිපතිවරයා විසින් අභියාචනාධිකරණයේ සභාපති ධුරය සඳහා නම් කර එවන කෙනා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අවස්ථා දෙකකදී ප්‍රතික්ෂේප කර තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එම ප්‍රතික්ෂේප කිරීම සඳහා උපයෝගී කර ගෙන තිබෙන්නේ, සභාවේම සාධකවලට වඩා, අග්‍ර විනිශ්චයකාරතුමා විසින් ලබා දෙන ලද නිර්දේශයයි. මේක එසේ සිදු වූ පළමුවෙනි අවස්ථාව නොවෙයි. අභියාචනාධිකරණ විනිසුරුවන් පත් කිරීමේදීත් සෑම විටම සැලකිල්ලට භාජන කළා, අග්‍ර විනිශ්චයකාරතුමාගේ නිර්දේශය. එම නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එක්වරක් ප්‍රතික්ෂේප කොට තිබියදී ජනාධිපතිවරයා විසින් නැවත එම නමම යෝජනා කළාට පසුව, අග්‍ර විනිශ්චයකාරවරයාගේ නිර්දේශය මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නැවත එම නම ප්‍රතික්ෂේප කරනු ලැබුවා. දැන් අපේ රටේ අභියාචනාධිකරණය සමන්විත වන්නේ සභාපතිවරයෙකු සහ විනිසුරුවන් 11දෙනෙකුගෙන්. සභාපතිවරයෙකු නැත්නම් තවදුරටත් අභියාචනාධිකරණයක් නැහැ. හැබැයි, දැන් ජනාධිපතිවරයා මොකක්ද කරන්නේ? එතුමා සති දෙකෙන් දෙකට අභියාචනාධිකරණයේ සභාපති ධුරයට වැඩ බලන පත්වීමක් දෙමින් යනවා. මේකේ අරමුණ කුමක්ද? ජනාධිපතිවරයාට අභියාචනාධිකරණයේ සභාපති ධුරයට වැඩ බලන පත්වීමක් කරන්නත් බැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය නැතිව.

[ගරු අනුර දිසානායක මහතා]

වැඩ බලන පත්වීමක් කරන්න කලින්, පත් කිරීමක් තිබෙන්න ඕනෑ. වැඩ බැලීමේ පත්වීමක් කළ හැක්කේ කොහොමද ගරු සභාපතිතුමනි? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109(1) ව්‍යවස්ථාවේ මේ විධියට සඳහන් වනවා.

"රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට අග්‍ර විනිශ්චයකාරවරයා හෝ අභියාචනාධිකරණයේ සභාපතිවරයා හෝ තාවකාලිකව අපොහොසත් වේ නම්, එම කාලසීමාව තුළ පිළිවෙළින් අග්‍ර විනිශ්චයකාර ධුරයේ හෝ අභියාචනාධිකරණයේ සභාපති ධුුරයේ හෝ වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නැතහොත් අභියාචනාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයකු පත් කළ හැක්කේ ය."

මේ අනුව, වැඩ බැලීමේ පත්වීමක් කරන්න නම් මොකක්ද සිදු වන්නේ ඕනෑ? ඉස්සර වෙලාම අභියාචනාධිකරණයේ සභාපති තනතුරට පත් කර තිබෙන්න ඕනෑ. අභියාචනාධිකරණයේ සභාපති ධුරය හිස් වෙලා තිබියදී වැඩ බලන පත් කිරීමක් කරන්න බැහැ. පළමු කොටම අභියාචනාධිකරණයේ සභාපතිවරයා පත් වෙන්න ඕනෑ. එම පත් වෙච්ච සභාපතිවරයාට වැඩ කරගෙන යන්න බැරි නම්, ඔහු විදේශගත වෙනවා නම්, ඔහු රෝගාතුර වනවා නම්, අන්න ඒ වෙලාවට විතරයි වැඩ බලන්න කෙනකු පත් කරන්න පුළුවන්. දැන් මොකක්ද මේ ජනාධිපතිවරයා කරමින් තිබෙන්නේ? මේ ජනාධිපතිවරයා අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුළුමනින්ම කඩල ඔතන කඩදාසියක් තරමට වත් ගණන් ගන්නේ නැති ජනාධිපතිවරයෙක්. ඒක මතක තබා ගන්න. මා එතුමා ගැන කියන්නම්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩල ඔතන කඩදාසියක් ගණනට වත් ගණන් ගන්නේ නැහැ, මේ ජනාධිපතිවරයා. ආණ්ඩුක්‍රම ව්‍යස්ථාව අනුවත් ජනාධිපතිවරයාට අභියාචනාධිකරණයේ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා පත් කරන්න බැහැ. පත් කළ හැකි වන්නේ කෙසේද? අභියාචනාධිකරණයේ සභාපති ධුරයට පත් කොට, ඔහු අකර්මණ්‍ය වනවා නම් විතරයි වැඩ බලන සභාපතිවරයකු පත් කරන්න පුළුවන්කම තිබෙන්නේ. මෙය ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් මට්ටමකට සැලකිල්ලකට භාජන කළොත් මොකද වෙන්නේ? කවුරුන් හෝ යන්න ඕනෑ, අධිකරණයට. මා දන්නේ නැහැ ඒ ගැන. අභියාචනාධිකරණය විසින් අසන ලද සියලු නඩු ගැන ප්‍රශ්න කරන්න පුළුවන්. ඕනෑම වරදකරුවකුට ශ්‍රේෂ්ඨාධිකරණය ගිහින් ප්‍රශ්න කරන්න පුළුවන්, අභියාචනාධිකරණයේ සභාපති ධුරය නිසි පරිදි ස්ථාපිත වී නැති බව කියමින්. ඇයි ඒ? අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් තමයි ඒ ඒ නඩුවලට අවශ්‍ය වන විනිශ්චය මණ්ඩල පත් කරන්නේ. ඒ වාගේම අභියාචනාධිකරණයේ සභාපතිවරයාට පුළුවන්, යම් නඩුවක් තමන් අතට පවරා ගන්න. ඒ නිසා අභියාචනාධිකරණය පවත්වාගෙන යෑමේදී අතිශය වැදගත්, සභාපති ධුරය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙතින් අවස්ථා දෙකකදී ප්‍රතික්ෂේප වී තිබියදී නැවත නැවත කරන වැඩ බැලීමේ පත් කිරීම් හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනාධිපතිවරයා විසින් අමු අමුවේම උල්ලංඝනය කරමින් සිටිනවා, ගරු සභාපතිතුමනි.

ඊළඟට, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව ගෙන බලමු. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පත් කරන කොට අපේක්ෂාව වුණේ මේකයි.

"රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ නියාමන ආයතනය වනුයේ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවයි. එසේ වුවත් විධායකය විසින් කොමිෂන් සභාවේ කාර්ය භාරය බරපතළ ලෙස අක්‍රිය කරමින් තිබේ. ප්‍රසම්පාදන තීරණයකදී අසාධාරණයට ලක් වූ ලංසුකරුවන්ට ඒ සඳහා අභියාචනා කිරීමේ නියාමනයද කොමිෂන් සභාවේ විෂයය පථයට ඇතුළත් විය යුතුය."

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ වගකීම, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156(ඇ)(2) යටතේ රජයේ ආයතන විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු පූර්වයේ අනුමත වූ ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව පිළියෙල කරන ලද ප්‍රසම්පාදන ක්‍රම මත පදනම්ව ඇද්ද යන්න නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීමත්, සියලු සුදුසුකම් ලත් ලංසුකරුවන්ට ලංසු තැබීමේ ක්‍රියාවලියට සහය වීම පිණිස සමාන අවස්ථා ලබා දී ඇතිද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධාරින්ට වාර්තා කිරීමත් කොන්ත්‍රාත්කරුවන් තේරීම සහ කොන්ත්‍රාත් ලබා දීමේ ක්‍රියා පටිපාටිය සාධාරණ හා විනිවිද පෙනෙනසුලු වන්නේද යන්න නියාමනය කොට උචිත බලධාරින් වෙත වාර්තා කිරීමත්, ප්‍රසම්පාදනයන්ට සමන්විත සැපයීම් කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකත්වය යෝග්‍ය පරිදි සුදුසුකම් ලබා ඇද්ද යන්න පිළිබඳව වාර්තා කිරීමත්, රජයේ ආයතන විසින් පිළිගත් පටිපාටිවලින් හා මෙහෙයුම් නිර්ණායකවලින් බැහැරව කරන ලද ප්‍රසම්පාදන වාර්තා විමර්ශනය කිරීම සහ එකී ප්‍රසම්පාදන සම්බන්ධ වග කිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග සඳහා අදාළ බලධාරින්ට වාර්තා කිරීමත් ය."

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්වාධීන ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව ගොඩ නැඟෙන්නේ කුමක් වෙනුවෙන්ද? මිල දී ගැනීම්, කොන්ත්‍රාත් ලබා දීම් අයථා ලෙස සිදු වීම අද සුලභ දෙයක් බවට පත් වී තිබෙනවා. ඒ නිසා එම ආයතනවලට උඩින් සිට මෙම ක්‍රියාවලිය පිළිබඳව මැදිහත් සිතින් ස්වාධීනව සමීක්ෂණය කිරීම සඳහා තමයි මෙම ආයතනය පිහිටුවා තිබෙන්නේ. හැබැයි දැන් ජනාධිපතිවරයා මොකක්ද කරන්නේ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ළඟ තිබෙනවා රජයේ ප්‍රසම්පාදනය සඳහා වන අභියාචනා කාර්ය පටිපාටිය. එතුමා විසින් 2018 ජනවාරි මාසයේ 09 වන දා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවක් තිබෙනවා. ඒ කැබිනට් පත්‍රිකාවේ මොකක්ද කියන්නේ? එහි මෙසේ සඳහන් වෙනවා.

"එබඳු අවස්ථාවලදී ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් මෙම පැමිණිලි විභාග කර ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කළ හැකි නමුත් ඔවුන්ගේ නිර්දේශ නිසි බලධාරින් වෙත නියාමනය කිරීමට හා වාර්තා කිරීමට එම කොමිෂන් සභාව සතු විධි නියෝගයන්හි කොටසක් ලෙස පමණක් සැලකිය යුතුය."

මා ඒ අවසන් කොටස ආපසු කියවන්නම්.

"ඔවුන්ගේ නිර්දේශ නිසි බලධාරින් වෙත නියාමනය කිරීමට හා වාර්තා කිරීමට එම කොමිෂන් සභාව සතු විධි නියෝගයන්හි කොටසක් ලෙස පමණක් සැලකිය හැකිය.

මෙම නිර්දේශ සැබැවින්ම ඵලදායී වන නමුදු ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සතුව විධාන කිරීමට බලයක් නොමැති බැවින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට රජයේ නිලධරයන් බැඳී නැත. අමාත්‍යාංශ ලේකම්වරු එපරිද්දෙන් දැනුවත් කළ හැකිය."

දැන් ජාතික ප්‍රසම්පාදන කොමිසමක් තිබෙනවා. ජාතික ප්‍රසම්පාදන කොමිසමෙන් දෙන නිර්දේශයන් සම්බන්ධයෙන් මේ ජනාධිපතිවරයා කැබිනට් පත්‍රිකාවක් දාලා කියනවා, "කොමිෂන් සභාව සතුව විධාන කිරීමට බලයක් නොමැති බැවින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට රජයේ නිලධරයන්ට බැඳී නැත කියලා. එහෙනම් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවක් මොකටද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

Order, please! The Hon. Mayantha Dissanayake will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. MAYANTHA DISSANAYAKE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන බරපතළ ලෙස ව්‍යවස්ථා උල්ලංඝනය කිරීමක් සිදු වී තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත පවරා තිබෙන බලතල ජනාධිපතිවරයා කැබිනට් පත්‍රිකාවක් මඟින් පවරාගෙන තිබෙනවා. "රජයේ ප්‍රසම්පාදන සඳහා වන අභියාචන කාර්ය පටිපාටිය" කියලා කැබිනට් පත්‍රිකාවක් දාලා, ජනාධිපති ලේකම් කාර්යාලය පිහිටුවා තිබෙනවා. ජනාධිපති ලේකම් කාර්යාලයේ පිහිටුවා තිබෙන අභියාචනා කමිටුවට ජනාධිපතිවරයාගේ ජීවාත් බලන්න අයිතිය තිබෙනවාද; ඒවා බලයි කියලා විශ්වාස කරනවාද; ඒවා පරීක්ෂා කරයි කියලා විශ්වාස කරනවාද? එහෙම විශ්වාසයක් නැහැ. ඒ නිසා තමයි ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවක් පත් කළේ. හැබැයි, ජනාධිපතිවරයා මොකක්ද කරලා තිබෙන්නේ? එතුමා කැබිනට් පත්‍රිකාවක් දානවා. ඒ කැබිනට් පත්‍රිකාව අනුව එම ප්‍රසම්පාදන ක්‍රියාවලියත් තමන්ගේ අතට ගන්නවා. හැබැයි, තිබෙන පුදුමය මොකක්ද? මේ සඳහා කැබිනට් මණ්ඩලය අනුමැතිය දෙනවා. ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමනි, ඔබතුමා මේ කටයුත්තට අනුමැතිය ලබා දුන්නාද? තමුන්නාන්සේ මේක පිළිගන්නවාද? ජාතික ප්‍රසම්පාදන කොමිසමේ තිබෙන බලය ජනාධිපතිවරයා විසින් පිහිටුවන ලද අභියාචන කමිටුවක් වෙතට පවරා ගැනීම ඔබතුමා අනුමත කරනවාද? තමුන්නාන්සේලා 2018 පෙබරවාරි මාසයේ 14 වැනිදා කැබිනට් පත්‍රිකාවක් අනුමත කරලා දීලා තිබෙනවා නේ. මා ළඟ එම අනුමත කරපු කාර්ය සටහන් තිබෙනවා. ඒ වාගේම ඉදිරිපත් කරපු එම කැබිනට් පත්‍රිකාවත් තිබෙනවා. දැන්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට අපි සල්ලි වෙන් කරන්නේ මොකටද? ඒකේ නියෝග පිළිගන්න බැහැ කියලා ජනාධිපතිවරයා කැබිනට් පත්‍රිකාවක් දානවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමා එතැනදීත් ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙනවා. ජනාධිපතිවරයා ව්‍යවස්ථාව උල්ලංඝනය කරපු බව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඔප්පු වී තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව විසුරුවා හරින්න ජනාධිපතිවරයාට හැකියාවක් නැහැ. හත් දෙනෙකුගෙන් යුතු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු මඩුල්ලක් ඒකමතිකව තීරණය කරලා තිබෙනවා, ජනාධිපතිවරයා ව්‍යවස්ථාව කඩලා තිබෙන බව. ඒ විතරක් නොවෙයි. ජනාධිපතිවරයා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. ඒක හොඳද නරකද කියන එක වෙනම කාරණයක්. හැබැයි, ඒ අනුව ජනාධිපතිවරයාට කළ හැකි වන්නේ අගමැතිවරයා විසින් එවන නම්වලට අමාත්‍ය ධුර ලබා දීම විතරයි. හැබැයි, අග්‍රාමාත්‍යවරයා නම් යවන්නේ නැතිව ජනාධිපතිවරයා විසින් අමාත්‍ය ධුර ලබා දුන්නා. එය මුළුමනින්ම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක්. ඒ විතරක් නොවෙයි, මම මේ කාරණයත් දැනගන්න කැමතියි. දින 52ක කාල සීමාවේ -ඒ ආසන්න දින 10 ඇතුළත- එක්තරා මුස්ලිම් මන්ත්‍රීවරයකු ගිහිල්ලා, ජනාධිපතිවරයා ඉදිරිපිට නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට දිවුරුම් දුන්නා. එතුමා කවුද කියලා රටට ඉදිරිපත් කරන්න. රූ කාමරේකට කවුරු හෝ කැඳවලා, නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යවරයා ලෙස දිවුරුම් දුන්නා. හැබැයි, ඒවා ගැන රටේ ජනතාව දන්නේ නැහැ. එතුමා නියෝජ්‍ය සෞඛ්‍ය ඇමති හැටියට දිවුරුම් දුන්නා. ඊට පස්සේ ඔහු ලංකාවෙන් එළියට -මක්කම- ගියා. ජනාධිපතිවරයාට මෙහෙම සෙල්ලම් කරන්න පුළුවන්ද කියලා අපි දැනගන්න කැමතියි. හිටපු ගමන් කෙනෙකු කැඳවනවා. ඊට පස්සේ ඔහු සෞඛ්‍ය ඇමති හැටියට දිවුරුම් දෙනවා. හැබැයි, මේවා රට දන්නේත් නැහැ; රටට මේවා වාර්තා වෙන්නේත් නැහැ. ඊට පස්සේ එතුමා ඇමතිද නැද්ද කියලා දන්නේත් නැහැ. රටේ ජනාධිපතිවරයෙකුට මෙහෙම විගඩම් කරන්න පුළුවන්ද? ඒ අනුව මේ ජනාධිපතිවරයා අවස්ථා ගණනාවකදී අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙනවා.

මෙහි තිබෙන බරපතළකම ගැන මා කියන්නේ වෙන කිසිවක් නිසා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ජනාධිපතිවරයාට ජනතාව විසින් ජන වරමක් ලබා දෙනවා. ඒ ජන වරම නැවත පරීක්ෂාවට භාජනය වෙන්නේ නැවත ජන වරමකදීයි. ඒ නිසා එතුමාට අවුරුදු පහක් ලබා දුන්නාම එතුමාට ඒ අවුරුදු පහේ බලය හෙබවීමට කාලය තිබෙනවා. ඒ කාරණය අපි පිළිගන්නවා. හැබැයි, එතුමාට සිතූ සිතූ දේ කරන්න බැරි බව තේරුම් ගත යුතුයි. ඒ කාලය තුළ දී එතුමාගේ බැඳීම තිබෙන්නේ කා සමඟද? එතුමාට බැඳීමක් තිබෙනවා, එතුමාට ඡන්දය ලබා දුන් ඡන්දදායකයන් සමඟ. හැබැයි, එතුමාගේ රාමුව කොහේද තිබෙන්නේ? එතුමාට සකස් කරලා දීලා තිබෙනවා, තමන්ට සෙල්ලම් කරන්න පුළුවන් රාමුව. ඒක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරයා ජන වරම ලබා ගත්දා සිට ඊළඟ ජන වරම දක්වා සිතූ සිතූ දේ කරන්න ගියොත් එවැනි රටකට කවර විපත්තියක් සිදු වේවිද?

ඒ නිසා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරන බවටත්, එයට ගරු කරන බවටත් ජනාධිපති ධුරය ලබා ගන්නකොට, අග්‍ර විනිශ්චයකාරවරයා ඉදිරිපිට දිවුරුම් දෙන්නේ. ඒ නිසා ඔහු තේරුම් ගත යුතුව තිබෙනවා, ඔහු බැඳී තිබෙන රාමුව කුමක්ද කියලා. මේ ජනාධිපතිවරයා මේ විධියට දැන් අවස්ථා පහ-හයකට වඩා වැඩිය ව්‍යවස්ථාව උල්ලංඝනය කර තිබෙනවා. ව්‍යවස්ථාව තමයි ඔහු සහ ජනතාව අතර තිබෙන බැඳීමේ ප්‍රකාශනය. ඒක තමයි නීතිමය ලියවිල්ල. හැබැයි, ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් කටයුතු කරන ජනාධිපතිවරයෙක් නම්; රටේ මූල් පුරවැසියා මූලික නීතිය කඩන කෙනෙක් බවට පත් වෙලා තිබෙනවා නම්, ඒ ජනාධිපතිවරයාට මේ රටේ අපරාධ නීතිය ආරක්ෂා කරන්න පුළුවන්ද කියලා කියන්න. ඒ ජනාධිපතිවරයාට මේ රටේ මාර්ග නීතිය රකින්න පුළුවන්ද කියලා කියන්න. ඒ ජනාධිපතිවරයාට මේ රටේ සාමාන්‍ය මිලදී ගැනීම් පටිපාටිය ආරක්ෂා කරන්න පුළුවන්ද කියලා කියන්න. ඒ නිසා තමන්ගේ පක්ෂයේ කෙනෙක්ද, තමන්ගේ පක්ෂයේ නායකයාද, තමන්ට හිතවත් කෙනෙක්ද කියන එක මත නොවෙයි මේ තත්ත්වය සැලකිල්ලට භාජන කරන්න ඕනෑකම තිබෙන්නේ. ජනාධිපතිවරයා සහ අප අතරේ තිබෙන බැඳීමේ ස්වභාවය කුමක්ද, වැනි කිසිවක් අදාළ කරගත යුතු නැහැ. අපි අදාළ කරගත යුතු වන්නේ ජනාධිපතිවරයා

[ගරු අනුර දිසානායක මහතා]

සහ ජනතාව අතර බැඳීම සකස් කරන ලියවිල්ල කුමක්ද කියන එකයි. ඒ ලියවිල්ල තමයි ව්‍යවස්ථාව. එම ව්‍යවස්ථාවට පටහැනිව ජනාධිපතිවරයකු කටයුතු කරන්නේ නම්, මේ රටේ කිසිදු පුරවැසියෙකුගෙන් ව්‍යවස්ථාවට අනුව හෝ සාමාන්‍ය නීතියට අනුව කටයුතු කරන්න කියලා ඉල්ලන්න අපට අයිතියක් නැහැ. ඒ නිසා අද ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් සිදු කරනවා නම්, ඒ තැනැත්තා තමන්ගේ පක්ෂයේ නායකයා, එහෙම නැත්නම් තමන්ට ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රී ධුරයක් ලබා දුන් තැනැත්තා යැයි කියලා කිසිවෙකුටත් නිහඬ වෙන්න අයිතියක් නැහැ. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරන්න මේ පාර්ලිමේන්තුවේ අපි කවුරුත් බැඳී සිටිනවා. මේ ව්‍යවස්ථාව පිළිගන්නවාද, නැද්ද කියන එක වෙනම කරුණක්. මේ ව්‍යවස්ථාවේ බොහෝ දේ පිළිගන්නේ නැතිවෙයි, දේශපාලන ව්‍යාපාරයක් හැටියටයි. හැබැයි, අපි කවුරුත් මේ ව්‍යවස්ථාවට යටත්. ඒක තමයි අද අපේ රටේ මූලික නීතිය. එතකොට අපේ රටේ මූලික නීතියට යටත් නොවෙන මූලික පුරවැසියෙක් ඉඳගෙන, රටක මූලික නීතිය ආරක්ෂා කරන්න කියලා බල කරන්නේ කොහොමද? මම අවස්ථා ගණනාවකදී පෙන්වා දී තිබෙන්නේ අන් කවරකවත් නොවෙයි. ජනාධිපතිවරයා විසින් අපේ රටේ මූලික නීතිය උල්ලංඝනය කරමින් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. එතුමා විසින් කොමිෂන් සභා පත් කළා. බරපතළ මූල්‍ය අපරාධ පිළිබඳව කොමිෂන් සභාවක් පත් කළා. එම කොමිෂන් සභාව පසුගිය කාලයේ පරීක්ෂණ 32ක වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එසේ පත් කරන කොමිෂන් සභාවල මුළු ක්‍රියා පටිපාටියට වෙන් කළේ, මේ පාර්ලිමේන්තුවෙන් වෙන් කරදෙන මුදල්. එම කොමිෂන් සභාවෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ඉතා පැහැදිලි ලෙස චූදිතයන් නම් කොට තිබෙනවා. හැබැයි, එම චූදිතයාව දැව සංස්ථාවේ සභාපති විධියට පත් කරනවා. [බාධා කිරීමක්] ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමනි, මම කියන්නේ ඔබතුමා ගැන නොවෙයි. ඔබතුමාට කලින් පත් කළ කෙනා ගැනයි මම කියන්නේ. එක චූදිතයෙක් දැව සංස්ථාවේ සභාපතිවරයා හැටියට පත් කරනවා. තමන්ගේ කොමිෂන් සභාවේ වාර්තාවෙන් චූදිතයන් ලෙස නම් කර ඇති අය අරගෙන ජපානයේ සංචාරය කරනවා. තමන්ගේම කොමිෂන් සභාවෙන් චූදිතයෙක් බවට පත්වෙන කෙනා, තමන්ගේ පෞද්ගලික ලේකම් කරගන්නවා. තමන්ගේම කොමිෂන් සභාවෙන් චූදිතයෙක් බවට පත් කරන කෙනා, තමන්ගේ අග්‍රාමාත්‍යවරයා බවට පත් කරගන්නවා. තමන්ගේම කොමිෂන් සභාවෙන් චූදිතයෙක් බවට පත් වී තිබෙන කෙනාට තමන්ගේ අතින්ම නිවාස ඇමතිකම දෙනවා, දින 52 තුළ. මොකක්ද, මේ වෙලා තිබෙන්නේ? මේ කොමිෂන් සභාවල ඇති ඵලය කුමක්ද? මහ ජනයාගේ සල්ලි වියදම් කරලා, ජනාධිපති කොමිෂන් සභාවක් හදලා, එම කොමිෂන් සභාවෙන්ම චූදිතයන් කරන අයට ඒ ජනාධිපතිවරයාම තනතුරු ප්‍රදානය කරනවා නම්, අපි -මේ පාර්ලිමේන්තුව- කොමිෂන් සභා සඳහා වැය බරක් දරන්න ඕනෑද? මහ ජනයාගේ මුදල් කොමිෂන් සභාව වෙනුවෙන් වැය කරන්න ඕනෑද? එච්චරයි මම අහන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, තව කොමිෂන් සභාවක් තිබුණා. ඒ තමයි මහ බැංකු බැඳුම්කර නිකුතුව පිළිබඳ කොමිෂන් සභාව. මහ බැංකු බැඳුම්කර නිකුතුව පිළිබඳ කොමිෂන් සභාව ගැන කථා කරනකොට, පසුගිය දවස්වල මන්ත්‍රීවරුන් 118 දෙනෙකුගේ ලැයිස්තුවක් තිබෙනවාය කියන කාරණය විශාල ආන්දෝලනයට තුඩු දුන් බව අපට මතකයි. විශේෂයෙන්ම පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන් මුදල් ගත්තාය කියන චෝදනාව දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයාට එල්ල වූ අවස්ථාවේ ඔහු ප්‍රසිද්ධියේ මාධ්‍ය ආයතනවලට කියා සිටියා, "මම විතරක් නොවෙයි, 118 දෙනෙකුගේ ලැයිස්තුවක් තිබෙනවා" කියලා. ඔහු දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්. ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා. ඒ නිසා ඔවුන් දෙදෙනා අතරේ ඉතා කිට්ටු සබඳතාවක් තිබෙනවා; දේශපාලනික සබඳතාවක් තිබෙනවා; දේශපාලනික වශයෙන් කිට්ටුකමක් තිබෙනවා.

බැඳුම්කර පිළිබඳ කොමිෂන් සභා වාර්තාවේ ඉතුරු ඇමුණුම් කෝ, කියන කාරණය දැන් අපි දැන ගන්න ඕනෑ. අපි පාර්ලිමේන්තුවේදී අවස්ථා ගණනාවකදී එය ඉල්ලා සිටියා. වර්තමාන ආණ්ඩුවට චෝදනා එල්ල වී තිබෙන බරපතළ වංචා දූෂණ පිළිබඳ ගනුදෙනුව එයයි. ඒ, ගනුදෙනුවේ සමහර වාර්තා සහ සාධක මත ඉතා පැහැදිලියි, එය අග්‍රාමාත්‍යවරයාගේ මැදිහත්වීම සහ මෙහෙයවීම සහ අනුදැනුම මත සිදු වූ ගනුදෙනුවක් බව. ඒක හංගන්න බැහැ, කාටවත්. බැඳුම්කර ගනුදෙනුවට අග්‍රාමාත්‍යවරයාගේ සබඳතාවක් නැහැ කියලා කවුරු හරි ඔහුව ආරක්ෂා කරනවා නම්, එය සරම ඇඳගෙන ඔළුවෙන් හිටගත්තා වාගේ වැඩක්. මතක තබා ගන්න, කිසිවෙකුටත් ආරක්ෂා කරන්න බැහැ. හැබැයි, සිදු වී තිබෙන්නේ මොකක්ද?

ඒ ගනුදෙනුව පිළිබඳ සම්පූර්ණ වාර්තාව මේ පාර්ලිමේන්තුවට අවශ්‍යයි. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ජනාධිපති කොමිෂන් සභාව රැස්වුණා. බැඳුම්කර ගනුදෙනුව පිළිබඳ විස්තර mediaවලින් හැම දාමත් වාර්තා කළා; පුවත් පත්වල ප්‍රධාන ශීර්ෂ පාඨ ගියා. හැබැයි, ජනාධිපතිවරයා තවමත් ඒ සම්පූර්ණ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැහැ. බැඳුම්කරය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව සම්පූර්ණයෙන්ම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

ඒ විතරක් නොවෙයි, මේ රටේ ජනාධිපතිවරයා පසුගිය දිනක ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් කළා. 2007 සිට 2015 දක්වා කාල පරිච්ඡේදය තුළ අපේ රටේ මහ බැංකුව බැඳුම්කර නිකුත් කිරීම හරහා සිදු වී තිබෙන පාඩුව රුපියල් බිලියන 1,000 ඉක්මවනවාය කියා එතුමා කිව්වා; ඒ පාඩුව ට්‍රිලියනය ඉක්මවනවාය කිව්වා. ඔබතුමන්ලා කල්පනා කර බලන්න. ඒ කියන්නේ, බැඳුම්කර නිකුතුව නිසා සිදු වූ පාඩුව රුපියල් කෝටි ලක්ෂය ඉක්මවනවා. "බැඳුම්කර ගනුදෙනුව හරහා අපේ රටට කෝටි ලක්ෂයක වංචාවක් සිදු වෙලා තිබෙනවා" කියා ප්‍රකාශයක් කර, sink එක ළඟට ගිහින් අත සෝදාගෙන පැත්තකට යන්න ජනාධිපතිවරයාට පුළුවන්ද? ජනාධිපතිවරයාට අයිතියක්, වග කීමක් තිබෙනවා, ඒක හෙළිදරව් කරන්න. හැබැයි, බැඳුම්කර ගනුදෙනුව පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවෙන් දැනට හෙළිදරව් වී තිබෙන්නේ බිලියන 11ක් ගැන විතරයි. එහෙම නම්, තව බිලියන 989ක් පිළිබඳව තොරතුරු හෙළිදරව් විය යුතුයි. රූපවාහිනියේ පැවති සජීවී වැඩසටහනකදී ජනාධිපතිවරයා කිව්වා, "මහ බැංකුවේ බැඳුම්කර ගනුදෙනුවෙන් රාජ්‍යයට කර තිබෙන පාඩුව බිලියන 1,000යි" කියා. වාර්තාවෙන් හෙළිදරව් වී තිබෙන්නේ, ඉන් බිලියන 11ක් ගැන විතරයි. එහෙම නම්, අනික් බිලියන 989 වංචා කළේ කවුද, ඒ කවදාද, කොහොමද එය සිද්ධ වුණේ කියා දැන ගන්න රටේ ජනතාවට සාධාරණ අයිතියක් නැද්ද? ජනාධිපතිවරයා වචනයක් හැටියට ඒක කියනවා; එය සුළඟේ පාවෙලා යනවා; අපිත් අහනවා. හැබැයි අපිටත් පැත්තකට වෙලා ඉන්න අයිතියක් නැහැ.

රටක ජනාධිපතිවරයෙක්, තමන්ගේ රටේ ලොකුම රාජ්‍ය ආයතනයක ගනුදෙනු පිළිබඳව ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් කරනවා. ඒක නිකම්, කිරි පිටි පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි; "මයිලෝ" කිරි පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. ඒක අපේ රටේ මහ බැංකුවෙන් සිදු කළ ගනුදෙනුවක් පිළිබඳ ප්‍රශ්නයක්. මහ බැංකු ගනුදෙනුවෙන්

බිලියන 1,000ක පාඩුවක් සිදු වී තිබෙනවා නම්, එයින් කොටසක් ගැන හෙළිදරව් කළා නම්, ඉතිරි ඒවා හෙළිදරව් කිරීමත් ජනාධිපතිවරයාගේ වග කීමක්.

අද මේ තිබෙන, අභියාචනාධිකරණයේ සභාපති ධුරයට වැඩ බලන සභාපතිවරයකු පත් කිරීම පිළිබඳ ප්‍රශ්නය, ප්‍රසම්පාදන කමිටුව පිළිබඳ ප්‍රශ්නය, අමාත්‍යවරු පත් කිරීම පිළිබඳ ප්‍රශ්නය, සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යවරයෙක් හොරෙන් දිවුරුම් දීම පිළිබඳ ප්‍රශ්නය, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳ ප්‍රශ්නය යනාදී සියලුම ප්‍රශ්න ගැට ගැසී තිබෙන්නේ ජනාධිපතිවරයා මේ රටේ ව්‍යවස්ථාවට ගරු කරනවාද, නැද්ද කියන සාධකය මතයි. එසේ තිබියදී, ජනාධිපතිවරයා මොකක්ද කරමින් සිටින්නේ?

ජනාධිපති වැය ශීර්ෂය වෙනුවෙන්, 2017දී මේ පාර්ලිමේන්තුව රුපියල් මිලියන 7,917ක් වෙන් කර දුන්නා. 2018දී ඒ සඳහා පාර්ලිමේන්තුව රුපියල් මිලියන 10,887ක් වෙන් කර දීලා තිබෙනවා. 2019 වසරට, ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂයට රුපියල් මිලියන 13,560ක් වෙන් කර දීලා තිබෙනවා. ඒ කියන්නේ, දවසකට රුපියල් ලක්ෂ 371ක්; තුන්කෝටි හැත්තෑ එක්ලක්ෂයක්. කවුරු හෝ කියන්න පුළුවන්, "තව වැඩ තිබෙනවා නේ" කියා. ඒ වැඩවලට එතුමාට වෙනම මුදල් වෙන් කරනවා. මහවැලි අමාත්‍යාංශයේ වැඩකටයුතු කරන්න වෙනම වැය ශීර්ෂයක් තිබෙනවා; පරිසර අමාත්‍යාංශයේ වැඩකටයුතු කරන්න වෙනම වැය ශීර්ෂයක් තිබෙනවා; පොලිස් දෙපාර්තමේන්තුවේ වැඩකටයුතු කරන්න වෙනම වැය ශීර්ෂයක් තිබෙනවා. එම අමාත්‍යාංශ සඳහා වෙනම වැය ශීර්ෂ තිබියදී, ජනාධිපතිවරයා ලෙස තමන්ගේ කාර්යයට සහ ඒ සඳහා අවශ්‍ය වන පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් හැටියට මිලියන 13,560ක් වෙන් කරගෙන තිබෙනවා.

අපි මේ මිලියන 13,560ක් වෙන් කර දෙන්නේ කාටද? ව්‍යවස්ථාව කඩන, ව්‍යවස්ථාවට ගරු නොකරන, අඩුම තරමේ තමන්ගේ වැය ශීර්ෂය සාකච්ඡා කරන දවසේ ලංකාවේ ඉන්නේවත් නැති ජනාධිපතිවරයෙක් වෙනුවෙනුයි අපි මේ මුදල් වෙන් කර දෙන්නේ. එවැනි ජනාධිපතිවරයකු වෙනුවෙන් මේ මුදල වෙන් කිරීම කිසිසේත්ම යුක්තිසහගත නොවන බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබාදුන්නාට ඔබතුමාට ස්තුතියි.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ Point of Order එක මොකක්ද?

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
විෂයය භාර අමාත්‍යතුමා හැටියට ගරු ජනාධිපතිතුමා අන්තර්ජාතික පරිසර සමුළුවකට සහභාගි වෙන්න ගිහින් තිබෙනවා. ඒ නිසා මේ සභාවේ,- [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එය point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක් තිබෙනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
විනාඩි 15ක් වෙන් කර තිබෙන බවයි මට දැනුම් දුන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අගමැතිතුමා ඒකෙන් විනාඩියක් ගත්තා. ගරු සභානායකතුමා තවත් විනාඩියක් ගත්තා. ප්‍රශ්නයක් නැහැ, ඔබතුමා කථා කරන්න.

[පූ.භා.11.52]

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද දවසේ තිබෙන වැය ශීර්ෂවලින් මගේ කථාව ඉලක්ක කරන්න හදන්නේ, විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය දෙසටයි. ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය ගැන දැනට විනාඩි දෙක-තුනකට කලින්ත් කියැවුණා. මම තවදුරටත් ඒ ගැන කථා කරන්න බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ දේශපාලන අර්බුදයක් තිබෙන බව අපි දන්නවා. ඒක ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් කිව්වා. තනිකරම, මේ දේශපාලන අර්බුදයේ නිර්මාතෘවරයා වන්නේ මේ රටේ ජනාධිපතිවරයායි. ජනාධිපතිතුමාට ව්‍යවස්ථාදායකයත් එක්ක ප්‍රශ්නයක් තිබෙනවා; අධිකරණයත් එක්ක ප්‍රශ්නයක් තිබෙනවා. එක පුද්ගලයෙක් නිසා ඇති වෙලා තිබෙන මේ අර්බුදයට අපේ රජය පැත්තට ඇඟිල්ල දිගු කරන එක මම හිතන විදියට ඉතාම අසාධාරණයි. පාර්ලිමේන්තුව අක්‍රිය වෙලා, රට අවුල් වෙලා, විශාල අර්බුදයක් ඇතිවුණු ආකාරය පසුගිය කාලයේ අපි දැක්කා නේ. ඒ අර්බුදයේ සෙවණැලි තවමත් පවතිනවා. ඒ අර්බුදය තවමත් නොයෙකුත් ආකාරයෙන් ඇදගෙන යන්න හදන්නේ ජනාධිපතිතුමායි. ජනාධිපතිතුමා අපේ රජයේ නායකයායි. එතුමා ආණ්ඩුවේ නායකයා නොවෙයි. ආණ්ඩුවේ වැඩ කරන්න යනකොට, ඒ ක්‍රියාදාමවලට අවශ්‍ය ශක්තිය, සහාය අපට ජනාධිපතිතුමාගෙන් ලැබෙන්නේ නැහැ; ජනාධිපතිතුමාගේ ආශිර්වාදය මේ වන විට ආණ්ඩුවට ලැබෙන්නේ නැහැ. ජනාධිපතිතුමා බලාගෙන ඉන්නේ, ආණ්ඩුව පෙරළෙන්නේ කොයි වෙලේද කියායි. එතුමා ප්‍රාර්ථනා කරන්නේ, මේ ආණ්ඩුව පෙරළෙන්න කියායි. ඒ නිසා, අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපි හොඳ දෙයක් කරන්න හැදුවත් -මොන දෙයක් කරන්න හැදුවත්- දේශපාලන න්‍යාය පත්‍රයේ වාසි ලබා ගන්න, එතුමාගේ ඉදිරිය බලාපොරොත්තුවෙන් දේශපාලන න්‍යාය පත්‍රය අනුව ගමන් කරන්න, රජයට විරුද්ධව කරන කකුලෙන් ඇදිල්ල එතුමා දිගින් දිගටම කරගෙන යනවා.

පසුගිය කාලයේදී අපේ රටේ සංවර්ධනය වෙනුවෙන් "ගම්පෙරළිය" ව්‍යාපෘතිය යටතේ අපි විශාල මෙහෙවරක් කරන්න ලැහැස්ති වුණා . ඒ සඳහා රුපියල් බිලියන 16ක් වෙන් කළා. නමුත් ජනාධිපතිවරයා නිර්මාණය කළ දේශපාලන අර්බුදය නිසා, ජනතාවට ප්‍රතිලාභ ලබා දීම වෙනුවෙන් ඒ මුදල් වියදම් කරන්න ලැබුණේ නැහැ. රුපියල් බිලියන 16ක් කියන්නේ, විශාල මුදලක්.

[ගරු සරත් ෆොන්සේකා මහතා]

අන්තිමට ආණ්ඩුව පෙරළා නීති විරෝධීව ඇති කළ ප්‍රශ්නය නිසා, එම රුපියල් බිලියන 16න් අපට වියදම් කරන්න ලැබුණේ රුපියල් බිලියන 5යි. ජනතාව වෙනුවෙන් ඒ සංවර්ධන කටයුතු කිරීම සඳහා, "ගම්පෙරළිය" ව්‍යාපෘතියට මේ වර්ෂයට අපි රුපියල් බිලියන 48ක් වෙන් කර තිබෙනවා. ඒ අනුව, ආසනයකට රුපියල් මිලියන 300ක් ලැබෙනවා. නමුත් ගිය වර්ෂයේ ජනාධිපතිතුමා ඇති කළ අර්බුදය නිසා, මේ වර්ෂය සඳහා අය වැය සම්මත කර ගන්නකොටම පළමුවන කාර්තුව අවසන් වෙලා තිබෙනවා. මෙවර අය වැය සම්මත වෙලා, තව මාස පහක් හයක් ඇතුළත මේ විශාල මුදල වියදම් කරන්න අපට සිදු වෙනවා. ඒක ටිකක් දුෂ්කරයි කියන එකයි මගේ අදහස. මම දන්නවා, අපේ කාර්ය මණ්ඩල, අපේ අමාත්‍යාංශ හරහා එක පාරටම විශාල මුදලක් වියදම් කරන්න අමාරු බව. මේ වර්ෂයේත් අපි යම්කිසි පසුබෑමකට ලක් වුණොත්, ඒකේ පිටුපස සිටින්නේ ජනාධිපතිතුමාය කියන එක එතුමාගේ හෘදය සාක්ෂිය එතුමාට කියාවි; එතුමාගේ හෘදය සාක්ෂිය තුළ ඒක දෝංකාර දේවි. තමන්ගේ හෘදය සාක්ෂිය අනුව එතුමාට ඒක පිළිගන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි නොයෙක් නොයෙක් හොඳ වැඩ කරන්න හැදුවා. මම උදාහරණයක් කියන්නම්. Advanced Level කරන පාසල් දරුවන්ට අපි "ටැබ්" දෙන්න හැදුවා. ඒ සඳහා වූ කැබිනට් පත්‍රිකාව අපි ගෙනාවේ ගිය අවුරුද්දේ මැද හරියේයි. ඒ වෙලාවේ ජනාධිපතිවරයා ඒකට තදින්ම විරුද්ධ වුණා. එතුමා ඒකේ හොඳ පැත්ත දැක්කේ නැහැ. එතුමා දැක්කේ ඒකේ අසුබවාදී පැත්ත විතරයි. නමුත්, අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා නැවතත් ඒවා ලබා දෙන්න උත්සාහයක යෙදෙනවා. මම හිතන්නේ, එය දැන් ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියට ගිහින් තිබෙනවා. අපි මැතකදී ජනාධිපතිවරණයක් බලාපොරොත්තු වනවා. මේ වාතාවරණය හමුවේ මේ සියලු දේවල් සම්පූර්ණ කරන්න ලැබේද, ඒ සඳහා අපට කාලය ලැබේද කියන එකත් ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි වෙළෙඳ ගිවිසුම් අත්සන් කරන්න හැදුවා. ලංකාව වැනි කුඩා රටවල්, සිංගප්පූරුව වැනි රටවල් සමඟ, වෙනත් බලවත් රටවල් සමඟ වෙළෙඳ ගිවිසුම් අත්සන් කළාම තමයි ඔළුව උස්සන්න පුළුවන් වෙන්නේ. ඒ දේවල් සම්පූර්ණයෙන්ම කඩාකප්පල් කර, ඒ වෙළෙඳ ගිවිසුම්වලට බාධාවක් වුණෙත් ජනාධිපතිවරයායි. අපි මොන හොඳ වැඩක් කරන්න හැදුවත්, ඒ කකුලෙන් ඇදිල්ල එතුමා දිගින් දිගටම කරගෙන යනවා. එතුමා අපට ආශීර්වාදයක් දෙන්නේ නැහැ; ශක්තියක් වෙන්නේ නැහැ. "මධ්‍යම අධිවේගී මාර්ගය හදන්න කඳු කපනවාය" කියා එතුමා පසුගිය දවස්වල කියා තිබෙනවා මම දැක්කා. මේ රටේ මධ්‍යම පළාතේ තිබෙන්නේ කඳු තමයි. කඳු කපන්නේ නැතිව ඒ පැත්තේ අධිවේගී මාර්ග හදන්නේ කොහොමද? එතුමා කිව්වා ලු, එපා කියලා. එහෙම නම්, මධ්‍යම අධිවේගී මාර්ගය හදේ හෝ එවැනි මොකක හරි එල්ලලා රොකට් එකකින් ඒකට ගිහිල්ලා, මහනුවරින් බහින්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉන්නෙත් මහනුවර දිස්ත්‍රික්කයේ නේ. එහෙම නැත්නම් මේකට විකල්පය තමයි, කඳු හිල් කරන එක. ඒක විශාල වියදමක් දරන්න වෙන වැඩක්. ලෝකයේ ඉතා පොහොසත් රටවල් තමයි කඳු හිල් කරලා අධිවේගී මාර්ග හදන්නේ. පසුගිය කාලයේ මහින්ද චින්තනය යටතේ, කන්දක් හිල් කරන්න ගියා "උමා ඔය ව්‍යාපෘතිය" හදනවා කියා.

අන්තිමේදී ඒක විනාශයක් වුණා. රටේ සල්ලි නැති වුණා. රටට විශාල පාඩුවක් වුණා. ඒක දැන් සම්පූර්ණයෙන් අතහැර දමන්න වෙලා තිබෙනවා. ඒ නිසා ඒවා කියන තරම් ලෙහෙසි නැහැ. එක පුද්ගලයෙකුට මුල්ලක වාඩි වෙලා ඉඳගෙන කියන්න පුළුවන්, "කඳු කපන්න එපා. හිල් කරන්න." කියා. නමුත්, කරන්න ගියාම ඒවා අපට දරන්න පුළුවන්ද, ඒවා සාර්ථකද, ප්‍රායෝගිකද කියන එක ප්‍රශ්නයක්.

එතුමා සුමානයකට විතර කලින් කිව්වා, -මට මතක විධියට මේ ගරු සභාවේදීමයි කිව්වේ.- දැන් ඇමතිවරු එතුමා කියන එක අහන්නේ නැහැ කියා. එතුමාගේ වැඩේම ඇමතිවරුන්ගේ කකුලෙන් අල්ලන එක නම්, ඇමතිවරුන්ට නිවැරදි මානසිකත්වයක ඉඳගෙන වැඩ කරන්න දෙන්නේ නැත්නම්, ඇමතිවරුන්ට අඩු තරමින් ගැළපෙන ලේකම් කෙනෙකුවත් දෙන්නේ නැත්නම් ඇමතිවරු එතුමා කියන එක අහන්නේ කොහොමද? පසුගිය අවුරුදු තුන තුළ අමාත්‍යාංශවල හිටපු ලේකම්වරු සම්බන්ධයෙන් කටයුතු කළේ කොහොමද? මගේ අමාත්‍යාංශයේ හිටපු ලේකම් වනජීවී වැඩවලට අදාළ සියලුම තැන්වලට ගියා. එතුමා අලි වැටවල් ගැන වනජීවී අධ්‍යක්ෂ ජනරාල්ටත් වඩා දැනුමක් ලබා ගත්තා. එතුමා අලින්ගේ ප්‍රශ්නය ගැන විශාල අධ්‍යයනයක් කළා. එතුමා බුද්ධ ශාසන අමාත්‍යාංශයට ඇදලා දැම්මා. එතකොට අවුරුදු තුනක් තිස්සේ එතුමා දැරූ උත්සාහය සම්පූර්ණයෙන්ම වතුරේ ගිහිල්ලා තිබෙනවා. මේ ප්‍රශ්නය හැම අමාත්‍යාංශයකම තිබෙනවා. තමුන්නාන්සේලා සාධාරණව කල්පනා කර බලන්න. තමුන්නාන්සේලා ඇමතිවරු කාලයේ වුණත් තමුන්නාන්සේලා ලේකම් කෙනෙකු සමඟ වැඩ කරන්න පටන් ගත්තාම අතරමඟදී ලේකම් මාරු කරනවා නම්, ඊට පස්සේ ඒ ලේකම්ට ජනාධිපති ලේකම් හරහා වෙන වෙන උපදෙස් එවන්න පටන් ගන්නවා නම් එතකොට ඒ ලේකම් වැඩ කරන්න හය වෙනවා. ඒ ලේකම් ඇමති සමඟ ගමනක් යන්න හයයි. එවැනි තත්ත්වයක් අද ජනාධිපති ඇති කර තිබෙනවා. ගරු ජනාධිපතිතුමනි, ඇමතිවරු දැන් ඔබතුමා කියන එක අහන්නේ නැහැ. තව මාස පහක්, හයක් යනකොට ඔබතුමා කියන එක ඔබතුමාගේ පක්ෂයේ පිටුපස සිටින, දැන් දණ ගහගෙන ඔබතුමාට වැඳ ගෙන සිටින උදවියත් සමහර වෙලාවට අහන එකක් නැහැ කියායි මට නම් තේරෙන්නේ. ඒක තමයි යථාර්ථය වන්නේ. ඊට පස්සේ ඇමතිවරුන්ට ඇඟිලි ගහන්න ඔබතුමාට කොහොමත් හම්බ වෙන එකක් නැහැ.

අපි පසුගිය කාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කුමන්ත්‍රණයක් දැක්කා. මා ඉස්සෙල්ලා කිව්වා වාගේ ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කුමන්ත්‍රණයේ නිර්මාතෘ ජනාධිපතිතුමායි. හැබැයි, ඒ අතරේ ජනාධිපතිතුමා එක්සත් ජාතික පක්ෂයේ අය සමඟත් කුටු කුටු ගාන්න, කුමන්ත්‍රණ කරන්න පටන් ගත්තා. ඒ කියන්නේ, අපේ පක්ෂයේ සමහර ප්‍රබලයෝ සමඟ. පසු ගිය දවස්වල ඇලෝසියස්ගේ ප්‍රශ්නය ආවාම ඇලෝසියස්ට දුරකථන ඇමතුම් 10ක්, 15ක් දීලා තිබුණා නම් එහෙම ඇමතුම් දුන්නු කෙනා චූදිතයෙක් වුණා. මොනවා හෝ ප්‍රශ්නයක් ආවා. පසු ගිය දවස්වල අපේ සමහර ප්‍රබලයෝ කිව්වා, "ජනාධිපති මේ ආණ්ඩුව පෙරළන්න ඉස්සෙල්ලා කුමන්ත්‍රණය කරන කාලය තුළ සමහරුන්ට දුරකථන ඇමතුම් 60ක්, 70ක් දීලා තිබෙනවා කියා. සමහරු දහ පහළොස් වතාව හම්බ වෙලා සාකච්ඡා කර තිබෙනවා. කුමන්ත්‍රණය කළායින් පස්සෙත් දුරකථන ඇමතුම් 20ක්, 30ක් දීලා තිබෙනවා. ඒ කාලයේත් ජනාධිපති හම්බ වෙලා හොරෙන් හොරෙන් සාකච්ඡා කර තිබෙනවා. මේ වාගේ තත්ත්වයකුත් ඇති කර ජනාධිපතිතුමා උත්සාහ කළේ මේ රජය පෙරළා රජයේ සියලු දේ අවුල් කර එක්සත් ජාතික පක්ෂය විනාශ කරන්නයි. මේ පක්ෂයට කෙළෙහි ගුණ දක්වන්නේ නැතිව, පක්ෂයේ අවුල් ඇති කර, මොන ක්‍රමයකින් හෝ එතුමාගේ ගමන යාමේ, එතුමාගේ න්‍යාය පත්‍රය කරා ගමන් කිරීමේ, එතුමාට ලබන වතාවේත් ජනාධිපති නාම යෝජනා ලබා ගැනීමේ අරමුණින් තමයි එතුමා ඒ වැඩේ කළේ කියන එක මට ඉතා පැහැදිලියි.

මම කනගාටුවෙන් වුවත් තවත් කාරණයක් කියන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ නායකයා -විපක්ෂ නායක- ලණුවක් කැවා, කුමන්ත්‍රණයේ ප්‍රතිලාභ එතුමාට ලැබේවි කියා හිතාගෙන. නමුත්, එතුමා එතැනදී නිකම් ඇමක් කර ගත්තා පමණයි. එතුමා දිරච්ච ලණුව කාලා එතුමාගේ ප්‍රතිරූපය විනාශ කර ගත්තා.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ ජනාධිපතිතුමා මේ දවස්වල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට බැන බැන යනවා. ඒ බණින්නේ ඇයි කියා එතුමා ඉතා දීර්ඝව විස්තර කළා. අභියාචනාධිකරණයේ සභාපතිතුමිය පත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අනුමැතිය නොදෙන නිසයි එහෙම කරන්නේ. එතුමා නම යවන මේ විනිසුරුවරියට මමත් සමඟ පරණ ගනුදෙනුවක් තිබෙනවා. මට විරුද්ධව "සුදු කොඩි නඩුව" කියා නඩුවක් දැම්මා. ඒ කාලයේ හිටියා ෆෙඩ්රිකා ජැන්ස් කියා මාධ්‍යවේදිනියක්. ඇයට තානාපති ධුරයක් දෙනවා කියා පොරොන්දු වෙලා, ඇය බොරු කථාවක් හදලා, ඇයගේ තනි සාක්ෂිය මත, ඔය කියන විනිසුරුවරිය ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලේ සභාපතිනිය හැටියට මට අවුරුදු තුනක සිර දඬුවමක් ලබා දුන්නා. ඒ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලේ හිටියා නුවරින් ආපු වරාවැව කියා ඉතාම විශිෂ්ට විනිශ්චයකාරවරයෙක්. මා හිතන හැටියට දැනට එතුමා පළාත් සභාවේ සිටිනවා. එතුමා ඒකට අත්සන් නොකළ නිසා ඔය විනිසුරුවරිය එතුමාට අසභ්‍ය වචනයෙන් බැන ගෙන, බැන ගෙන ගියා කියා එතුමා මට වාර්තා කළා. මට විරුද්ධව සිර දඬුවමේ තීන්දුව දෙන්න සුමාන දෙකකට ඉස්සෙල්ලා එයාගේ දියණියගේ මඟුල් උත්සවය තිබුණා.

දියණියගේ විවාහයට අත්සන් කරන්න ගියේ මහින්ද රාජපක්ෂ මහත්මයා. විවාහයට අත්සන් කර නිකම් හිටියේ නැහැ. දියණියට තෑග්ගකුත් දුන්නා. ලක්ෂ තිස්එකක කාර් එකක් දුන්නා. ඒකෙන් විනෝද වෙලා, ජොලියක් ගිහිල්ලා, අමුතු වුන් එකක් ගිහිල්ලා එතුමිය නටන්නත් පටන් ගත්තා. ඒ පින්තූර හැම තැනම තිබුණා. එහෙම කළේ ජනාධිපති සතුටු කරන්න. එතුමිය cabaret artiste කෙනෙක් වාගේ නටනවා. එතුමිය විනිසුරුවරියක්. ඒවා සදාචාරයෙන් තොර වැඩ. ඊට මාසයකට පස්සේ ඒ විනිසුරු මණ්ඩලයේ හිටිය එතුමිය සහ තවත් විනිසුරු කෙනෙකුට,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම විනිසුරුවරුන්ගේ පෞද්ගලික දේවල් පිළිබඳව මේ ගරු සභාවේ කථා නොකර ඉන්න එක වටිනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නඩුවට අදාළවයි මම කියන්නේ. ඒ නඩුවට අදාළව ඒ විනිසුරුවරියගේ පැවතුණු සම්බන්ධතාවය මම මේ කියන්නේ. ඒ නඩුවෙන් මට චෝදනා කරපු අයත් සමඟ එතුමිය සම්බන්ධ වෙලා හිටියා. නඩුවේ තීන්දුව දීලා මාසයක් ඇතුළත Central Bank එකේ විශාල party එකක් තිබුණා. 111දෙනෙක් එයට සහභාගි වුණා. නිවාඩ් කබ්රාල්, තමුන්නාන්සේලාගේ යුවරජතුමා. ඒ ඔක්කෝම සිටින තැන මෙතුමිය සහ රෂීන් කියන අනෙක් විනිසුරුවරයා ගිහිල්ලා ඒ party එකේදීත් නට නටා විනෝද වුණා. මට විරුද්ධව දුන්නු තීන්දුව සමරන්න තමයි එහෙම කළේ. ඒකයි මම මෙතැන පෙන්වන්න හදන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විනිසුරු කෙනෙක් වුණාම හැසිරෙන්න ඕනෑ ආකාරයක් තිබෙනවා. ඒ ආකාරය ඇතුළත තමයි හැසිරෙන්න ඕනෑ. නැත්නම් ඒ ගොල්ලෝ කරන දේවල් සාධාරණ වෙන්නේ නැහැ.

ජනාධිපතිතුමා කිව්වා, "පොලිස්පතිතුමා පත් කිරීම වැරැදියි. නීතිපතිතුමා පත් කිරීම වැරැදියි." කියා. එක නිලධාරියෙක් ජනාධිපතිගේ ආරක්ෂක අංශයේ ප්‍රධානියා හැටියට හිටියා. හිටපු ජ්‍යෙෂ්ඨම නියෝජ්‍ය පොලිස්පතිතුමා. ඒ නම අරින්නේ නැතිව, තවත් නම් කීපයක් ඇරියේ ඇයි? ඒ නිසායි ප්‍රශ්නය ඇති වුණේ. නීතිපති පත් කරන අවස්ථාවේත් එතුමා නිර්දේශ කළා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඒවා අනුමත කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුළුවන් නම් මට වැඩිපුර වෙලාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට විනාඩියක් වැඩියෙන් දෙන්නම්.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

ගරු සභානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට විනාඩියක කාලයක් වැඩිපුර දෙනවා. [බාධා කිරීමක්]

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දෙන බවට හොඳ ප්‍රතිචාරයක් තිබෙනවා. කරුණාකර ඒ වෙලාව ලබා දෙන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාවෙන් එතුමාට කාලය ලබා දෙනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

එහෙම කළොත් අන්තිමට කථා කරන අයට වෙලාව අඩු වෙනවා. The last speaker will lose time.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

පසුගිය දවස්වල ජනාධිපතිතුමා සුජාත දරුවෙක් ගැන කථා කළ බව අපි දැක්කා. යහ පාලන සුජාත දරුවා ගැන කථා කළා.

[ ගරු සරත් ෆොන්සේකා මහතා]

සුජාත දරුවා බිහි කරන්න අපි ඔක්කෝම වැඩ කළා. සුජාත දරුවා බිහි වුණා. යහ පාලනයේ පියා හිටියා, යහ පාලනයේ මව හිටියා. නමුත්, සුජාත දරුවා බිහි වුණාට පස්සේ ඒ පරිසරය අවජාතක වුණා. ඒ පරිසරය අවජාතක වුණේ, යහ පාලනයේ පියා යහ පාලනයේ මව දූෂණය කරන්න පටන් ගත්ත නිසායි. සුජාත දරුවා ජීවත් වුණු පරිසරය අවජාතක වුණු නිසා, සුජාත දරුවා අවජාතක වුණා. ඒකේ වගකීම ගන්න වෙන්නේ යහ පාලනයේ පියාට. එතුමා කරපු ක්‍රියාදාමය නිසා තමයි ඒ ප්‍රශ්නය ඇති වුණේ.

අපට අමාත්‍යාංශ දුන්නේ නැහැ. ඇමතිවරු පත් කිරීමට එක්සත් ජාතික පක්ෂයට අයිතියක් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් තිබෙනවා. ඒ පක්ෂය තීරණය කරන්න ඕනෑ, පක්ෂයේ ඇමතිවරු වෙන්න ඕනෑ කවුද කියා. ජනාධිපතිතුමාට තිබෙන්නේ, අගමැතිතුමා නිර්දේශ කරන ආකාරයට, අගමැතිතුමාගේ පක්ෂයේ අයට ඇමතිකම් දෙන්න. අපත් සමඟ පෞද්ගලික තරහ තිබුණා. එතුමාත් සමඟ අපේ පෞද්ගලික තරහක් නැහැ. අපි එතුමා විවේචනය කළා. ඒ විවේචනය ඇඟ වැදුණු නිසා අපිත් සමඟ වෛරයෙන් ඉඳගෙන, "සරත් ෆොන්සේකාට නම් ඇමතිකමක් දෙන්න බැහැ." කිව්වා. මේක සදාචාරයෙන් තොර වැඩක්. රටක රාජ්‍ය නායකයෙක්, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ ගෞරවයෙන් ජීවත් වෙන්න ඕනෑ කෙනෙක් පෞද්ගලික පළිගැනීම් මත, දේශපාලනයේ වෛරයක් ඇති කරගෙන එහෙම කිරීම සදාචාරයෙන් තොරයි. මේ තත්ත්වයෙන් ගොඩ එන්න අපට ජාතික රජයක් අවශ්‍යයි කියා මම හිතනවා. ජාතික රජයක් ඇති කළොත්, ජනාධිපතිට බැහැ, ඇමතිවරුන් ගැන ඇඟිලි ගහන්න. නැත්නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිට පුළුවන්. අද තිබෙන අමාත්‍යාංශ 28, එතුමාට ඕනෑ නම් දහයක් බවට පත් කරන්න පුළුවන්.

නැවතත් මලික් සමරවික්‍රම ඇමතිතුමා ගිහිල්ලා ජනාධිපතිතුමාට ප්‍රකාශ කළා, "එතුමා ඉල්ලා අස්වෙනවා. ඒ තනතුරට සරත් ෆොන්සේකාව පත් කරන්න." කියා. ජනාධිපති නැවතත් එතුමාගේ බලය අයුතු ලෙස පාවිච්චි කර කිව්වා, "ඔබතුමා අස්වුණත් සරත් ෆොන්සේකාට ඒක දෙන්නේ නැහැ. මම ඒ අමාත්‍යාංශය අහෝසි කරනවා." කියා. ඊට අමතරව නැවතත් යම් දෙයක් කියා තිබෙනවා. ඒ දේ මම කියන්නේ නැහැ. මොකද, ඒක මගේ නිලයට අදාළ දෙයක් නිසයි. ඒ නිසා මම මේ ගරු සභාවේදී ඒක කියන්නේ නැහැ, එයින් මගේ නිලයට අගෞරවයක් විය හැකි නිසා.

ජාතික රජයක් නැති නිසා අද වෙනකොට අපේ අමාත්‍යාංශ භයානක තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා. ඇත්තටම ජාතික රජයක් තිබුණා නම්, අපට වැඩිපුර අමාත්‍යාංශ නැති වුණත්, තිබෙන ටික හෝ පාර්ලිමේන්තුවේ සම්මත කරගත්තා නම්, අපට කෙළින් වැඩ කරන්න පුළුවන් කියා මම හිතනවා.

මට වෙලාව දෙන්නේ නැති නිසා අවසාන වශයෙන් මම තව එක කාරණයක් ප්‍රකාශ කරන්නට ඕනෑ. තමුන්නාන්සේලාට ඒ කාලයේ මහින්ද චින්තනය තිබුණා. අපි ගෙනාවා, මෛත්‍රී පාලනය. අන්තිමේදී මේ දෙක එකතු වෙලා මෛත්‍රී චින්තනයක් හැදුණා. ප්‍රශ්නය තමයි, මහින්ද චින්තනය තිබෙන කාලයේ අපි භය නැතිව මුහුණට මුහුණලා හැප්පුණා. මහින්ද චින්තනය අපට වෙඩි තිබ්බේ පපුවට. අපි වෙඩි පහර කා ගෙන ඇවිත් චින්තනයට ගැහුවා. චින්තනය ගිහිල්ලා මැද මූලන ජනේලයේ එල්ලුණා. දැන් ප්‍රශ්නය තිබෙන්නේ මෛත්‍රී චින්තනය අපට පිටිපස්සෙන් පිහියෙන් අනින එක. මහින්ද චින්තනය පපුවට ගැහුවා, මෛත්‍රී චින්තනය පිටිපස්සට පිහියෙන් අනිනවා. එම නිසා ඉතාම අසුබවාදී තත්ත්වයක් මේ රටේ ඇති වෙලා තිබෙනවා. මේ අනුව අපට සිද්ධ වෙනවා, ඉතා පරිස්සමෙන් ඉදිරි ගමන යන්න.

මේ අවස්ථාවේදී මම තමුන්නාන්සේලාට මතක් කර දෙනවා, යුද හමුදාවල කියන කථාවක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියක් දෙන්න.

යුද හමුදාව කියනවා, "ඔටු හමුදාවකට අණ දෙන්න සිංහයෙක් දැම්මොත්, ඔටු හමුදාව යුද්ධයට ගිහින් යුද්ධය දිනනවා" කියා. එහි අනෙක් පැත්තත් කියනවා, "සිංහ හමුදාවකට අණ දෙන්න ඔටුවෙක් දැම්මොත් ඒ හමුදාව යුද්ධය පරදිනවා" කියා. අද අපට මේ පැත්තේ තිබෙනවා, සිංහ හමුදාවක්. අපේ රජය සිංහයෝ වාගේ වැඩ කරන්නට පුළුවන් කට්ටියක්. අපට අණ දෙන්න ඔටුවෙක් ඉන්න නිසා අපේ හමුදාව අක්‍රිය වෙලා තිබෙනවා.[බාධා කිරීමක්] ඒ කියන්නේ අගමැතිතුමා ගැන නොවෙයි. මේ රජයේ නායකයා ගැන මම කියන්නේ. ඒ තත්ත්වය මත රජය අක්‍රිය වෙලා තිබෙනවා.[බාධා කිරීමක්] අවසාන විනාඩිය. මම කථා කර ඉවර වුණාට පස්සේ ඔබතුමා කියන්න.[බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! කරුණාකර මන්ත්‍රීවරු බාධා කරන්න එපා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
මම උදාහරණයක් දුන්නේ. ඔබතුමා මට කථා කරන්න ඉඩ දෙන්න, ඊට පස්සේ කථා කරන්න.

ඊළඟට මම උත්තර දෙන්න ඕනෑ, මේ කාරණයට. දැන් දවස් දෙක තුනකට ඉස්සෙල්ලා විමල් වීරවංශ මන්ත්‍රීතුමා ගිරිය කඩා ගෙන කෑ ගහනවා මම දැක්කා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය නම් අවසානයි ගරු මන්ත්‍රීතුමා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka
මේ කාරණය කියා මගේ කථාව අවසන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කෑ ගැහුවා, ගිවිසුම් අත්සන් කරලා ඇමෙරිකාවේ නැව් ත්‍රිකුණාමලයට ගේනවා කියා. එතුමා හිතාගෙන ඉන්නේ නැවක් ගේනවාය කියන එක අර මාළු බාන ට්‍රෝලර් එකක් ගේනවා වාගෙයි කියා. ඇමෙරිකාවේ නැවක් ගෙනාවොත් අපේ කිසිම වරායක ඒ නැවට අවශ්‍ය තෙල් ටික තියා වතුර ටිකවත් දෙන්න බැහැ. එක නැවක් ගත්තොත් හරියට ත්‍රිකුණාමලය නගරය වාගෙයි. සේවකයෝ හාර පන් දාහක් වැඩ කරනවා. ඒ පහසුකම් අපට දෙන්නට බැහැ. එතුමා කෑ ගහනවා, ඇමෙරිකාවේ නාවික හමුදාවේ නැව් 500ක් මුහුදේ තිබෙනවා. ඒවා ඉදිරි කාලයේ ත්‍රිකුණාමලයට එන්න හදනවා කියා. අපට හැකියාවක් ආවොත් ඒ නැව් පන්සියයෙන් නැව් දෙකක් ත්‍රිකුණාමලයට ගෙන්වගන්න අපට ආඩම්බර වෙන්න පුළුවන්, එදාට අපේ රට අනිවාර්යයෙන්ම මේ කලාපයේ තිබෙන දියුණුම

රටක් බවට පත් වෙලා කියා. විමල් වීරවංශ මන්ත්‍රීතුමාට හොර පාස්පෝට් හදාගෙන ඩිස්නිලන්තයට රිංගන්න පුළුවන්; ඩිස්නිලන්තයට ගිහින් ඇමෙරිකාවේ හැම තැනම සවාරි ගහන්න පුළුවන්. මෙතැනට ඇවිත් බොරුවට ඇමෙරිකාව විවේචනය කරමින් කෑ ගහනවා. එතුමා හිතන්නේ ඇමෙරිකාව විවේචනය කළ පලියටම එතුමා ජාතිවාදියෙක් වෙයි; දේශ ප්‍රේමියෙක් වෙයි කියා.

මම අවසාන වශයෙන් මේ කාරණය කියන්න ඕනෑ. අද මම ජනාධිපතිතුමගේ වැය ශීර්ෂයට ආධාර කර මගේ ඡන්දය පාවිච්චි කරන්නේ නැහැ. මේ වැය ශීර්ෂයට මම අත උස්සන්නේ නැහැ. ජනාධිපතිතුමාට දී තිබෙනවා, බිලියන 23ක්. එහි, බිලියන 13ක් තිබෙනවා, වැය ශීර්ෂය. එයින් බිලියන 8ක් තිබෙනවා, වෙනත් කරුණු, යටිතල පහසුකම් කියා. ඒ ඔක්කොම යන්නේ පොළොන්නරුවේ දේශපාලනයට. තව බිලියන 10 ක් තිබෙනවා, පිබිදෙන පොළොන්නරුව කියා. ගිය අවුරුද්දේ බිලියන 12යි, ඊටකලින් අවුරුද්දේ බිලියන 13යි. අද පොළොන්නරුවක් නැහැ. අද දකින්නේ පිබිදෙන පොළොන්නරුව නොවෙයි; වැළපෙන පොළොන්නරුව. අඩි 200ක් විතර පළල පාරවල් තිබෙනවා. නමුත් නගරය බිමට සමතලා වෙලා තිබෙන්නේ. එම නිසා මේ මුදල් නාස්තියට අපි සහාය දෙන්නේ නැහැ. මේ මුදල් වෙන පැතිවලට යොදවන්නට පුළුවන්. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාව ලක්ෂ 5යි:ඡන්ද ලක්ෂ 3 යි. ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව ලක්ෂ 28යි: ඡන්ද ලක්ෂ 20යි. ගම්පහ දිස්ත්‍රික්කයට පසුගිය අවුරුදු තුනටම බිලියන 15ක්වත් දීලා නැහැ. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට ගරු මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා.12.12]

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගත් අවසරයි. මේ වැය ශීර්ෂය දෙස බැලුවාම පෙනෙනවා, රටේ නායකයාට, රටේ ප්‍රධානියාට වාගේම රටට අවශ්‍ය මහජනතාවට සේවය කරන ආයතන ගණනාවකට වෙන් කර තිබෙන මුදල් පිළිබඳවයි, ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කරන්නටයි අද අපි දවස පුරාම වෙලාව වෙන් කර තිබෙන්නේ කියලා. බොහොම කෙටියෙන් ඒ පිළිබඳව මම සඳහනක් කරනවා නම්, පසුගිය වර්ෂයේ කළ සේවය පිළිබඳව ජනාධිපති ලේකම්තුමා ප්‍රධාන ජනාධිපති ලේකම් කාර්යාලයේ සියලු දෙනාටම මගේ ප්‍රණාමය, ස්තුතිය පළමුවෙන්ම පුද කරන්නට ඕනෑ.

මම කලින් කිව්වා වගේ රටට අවශ්‍ය ආයතන ගණනාවක ප්‍රධානීන්, මණ්ඩල, සාමාජිකයෝ, සේවක සේවිකාවන් සියලුදෙනාටම මගේ ප්‍රණාමය හා ස්තුතිය පුද කර සිටින්නට ඕනෑ, අදාළ ප්‍රාග්ධන වියදම් මුළුමනින්ම වියදම් කිරීම නිසා සහ ඒ සෑම ආයතනයක් තුළම හොඳ ප්‍රගතියක් පෙන්වීම පිළිබඳව.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී අභියාචනාධිකරණයේ සභාපතිතුමිය පිළිබඳව දීර්ඝ සඳහනක් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ජනාධිපතිවරයාගේ නියෝජිතයා හැටියට කටයුතු කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම එහි පසු බිම ඔබතුමා මාර්ගයෙන් මේ සභාවට දැනුම් දිය යුතුයි. එතුමා සඳහන් කළා, අභියාචනාධිකරණයේ සභාපති තනතුර සඳහා දීපාලි විජේසුන්දර විනිශ්චයකාරතුමියගේ නම ජනාධිපතිවරයා විසින් තුන් වතාවක් එවලා තිබෙනවා, ඒ නම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ප්‍රතික්ෂේප කර තිබෙනවා කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දිහා බැලුවාම පෙනෙනවා, අභියාචනාධිකරණයේ සභාපතිකමට සුදුස්සෙක් යැවීමේ වගකීම ව්‍යවස්ථාවෙන් දීලා තිබෙන්නේ ජනාධිපතිවරයාටයි; ඒ නම ව්‍යවස්ථා සභාවට තෝරා ගන්නට බැහැයි කියන එක. ජනාධිපතිවරයා විසින් තෝරා එවන නම සුදුසුද නැද්ද කියන එක විතරයි ව්‍යවස්ථා සභාව තුළ සාකච්ඡාවට භාජන කර, තීරණයක් ගෙන නැවත ජනාධිපතිවරයාට යැවිය යුත්තේ, එම පත්වීම කිරීමට. මේ සඳහා සම්ප්‍රදායකුත් තිබෙනවා, ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේත් සඳහන් කරලා තිබෙනවා, එවැනි අවස්ථාවලදී අභියාචනාධිකරණයේ, නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙකු පිළිබඳව අග්‍ර විනිශ්චයකාරතුමාගෙන් නිර්දේශයක් ලබාගත යුතුයි කියලා. එතුමාගේ අදහස් එවන්න කියලා ව්‍යවස්ථා සභාවෙන් අග්‍ර විනිශ්චයකාරතුමාට දැන්වූවාට පස්සේ , -ඇත්ත වශයෙන්ම සඳහන්ව තිබෙන්නේ නිර්දේශයන් එවන්න නොවෙයි; අදහස් එවන්න කියලායි.- අග්‍ර විනිශ්චයකාරතුමා ලිපියකින් දන්වලා තිබෙනවා, අභියාචනාධිකරණයේ සභාපතිකමේ වගකීම දරන්න එතුමියට බැහැ කියලා. මේක එක පුද්ගලයෙකුගේ මතයක්. ශ්‍රේෂ්ඨාධිකරණයේ අග විනිසුරුතුමා ලියලා කියනවා,- ඒක චෝදනාවක් නොවෙයි. එතුමියට විරුද්ධව අල්ලස් චෝදනාවක් නැහැ, එතුමිය විනයානුකූල නොවන ආකාරයෙන් කටයුතු කරලා තිබෙනවා කියලා චෝදනාවක් නැහැ, JSC -Judicial Service Commission - එකෙන් එතුමිය පිළිබඳ පරීක්ෂණයක් පවත්වලා නැහැ.- එතුමියට අභියාචනාධිකරණයේ සභාපතිකම උසුලන්න බැහැ; ඒ සභාපතිකමේ තිබෙන වැඩ රාජකාරි දිහා බැලුවාම එතුමියට ඒ වගකීම භාර ගන්න බැහැ කියලා. හැබැයි, ඒ එක්කම අග්‍ර විනිශ්චයකාරතුමා කියනවා, මෙතුමිය විනිසුරුවරයෙක් හැටියට ශ්‍රේෂ්ඨාධිකරණයට යැවීම සුදුසුයි කියලා. ඒක පරස්පර විරෝධී අදහසක්. එක පැත්තකින් අග විනිසුරුතුමා නිර්දේශ කරනවා, එතුමිය ශ්‍රේෂ්ඨාධිකරණයට යැවීම සඳහා සුදුසුයි කියලා. තව පැත්තකින් එතුමා තනි මතයක් අනුව කියනවා, අභියාචනාධිකරණයේ සභාපති තනතුරේ වගකීම් දරන්න එතුමියට බැහැ කියලා. Sir, it becomes subjective. It is a subjective evaluation. It is not an objective evaluation. අග්‍ර විනිශ්චයකාරතුමාගේ මතය තමයි එතුමා ඉදිරිපත් කරලා තිබෙන්නේ. අවාසනාවකට අග විනිසුරුතුමාගෙන් එවැනි අදහස් ලබා ගන්න කොට, ඒ අදහස් එවන්නට පෙර අග විනිසුරුතුමා කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ වැඩ පිළිවෙළක් දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් කරලා නැහැ. මොකද, කුමක් හෝ කමිටුවක් තිබෙනවා නම්, එහෙම නැත්නම් වෙනත් අයගේත් අදහස් අරගෙන එම අදහසුත් එවනවා නම්, ඒක වෙනම කාරණයක්. නමුත් එතුමා තනි මතයට කියනවා, මෙතුමියට ඒ වැඩේ කරන්න බැහැ කියලා. ඉතින්, ජනාධිපතිතුමාට ඒක දැන්වූවාට පස්සේ, ජනාධිපතිතුමා බොහොම සාධාරණව කියලා තිබෙනවා, "මට මේක පිළිගන්න බැහැ, මේක හේතුවක් නොවෙයි" කියා. ඒ පත් කරලා තිබෙන කෙනාට මේ වගකීම උසුලන්න බැහැ කියලා එක පුද්ගලයෙකුට කියන්න බැහැ. "එතුමියට විරුද්ධව මොකක් හෝ චෝදනාවක් තිබෙනවා නම්, ඒක වෙනම දෙයක්. එතකොට මට වෙන නමක් එවන්න පුළුවන්" කියලා ජනාධිපතිතුමා කියා තිබෙනවා. ඇත්ත වශයෙන්ම පසුබිම මේකයි. ඒ නිසාම තමයි ජනාධිපතිතුමා තුන්වතාවක් මේ නම එවලා තිබෙන්නේ. නැවත වතාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රැස් වෙනකොට අපි මේ පිළිබඳ කථා කරන්න බලාපොරොත්තු වෙනවා. "ජනාධිපතිතුමා එක්ක වාඩි වෙලා අපි මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කළ යුතුයි" කියලා මම පසුගිය රැස්වීමේදී යෝජනා කළාම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඒක පිළිගත්තා; ඒකට එකඟ වුණා. ඒ සඳහා ජනාධිපතිතුමාගෙන් වේලාවක් ඉල්ලා තිබෙනවා. අපට වේලාවක් ලබා දුන්නාම ඉක්මනින් මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්.

[ගරු මහින්ද සමරසිංහ මහතා]

අවාසනාවකට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හිඩැසක් තිබෙනවා. අභියාචනාධිකරණයේ සභාපති තනතුරට දවස් 14කට පත් කරන්න පුළුවන්. හැබැයි, ඒ දවස් 14 ඉක්ම ගියාට පසුව මොකක්ද කරන්න පුළුවන් කියලා සඳහනක් නැහැ. ඒ නිසා තමයි දවස් 14න්, 14ට මේ පත්වීම දීලා තිබෙන්නේ. මේක තමයි ඇත්ත තත්ත්වය. මම මේ බොහොම මධ්‍යස්ථව කථා කරන්නේ. මේ පිළිබඳ අනුර දිසානායක මන්ත්‍රීතුමා විශේෂයෙන් සැලකිල්ලක් දක්වයි කියා මං බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, ජිනීවා මානව හිමිකම් කවුන්සිලය වැනි ස්ථානයකට ජනාධිපතිවරයාගේ නියෝජිතයින් හැටියට විපක්ෂයේ මන්ත්‍රීවරු යවන්නේ කොහොමද කියලා ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා. ජනාධිපතිවරයාට ඕනෑම කෙනෙක් ජනාධිපතිවරයාගේ විශේෂ නියෝජිතයෙක් හැටියට යවන්න පුළුවන්. ඒකට තහංචියක් නැහැ. ආණ්ඩුවේ කෙනෙක් යවන්නත් පුළුවන්. මේ සභාවේ සිටින 225න් ඕනෑම කෙනෙක් යවන්න පුළුවන්. මානව හිමිකම් කවුන්සිලයට හෝ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ සැසිවාරයට හෝ වෙනත් සම්මන්ත්‍රණයකට මගේ විශේෂ නියෝජිතයා හැටියට මම කාව හරි යවන්න ඕනෑ කියලා එතුමා හිතනවා නම්, ඒක එතුමාට තිබෙන අයිතියක්. සුමන්තිරන් මන්ත්‍රීතුමා ඒ ගැන ප්‍රශ්න කිරීම සම්පූර්ණයෙන් වැරදියි. ඒක ජනාධිපතිවරයාට නීත්‍යනුකූලව ලැබී තිබෙන අයිතියක්. එතුමා ඇහුවා මේ වැය ශීර්ෂයේ මුදල් ඒකට පාවිච්චි කරන්නේ කොහොමද කියලා. ඒ මුදල් පාවිච්චි කිරීමේ නීත්‍යනුකූලභාවයක් ජනාධිපතිවරයා සතුව තිබෙනවා කියන එක මම විශේෂයෙන් සඳහන් කරන්න කැමතියි.

සුමන්තිරන් මන්ත්‍රීතුමා මානව හිමිකම් කවුන්සිලය පිළිබඳ ලොකුවට, විස්තරාත්මකව කථා කළා. කවුද යන්නේ, අපි එහේ ගිහින් මොකක්ද කරන්නේ කියලා අපේ සභානායකතුමා මගෙන් පැහැදිලි කිරීමක් ඉල්ලුවා. මම ඒකට එන්න කලින් මානව හිමිකම් කවුන්සිලය කියන්නේ මොකක්ද, ඒක මොන වාගේ ව්‍යුහයක්ද, මොකක්ද මානව හිමිකම් කවුන්සිලයෙන් කරන්නේ කියන එක ගැන බොහොම කෙටියෙන් සඳහන් කරන්න කැමතියි. මොකද, මේ සභාවේ සිටින 225දෙනාගෙන් මානව හිමිකම් කවුන්සිලය පිළිබඳ අත්දැකීම් මට තරම් වෙන කාටවත් නැහැ කියන එක මම බොහොම නිහතමානීව කියන්න කැමතියි. ඒ පසුබිමත් එක්ක තමයි මම මේ ඉතිහාසය ගැන ටිකක් කියන්න යන්නේ. මානව හිමිකම් කවුන්සිලයේ මේ වාගේ ප්‍රශ්නවලට අපට මුහුණ දෙන්න සිදු වුණේ අද ඊයේ නොවෙයි. හුඟක් දෙනෙක් හිතන්නේ මහින්ද රාජපක්ෂ විපක්ෂ නායකතුමාගේ -හිටපු ජනාධිපතිතුමාගේ- කාලයේ තමයි මේ මානව හිමිකම් ප්‍රශ්න සියල්ලටම අපට කරගහන්න සිද්ධ වුණේ කියලා. නැහැ. මම ජිනීවාවල පිහිටි අපේ තානාපති කාර්යාලයේ ජයන්ත ධනපාල තානාපතිතුමාගේ දෙවැනියා හැටියට 1983-1987 අතර කාලයේ කටයුතු කළ අවස්ථාවේ අපට ලොකු අභියෝගයකට මුහුණ දෙන්න සිදු වුණා. මොකද, එක්තරා රටක්, අපට කිට්ටු රටක් ආර්ජන්ටිනාව ඉලක්ක කරගෙන, ආර්ජන්ටිනාව අල්ලාගෙන අපට මානව හිමිකම් කොමිසමට -ඒ කාලයේ තිබුණේ කවුන්සිලය නොවෙයි, කොමිසම- මේ වාගේ චෝදනා ඉදිරිපත් කරලා යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදී එච්.ඩබ්ලිව්. ජයවර්ධන වන හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ සහෝදරයා තමයි අපේ ශ්‍රී ලංකා කණ්ඩායමේ ප්‍රධානියා හැටියට ආවේ. එතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කළේ නැහැ. එතුමා ගැන තිබෙන විශ්වාසය මත ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා එතුමාව තෝරා ගත්තා. අපි ඒවාට මුහුණ දුන්නා. ඒ වාගේ යෝජනා 1983 සිට නිතර, නිතර ජාත්‍යන්තර මට්ටමින් ඉදිරිපත් වුණා. අපි ඒවාට සාර්ථකව මුහුණ දුන්නා.

ඒ වාගේම, අපි 2012දී, 2013දී, 2014දී යෝජනා පැරදුණා කියන එක අපේ සභානායකතුමා සඳහන් කළා. ඒක ඇත්ත. හැබැයි එතුමාට සඳහන් කරන්න අමතක වුණා, යුද්ධයෙන් පස්සේ 2009දී ලංකාව පිළිබඳව මානව හිමිකම් කවුන්සලයේ ක්‍රියාත්මක කරපු විශේෂ සැසිවාරය අවස්ථාවේදී අපි තුනෙන් දෙකකට කිට්ටු වෙන්න ඡන්ද අරගෙන ඒ යෝජනාව ජයග්‍රහණය කළ බව. ඒ අවස්ථාවේදීත් ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකා කණ්ඩායමේ ප්‍රධානත්වය, නායකත්වය දැරුවේ මමයි. ඒ අවස්ථාවේ මමත් එක්ක හොඳ කණ්ඩායමක් ගියා. අපි සාමූහිකව කණ්ඩායම් හැඟීමෙන් ඒවාට මුහුණ දීලා, තුනෙන් දෙකකට කිට්ටු වෙන්න අපි ඡන්ද ලබාගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඒ බාර ගත්ත පොරොන්දු අපි හරියට ඉෂ්ට කළේ නැහැ. අපි හරියට ඒවා ක්‍රියාත්මක කරන්න කටයුතු කළේ නැහැ. ඊට පස්සේ 2012 වෙනකොට අපට කට උත්තර නැතිව ගියා. අපි ඒ යෝජනාවෙන් පැරදුණා. අපි 2013 යෝජනාවෙන් පැරදුණා. අන්තිමට මානව හිමිකම් කවුන්සලයේ තුනෙන් දෙකක් ඡන්ද ගත්ත අපේ රට ඡන්ද 12ට බැස්සා. රටවල් 47න් අපි තුනෙන් දෙකක් ගත්තා. නමුත්, අවුරුදු 3ක්, 4ක් ඇතුළත අපි ඡන්ද 12කට බැස්සා. ඒ බැස්සේ, අපි මේ මේ දේවල් කළා කියන එක අපට ඇත්ත වශයෙන්ම කවුන්සලයට ගිහිල්ලා හරියට කියා ගන්න බැරි වුණු නිසා. බස් එක ගියා. අපි බස් එකට නැග්ගේ නැහැ. ඇත්ත වශයෙන්ම සභානායකතුමා කිව්වා වාගේ 2015 වෙනකොට ඒ ගොල්ලන් දරුණු වාර්තාවක් පිළියෙළ කරලා තිබුණේ. ඒ දරුණු වාර්තාව ඉදිරිපත් වුණා නම්, ඒක පදනම් කරගෙන ආර්ථික සම්බාධක පනවන්න අනිවාර්යයෙන්ම රටවල් කීපයක් ලැහැස්ති වෙලා තිබුණේ. ඕනෑ නම් මට ඒ රටවල් නම් කරන්න පුළුවන්. ඒ රටවල් ආර්ථික සම්බාධක පනවන්න ලැහැස්ති වුණේ.

අදත් අපේ රටේ තිබෙන මේ ප්‍රශ්නය පිළිබඳව අවධානය යොමු කරගෙන මානව හිමිකම් කවුන්සලයට යෝජනා පවා ගේන්න මේ රටවල් විශාල උනන්දුවක් දරන්නේ, ඒ රටවල්වල විශාල දෙමළ ඩයස්පෝරාවක් අද පුරවැසිභාවය අරගෙන ජීවත් වෙන නිසායි. හෙට-අනිද්දා ඉදිරිපත් කරන්න යන මේ යෝජනාවේ මූලිකත්වය අරගෙන තිබෙන්නේ කවුද? මූලිකත්වය අරගෙන තිබෙන්නේ, විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයයි, කැනඩාවයි, ජර්මනියයි. මොන්ටිනීග්‍රෝ ඇතුළු රටවල් හතරක්, පහක් ඒ ගොල්ලන් බලය වැඩි කරගන්න එල්ලා ගත්ත රටවල්. අර රටවල් තුනේ දෙමළ ඩයස්පෝරාවේ කී දෙනෙක් ඉන්නවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැනඩාවේ ලක්ෂ 5කට ආසන්න දෙමළ ඩයස්පෝරාවක් ඉන්නවා. ඒ ගොල්ලන් පුරවැසිභාවය අරගෙන ඒ ගොල්ලන්ට ඡන්ද අයිතිය තිබෙනවා. ඒ ගොල්ලන්ගේ කොට්ඨාසවල මන්ත්‍රීවරුන් හරහා ඒ ගොල්ලන් ඒ බලපෑම ගේනවා. ඒ ගොල්ලන් විදේශ අමාත්‍යාංශයට ඒ බලපෑම ගේනවා. එතකොට ඒ අය කුලප්පු වෙලා, කරන්න පුළුවන් උපරිම දේ කරන්න ඒ ගොල්ලන් ඉදිරිපත් වෙනවා. ඒ වාගේම, බ්‍රිතාන්‍යයේ ලක්ෂ දෙකහමාරකට ආසන්න දෙමළ ඩයස්පෝරාවක් ඉන්නවා. ඊටත් වඩා වැඩි වෙන්න පුළුවන්. ජර්මනියේ ඒ තරම් නැහැ. හැබැයි, ජර්මනියේත් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ ගොල්ලන්ට මේ රටවල පුරවැසිභාවය දීලා තිබෙනවා. ඒක තමයි මේ ගොල්ලන් පාවිච්චි කරන්නේ. මම ජිනීවා ඉඳලා ඊයේ ආවේ. ඇත්ත වශයෙන්ම මම එහේ ඉන්න අවස්ථාවේදී පොඩි පසු විපරමක් කළා. ජනාධිපතිතුමාත් මට කිව්වා, ඒ පසු විපරම කරන්න කියලා. මම ඊයේ ජනාධිපතිතුමාට ඇත්ත තත්ත්වය පැහැදිලි කරලා දුන්නා. ඊයේ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් කැඳවලා තිබුණා. ඒ රැස්වීමට අපේ ගරු සරත් අමුණුගම මන්ත්‍රීතුමාත්, මමත්, උතුරු පළාතේ ආණ්ඩුකාරතුමාත්, ගරු තිලක් මාරපන විදේශ කටයුතු ඇමතිතුමාත්, ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමාත් ඇවිල්ලා හිටියා. ඒ වාගේම, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් රවිනාත් ආරියසිංහ මැතිතුමාටත් ආරාධනා කරලා තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත විනාඩි 15ක කාලය දැන් අවසානයි. ගරු සරත් අමුණුගම මන්ත්‍රීතුමා කිව්වා, එතුමාගේ කාලය ඔබතුමාට ලබා දෙනවා කියලා.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
මට ගරු නිමල් සිරිපාල ද සිල්වා මන්ත්‍රීතුමාගේ විනාඩි 15ත් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා කථා කරන්න.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
එතකොට මේ රැස්වීම, දිගටම-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

පස්වරු 12.30න් පසුව තවත් විනාඩි 15ක් සභාව පවත්වා ගෙන යෑම සඳහා සභාවේ අවසරය ලබා ගත යුතුයි.
Now the House resumes.

***ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.***
*அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවා විවේකයෙන් විනාඩි 15ක් විවාදය සඳහා ලබා ගත යුතුයැයි මා යෝජනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී - [මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பட்டது. - [மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee. [* HON. PRESIDING MEMBER *in the Chair.]*

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජිනීවාවල ඉඳලා ඊයේ උදේ පැමිණි නිසා, ඊයේ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු රැස්වීමේදී ජනාධිපතිතුමා මට අවසර දුන්නා, වර්තමාන තත්ත්වය පිළිබඳව පැමිණ සිටින සියල්ලන්ම දැනුවත් කරන්න. මම ඒ අවස්ථාවේ යෝජනා කළේ, තිලක් මාරපන විදේශ කටයුතු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපේ කණ්ඩායම මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරයට මේ අන්තිම සතියේ සහභාගි වෙලා, අපේ මතය ඉදිරිපත් කරන්න කටයුතු කරන්න කියලායි. මට තිබෙන තිබෙන අත්දැකීම් සියල්ල එක්කම මම එතැනදී බොහොම පැහැදිලිව පෙන්වලා දුන්නා, අපි කණ්ඩායම් දෙකක් හැටියට එතැනට ගිහිල්ලා පරස්පර විරෝධී අදහස් ප්‍රකාශ කරන එක නොවෙයි කළ යුත්තේ කියලා. සභානායකතුමා පෙන්වා දුන් ආකාරයට, 2009දී අපි ජයග්‍රහණය කරපු යෝජනාව පැත්තකට දැම්මාට පස්සේ, 2012, 2013, 2014 යෝජනා වාගේම, 2015 වර්ෂයේ 30/1 කියන යෝජනාව, 2017 වර්ෂයේ 34/1 කියන යෝජනාව, දැන් මේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව -මේ සියල්ලක්ම- අඩංගු කරලා තිබෙනවා, 21වැනි දා සාකච්ඡා කරන යෝජනාවට. අපි මේවාට එකඟ වෙලායි තිබෙන්නේ. 2015 ඉඳලා 30/1 යෝජනාවට අපි සමඅනුග්‍රහය දැක්වූවා. අපි 34/1 යෝජනාවටත් සමඅනුග්‍රහය දැක්වූවා.

මේ මාසයේ 21වැනි දා ඉදිරිපත් කරන්න යන යෝජනාව ගැන විදේශ කටයුතු අමාත්‍යාංශය මේ වෙන කොට කියලා තිබෙනවා,ඒකට සමඅනුග්‍රහය දක්වනවා කියලා. 21වැනි දා ඉදිරිපත් කරන්න යන යෝජනාව දිහා බැලුවාම, ඇත්ත වශයෙන්ම ඒ යෝජනාවේ ලොකු දෙයක් නැහැ. හැබැයි, ඔය 30/1, 34/1 කියන යෝජනා දෙක ඒ ගොල්ලන් සම්බන්ධ කරලා තිබෙනවා 21වැනි දා ඉදිරිපත් කරන්න යන යෝජනාවට. එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. කොහොම වුණත්, විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් දැන් නිල වශයෙන් කියලා තිබෙනවා, අපි මේකට සමඅනුග්‍රහය දක්වනවා කියලා. ජනාධිපතිතුමා ප්‍රකාශයක් කළා, එතුමාගේ නියෝජිතයන් තුන්දෙනෙක් එවනවා කියලා. මොකද, ඒ වෙන කොට ආණ්ඩුවෙන් තීරණයක් අරගෙන තිබුණේ නැහැ, විදේශ කටයුතු ඇමතිවරයා හෝ කවුරු හරි ඇමතිවරයෙක් එවනවා කියලා. ජිනීවාවල ඉන්න අපේ තානාපතිවරයාට ඒ වග කීම භාර දීලායි තිබුණේ. හැබැයි, ඔබතුමා මාර්ගයෙන් මේ සභාව දැන ගන්න ඕනෑ, අර පුළුල් වාර්තාව 20වැනි දා එනවා කියලා.

අවුරුදු දෙකක් තිස්සේ මානව හිමිකම් කවුන්සිලය පිළියෙල කරපු පුළුල් වාර්තාව තමයි ඉස්සෙල්ලාම සාකච්ඡා කරන්නේ. ඒක මානව හිමිකම් කොමසාරිස්තුමියගේ වාර්තාව හැටියටයි ඉදිරිපත් කරන්නේ. 34/1 කියන යෝජනාවෙන් බලය දුන්නේ, අවුරුදු දෙකක් අරගෙන, පුළුල් වාර්තාවක් 2019 මාර්තු මාසයේ සැසිවාරයට ඉදිරිපත් කරන්නයි. දැන් ඒ වාර්තාව 20වැනි දා ඉදිරිපත් වෙනවා. 20වැනි දා තිලක් මාරපන අපේ විදේශ කටයුතු ඇමතිතුමා සමස්ත රජය වෙනුවෙන්, රට වෙනුවෙන් ප්‍රකාශයක් කරන්න ලැස්ති වෙනවා. ඒක තමයි ඊයේ ගත්තු තීරණය.

එතුමාත් එක්ක කවුද යන්නේ? ඇත්ත වශයෙන්ම මා කිව්වා, මා යන්නේ නැහැයි කියලා. මොකද, මා දැන් ගියා ඇති. මා අවුරුදු 10ක් තිස්සේ ගිහින් ඒ අභියෝගවලට මුහුණ දුන්නා. අපි උඩ බලාගෙන කෙළ ගැහුවේ නැහැ. අපි ඒ සටනේ දිගටම සිටියා. අපේ ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ රණ විරුවන් අපි කවදාවත් පාවා දුන්නේ නැහැ. අපි කිව්වේ නැහැ, ඒ යුද්ධයේදී කවුරුවත් මැරුණේ නැහැයි කියලා. හැබැයි මා කිව්වේ, ප්‍රතිපත්තියක් හැටියට අපේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය සිවිල් ජනතාව ඉලක්ක කරගෙන යුද්ධයක් කළේ නැහැ කියන එකයි. අපි ප්‍රතිපත්තියක්

[ගරු මහින්ද සමරසිංහ මහතා]

වශයෙන් එහෙම දේවල් කළේ නැහැ. ඒක මා එදාත් කිව්වා, අදත් කියනවා, ඉදිරියටත් කියනවා. ඒක තමයි ඇත්ත. අපි මේවා කියන්න ඕනෑ. අපි ඒවා කිව්වා. අපි ඒවා කිව්වා විතරක් නොවෙයි, ලොකු රටවල සමහර තානාපතිවරුන්ට ඇඟිල්ල දික් කරලා මා කිව්වා, "වීදුරු ගෙවල්වල ඉඳලා ගල් ගහන්න එපා"යි කියලා. ඒක ඉස්සෙල්ලාම කිව්වේ මම. අපි රට වෙනුවෙන් ඒ විධියට සටන් කළා. මේ අවස්ථාවේදී මා ඒ ගමන යන්න ඕනෑ නැහැ. මා ජනාධිපතිතුමාට කිව්වා, "මා යවන්න එපා. මා යන්නේ නැහැ"යි කියලා. හැබැයි ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතයා හැටියට අපේ සරත් අමුණුගම මන්ත්‍රීතුමා ගිය අවුරුද්දේත් ගියා. අපේ සරත් අමුණුගම හිටපු ඇමතිතුමා ගැන කියනවා නම්, එතුමා පළපුරුද්දක් තිබෙන, මේ විෂය පිළිබඳ හොඳ දැනුමක් තිබෙන, පරිණත දේශපාලනඥයෙක්. අපේ තිලක් මාරපන විදේශ කටයුතු ඇමතිතුමාට සහය දෙන්න එතුමා යනවා. තිලක් මාරපන ඇමතිතුමාත් මේ විෂයයට සම්බන්ධවෙලා තිබෙන්නේ අද ඊයේ නොවෙයි. මා ජිනීවාවල සිටියදී එතුමා නීතිපතිවරයා හැටියට ඒ කාලයේදීත් එනවා. එතුමා දීර්ඝ කාලයක් තිස්සේ මේ පිළිබඳව හොඳ අත්දැකීම් ඇතිව තමයි අද විදේශ කටයුතු අමතිවරයා හැටියට කටයුතු කරන්නේ. ඒ නිසා තමයි අපි ඊයේ තීරණයක් ගත්තේ, කවුරුන් හෝ ප්‍රකාශයක් කරනවා නම් ඒ ප්‍රකාශය කරන්න ඕනෑ රජයේ ඇමතිවරයෙක් කියලා. රජයේ ඇමතිවරයකු සිටියදී වෙනත් කවුරුන් හෝ ගිහින් එවැනි ප්‍රකාශයක් කළොත් ඇත්ත වශයෙන්ම ජාත්‍යන්තර ප්‍රජාවටත් එය පිළිගන්න බැරි තත්ත්වයක් ඇතිවෙනවා. හැබැයි, ඒ කරන ප්‍රකාශය සාමූහික ප්‍රකාශයක් වෙන්න ඕනෑ. අවුරුදු 10ක් තිස්සේ ඒ ප්‍රකාශ ඉදිරිපත් කරපු කෙනා හැටියට මා ඔබතුමා මාර්ගයෙන් මේ සභාවට මතක් කරන්න ඕනෑ, අපි ජිනීවාවලට යන්න ලංකාවෙන් පිටත් වෙන්න ඉස්සෙල්ලා විදේශ කටයුතු අමාත්‍යාංශයත්, ආරක්ෂක අමාත්‍යාංශයත්, මානව හිමිකම් අමාත්‍යාංශයත් ඇතුළු අපි සියලුදෙනාම වාඩිවෙලා සාකච්ඡා කරන බව. අපි සති දෙකක්, සති තුනක් තිස්සේ සාකච්ඡා කරලා deliver කරන්න යන statement එකේ draft එකක් හදාගන්නවා. මොකද, එතැනදී අපි ඉදිරිපත් කරන්නේ රට වෙනුවෙන් කරන ප්‍රකාශයක්. ඊට පස්සේ මා ඒ draft statement එක අරගෙන ජිනීවාවලට යනවා. ජිනීවාවලට ගිහින් එහි තානාපතිවරයාත් එක්ක තව සාකච්ඡා වටයක් පවත්වනවා. ජිනීවාවල සිටින එතුමාගේ ප්‍රායෝගික දැනුම එතුමා අපට ලබාදෙනවා. ඊට පස්සේ එය සංශෝධනය කරන්න ඕනෑ නම් සංශෝධනය කරනවා. මා එතැනින් නවත්වන්නේත් නැහැ. එහිදී මා කළ හැම ප්‍රකාශයක්ම ජනාධිපති කාර්යාලයට එවා තිබෙනවා, ප්‍රකාශය කරන්න ඉස්සෙල්ලා. ඒ වාගේම ආරක්ෂක අමාත්‍යාංශයටත් එවලා තිබෙනවා. ඒ සම්බන්ධීකරණය තිබෙන්න ඕනෑ. ඒක එව්වාට පස්සේ විදේශ කටයුතු අමාත්‍යාංශයේයි, ආරක්ෂක අමාත්‍යාංශයේයි ඇමතිවරු නැවත වරක් සම්බන්ධවෙලා ඒ ප්‍රකාශය බලා ඒ සම්බන්ධයෙන් එතුමන්ලාගේ අදහස් තිබෙනවා නම් ඒ අදහස් අපට ඉදිරිපත් කරනවා. ඒ අදහස් භාරගන්න පුළුවන් නම් අපි ඒවා භාර ගන්නවා.

ඊයේ ගත්ත තීරණය අනුව අපි දැන් වහාම joint statement - joint text- එක හදන්න පටන් ගන්න යනවා. ඒ joint text එක හදනකොට විදේශ කටයුතු අමාත්‍යාංශය වාගේම, ඒ අදාළ පාර්ශ්ව අපි සම්බන්ධ කර ගන්නවා. එයට විශේෂයෙන්ම සම්බන්ධ වෙනවා, සරත් අමුණුගම මන්ත්‍රීතුමා සහ උතුරේ අපේ ආණ්ඩුකාරවරයා. මා කිව්වා, ඒක හදනකොට ඕනෑ නම් මෙහේ ඉඳලා මාත් සම්බන්ධ වෙන්නම් කියලා. ඒක හදලා අවසාන draft එක ජනාධිපතිවරයාට පෙන්වනවා; අගමැතිවරයාට පෙන්වනවා. ආණ්ඩුවේ විදේශ කටයුතු ඇමතිවරයා දන්නවා, අපි එහේට ගිහින් කරන්න යන statement එක මොකක්ද කියලා. ඊට පස්සේ, 20 දා තිලක් මාරපන ඇමතිතුමා විදේශ ඇමතිවරයා හැටියට සමස්ත රට වෙනුවෙන් කරන statement එක එතැනදී deliver කරනවා. එහෙම තමයි කළ යුත්තේ. එතකොට එහි භාරකාරිත්වය - ownership - අපට ගන්න පුළුවන්. ජනාධිපතිතුමා කොන් කරලා මේ කටයුත්ත කරන්න බැහැ. ජනාධිපතිතුමා ආණ්ඩුවේ ප්‍රධානියා. එතුමා දැන ගන්න ඕනෑ, කරන්න ඕනෑ මොකක්ද කියලා.

දැනට ඉදිරිපත් කරලා තිබෙන පුළුල් වාර්තාවේ තිබෙන හැම දෙයක්ම අපට පිළිගන්නත් බැහැ. ඒ බව අගමැතිතුමාත් පිළිගන්නවා. අපට පිළිගන්නට බැරි දේවල් මොනවාද කියලා අපි කියනවා. මේ දේවල් මෙහෙමයි, අපි මේ මේ දේවල් කරන්නට බලාපොරොත්තු වෙනවා, ඒක හරිගස්සා ගන්න කියලා. ඇත්ත වශයෙන්ම අපි මේ ප්‍රකාශයට ඒ වාගේ දේවල් අඩංගු කරනවා. [බාධා කිරීමක්] ඔව්, අපට අයිතිය තිබෙනවා ඒක කියන්නට. විශේෂයෙන්ම අදාළ රට හැටියට 20වැනිදා අපට විශේෂ අවස්ථාවක් දෙනවා. මේ යෝජනාවට සම අනුග්‍රාහකත්වය ලබා දීලා තිබෙන නිසා, ඒකේ වෙනසක් වෙන්නේ නැහැ. හැබැයි, අපට කියන්නට පුළුවන් 30/1 යෝජනාවේ සහ 34/1 යෝජනාවේ අපට පිළිගන්නට බැරි මොකක්ද කියලා. සම අනුග්‍රහය දීලා ඒක කියන්නේ නැතිව ඉන්න ඕනෑ කියලා නීතියක් නැහැ. අපට කියන්නට පුළුවන්,"Yes, we are co-sponsoring it. But, we have concerns about these aspects." කියලා.

ඒ විධියේ ප්‍රකාශයක් තිලක් මාරපන ඇමතිතුමා රජය වෙනුවෙන්, සමස්ත රට වෙනුවෙන් 21වෙනිදාත් කරනවා. මේ විධියට තමයි ඒ වැඩ පිළිවෙළ දැන් සකස්වෙලා තිබෙන්නේ. කිසිම ප්‍රශ්නයක් නැහැ, විදේශ කටයුතු ඇමතිවරයාගේ ප්‍රධානත්වයෙන් තමයි ඒ කණ්ඩායම යන්නේ. ඒ සඳහා විශේෂයෙන්ම ගරු සරත් අමුණුගම මැතිතුමා සම්බන්ධ වෙනවා. ඒ වාගේම උතුරේ ආණ්ඩුකාරවරයාත් ඉල්ලීමක් කරලා තිබෙනවා, එතුමාවත් සම්බන්ධ කර ගන්න කියලා. ජනාධිපතිතුමාත් ඒකට එකඟවෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම එතුමාට පුළුවන් සංහිඳියාව කරා යන ගමනේ විශේෂ අංශ සහ ඒ ප්‍රගතිය වාර්තා කරන්නට. වෙන වෙන දේවල් නොවෙයි, පෙත්සම් ගෙන යන්න නොවෙයි එතුමා කටයුතු කරන්නට ඕනෑ. මම දැක්කා පත්තරයක පළ වෙලා තිබුණා, එතුමාට පෙත්සම් භාර දෙන්න සමහරු ලැහැස්ති වෙනවා කියලා. මානව හිමිකම් කවුන්සලය කියන්නේ පෙත්සම් භාරදෙන තැනක් නොවෙයි. [බාධා කිරීමක්] ඔව්, තැපැල් කන්තෝරුවක් නොවෙයි ඒක. එතුමා ගිහින් ඒ කටයුත්ත කරයි.

මට අවසානයේ දී කියන්නට තිබෙන්නේ මෙපමණයි. ඒ අත් දැකීම් ඇතිවයි මම මේ කථා කරන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම දැකලා තිබෙන ස්වරූපය තමයි, මෙවැනි යෝජනා ඉදිරිපත් වෙනවා. අපි 2015 දක්වා ඒවා වෙනුවෙන් සටන් කළා; ඒවාට අභියෝග එල්ල කළා. අපි පැරදුණා. 2015න් පසුව අපි සම අනුග්‍රහය දක්වලා ඡන්දයක් තියන්නේ නැතිව ඒ යෝජනා සම්මත කර ගත්තා.

හැබැයි, මම දකින දෙයක් තිබෙනවා. මම බොහොම අපක්ෂපාතීව, මධ්‍යස්ථව කියන්නට ඕනෑ, ජිනීවා ගිහින් ආවාට පසුව මොකක්වත් වෙන්නේ නැහැ. ජිනීවා ගිහින් ආවාට පසුව අපට අමතක වෙනවා, තව අවුරුද්දකින් අපට ඒකට ආයේ මුහුණ දෙන්න සිද්ධ වෙනවා කියලා. මේ පාර ගිහිල්ලා ආවාට පස්සේ තව අවුරුදු දෙකකින් ආපහු පුළුල් වාර්තාවක් ඉදිරිපත් වෙනවා, ආපහු යෝජනාවක් එනවා. එතකොට ඒක ඉලක්ක කරගෙන අපි වැඩ කරන්නට ඕනෑ. අපි සංහිඳියාවට යන ගමන ශක්තිමත් කරන්නට ඕනෑ. අඩු පාඩු තිබෙනවා. අපට හැම දෙයක්ම කරන්නට බැරිවෙලා තිබෙනවා, යුද්ධය අවසන් වුණාට පසුව. සමහර රටවල් මෙවැනි කාරණාවලට අවුරුදු 20, 30, 40 ගන්නවා. අපි විශාල ප්‍රගතියක් පෙන්වලාත් තිබෙනවා. හැබැයි, අපට තව

දුරක් යන්නට තිබෙනවා. ඒ සඳහා අපි දේශපාලන වුවමනාවකින්, අධිෂ්ඨානශීලීව කටයුතු කරන්නට හැඩගැස්සෙන්නට ඕනෑ. මම ජනාධිපතිතුමාට යෝජනා කරනවා, මේ වැය ශීර්ෂයෙන් ප්‍රයෝජනයක් අරගෙන, අපේ ගරු සරත් අමුණුගම මැතිතුමන්ලා, ගරු තිලක් මාරපන ඇමතිතුමන්ලා ජිනීවා ගිහිල්ලා ආවාට පසුව පොඩි කමිටුවක් පත් කරන්න කියලා. කමිටුවක් පත් කරලා, ඊළඟ අභියෝගවලට මුහුණ දෙන්න, ඒ කරන්නට තිබෙන වැඩ කොටස කරන්න දැන්ම ඉඳලාම ලැහැස්ති වෙන්න කියලා මම යෝජනා කරනවා.

විශේෂයෙන්ම මම ප්‍රසංශා කරනවා, ජනාධිපතිතුමා කාර්ය සාධන බලකායක් පත්කරගෙන, එතුමා එහි ප්‍රධානත්වය අරගෙන අපේ ද්‍රවිඩ මන්ත්‍රීවරුන් සමඟ වාඩිවෙලා පැය ගණන් කථා කරමින් කරන කැපවීම ගැන. ඉඩම් නැවත පෞද්ගලික අයිතිකරුවන්ට ලබා දීමේ වැඩපිළිවෙළ ඇතුළු වෙනත් ප්‍රශ්න ගැන එතුමා පැය ගණන් කථා කරනවා මගේ ඇස් දෙකට දැකලා තිබෙනවා. එතුමා මෙහි ප්‍රගතියක් පෙන්වන්නට මොන වාගේ කැපවීමක් කරනවාද කියලා මා දැක තිබෙනවා. මේවා ජිනීවාවලට වාර්තා වෙන්නට ඕනෑ. ඒ වාගේම කරන්නට තව කටයුතු ටිකක් තිබෙනවා නම්, අපි ඒ ටිකත් කරලා ඉවර කරන්නට ඕනෑ. අපේ රටේ සියලුම ජන කොටස් අතර සමඟියක් ඇති කරන්නට පුළුවන් නම්, සියලුම ජන කොටස්වලට දිය යුතු ඒ සම පුරවැසිභාවය, අයිතිවාසිකම ලබා දෙන්නට පුළුවන් නම්, අපට මේ රට විශාල දියුණුවක් කරා ගෙන යන්නට පුළුවන්. මට කියන්නට තිබෙන්නේ එච්චරයි. මට වේලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ඇසූ ප්‍රශ්නවලට මෙතුමා සෑහෙන පිළිතුරක් ලබා දුන්නා. මෙතුමාට මම මතක් කරන්න කැමැතියි, මෙතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරයකුව සිටි කාලයේ ඔය කථාව කෙරුවේ නැහැ. එතුමා අද ඔය විධියට කථා කරන්නේ යහ පාලන ආණ්ඩුවේ ඇමතිවරයකු වෙලා හිටපු නිසා.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
ඔබතුමා,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No, please do not disturb me.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, සභානායකතුමාට අවස්ථාව දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙතුමා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට අවුරුදු දහයක් ගියා. ගිහිල්ලා, මොකක්ද අත්වුණු ප්‍රතිඵලය? 12, 13, 14 යෝජනා ශ්‍රී ලංකාවට විරුද්ධව සම්මත වුණා. 15 වන යෝජනාව ආර්ථික සම්බාධක. ඉතින්, ඔබතුමන්ලා ගැන හොඳට දන්නවා. මට ලජ්ජයි කියන්න, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ ඇමතිවරු මොනවාද කෙරුවේ? ජනාධිපතිතුමාට මම කියනවා, යවන කට්ටිය ගැන පරිස්සම් වෙන්න කියලා. මොකද, යවන කට්ටියගේ කැරැට්ටුව ගැන ඒ ගොල්ලන් හොඳට දන්නවා. මම එකක් කියන්නම්. ඒ කාලයේ අර ත්‍රිකුණාමලයේ ශිෂ්‍යයන් 11 දෙනා ඝාතනය වුණාම, ඇමතිවරු ඒ ශිෂ්‍යයන්ගේ දෙමවුපියන්ට කථා කරලා කියලා තිබෙනවා, "සාක්ෂි දෙන්න එන්න එපා; අපි කොළඹින් ගෙවල් දෙන්නම්; වාහන දෙන්නම්" කියලා. Dr. Manoharan ගේ පුතා මැරුවා. Dr. Manoharan එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කොමිසමට කියලා තිබෙනවා, මෙන්න මේ ඇමතිවරයා තමයි මට කථා කෙරුවේ කියලා. ඉතින් මේවා තේරුම් ගන්න. මම අපේ අනාගත අපේක්ෂක චමල් රාජපක්ෂ මැතිතුමාට කියනවා, - [බාධා කිරීමක්] මම කියන්නේ, යවනවා නම් හොඳ කට්ටිය යවන්න. මොකද, මේක යහ පාලන ආණ්ඩුව. මේකේ අරමුණ, approach එක වෙනස්. අවුරුදු දහයක් මානව හිමිකම් කවුන්සලයට ගිහිල්ලා, දැන් "මානව හිමිකම් උල්ලංඝනය වුණේ නැහැ; ඝාතන වුණේ නැහැ" කියලා වෙන සිංදුවක් කියන්න බැහැ. මේ සඳහා හොඳ කණ්ඩායමක්, අවංකවම මානව හිමිකම් ගැන විශ්වාසය තිබෙන කණ්ඩායමක් යවන්න ඕනෑ. එච්චරයි මම කියන්නේ. මොකද, රට ආගාධයට යවන්න අපි කැමැති නැහැ. අවුරුදු දහයක් මානව හිමිකම් කවුන්සලයට ගිහිල්ලා අපේ රට ආර්ථික සම්බාධක දමන තැනට ඇද ගෙන ගිහිල්ලා දැන් වෙන සිංදුවක් ගහන්න බැහැ. මම කියන්නේ ඒ සඳහා ආණ්ඩුවේ කට්ටිය යවන්න ඕනෑ. මොකද, අපටයි කැක්කුම තිබෙන්නේ. තමුන්නාන්සේලා මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට වැඩ කෙරුවාද? ඔබතුමන්ලා විරුද්ධව වැඩ කෙරුවේ. ඉතින් විරුද්ධව වැඩ කරපු අයට පුළුවන්ද, ආණ්ඩුව බේරාගන්න? ඔබතුමා විරුද්ධව වැඩ කෙරුවේ. මේ ඉස්සරහ පේළියේ ඔක්කෝම අය විරුද්ධව වැඩ කෙරුවේ. අපියි පක්ෂව වැඩ කළේ. ඒ නිසා අපටයි මේ ආණ්ඩුව ගැන කැක්කුමක් තිබෙන්නේ. තමුන්නාන්සේලා අවස්ථාවාදීන්. ඇමතිකම් ගන්න ආණ්ඩුවට ආවා. [බාධා කිරීමක්] හරි, හරි තමයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද සමරසිංහ මැතිතුමා.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
කිරි මුට්ටියට ගොම ටිකක් දානවා වාගේ තමයි ඔබතුමා අන්තිමට කරන්නේ. අපි මේ බොහොම මධ්‍යස්ථව පැහැදිලි කරලා දුන්නා, වර්තමාන තත්ත්වය. [බාධා කිරීමක්]ඔව්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මානව හිමිකම් ඇමතිවරයා හැටියට ජිනීවා ගිහිල්ලා ඇත්ත තත්ත්වය වාර්තා කරපු නිසා තමයි මට කවදාවත් විදේශ කටයුතු ඇමතිකම ලැබුණේ නැත්තේ. ඒකයි මට දෙන්න තිබෙන උත්තරය. මානව හිමිකම් පිළිබඳව මම ඇත්ත කියපු නිසා, මම සටන් කළ නිසා මට ඒ ලැබිය යුතු තැන ලැබුණේ නැහැ. ඒ කොහොම වුණත් මට ප්‍රශ්නයක් නැහැ. ඒකේ ප්‍රශ්නයක් නැහැ.[බාධා කිරීමක්] හැබැයි, මම එකක් කියන්න කැමැතියි, මේ යන කණ්ඩායමට උඩ බලාගෙන කෙළ ගහගන්න අපි ඉඩ දෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කවුද, Dr. Manoharanගේ තාත්තාට කතා කරලා කිව්වේ, "සාක්ෂි දෙන්න එන්න එපා; වාහනයක් දෙනවා; කොළඹින් ගෙයක් දෙනවා" කියලා. මට ඒ ගැන හෙළිදරව් කරන්න. විදේශ කටයුතු විෂය මගේ විෂය නොවෙයි. හැබැයි, මම සන්තෝෂ වෙනවා, 2005 ඉඳලා 2015 දක්වා ගරු අගමැතිතුමාගේ ඉල්ලීම අනුව, I was the Shadow Minister. So I know what happened during that time. අලුත් කට්ටියට මේ බයිලා ගහන්න පුළුවන්. නමුත් අපට ගහන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு பி.ப.1.00 மணி வரை இடைநிறுத்தப்பட்டு, மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.* DEPUTY SPEAKER [THE HON . J.M. ANANDA KUMARASIRI] *in the Chair.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகுதவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)
ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමා.

[අ.භා.1.01]

**ගරු(ආචාර්ය) ජයම්පති වික්‍රමරත්නමහතා**
(மாண்புமிகு(கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) JayampathyWickramaratne)

ගරු සභාපතිතුමනි, පසු ගිය වසර විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම අත්‍යවශ්‍ය ඇයිදැයි මුළු රටටම පෙන්වා දුන් වසරක්. මා ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් කියන්න යන්නේ නැහැ. අපි දැක්කා, දින 52ක කාලය තුළ අග්‍රාමාත්‍යවරයා ව්‍යවස්ථා විරෝධිව ඉවත් කළා; අලුතින් ඊනියා අග්‍රාමාත්‍යවරයෙකු නීතියට විරුද්ධව පත් කළා; දේශපාලන හේතූන් මත පාර්ලිමේන්තුව කල් දැම්මා; පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. ඒ විසුරුවා හැරීම අත් හිටුවා ඉන් පසුව ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළා, ජනාධිපතිතුමාගේ ක්‍රියා කලාපය ව්‍යවස්ථා විරෝධියි කියා. ඉන් පසුව ජනාධිපතිතුමා කියා සිටියා, කුමන බහුතරයක් තිබුණත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති කරන්නේ නැහැ කියා. "ඔහුට අගමැති ධුරය දුන්නොත් මම පැය දෙකක්වත් මේ ධුරයේ ඉන්නේ නැහැ" කියා එතුමා කිව්වා. එහෙත් අවසානයේ දී, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට පැහැදිලි බහුතරයක් තිබෙන නිසා ඔහුට දිවුරුම් දීම සඳහා ආරාධනා කරන්න ජනාධිපතිවරයාට සිදු වුණා. එතුමා කියා සිටියා, පාර්ලිමේන්තු සම්ප්‍රදායට සහ ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරලා මා අග්‍රාමාත්‍යවරයා හැටියට රනිල් වික්‍රමසිංහ මැතිතුමාව කැඳවනවා කියලා. අපට කියන්න කනගාටුයි, එහෙම නම්, "අගමැති ධුරයට රනිල් වික්‍රමසිංහ මහත්මයා කිසිම හේතුවක් උඩ කැඳවන්නේ නැහැ. එහෙම වුණොත් මම ගෙදර යනවා" කියලා කියන කොට පාර්ලිමේන්තු සම්ප්‍රදාය සහ ප්‍රජාතන්ත්‍රවාදය ගැන එතුමා දැනගෙන ඉන්න නැතිව ඇති. එහෙම නම්, පාර්ලිමේන්තු සම්ප්‍රදාය කුමක්ද කියා එතුමාත් එයින් ඉගෙන ගත්තා. අවාසනාවකට එතුමාට කවුරුවත් උපදෙස් දීලාත් නැහැ, පාර්ලිමේන්තු සම්ප්‍රදාය කුමක්ද කියන එක සම්බන්ධයෙන්.

මේ දවස්වලත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වෙනවා අපි දැක්කා. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා පැහැදිලිව කිව්වා වාගේ, අභියාචනාධිකරණයේ සභාපති ධුරයට ස්ථිර පත්වීමක් නැතිව දිගින් දිගටම දවස් 14 බැගින් ව්‍යවස්ථා විරෝධිව පත් කිරීම් කරනු ලැබුවා. ගරු මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා කිව්වා, වැඩ බැලීම සඳහා දින 14න් 14ට පත් කරන්න පුළුවන් කියලා. එහෙම කරන්න බැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ. (2) යටතේ සඳහන් වෙනවා, "දින දහහතරක් නොඉක්මවන අනුක්‍රමික කාල සීමා සඳහා එවැනි කවර හෝ ධුරයක වැඩ බැලීමට යම් තැනැත්තකු පත් කිරීම ජනාධිපතිවරයා විසින් කරන ලද නිර්දේශ මත සභාව විසින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, නොකළ යුත්තේ ය" කියලා. ඒ අනුව, දින 14න් 14ට එකම පුද්ගලයා පත් කරන්න පුළුවන් කියා කොහේවත් කියැවෙන්නේ නැහැ. එහෙම බැහැ කියලා තමයි 41ඇ (2) යටතේ තිබෙන්නේ.

ඊළඟට, අභියාචනාධිකරණය පිළිබඳ විශේෂ විධිවිධාන තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 (1) යටතේ සඳහන් වෙනවා, රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමට අග්‍ර විනිශ්චයකාරවරයා හෝ අභියාචනාධිකරණයේ සභාපතිවරයා තාවකාලිකව අපොහොසත් වුවහොත්, එම කාල සීමාව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නැතහොත් අභියාචනාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයකු පත් කළ හැකිය කියලා. ඒ අනුව ඉතාම පැහැදිලියි, 109වන ව්‍යවස්ථාව අනුව පළමු වන දින 14ට වත් වැඩ බැලීමේ පත් වීමක් කරන්න බැහැ කියන එක. කෙසේ වෙතත් දින 14කට පසුව නම් කිසිම වැඩ බැලීමේ පත් කිරීමක් කරන්න බැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය නැතිව. එය ඉතාම පැහැදිලියි.

ගරු සභාපතිතුමනි, පසුගිය දින 52හි අප ලැබූ අත් දැකීම් අනුව මේ විධියට සිදු වේවි කියා අපට කලින් කියා දුන් දේශපාලනඥයන්, නායකයන් ගණනාවක් ඉන්නවා. විධායක ජනාධිපති ක්‍රමය ඇති කළොත් එහි ආදීනව කුමක්ද කියා ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමන්ලා පෙන්වා දුන්නා. 1978 ව්‍යවස්ථාව ගෙනාපු වෙලාවේ, ඊටත් කලින් -1978ට කලින්- දෙවන සංශෝධනය මඟින් විධායක ජනාධිපති ක්‍රමය ගෙනාපු වෙලාවේ, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය රටට එහි ආදීනව පෙන්වා දුන්නා. ඩඩ්ලි සේනානායක මැතිතුමා 1971 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ දී - Constituent Assembly එකේ දී- කියා සිටියා, විධායක ජනාධිපති ක්‍රමයේ ආදීනව මොකක්ද කියා. අපි ඒවා සියල්ල දැක්කා. අද ඒවා ඔප්පු වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, විධායක ජනාධිපති ක්‍රමය තියා ගන්න ඕනෑද, නැද්ද කියන එක ගැන කාට හෝ සැකයක් තිබුණා නම් දැන් ඒ සැකය තිබෙන්නට බැහැ. 2015 ජනවාරි 8වැනිදා පැවැති ජනාධිපතිවරණය අවස්ථාවේ මැතිවරණ වේදිකාවල අපේ පොදු අපේක්ෂකයා; අප සහාය දුන් අපේ පොදු අපේක්ෂකයා කියා සිටියා, "මේක තමයි අවසාන ජනාධිපතිවරණය" කියලා.

අපි ඒ ජයග්‍රහණයෙන් පස්සේ යම් වෙනස්කම් සිදු කළා. නමුත් අපට සියලු වෙනස්කම් කර ගන්නට බැරි වුණා. ජූලි මාසයේ අපි නාම යෝජනා කැඳවලා, අගෝස්තු මාසයේ 17 වැනිදා ඡන්දය පවත්වන කොට එක්සත් ජාතික පෙරමුණ තම මැතිවරණ ප්‍රකාශය ඉදිරිපත් කළා. එම මැතිවරණ ප්‍රකාශයේ මෙසේ සඳහන්ව තිබෙනවා.

> "පාර්ලිමේන්තුවට වගකියන අගමැති සහ කැබිනට් මණ්ඩලයේ උපදෙස් අනුව ජනාධිපතිවරයා ස්වකීය බලතල ක්‍රියාත්මක කරනු ඇත."

ඒ කියන්නේ, විධායක ජනාධිපති ක්‍රමය නැති කරලා, නැවතත් පාර්ලිමේන්තු ක්‍රමයකට යන්නට එදා එක්සත් ජාතික පෙරමුණ පොරොන්දු වුණා. එහි තවදුරටත් මෙසේ සඳහන් වනවා,

> "මෙයින් පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ආරක්ෂා වේ....
>
> ඒකීය රාජ්‍යයක් යටතේ සියලු දෙනාගේ සම්මුතියෙන් සිදු කළ හැකි උපරිම ආකාරයෙන් බලය බෙදීමට පියවර ගන්නෙමු."

ඒ අනුව අද මේ පැත්තේ ඉඳගෙන ඉන්න එක්සත් ජාතික

පෙරමුණේ මා ඇතුළු සියලුම මන්ත්‍රීවරු එදා එකඟ වුණා, විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන් අහෝසි කළ යුතු බවට. එම නිසා ඒ පිළිබඳව සැකයක් තිබෙන්නට බැහැ. මම එහෙම කියන්නේ එවැනි සැක මේ පැත්තෙනුත් ඉඳලා හිටලා මතු වන නිසයි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා නම් මැතිවරණ ක්‍රමයේ යම් වෙනසක් කළ යුතුයි කියලා සමහරු අවංකවම විශ්වාස කරනවා. අපට අලුත් මැතිවරණ ක්‍රමයට එහෙම ලේසියෙන් කවදාවත් එකඟ වෙන්නට පුළුවන් වන එකක් නැහැ. පසුගිය කාලයේ අපි අත්දැකීම් ලැබුවා. මනාප ක්‍රමය නැති කරලා, ආසන ක්‍රමය නැවත ඇති කරලා, සමානුපාතික ක්‍රමය රකිමින්, කාන්තා නියෝජනයද සහතික කරමින් අලුත් ක්‍රමයකට යන්නට අපි උත්සාහ කරනවා. මම එවැනි ක්‍රමයකට සම්පූර්ණයෙන්ම පක්ෂයි. එහෙත් පළාත් පාලන මැතිවරණයේ දී ලැබූ අත්දැකීම් දිහා බලනකොට අපට එය පහසු වෙන්නේ නැහැ.

එම නිසා මම තාවකාලික යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්න කැමතියි, මේ පාර්ලිමේන්තුවේ ආසන ගණන හයකින් හෝ අටකින් වැඩි කරලා, ඒ ස්ථාවර භාවය ඇති කිරීම සඳහා කටයුතු කරන්න ඕනෑය කියන කාරණය. ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණයකින් වැඩිම මන්ත්‍රී ධුර ප්‍රමාණයක් දිනා ගන්නා පක්ෂයට වැඩියෙන් ආසන හයක් හෝ අටක් bonus එකක් හැටියට දෙන්න ඕනෑ කියලා මම යෝජනා කරනවා. මේක අලුත් දෙයකුත් නොවෙයි. මේක සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේත් තිබුණා. එමඟින් ස්ථාවර භාවයක් ඇති කර ගන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
මට විනාඩි 11ක් තිබෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමන්ලා වැඩිපුර කාලයක් ගත් නිසා ඒ වේලාව අඩුකර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
සමහර කුඩා ජන වර්ග නියෝජනය කරන අයත් "විධායක ජනාධිපති ක්‍රමය තියා ගන්න ඕනෑ" කියලා දැන් කියන්නට පටන්ගෙන තිබෙනවා. මම ඒ සම්බන්ධයෙන් කනගාටු වනවා. කුඩා ජන වර්ගවලට නම් විධායක ජනාධිපති ක්‍රමයෙන් කිසිම වාසියක් වුණේ නැහැ. නායකයන්ට නම් ඡන්දයක් එහෙම තියෙන කොට යම් යම් ගනුදෙනු කරලා, යම් යම් අමාත්‍යාංශ එහෙම ලබා ගන්න පුළුවන් වුණා. 83 කළු ජූලිය, අලුත්ගම සිද්ධිය, දිගන සිද්ධිය කියන මේ සියල්ලම ඇතිවුණේ විධායක ජනාධිපති ධුරය පැවැති කාල සීමාව තුළ. එම නිසා ඒ පිළිබඳව නම් දැන් සැකයක් තියා ගන්න බැහැ.

මට කාලය නැති නිසා, අවසාන වශයෙන් තව එක කාරණයක් පිළිබඳව මේ වෙලාවේ දී සඳහන් කරන්නම්. මම කවදත් මරණ දණ්ඩනයට විරුද්ධ කෙනෙක්. ඒ වුණාට මම අපරාධවලට නිසි අපරාධ යුක්ති ප්‍රතිචාරයක් - criminal justice response එකක්- තිබෙන්න ඕනෑ කියලා පිළිගන්න කෙනෙක්. මරණ දඬුවම ක්‍රියාත්මක කරනවාට මම සම්පූර්ණයෙන් විරුද්ධයි.

දකුණු අප්‍රිකාවේ සුප්‍රසිද්ධ නඩුවක් වන මක්වන්යානේ නඩුවේදී මරණ දඬුවමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව ප්‍රශ්න මතු වුණා. එහිදී ව්‍යවස්ථාධිකරණය මෙසේ කියලා තිබෙනවා. "The greatest deterrent to crime is not the death penalty, but the likelihood that offenders will be apprehended, convicted and punished. It is that which is lacking in our criminal justice system." එහි සිංහල පරිවර්තනයේ තිබෙනවා, "අපරාධ වැළැක්වීමේ ලොකුම නිවාරකය වන්නේ මරණීය දණ්ඩනය නොවේ. ඒ වූ කලී වරදකරුවන් අල්ලා නඩු පවරා වරදකරුවන් කර දඬුවම් කිරීමට ඇති හැකියාවයි. අපේ අපරාධ යුක්ති විනිශ්චය ක්‍රම පද්ධතිය තුළ නැත්තේද එයයි" කියලා. මම හිතන හැටියට එය අපටද අදාළ වනවා. අපටද නැත්තේ එයයි. එම නිසා අපට අවශ්‍ය වන්නේ වරදවල් සිදු වනකොට වරදකරුවන් අල්ලා නඩු පවරා දඬුවම් කිරීමයි. එය සිදු වන බව රටේ ජනතාව දන්නවා නම් අපරාධ අඩු කරන්න පුළුවන්. ඒක තමයි එකම නිවාරකය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැන දිගින් දිගටම කථා වුණු නිසා මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමතියි. සමහර ප්‍රශ්න ඇතිවෙලා තිබෙන්නේ මේකයි. විශේෂයෙන් විනිශ්චයකාරවරුන් නම් කරලා එවන කොට, අග්‍රවිනිශ්චයකාරතුමා කුමන මතයක් දරනවාද කියලා දන්නේ නැතිව සමහර විට නම් එවනවා. එතකොට යම් ප්‍රශ්න මතුවෙලා තිබෙනවා. මම මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් යෝජනාවක් කරන්න කැමැතියි. මම කලින් දවසකුත් මේ යෝජනාව ඉදිරිපත් කළා. අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට එවන්නට ඉස්සෙල්ලා අග්‍රවිනිශ්චයකාරතුමා, නීතිපතිවරයා සහ අධිකරණ ඇමතිවරයාගේ අදහස් ලබාගෙන ඒ සඳහා යම් යන්ත්‍රණයක් හදා ගත යුතුයි.

ගරු සභාපතිතුමනි, හැකි නම් ඊටත් එහාට ගිහින්, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විධායක සභාවෙන් නම් කරන, ඉතා ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥවරු තුන්දෙනෙකුගෙන් යුත් කමිටුවකින් අදහස් ලබාගෙන එය කෙරෙනවා නම්, මේ බොහෝ ගැටුම් ඇති වෙන්නේ නැහැ. එමඟින් විධායකය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අතර තිබෙන ගැටුම් අපට අවම කරගත හැකි වෙයි. එම යෝජනාව ඉදිරිපත් කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මීළඟට, ගරු ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක් තිබෙනවා.

[අ.භා. 1.11]

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු සභාපතිතුමනි, අද දින වැය ශීර්ෂ ගණනාවක් පිළිබඳව සාකච්ඡා වන නමුත්, මේ දක්වා -සියයට 90කටත් වඩා වැඩි කාලයක්- ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලුදෙනාම කථා කළේ විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය සහ ජනාධිපතිතුමාගේ ව්‍යවස්ථානුකූල කටයුතු පිළිබඳවයි. ඒ අනුව අපට නිගමනය කරන්න පුළුවන් මොකක්ද? අතිගරු ජනාධිපතිතුමාගේ ක්‍රියාකාරිත්වය සහ එතුමාගේ නායකත්වය පිළිබඳව එතුමන්ලා මෙතරම් උනන්දුවක් දක්වන්නේ, එතුමා කරගෙන යන කටයුතු තවත් ශක්තිමත් කිරීමේ අරමුණින් සහ

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

අනෙක් පැත්තෙන්, එතුමාගේ ඒ කටයුතු පිළිබඳව සෑම පාර්ශ්වයකටම යම්කිසි ආකාරයක බලපෑම් ඇති වෙලා තිබෙන නිසාද විය හැකියි. එයයි, අපට මේ තුළින් අපට අවබෝධ වන්නේ.

ගරු සභාපතිතුමනි, 1977 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ රටේ ස්ථාපිත කිරීමෙන් අනතුරුව, එම ව්‍යවස්ථාව පිළිබඳව විවිධ ගැටලුකාරී තත්ත්වයන් ඇති වුණා. 2001 අවුරුද්දේ විධායකය සහ ආණ්ඩුව දේශපාලන පක්ෂ දෙකක් නියෝජනය කිරීමේ ප්‍රතිඵලයක් විධියට, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට ඒ වෙලාවේ අමාත්‍යාංශ කීපයක් පවරාගෙන, පාර්ලිමේන්තු මැතිවරණයකට පවා යන්න සිද්ධ වුණා. එම පාර්ලිමේන්තු මැතිවරණයේදී එතුමියගේ පාර්ශ්වයේ අය ජයග්‍රහණය කළා. විශේෂයෙන්ම ජනාධිපතිවරයා සහ ආණ්ඩුව පක්ෂ දෙකක නියෝජනයක් වන අවස්ථාවලදී ගැටුම්කාරී තත්ත්වයන් ඇති වනවා. ඒ අනුව, මෙවැනි ගැටලුකාරී තත්ත්වයන් ඇති වුණු පළමු අවස්ථාවය මෙය නොවෙයි. මීට පෙරත් මෙවැනි අවස්ථා ඇති වෙලා තිබෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියේදී, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ඒ සඳහා කමිටුවක් පත් කළා. එම කමිටුව දීර්ඝ වශයෙන් ඒ පිළිබඳව අධ්‍යයනය කළා. ඒ අනුව, අපේ පක්ෂයේ මතය අපි බොහොම පැහැදිලිව, ලිඛිතව ඉදිරිපත් කර තිබෙනවා. අපේ පක්ෂයේ නායකයා විධියට අතිගරු ජනාධිපතිතුමා එය ලිඛිතව ඉදිරිපත් කළා. අද මේ ගරු සභාවේදී කියැවුණා, විධායක බලය අඩු කර ගැනීමට -සියයට 90ක්ම අඩු කර ගැනීමට- මුල් අවස්ථාවේදී ජනාධිපතිතුමා එකඟ වුණු බව. මේක අපි පටලවා ගන්න හොඳ නැහැ. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ මතය තමයි, අද හෝ මේ පාර්ලිමේන්තුව එය යෝජනා කරනවා නම්, නීති සකස් කරනවා නම් විධායක බලය සදහටම ඉවත් කිරීම පිළිබඳව හෝ එතුමාගේ විරෝධතාවක් සහ අකැමැත්තක් මොනම ආකාරයෙන්වත් නොමැති බව. එහි වගකීම පැවරී තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. පාර්ලිමේන්තුව විධියට අපි ඒ වගකීම භාර ගන්න ඕනෑ. ඒ පිළිබඳව අපේ පක්ෂයේ ස්ථාවරය අපි බොහොම පැහැදිලිව ඉදිරිපත් කර තිබෙනවා.

අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය ලබා දුන්නේත්, විශේෂයෙන්ම මැතිවරණ ක්‍රමය ලබා දීමේ පොරොන්දුවක් මතයි. "දහනව වන සංශෝධනයට ඡන්දය ලබා දෙන්න, අපි විසිවන සංශෝධනය, ඒ කියන්නේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම ගෙනෙනවා" කියා අග්‍රාමාත්‍යතුමා ඒ වෙලාවේ බොහොම පැහැදිලිව අපිට පොරොන්දුවක් ලබා දුන්නා. ඒ අනුව, අපි ඒ අවස්ථාවේදී දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන්න ඡන්දය ලබා දුන්නා. නමුත් අපට පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමට අදාළ විසිවන සංශෝධනය කරගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ.

මම තවත් කරුණු කිහිපයක් සඳහන් කරන්න ඕනෑ. මම උදේ පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා මොනම ආකාරයකටවත්, කොළඹ-නුවර අධිවේගී මාර්ගය එපාය කියා මතයක් ප්‍රකාශ කළේ නැහැ; කොළඹ-නුවර අධිවේගී මාර්ගය අනවශ්‍යයි කියා එතුමා කිව්වේ නැහැ. කොළඹ-නුවර අධිවේගී මාර්ගය අවශ්‍යයි. නමුත් මේ රටේ විද්වතුන්, ආර්ථික විද්‍යාඥයන්, පරිසර විද්‍යාඥයන් වැනි අය විශේෂයෙන්ම මේ පිළිබඳව මතයක් ඉදිරිපත් කරනවා, මාවතගම දක්වා අධිවේගී මාර්ගය ඉදිකර, මාවතගම ඉඳලා නුවර දක්වා දැනට තිබෙන මාර්ගය මං තීරු හතරක් දක්වා පළල් කිරීම තුළින් මේ සඳහා වැය වන මුදලින් සියයට දහයකටත් වඩා මුදලක් අඩු කරගෙන, පරිසරයටත් ගැටලුවක් ඇති නොවන පරිදි මේ ව්‍යාපෘතිය නිම කරන්න පුළුවන්කමක් තිබෙනවාය කියා. ඒ මතය තමයි, විශේෂයෙන්ම පරිසරය භාර ඇමතිවරයා විධියට අතිගරු ජනාධිපතිතුමාත් ඉදිරිපත් කළේ. නුවරට අධිවේගී මාර්ගයක් අවශ්‍යයි. එහිදී ආර්ථිකමය වශයෙන් සහ පාරිසරික වශයෙන් තිබෙන කරුණු අමතක කරලා, අපේ අවශ්‍යතා ඉටුකර ගත යුතු නැහැ. ආර්ථිකමය වශයෙන් ඵලදායී වන ආකාරයට සහ පරිසරයත් රැකෙන ආකාරයට අපේ අවශ්‍යතාව ඉටු කරගන්න පුළුවන් නම්, මම හිතන විධියට එය තමයි ජනතාව වෙනුවෙන් ගත හැකි හොඳම තීන්දුව වන්නේ. එම නිසායි අතිගරු ජනාධිපතිතුමා එම මතය ඉදිරිපත් කළේ, කියන කාරණය මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

මේ රටට නිදහස ලැබී මේ වන විට දශක හතකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. අපි හැත්තෑදෙවැනි අය වැය තමයි පාර්ලිමේන්තුවට මේ ඉදිරිපත් කර තිබෙන්නේ. අපි, මේ අය වැය විවාදවලදී පක්ෂව හෝ විපක්ෂව කථා කරනවා. අපි විපක්ෂය විධියට, "අය වැය නරකයි" කියා කියනවා. ආණ්ඩු පක්ෂය එය, "හොඳයි" කියා කියනවා. මෙවැනි ක්‍රියාකාරිත්වයක් තමයි අපේ රටේ දශක ගණනාවක් තිස්සේම තිබුණේ. විශේෂයෙන්ම අද මේ රට මේ තත්ත්වයට පත්වීමට ප්‍රධානතම හේතුවක් තමයි, අපේ රටේ ජාතික වශයෙන් පොදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොවීම. ප්‍රධාන වශයෙන්ම රටේ ජනතාවට දැනෙන, අවධානය යොමු කළ යුතු, ජනතාවගේ ප්‍රධාන ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු නොකිරීමත් එයට තවත් හේතුවක්.

අතිගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට දැවැන්ත මුදලක් වෙන් කර තිබෙනවාය කියා අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කළා. ඒක ඇත්තයි. මගේ පෞද්ගලික මතය නම්, ජාතික වැදගත්කමකින් යුත් මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දැනටත් වඩා වැඩි මුදලක් අනිවාර්යයෙන්ම එතුමාගේ වැය ශීර්ෂයට ලබා දිය යුතුයි කියන එකයි.

මේ විධියට එතුමාගේ වැය ශීර්ෂයට වෙන් කරන මුදල්වලින් මේ දක්වා කර තිබෙන්නේ මොනවාද? අද අපේ රටේ තිබෙන ප්‍රධාන ජාතික ප්‍රශ්නයක් තමයි, වකුගඩු රෝගය. අද ඒ ප්‍රශ්නයට ලැබී තිබෙන විසඳුම මොකක්ද? විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගයත් ඇතිව මේ වකුගඩු රෝගයට පිළියම් සෙවීම නිසා, අද අපේ රටේ අලුතින් ඇතිවන වකුගඩු රෝගීන් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. මේක ජනාධිපතිතුමා, ජනාධිපති කාර්ය සාධන බලකායත් එක්ක තනියෙන් කළ කටයුත්තක්ය කියා අපි කියන්නේ නැහැ; එතුමා එහෙම කියන්නෙත් නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශයත් සමඟ එකතු වෙලා තමයි එතුමා මේ කටයුත්ත ක්‍රියාත්මක කළේ. යම් නිවසක වකුගඩු රෝගියෙක් සිටියොත්, ඒ පවුල් සංස්ථාවම සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා.

මේක දැවැන්ත ජාතික ප්‍රශ්නයක්. එම නිසා පසුගිය අවුරුදු තුන තුළ වකුගඩු රෝගය සම්බන්ධයෙන් ගෙන තිබෙන ක්‍රියාමාර්ග අපට මොනම ආකාරයකටවත් අමතක කරන්න හෝ අවතක්සේරු කරන්න පුළුවන්කමක් නැහැ. මේ ක්‍රියාමාර්ග සාර්ථකව ක්‍රියාත්මක කරන්න අමාත්‍යාංශය ක්‍රියාත්මක වුණා වාගේම, අපේ රටේ තිබෙන පරිපාලන ක්‍රමය තුළ විධායක බලය සහිත ජනාධිපතිවරයාගේ නායකත්වය ලැබීම මෙවැනි ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක වීම සඳහා ප්‍රධාන සාධකයක් වූ බවත් අපි අමතක කළ යුතු වන්නේ නැහැ.

අද පාරිසරික ප්‍රශ්න දෙස අපි කවුරුවත් අවධානය යොමු කරන්නේ නැහැ. අද අපේ රට ඇතුළු මුළු ලෝකයම පාරිසරික වශයෙන් දැවැන්ත ප්‍රශ්න ගණනාවකට මුහුණ දී තිබෙනවා. මේ ප්‍රශ්න සඳහා අපි විසඳුම් සෙවිය යුතුයි. ඊට අවශ්‍ය ව්‍යාපෘති තමයි අද විශේෂයෙන්ම ක්‍රියාත්මක වන්නේ. ඒ වාගේම අද "ග්‍රාම

ශක්ති" වැඩසටහන තුළින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති පොළොන්නරුව දිස්ත්‍රික්කයට පමණක් සීමාවන ව්‍යාපෘති නොවෙයි. ඒවා සමස්ත රටේම ජනතාවට බලපාන ව්‍යාපෘති. මෙහිදී පොළොන්නරුව දිස්ත්‍රික්කයට වැඩි මුදලක් වෙන් වෙලා තිබෙනවා. ඒක ඇත්ත. ඒක විය යුතුයි. අපිත් ඇමතිවරු විධියට පත් වී කටයුතු කළා. එතකොට අපිත්, අපේ ප්‍රදේශවලට වැඩ කළා. ජනාධිපතිතුමා, එතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයට වැඩ කළ යුතුයි. ඒක අනිවාර්යයෙන්ම කළ යුතු දෙයක්. ඒ සඳහා අපේ ආශිර්වාදයත් ලබා දිය යුතුයි. ඒ කටයුතු ක්‍රියාත්මක වනවා වාගේම, අනිවාර්යයෙන්ම ජාතික වශයෙන් වැදගත් වන ව්‍යාපෘති සඳහා තමයි මේ මුදල ලබා දීමට කටයුතු කර තිබෙන්නේ.

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පිළිබඳවත් මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අනුර දිසානායක මන්ත්‍රීතුමාත් ඒ පිළිබඳව සඳහන් කළා. අතිගරු ජනාධිපතිතුමා පත් කළ අභියාචනා කමිටුවෙන් මේ වන විට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කටයුතුවලට මොනම ආකාරයකවත් බාධාවක් හෝ ගැටලුවක් ඇතිවෙලා නැහැ. අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් දමා විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා විසින් මේ ආයතනය පිහිටුවා තිබෙන්නේ අමාත්‍ය මණ්ඩලයට උපදෙස් දීම සඳහායි. මෙය, ටෙන්ඩර් සහ එවැනි කටයුතු පිළිබඳව යම් ගැටලුකාරී තත්ත්වයන් තිබෙනවා නම්, ඒවා පිළිබඳව අභියාචනා ඉදිරිපත් කර වාර්තා ඉදිරිපත් කිරීම සඳහා පත් කළ ආයතනයක් පමණයි. එහෙම නැතිව ඒ කමිටුව තුළින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ක්‍රියාවලියට මොනම ආකාරයකවත් බාධාවක් හෝ ගැටලුවක් කිසිසේත්ම සිද්ධ වෙලා නැහැ. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කටයුතු සඳහා පත් කරපු අභියාචනා කමිටුවෙන් සැලකිය යුතු සහායක් ලැබෙන බව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියට මම ඉතාමත් හොඳින් පෞද්ගලිකව දන්නවා. එම නිසා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කටයුතු සඳහා බාධාවක් හෝ අකුල් හෙළීමක් හෝ බලතල අඩු කිරීමක්, ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ඒ අභියාචනා කමිටුව තුළින් මොනම ආකාරයකටවත් සිද්ධ වෙලා නැහැ.

අද කොමිෂන් සභා ගණනාවක් පිළිබඳව පාර්ලිමේන්තුවේ මුදල් අනුමත කරනවා. එම නිසා කොමිෂන් සභා පිළිබඳව කථා කරන්න තිබෙන එකම අවස්ථාව තමයි, අද ලැබෙන අවස්ථාව. අපට ඒ සඳහා වෙනත් කිසිදු අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ වෙනත් දිනක හෝ පාර්ලිමේන්තුවේ වෙනත් කාරක සභාවකදී හෝ පාර්ලිමේන්තුව ඉදිරියේදී හෝ මේ කොමිෂන් සභා පිළිබඳව විශේෂයෙන්ම කථා කරන්න අපට අවස්ථාවක් නැහැ. තිබෙන එකම අවස්ථාව තමයි, අද පාර්ලිමේන්තුව තුළ කථා කරන්න ලැබෙන අවස්ථාව. මේ කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වය හොඳයි, මේ කොමිෂන් සභා තිබිය යුතුයි, මේවා තවදුරටත් ශක්තිමත් විය යුතුයි. හැබැයි, අපි පොදුවේ පිළිගත යුතු දෙයක් තිබෙනවා. මේ අවුරුදු තුන තුළ මේ කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වය පිළිබඳව යම් කිසි ආකාරයකින් පසු විපරමක් කර, මේ කොමිෂන් සභාවල සිදුවන ක්‍රියාකාරිත්වයේ අඩු පාඩු නිවැරදි කර ගනිමින් ඉදිරියට යෑම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අපි අනිවාර්යයෙන්ම ගත යුතුව තිබෙනවා. ඒක අවශ්‍යතාවක්. එහෙම නොවුණොත් මොකද වෙන්නේ? අද මොනම ආකාරයකින්වත් කිසිම කටයුත්තක් සිද්ධ නොවන කොමිෂන් සභා තිබෙනවා. එවැනි කොමිෂන් සභා තිබෙන්නේ නමට පමණයි. එම නිසා මේ සමස්ත කොමිෂන් සභා පිළිබඳව පසු විපරමක් කර, කාර්ය සාධනය පිළිබඳව ඇගැයීමක් කර මේ හොඳ ක්‍රියාකාරිත්වය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අපි අනිවාර්යයෙන්ම කටයුතු කළ යුතුව තිබෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ඊළඟට, ගරු සිසිර කුමාර අබේසේකර මහතා. ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

[අ.භා. 1.26]

**ගරු සිසිර කුමාර අබේසේකර මහතා**
(மாண்புமிகு சிசிர குமார அபேசேகர)
(The Hon. Sisira Kumara Abeysekara)

ගරු සභාපතිතුමනි, අද දිනට නියමිත මෙම වැය ශීර්ෂ සම්බන්ධව වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම සම්බන්ධව අපගේ පක්ෂයේ ගරු නායකතුමාට මම ස්තුතිවන්ත වනවා. අද මේ රටේ විධායක ජනාධිපති ක්‍රමය සම්බන්ධව විවේචනාත්මක ආන්දෝලනයක් ඇති වෙලා තිබෙනවා.

අපි දන්නවා, දේශපාලන ඉතිහාසය ගෙන බැලුවොත්, 1978දී එවකට ජනාධිපතිව සිටි ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඇමෙරිකාවේ තිබුණු ජනාධිපති ක්‍රමවේදය අනුගමනය කර, ශ්‍රී ලංකාව දියුණු කිරීම සඳහා මෙම විධායක ජනාධිපති ක්‍රමය ලංකාවේ ඇති කළ බව. විධායක ක්‍රමය ඇති කළායින් පසුව ඊට පෙර රටේ පැවැති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට වඩා විධායක ජනාධිපති ක්‍රමය රටේ දියුණුවට උපයෝගී වුණ බව අපි පොඩි අවධියේ වුණත් අපට මතකයි. එවකට විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නා. ඒ වාගේම රටේ බොහෝ සංවර්ධන ව්‍යාපාර ඇති කළා. ඒ වාගේම වෙළෙඳ කලාප -බියගම, කටුනායක වාගේ වෙළෙඳ කලාප- ඇති කර රටේ රැකීරක්ෂා ප්‍රශ්නයට විසඳුමක් දුන්නා. ව්‍යාපාරිකයන්ට ද තැනක් දී දවසින් දවස රටේ දියුණුව ඇති වෙගන ගියා. අපි හිතුවා, ශ්‍රී ලංකාවට මෙම විධායක ජනාධිපති ක්‍රමය ඉතාමත් යෝග්‍යයි කියා. තේරුම් බේරුම් තිබෙන කාලයේදී හෝ අපි දැක්කා, දවසින් දවස මේ රටේ විධායක ජනාධිපතිවරයෙක් හැටියට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ලෝකයම පිළිගත යුතු නායකයෙක් බවට වුණ බව. මෙතුමා විධායක ක්‍රමය නිර්මාණය කරනකොට පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීවරුනේගන් දීර්ඝ කාලීනව අද පාර්ලිමේන්තුවේ රැඳී සිටින්නේ, එක්සත් ජාතික පක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් ඒ වාගේම බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍ය ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමාත් විතරයි. අපි දන්නවා, විධායක බලතල සහිත ව්‍යවස්ථාව ක්‍රම ක්‍රමයෙන් ජනතාවට ඇති කරපු ඵලදායී තත්ත්වය, එහෙම නැත්නම් මේ රටේ ජනතාවට ඇති කරපු විනාශය මොකක්ද කියා. විධායක ජනාධිපතිවරු තුන් දෙනෙක් අපි දැක්කා. එනම්, එවකට පළමුවෙන්ම විධායක ජනාධිපතිව සිටි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා සහ ඩී.බී. විජේතුංග මැතිතුමා. මෙහි පැවැති ලොකු බලය ගැන ඒ දවස්වල කථාවට කිව්වේ, විධායක ජනාධිපති ක්‍රමයට ඕනෑම දෙයක් කරන්න පුළුවන් කියායි. කථාවක් ගියා, "ගැහැනියෙක් මිනිහෙක් කරන්නත්, මිනිහෙක් ගැහැනියක් කරන්නත් විතරයි බැරි. අනෙක් සියල්ල කරන්න පුළුවන්." කියා . කථාව ඇත්ත. අන්න ඒ වාගේ පරිණත නායකයෙක් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදලා මේ ක්‍රමවේදය ඉස්සරහට ගෙනයද්දි මේ රටේ දියුණුව ඉතාමත් ශීඝ්‍රයෙන් වැඩි වුණා. තනතුරේ පවතින බලය, ආධිපත්‍ය තේරෙන්නේ නැති දේශපාලනඥයන් මේ රටේ විධායක ජනාධිපති ධුරයට ඇවිල්ලා දවසින් දවස මෙම විධායක ක්‍රමය විනාශ කරගෙන යනවා. හදවතින් පරිපූර්ණ වුණු උදවිය මෙම විධායක ක්‍රමය ආයුධයක් හැටියට දැක්කත්, ඒ ආයුධයට අත තිබ්බේ නැහැ. ඒ ආයුධයෙන් වැඩ ගන්න බැලුවේ නැහැ. හැම දෙයක්ම ස්වාධීනව, ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදීව කරගෙන ගියා. නමුත් අද වන විට ඒක සම්පූර්ණයෙන්ම ගිලිහිලා ගිහින් තිබෙනවා.

[ගරු සිසිර කුමාර අබේසේකර මහතා]

ගරු සභාපතිතුමනි, 2015 ජනවාරි 08 වෙනිදා පත් කර ගත්ත අපේ ජනාධිපතිතුමා ගැන මම ප්‍රථමයෙන්ම කියන්න ඕනෑ. අපි පුදුම විධියට වෙහෙස මහන්සි වෙලායි එතුමාව පත් කර ගත්තේ. නමුත් අද වන විට -මේ අවුරුදු තුනහමාර තුළ- රටේ ජනතාව දෙස හෝ මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙස හෝ එතුමා නෙත් දෙක යොමු කර නැහැ.

එවකට හිටපු ජනාධිපතිවරු එහෙම නැහැ. මන්ත්‍රීවරයකු හැටියට මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්න අපට ලැබී තිබෙන දේවල් මොනවාද, නොලැබී තිබෙන දේවල් මොනවාද කියන එක ගැන අද කියන්න ලජ්ජයි. අඩුම තරමින් මේ පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරුන්ට මීට පෙර බෙහෙත් ටික හෝ ලබා දුන්නා. අද ඒ බෙහෙත් ටිකත් කප්පාදු කරලා තිබෙනවා. මන්ත්‍රීවරුන්ගේ නිල නිවාස කුකුළු කූඩුවලට අන්තයි; දොරවල් කැඩිලා, විනාශ වෙලා. එවැනි තත්ත්වයකට මන්ත්‍රීවරුන් දාලා තිබෙනවා. මන්ත්‍රීවරුන්ගේ බලය සම්පූර්ණයෙන් විනාශ කර දමා තිබෙනවා.

"යහ පාලනය" කියන එකට අපි කැමැතියි. ඒක හොඳ උතුම් ධර්මයක්. හැබැයි, මන්ත්‍රීවරයකුට ගමේ බලය තිබෙන්න ඕනෑ. අඩුම තරමින් සමෘද්ධි නියාමක එක්ක, ග්‍රාම නිලධාරි එක්ක මන්ත්‍රීතුමාට සංවර්ධන වැඩ කටයුතුවලදී එකට ගමනක් යන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කර දෙන්න ඕනෑ. අද ඒ තත්ත්වය ගිලිහිලා, නැති වෙලා තිබෙනවා. කියන්න කනගාටුයි, අපේ ජනාධිපතිතුමා මේ වන කොට අපේ මන්ත්‍රී ධුරවල තිබෙන සියලුම දේවල් කප්පාදු කරලා ඉවරයි. හැබැයි, එතුමා නම් මේකට එන කොට කිව්වේ මොනවාද? "මම කවදාවත් ජනාධිපති මැදුරට යන්නේ නැහැ. මට ඒ සැප සම්පත්වලින් වැඩක් නැහැ. මම යන්නේ නැහැ, හෙලිකොප්ටර්වල. මට ඒ සැප සම්පත්වලින් වැඩක් නැහැ. වාහන පෙළ ගස්වාගෙන මම යන්නේ නැහැ. මට ඒ සැප සම්පත්වලින් වැඩක් නැහැ" කියලායි කිව්වේ. එහෙම කියාපු අපේ ජනාධිපතිතුමා අද සම්පූර්ණයෙන්ම වෙනස් විධියට ක්‍රියා කරලා අද ඒ සැප සම්පත් එතුමා ලබා ගන්නවා.

ගරු සභාපතිතුමනි, මම මන්ත්‍රීවරයෙක්. මම නිතරම පාර්ලිමේන්තුවේ කථා කරන්න එන්නේ නැහැ; ඒ වාගේම විවාදවලට යන්නේ නැහැ. හැබැයි, අපට අදහස් තිබුණාට ඒවා ඉටු කරගන්න ශක්තියක් නැහැ. විවාදයකට ගිහිල්ලා මාධ්‍ය ඉදිරියේ අසත්‍ය කියන්න බැහැ. අන්න ඒ නිසයි අපි නිහඬව සිටියේ. හැබැයි, නිහඬව සිටියාට අද වැනි දවසකවත් වචන ස්වල්පයක් කථා කරලා අපේ හිතේ තිබෙන වේදනාව කිව්වේ නැත්නම් වැඩක් නැහැ. අද තිබෙන තත්ත්වය ගැන මට පුදුමයි. මම පාර්ලිමේන්තුවට පළමු වතාවට ආවත් පළාත් සභාවේ අවුරුදු 17ක් මන්ත්‍රීවරයකු හැටියට වැඩ කළා. නගර සභාවේ අවුරුදු තුනක් හිටියා. පුත්තලම් දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයා හැටියටයි අද මම ඉන්නේ. නමුත්, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපි අපේ පාඩුවේ ඉන්නකොට "එක් එක් කෙනාගේ ඊපා දූප ගැන කථා කරනවා" යි කියද්දී අපට හරි කලකිරීමක් එනවා. පෙළක් මන්ත්‍රීවරුන් කථා කරන්න දක්ෂයි. හැබැයි, කථා කරන්නේ අනෙක් මන්ත්‍රීවරයාට දෝෂාරෝපණ කරලා. ඒ අයගේ ළමයින්ට දෝෂාරෝපණ කරලා. එහෙම කථා කරලා ඊට පස්සේ පුදුම එකමුතුවකට තමයි සැරසෙන්නේ.

දැන් බලන්න, අපේ ජනාධිපතිතුමාට බැනපු උදවිය කී දෙනකු අද එතුමාට ළං වෙලා ඉන්නවා ද කියලා. අපි කියන්න කැමැති නැහැ. මගේ මිත්‍ර අපේ ලේකම්තුමා -දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා,- ඒ දවස්වල අපි හොඳ කියද්දී මොන තරම් බැන්නාද? නමුත්, දැන් ලේකම්තුමා. මේක පුදුම ලෝකයක්.

ඒ විතරක් නොවෙයි. අද විවාදයට ගෙන තිබෙන්නේ මේ රටේ අපේ ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයයි. නමුත්, එතුමා අද 08 දෙනකු අරගෙන රට ගිහිල්ලා. 08 දෙනාට ලක්ෂය ගානේ දීලා. අපි වැනි උදවියට හත. මේකද, මේ රටේ තිබෙන උත්තරීතරභාවය? කවුද, අරගෙන ගිය 08 දෙනා. එතුමාට පසුගිය මැතිවරණය වෙලාවේ සහයෝගය දෙන්න අනෙක් පැත්තට පැනපු අය. එක්කෙනකු කෝටි 20ක් අරගෙන පැන්නා. අන්තිමට එතුමන්ලා රුපියල් 50,000ක් අඩුයි කියලා පැය 4ක්, 5ක් හිටියා. අද ඒ 08දෙනකු අරගෙන එතුමා රට ගිහිල්ලා. මේක ජනාධිපතිවරයකුට තිබෙන අයිතියක්ද?

ගරු සභාපතිතුමනි, මම නම් පොඩි කාලයේ සිටම දැක තිබෙන ජනාධිපතිවරුන් අතරින් මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කර තිබෙන්නේ එතුමායි; එහෙම නැතිව මේ මන්ත්‍රීවරුන්වත්, රටේ ජනතාවවත් නොවෙයි. එතුමා ඒක උල්ලංඝනය කළා. තමුන් දන්නා, තමුන් ඉන්දැද්දී හදාපු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එතුමා උල්ලංඝනය කළේ. මට මතකයි, එදා මගේ උපන් දිනය දවස. එක පාරටම රූපවාහිනිය බලන කොටයි නව අගමැතිවරයකු දිවුරුම් දුන්නා කියලා දන්නේ. ඒක මොන පාප කර්මයක්ද? කිසිම කෙළෙහි ගුණයක් තිබුණාද? මෙතෙක් කල් හිටපු ජනාධිපතිවරුන්ට කෙළෙහි ගුණ හෝ තිබුණා. නමුත්, මේ ජනාධිපතිතුමාට අඩුම තරමින් ඒ ගැන හිතන්න ශක්තියක් තිබුණාද? අපි -එක්සත් ජාතික පක්ෂයේ උදවිය,- එතුමාව ජනාධිපති කරන්න මොන තරම් උත්සාහ කළා ද? ඒ විතරක් නොවෙයි, එදා ඇතැම් උදවිය බණින කොට, "සිරිසේන" කියලා කෑ ගහන කොට, "සිරිසේනට අමුඩේ ගස්වා පොළොන්නරුවට යවනවා"යි කියලා කියන කොට අපි අපේ ජීවිත පරදුවට තබා කටයුතු කළ ආකාරය අපට මතකයි. අද එතුමා ඒ අය තුරුලු කරගෙන මේ ගමන යන්න හදනවා.

ජනාධිපතිවරයෙක් බොහොම ප්‍රජාතන්ත්‍රවාදීව හැසිරිය යුතුයි; රටේ ප්‍රධාන පුරවැසියා හැටියට කාටත් එක හා සමානව සැලකිය යුතුයි; හදවත පරිපූර්ණ විය යුතුයි; හදවතට හරි දෙයක් තමන්ට ලැබිය යුතුයි. අන්න එහෙමවත් නැති ජනාධිපතිවරයෙක් ආවාම මේ රටේ, අද වෙන කොට සිදුවන විනාශය අපට බලාගෙන ඉන්න බැරි වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සිසිර කුමාර අබේසේකර මහතා**
(மாண்புமிகு சிசிர குமார அபேசேகர)
(The Hon. Sisira Kumara Abeysekara)
ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න. අවංකවම කියනවා නම්, මෙහෙමත් දේශපාලන ක්‍රමවේදයක්! මේ නායකයෝ කිව්වාම ඔක්කෝම එකයි. ජනාධිපතිතුමාට අමුඩය ගහලා පොළොන්නරුවට අරිනවා කියපු කෙනාවත් ළඟට ගත්තා. අපේ පක්ෂයේත් එහෙමයි. අපේ පක්ෂයේත්, "රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සිරිකොත ළඟදි අමුඩය ගස්සලා, රවුම් තුනක් කරකවලා, පස්සට පයින් ගහලා එළවනවා" කියපු අයටත් අද තනතුරු, තාන්න-මාන්න දීලා තිබෙනවා. මේක පුදුමාකාර දේශපාලන ක්‍රමයක් බවට පත් වෙලා තිබෙනවා, ගරු සභාපතිතුමනි.

මේ ජනාධිපති ධුරය තිබුණත්, නැතත් කමක් නැහැ. එහෙම නැත්නම් හොඳ කෙනෙක් ජනාධිපතිවරයා හැටියට පත් වෙලා, එහෙමත් නැත්නම් මේ ධුරය අහෝසි කරලා හෝ, මේ රටේ

ජනතාවගේ තිබෙන දුක නැති කර ඒ යුතුකම අපට හරියාකාරව ඉටු කරන්න අපට හොඳ අනාගතයක් උදා වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දොළහක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.37]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, අද දවසේ, අතිගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධව කථා කරන්නට ලැබීම ගැන සතුටු වනවා. ඒ වාගේම, කථා කිරීමට කාලය ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්, මම ගැනත් කියපු අපේ සිසිර කුමාර මැතිතුමා කළ කථාව මම අහගෙන හිටියා. එතුමාට දුක් වේදනා සමුදායක් තිබෙන්නේ. ජනාධිපතිතුමා තමුන්නාන්සේලා එක්ක හොඳින් සිටි කාලයේ, තමුන්නාන්සේලා සියල්ලෝම කරේ තියාගෙන පිට රට ගියා. ඒ කාලයේ කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ඔබතුමාව ගෙනිච්චේ නැති එක තමයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. මම ජනාධිපතිතුමාට කියන්නම්, ලබන වතාවේ එක්ක යන්න කියලා. මේ එක්ක ගිය කට්ටිය ඒ කාලයේ,- [බාධා කිරීමක්] කලබල වෙන්න එපා, මම කථා කළේ නැහැ නේ. කලබල වෙන්න එපා. එතකොට ප්‍රශ්නයක් තිබුණේ නැහැ. පසුගිය අවුරුදු තුනහමාරක කාලය තුළ අතිගරු ජනාධිපතිතුමා එක්ක ආණ්ඩුවක් අරගෙන ගියේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එතුමා නායකත්වය අරගෙන වැඩ කළ නිසාය කියලා විතරක් මතක තියාගන්න. එහෙම නැතිව තමුන්නාන්සේලාට පාර්ලිමේන්තුවේ 106යි තිබුණේ. ආණ්ඩුව අරගෙන යන්න බලයක් තිබුණේ නැහැ. ඒක අමතක කරන්න එපා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ. කරුණාකරලා කථා කරන්න දෙන්න කෝ. ඒ නිසා මේවා නොදැන, අද අහසින් පාත් වුණා වාගේ කථා කරන්න හදන්න එපා. පසුගිය අවුරුදු තුනහමාර තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා විධියට එතුමා ඒ නායකත්වය ගත්ත නිසා තමයි අපි එතුමාත් එක්ක එකට එකතු වෙලා වැඩ කළේ. මොකද, අපේ පක්ෂයේ නායකයා විධියට එතුමා පත් කළාට පස්සේ අපි එතුමාත් එක්ක වැඩ කරනවා. ඊට කලින් අපි එතුමා විවේචනය කළ එක හරි. මොකද, අපේ පක්ෂය අතහැරලා ගියා. අපි මහින්ද රාජපක්ෂ මැතිතුමාට වැඩ කරපු අය. තමුන්නාන්සේලායි එතුමාට වැඩ කළේ. එතැනින් පස්සේ තමුන්නාන්සේලාගේ මේ ආණ්ඩුව ගෙනියන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපි මේ සියලු දෙනාම එකට එකතු වෙලා වැඩ කළා. අවුරුදු තුනහමාරකට පස්සේ අපි එතැනින් එළියට ආවා. ඒවා කරන කල් තමුන්නාන්සේලාට ජනාධිපතිතුමා හොඳයි. දැන් තමයි තමුන්නාන්සේලාට ජනාධිපතිතුමා ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. අවුරුදු තුනහමාරක් තිබුණු ප්‍රශ්න සියල්ලම ඉවසාගෙන, කෙළෙහිගුණ සලකා ගෙන, තමුන්නාන්සේලා කියන ඕනෑ දෙයක් කරන්න ජනාධිපතිතුමා ඉඩ දුන්නා. ඒක මතක තියාගන්න. තමුන්නාන්සේලාට වැඩිය කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙක් විධියට හිටිය මම දන්නවා මොකක්ද වුණේ කියලා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, කෑ ගහන්නේ නැතිව. තමුන්නාන්සේ කථා කරන කොට මම බාධා කරන්නේ නැතිව හිටියා නේ. ඒ නිසා පොඩ්ඩක් ඉවසන්න. පොඩ්ඩක් පුරුදු වෙන්න සංවරව හැසිරෙන්න; රස්තියාදුකාරයෝ වාගේ හැසිරෙන්නේ නැතිව. [බාධා කිරීමක්] තමුන්නාන්සේගේ රස්තියාදුකාරකම් මට අදාළ නැහැ. ඒක මතක තියාගන්න. [බාධා කිරීමක්] මගෙන් අහගන්න එපා, තමුන්නාන්සේ ගිහිල්ලා කථා කරපුවා; කවුරු එක්කද පනින්න හැදුවේ කියලා. [බාධා කිරීමක්] හරිද? ගන්න හදපු ඒවා, අත් අඩංගුවට පත් වෙලා, සිදුවෙච්ච ඒවා. තමුන්නාන්සේලා වාගේ අය එක්ක කථා කරන්න ඕනෑ නැහැ, මට.

අතිගරු ජනාධිපතිතුමාගේ මේ ක්‍රියාදාමය තුළ පසුගිය කාලවකවානුවේ එතුමා විශාල වැඩ කොටසක් පටන් ගත් බව මම කියන්න කැමැතියි. විශේෂයෙන්ම අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කටයුතු එක්ක තමයි එතුමා මේ ක්‍රියාදාමය පටන් ගත්තේ. විශේෂයෙන් ප්‍රතිපත්තිමය වශයෙන්, සමහර වෙලාවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධනය පිළිබඳ ක්‍රියාදාමයට අවශ්‍ය කරන ප්‍රතිපත්ති සමුදාය හදලා, එතුමා ඒ ක්‍රියාදාමය ඉදිරියට ගෙන ගියා. තිරසර සංවර්ධන අමාත්‍යාංශය යටතේ එය ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළ එතුමා සකස් කර තිබෙනවා.

දුප්පත්කම තුරන් කිරීමේ වැඩ පිළිවෙළ සඳහා එතුමා 2018 වර්ෂය නම් කළා. ඒ අනුව 'ග්‍රාම ශක්ති' වැඩසටහන අද ග්‍රාමසේවා කොට්ඨාස 9,000ක් විතර ප්‍රමාණයක විශාල වැඩ පිළිවෙළක් විධියට ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යනවා.

මත් ද්‍රව්‍ය පිළිබඳව එතුමා විශාල වැඩ කොටසක් අද ආරම්භ කරලා තිබෙනවා. ඊයේ-පෙරේදා, මේ දවස්වල අපි දැක්කා, අපේ පොලීසියට අත් පුඩි ගහලා පිළිගත් ආකාරය. මේ කාල වකවානුවේ තමයි මේ රටේ ජනතාව ඒ ආකාරයට විශේෂ කාර්ය බලකාය අත් පුඩි ගහලා පිළිගත්තේ. මේ අත් අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් ජනතාව පොලිස් නිලධාරීන්ට ස්තුතිය ප්‍රකාශ කළා. මේවා ඉතිහාසයේ තිබුණු කාරණා නොවෙයි. අපේ පොලීසිය භාර ඇමතිවරු හිටියා. මේ අය යටතේ අපි දැක්කා, මොකක්ද වුණේ කියලා. ඒ නිසා බොහොම පැහැදිලිව අතිගරු ජනාධිපතිතුමා ඒ ක්‍රියාදාමයට අද අතගහලා තිබෙනවා. මේ රටේ ජනතාව තවදුරටත් ශක්තිමත්ව එතුමාට සහයෝගය දෙන්න බලාගෙන ඉන්නවා. මේ මත් කුඩු ව්‍යාපාරය නිසා මේ රටේ අහිංසක දුප්පත් කාන්තාවන්, තරුණයන් අසරණ වෙලා තිබෙනවා. මේ අත් අඩංගුවට ගැනීම් කරන්නේ නැතිව කිලෝ ගණනක මත් ද්‍රව්‍ය මිනිසුන්ගේ අතට ගියා නම්, තරුණයන්ගේ අතට ගියා නම්, මේ රටට අත් වන තිබෙන ඉරණම මොකක්ද කියලා කල්පනා කර බලන්න.

මේ ක්‍රියාදාමය තුළ එතුමා විශාල වැඩ කොටසක් කර තිබෙනවා. ජිනීවා මානව හිමිකම් කොමිසම පිළිබඳ තත්ත්වයන් ගැන අද මේ සභාවේ කතා වුණා. කොහොල්ලෑ බබාගේ වාගේ ප්‍රශ්නයක් තිබුණේ. 2015 වර්ෂය වෙනකොට බොහොම පැහැදිලිව අපි දැක්කා, මේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් ඇති වෙලා තිබුණු තත්ත්වයන්. මොකද? අපිට සම්බාධක පැනවෙන තැනකට මෙය තල්ලු වෙලා තිබුණේ.

අපි බොහොම පැහැදිලිව කියන්නට කැමැතියි, දරුස්මාන් වාර්තාව අපි පිළිගන්නේ නැති බව. දරුස්මාන් වාර්තාවට යටත් වෙලා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයා වෙනත් වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාර්තාවේ 30(1) වගන්තිය යටතේ තිබුණු කාරණා මත තමයි ගරු මංගල සමරවීර අමැතිතුමාට සිද්ධ වුණේ එයට යම් සහයෝගයක් සහිතව වැඩ කටයුතු කරන්න. ඇත්තවශයෙන්ම ලංකාවේ තිබෙන තත්ත්වයන් පිළිබඳව වෙනත් විධියකට මේ වාර්තාවේ තිබුණු කාරණා අපට පිළිගන්නට සිද්ධ

[ගරු දයාසිරි ජයසේකර මහතා]

වුණා. අද ඒවා ක්‍රමානුකූලව විසඳාගෙන විසඳාගෙන යන කාල වකවානුවක් අපට තිබෙන්නේ. දරුස්මාන් වාර්තාවේ තිබුණා, 40,000ක් සම්පූර්ණයෙන් අතුරුදහන් වුණාය කියා. අනෙක් කාරණය තමයි මනුෂ්‍යත්වයට එරෙහි වැරදි -crimes against humanity-. එය අපේ රටට ඉදිරිපත් වෙච්ච මහා දැවැන්ත චෝදනාවක් විධියට තිබුණා.

අපි කවුරුත් දන්නවා ගරු සභාපතිතුමනි, හිට්ලර් යුදෙව්වරු මැරුවා වාගේ මේ යුදමය වාතාවරණය යටතේ අපේ මිනිස්සු - හමුදා භටයන්- දෙමළ මිනිස්සු මැරුවේ නැහැ කියා. හැබැයි, එහෙමත් මේ වාර්තාවට ඇතුළත් කර තිබුණා. ඒ වාගේම මතක තබා ගන්න ඕනෑ කරන කාරණය තමයි 2019 මැයි 19වැනි දායින් පස්සේ -යුද්ධය අවසන් වුණායින් පස්සේ- මේ රටේ හමුදා නිලධාරින් කිසිදු යුද අපරාධයක් කළේ නැහැ කියන එක. ඒක අපි සියලු දෙනාම දන්නවා. මේ සියල්ලම තමයි මේවාට ඇතුළත් කර තිබුණේ. ඊට අමතරව මානව හිමිකම් උල්ලංඝනය පිළිබඳව සොයා බැලීම් පිළිබඳ කාරණා ඇතුළත් වුණා. මේවා තමයි දිගින් දිගටම මේ යෝජනාවලිය තුළ ඇතුළත් වුණේ. ඒ නිසා පසුගිය කාලය තුළ ආණ්ඩුවක් විධියට අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ විශේෂයෙන් අතුරුදහන් වූවන් - missing persons - පිළිබඳව ඒ සොයා බැලීම් ටික ආරම්භ කර තිබුණා. එයින් බොහොම පැහැදිලියි, එල්ටීටීඊ අතුරු හමුදා විසින් මරා දමන ලද පිරිස් - උදාහරණයක් විධියට ගත්තොත් යුද්ධය අවසාන කාලයේ එල්ටීටීඊ සංවිධානය යාපනයේ සිටි කරුණාවැම්ගෙය් - කොණ්ඩා කපන අය- ධීවරයන්, ගොවීන් විශාල සංඛ්‍යාවක් බඳවා ගත්තා. ඔවුන් සාමාන්‍ය සිවිල් ජනතාව. මේ අය අතුරු හමුදා විධියට එල්ටීටීඊ එක පාවිච්චි කළා. ඒ අය අවසාන මොහොතේ යුද්ධයට කෙළින්ම කැඳෙව්වා. විශාල යුද්ධයක් එක්ක එක පැත්තකින් එල්ටීටීඊ එකේ ස්ථාවර බට පිරිස මැරුණා වාගේම එල්ටීටීඊ එක පාවිච්චි කළ අතුරු හමුදාවල විශාල ප්‍රමාණයක පිරිසක් මැරුණා. මේ අය තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වාර්තාවට ඇතුළත් කර තිබෙන්නේ, විශේෂයෙන් දරුස්මාන් වාර්තාවට ඇතුළත් කර තිබෙන්නේ හතළිස් දාහකට අධික පිරිසක් මැරුණාය කියා. හැබැයි අතුරුදහන් වූවන් පිළිබඳව කාර්යාලයක් ස්ථාපිත කිරීම තුළ මේක අපට විසඳාගන්නට පුළුවන් තත්ත්වයකට පත් වෙනවා. ඊට අමතරව ඒ අයට වන්දි ගෙවීම සඳහා අවශ්‍ය කරන කටයුතු ටික අපි ලැහැස්ති කර තිබෙනවා. අනෙක් කාරණය අනීතික ලෙස අතුරුදහන් කර තිබෙනවා නම් ඒ අයට විරුද්ධව නඩු පැවරීම සඳහා අවශ්‍ය කරන කාරණා, LLRC වාර්තාව යටතේ තිබෙන කාරණා පිළිබඳව විශේෂයෙන්ම නඩු පැවරීමේ කාර්යය දැන් ආරම්භ කර තිබෙනවා. අපි විශ්වාස කරන්නේ මේ ක්‍රියාදාමය තුළ විශේෂයෙන් මේ රටට එරෙහිව ඇතිවෙලා තිබෙන මේ වාතාවරණයෙන් අපි ගැලවෙන්න නම් රටක් විධියට මේ සම්බන්ධව නිවැරදිව අපි ඔළුව කල්පනා කර ක්‍රියා කළ යුතු බවයි. මේ වැඩ පිළිවෙළ හරියට ක්‍රියාත්මක කළොත් අනීතික ලෙස සමහර වෙලාවට මානව හිමිකම් උල්ලංඝනය කරමින් සිදුවුණ ක්‍රියාදාමයන් පිළිබඳව වැඩ පිළිවෙළක් සකස් කරනවා නම්, අලුත් මහාධිකරණයක් ස්ථාපිත කර හෝ කිසියම් විධියකට මේ අනුව කටයුතු කරනවා නම්, එක පැත්තකින් එල්ටීටීඊ ත්‍රස්තවාදීනුත් පරාජය කරන්නට පුළුවන්; ඩයස්පෝරාවත් පරාජය කරන්නට පුළුවන්; අන්තවාදීනුත් පරාජය කරන්නට පුළුවන්. මොකද,ලෝකයේ රටවල් අපිත් එක්ක තිබෙන සම්බන්ධතාවය තවදුරටත් වර්ධනය කර ගන්නා නිසා.

මේ වෙනකොට අපි වන්දි සම්බන්ධයෙන් වූ පනත මේ පාර්ලිමේන්තුවේ සම්මත කර තිබෙනවා. සත්‍යය සෙවීමේ සහ ප්‍රතිසන්ධානය - truth and reconciliation - පිළිබඳ පනත් කෙටුම්පත දැන් සාකච්ඡාවට බඳුන් වෙලා තිබෙනවා. ඒක Act එකක් විධියට ඉදිරිපත් කරයි.

පසුගිය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩු කාලවකවානුව තුළ අපි විශේෂ නියෝජිතයන්ට - mandate holdersලාට - එන්න දුන්නේ නැහැ. නමුත්, මේ ආණ්ඩුව යටතේ ඒ ගොල්ලන්ට ඇවිල්ලා වැඩ කරන්න ඉඩ දීලා තිබෙනවා. මේ රට ඇතුළේ තිබෙන සම්මත තත්ත්වයන් ඔවුන් හොඳින් අවබෝධ කරගෙන තිබෙනවා. මෙම ක්‍රියාදාමය තුළ, මේ කොහොල්ලෑ බබාගෙන් ගැලවෙන්නේ කොහොමද කියලා අපි බලන්න ඕනෑ. මේ සඳහා අපි තව දුරටත් වෙනත් වැඩ කරනවාද, නැත්නම් ඒකට විරුද්ධව වැඩ කරනවාද කියන කාරණයට වැඩිය, අපි රටක් විධියට මේ ක්‍රියාදාමය සකස් කරන්න ඕනෑ. එම නිසා, මේ රටට අත් වෙලා තිබෙන ඉරණමෙන් මේ රට ගොඩ ගන්න නම් අපි සියලුදෙනා බුද්ධිමත් ලෙස කටයුතු කළ යුතුයි කියලා මේ ක්‍රියාවලියේදී රටක් විධියට වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විදියට අපි ඉතාමත් හොඳ විවෘත මනසක ඉන්නවා. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමා යම් පිරිසක් ජිනීවාවලට යවන්න හදනවා නම්, එය එම ක්‍රියාදාමය තවත් ශක්තිමත් කරන්න මිස කඩා කප්පල් කිරීමට නොවෙයි කියන එක මම මෙතැනදී කියන්න අවස්ථාව උදා කර ගන්නවා.

ගරු සභාපතිතුමනි, අනික් කාරණය මෙයයි. විශේෂයෙන්ම කොමිෂන් සභාවල ක්‍රියාමාර්ග පිළිබඳව අපි අරගෙන බැලුවොත්, දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ,- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ප්‍රශ්න පිළිබඳව දැන් දිගින් දිගටම කථා වෙනවා. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කටයුතු කළ යුත්තේ ස්වභාවික යුක්තියේ මූලධර්ම අනුව මිස ඒ ගොල්ලන්ට හීන ලෝකවල ඉඳගෙන කටයුතු කරන්න බැහැ. ඒ නිසා තමයි අපි කිව්වේ, නිර්ණායක හදන වැඩ පිළිවෙළකට යන්න කියලා. හැබැයි, "අශ්වයා ගියාට පස්සේ ඉස්තාලය වහනවා වාගේ" අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කරන්නේ මොකක්ද? අපි මේ ප්‍රශ්න ඇද්දායින් පසු, 2002දී ඒ ගොල්ලෝ එකඟ වුණු නිර්ණායක ටික ගෙනැල්ලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන එකයි ඒ ගොල්ලෝ කරන්නේ. ඒක නොවෙයි කළ යුත්තේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41උ. (3) ව්‍යවස්ථාවේ, නිර්ණායක සෑදීම පිළිබඳව බොහොම පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා:

> "ස්වකීය කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමට අදාළව රීති සෑදීමට සභාවට බලය ඇත්තේ ය. එකී සියලු රීති ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එකී පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

ගරු සභාපතිතුමනි, 2002දී එකඟ වුණු නිර්ණායක අනුව ක්‍රියා කරනවා කියලානේ දැන් ඒ අය කියන්නේ. ඇත්ත වශයෙන්ම දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව කළ යුතු කාර්ය භාරය බොහොම පැහැදිලියි. 41උ. (3) ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව තිබෙනවා, සභාවට රීති හදන්න පුළුවන්, ඒවා ගැසට් පත්‍රයේ පළ කරන්න ඕනෑ, ඊට අමතරව ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගන්න ඕනෑ කියලා. මේවා තවමත් ක්‍රියාත්මක කරලා නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට තව විනාඩි කිහිපයක් දෙන්න ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාගේ වෙලාවෙන්ද අඩු කරන්නේ?

**ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)
ගරු සභාපතිතුමනි, මගේ කාලයෙන් අඩු කරගන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මැතිතුමා කථා කරන්න ඉන්නවා. එතුමාට වෙන් වූ කාලයෙන් විනාඩි දෙකක් මම ලබා ගන්නවා. මට කාලය ලබාදීම සම්බන්ධයෙන් එතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා.

ඊළඟට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සෑම මාස තුනකට වරක්ම, ඊට පෙරාතුව මාස තුන ඇතුළත වූ කටයුතු පිළිබඳ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුයි. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එම වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ කවදාද කියා මම අහන්න කැමැතියි. ඒ කටයුත්ත සිද්ධ කරලා නැහැ. ඒ විධියට තමයි මේකට විරුද්ධව ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ.

ඊට අමතරව ගිය සතියේ උපුල් ජයසූරිය මැතිතුමාගේ ගෙදර සාකච්ඡාවක් තිබුණා. ඒකට අපේ බලවතුන් ගණනාවක් ගියා. මම මෙතැනදී ඔවුන්ගේ නම් කියන්නේ නැහැ. ඔවුන්ගේ කටහඬ සහිත ඒ හඬ පටය මම පසුව ඉදිරිපත් කරනවා. ඒකට සහභාගි වූ අයගේ නම් ටිකත් මගේ ළඟ තිබෙනවා. ඔවුන් ගිහිල්ලා මොකක්ද කථා කළේ? ඊළඟ අග්‍ර විනිශ්චයකාරවරයා පත් කරන්නේ කොහොමද කියන එක තමයි ඔවුන් සාකච්ඡා කළේ. මේ ගොල්ලෝ වෙනම මේ රටට පෙන්වනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්වාධීනයි කියලා. හැබැයි, අභ්‍යන්තරව ඒ අය වෙනම සාකච්ඡා කරමින් තමයි මේ ක්‍රියාවලිය කරගෙන යන්නේ.

ඊට අමතරව මම ඔබතුමාට තවත් කාරණයක් කියන්න කැමැතියි. විශේෂයෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරින්ගේ වැටුප් සම්බන්ධයෙන් අද විශාල ප්‍රශ්නයක් තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරින් සියලුදෙනාම 1994 සිට නීති නිලධාරි - Law Officer - සේවා ගණයේ තමයි පිහිටුවා තිබුණේ. 2006, 2016 වැටුප් චක්‍රලේඛ අනුව ද බොහොම පැහැදිලිව මේ අය SL5 වැටුප් තලයේ Law Officer සේවා ගණයේ තබා කටයුතු කළා. 2018දී නීතිපති දෙපාර්තමේන්තුවේ පඩි වැඩි කරන කොට අපි ඒකට සහයෝගය දුන්නා. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට වෙනම වැඩි වැටුප් ලබා දීමට අමතරව, 1/2008 අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛනය යටතේ ඔවුන්ට දීමනා විශාල ප්‍රමාණයක් ද ලබා දී තිබෙනවා. අධි චෝදනා පත්‍ර ඉදිරිපත් කරන්න බලය තිබෙන්නේ, නීතිපති දෙපාර්තමේන්තුවට සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පමණයි. මෙම නීති නිලධාරින් දෙගොල්ලන්ගේම මූලික රාජකාරි විමර්ශනවලට උපදෙස් ලබා දී නඩු පවරලා අධිකරණවල පැමිණිලි මෙහෙයවීම ඒ අය කරනවා. ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ නීති නිලධාරින් දිවයින පුරාම අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ කටයුතු සඳහා විශාල මෙහෙවරක් කරමින් සිටින තත්ත්වයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, හැබැයි එහි ඉන්නේ නීති නිලධාරින් 28දෙනායි. මම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි, කරුණාකරලා මේ ක්‍රියාදාමයට ඒ අයවත් ඇතුළු කරන්න කියා. මොකද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සිටින නීති නිලධාරින් 28දෙනාට පමණක් Law Officersලාගේ සේවා ගණය තිබෙන -එකම සේවා ගණය තිබෙන- තත්ත්වය නැති කරන්න අවශ්‍ය කරන කටයුතු ටික ඇති කළොත්, අල්ලස් හෝ දූෂණ සම්බන්ධයෙන් තිබෙන්නා වූ ක්‍රියාදාමයන් තව තවත් වැඩි වෙයි කියා මා විශ්වාස කරනවා. එම නිසා එයත් ඉෂ්ට කරන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඊළඟට අද බැඳුම්කර කොමිෂන් සභාවේ ලේකම් විසින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාර දී තිබුණු සමහර කාරණා පිළිබඳවත් මම කියන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, මේ බැඳුම්කර කොමිසමේ සමහර වාර්තා ජනාධිපති ලේකම් කාර්යාලයේ හිර කරගෙන ඉන්නවා කියලා එදා කිව්වා. ඒවා ජනාධිපතිතුමා ළඟ හිර කරගෙන ඉන්නවා කිව්වා. හැබැයි මතක තියා ගන්න ඕනෑ කාරණය තමයි, අදාළ ලේකම් කාර්යාලය වෙත භාර දුන් ලේඛන නීතිපතිතුමාගේ උපදෙස් මත, 2018 ජූලි මාසයේ 31වැනි දින ගරු කථානායකතුමා වෙත යොමු කර තිබෙන බව. මොකද, ගරු කථානායකතුමාමයි කිව්වේ ඒ ඉදිරිපත් කරපු කරුණු, සමහර කාරණා මත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බැහැ, ඒ නිසා නීති උපදෙස් ගන්න ඕනෑ කියලා. ඒ අනුව 2018 ජූලි මස 31වැනි දා නීතිපති දෙපාර්තමේන්තුවෙන් නීති උපදෙස් ලැබුණා. ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුවේ අවසරය සහිතව බැඳුම්කර කොමිසමේ සමහර ලේඛන, සී 3 ලේඛනය, සී 4 ලේඛනය, සී 6 ඒ ලේඛනය සී 6 බී ලේඛනය, සී 6 සී ලේඛනය, සී 6 ඩී ලේඛනය, සී 25ලේඛනය, සී 25 ඒ ලේඛනය, සී 25 බී 1 ලේඛනය, සී 25 බී 2 ලේඛනය, සී 25 බී 3 ලේඛනය ඇතුළු ලේඛන විශාල සංඛ්‍යාවක් ගරු කථානායකතුමාට ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ලේඛන ජනාධිපතිතුමාගේ භාරයේ තියාගෙන ඉන්නවා කියලා පසුගිය කාලයේ චෝදනා ගණනාවක් එල්ල වුණා. මේ සියලු තොරතුරු නීතිපති උපදෙස් මත ජනාධිපති ලේකම් කාර්යාලයෙන් පාර්ලිමේන්තුවට යොමු කරලා තිබෙනවා. ඒ නිසා ඒ අනුව ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිනවා. අද මේ අය වැය විවාදයේදී ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කළා. අපි එයට සහයෝගය සහ ශක්තිය ලබා දෙන බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා.1.52]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු සභාපතිතුමනි, 2019 අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේ ආයතන කිහිපයක වැය ශීර්ෂ සම්බන්ධ විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය, කොමිෂන් සභා වැය ශීර්ෂ, අග්‍රාමාත්‍ය කාර්යාලයේ වැය ශීර්ෂය වැනි වැය ශීර්ෂ රාශියක් අද දින විවාදයට අරගෙන තිබෙනවා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු සභාපතිතුමනි, අපි 2015 ජනවාරි 08වැනි දින ලැබූ ජයග්‍රහණය සහ අගෝස්තු මාසයේ මහ මැතිවරණයෙන් ලැබූ ජයග්‍රහණයත් එක්ක එක්සත් ජාතික පෙරමුණ හැටියට මන්ත්‍රීවරු 107දෙනෙක් පත් වුණා. ඒ 107දෙනා පත් වුණාට පසුව, එදා නිදහස් සන්ධානයෙන් තරග කරපු මන්ත්‍රීවරු රාශියක් මේ ආණ්ඩුවට එකතු වෙන්න හැදුවා. ඒ අය එක්සත් ජාතික පෙරමුණ හැටියට මේ ආණ්ඩුවට එකතු වෙන්න, වැඩ කරන්න, ඇමතිකම් ගන්න ගරු අගමැතිතුමාත් සමඟ සාකච්ඡා කරලා විශාල උත්සාහයක් දැරුවා. නමුත් අගමැතිතුමා ඒ වෙලාවේ කිව්වා, "අපට පක්ෂ කඩන්න ඕනෑ නැහැ. ඔබතුමන්ලා ඒ පැත්තේ ඉන්න, අපි ජාතික ආණ්ඩුවක් හැටියට වැඩ කරමු" කියලා. ඒ අනුව තමයි අපි එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක ජාතික ආණ්ඩුවක වැඩ පිළිවෙළට ගියේ.

එදා සන්ධානයෙන් පත් වුණු මන්ත්‍රීවරු අරගෙන අපි ආණ්ඩුව හැදුවා නම්, සමහර විට අද වන විට එතුමන්ලා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකත්වය ලබා ගන්නත් තිබුණා. නමුත් අගමැතිතුමා කිව්වා, එහෙම පක්ෂ කඩන්න අපට අවශ්‍යතාවක් නැහැ කියලා. මේ රටේ ප්‍රධාන ප්‍රශ්න විසඳා ගන්න අනිවාර්යයෙන්ම ජාතික ආණ්ඩුවක් අවශ්‍යයි, ඒ නිසා අපි ජාතික ආණ්ඩුවකට යමු කියන අදහසින් තමයි අගමැතිතුමා වැඩ කළේ.

ගරු සභාපතිතුමනි, මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමාත් ජනාධිපතිතුමාගේ මත්ද්‍රව්‍ය මර්දනය කිරීමේ වැඩසටහන් ගැන කිව්වා. ඒ ගැන අපට ගැටලු නැහැ. 2015න් පසු, අපේ ආණ්ඩුව කාලයේ පොලීසිය තුළ ඇති කරපු වෙනස අද විශේෂයෙන්ම මතක් කර ගන්න ඕනෑ. සාගල රත්නායක ඇමතිතුමාත්, රංජිත් මද්දුමබණ්ඩාර ඇමතිතුමාත් පොලීසිය භාරව කටයුතු කරපු කාලයේ 'සංවිධානාත්මක අපරාධ, මත්ද්‍රව්‍ය නාශක දිසාව' කියලා වෙනම යුනිට් එකක් හැදුවා. ඒ යුනිට් එකට STF එකත් සම්බන්ධ කළා. එහෙම සම්බන්ධ කරලා ලතීෆ් මහත්මයා STF එකේ DIG බවට පත් කළා. මත්ද්‍රව්‍ය නාශක අංශය, සංවිධානාත්මක අපරාධ අංශය යන ඒ ඔක්කොම එකතු කරලා එක යුනිට් එකක් හැටියට වැඩ කරන්න පුළුවන් බලයක් ලබා දුන්නා. එසේ බලය ලබා දීම තුළ විශේෂයෙන් DIG ලතීෆ් මැතිතුමාට විශාල බලයක් ලැබුණා. මත්ද්‍රව්‍ය ව්‍යාපාර මැඬ පවත්වන්න ඉදිරියට යන්න පුළුවන් වාතාවරණය එතුමාට සකස් කරලා දුන්නා.

නමුත් අවාසනාවකට ඒ ඔක්කෝම හදලා දුන්නාට පස්සේ ජනාධිපතිතුමා පොලීසිය එතුමා යටතට ගත්තාම ඔක්කෝම අය කියනවා, "ජනාධිපතිතුමා තමයි මේ ඔක්කෝම අල්ලන්නේ" කියලා. නමුත් එහෙම එකක් නැහැ. ජනාධිපතිතුමාටත් ඒකේ credit එක තිබෙනවා. ඒක ගැන අපට ගැටලුවක් නැහැ. නමුත්, මේ වෙනුවෙන් මූලිකව වැඩ කරගෙන ආපු මැති ඇමතිවරු රාශියක් ඉන්නවා. දේශපාලනඥයන්ගේ ඇඟිලි ගැසීම්වලින් තොරව, දේශපාලන බලපෑම්වලින් තොරව පොලීසියට ස්වාධීනව වැඩ කරන්න පුළුවන් වන විධියට කොමිෂන් සභා පත් කළේ මේ යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණාට පස්සෙයි. ඒ ගෞරවය අනිවාර්යෙන්ම යහ පාලන ආණ්ඩුවට එන්න ඕනෑ. යහ පාලන ආණ්ඩුවේ ක්‍රියා කලාපය උඩ තමයි අද වෙනකොට පොලීසියට එහෙම වැඩ කරන්න පුළුවන් හයිය, ශක්තිය ලබා දීලා තිබෙන්නේ. එතකොට, ඒක එක පුද්ගලයෙකුට යන්න ඕනෑ ගෞරවයක් විතරක් නොවෙයි. ඒක යහ පාලන ආණ්ඩුවට යන්න ඕනෑ ගෞරවයක්. අද ඒක එක පුද්ගලයෙකුට යන්න ඕනෑ ගෞරවයක් හැටියට හොරකම් කරන්න බලනවා.

ගරු සභාපතිතුමනි, අපි පසුගිය කාලයේ දිගටම කරුණු මතුකරගෙන ආවා මේ කොමිෂන් සභා ගැන. මේ කොමිෂන් සභා ගැන ලොකු විවේචන ආවා. කොමිෂන් සභාවලට කරපු ඒ පත් කිරීම් ගැන විවේචන ආවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට කලින් ජනාධිපතිතුමාට තමයි බලතල තිබුණේ, ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරු පත් කරන්න, අභියාචනාධිකරණයේ සභාපති පත් කරන්න, අග්‍ර විනිශ්චයකාරවරයා පත් කරන්න, නීතිපතිවරයා පත් කරන්න, පොලිස්පතිතුමා පත් කරන්න. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට කලින් මේ පත්වීම් ඔක්කෝම කරන්න ජනාධිපතිවරයාට තමයි බලතල තිබුණේ. ජනාධිපතිවරයාට මේ බලතල තිබුණු පසුගිය ආණ්ඩු කාලයේ මේ පත් කිරීම් කරපු හැටි අපි දැක්කා. ගෙදර යන ගමන් අග්‍ර විනිශ්චයකාරවරු පත් වුණා. ගෙදර යන ගමන් ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරු පත් වුණා. අපි දැක්කා, කොහොමද එහෙම පත් වුණේ කියලා. සමහර යම් යම් වරප්‍රසාද මත නීතිපතිවරයා පත් කළේ කොහොමද කියලා අපි දැක්කා. විශේෂයෙන්ම මේ ක්ෂේත්‍රයෙන් පිට හිටපු අය ගෙනැල්ලා නීතිපතිවරු කළා. සෙලාන් බැංකුවේ සභාපති වෙලා හිටපු කෙනා ගෙනැල්ලා අග්‍ර විනිශ්චකාරවරයා හැටියට පත් කළා. එහෙම තත්ත්වයක් මේ රටේ තිබුණා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පත් කිරීම තුළින් ඒ හැම එකක්ම වෙනස් කරගන්න පුළුවන් වුණා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පත් කිරීම නිසා ජනාධිපතිවරයාට හිතෙන හිතෙන විධියට තමන්ගේ හිතවතුන්, තමන්ට උදව් කරන අය, තමන්ට නෑදෑකම් කියන අය තමන්ට ඕනෑ විධියට තනතුරුවලට පත් කරන්න බැරි වෙච්ච එක තමයි දැන් තිබෙන ගැටලුව. මේ කථා කරන්නේ නැවත පරණ යුගයට යන්නයි. පරණ විධියට ජනාධිපතිතුමාට ඕනෑ දේවල් කරන, ජනාධිපතිතුමා කියන දේවල් කරන, ජනාධිපතිතුමාට ඇහුම්කන් දෙන, අන්න ඒ වාගේ අය මේ නීති ක්ෂේත්‍රයට ගෙනෙන්න තමයි මේ අය දැන් කථා කරන්නේ කියලා මනාව පැහැදිලි වෙනවා. මේ ක්‍රියාවලිය තුළ අඩු පාඩු තිබෙන්න පුළුවන්. කොමිෂන් සභාවල අඩු පාඩු තිබෙන්න පුළුවන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ අඩු පාඩු තිබෙන්න පුළුවන්. නමුත්, එදා හිටපු ඒ වැඩවසම් යුගයෙන් මිදිලා, ධනාත්මකව, ප්‍රජාතන්ත්‍රවාදීව කාටත් පිළිගන්න පුළුවන් යුගයකට අපි අද ඇවිල්ලා තිබෙනවා. ඒ යුගය ආපසු හරවන්න අවශ්‍යතාවක් නැහැ. මේ තිබෙන දේවල්වල අඩු පාඩුකම් තිබෙනවා නම් අපට හදා ගන්න පුළුවන්. එ් හින්දා ජනාධිපතිතුමාටත් හිතෙන හිතෙන විධියට අද පත්වීම් කරන්න බැහැ. අද ඒ පත්කිරීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත් වෙන්න ඕනෑ. පරණ විධියට මේ පත් කිරීම් කරනවා නම්, අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමේ තේරුමක් නැහැ. ජනාධිපතිතුමාට ඕනෑ විධියට පත් කිරීම් කරන්න ඕනෑ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් වැඩක් නැහැ. එහෙම නම්, අපි ආයෙත් යන්නේ පරණ ක්‍රමයට. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරු පත් කරපු විධිය, නීතිපතිතුමා පත් කරපු විධිය බලන්න. එහෙම නම් ඒ යුගයට අපි ආයෙත් යන්නයි මේ කථා කරන්නේ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225න්, 224 දෙනෙක්ම ඡන්දය දුන්නේ නැවත ඒ යුගයට යන්න නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ ඒකමතිකව ඒක සම්මත වුණා. ඒක සම්මත වුණාට පස්සේ දැන් ඇවිල්ලා ඒකට විරුද්ධව එක එක ගෝරනාඩු දානවා. මා හිතන විධියට ඒක කිසිම තේරුමක් නැති කථාවක්. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අපි ලෝකයට පෙන්වලා තිබෙනවා, මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ තිබෙන ස්වාධීනත්වය. දේශපාලන බලපෑමට, දේශපාලන හයියට, දේශපාලන නායකයන්ගේ වුවමනා උඩ වැඩ කරන අධිකරණයක් නොවෙයි අද තිබෙන්නේ කියන එක ලෝකය පිළිඅරගෙන තිබෙනවා. එතකොට ඒ පිළිගැනීම අපට ආපසු හරවන්න බැහැ.

ගරු සභාපතිතුමනි. අපි විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය ගැන කථා කළා. ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයේදී

පසු පෙළ මන්ත්‍රීවරයකු හැටියට මා යෝජනාවක් ඉදිරිපත් කරමින් කියා සිටියා, "ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට අපි විරුද්ධ වෙනවා" කියලා. අපි ඒ යෝජනාව ගෙනාවේ වෙන මොකක් නිසා නොවෙයි. මොකද, 2015 ජනවාරි 08වැනි දා අපි කරපු පරිවර්තනයත් එක්ක ජනාධිපතිතුමා සමඟ ලොකු ගමනක් යන්න අපේ බලාපොරොත්තුව තිබුණා.

අපි යහ පාලන ආණ්ඩුව ශක්තිමත් කරමින් නැවත මේ රටේ ජාතික සමඟිය, මේ රටේ නීතියේ ආධිපත්‍ය ඒ සියලු දේවල් ස්ථාපිත කරමින් අලුත් රටක් ගොඩනඟන්න ඕනෑය කියන ඒ බලාපොරොත්තුවෙන් තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් එක්ක මේ ගමන ආවේ. ඒ ආපු ගමන එතුමා පසුගිය ඔක්තෝබර් 26වැනි දා ආපසු හැරෙව්වා. මේ රටේ අපි පරාජය කරපු ඒ බලවේග -ඒකාධිපති ගමනක් යන්න හදපු බලවේග, මේ රටේ ජාතිවාදය අවුස්සන්න හදපු බලවේග, මේ රටේ ෆැසිස්ට්වාදී ගමනක් යන්න හදපු බලවේග- එක්ක නැවත ජනාධිපතිතුමා එකඟත්වයකට ගිහිල්ලා ජනතා මතයෙන් පත් වෙච්ච ආණ්ඩුව පරාජය කරන්න, ආණ්ඩුව වට්ටන්න ඔක්තෝබර් මාසයේ කුමන්ත්‍රණයක් කළා. ඒ කුමන්ත්‍රණය කළේ ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉඳගෙන. අන්න ඒක උඩ ඉඳන් තමයි අපි කිව්වේ, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට අපි විරුද්ධයි කියලා.

ජනාධිපතිතුමා අපි හදපු ආණ්ඩුවත් එක්ක -අපිත් එක්ක- යන ගමන ආපසු හරවලා, මේ රටේ කුමන්ත්‍රණකාරී බලවේගත් එක්ක ජනාධිපතිතුමා ගනුදෙනු කරන්න පටන් ගත්තා. ඒ ගනුදෙනු කිරීමේ මූලික මධ්‍යස්ථානය තමයි -ඒකේ මූලික ස්ථානය තමයි- ජනාධිපති ලේකම් කාර්යාලය. එහේ ඉඳන් තමයි මේ ඔක්කෝම කළේ. ජනාධිපතිතුමාගේ ලේකම් කාර්යාලයේ ඉඳන් තමයි ඔක්කෝම දේවල් කරන්නේ. අද එක්සත් ජාතික පෙරමුණට පහර දෙන්නේ, එක්සත් ජාතික පක්ෂය විනාශ කරන්න පහර දෙන්නේ, මේ ආණ්ඩුව වට්ටන්න පහර දෙන්නේ, ජනාධිපතිතුමාට අවශ්‍ය විධියට නොයෙකුත් මාධ්‍ය ආයතන හසුරුවා ගෙන එක එක මන්ත්‍රීවරුන් එල්ල කරමින්, අගමැතිතුමා ඉලක්ක කරමින්, එක එක ඇමතිවරු ඉලක්ක කරමින් ඒ සියලු පහර දීම් වෙන්නේ ජනාධිපතිතුමාගේ ලේකම් කාර්යාලයේ ඉඳන්. අන්න ඒ ලේකම් කාර්යාලයට මුදල් වෙන් කරනවාට තමයි අපි විරුද්ධයි කියලා කිව්වේ. අපි ඒකට විරුද්ධ වෙන්න හේතුව ඒක තමයි.

අපි ජනාධිපතිතුමාට මුදල් අනුමත කරලා දීලා - ඒ මුදල් පාවිච්චි කරලා නැවත අපව විනාශ කරන්න, මේ ආණ්ඩුව කඩන්න, මේ ආණ්ඩුවට කකුල් මාට්ටු දාන්න, මේ ආණ්ඩුව පෙරළන්න කරන කුමන්ත්‍රණය තුළ ජනාධිපතිතුමා සිටිනවා. පසුගිය ඔක්තෝබර් 26වැනි දා සිදු වූ එම කුමන්ත්‍රණයේ මූලික කොටස් කාරයා වුණේ ජනාධිපතිතුමා. අවසානයේ, ජනාධිපතිතුමා මේ රටේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙනවා කියලා එදා ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දුන්නා. එහෙම වාතාවරණයක් උඩ තමයි අද අපි මේකට විරුද්ධ වෙන්න ඕනෑය කියන අදහස ගෙනාවේ. එහෙම නැතිව ජනාධිපතිතුමා එක්ක අපට වෙනත් ගැටලුවක් නැහැ. නමුත් ඒ අදහස ගැන නොයෙකුත් අදහස් තිබෙනවා. අපේ පක්ෂය ඇතුළේත් තිබෙනවා; ආණ්ඩුව ඇතුළේත් තිබෙනවා.

අපි ඒ අදහස ඉදිරිපත් කළාට පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 25දෙනෙකුට වැඩි පිරිසක් ඊයේ ඡන්දයට ආවේ නැහැ; ඡන්දය දීමෙන් වැළකී සිටියා. එසේ ඡන්දය දීමෙන් වැළකී සිටීම තුළ එතුමන්ලා ලබා දීපු සංඥාව මොකක්ද කියලා මම දන්නේ නැහැ. කොහොම හරි ඒකාබද්ධ විපක්ෂය විශාල බලාපොරොත්තුවක් තියාගෙන හිටියා, මේ අය වැය පරාජය කරන්න ඕනෑ කියලා. පරාජය කරන්න ඕනෑය කියලා කයිවාරු ගැහුවා. එකසිය ගණන් ඉන්නවාය කිව්වා. ඒ කියපු උදවිය අන්තිමට 70න් තමයි ගිහිල්ලා නැවතුණේ. ජනතා විමුක්ති පෙරමුණේ හය දෙනා නැත්නම් ඒ ගොල්ලන්ට ඡන්ද ලැබුණේ 70යි. ගරු සභාපතිතුමනි, මේ වාගේ පරිසරයක් තුළ තමයි මගේ අදහස් මම ඉදිරිපත් කළේ. විශේෂයෙන් ජනාධිපතිතුමා හැම තිස්සේම කියන දෙයක් තමයි, මේ ආණ්ඩුව හොරු අල්ලන්නේ නැහැ කියලා.

එතුමා ඊයේ - පෙරේදා කථාවක් කිව්වා, එතුමා කියන දේවල් කවුරුවත් අහන්නේ නැහැයි කියලා. "මම කියන දේවල් ආණ්ඩුවේ කවුරුවත් අහන්නේ නැහැ" කියලා එතුමා කියනවා. මම නම් එතුමාට කියන්නේ මෙයයි. එතුමා කියන දේවල් කවුරුවත් අහන්නේ නැත්නම් -මේ ආණ්ඩුවේ ඉන්න උදවිය අහන්නේ නැත්නම්- එතුමා අඬ අඬා ඉඳලා තේරුමක් නැහැ. දැන් එතුමාට පුළුවන්, අලුත් ජනවරමක් ගන්න ජනාධිපති මැතිවරණයකට යන්න. ජනවාරි 8වැනි දායින් පස්සේ එතුමාගේ කාලයෙන් අවුරුදු හතරක් අවසාන වෙලා තිබෙනවා. අලුත් මැතිවරණයකට යන්න පුළුවන්. ඒ හින්දා මම එතුමාට යෝජනා කරනවා, ඔබතුමා කියන දේවල් මේ ආණ්ඩුවේ ඉන්න කවුරුවත් අහන්නේ නැත්නම්, ඔබතුමා අලුත් ජනවරමකට යන්න කියලා. අලුත් ජනවරමකට යන්න පුළුවන් නීතිමය අවස්ථාව, ඒ සියලු දේවල් ඔබතුමාට තිබෙනවා. ඔබතුමාට පුළුවන් වහාම ජනාධිපතිවරණයක් කැඳවන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු සභාපතිතුමනි, ජනාධිපතිවරණයකට ගිහිල්ලා අලුත් ජනවරමක් අරගෙන, එතුමා කියන දේවල් අහන ආණ්ඩුවක් හදා ගන්න ජනාධිපතිතුමාට පුළුවන්. ඒකයි කරන්න තිබෙන්නේ. එහෙම නැතිව අඬ අඬා ඉන්න එකෙන්, කියවා කියවා ඉන්න එකෙන් කාටවත් වැඩක් වෙන්නේ නැහැ. ජනාධිපතිවරයෙක් හැටියට එතුමා එළියට ඇවිල්ලා කියන කොට, "මම කියන දේවල් කවුරුවත් අහන්නේ නැහැ" කියලා, ඒක එක අතකින් ලජ්ජාවට කාරණයක්.

මොකද, මේ රටේ විධායක ජනාධිපතිතුමා එළියට ඇවිල්ලා කියනවා, "මා කියන දේවල් කවුරුවත් අහන්නේ නැහැ"යි කියලා. එහෙම නම් එතුමා ජනාධිපති ධුරයේ ඉන්නේ මොකටද? ඒක තේරුමක් නැහැ. එතුමාට දැන් කරන්න තිබෙන හොඳම දේ මේකයි. දැන් අවුරුදු හතර අවසානයි. දැන් ජනවාරි 08 පහුවෙලා ඉවරයි. මැතිවරණයක් පවත්වන්න දැන් එතුමාට නීතිමය අවස්ථාව තිබෙනවා. ජනාධිපති මැතිවරණයකට ගිහින් එතුමාට අලුතින් ජන වරමක් ගන්න පුළුවන්. අලුත් ජන වරමක් ලබාගෙන එතුමා කියන විධියට, එතුමා කියන දේ අහන, ආණ්ඩුවක් හදාගෙන ඉදිරියට යන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මා එක කාරණයක් කියන්න ඕනෑ. එදා තිබුණු තත්ත්වයට වඩා අද මේ රට වෙනසකට පරිවර්තනය වෙලා තිබෙනවා. මේ ප්‍රතිසංස්කරණ හරහා අද මේ රටේ කොමිෂන් සභා, ස්වාධීන අධිකරණ, ස්වාධීනව වැඩ කරන්න පුළුවන් පොලිසි ඇති කිරීම නිසා පසුගිය කාලයට වඩා අද අපි ඉදිරියට පැමිණ තිබෙනවා. ඒ ලබාගත් සියලු දේවල් මේ රටේ ජනතාවගේ ජයග්‍රහණ; ජනතාවගේ වුවමනාවන්; ජනතාව බලාපොරොත්තු වුණු දේවල්. අපට මෙතැන ඉඳලා යන්න තව බොහෝ දුර තිබෙනවා. ඒ දුර යන්නත් අපි ලෑස්තියි කියා කියමින්, කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තුතියි. The next speaker is the Hon. Douglas Devananda. You have 16 minutes.

Order, please! මෙම අවස්ථාවේදී ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා* ***මූලාසනයෙන් ඉවත් වුයෙන්,*** *ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා* ***මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ANURA SIDNEY JAYARATHNE *took the Chair.*

[பி.ப. 2.07]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் 2019ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் ஜனாதிபதி, பிரதமர் அலுவலகம் மற்றும் சுயாதீன ஆணைக் குழுக்கள் உள்ளடங்கலாக 23 நிறுவனங்களுக்கான நிதி ஒதுக்கீடுகள்மீது இடம்பெறுகின்ற குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துக்களையும் பதிவுசெய்வதற்கு வாய்ப்பு வழங்கியமை குறித்து முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த நாடு நிறைவேற்றதிகாரம், சட்டவாக்கத்துறை மற்றும் நீதித்துறைக் கட்டமைப்பு என்ற மூன்று வகையிலான நிர்வாகத்தின்கீழ் ஆட்சி செய்யப்பட்டு வருகின்றது. இவற்றில் நிர்வாக வசதிகள் மற்றும் அதிகாரப் பரவலாக்கல் போன்றவற்றை முதன்மைப்படுத்தியதாக நிறைவேற்றாளரினதும் சட்டவாக்கத் துறையினதும் அதிகாரங்கள், உள்ளூராட்சிச் சபைகள் மற்றும் மாகாண சபைகள் என்ற வகையில் பரவலாக்கப்பட்டுள்ளன. அந்தவகையில் பார்க்கின்றபோது நாடாளுமன்றத்தில் 225 உறுப்பினர்கள், மாகாண சபைகளில் 455 உறுப்பினர்கள், உள்ளூராட்சி சபைகளில் 7,654 உறுப்பினர்கள் என மொத்தமாக சுமார் 8,334 மக்கள் பிரதிநிதிகள் நியமிக்கப்பட்டுள்ளனர். இந்த நாட்டின் சனத்தொகையுடன் ஒப்பிட்டுப்பார்க்கின்றபோது, சுமார் 2,452 மக்களுக்கு ஒரு மக்கள் பிரதிநிதி இருப்பதாகக் கூறப்படுகின்றது. இந்த மக்கள் பிரதிநிதிகளுக்குரிய ஊதியங்கள், வீட்டு வசதிகள், வாகனங்கள், வாகனச் செலவுகள், ஏனைய சலுகைகள் எனப் பார்க்கின்றபோது, அந்த அனைத்து வசதிகளும் இந்த நாட்டு மக்களின்மீதே பெரும் சுமையாகச் சுமத்தப்பட்டு வருகின்றன. தங்களது மக்கள் பிரதிநிதிகளது பதவிகளுக்கான செலவினச் சுமைகளை, தாங்கிக்கொள்ள இயலாமல் தாங்குகின்ற மக்களுக்கு இந்த மக்கள் பிரதிநிதிகளால் ஏதேனும் சேவைகள் நடக்கின்றனவா? என்பது, தென் பகுதியைப் பொறுத்து போதுமானளவு நடப்பதாகவே தெரியவந்தாலும் வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையில் பூச்சியமாகவே இருந்து வருகின்றது.

இந்த நிலையில்தான் இத்தனை மக்கள் பிரதிநிதிகள் இருந்தும், இந்த நாட்டின் அனைத்து நிர்வாகச் செயற்பாடுகளையும் மேற்கொள்வதற்காக எனக் கூறப்பட்டு, சுயாதீன ஆணைக் குழுக்கள் அமைக்கப்பட்டன. அதாவது, 'சுயாதீனமான நிர்வாகச் சேவைகளை முன்னெடுப்பதற்கு' என்ற நோக்கத்திற்காக எனக் கூறப்பட்டு இந்த ஆணைக்குழுக்கள் அமைக்கப்பட்டன. அந்த வகையில், இந்தச் சுயாதீன ஆணைக்குழுக்கள் உண்மையில் சுயாதீனமானவையா என்ற கேள்வி இன்று எமது மக்கள் மத்தியில் எழுந்துள்ளது.

இந்த ஆணைக்குழுக்களை உருவாக்குகின்ற முழுமையான அதிகார மையமாகச் செயற்படுவது அரசியலமைப்புப் பேரவை யாகும். இதில் பொதுமக்களது பிரதிநிதித்துவத்திற்கும் வாய்ப்பிருக்கின்றது என்றபோதிலும், அரசியல்மயமற்ற நோக்கங்களை முக்கியமாகக் கொண்டிருக்கவேண்டிய இந்தப் பேரவையில், அதிகமான உறுப்புரிமையை நாடாளுமன்ற உறுப்பினர்களே, அதுவும் ஆளுங்கட்சி உறுப்பினர்களே கொண்டிருக்கின்றனர். ஆளுங்கட்சியுடன் பங்காளிக் கட்சியாகச் செயற்பட்டுவருகின்ற தமிழ்த் தேசியக் கூட்டமைப்பானது, அரசியலமைப்புப் பேரவையில் உறுப்புரிமை பெறுகின்ற நிலையில், அந்த உறுப்புரிமையானது எதிர்க்கட்சி உறுப்புரிமையாகிவிடாது என்பதை அறிந்துகொள்ள வேண்டும். அவர்கள் எதிர்க்கட்சியென்ற போர்வையில் இருக்கின்ற ஆளுங்கட்சியினரே என்பதில் எவருக்கும் சந்தேகமில்லை. இந்த நிலையில், இந்த ஆணைக்குழுக்களின் சுயாதீனத் தன்மையை எதிர்பார்க்க முடியுமா என்பதே மக்களின் கேள்வியாகவுள்ளது. அதாவது, 8,334 மக்கள் பிரதிநிதிகளாகிய அரசியல்வாதிகளின் மூலம் எதிர்பார்க்கப்பட இயலாத சுயாதீனமான நிர்வாகச் சேவையினை எதிர்பார்த்தே இந்த ஆணைக்குழுக்கள் அமைக்கப் பட்டு, அதற்கான ஆணையாளர்கள் உட்பட உறுப்பினர்களை அதே அரசியல் பிரதிநிதிகளே பரிந்துரைத்து நியமிக்க வேண்டுமெனில், இந்த ஆணைக்குழுக்கள் எதற்கு? இது இந்த நாட்டு மக்களுக்கு மேலுமொரு வீண்செலவு இல்லையா? என்ற கேள்வி எமது மக்கள் மத்தியில் எழுகின்றது.

இந்த அரசியலமைப்புப் பேரவையின் செயற்பாடுகள் தொடர்பில் மேதகு ஜனாதிபதி அவர்கள் இதே நாடாளுமன்றத்தில் மிகத் தெளிவாகவே தெரிவித்திருந்தார். அவரது கடுமையான விமர்சனத்திற்கு இந்த அரசியலமைப்புப் பேரவை ஆளாகி யிருந்தது. நாட்டின் தலைவரின் கடுமையான விமர்சனத்திற்கு உட்பட்டுள்ள ஒரு சபையினால் நியமனங்களுக்கான பரிந்துரைகளைப் பெறுகின்றவர்களைக்கொண்ட சுயாதீன ஆணைக்குழுக்களின் சுயாதீனத்தன்மை தொடர்பில் இந்த நாட்டு மக்கள் சிந்தித்துப் பார்க்கமாட்டார்களா? என்ற கேள்வி நியாயமானதாகவே தெரிகின்றது.

அரசியலமைப்புப் பேரவையின் செயற்பாடுகள் தொடர்பில் மக்களுக்குத் தெளிவு இல்லை. சுயாதீன ஆணைக்குழுக்கள் தமக்காக உருவாக்கப்பட்டவை என்ற உணர்வு நாட்டு மக்களிடையே இல்லை. இந்த ஆணைக்குழுக்களுக்குத் தேர்ந்தெடுக்கப்படுகின்ற அதிகாரிகள் எந்த அடிப்படையில் தெரிவுசெய்யப்படுகிறார்கள் என்ற தெளிவு மக்களுக்கு இல்லை. குறிப்பாக, இந்த ஆணைக்குழுக்கள் தமது செயற்பாட்டு ஒழுங்குவிதிகள் தொடர்பில் உரிய சட்டக் கட்டமைப்பிற்குள் தமது அதிகார ஆணையை மிகவும் விரிவுபடுத்திக்கொள்ளல் வேண்டும். பரந்தளவிலான மக்கள் அபிப்பிராயக்கோரலின் பின்னர் வகுக்கப்பட்ட தந்திரோபாயத் திட்டங்கள் மற்றும் நடைமுறைச் சாத்தியமான வேலைத்திட்டங்களையும் கொண்டிருத்தல் வேண்டும். அதேநேரம், அதனது உறுப்பினர்கள் தொடர்பில் மக்கள் மத்தியில் ஆழப் பதிந்துள்ள எண்ணக்கரு குறித்து ஆராய்ந்து பார்க்கவேண்டும். இவையெல்லாம் நடக்கின்றனவா? என்பது கேள்வியாக மட்டுமே இருந்துவிடுகின்றன. தேர்தல்கள் ஆணைக்குழு உறுப்பினர் ஒருவரே "தேர்தல் நடத்தக்கூடாது" எனக்கோரி, ஒரு பக்கச்சார்பாக நீதிமன்றத்தை நாடிச்செல்கின்ற நிலையில், இங்கு சுயாதீன ஆணைக்குழுக்கள் தொடர்பில் எமது மக்கள் எந்த நம்பிக்கையினைக் கொள்ளமுடியும் என்பது குறித்துச் சிந்திக்க வேண்டியுள்ளது.

துறைசார்ந்து மிகத் திறமையாகச் செயற்படுகின்ற நடுத்தர வயதுடைய ஓர் அதிகாரியை இத்தகைய ஆணைக்குழுக்களில் தேடிக்கொள்வதே இன்று சிரமமான காரியமாக இருக்கின்றது. அண்மையில்கூட, 80 வயதினைத் தாண்டியவர்கள் - 83, 85, 87 வயதையுடையவர்கள் - சில ஆணைக்குழுக்களுக்கு ஆணையாளர் களாக நியமிக்கப்பட்டுள்ள நிலையில், ஆணைக்குழுக்களின் செயற்பாடுகள் தாமதமாவதாக முறைப்பாடுகள் எழுப்பப் பட்டிருந்தன. இலஞ்சம் அல்லது ஊழல் பற்றிய விசாரணை ஆணைக்குழுவானது, அது ஆரம்பிக்கப்பட்டு, கடந்த 25 ஆண்டுகளாகச் செயற்பாடின்றிய நிலையில் இருந்துள்ளதாக அதன் பணிப்பாளர் நாயகம் கடந்த வருட இறுதியில் ஊடகங்களில் தெரிவித்திருந்தார். இந்த ஆணைக்குழு ஆரம்பிக்கப்பட்ட காலத்திலிருந்து இதுவரையில் ஒரு பட்டதாரியோ, கணக்காளரோ, நிபுணத்துவம் பெற்ற கணக்குப் பரிசோதகரோ, பொறியிய லாளரோ அதன் விசாரணைக்குழுவில் இடம்பெற்றிருக்க வில்லையென அவர் தெரிவித்திருந்தார். 25 வருடங்களாக அந்த ஆணைக்குழுவுக்கென மக்களின் நிதி வீண்விரயமாக்கப் பட்டுள்ளதென்றே தெரியவருகின்றது. எனவே, இந்த நாட்டில் தற்போதுள்ள பொருளாதார நெருக்கடி நிலைமைகளுக்கு மத்தியில் இத்தகைய வீண்விரயங்களுக்காக மக்களது நிதியினைச் செலவுசெய்யாமல், செலவு செய்யப்படுகின்ற நிதிக்கேற்ப பயன்களை எமது மக்கள் பெறக்கூடிய வகையிலான ஏற்பாடுகள் அவசியமென்பதை இங்கு வலியுறுத்த விரும்புகின்றேன்.

பெயருக்குத் தமிழ் மக்களின் பிரதிநிதிகள் என்று கூறிக்கொண்டு, வாய்வீரம் பேசிக்கொண்டு, எமது மக்களது நிதியை வீணடித்துக்கொண்டு, எமது மக்களுக்குக் கடுகளவேனும் பயனில்லாத வகையில் இருக்கின்ற தமிழ்த் தரப்பினர்போல் இந்த அரச நிறுவனங்களும் இருந்துவிடக்கூடாது. இன்றைய நிலையில், செயற்பாடற்ற அல்லது மக்களுக்கு எவ்விதமான பயன்களும் கிடைக்காத நிறுவனங்களை வைத்துக்கொண்டு பராமரித்துக் கொண்டிருப்பதைவிட, அவற்றுக்கான ஒரு தொகை பணியாளர் களை நியமித்து, ஊதியம் உட்பட அனைத்துச் சலுகை களுக்காகவும் மக்கள் நிதியினை வீண்விரயம் செய்து கொண்டிருப்பதைவிட, இந்த நாட்டைப் பொருளாதார ரீதியில் தூக்கி நிறுத்தக்கூடிய துறைகள் வலுப்படுத்தப்பட வேண்டும்; தூக்கி நிறுத்தப்படவேண்டிய மக்களுக்குக் கைகொடுக்க வேண்டும்.

இந்த வரவு செலவுத்திட்டத்திலே எதிர்பார்க்கின்ற வருமானத்தைவிட இரட்டிப்பான செலவுகளை நீங்கள் எதிர்பார்த்துக் கொண்டிருக்கிறீர்கள். எதிர்பார்க்கின்ற வருமானத்தை எப்படி நீங்கள் ஈட்டப்போகிறீர்கள் என்பது உங்களுக்கும் கேள்விக்குறியாகவே இருக்கும். பல்வேறு கடன் திட்டங்களை நீங்கள் அறிமுகப்படுத்தியிருக்கிறீர்கள். அதனூடாக எமது மக்களையும் கடன்காரர்களாக்கிவிட்டு, நீங்கள் எதிர்பார்க்கின்ற செலவுகளை மேற்கொள்வதற்கு மேலும் கடன் வாங்கப்போகிறீர்கள். மறுபக்கத்தில் மக்களிடமிருந்து வரிகளை எதிர்பார்க்கின்றீர்கள்; அறவிடுகின்றீர்கள். மக்களுக்கு என்ன வருமானங்கள் இருக்கின்றன, வரிகளைச் செலுத்தி, அன்றாட உணவைத் தேடிக் கொள்வதற்கு என்பது பற்றி நீங்கள் ஆராய்வதாக இல்லை. கடன்களையும் வரிகளையும் தவிர்த்து வேறு என்ன வருமான வழிகளை நீங்கள் கொண்டிருக்கிறீர்கள்? என்ற கேள்விக்கு நடைமுறைச்சாத்தியமான பதில் கிடையாது என்றே நினைக்கின்றேன்.

நேற்று நள்ளிரவிலிருந்து எரிபொருட்களுக்கான விலை உயர்த்தப்பட்டிருக்கின்றது. அதனால் இன்று முதல் உணவுப் பொருட்களிலிருந்து பஸ் கட்டணங்கள் வரை மீண்டும் ஒரு சுற்று விலை உயர்வுகள் இந்த நாட்டில் தொடரும் என்பதை விளங்கிக்கொள்ள முடிகின்றது.

இன்று இந்த நாட்டின் முக்கிய ஏற்றுமதிப் பொருளான தேயிலைப் பயிர்ச்செய்கை தொடர்பில் போதிய அக்கறையில்லாத நிலை காணப்படுகின்றது. தோட்டத் தொழிலாளர்கள் கைவிடப்பட்ட நிலையே காணப்படுகின்றது. தோட்டத் தொழிற்றுறைகள் சார்ந்திருந்த மக்கள் பெருமளவில் இன்று அதிலிருந்து விடுபட்டு வெவ்வேறு தொழிற்றுறைகளை நாடிச்சென்று கொண்டிருக்கிறார்கள். இந்த நாட்டின் கல்வித்துறை இன்னமும் நவீன தொழிற்றுறைகளுக்கு ஏதுவான முறையில் இல்லாமல் இருக்கின்ற நிலையில், தேசிய கல்வி ஆணைக்குழுவும் செயற்பட்டு வருவதாகக் கூறப்படுகின்றது. மாகாண சபைத் தேர்தல் தொடர்பாக என்ன செய்வது என்பது தெரியாத நிலையில் தேர்தல்கள் ஆணைக்குழு இயங்கி வருகின்றது. எனவே, இத்தகைய ஆணைக்குழுக்கள் சுயாதீனமாக இயங்குவதற்குரிய வழிவகைகள், குறிப்பாக அரசியல் நோக்கங்கள் அற்ற நியமனங்களின் ஊடாகவும் அரசியல் தலையீடுகள் அற்ற நிர்வாக முறைமையின்கீழும் உறுதிப்படுத்தப்படல் வேண்டும் என்ற விடயத்தை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அத்துடன், இங்கு கௌரவ ஜனாதிபதி அவர்களினதும் கௌரவ பிரதமர் அவர்களினதும் நிதி ஒதுக்கீடுகள் தொடர்பிலும் கூறப்பட்டுள்ளது. கௌரவ ஜனாதிபதி அவர்களின்கீழான நிதி ஒதுக்கீடுகள் கடந்த காலங்களிலிருந்து இந்த நாட்டின், நாட்டு மக்களின் நலன் கருதிய பல்வேறு பணிகளுக்காகப் பயன்படுத்தப்பட்டு வருவதை அவதானிக்க முடிகின்றது. குறிப்பாக, அவர் செல்கின்ற இடங்களில் மக்களால் முன்வைக்கப் படுகின்ற பல்வேறு தேவைகளை அவர் காலதாமதமின்றி நிறைவேற்றி வருவதை நாம் அவதானிக்கின்றோம். அந்த வகையில், அவரது மேற்படி பணிகளை வரவேற்பதுடன், அவரது மக்கள் நலன் சார்ந்த பணிகள் மேற்படி நிதி ஒதுக்கீட்டின் ஊடாக மேலும் சிறக்க வேண்டும் எனத் தெரிவித்து, இந்தச் சந்தர்ப்பத்துக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.20]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - State Minister of Mahaweli Development and Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම සතුටු වෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වැය ශීර්ෂය විවාදයට ගන්නා වේලාවේ වචන ස්වල්පයක් කථා කිරීමට පොඩි වේලාවක් හෝ ලබා දීම ගැන. රටක් සංවර්ධනය කරන්න නම් අල්ලස සහ දූෂණය මැඩලන්නම ඕනෑ. එහෙම නැතිව අපි සංවර්ධනය ගැන කථා කරන එකේ තේරුමක් නැහැ. ඒක හරියට හිල් තිබෙන කළයකට වතුර පුරවනවා වාගේ වැඩක්. මොකද, හිල් වුණු කළයකට වතුර පුරවන්නට බැහැනේ. අපේ රටේ ඉතිහාසයේ වෙලා තිබුණේත් ඕකම තමයි. කවුරු සංවර්ධනය කළත්, සංවර්ධනය කියා කථා කළත් ඒවා සියල්ල ගඟට ඉනි කපනවා වාගේ වුණා. මොකද, අල්ලස - දූෂණය රජවෙලා තිබුණු කාලයක් මේ රටේ තිබුණේ.

විශේෂයෙන්ම අපි කියනවා, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවත් වැඩ කළේ නැත්තේ නැහැ, වැඩ කළා. වරාය හැදුවා, ගුවන් තොටුපොළ හැදුවා, විදුලි බලාගාර හැදුවා, අධිවේගී මාර්ග හැදුවා, පාර කාපට් කළා. ඒවා කරලාත් ඇයි මේ රට ආර්ථික ප්‍රපාතයකට

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

කඩාගෙන වැටිලා තිබෙන්නේ, එහෙම නැත්නම් ඇයි ණය ගෙවා ගන්න බැරි රටක් බවට පත්වෙලා තිබෙන්නේ? එහෙම නැත්නම් ඇයි අවුරුදු 12ක් රට කරවන්නට ආපු නායකයා අවුරුදු 12ක් කරන්නට බැහැයි කියා අවුරුදු 10ක් කර රාජ්‍යය දමා පැනලා ගියේ? අපි ඒ ගැන හිතන්නට ඕනෑ. ඒ වාගේම, මානව හිමිකම් කඩන රටක් වශයෙන් අපව බලගතු රටවල් ප්‍රතික්ෂේප කළේ ඇයි? ඒ වාගේම සුළු පොලියකට ණය අරගෙන වැඩ කළ අපට අධික පොලියක් ගෙවන්නට සිද්ධ වුණේ ඇයි? ඒ වාගේම, උගතුන් - බුද්ධිමතුන් මේ රට හැරදමා ගියේ ඇයි? අපේ රටේ දුප්පත් අහිංසක මිනිසුන්ගෙන් වක්‍ර බදු වශයෙන්, පික්පොකට් ගහන බදු වශයෙන් සියයට 82ක් අය කර සියයට 18ක් වාගේ සුළු ප්‍රමාණයක් ආදායම් උපයන්නන්ගෙන් අය කරන්නට සිද්ධ වුණේ ඇයි? "වංචා කළ මැති ඇමතිවරුන්ගේ ෆයිල් ටික මගේ කිහිල්ලේ තමයි ගහගෙන ඉන්නේ. අවශ්‍ය වෙලාවට මම අදිනවා." කියමින්, හිටපු ජනාධිපතිවරයා ඒ අය නිශ්ශබ්ද කරන්නට ඒ ෆයිල් පාවිච්චි කළේ ඇයි?

අගවිනිසුරුවරයා විශ්‍රාම ගිහිල්ලා, "Helping Hambantota" ගිණුමෙන් මුදල් වංචා කිරීම සම්බන්ධයෙන් හිටපු අගමැතිවරයාව සිරගත නොකිරීම ගැන ජාතියෙන් සමාව ඉල්ලන ප්‍රකාශයක් නිකුත් කළේ ඇයි? ඒ වාගේම, 2014 වෙනකොට මේ රට කළු සල්ලි සුදු කරන රටක් බවට පත්වෙලා, යුරෝපීය පාර්ලිමේන්තුව අපිව අළු ලේඛනයට - Grey List එකට - ඇතුළු කළේ ඇයි?

මේ වාගේ දේවල් දෙස බැලුවාම පෙනෙන්නේ මොකක්ද? කුමන පුද්ගලයා, කුමන නායකයා රට ගැන හිතලා කටයුතු කළත් ඒ තැනට රට ගෙන යන්න බැරිවෙලා තිබෙන හේතුව තමයි මේ රටේ අල්ලස සහ දූෂණය රජ වීම. විශේෂයෙන්ම දේශපාලනඥයන් කොටසක්, එහෙම නැත්නම් ප්‍රබල රාජ්‍ය නිලධාරින් කොටසක් ඉවක් බවක් නැතිව, ලයිසන් ගත්තා වාගේ මේ රටේ මහජන මුදල් ගසා කෑම කරගෙන ගිය කාලයක් තිබුණු නිසා තමයි එදා ඉඳලා අපේ රට මේ තත්ත්වයට පත් වුණේ. මේවා වහගන්න හරි ලේසියි. මාධ්‍ය සංදර්ශන පවත්වා, ඒ අය කැමැති තැන්වලට මාධ්‍ය සංදර්ශනවලින් මිනිසුන්ව යොමු කරනවා. එහෙම නැත්නම් රටේ කෑ ගහන ජනතාවට මොනවා මොනවා හෝ දීලා, එක්කෝ මැෂින් දීලා, රෙදි දීලා ඔවුන්ව වහලුන් බවට පත් කරගත් යුගයක් තිබුණා. එතකොට මේ සමාජය මේක දකින්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අල්ලස, දූෂණය, වංචාව රජවෙලා තිබෙනවා, මේ රටට යහ පාලනයක් අවශ්‍යයි, එහෙම නැතුව මොන දේ කළත් මේ රට දියුණු කරන්න බැහැයි කියා අපි එදා ඉඳලා කෑ ගැහුවා. අපේ වාසනාවකට, ජාතියේ වාසනාවකට 2015 ජනවාරි 08 දා ජනතාව මෙය තේරුම්ගෙන, කන්න ඉල්ලා නොවෙයි, රක්ෂා ඉල්ලා නොවෙයි, මේ රටේ යහ පාලනයක් ඇති කරන්න කියා, මේ රටින් වංචාව, දූෂණය තුරන් කරන්න කියා ඉල්ලීමක් කර එවකට තිබුණු ආණ්ඩුව පෙරළන්න කටයුතු කළා. ජනතාව එය තේරුම් ගැනීම ගැන අපි සතුටු වෙනවා. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා 2019 වර්ෂය දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක් නිර්මාණය කරන්න ප්‍රතිඥා දීම ගැනත් අපට සතුටු වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1994දී තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්ථාපිත කළේ. අපි දන්නවා, කොමිෂන් සභාව ස්ථාපිත කළත් කොමිෂන් සභාව විසින් හඳුනා ගන්නා ලද වැරදි සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ බලය ඉවත් කර තිබුණු බව. නමුත් දින සියයේ ආණ්ඩුව එනවාත් සමඟම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156අ.(2) යටතේ කොමිෂන් සභාවට තමා විසින්ම විමර්ශනය ඇරඹීමේ බලය ලබා දී තිබෙනවා. යහ පාලන ආණ්ඩුව පත් වුණා විතරයි, අපි ඒ ප්‍රගතිය අත්කර දුන්නා; කොමිෂන් සභාව යම් මට්ටමකින් ශක්තිමත් කර දුන්නා.

ඒ ශක්තිමත් කිරීම තුළින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වත්මන් රජය අල්ලස් හෝ දූෂණ මර්දන ක්‍රියාවලිය ශක්තිමත් කළාය කියන එක සංඛ්‍යා ලේඛනවලින් පෙන්නුම් කරන්න පුළුවන්. 2005 සිට 2010 දක්වා බැලුවොත්, මේ රටේ අල්ලස්, දූෂණ වැරදිවලට වැරදිකරුවන් වෙලා තිබුණේ අවුරුද්දකට සාමාන්‍යයෙන් 15ක් - 20ක් අතර ජනතාවක්. හරියට ඒ කාලයේ හොරකම් සිදු වුණේ නැහැ වාගෙයි. නමුත් 2017දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට 57දෙනෙකු වැරදිකරුවන් බවට පත් කරන්න හැකියාව ලැබුණා. 2018දී 64දෙනෙකු වැරදිකරුවන් බවට පත් කිරීමේ හැකියාව ලැබුණා. ඒ කියන්නේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත්වෙලා තිබෙනවාය කියන එකයි. හැබැයි, එදා අවුරුද්දකට වැරදිකරුවන්වෙලා තිබුණේ 15ක් - 20ක් අතර ජනතාවක් කියා කිව්වත්, ඒ අහුවුණේ හාල්මැස්සන් විතරයි, තෝරුන් මෝරුන් අහුවුණේ නැහැ.

නිකම් මකුළු දැලක් වාගේ තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තිබුණේ. පොඩි මිනිහෙක් අහු වෙනවා. ලොකු මිනිසුන් දැල කඩාගෙන යනවා. ඒ වාගේ කාලයක් තිබුණේ. විශේෂයෙන්ම පසුගිය දවස් දෙස බැලුවොත්, 50කට ආසන්න සංඛ්‍යාවක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දැලට අසු වුණා. විශේෂයෙන්ම අලුත් ආණ්ඩුව, යහ පාලන ආණ්ඩුව පැමිණීමෙන් පස්සේ ඇමතිවරු, අභියාචනාධිකරණ විනිසුරුවරු, සංස්ථා සභාපතිවරු වැනි ප්‍රබල පුද්ගලයන් මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දැලට අහුවෙන්න පටන් ගත්තා. ඒක ස්වාධීන කොමිසමක් වශයෙන් ශක්තිමත් වීම නිසා බය නැතුව ඒ රාජ්‍ය නිලධාරින් වැඩ කරන්න පටන් ගත්තා. ඒ වාතාවරණය අපට නිර්මාණය කර දෙන්න පුළුවන් වුණා.

අපි දැක්කා, පසුගිය දවස්වල ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රධානී පවා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දැලට අහු වුණා. නමුත් ඒ අවස්ථාවේදී ජනාධිපතිවරයා කොපමණ නිහතමානි වුණා ද? හිටපු ජනාධිපතිතුමා තමුන්ගේ ගෝලයා වැරද්දකට අහුවුණාම බේරාගන්න හෙලිකොප්ටරයෙන් ගියා. නමුත් වර්තමාන ජනාධිපතිතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අල්ලස හා දූෂණය පිටු දකින පුද්ගලයෙක් හැටියට තමුන්ගේ කාර්ය මණ්ඩල ප්‍රධානියා අල්ලසට දූෂණයට හසු වුණත්, තමුන්ගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට හසු වුණත් බේරාගන්න ගියේ නැහැ. අදාළ නීතිය ක්‍රියාත්මක කරන්න දීලා ඔවුන්ට පාඩම ඉගෙන ගන්න දුන්නා. අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ වාගෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, 2008 ඉඳන්ම බිලියන 1,000කට වඩා හොරකම් කරගෙන, හොරකම් කරගෙන ආපු මහ බැංකු බැඳුම්කර සිද්ධිය 2015දී නැති කරන්න අපට පුළුවන්කම ලැබුණ බව. ගරු අග්‍රාමාත්‍යතුමාට මොන මඩ ප්‍රහාර එල්ල වුණත්, මොන ගල්මුල් එල්ල වුණත්, ගරු අග්‍රාමාත්‍යතුමා සාක්ෂි දීලා මේ හොරුන් නීතියේ රැහැනට හසුකර ගැනීම සඳහා අවශ්‍ය සහාය, අවශ්‍ය වටපිටාව සකස් කර දී තිබුණා. [බාධා කිරීමක්]

විශේෂයෙන්ම අපි දකිනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල් සරත් ජයමාන්න මැතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය බොහොම

ක්‍රියාකාරීව, බොහොම ශක්තිමත්ව මේ කටයුතු කරගෙන යන බව. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු අමාත්‍යතුමිය මේ හැමෝම එකතුවෙලා දූෂණය නැති, අල්ලස නැති රටක් නිර්මාණය කිරීම සඳහා කටයුතු කිරීම නිසා අපට රටේ අනාගතය ගැන බලාපොරොත්තු තියන්න පුළුවන්. ඒ වාගේම විශේෂයෙන්ම කියනවා, පොලිස් නිලධාරින් 25 දෙනෙකු තමයි මේ වැටලීම් කටයුතු කිරීම සඳහා මෙතෙක් සිටියේ. නමුත් වර්තමානයේ නීතිරීති සංශෝධනය කරමින් විශේෂයෙන්ම විමර්ශන කටයුතු සඳහා විශේෂඥ නිලධාරින් බඳවා ගැනීමට කැබිනට් අනුමැතිය ලැබුණා. ඒ අනුව, ගණකාධිකාරිවරු, මූල්‍ය විශ්ලේෂකයන්, ඩිජිටල් විමර්ශන කටයුතු කරන්න පුළුවන් අය, ආරක්ෂණ කටයුතු කරන අය, බැංකුකරණය, ජාත්‍යන්තර සම්මුතීන්, ප්‍රසම්පාදන, ඉදි කිරීම්, ඉංජිනේරු විද්‍යාව, කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය යන සුවිශේෂ ක්ෂේත්‍රවල විශේෂඥවරුන් මේ කොමිෂන් සභාවට බඳවා ගැනීමට වර්තමානයේ හැකියාව ලැබිලා තිබෙනවා. 200ක පිරිසක් බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබෙනවා. ඒ වාගේම අපි මෙතෙක් කල් කළා වාගේ අල්ලස, දූෂණය කරන කෙනා අල්ලා ගන්නවා කියන එක විතරක් නොව එතැනින් ඔබ්බට ගිහිල්ලා අල්ලස, දූෂණය නිවාරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමටත් දැන් කටයුතු සලසා තිබෙනවා. ඒ සඳහා නිලධාරින් 50 දෙනෙක්, මේ රටේ අල්ලස, දූෂණය තුරන් කිරීම සඳහා අවශ්‍ය නිලධාරින් 50ක් අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් කියනවා, නැවත පනත සංශෝධනය කරන්න, අලුත් අලුත් ක්‍රම හදන්න කියා. මේ රටේ අල්ලස දූෂණය මැඩලීම ප්‍රධාන කටයුත්තක් සේ සලකා කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගැනීම ගැන විශේෂයෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සරත් ජයමාන්න මැතිතුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම මා විශ්වාස කරනවා, අපේ රටේ ජනතාවගෙන් ගන්නා බදු ප්‍රමාණය සාර්ථක විධියට යොදාගෙන අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන රටක් වුණොත් අපට මේ රට දියුණු කරන්න පුළුවන් බව. නව රජය මේ නිවාරණ කටයුතු සඳහා පහසුකම් සැලසීමට මිලියන 100ක් ලබාදීලා තිබෙනවා. ඒ සඳහාත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ඔබතුමාට.

මීළඟට, ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.30]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එච්.ආර්. සාරථී දුෂ්මන්ත මැතිතුමාගේ විනාඩි 10ක කාලයත් මට ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය සමඟ ආයතන ගණනාවක වැය ශීර්ෂ විවාදයට ගන්නවා. මම මුලින්ම කියන්නට ඕනෑ, අජිත් මාන්නප්පෙරුම රාජ්‍ය ඇමතිතුමා කියූ කාරණාවලට මම එකඟ වෙනවා කියා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වර්තමානයේ කටයුතුත්, මීට පෙර කටයුතුත් දිහා බැලුවාම වර්තමානයේ ඉතාමත් හොඳින් යම් දර්ශනයක්, ඉදිරි දැක්මක් ඇතිව යම් වැඩ පිළිවෙළක් අනුව ක්‍රියාත්මක වන වග පෙනුණා. හැබැයි, එහෙම ක්‍රියාත්මක වන ආයතනයකට මුදල් අමාත්‍යාංශයේ සැලකිල්ල නම් ඒ විධියටම ලැබී නැහැයි කියන කාරණයත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

අපි දන්නවා, මෑතක් වනතුරුම නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරුන්ට ගෙවූ වැටුප් තල බොහොම පහළ මට්ටමක තිබුණු බව. හැබැයි, ඒ අයගේ වැටුප් තල වැඩි කළාට පස්සේ දක්ෂ නීතිඥවරු ගණනාවක් නීතිපති දෙපාර්තමේන්තුවට ඇතුළු වුණා. දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරිනුත් නිකම් ඔහේ බඳවා ගැනීම් කළ යුතු වන්නේ නැහැ. අපි දන්නවා, වර්තමාන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා පත් වුණාට පස්සේ නිකම් නඩු දැමීම විතරක් නොවෙයි කරන්නේ කියලා. නමුත්, බොහෝ නඩුවල ඒ චෝදනාවට ලක්වන විත්තිකරුවන් පෙර පැවැති නඩු හා බලන කොට අද වැරදිකරුවන් මට්ටමට ගෙන එන්න මේ කොමිෂන් සභාවට හැකියාව ලැබී තිබෙනවා, ඒ දක්ෂ නිලධාරින් බඳවා ගත් නිසා. එම නිසා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරින්ට ගෙවන වැටුප් තලත්, නීතිපති දෙපාර්තමේන්තුවේ වාගේම වැඩි කිරීමට ලක් කළොත් හොඳයි. හැබැයි, එහෙම ලක් කිරීමේ වුවමනාවක් මුදල් අමාත්‍යාංශයට තිබෙන බව පෙනෙන්නේ නැහැ. මොකද හේතුව, මෙවර අය වැයෙන් මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දූෂණ නිවාරණ කටයුතු සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 100යි. ඒකට වෙනත් දෙපාර්තමේන්තුවක් හා සමානව සලකා මුදල් වෙන් කිරීම කරන්න එපා. මේක විශේෂ ආයතනයක් හැටියට සලකා ඒ මුදල් වෙන් කිරීම කරන්න ඕනෑය කියන කාරණය මම කියනවා. උදාහරණයක් හැටියට ගත්තොත් හොං කොං රාජ්‍යයේ ජනගහනය මිලියන 6යි; විමර්ශන නිලධාරින් 1,000ක් ඉන්නවා; ජාතික ආදායමෙන් සියයට 0.282ක් වෙන් කරනවා, මේ කොමිෂන් සභාවට. හැබැයි, අපේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට වෙන් කරන්නේ ජාතික අය වැයෙන් 0.014යි. එම නිසා ඒ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂතුමා ඇතුළු නිලධාරින් කොපමණ උත්සාහ කළත්, නිවැරදි දර්ශනයක් ඔස්සේ; යම් සැලැස්මක් ඔස්සේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කරමින්, හාල්මැස්සෝ නොවෙයි, තෝරු මෝරුත් අල්ලා ගනිමින් ඒ අය වැරදිකරුවන් කිරීමේ තත්ත්වයට ගෙන එන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ඉටු කරන්න මහා භාණ්ඩාගාරය ඇතුළු මුදල් අමාත්‍යාංශය ඒ කොමිෂන් සභාවට දක්වා තිබෙන්නේ කුඩම්මාගේ සැලකිල්ලක්ය කියන එක මම මතක් කරන්න ඕනෑ. මොකද හේතුව, මේ විෂය සම්බන්ධයෙන්, මේ දූෂණය හා වංචාව පිටුදැකීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා ඉතාම ඕනෑකමින් සහ කැපවීමෙන් කිසිම මැදිහත්වීමකින් තොරව කටයුතු කරන නිසා. අර කිව්වා වාගේ එතුමාගේම ජනාධිපති ලේකම් කාර්යාලයේ Chief of Staff අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අල්ලා ගත් වෙලාවේ කිසිම මැදිහත්වීමකින් තොරව ඒ කොමිෂන් සභාවට අවශ්‍ය කටයුතු කරන්න එතුමා ඉඩ දුන්නා. එම නිසා නිකම් කටින් විතරක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට උදවු කරනවා කියමින්, ඒ ගොල්ලන් ලබා ගෙන තිබෙන ප්‍රතිඵල අරගෙන ඒවා කොඩියක් ලෙස වනමින් ඒකෙන් දේශපාලන වාසි ගන්නවා වෙනුවට ඒ ආයතනයට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වැඩි වැඩියෙන් ලබා දෙන්න කියන ඉල්ලීමත් මේ වෙලාවේ මම කරන්න කැමැතියි.

ඊ ළඟට, අද අපි විවාද කරන වැය ශීර්ෂ අතර තිබෙන තව ආයතනයක් තමයි, මැතිවරණ කොමිෂන් සභාව. අපේ රටේ

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

තිබෙන මැතිවරණ කොමිෂන් සභාවේ වර්තමාන සභාපතිතුමා තමයි, මම දන්නා විධියට මැතිවරණ දෙපාර්තමේන්තුව විධියට තිබෙන කාලයේ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙකු හැටියට සිටියේ. මැතිවරණ වෙලාවට පවත්වන්න, මැතිවරණ පවත්වන කාලවල කිසිම බලපෑමකින් තොරව මැතිවරණයට ජනතාව ගෙන්වා ගන්න විශාල වැඩ කොටසක් කරපු මැතිවරණ කොමසාරිස් ජනරාල්තුමා, මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති වුණාට පස්සේ එතුමාට මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් කටයුතු කළ කාලයේ කරන්න තිබුණු කාර්ය භාරය කරන්න හැකියාව ලැබුණේ නැහැ. ඒකට එක හේතුවක් විධියට මට පෙනෙන දෙයක් තිබෙනවා. මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ඉන්නවා, මැතිවරණ එපාය කියලා උසාවි යන. මැතිවරණ කොමිෂන් සභාව තිබෙන්නේ මැතිවරණ පවත්වන්නයි. ඒ කොමිෂන් සභාවේම ඉන්නවා, ස්වාධීන යැයි කියා ගන්නා සාමාජිකයෙක්, මැතිවරණ එපා කියලා උසාවි යන. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා, මැතිවරණ කොමසාරිස් ජනරාල්තුමා හැටියට සිටි කාලයේ බොහොම දක්ෂතම මැතිවරණ කොමසාරිස් හැටියට ලබා ගත්තා වූ ඒ අභිමානය නැති කර ගන්න හේතුවක්ද කියන්න මම දන්නේ නැහැ, මැතිවරණ එපාය කියලා කකුලෙන් අදින කෙනෙක් මැතිවරණ කොමිෂන් සභාවේම සිටීම.

එම නිසා තමයි, අපි දිගින් දිගටම කියන්නේ ස්වාධීන කොමිෂන් සභා කියන සංකල්පය ඉතාම හොඳ සංකල්පයක් කියලා. හැබැයි, ඒ සංකල්පය ඉදිරිපත් කළාය කියලා ඒ කොඩිය වැනුවාට වැඩක් වෙන්නේ නැහැ, ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කරන්න පෙර තිබුණු ඒ ආයතනවල ක්‍රියාකාරිත්වයයි, ඒ ක්ෂේත්‍රවල ක්‍රියාකාරිත්වයයි සිද්ධ වන්නේ නැත්නම්. එම නිසා අපට පෙනෙනවා, මැතිවරණ කොමිෂන් සභාව ඇතුළු වර්තමාන ස්වාධීන කොමිෂන් සභාවල තත්ත්වය ගත්තාමත්, ඒ වාගේම අධිකරණ ක්ෂේත්‍රය ගත්තාමත් ඊට පෙර තිබුණු ස්වාධීනත්වය සහ ඊට පෙර තිබුණු ක්‍රියාකාරිත්වය දැන් නැති වෙලා තිබෙන බව. ඒකෙන් හැඟෙන්නේ මොකක්ද? ඒකෙන් හැඟෙන්නේ ස්වාධීන කොමිෂන් සභා කියන නම ගැහුවාට ඊට පෙර තිබුණු ක්‍රියාකාරී තත්ත්වයට ගෙන එන්න අවශ්‍ය නියාමනය, එහෙම නැත්නම් අවශ්‍ය පහසුකම් දෙන එකේ මොකක් හරි අඩුවක් තිබෙනවාය කියන කාරණයයි. එම නිසා තමයි, ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තු සභා ගර්භයට ඇවිල්ලා විශේෂයෙන්ම අධිකරණ ක්ෂේත්‍රයේ විනිශ්චයකාරවරුන් පත් කිරීමේදී ඇති වෙලා තිබෙන ඒ අකරතැබ්බය, ඒ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට ගරු කථානායකතුමාගේ සභාපතිත්වයෙන් යුක්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව දැනුවත් කළේ. නමුත් ඒක ගරු කථානායකතුමා ගත්තේ වෙනත් දේශපාලන කෝණයකින්. එම නිසා අද ඒ සම්බන්ධයෙන් ජනාධිපතිතුමාට ලියුම් ලියමින් දේශපාලන වශයෙන් ගනුදෙනුවකට කථා කරනවා මිනා, ඒ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න ක්‍රියාත්මක වන බවක් පෙනෙන්න නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන බලමු. අද මේ සභාවේ කථා කළ මන්ත්‍රීවරු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන මහා උජාරුවෙන් කථා කළා. හැබැයි, අතිගරු ජනාධිපතිතුමාත්, එතුමාගේ පක්ෂයත්, එතුමාගේ පක්ෂයත් සමඟ සිටි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරුනුත් එදා ඡන්දය දුන්නේ නැත්නම්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්න වෙන්නේ නැහැ. අද ජනාධිපතිතුමාට කොපමණ දොස් කිව්වත්, මේ සභාවේ සිටින එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට අමතක වෙලා තිබෙනවා, මන්ත්‍රීවරු 44දෙනෙකු පමණක් හිටපු එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ කෙනෙකුට තමයි ජනාධිපතිතුමා 2015 ජනවාරි මාසයේ 9 වෙනි දා අගමැතිකම දුන්නේ කියලා. එතකොට ජනාධිපතිතුමා හරිම ෂෝක්; එතකොට ජනාධිපතිතුමා හරිම ප්‍රජාතන්ත්‍රවාදීයි; එතුමා තරම් හොඳ කෙනෙක් ඇත්තේම නැහැ. අද ඒ පැත්තේ සිටියාට මම මේ කියන කාරණය ගරු ෆවුසි ඇමතිතුමාට මතක ඇති. ජනාධිපතිතුමා එදා ජනාධිපති ධුරයේ දිවුරුම් දෙනකොට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු විධියට සිටියේ 44දෙනායි. එදා විපක්ෂය විධියට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු160කට ආසන්න පිරිසක් සිටියා. හැබැයි, ජනාධිපතිතුමා එදා මන්ත්‍රීවරු 44දෙනෙකු හිටපු යූඑන්පී එකේ නායකයා වුණු රනිල් වික්‍රමසිංහ මහතාට අගමැති ධුරය දුන්නා. එතකොට ජනාධිපතිතුමා හරිම ප්‍රජාතන්ත්‍රවාදීයි; එතුමා තරු පහේ ප්‍රජාතන්ත්‍රවාදියා; බුලට් එක. හැබැයි, එක්සත් ජනතා නිදහස් සන්ධානය ජාතික ආණ්ඩුවෙන් ඉවත් වෙලා කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු සංඛ්‍යාව 30ට අඩුවන්න ඕනෑ නිසාත්, එහෙම නොවුණොත් අමාත්‍ය මණ්ඩලයේ පැවැත්ම නිතැතින්ම නවතින කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අනිවාර්යයෙන් අලුත් අගමැතිවරයෙක් පත් කරන්න ඕනෑය කියන ඒ නීතිමය වගන්තිය තියෙද්දි ඒ නීතිය ක්‍රියාත්මක කරන්න ගියාම මන්ත්‍රීවරු 95දෙනෙකු සිටින මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති කළාම එතුමා ප්‍රජාතන්ත්‍රවාදී නැහැ. මේක තමයි මට නොතේරෙන ප්‍රශ්නය. එම නිසා හැම දෙයක් දිහාම දේශපාලන කණ්ණාඩි දමා බලන්න එපා. ශ්‍රේෂ්ඨාධිකරණය වුණත් තීන්දු කළේ ජනාධිපතිතුමා විසින් මහින්ද රාජපක්ෂ මැතිතුමාව අගමැති හැටියට පත් කිරීම වැරදියි කියලා නොවෙයි. අධිකරණයේ විනිශ්චයට ලක් වුණේ පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වන්න එතුමා ගත් තීන්දුවයි. එහෙම නැතිව එක්සත් ජනතා නිදහස් සන්ධානය ජාතික ආණ්ඩුවෙන් ඉවත් වීමත් එක්ක අමාත්‍ය මණ්ඩලයේ පැවැත්ම නැවතීම හරහා අලුත් අගමැති කෙනෙකු පත් කිරීම කියන කාරණය නොවෙයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයට ලක් වුණේ කියන කාරණය මේ කාටත් අමතක වෙලා තිබෙනවා. එම නිසා මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන් ඒ වෙලාවේ කළේ මන්ත්‍රීවරු 44ක් ඉඳලාත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති කළාටත් වඩා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන වගන්ති ක්‍රියාත්මක කිරීම විනා වෙනත් කාරණයක් නොවේය කියන කාරණය මම කියන්න ඕනෑ, අතිගරු ජනාධිපතිතුමාට කරන සාධාරණත්වයක් හැටියට.

ඊ ළඟට, අද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන පුන පුනා ප්‍රශංසා කරන එක්සත් ජාතික පක්ෂයට අමතක වෙලා තිබෙනවා, එදා ඒ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරලා "ආ! අපි තමයි ඒක කළේ" කියලා කොඩිය වනන්න පුළුවන් වුණේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු 160දෙනාගේම සහයෝගය ලැබුණු නිසාය කියන කාරණය. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු එක්සත් ජනතා නිදහස් සන්ධානයත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව අත ඉස්සුවේ නැත්නම්, අද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් නැහැ. එක්සත් ජාතික පක්ෂයට අද ඒක අමතක වෙලා තිබෙනවා.

ඒ නිසා මම කියන්න හදන්නේ මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වෙලාවේ අපි කථා කළ යුතු වන්නේ තමතමන්ට වාසි වන ආකාරයට යම් යම් දේවල් දිහා බලලා නොවෙයි. විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳ ප්‍රශ්නය දැන් ආපසු කරළියට ඇවිල්ලා තිබෙනවා. මම මීට පෙරත් -සම්මුතිවාදී ආණ්ඩුවේ කොටස්කරුවෙකු හැටියට ඉන්න කොටත්- කියලා තිබෙනවා, තුනෙන් දෙකෙන් සම්මත කර ගන්න පුළුවන් කාරණා සම්මත කරගෙන, විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳව අපිට මැද මාවතකට එන්න පුළුවන් නම් මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් කියලා. ජනතා විමුක්ති පෙරමුණෙන් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැටියට සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා.

නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත් මට පස්සේ කථා කරන්න නියමිතයි. ඒ සංශෝධනය තුළ මට තිබෙන්නේ ගැටලු දෙකයි. ඉන් එක් ගැටලුවක් වන විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැටියට ජනතා විමුක්ති පෙරමුණෙන් ගෙනැල්ලා තිබෙන සංශෝධනය තුළ තිබෙන විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ කටයුත්ත ගැන පමණයි මම කථා කරන්නේ. හැබැයි, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එක්ක, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන කොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි ඉල්ලපු පරණ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ගැට ගැහුවා නම් Twenty20 ගහන්න පුළුවන් කියලා පක්ෂයක් හැටියට නොව මම පෞද්ගලිකව කල්පනා කරනවා. ජනතා විමුක්ති පෙරමුණේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම විතරයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන වෙලාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපිට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, 44 දෙනාගේ කණ්ඩායමෙන් හැදිච්ච ඒ ආණ්ඩුවේ අගමැති රනිල් වික්‍රමසිංහ මහත්තයාත් පොරොන්දු වුණා, "මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමට විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනවා"ය කියලා. ඒ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි, මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි එකට ගැට ගැහිච්ච යම් සංශෝධනයක් එනවා නම් -ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතය මම දන්නේ නැහැ- ඩිලාන් පෙරේරා හැටියට මම පාර්ලිමේන්තුවේදී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාට පක්ෂව අත උස්සනවා. ඒ කාරණය මම කිසි ගැටලුවක් නැතිව කියන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණෙන් ගෙනාපු විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ ජයම්පති වික්‍රමරත්න මහත්මයා කථා කරන ආකාරයේ දේශපාලන game එකක් මට පෙනෙන්නේ නැති නිසායි මම ඒ වෙනුවෙන් අත උස්සන්නේ. ජයම්පති වික්‍රමරත්න මහත්තයලා දිගටම කළේ දේශපාලන game එකක්.

ජයම්පති වික්‍රමරත්න මහත්තයලා අද ඇවිල්ලා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන පාරම් බෑවාට, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න කියලා කිව්වාට, එතුමන්ලා කළේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන මුවාවෙන්, විධායක අගමැතිකම පස්ස දොරෙන් එක්සත් ජාතික පක්ෂයට ගන්න කරපු කූට කුමන්ත්‍රණයකුයි. එවැනි කුමන්ත්‍රණයක් කළා මිසක් විධායක ජනාධිපති ක්‍රමය ඇත්තටම අහෝසි කිරීම සඳහා එක් පුද්ගලයෙකු වටා ඒකරාශී වන බලය අහෝසි කරන්නට එතුමන්ලා උත්සාහ කළේ නැහැ.

විවිධ රාජ්‍ය නොවන සංවිධාන අටවාගෙන, ඒ රාජ්‍ය නොවන සංවිධානවලට තමන්ගේ දරුවනුත් දාගෙන, ඒ අයට ඩොලර් හා පවුම්වලින් විශාල මුදල් කුට්ටි ගෙවාගෙන ගහපු game එකක් තමයි ජයම්පති වික්‍රමරත්න මහත්තයලා කළේ. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණට විවිධ දේශපාලන වුවමනා තිබෙන්න පුළුවන්. මටත් ජනතා විමුක්ති පෙරමුණ එක්ක සමහර දේශපාලන කාරණා සම්බන්ධයෙන් ගැටලු තිබෙනවා. හැබැයි, මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ ජයම්පති වික්‍රමරත්න මහත්තයලා ගහපු game එක මට පෙනෙන්න නැහැ. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි වුණාට පස්සේ තිබෙන මැතිවරණ ක්‍රමය, මේ මැතිවරණ ක්‍රමයම නම් එහෙනම් පාර්ලිමේන්තුව දුර්වල පාර්ලිමේන්තුවක් වීම තමයි මේකේ තිබෙන අඩුපාඩුව. මේ මැතිවරණ ක්‍රමය එක්ක කාටවත් ශක්තිමත් පාර්ලිමේන්තුවක් හදන්න බැහැ. විධායකයත් නැතිව පාර්ලිමේන්තුවත් දුර්වල වුණොත් ඉතාලියේ වාගේ අපිට අවුරුද්දෙන් අවුරුද්ද මැතිවරණ පවත්වන තත්ත්වයකට යන්න සිදු වේවි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි යෝජනා කරපු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන වෙලාවේ අපිට පොරොන්දු වෙච්ච මැතිවරණ ක්‍රමය, වර්තමානයේ තිබෙන විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එක්කහු කරන්න පුළුවන් නම් අපිට Twenty20 match එකක් ගහලා වැඩේ ඉවර කර ගන්න පුළුවන්. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතය නොවෙයි මේ කියන්නේ. මගේ පක්ෂය මට මොන නීතිය දැම්මත්, මැතිවරණ ක්‍රමයත් එක්ක ඒකාබද්ධ වෙච්ච විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාවක් ආවොත් මම පෞද්ගලිකවම ඒකට අත් දෙකම උස්සනවා. මම පක්ෂයේ නීතිය සියයට සියයක් ක්‍රියාත්මක කරන කෙනෙක් නොවෙයි. ඊයේත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙන්න ඕනෑය කියලා අපේ කණ්ඩායම් රැස්වීමේදී තීන්දු කළා. නමුත් හවස් වනකොට ඡන්දය දීමෙන් වැළකී ඉන්න අපේ පක්ෂය තීන්දුවක් ගත්තා. නමුත් මමත්, ගරු ලක්ෂ්මන් පෙරේරා මන්ත්‍රීතුමාත්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියත්, ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මන්ත්‍රීතුමාත් -අපි- පක්ෂයේ තීරණයට එරෙහිවෙලා, මේ අය වැයට විරුද්ධව ඡන්දය දුන්නා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හරි මඟට ගන්නට අපි කටයුතු කරනවා. එහෙම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හරි මඟට ගන්න බැරි නම් පක්ෂයට එරෙහිව වුණත් ගිහිල්ලා -ඊළඟට එන මැතිවරණයෙන් ගෙදර යන්න සිද්ධ වුණත් - ජනතාව වෙනුවෙන් තීන්දු ගන්නට මම පසුබට වෙන්නේ නැහැ.

අද මේ රටේ ජනතාව ඉල්ලා සිටින්නේ, පැහැදිලිවම අලුත් ව්‍යවස්ථාවක් සහ සංශෝධන. හැබැයි, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පමණක් නොවෙයි, විධායක ජනාධිපති ක්‍රමයත් එක්ක ගැට ගැසී තිබෙනවා, ආණ්ඩුකාරතුමාගේ බලතලත් එක්ක එන පළාත් සභා ක්‍රමය. ඒ වාගේම දෙමළ භාෂාව කථා කරන ජනතාවට සුවිශේෂ වූ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. එයට තිබෙන එකම විසඳුම ඒ අයට යම් දේශපාලන බලයක් ලබා දීමම තමයි. අන්න ඒ දේශපාලන බලය ලබා දීමේ කාරණයත් එක්ක දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මත පදනම් වෙලා, අර මැතිවරණ ක්‍රමයත් සංශෝධනය කරන කාරණය අපට ඇතුළත් කරගන්න පුළුවන් නම්, මට නම් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න අත් දෙකම ඔසවන්න කිසිම බාධාවක් නැහැ; ඒකට මගේ කිසිම පැකිළීමක් නැහැ.

ඊළඟට, අද මේ රටේ කවුරුත් අමතක කරපු තව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි දෙමළ භාෂාව කථා කරන ජනතාවගේ ප්‍රශ්නය. අද දෙමළ භාෂාව කථා කරන ජනතාවට TNA සංවිධානය තමයි වැඩිපුර නියෝජනය දෙන්නේ. හැබැයි, අද TNA එක, "TNA" නොවෙයි, "SNA" වෙලා තිබෙනවා. ඒක " Sampanthan's National Army" එක, එහෙම නැත්නම් සුමන්තිරන්ගේ "නැෂනල් පක්ෂය" වෙලා තිබෙනවා. දෙමළ භාෂාව කථා කරන ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට තමන්ගේ ජනතාව වෙනුවෙන් විසඳා ගන්න තිබෙන ප්‍රශ්න ටික විසඳාගන්න බැරි වෙලා තිබෙනවා, ඒ පක්ෂය එක්කෙනෙකුගේ, දෙදෙනෙකුගේ බූදලයක් බවට පත් වෙලා එක්සත් ජාතික පක්ෂයත් එක්ක ඇති කරගෙන තිබෙන ඒ deal එක සහ ඒ ගිවිසුම නිසා. ඒ නිසා අද දෙමළ භාෂාව කථා කරන ජනතාව වෙනුවෙන් වැඩිපුරම කථා කරන්න ඉන්නා දෙමළ ජාතික සන්ධානයේ සමහර මන්ත්‍රීවරුන් අපිට ආපනශාලාවේදී හම්බ වුණාම, පුස්තකාලයේදී හම්බ වුණාම -මමත් ඒ අයගේ ප්‍රශ්න වෙනුවෙන් දීර්ඝ කාලයක් මැදිහත් වෙච්ච කෙනෙක් නිසා- අපිත් එක්ක පෞද්ගලිකව කථා කරලා කියන්නේ, මේ සම්මුතිවාදී ආණ්ඩුවෙන් නෙළා ගන්න තිබ්ච්ච හොඳම අස්වැන්න වෙච්ච ඒ දෙමළ භාෂාව කථා කරන අයගේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් ලබා ගැනීමේ අවස්ථාව මඟ හැරුණේ, ඒ අයට නායකත්වය දෙන කිහිප දෙනෙකු පෞද්ගලික පරමාර්ථ ඉස්සරහට දමාගෙන ඇති කරගත් දේශපාලන deal එක නිසාය කියලායි. ඒ අයත් ඒක පිළිගන්නවා. දෙමළ භාෂාව කථා කරන ජනතාවගේ ප්‍රශ්න විසඳා ගැනීමට දේශපාලනික වශයෙන් deal එකක් දමාගන්න තිබුණු අවස්ථාව අහිමි වුණා කියන කාරණය ඒ ගොල්ලන් පවා පිළිගන්නවා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
No, let me speak.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ගරු මන්ත්‍රීතුමනි, ඔයගොල්ලන්ගේ පක්ෂයේ තිබෙන ප්‍රශ්න ඉස්සෙල්ලා බේරා ගන්න. ඊට පසුව අනෙක් පක්ෂ ගැන කථා කරන්න පුළුවන්.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මම කියන්නේ මගේ මතය. ඔබතුමන්ලාට -[බාධා කිරීමක්] කට්ටිය ඉන්නවානේ. මේක මගේ මතය. මගේ මතය කථා කරන්න මට ඉඩ දෙන්න ඕනෑ. මොකද, අපේ රටේ තමන්ගේ මතය කථා කරන අයට වෙඩි තබන කට්ටිය දැන් නැහැ නේ. ඒ නිසා මගේ මතය ප්‍රකාශ කරන්න මට ඉඩ දෙන්න ඕනෑ. මගේ මතය ප්‍රකාශ කළාට පසුව තමුන්නාන්සේට උත්තර දෙන්න පුළුවන්. තමුන්නාන්සේලාගේ කථික මහත්වරුන් ඉන්නවා. මේක මගේ මතය. මම පැහැදිලිවම දකිනවා, ඉතාම ස්වර්ණමය අවස්ථාවක් මඟ හැරුණු බව. මම හැම දාම කියන විධියට අන්තිම බස් එක ඒ තිබුණේ. ප්‍රධාන පක්ෂ දෙක එකට වැඩ කළා, සම්මුතිවාදී ආණ්ඩුව ඇතුළේ. එසේ වැඩ කරනකොට, මේ ප්‍රශ්නය විසඳා ගන්න තිබුණු ප්‍රධානතම අවස්ථාව මඟ හැරුණේ, දෙමළ ජාතික සන්ධානයේ -ඔක්කෝම නොවෙයි- නායකයෝ යැයි කියන එක්කෙනෙක්, දෙදෙනෙක් ගහගත් වෙන දේශපාලන deal එකක් නිසායි. ඒ නිසා එම ප්‍රශ්නය විසඳා ගැනීමට තිබුණු මහඟු අවස්ථාව මඟ හැරුණා. ඒක අපි කියන්නට ඕනෑ. ඒ නිසා දැන්වත් ඇස් ඇරගන්න. ගිය සතිය වෙනකම් දෙමළ ජාතික සන්ධානයේ නායකයෝ පත්තරවලට කිව්වේ, හැන්සාඩ් වාර්තාවල කියා තිබුණේ මොකක්ද? "ජනමත විචරණයට යන්නේ නැතුව, අපිට විසඳුමක් වැඩක් නැහැ." කියලායි කියා තිබුණේ. ඔන්න, ගිය සුමානේ ඉඳලා කියන්න පටන් ගෙන තිබෙනවා, "නැහැ, නැහැ. එහෙම ජනමත විචාරණයකට යන්න ඕනෑ නැහැ. ඒකට අවශ්‍යතාවක් නැහැ" කියලා. ඒ නිසා තමන්ගේ භාෂාව කථා කරන ජනතාවගේ ප්‍රශ්නය පැත්තකට දමා, එක්සත් ජාතික පක්ෂයත් එක්ක වෙනම deal එකක් දමාගෙන, ඒ deal එක හරහා පිටුපස දොරෙන් අගමැතිතුමාට අවශ්‍ය කරන බලය ලබා දීම සඳහා කටයුතු කිරීම නිසා තමයි අද දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන් අපට කැන්ටිමේදී, පුස්තකාලයේදී හම්බ වුණාම පැමිණිලි කරන්නේ, ඒ ගොල්ලන්ගේ ප්‍රශ්න පැත්තකට දමා ඒ ගොල්ලන්ගේ සමහර නායකයින් deals දමාගත්ත වගට. එහෙම deals දමා ගන්නා වෙනත් සමහර නායකයින් ඉන්න පුළුවන්. ඒක වෙනම ප්‍රශ්නයක්. හැබැයි, මේ ප්‍රශ්නය පිළිබඳව දිගින් දිගටම -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක පමණ කාලයක් ඉතුරු වී තිබෙනවා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට සාරතී දුෂ්මන්ත මන්ත්‍රීතුමාගේ වේලාවත් ලබා දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ කාලයත් එක්ක තමයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
හොඳයි.

මේ ප්‍රශ්නය විසඳා ගන්න අවශ්‍යකම තිබෙනවා නම්, දැනුත් ප්‍රමාද නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ ඒකාබද්ධ විපක්ෂය තුළ අපි වාගේ මන්ත්‍රීවරුන් තවම ඒ ජාතික ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් නිශ්චිත වශයෙන් හොයනවා. හැබැයි, දේශපාලන වාසි නැතුව. අපි ඒකට සූදානම්. හැබැයි, ඒකෙන් දේශපාලන වාසි ගන්න බලන්නේ නැතිව. අපේ රටේ සමහර කුඩා පක්ෂවල නායකයෝ මැතිවරණ ක්‍රමය දිහා බලන්නේ, විධායක ජනාධිපති ක්‍රමය දිහා බලන්නේ තමන්ගේ ජන කණ්ඩායමේ ප්‍රශ්න විසඳා ගන්න නොවෙයි, තමන්ට කොහොමද, ඒකෙන් වාසියක් ගන්නේ කියන කාරණය ඉස්මතු කරගන්නයි.

එහෙම බලන්නේ නැතුව අවංකව මේ ප්‍රශ්නය දිහා බලනවා නම් මම හිතන විධියට අපට මේ ප්‍රශ්නය බේර ගන්න පුළුවන්. අද උදේ වරුවේ මහින්ද සමරසිංහ මැතිතුමා -මම කැමැති හෝ අකැමැති වුණත් එතුමාගේ සමහර ක්‍රියා මාර්ගවලට- උත්සාහයක් ගත්තා, ජිනීවාවල පවතින ප්‍රශ්නයට ආණ්ඩුවත් සමඟ අපක්ෂපාතී යම් යම් ප්‍රවේශයකට එන්න. හැබැයි, ඒකට ලැබුණු උත්තරය බොහොම ප්‍රහාරත්මක එකක්. ඒ නිසා තමයි අපි දිගින් දිගටම එතුමා වාගේ උදවියට කියන්නේ, මේ තත්ත්වය තේරුම් ගන්න කියලා. මෙතැන තිබෙන්නේ අවංකවම ජිනීවාවල ප්‍රශ්නය විසඳා ගන්නවත්, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමටවත්, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමටවත් තිබෙන උත්සාහයක් නොවෙයි. මෙතැන තිබෙන්නේ දේශපාලන බල පොරයක්. ඒ දේශපාලන බල පොරය ගැන කථා කරනකොට අපට අනිවාර්යයෙන්ම සිද්ධ වනවා, මේ අය වැය එක්සත් ජාතික පක්ෂයේ අවසාන අය වැය සේ සලකන්න.

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ජනාධිපතිතුමාට පොඩි අභියෝගයක් කළා දැන් ජනාධිපතිවරණයක් තියන්න කියලා. උදේ වරුවේ ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමා කිව්වා, ජනාධිපතිවරණයක් තියන්න එපා කියලා. වර්තමානයේ, මේ වෙලාවේ ජනාධිපතිරණයක් පවත්වනවා නම් ව්‍යවස්ථාව අනුව පවත්වන්න පුළුවන් කොහොමද? එහෙම නම්, ඒ සඳහා වර්තමාන ජනාධිපතිතුමා තරග කරන්නම ඕනෑ. එතුමා තරග කරන්නේ නැත්නම් එතුමාට මැතිවරණයක් තියන්න බැහැ, මේ තරම් ඉක්මනට. ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමා කියනවා, මැතිවරණයක් තියන්න එපා කියලා. නමුත් ඒ පැත්තේම එක් කෙනෙක් කියනවා, වහාම මැතිවරණයක් තියන්න කියලා. නීත්‍යානුකූලව වර්තමාන ජනාධිපතිතුමා ඉල්ලන්නේ නැත්නම් මැතිවරණයක් පවත්වන්න බැහැ. එක්සත් ජාතික පක්ෂය තුළ එකිනෙකා අතර තිබෙන්නා වූ ප්‍රශ්න, එක්සත් ජාතික පෙරමුණ ඇතුළේ තිබෙන ප්‍රශ්න විසඳා ගත්තේ නැත්නම්, ඊළඟ මාස අටේවත් මේ ජනාධිපතිතුමාගේ කාලය තුළ මේ රටේ තිබෙන ප්‍රධානම ප්‍රශ්න ටික විසඳා ගන්න බැරි වනවා කියලා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය මංගල සමරවීර මැතිතුමා ඉදිරිපත් කළා. මේ මංගලගේ අය වැය, එක්සත් ජාතික පක්ෂයේ අවමංගල අය වැය කියලායි මට නම් පෙනෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වජිර අබේවර්ධන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.53]

**ගරු වජිර අබේවර්ධන මහතා (අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வஜிர அபேவர்தன-உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
The Hon. Wajira Abeywardana - (Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආයතන 25ක් සම්බන්ධ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන වෙලාවේ මම එක කාරණයක් ගැන පමණයි අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් අපේ රජය විසින් ඇති කළ කොමිෂන් සභා හරහා ඇති වී තිබෙන යහපත් ප්‍රතිඵල සහ අයහපත් ප්‍රතිඵල කියන කාරණා දෙක ගැනම රජයක් හැටියට ඉතාම කල්පනාවෙන් බලන්න සිද්ධ වනවා කියලා මා හිතනවා. මම ඇහුම් කන් දුන්නා, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඒ අංශය පිළිබඳව හොඳ විග්‍රහයක් කළා. සමස්ත පාර්ලිමේන්තුවම ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කළ යුතුව තිබෙනවා, කොමිෂන් සභාවල කාර්ය සහ කර්තව්‍ය පිළිබඳව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මහජනතාව විසින් ලබා දෙන mandate එක ක්‍රියාවට නැංවීමට ආණ්ඩුවට, පාලන පක්ෂයට තිබෙන බාධා සහ ඒවා නිරාකරණය කර ගැනීම පිළිබඳව කථානායකතුමා විසින් නැවත සලකා බැලිය යුතුව තිබෙනවා. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කියපු කාරණා සම්පූර්ණයෙන් සත්‍යයි. මේ කොමිෂන් සභාවලින් රටක අමාත්‍යාංශවලින් රටේ සංවර්ධනයට සිදු වන හානිය සහ සිද්ධ වන පාඩුව ගණනය කරලා බලලා, අපි ඒවා නිවැරදි කර ගත යුතුව තිබෙනවා. එසේ නොමැති වුණොත් රාජ්‍ය පාලනය කරන කණ්ඩායම හැටියට බරපතළ බේදවාචකයට මුහුණ දෙනවා. එම නිසා මම අපේ සියලු නියෝජිතයන්ගේ අවධානය යොමු කරන්න කැමැතියි, අපි සද්භාවයෙන් ඇති කළ කොමිෂන් සභා හරහා සිදු වූ හොඳ දෑ වාගේම, සිදු වන බරපතළ අඩුපාඩු පිළිබඳව අවධානය යොමු කළ යුතු බව. ඒ කරුණු විග්‍රහ කරන්න මේ විනාඩි නවයක කාලය මදි. නමුත්, මට ඕනෑකම තිබුණා මේ කාරණයට අවධානය යොමු කරවන්න.

සමස්ත කොමිෂන් සභා හරහා සිදු වන බරපතළ හානිය ගණනය කිරීමක් සිදු කළ යුතුව තිබෙනවා. සමහර ලිපිවලට මාස 6ක්, 8ක්, 10ක් යනතෙක් පිළිතුරක් ලබා ගැනීමට නොහැකිවීම නිසා අමාත්‍යාංශවල ක්‍රියාකාරිත්වයට තිබෙන බාධා අවම කර ගත යුතුයි. ඒ ඒ අමාත්‍යාංශවලින් ගරු කථානායකතුමා වෙත ඒ කරුණු ලිඛිතව භාරදීමෙන් අනතුරුව විභාග කරලා, මහජන නියෝජිතයන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්න අවස්ථාවක් ලබා දීම සඳහා කථානායකතුමා අවස්ථාවක් ලබා දිය යුතුව තිබෙනවා. උදාහරණයක් විධියට කියනවා නම්, චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ ඉන්නවා. චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා නිතර ඇවිල්ලා මන්නාරම ප්‍රදේශයේ ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කරනවා. අනෙක් මන්ත්‍රීතුමන්ලාත් ප්‍රශ්න ඉදිරිපත් කරනවා. මූලාසනයේ ඉන්න මන්ත්‍රීතුමනි, ඔබතුමාත් එවැනි ප්‍රශ්න ඉදිරිපත් කරනවා. එතකොට ඒ ප්‍රශ්නත් සමඟ මතුවෙලා තිබෙන තත්ත්වය පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමාට යොමු කිරීම තුළින් නිවැරදි කර ගත යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ කටයුතු ගැන සුපරීක්ෂාවක් කථානායකවරයා හරහා සිදු නොවීම හේතුවෙන් බරපතළ ගැටලු රාශියක් ඇති වෙලා තිබෙනවා. අපි ඒ ගැන පාර්ලිමේන්තුවේ දවසක විවාදයක් කළොත් සියලු අමාත්‍යාංශ කරුණු ඉදිරිපත් කරයි කියලා මම හිතනවා. මේ පවතින තත්ත්වය වෙනස් කර ගැනීම සඳහා වහාම මේ කොමිෂන් සභාවල guidelines, regulations යනාදියෙන් සිදුවන හානිය ගණනය කළ යුතුව තිබෙනවා. එහෙම නැත්නම් ඉදිරි කාලයේදී මේවායින් සිදුවන බරපතළ හානිවලට අමාත්‍යාංශවලට පමණක් වග කියන්න බැරි තැනකට යා යුතුව තිබෙනවා. මේ ගැටලු ඉදිරි කාලයේදී නිවැරදි කර ගන්න ඕනෑ. නිවැරදි කර ගන්න බැරි නම් අපේ යුතුකම තමයි සත්‍ය තත්ත්වය පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කිරීම හා ඒවා නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම. එසේ නිවැරදි කර ගැනීමට නොහැකි නම් එවැනි තත්ත්වයක් ඇති වීමට තුඩු දුන් හේතු සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කිරීම සඳහා අපි කටයුතු කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි 2015 ජනවාරි 08 වෙනිදායින් පස්සේ කොමිෂන් සභා ඇති කරලා, ඒවා ශක්තිමත් කරලා තිබෙනවා; අගෝස්තු 17 වෙනිදායින් පසුව තවත් ශක්තිමත් කරලා තිබෙනවා. අපි ලක්ෂ 15කට ආසන්න රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩි කර රාජ්‍ය සේවය ශක්තිමත් කර තිබුණත්, රටේ සංවර්ධනයට ඔවුන්ගෙන් ගන්න තිබෙන සහයට බාධාවක් සිදු වෙනවා නම්, ඒක බරපතළ තත්ත්වයක් කියලා මම හිතනවා. මට මේ ගැන උදාහරණයක් විධියට එක කාරණයක්, දෙකක් කියන්න පුළුවන්. අපේ අමාත්‍යාංශයට තට්ටු 22ක නව ගොඩනැඟිල්ලක් ඉදි කළාම, ඒ ගොඩනැඟිල්ලේ අවශ්‍යතාව සඳහා අවශ්‍ය කරන යම් යම් නිලධාරීන්, Premises Manager වාගේ කෙනෙකුගේ අවශ්‍යතාව ඉදිරිපත් කළාම මේ අයට ඒ පිළිබඳ අවබෝධයක්, සංකල්පයක්, කල්පනාවක්, කිසිම හැඟීමක් නැහැ. ඒ අය හිතනවා, ඒක තව කාට හරි කරන්න පුළුවන් කියලා. සම්පූර්ණයෙන්ම computerized වුණු ගොඩනැඟිල්ලක් ඉදි වුණාම, Premises Manager කෙනෙකුගේ තිබෙන වටිනාකම පිළිබඳ අවබෝධයක් ඒ අයට නැහැ කියලා මම හිතනවා. ඒ ගොල්ලන් කියනවා, "නැහැ, ඒක තව කාට හරි කරන්න පුළුවන්" කියලා. එහෙම කරන්න බැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කොමිෂන් සභාවලට ප්‍රතිපත්ති තීරණය කරන්න බැහැ. කොමිෂන් සභාවේ යුතුකම වන්නේ, පාර්ලිමේන්තුව හදන, පාර්ලිමේන්තුවෙන් අනුමත කරන යම් යම් කරුණු කාරණා ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය guidelines පෙන්වීම පමණයි. රෙගුලාසි හදා දීම යුතුකමක්. හැබැයි, ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කොමිෂන් සභා මැදිහත් වුණොත් බරපතළ තත්ත්වයක් අනාගතයේ ඇති වෙන්න ඉඩ තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන ගරු කථානායකතුමාගේ අවධානය යොමු කළ යුතුව තිබෙනවා. අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ, සමස්ත කොමිෂන් සභා ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඇති වී තිබෙන තත්ත්වය ගැන කරුණු ඉල්ලුවොත්, මට පුළුවන් සියලු කොමිෂන් සභා ගැනම සියලු තොරතුරු සපයන්න. අපට එක් එක් වශයෙන් ඒ තොරතුරු ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තාම, අපි නීති නිලධාරියෙක් අමාත්‍යාංශයට බඳවා ගන්නා විට ඒ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය දිගා බැලුවාම

[ගරු වජිර අබේවර්ධන මහතා]

කනගාටුදායකයි. එවැනි වැරදි විධියේ බඳවා ගැනීමේ පරිපාටියක් තමයි අනුගමනය වන්නේ. නීති නිලධාරියෙක් බඳවා ගැනීමට සුදුසුකම් විධියට සලකන්නේ, ඔහු නීති වෘත්තියට පැමිණි දිනයේ සිට වයස් ගත වීම නම්, ඒ අමාත්‍යාංශයට බඳවා ගන්න නීති නිලධාරියාගෙන් ඒ අවශ්‍ය ඉලක්ක සම්පූර්ණ කරන්න බැරිව යනවා.

ඒ නිසා අමාත්‍යාංශ තුළ ඇති වී තිබෙන බරපතළ ගැටලුවලට මුහුණ දීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු කථානායකතුමාගේ විශේෂ අවධානය යොමු කළ යුතුව තිබෙනවා කියා මම හිතනවා. මේ සම්බන්ධයෙන් අපට අලුතෙන් හිතන්න වෙලා තිබෙනවා.

මම ඊට වඩා කරුණු කියන්න යන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා අල්ලස් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ වැටුප් සම්බන්ධව කථා කරනවා මම අහගෙන හිටියා. නීතිපති දෙපාර්තමේන්තුව සමඟ ගලපා කරුණු කිව්වා. ඇත්ත වශයෙන්ම ඒ අයගේ වැටුප් වැඩි විය යුතුයි කියලා මම හිතනවා. අල්ලස් දෙපාර්තමේන්තුවේ ප්‍රශ්නය ඉක්මනින් නිරාකරණය කරන්න අපේ ගරු අගමැතිතුමාගේත්, රජයේත් අවධානය යොමු වේවි කියලා මම හිතනවා. හැබැයි, ඇති වෙලා තිබෙන මේ තත්ත්වය නිරාකරණය කර ගැනීම සඳහා අනිවාර්යයෙන්ම ගරු කථානායකතුමාගේ විශේෂ අවධානය යොමු කළ යුතුව තිබෙනවා. උදාහරණයක් විධියට මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ගත්තොත්, අවුරුදු 155ක් වයසයි. අග්‍රාමාත්‍යතුමා මට ලිපියක් එවමින් කියනවා, "ඔබේ දෙපාර්තමේන්තුව ලෝකයේ 170වැනි තැන..." කියලා. ලෝකයේ රටවල් 249යි. ලෝකගත ලැයිස්තුවේ මේ දෙපාර්තමේන්තුව ඉන්නේ 170වැනිතැන. ඒ 170 තැන වෙනස් කරන්න යම් යම් යෝජනා යවන විධිය ගැන බැලුවාම බොහොම කනගාටුදායකයි. ඒ නිසා කොමිෂන් සභාවල කර්තව්‍ය ගැන අපි නැවත සිතා බැලිය යුතුව තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)
හොඳයි.

උදාහරණයක් හැටියට අපි එම දෙපාර්තමේන්තුව මේ 16වැනිදා විශාල ප්‍රතිසංවිධානයකට තල්ලු කර තිබෙනවා, අවුරුදු 155කට පස්සේ. ඒ නිසා මෙවැනි ආයතන පාලනය කරන අංශ පිළිබඳ පාර්ලිමේන්තුවේ මීට වඩා දැඩි අවධානයක් යොමු විය යුතුව තිබෙනවා. ඒ පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානය යොමු වේවි කියලා මම හිතනවා. මේ සම්බන්ධයෙන් වහාම ක්‍රියා කළ යුතුයි කියන එකත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මාවෛ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.03]

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இங்கு முக்கியமாக ஜனாதிபதி அவர்களின்கீழ் வருகின்ற திணைக்களங்கள், நிறுவனங்கள் மற்றும் விடயங்கள் சம்பந்தமான வரவு செலவுத்திட்டக் குழுநிலை விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கின்றது. உண்மையில், இந்த நாட்டுக்கு நிறைவேற்று அதிகார ஜனாதிபதி முறை ஜே.ஆர். ஜயவர்தன அவர்களினால் அறிமுகப்படுத்தப்பட்டதற்குப் பிறகு, இந்த நாட்டிலே ஜனாதிபதியாகத் தெரிவுசெய்யப்பட்ட ஒவ்வொருவரும் தாங்கள் நிறைவேற்று அதிகார ஜனாதிபதி முறையை ஒழித்துவிடுவோம் என்று மக்களுக்கு வாக்குறுதியளித்துவந்த வரலாற்றை இந்த நாடு அறியும்.

அப்படித்தான் இப்பொழுது ஜனாதிபதியாக இருக்கின்ற மைத்திரிபால சிறிசேன அவர்களும் 62 இலட்சம் மக்களின் வாக்குகளைப் பெற்று 2015ஆம் ஆண்டு ஜனவரி மாதம் ஜனாதிபதியாகத் தெரிவுசெய்யப்பட்டபொழுது, இந்த நாட்டு மக்களிடத்தில், குறிப்பாகத் தமிழ் மக்களிடத்திலே ஒரு நம்பிக்கையேற்பட்டிருந்தது. சிறுபான்மைத் தேசிய இனங்களான தமிழ், முஸ்லிம், மலையக மக்கள் எல்லோரும் ஒருமித்து மைத்திரிபால சிறிசேன அவர்களை ஜனாதிபதியாகத் தெரிவுசெய்தார்கள்; அந்த மக்களுடைய வாக்குகளே அவருடைய வெற்றிக்குக் காரணமாக இருந்தன.

தமிழரசுக் கட்சியைப் பற்றிப் பேசுகின்றபோது, அதற்குப் பிறகு வந்த தமிழர் விடுதலைக் கூட்டணியைப் பற்றிப் பேசுகின்றபோது, முன்னாள் அமைச்சராக இருந்த அமரர் மு. திருச்செல்வம் அவர்கள், அவருடைய மகன் கலாநிதி நீலன் திருச்செல்வம் ஆகியோர் பற்றிக் குறிப்பிட வேண்டும். கலாநிதி நீலன் திருச்செல்வம் அவர்கள் உலகத்திலே உள்ள நாடுகளின் அரசியலமைப்புக்களை மிகவும் நன்கு அறிந்த ஒருவர்; ஆபிரிக்க நாடுகளிலும் வேறுசில நாடுகளிலும் அவற்றின் அரசியலமைப் புகளை உருவாக்குவதில் மிகப் பெரும் பங்காற்றியவர். இந்த ஜனாதிபதி முறை பற்றி திரு. நீலன் திருச்செல்வம் அவர்கள் எங்களுடன் பேசுகின்றபோதும் கலந்துரையாடுகின்றபொழுதும் நாங்கள் அவரிடம் அந்த முறை பற்றிப் பல கேள்விகளை எழுப்பியிருக்கிறோம். “இலங்கை நாட்டுக்கு நிறைவேற்று அதிகார ஜனாதிபதி முறை பொருத்தமாக இருக்கும்; அந்த முறையை நாங்கள் ஆதரிக்க வேண்டும்” என்று அவர் கூறி வந்திருக்கின்றார். அந்த முறையின்கீழ் தெரிவு செய்யப்பட்டவர்களில், தமிழ் மக்களின் வாக்குகளை மிகப் பெருமளவில் பெற்ற முன்னாள் ஜனாதிபதி சந்திரிகா பண்டாரநாயக்க அவர்களும் ஒருவராவார்.

1920களிலே எஸ்.டப்ளியு.ஆர்.டீ. பண்டாரநாயக்க அவர்கள் 'ஒக்ஸ்போர்ட்' பல்கலைக்கழகத்தில் படித்துவிட்டு இலங்கைக்கு வந்தபோது, வெள்ளைக்காரர்களிடமிருந்து இலங்கையை விடுதலை செய்வதற்கான போராட்டங்கள் நிகழ்ந்த காலத்தில், கண்டியத் தலைவர்களோடு சேர்ந்து "சமஷ்டி அமைப்பு முறைதான் இந்த நாட்டுக்கு உகந்தது; ஆயிரம் எதிர்ப்புக்கள் வந்தாலும் நாம் அதை நிறைவேற்ற வேண்டும்" என்று கூறினார். இது சம்பந்தமாக "Ceylon Morning Leader" பத்திரிகையிலே அவர் நான்கு கட்டுரைகளை எழுதியிருந்தார். ஆனால், பண்டாரநாயக்க அவர்கள் தனது ஆட்சிக் காலத்தில் - 1957ஆம் ஆண்டு - எங்களுடைய தலைவராக இருந்த தந்தை செல்வநாயகம் அவர்களுடன் செய்துகொண்ட ஒப்பந்தத்துக்குப் பின்னர் சுட்டுக்கொல்லப்பட்டார். அது துரதிருஷ்டவசமான ஒரு நிகழ்வு.

திரு. பண்டாரநாயக்க அவர்களுடைய மகளான சந்திரிகா பண்டாரநாயக்க குமாரதுங்க அவர்கள் 1995ஆம் ஆண்டு 68 வீதமான வாக்குகளைப் பெற்று ஜனாதிபதியாகத் தெரிவு

செய்யப்பட்டார். அவருடைய பதவிக் காலத்தில் அவருக்குச் சிறந்த ஆலோசகர்களாக இருந்த பேராசிரியர் ஜீ.எல். பீரிஸ் அவர்களும் திரு. நீலன் திருச்செல்வம் அவர்களும் இந்த நாட்டினுடைய இனப் பிரச்சினையைத் தீர்ப்பதற்கு திருமதி சந்திரிகா பண்டாரநாயக்க அவர்களுக்கு உதவிபுரிந்தார்கள். இந்த நாட்டிலே ஒற்றையாட்சி ஒழிக்கப்பட்டு, பிராந்தியங்கள் இணைந்த ஓர் அமைப்பு முறை - "பிராந்தியங்களின் ஒன்றியம்" - "union of regions" என்ற அடிப்படையில் ஓர் அரசியலமைப்பை உருவாக்குவதற்கு ஏற்றவகையில் அதாவது, வடக்கு, கிழக்கு இணையக்கூடியதாக முழுமையான அதிகாரங்கள் பகிரப்பட்டு, முஸ்லிம் மக்களும் அவர்களுடைய பிரதேசத்திலே ஆளுகையைச் செய்யக்கூடியதாக ஒரு திட்டத்தை அவர் கொண்டுவந்தார். அந்த வகையில், இந்த நாட்டில் ஜனாதிபதியாக இருந்தவர்களில் மிகச் சிறந்ததொரு தீர்வுத் திட்டத்தை முன்வைத்தவர் என்ற பெருமை சந்திரிகா பண்டாரநாயக்க அவர்களுக்குத்தான் உரித்தானது. அதே நம்பிக்கையின் அடிப்படையில், அவருடைய நம்பிக்கைக்கு உரியவராக இருந்த மைத்திரிபால சிறிசேன அவர்களை ஜனாதிபதி வேட்பாளராகத் தேர்ந்தெடுப்பதற்குப் பிரேரித்ததில் சந்திரிகா பண்டாரநாயக்க அவர்களுக்கும் பங்குண்டு என நான் நம்புகின்றேன்.

இந்த நாட்டினுடைய தற்போதைய ஜனாதிபதியை 2015ஆம் ஆண்டு தை மாதம் தெரிவுசெய்தபொழுது அவர்மீது மக்கள் கொண்டிருந்த நம்பிக்கை, சென்ற சில மாதங்களுக்கு முன்னர்வரை, அதாவது, கடந்த ஒக்டோபர் மாதம் 26ஆம் திகதிவரை இருந்தது. இந்த நாட்டின் அரசியலமைப்பை நாங்கள் ஏற்றுக்கொள்ளாவிட்டாலும், அதற்கு எங்களுடைய சம்மதம் இல்லாவிட்டாலும், அரசியலமைப்புக்கான 19வது திருத்தத்துக்கு எதிராக மேதகு ஜனாதிபதி அவர்கள் செயற்பட்டதை நாங்கள் ஏற்றுக்கொள்ளவில்லை. அதேநேரம் 19வது திருத்தத்தை நிறைவேற்றுவதற்காக அவரும் ஆதரவு தெரிவித்திருந்தார். இருந்தபோதிலும் மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் 19வது திருத்தத்துக்கு எதிராக கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களைப் பதவியிலிருந்து நீக்கி, மஹிந்த ராஜபக்ஷ அவர்களைப் பிரதமராக நியமித்தார்; ஒரு தேர்தலை நோக்கித் தேவையான அமைச்சர்களையும் நியமித்தார்; பின்னர் பாராளுமன்றத்தைக் கலைத்தார். இவையெல்லாம் அரசியலமைப்புக்கான 19வது திருத்தத்துக்கு விரோதமானதென்று நீதிமன்றத்திலே தீர்ப்பளிக்கப்பட்டு, இந்தப் பாராளுமன்றம் மீண்டும் கூடி, இப்பொழுது நடைபெற்றுக் கொண்டிருக்கின்றது. சுட்டுக்கொல்லப்பட்ட திரு. நீலன் திருச்செல்வம் அவர்கள் உயிரோடிருந்தால் இந்த நடவடிக்கைகளின் விளைவு பற்றி நாங்கள் அவரிடம் கேட்டிருப்போம்.

இந்த நாட்டிலே இருந்த ஒவ்வொரு நிறைவேற்று ஜனாதிபதியும் - மைத்திரிபால சிறிசேன வரை - தேர்தல் காலங்களில் கொடுத்த வாக்குறுதிகள் அவர்களால் மீறப்பட்டு வந்துள்ளன. தற்போதைய ஜனாதிபதி 62,00,000 மக்களுக்கும் கொடுத்திருந்த வாக்குறுதிகளை இன்று மீறியிருக்கிறார். இன்றைய ஜனாதிபதிக்கு குறிப்பாக, சிறுபான்மைத் தேசிய இனங்களான - சிறுபான்மை மக்களான தமிழ், முஸ்லிம் மக்கள் மிக நம்பிக்கையோடு வாக்களித்திருந்தனர். அவர் யாழ்ப்பாணத்துக்கு வந்தபோது அது சம்பந்தமாக எங்களுக்கு மிகுந்த நன்றியைச் சொன்னார். இந்த நாட்டின் இனப் பிரச்சினையைத் தீர்ப்பதற்கு இந்த நல்லாட்சி அரசாங்கத்தினால் நடவடிக்கை எடுக்கப்படும் என்றும் அதனைத் தீர்த்துவைப்பதாகவும் யாழ்ப்பாணத்தில் நானும் அமர்ந்திருந்த ஒரு மேடையில் அவர் கூறினார். இந்த நாட்டிலே நிறைவேற்று அதிகார ஜனாதிபதி முறை ஒழிக்கப்பட வேண்டும் என்பதற்காக ஒவ்வொரு ஜனாதிபதித் தேர்தலிலும் மக்கள் வாக்களித்திருந்தார்கள்.

இப்பொழுது ஜனாதிபதி அவர்கள் மிகப்பெரும் அவல நிலையில் இருக்கிறார். அதாவது, நாட்டினுடைய இனப் பிரச்சினை தீர்க்கப்படாமல், இலட்சக்கணக்கான மக்கள் போரிலே தங்கள் உயிர்களைப் பலிகொடுத்ததற்குப் பிறகும், சர்வதேச தலையீடுகள், அதாவது இனப் பிரச்சினைக்கும் ஏனைய பிரச்சினைக்கும் தீர்வு காணப்பட வேண்டும் என்ற மனித உரிமைப் பேரவையின் தீர்மானம் வந்தபொழுதும், அதை நாங்கள் ஏற்கமாட்டோம்; அதற்குக் கட்டுப்படமாட்டோம்; அதிலிருந்து விலகி இருப்போம் என்று இன்றுவரை மைத்திரிபால சிறிசேன அவர்கள் பேசிக் கொண்டிருக்கின்றார். இந்த நிலையில், பாதிக்கப்பட்டவர்கள் தமிழ் மக்கள்தான்! மீண்டும் மீண்டும் ஏமாற்றப்பட்டவர்கள் தமிழ் மக்கள்தான்! அதனால் நிறைவேற்று அதிகார ஜனாதிபதி முறை இந்த நாட்டுக்குத் தேவையற்ற தென்பது ஜனாதிபதி அவர்களின் நடவடிக்கைகளினாலேயே நிரூபிக்கப்பட்டு வந்திருக்கின்றது.

இஸ்ரேல் நாட்டிலே பிரதமராக இருப்பவருக்கு நிறைவேற்று அதிகாரமுள்ள ஜனாதிபதிக்கான அதிகாரமும் - powers of Executive Presidency - இருக்கின்றது. இந்தியாவின் ஜனாதிபதி முறையின்படி, ஜனாதிபதியாக நியமிக்கப்பட்டவர் பின்னர் அரசியலில் ஈடுபடுவதில்லை; அரசியல் கட்சிகளின் நிகழ்வுகளில் பங்குபற்றுவதில்லை. இன்று பல நாடுகளில் அப்படியான ஜனநாயக நடைமுறை இருக்கின்றது.

இந்த ஆட்சி உருவாக்கப்பட்ட பின்னர் எந்தவொரு விடயத்திற்கும் இந்த அவையிலே 157 வாக்குகள் தொடர்ச்சியாகக் கிடைத்துவந்த நிலையில், இனப்பிரச்சினைத் தீர்வுக்கான ஒரு சிறந்த திட்டம், அதாவது ஒரு சமஷ்டிக் கட்டமைப்பில் முழு அதிகாரங்களைக்கொண்ட அரசியல் தீர்வொன்று கிடைக்கு மானால் அதனை மூன்றிலிரண்டு பெரும்பான்மையுடன் இந்த அவையிலே நிறைவேற்ற முடியுமென்ற நம்பிக்கை எங்களுக்கு இருந்தது. ஆனால், ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களுடைய கட்சியினர் இந்த நல்லாட்சி அரசாங்கத்திலிருந்து விலகுவதாகக் கடிதமூலம் அறிவித்தல் கொடுத்ததன் ஊடாக அந்த நம்பிக்கையைக் கெடுத்துவிட்டனர். இது எதை நிருபித்திருக் கின்றது என்றால், நிறைவேற்று ஜனாதிபதி கொடுத்த வாக்குறுதிகளை ஒருபொழுதும் நிறைவேற்றவில்லை என்பதைத்தான். வாக்குறுதிகளை மீறி, மீண்டும் ஜனாதிபதியாக வரவேண்டும் என்ற அவர்களுடைய அரசியல் அபிலாஷைகளை நிறைவேற்றுகின்ற ஈடுபாட்டையே இந்தச் செயற்பாடு காட்டி நிற்கின்றது.

இங்கே எனக்கு முன்பு பேசிய டிலான் பெரேரா அவர்கள் எங்களுடன் நட்பாகப் பழகுபவர். ஆனால், இன்று தமிழ்த் தேசியக் கூட்டமைப்பினுடைய போக்கை அவர் அதிகம் விமர்சித்தார். அவர் இங்கு ஏதோ இரககியமான "டீல்" என்ற ஒரு வார்த்தையைக்கூடப் பாவித்தார். அது எனக்கு மிகவும் அதிர்ச்சியாக இருந்தது. முன்பு இவ்வாறான வார்த்தைகளைப் பிரயோகிக்கமாட்டார். அவர் சந்திரிகா பண்டாரநாயக்க அவர்களுக்கு மிகவும் நம்பிக்கை கொண்டவராக இருந்தார்; சந்திரிகா பண்டாரநாயக்க அவர்களுடைய அரசியற் திட்டத்தை ஆதரித்தார்.

மஹிந்த ராஜபக்ஷ அவர்கள் முதலில் ஜனாதிபதியாக வந்த ஆண்டிலிருந்து அடுத்த ஆண்டு வரையும் அவருடன் நாங்கள் பேச்சுவார்த்தை நடத்தினோம். அதாவது, அவர் நிமல் சிறிபால த சில்வா அவர்களுடைய தலைமையிலே நியமித்த குழுவுடன் அந்த ஆண்டின் ஜனவரி மாதம் தொடங்கி நவம்பர் மாதம் வரை 11 தடவைகள் பேசினோம். இறுதியாக, ஓர் அரசியற் தீர்வைக் காண்பதற்குப் பதிலாக, அவர்கள் நவம்பர் மாத இறுதியிலே பேச்சுவார்த்தையிலிருந்து வெளியேறிச் சென்றார்கள். இந்த விடயத்தை டிலான் பெரேரா அவர்கள் மறுக்கமாட்டார். இன்று எனக்கு இங்கு பேசுவதற்கு எந்த நேரத்தில் சந்தர்ப்பம் கிடைக்கும் என்று தெரியாமல் இருந்தது. ஆனால், நான் பேசும்போது அவர் இங்கு இருப்பார் என்று நான் நினைத்தேன்.

இந்தப் பாராளுமன்றம் அரசியலமைப்புச் சபையாக உருவாக்கப்பட்டு, புதியதோர் அரசியலமைப்புக்கான முயற்சிகள் எடுக்கப்பட்டு வந்த நிலையில், அது பற்றிய இடைக்கால

[ගරු ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා]

அறிக்கையொன்று வந்தபொழுதும், நிபுணர் குழுவின் அறிக்கை வெளிவந்தபொழுதும், இன்று டிலான் பெரேரா அவர்கள் ஆதரித்துக்கொண்டிருக்கின்ற மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய 'பொதுஜன பெரமுன' கட்சியினர் "இது நாட்டைப் பிளவுபடுத்தும்; இதைப் பூரணமாக நாங்கள் எதிர்க்கிறோம்" என்று அந்த விடயம் குறித்து நாடு முழுவதும் இனவாதப் பிரச்சாரம் செய்து, அந்தத் திட்டத்தை முறியடிப்பதில் இன்றுவரைக்கும் அதிக கவனமாக இருக்கின்றார்கள். டிலான் பெரேரா அவர்கள் இதை மறத்துவிட முடியாது.

போர் முடிந்ததும் ஐக்கிய நாடுகள் சபையினுடைய முன்னாள் பொதுச் செயலாளர் பான் கீ மூன் அவர்கள் இந்த நாட்டுக்கு வந்தபோது, போரிலே இடம்பெற்ற சம்பவங்கள், குற்றங்கள் தொடர்பில் விசாரித்து ஒரு நீதியான தீர்வை வழங்குவதற்குச் சம்மதம் என்று அவருடன் ஓர் உடன்பாட்டைச் செய்தவர்தான் மஹிந்த ராஜபக்ஷ அவர்கள். அந்த உடன்படிக்கையில் பான் கீ மூன் அவர்களும் கையெழுத்திட்டார். அதற்குப் பின்னர், மனித உரிமைப் பேரவையிலே பலவிதமான தீர்மானங்கள் கொண்டுவரப்பட்டன. பின்னர் ஐக்கிய நாடுகள் மனித உரிமைப் பேரவையின் ஆணையாளராக இருந்த அம்மையார் அவர்களை இந்த நாட்டுக்குள் காலடி எடுத்துவைக்க விடமாட்டேன் என்று மஹிந்த ராஜபக்ஷமிக சொன்னார். இருந்தபோதிலும் அவர் இங்கே வந்து எங்களுடன் ஒன்றரை மணிநேரம் பேசினார்.

சற்று முன்னர் இங்கு பேசிய மஹிந்த சமரசிங்க அவர்கள் 2012ஆம் ஆண்டிலே ஐக்கிய நாடுகள் மனித உரிமைப் பேரவையிலே கலந்துகொண்டிருந்தபோது பல விடயங்களைச் சொல்லியிருந்தார். தென்னாபிரிக்க நீதிபதியாக இருந்த அந்த ஆணையாளரை மோசமாகத் திட்டியிருந்தார். எங்களுக்கு அந்தச் செய்திகள் வந்தபோது, மஹிந்த சமரசிங்க பேசியவை உண்மைக்குப் புறம்பானவை என்றும் இதுதான் உண்மை யென்றும் கூறி, 19 மணித்தியால நேரத்துக்குள் 16 பக்கங்களைக் கொண்ட ஓர் அறிக்கையினை நாங்கள் ஐ.நா மன்றத்தின் மனித உரிமைப் பேரவை உறுப்பினர்களுக்கும் இராஜதந்திரிகளுக்கும் அனுப்பிவைத்தோம். அவர்களுக்கு அன்றே அந்தச் செய்தி கிடைத்தது. இதை இங்கு சொல்லிவைக்கவேண்டிய கடப்பாடு எங்களுக்கிருக்கின்றது. இப்பொழுது இங்கே திரு. மஹிந்த சமரசிங்க அவர்கள் இருக்கிறார். நான் சொல்வதை அவரால் மறுக்க முடியாது; நடந்தது அதுதான்.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
Can I clarify?

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)
Sorry, I did not interrupt your speech.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)
Okay, Sir.

நான் இங்கு குறிப்பிட்டவாறு இந்த நாட்டிலே ஓர் அரசியற் தீர்வை எட்டுவதற்காக மதிப்புக்குரிய முன்னாள் ஜனாதிபதி சந்திரிகா பண்டாரநாயக்கா அவர்கள்கூட பலசுற்றுப் பேச்சுவார்த்தைகளை நடாத்தியிருந்தார். இந்த நிலையில், இந்த நாட்டில் ஒற்றையாட்சியின்கீழ் அதிகாரங்கள் முறையாகப் பகிரப்பட்டு முறையான தீர்வு கிடைக்கும் என்று ஒருபொழுதும் நாங்கள் நம்பிக்கை கொள்ளவில்லை. இப்பொழுது இந்த நாட்டில் நிலவுகின்ற நெருக்கடியான நிலைமைகளைச் சர்வதேசம் முழுமையாக அவதானித்துக்கொண்டிருக்கின்து. ஜனாதிபதி அவர்களால் மஹிந்த ராஜபக்ஷ அவர்கள் பிரதமராக நியமிக்கப் பட்ட நேரத்தில் ஒரு நாடுகூட மஹிந்த ராஜபக்ஷ அவர்களுக்கு வாழ்த்துத் தெரிவிக்கவில்லை. மாறாக, இந்த நாட்டுக்கு உதவி செய்ய முனைகின்ற ஐரோப்பிய யூனியனிலுள்ள ஜேர்மனி போன்ற நாடுகள், அமெரிக்கா, கனடா, யப்பான் போன்ற நாடுகள் தங்களின் குறித்த ஒப்பந்தங்களைத் திரும்பப் பெற்றுக்கொண்டன. அதிலிருந்து இன்று நாங்கள் சர்வதேசத்தினுடைய, மனித உரிமைகள் பேரவையினுடைய போக்குகளை அறிந்துகொள்ளக் கூடியதாக இருக்கின்றது. இந்த நாட்டின் இனப்பிரச்சினை தீர்க்கப்படாமல் ஜனநாயக நெறிமுறைகள் மீறப்படுகின்ற நேரங்களில் அவர்கள் எவ்வாறு நடந்திருக்கிறார்கள் என்பதைப் பற்றியே நான் இங்கு உங்களுக்குச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இந்த நாட்டில் எங்களது இனப் பிரச்சினை தீர்க்கப்படாது விட்டால், எங்களது அன்றாட பிரச்சினைகள் தீர்க்கப்படாது விட்டால், மனித உரிமைகள் பேரவை எதிர்காலத்தில் மீண்டும் ஒரு தீர்மானத்தை எடுப்பதில் சர்வதேச நாடுகளின் ஈடுபாடுகளை ஏற்படுத்துவதுதான் நிச்சயமாக எங்களுடைய நோக்கமாக இருக்கும். ஆனால், நேற்றுப் பதவிக்கு வந்த சிலர் குறித்த சில விடயங்களைப் பற்றிப் பெரிதாகப் பேசுகிறார்கள். இருந்தபோதிலும் ஐ.நா. மனித உரிமைகள் பேரவையுடைய தீர்மானம் மீண்டும் ஒருமுறை புதிய தீர்மானமாக வந்து, இலங்கையை ஏற்கச் செய்து, 30:1, 34:1 என்ற தீர்மானங்களை நிறைவேற்றுவதில் இந்த நாடு விடுபட்டுப் போகாமல், தன்னிச்சையாகச் செல்லாமல் நடவடிக்கை எடுப்பதற்குரிய முயற்சிகள் மேற்கொள்ளப்பட வேண்டும். சிலர் ஏதோ இப்பொழுதுதான் ஐ.நா. மனித உரிமைகள் பேரவையிலே ஓர் அறிக்கை சமர்ப்பிக்கப்படுகின்றதென்று பாராட்டுத் தெரிவிக்கின் றார்கள். 2012ஆம் ஆண்டிலேயே அதன் ஆணையாளராக இருந்த அம்மையார், அதற்குப் பிறகு ஹுசைன் அவர்கள், இப்போதிருக்கின்ற ஆணையாளர் ஆகியோர் மிகச் சிறந்த, திட்டவட்டமான அறிக்கைகளை வெளியிட்டிருக்கின்றார்கள். ஆனால், ஜனாதிபதி அவர்கள் அதற்கு விரோதமாக இருக்கின்றார். இன்று மஹிந்த சமரசிங்ஹ அவர்கள் பேசியபோது, ஓர் இணக்கப்பாட்டை ஏற்படுத்துவதற்கு முயற்சிப்பதாகச் சொன்னார். இந்த நிலைமையில் ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் மற்றும் இந்த நாட்டின் அரசியல் கட்சிகள், குறிப்பாக பிரதமருடைய தலைமையிலே இருக்கின்ற ஆளுங்கட்சி மனித உரிமைகள் பேரவைக்குப் பதில் சொல்வது மட்டுமல்லாமல், அங்கே நிறைவேற்றப்பட்ட தீர்மானங்களை நடைமுறைப் படுத்துவதற்கு உடன்பட்டு, அவற்றை நிறைவேற்றி, நாட்டின் இனப்பிரச்சினையையும் ஏனைய பிரச்சினைகளையும் தீர்க்க முன்வர வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்திலே கேட்டு, விடைபெற்றுக் கொள்கின்றேன். நன்றி. வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා. ඔබතුමාට විනාඩි 20ක පමණ කාලයක් තිබෙනවා. ඊට ප්‍රථම කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ශ්‍රියානි විජේවික්‍රම මහත්මියගේ නම යෝජනා කරන්න.

**ගරු රුවන් විජේවර්ධන මහතා (ජනමාධ්‍ය කැබිනට් නොවන අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ருவன் விஜயவர்தன - வெகுசன ஊடக அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர் மற்றும் பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ruwan Wijewardene - Non Cabinet Minister of Mass Media and State Minister of Defence)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ANURA SIDNEY JAYARATHNE *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

[අ.භා. 3.24]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පළමුකොට අද දින සාකච්ඡාවට ලක් වන විෂය කාරණයන් අතරට අතිගරු ජනාධිපතිතුමාගේ කාර්යාංශය සාකච්ඡාවට භාජනය වෙනවා. එවැනි කාර්යාංශ 25ක් පමණ අද දින සාකච්ඡාවට ලක් වෙනවා. එයින් කිහිපයක් ගැන අදහස් ඉදිරිපත් කරන්නට පුළුවන් වෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

පළමුවෙන්ම ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට පත් කිරීමේ ක්‍රියාවලිය අධිෂ්ඨාන සහගතව ඉෂ්ට කිරීම ගැන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට අපේ ගෞරවය හා ස්තුතිය පුද කරන්න මා කැමැතියි. ඒ වාගේම එය ලෝක උරුමයක් බවට පත් කිරීම සඳහා වූ ක්‍රියා මාර්ගයට අවතීර්ණ වෙලා ශ්‍රී ලංකාවේ අනන්‍ය ශිෂ්ටාචාරයක කොඳු නාරටිය අපටත් ලොව ජනතාවටත් ලබා දීම සඳහා වූ ගමන ශක්තිමත් කිරීමට උත්සාහ ගැනීම පිළිබඳවත් මා එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ජනාධිපතිතුමාත්, පාර්ලිමේන්තුවත්, අග්‍රාමාත්‍යතුමාත් අතර ආණ්ඩුක්‍රම අර්බුදයක් පවතිනවා. ඒක වසන් කරන්නට අවශ්‍ය වන්නේ නැහැ. එම ආණ්ඩුක්‍රම අර්බුදය ඇති වෙන්නට එක හේතුවක් තමයි, දේශපාලන ප්‍රතිපත්ති. දෙවැනි හේතුව තමයි, අපේ පාර්ලිමේන්තුව දුර දිග බලන්නේ නැතුව සම්මත කරන ලද දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. එක් උදාහරණයක් අරගෙන බලමු. ජනාධිපතිතුමාට අමාත්‍යවරු පත් කිරීමේ සහ මූලාසනය දැරීමේ බලය තිබෙනවා. අගමැතිතුමාට අමාත්‍යවරු නම් කිරීමේ බලය තිබෙනවා. ජනාධිපතිතුමාට තමන්ට අවශ්‍ය වෙලාවට විෂය වෙනස් කිරීමේ බලය සහ විෂය පැවරීමේ බලය තිබෙනවා. අග්‍රාමාත්‍යතුමා නිර්දේශ කළද, එය පිළිගැනීමට ජනාධිපතිවරයා බැඳී නැහැ කියාත් තිබෙනවා. අපි මේ කථා කරන පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය -ජනාධිපති ආණ්ඩු ක්‍රමය- 1978දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා බලයට පැමිණ, අපේ පාර්ලිමේන්තුවේ සටහන් වී තිබෙන ආකාරයට එතුමා කිව්වා, අපේ රට ජනරජයක් බවට පත් කළ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට ජනාධිපති ධුරයකට විධායක බලය හිමි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි කියා. ඒ මත තමයි මහ ජනයාගෙන් අවසරයක් ගන්නේ නැතුව පාර්ලිමේන්තුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කළේ. එහි හොඳ වාගේම එහි විපාක අවුරුදු 41ක් පුරා මේ රට බුක්ති විඳිනවා. තවමත් හෙලවෙන්නවත් බැරි අර්බුදයකට ආණ්ඩු ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදී ජනතාව මුහුණ දෙමින් එන ප්‍රශ්නයක් බවට පත් වී තිබෙනවා. එම නිසා පසුගිය කාල පරිච්ඡේදය තුළ විධායක බලතල ක්‍රමානුකූලව අඩු කරමින් යම් ප්‍රමාණයක් අග්‍රාමාත්‍යවරයාටත්, පාර්ලිමේන්තුවටත් පැවරීම ගැන ඇති වුණු සංවාදය සම්බන්ධව මම එක කාරණයක් ඉතා පැහැදිලිව සඳහන් කරන්නට ඕනෑ. පාර්ලිමේන්තු ඡන්ද ක්‍රමය වෙනස් කිරීමට අපි දීර්ඝ කාලයක උත්සාහයක් දැරුවා. පාර්ලිමේන්තු ඡන්ද ක්‍රමය වෙනස් කිරීමේ කමිටුවේ සභාපතිවරයා හැටියට පාර්ලිමේන්තු තුනකදී සර්වපාක්ෂික එකඟතාවකින් යුක්තව මාව පත් කළා. එහි සංක්ෂිප්ත යෝජනාව මොකක්ද? සියයට 70ක් කේවල ආසනවලින් සමන්විත වන පරිදි සහ සියයට 30ක් අනුපාත ඡන්දයෙන් පත් වන මිශ්‍ර ඡන්ද ක්‍රමයකට පිවිසීම.

ඒ ඡන්ද ක්‍රමය පළාත් සභාවටත්, ඒ ඡන්ද ක්‍රමය පළාත් පාලන ආයතනයටත් ඇති කිරීම. පළාත් පාලන ඡන්දයට අපි ඒක බොහොම අමාරුවෙන් සම්මත කර ගත්තා.

නමුත් ආණ්ඩුව ඒ නිර්දේශත් වෙනස් කර, තිබුණු සමබර ජනතා අපේක්ෂාවන් ඉෂ්ට වෙන පාලනයක් ගෙන යා හැකි ආකාරයේ සභාවල්, තමන්ගේ නියෝජිතයන් පත් කරන සභාවල් බවට සහතික කර ගැනීමේ ඡන්ද ක්‍රමයක් ඇති කිරීම නිසා අද බරක්, විකෘතියක් ඇතිවී පළාත් පාලන ආයතන ගෙන යන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. එහි ඵල විපාක අද අපි භුක්ති විඳිනවා. ඒවා නිවැරදි කරන්න ලැබෙය කියා අපි විශ්වාස කරනවා.

අපි පාර්ලිමේන්තු ඡන්ද ක්‍රමයට යමු. මේ පාර්ලිමේන්තු ඡන්ද ක්‍රමය යටතේ ඡන්දයක් පැවැත්වුවොත් කිසිම ස්ථාවර ආණ්ඩුවක් බිහි වෙන්නේ නැහැ. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ පාලන සමයේත්, ඉන් පසුව රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වය යටතේත් බිහි වුණු ඡන්ද ප්‍රතිඵල ඔප්පු කරනවා, ස්ථාවර නැති ආණ්ඩු බිහිවීම පමණයි සිදු වෙන්නේ කියන කරුණ. දැන් තිබෙන්නේත් ස්ථාවර නැති ආණ්ඩුවක්. දිනුවයි කියලා ඊයේ කොයිතරම් කෑගැහුවත්, අනෙක් ඡන්ද ඔක්කොම එකතු වුණොත්, විරුද්ධ පක්ෂය එකට එකතු වුණොත් ආණ්ඩුව පරාදයි. පරදිනවා කියන්නේ මොකක්ද? කොනක ඉඳන් නිලධාරීන් පෙරළි, පෙරළී යනවා. ඒ නිසායි මම මේ කාරණාව විශේෂයෙන් සඳහන් කළේ. අපි මේ ඡන්ද ක්‍රමය වෙනස් කිරීමේ ක්‍රියාදාමයට දැන්වත් එකතු වෙලා වහා ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ මම පාර්ලිමේන්තුවේ හිටියා. එතුමාට ඕනෑකම තිබුණා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු සංඛ්‍යාව වැඩි කරන්න. ඒ කාලයේ අපේ සුමේධා මන්ත්‍රීතුමියත් හිටියා. මොකක්ද වුණේ? එක දවසක රාත්‍රියේ හදිසි පනතක් කියලා පනතක් හදලා, පසුවදා පාර්ලිමේන්තුවට ගෙනාවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව 196 සිට 225ක් දක්වා වැඩි කරන්න තමයි ඒක ගෙනාවේ. කාගෙන්ද ඇහුවේ? ජනමතවිචාරණයකින් ඇහුවාද? ඡන්ද බලය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන වගන්ති අනුව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කිව්වාද? නැහැ. ඔබතුමාට තනියම කරන්න බැහැ, මේ සඳහා ජනමතවිචාරණක් තියන්න ඕනෑ කියලා කිව්වාද? එහෙම කියපු ශ්‍රේෂ්ඨාධිකරණයකුත් නැහැ. මම ගෞරවාන්විතව ශ්‍රේෂ්ඨාධිකරණයට කියනවා, ශ්‍රේෂ්ඨාධිකරණයට එහෙම කියන්න ඉදිරියක් දකින්න පුළුවන්කම නොතිබුණු නිසා ඇතිවුණු මේ 225 පාර්ලිමේන්තු ක්‍රමය කොයි තරම් අපව දැන් අවුල් ජාලාවකට පත් කරලා තිබෙනවාද කියලා. එය ආණ්ඩුක්‍රම අවුලක් පමණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය ආර්ථික අර්බුදයක්; මූල්‍ය අර්බුදයක්. මහ බැංකු අධිපතිවරයා පත් කරන්න ගියාම ආණ්ඩුක්‍රම අර්බුදයක්. ඔහු ගෙදර යවන්න ගියාම

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ආණ්ඩුක්‍රම අර්බුදයක්. ඔහුව පොලීසියෙන් හොයන්න ගියාම ආණ්ඩුක්‍රම අර්බුදයක්. මේක නේද, අද මුළු රටම වැටිලා තිබෙන ආර්ථික ප්‍රපාතය? රටක පාලන තන්ත්‍රය විශ්වාසයක් නැති තැනකට වැටුණාම, කවුරු අගමැති වුණත්, කවුරු ඇමති වුණත් වැඩක් වෙන්නේ නැහැ. අපි හිතාගෙන ඉන්නවා, අපි ඉන්නේ බොහොම සන්තෝෂ අවස්ථාවක කියලා. නැහැ. කොයි වේලාවේ පුපුරා යන ආර්ථිකයක් තුළද අපි ජීවත් වෙන්නේ? හෙට දින රුපියල බාල්දු වී ගමන් කරන්න පටන් ගත්තොත්, මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ට අද කථා කරන කිසිවක් කථා කරන්නට බැහැ. එවැනි ආණ්ඩුක්‍රම අර්බුදයකින් මිදෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපට අවශ්‍යයි. අද අග්‍රාමාත්‍ය කාර්යාලය වැය ශීර්ෂය සම්මත වෙනවා. මම ඒ ගැන කථා කරන්නේ නැහැ, අගමැතිතුමාත් නැහැ, ජනාධිපතිතුමාත් රටේ නැහැ.

ඊළඟට, උපරිමාධිකරණ විනිශ්චයකාරවරු ගැන බලමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ එක නීතියක් තිබෙනවාද? අපේ රටේ පාලන තන්ත්‍රය දේශපාලනඥයන් විසින් අසාර්ථක කළත්, පාලන තන්ත්‍රය මෙහෙය වන්නේ රාජ්‍ය නිලධාරීන්. රාජ්‍ය නිලධාරීන්ට මොන අඩු පාඩු තිබුණත්, මේ අවුල් ජාලාව තුළ රටේ පාලන තන්ත්‍රය කෙසේ හෝ දවසින් දවස ගත කරමින් ඉදිරියට ගෙන යාම ගැන මම ඔවුන්ට ප්‍රශංසා කරනවා. ඇයි, මහජනයාට ඒ සේවය අවශ්‍ය නිසා. දේශපාලනඥයන් තනතුරු සොයා යාම නිසා අද ලංකා දේශපාලනය අවුල් ජාලයකට වැටිලා තිබෙනවා. විනිශ්චයකාරවරයෙක් වයස අවුරුදු 65කදී විශ්‍රාම යනවා. රාජ්‍ය සේවයේ ඉහළම කෙනා වයස අවුරුදු 60දී විශ්‍රාම යනවා. සමහර සංස්ථාවල අය වයස අවුරුදු 55දී විශ්‍රාම යනවා. විශ්වවිද්‍යාල මහාචාර්යවරු වයස අවුරුදු 65න් විශ්‍රාම යනවා.

මේ අසමාන වයස් ක්‍රම යොදා ගැනීමෙන් ඇති කර තිබෙන හානියද බලපාන්නේ සාමාන්‍ය ජනතාවට හා එදිනෙදා පාලන තන්ත්‍රයටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "වේලාව අවසන් නිසා කෙටියෙන් කියලා අවසන් කරන්න" කියලා ඔබතුමා මට කියන්න කලින් මම ඔබතුමාගෙන් ඉල්ලනවා, මට තව පොඩි වේලාවක් දෙන්න කියලා.

මේ රටේ අපි අලුතින් කල්පනා කළ යුතු කාලපරිච්ඡේදයකට ඇවිල්ලා තිබෙනවා. පෞද්ගලික අංශයේ සමාගම්වල ප්‍රධානීන් අවුරුදු 70දී විශ්‍රාම යන්න ඕනෑ. එවැනි නීතියක් ගෙනැල්ලා සම්මත කරගෙන තිබෙනවා. අපේ වාගේ රටවල අමාරුවෙන් ගොඩ නැඟුණු අපේ ව්‍යාපාරිකයන්, පවුල්වල මුදල් ආයෝජනය කරගෙන ගොඩ නැඟුණු ව්‍යාපාර හිස ඔසවා ගෙන එන කොට, ඔවුන්ට දැන් ඉවත් වෙලා යන්න වෙලා තිබෙනවා. ආයතන කීයක් මේ නීතිය නිසා අවුල් ජාලයකට පත් වී තිබෙනවාද? ඒ නිසා මේ විශ්‍රාම යන වයස් ක්‍රමය ගැන නැවත කල්පනා කරන්නට ඕනෑයි කියන එක මා මේ වෙලාවේ මතක් කරනවා. අධිකරණයට වේවා, රාජ්‍ය සේවයට වේවා, වෙනත් කුමන මට්ටමකට වේවා, විශ්‍රාම යන වයස් සීමාව ගැන අලුතින් කල්පනා කර ඒ සම්බන්ධයෙන් අලුත් පරිපාලන වැඩ පිළිවෙළක් ඇති කිරීමට අවශ්‍යයි.

අපි විශ්වාස කරනවා, පළාත් සභා ඡන්දයක් ලැබෙන්නේ නැහැ කියලා. උතුරේ පළාත් සභාව විසිරිලා, උතුරුමැද පළාත් සභාව විසිරිලා, නැඟෙනහිර පළාත් සභාව විසිරිලා, සබරගමුව පළාත් සභාව විසිරිලා. ලබන අප්‍රේල් මාසයේ බස්නාහිර පළාත් සභාව විසිරෙනවා, ඌව පළාත් සභාව විසිරෙනවා, දකුණු පළාත් සභාව විසිරී යනවා. වයඹ පළාත් සභාව විසිරිලා. මධ්‍යම පළාත් සභාව විසිරිලා. කෝ ඡන්දය? අපි අහන්නේ ඡන්දය තියන්නේ නැත්තේ ඇයි කියලයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක් නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව ඡන්දය කල් දමන්නට බැහැ කියලා ශ්‍රේෂ්ඨාධිකරණය තීරණයක් දීලා තිබෙනවා නම්, පළාත් සභා ඡන්දය කල් දමන්න උත්සාහ කළ පනතේදී ශ්‍රේෂ්ඨාධිකරණය පැහැදිලි තීරණයක් දුන්නා, "ඡන්දය කල් දමන්න බැහැ, මහ ජනයාගෙන් අනුමැතියක් ගන්න ඕනෑ" කියලා. It has to go to a referendum. නමුත් මේ ආණ්ඩුව, ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය කට වචනයට පමණක් සීමා කරගෙන තිබෙන මේ ආණ්ඩුව, ඡන්දය ඝාතනය කර දමා, මේ දක්වා ඡන්දයක් දෙන්නේ නැහැ. ඒ ගැන පුදුම වෙන්නේ නැහැ. මගේ මිත්‍ර රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ඡන්ද එපාය කියා අත ඔසවපු කෙනෙක්.

මට මතකයි, 1983දී නියමිත මහ මැතිවරණය එක්සත් ජාතික පක්ෂය පැවැත්වූයේ නැති බව. මැතිවරණය නොපැවැත්වූ නිසා අන්තිමට ඒකේ ප්‍රතිඵලය මොකක්ද? දහස් ගණන් තරුණ තරුණියන්ව ඝාතනය කරලා දැම්මා; උතුරේත් ඝාතනය කළා, දකුණේත් ඝාතනය කළා. එයින් ගොඩ එන්න අපේ රටට කොච්චර වන්දි ගෙවන්න සිද්ධ වුණාද? එදා අගමැතිතුමා ඡන්දයක් නොපැවැත්වීමට ගත් තීරණයත් වැරැදියි; අද අගමැතිතුමාගේ තීරණයත් වැරැදියි. අපි කියනවා, වහාම ඡන්දය නොතිබ්බොත්, මේ සමාජ අර්බුදයේ විපාකය ලංකාවේ දේශපාලන කඳවුරු සියල්ල හරහා ගමන් කරන භයානක තත්ත්වයකට එනවා කියා.

මම හිතනවා, රජයේ නිලධාරීන්ගේ කාමරයේ ඉන්නවා කියලා මැතිවරණ කොමිසමේ ලොකු මහත්වරු. ලොකු මහත්වරුනි, ඡන්දය තියන්න. අපට වැඩක් නැහැ, ඡන්දය නොතියන කෙකර කථා. අපට ඕනෑ ඡන්දය තියන්න කියන එක විතරයි. මහ ජනයා බලාගෙන ඉන්නවා, ඔබලා ඒ ගැසට් නිවේදනය පිට කරන කල්. ඔබට පුළුවන්, ඡන්දය පැවැත්වීමේ ගැසට් නිවේදනයක් අද පිට කරන්න. කාටද පුළුවන් ඒක නවත්වන්න? ශ්‍රේෂ්ඨාධිකරණයට පුළුවන් නවත්වන්න. එහෙම නැවැත්තුවේ නැත්නම්, ඔබට ඡන්දය තියන්න පුළුවන් කියන එකයි අපේ මතය. ඒ නිසා ඔබතුමන්ලා මැතිවරණ දිනය ප්‍රකාශ කරලා, ශ්‍රේෂ්ඨාධිකරණය ඡන්දය තියන්න දෙන්නේ නැද්ද කියලා බලන්න. එයයි වඩා හොඳ ක්‍රමය. එයින් මැතිවරණ කොමිසමට ගෞරවයක් ලැබෙනවා.

මම තව එක කාරණාවක්, දෙකක් කියන්න අවසර ඉල්ලා සිටිනවා. මේ පාර්ලිමේන්තුව ගැනත් කරුණු කිහිපයක් කියන්න ඕනෑ. කථානායකතුමා පුටුවේ නැහැ. එතුමා හිටියා නම් කොච්චර හොඳද. අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට "කොකේන්කාරයෝ" කියන තත්ත්වයට අපහාස කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මොකක්ද කථානායකතුමා කරලා තිබෙන්නේ? මොකක්ද මේ ගැන කථානායකතුමා අද දක්වා කරලා තිබෙන්නේ? මුළු පාර්ලිමේන්තුවටම අපහාස කරලා තිබෙනවා. කිසිම පරීක්ෂණයක් කරලා නැහැ. මීට ඉස්සරලාත් මන්ත්‍රීවරුන්ට අපහාස කළා. මොකක්ද කථානායකතුමා කරලා තිබෙන්නේ? කාන්තාවන්ට අපහාස කළා. මොකක්ද කරලා තිබෙන්නේ? අද දවස කථානායකතුමාගේ වැය ශීර්ෂ අනුමත කරන දිනය. මොකක්ද මේ කථානායකතුමා කරලා තිබෙන්නේ? මොකක්ද අග්‍රාමාත්‍යවරයා කරලා තිබෙන්නේ? මොකක්ද සභානායකවරයා කරලා තිබෙන්නේ? මේවා ගැන කථා කරන්න අද තමයි ලැබුණේ. මම හිතුවා කථානායකතුමා පුටුවේ ඉඳීවි කියලා, කථා කරන්න. එතුමා ගැන මට කනගාටුයි. එතුමාට මම ගරු කරනවා. එතුමාට ගරු කළාට, වැඩේ කරගන්න, තීරණ ගන්න බැරි කනගාටුදායක තත්ත්වයට පත්වීම නිසා පාර්ලිමේන්තුව අද ගණන් ගන්නේ නැති කාසියක් වැනි

ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. පුටුව ගැන මට දුකයි. මේ පුටුව කොහොම හරි රැකගන්න ඕනෑ නිසා තමයි සමහර අය එදා පුටුව උස්සාගෙන ගියේ. ඒක වෙනම කථාවක්. දැන් ඒ ගැන කථා වෙන්නේ නැහැ. මම කියන්නේ, We have lost our credibility. We think that we are the most respected individuals in this country by coming to Parliament and driving in a limousine guarded by security guards. No. If we do not act fast, if we do not take the necessary measures to restore our credibility, the Parliament will not be able to restore our credibility. මේක තමයි ඇත්ත තත්ත්වය. ඊට වඩා කථානායකතුමාට මැදිහත් වෙන්න කියලා වහාම ඉල්ලනවා.

කථානායකතුමා දන්නවාද මම දන්නේත් නැහැ; පාර්ලිමේන්තු සේවකයෝ දන්නවාද දන්නේත් නැහැ; මගේ මිත්‍ර මන්ත්‍රීවරු දන්නවාද දන්නේත් නැහැ. මම නම් පාර්ලිමේන්තුවට ආවේ 1983දී. මම පාර්ලිමේන්තුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිටපතක් ඉල්ලුවාම කවදාවත් මගෙන් රුපියල් 400ක් ගත්තේ නැහැ. ලජ්ජයි, කථානායකතුමනි; ලජ්ජයි, මහ ලේකම්තුමනි; ලජ්ජයි, සහකාර මහ ලේකම්තුමියනි. මෙන්න, අද තත්ත්වය! A copy of the Constitution should be given free by Parliament to the public. Today you all are charging the Members of Parliament when we ask for a copy of the Constitution, which we do not carry all the time. When we want, we will ask the relevant officials to get a copy. පොතෙනුත් දැන් ගහන්නයි හදන්නේ අපිට. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හංගන්න තමයි තියෙන්නේ දැන්; හංගනවා මිසක් වෙන මොනවා කරන්නද? මේක උල්ලංඝනය කරන තරම බැලුවාම මේක රුපියල් 400 නොවෙයි, රුපියල් 4000 කරගෙන අරගෙන තියා ගන්න. කථානායකතුමාට කාමරයේ ඉඳගෙන ඇහෙනවා නම් මම කියනවා, මහජනයාට අයිති දෙය දෙන්න; මන්ත්‍රීතුමන්ලාගෙන් සහ ජනතාවගෙන් මේ රුපියල් 400 ගැනීම අවලංගු කරන්න කියා අදම නියෝග කරන්න කියා.

එපමණක් නොවෙයි. කථානායකතුමාගේ දැනගැනීමට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ වැටුප් සම්බන්ධයෙන් මම කියනවා. පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ වැටුප් අවප්‍රමාණය වීමෙන් වූ වැටුප් විෂමතාවන් ඉවත් කිරීම යන මැයෙන් වූ ලියවිල්ල මම **සභාගත*** කරනවා. I would like this to go into the Hansard.

මෙන්න තමුන්නාන්සේලා හැසිරෙන ආකාරය. ඉහළට එක හැන්දකින්, පහළට තව හැන්දකින්. කනගාටුයි. මම සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුව ඇතුළේ වැටුප් ගැන කථා කරන්නේ නැහැ. අපේ හැන්සාඩ් දෙපාර්තමේන්තුව ඉන්නවා; භාෂා පරිවර්තක දෙපාර්තමේන්තුව ඉන්නවා. ඒ වාගේ මේ පාර්ලිමේන්තුව ගමන් කරවන දෙපාර්තමේන්තු ඉන්නවා. ඒ හැමටම සැලකිය යුතුයි වාගේම ඒ අයට හිමි දීමනා රාශියක් තිබෙනවා. මේ ආයතනයේ විහිදී ගිය සේවකයන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ලේකම්තුමිය මා දෙස බලනවා. ඔබතුමියට නොවෙයි මම මේ කියන්නේ. කනගාටුයි. ඔබතුමිය විතරයි මේ වෙලාවේ මෙතැන ඉඳගෙන ඉන්නේ. අනෙක් ලේකම්තුමන්ලා දෙන්නාත් හිටියා නම් මම කියනවා, කියන්න තියෙන දෙය. අපිට ලැබෙන තොරතුරු අපි මෙතැන කියන්නේ නැහැ. අපිට කනගාටුයි පාර්ලිමේන්තුවට සිද්ධ වෙලා තිබෙන දෙය ගැන. පාර්ලිමේන්තු පරිපාලනය කඩා වැටිලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අපට ඕනෑ නම් විශ්වාස භංග යෝජනාවක් ගේන්න පුළුවන්. අපි ඒක කරන්නේ නැහැ, උඩ බලාගෙන කෙළ ගහගන්න වෙන නිසා. හොඳින් මම මේ කියන්නේ. ඒ වාගේ තත්ත්වයකට තමයි අද පාර්ලිමේන්තුව පත් වී තිබෙන්නේ. කවුරුත් දන්නවා, පාර්ලිමේන්තුවේ තිබෙන යම් යම්

** කථාව අවසානයේ පළ කර ඇත.*

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

ප්‍රශ්න ගැන චෝදනාවලට අවසර දෙනවා නම් සිද්ධ වෙන දෙය මොකක්ද කියා අධිකරණයෙන්. මම මීට වඩා ඒ ගැන කියන්නේ නැහැ. මේවා නවත්වන්නටය කියා මම ඉල්ලනවා.

ඊළඟට අල්ලස් කොමිසමේ නීති නිලධාරින්ගේ වැටුප් ගැන සඳහන් කරන්න ඕනෑ. නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව ලබා දී තිබෙන වැටුප් තලයන් ඒ ක්ෂේත්‍රයේ අනෙක් නිලධාරින්ට ලබා දී නැහැ. අල්ලස හා දූෂණය තුරන් කිරීම ගැන බොහෝ කථා කරන මේ රජය අල්ලස් කොමිසම ශක්තිමත් කළ යුතු යයි කියා ගනිමින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට හා නීතිපති දෙපාර්තමේන්තුවට ලබා දුන් වැටුප් වැඩි කිරීම හා දීමනා අල්ලස් කොමිසමේ සිටින නිලධාරින් 28 දෙනාට ලබා නොදුන්නේ ඇයි, ඒ අංශවල සේවය කරන අනික් නිලධාරින්ට ලබා නොදෙන්නේ ඇයි?

අපේ මිත්‍ර සේනාධිරාජා මන්ත්‍රීතුමා කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් හැදුවාය කියා. කවුරුවත් හැදුවේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත මිශ්‍ර වාර්තාවක් හැටියට -වාර්තා දහයක්ද කොහේද- අගමැතිතුමා ඉදිරිපත් කළා. එම නිසා තමන්ට ඕනෑ දෙය පමණක් හදා ගන්නා දෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් වන්නේ නැහැ කියන එක පමණයි මහින්ද රාජපක්ෂ මැතිතුමා පැහැදිලිව කියා තිබෙන්නේ. ඒකීය රාජ්‍යය වෙනස් කරන්නට අපි සහයෝගයක් දෙන්නේ නැහැ. අපේ රණවිරුවන්ට ජීවිත පූජා කරන්නට සිද්ධ වුණේ මේ ඒකීය රාජ්‍යය රකින්නයි. ඒකීය රාජ්‍යය දිනා ගැනීම සඳහා ජීවිත පූජාවෙන් සටන් කළ රණවිරුවන් හා නායකයන් අද ජිනීවාහි යුද්ධාධිකරණයට ගෙනයන්න හදනවා. ගරු ජනාධිපතිතුමා කියනවා, ඒක සිද්ධ විය යුතු නැහැ කියා. ඒකනේ ඇත්ත තත්ත්වය. ඒකාබද්ධ විපක්ෂය හැටියට අපි ඊට කලින් ඒ ගැන කිව්වා. නවනීදන් පිල්ලේ මැතිනියට අපේ රටට එන්නට එපාය කිව්වේ එතුමියගේ පක්ෂපාතිත්වය නිසායි. එතුමිය ස්වාධීන නැහැ. එම නිසා පැමිණීම සුදුසු නැහැ කිව්වා. මම ඊට වඩා කියන්න යන්නේ නැහැ මේ කාරණාව ගැන. මේ කාරණාව ආපසු ගනිව්.

Lord Naseby has visited this House over and over again for the last 30 years. What did Lord Naseby get up and say in the House of Commons? He said that Britain is wrong, that Britain has given wrong figures, the British confidential documents prove that the figures given to Geneva by Britain and the Co-sponsors are all misleading, false and has no basis and therefore, withdraw the Resolution against Sri Lanka. That is what Lord Naseby stated.

මම මේ කාරණාව කියන්නේ දැන්වත් මේ අවසාන මොහොතේදීවත් තමුන්නාන්සේලා අපි,- ජාතික විගණන කාර්යාලයට මම ස්තුතිවන්ත වෙනවා. අපි මැතිවරණ කොමිසමටත් ස්තුතිවන්ත වෙනවා. මොකද, පළාත් පාලන ඡන්දය පැවැත්වීමට කටයුතු කිරීම ගැන.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩි දෙකක් දෙන්න. අපි කාටත් කල්පනා කරන්න පුළුවන් නම්, පළාත් පාලන ආයතනවල, මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභාවල බලය වැඩි කිරීම තමයි වඩා හොඳ දේ. මහජනයා කිට්ටුම තැන එයයි. අද තිබෙන තාක්ෂණ දැනුම අනුව, තාක්ෂණ යන්ත්‍රණයන් පාවිච්චි කරන්නට පුළුවන්කම තිබෙනවා. පරිගණකයේ සිට අලුත්ම තාක්ෂණය තිබෙන කාලයේ ගෙදර දොරේ සිට ඡන්ද දායකයාට

තමන්ගේ නගර සභාවේ නගරාධිපතිට කථා කරන්න පුළුවන් ක්‍රම තියෙද්දී, ඒ පත් වෙච්ච දහස් ගණන් අය සමඟ අපි බලය වැඩි වැඩියෙන් මේ පළාත් පාලන ආයතනවලට දීම සඳහා වූ ක්‍රියාදාමයට කැපවී සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම විශාල සේවාවක් කර තිබෙනවා. මගේ මිත්‍රයන් සමහර විට එය විවේචනයට ලක් කරයි. එහි අඩු පාඩු නැතිව නොවෙයි. නමුත්, මේ පත් කරපු කොමිෂන් සභා අතරින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විශාල සේවාවක් අලුතින් ඉෂ්ට කරලා තිබෙනවා. ඒ වාගේම, අවුරුදු 41ක් මුදල් කොමිෂන් සභාව වැඩ කරලා තිබෙනවා. නමුත්, මේ රටේ ජාතික ධනය නාස්ති වන ආකාරයට පළාතෙන් පළාතට පළාත් සහා හරහා කිසිවක් ගැන දකින්නේ නැති මුදල් කොමිසමක් තමයි තිබෙන්නේ කියන එකත් සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම, මේ රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන යම් යම් වගන්ති අලුතින් අර්ථ නිරූපණය කිරීම සඳහා ජනාධිපතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීමේ වැදගත්කම අපි යළිත් සඳහන් කරන්නට ඕනෑ. අර බලන්න, මේ සභාවේ රාජකාරි කරන සේවකයන් අර එල්ලාගෙන ඉන්නේ මොකක්ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
**(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)**
(An Hon. Member)

කාඩ් එකක්. [බාධා කිරීමක්] මරණාධාර සමිතියක එකක් වාගේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
**(மாண்புமிகு தினேஷ் குணவர்தன)**
(The Hon. Dinesh Gunawardena)

කාඩ් එකක්ද? මොකක්ද ඒ? මේවා මේ පාර්ලිමේන්තුවේ කවදාවත් දැක්කේ නැති දේවල්.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
**(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)**
(The Hon. Anura Sidney Jayarathne)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාට පේන්නයි ඒක එල්ලා තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
**(மாண்புமிகு தினேஷ் குணவர்தன)**
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමා නොවෙයි නේ එල්ලුවේ. පොඩ්ඩක් ඉන්න. ඔබතුමාගේ එල්ලපු දවසට ඔබතුමා මෙතැන ඇවිල්ලා අඬයි. තේරුණාද? [බාධා කිරීම] ඊළඟට එල්ලන්නේ මන්ත්‍රීවරුන්ගේ. ඒක හොඳින් මතක තියා ගන්න. මේ පාර්ලිමේන්තු සභා ගර්භය. [බාධා කිරීම්]මේක තමයි උත්තරීතරම තැන. එළියේ ඕනෑ එකක් එල්ලා ගන්න. මේ සභා ගර්භය. මේ රටේ මන්ත්‍රීවරු වාගේම සේවකයන් සියලුදෙනා මේ සභා ගර්භයේ විශේෂ තත්ත්වයක් රකිනවා. මොකක්ද මේ පාර්ලිමේන්තුවට කරගෙන යන දේ? පරිපාලනය කඩා වැටිලා. පාලන තන්ත්‍රය කඩා වැටිලා. රටේම සිද්ධ වෙන දේ පාර්ලිමේන්තුවටත් කරන්න ද හදන්නේ? ඒ නිසා ගරු අග්‍රාමාත්‍යතුමාට ඉතා ඕනෑකමින් කියනවා, පාර්ලිමේන්තුව විසුරුවා හරින්න දැන් කාලය ඇවිල්ලා තිබෙනවා කියලා. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් තොරව මේ කරන විවාදවලින් වැඩක් වෙන්නේ නැහැ. රටම බලන් ඉන්නේ පාර්ලිමේන්තු මහා ඡන්දයක්. එය ලබා දීම තමයි සුදුසු කියමින් මගේ කථාව අවසන් කරනවා.

***සභාමේසය මත තබන ලද ලියවිලි:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள் :*
*Documents tabled:*

පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ වැටුප් අවප්‍රමාණය වීමෙන් වූ වැටුප් විෂමතාවන් ඉවත් කිරීම

ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුව සුවිශේෂ වූ ස්වාධීන ආයතනයකි. එහි කාර්ය මණ්ඩලය එම ආයතනයටම ආවේණික වූ රාජකාරි ඉටු කිරීම සඳහා බඳවා ගත් පිරිසකි. එබැවින් ආරම්භයේ සිටම ඔවුන්ටම විශේෂිත වූ වැටුප් ක්‍රමයක් ලබා දී තිබිණි. මෙම වැටුප් ක්‍රමයේ වැටුප් පරිමාණ රාජ්‍ය සේවයේ වැටුප් පරිමාණවලට අනුගතව සකස් කර තිබුණ ද ඒවා පාර්ලිමේන්තුවේ A සිට N දක්වා වන වැටුප් කාණ්ඩවලට උචිත සේ ගළපා තිබිණි. එය වගු අංක I යටතේ දක්වා ඇත.

වගු අංක I – 2005.12.31 දිනට

| පාර්ලිමේන්තු සේවය | | රාජ්‍ය සේවය | |
|---|---|---|---|
| වැටුප් කාණ්ඩය | මාසික මූලික වැටුප | වැටුප් කාණ්ඩය | මාසික මූලික වැටුප |
| A | 8,265/= | T.B. 1.4 | 8,265/= |
| B | 9,040/= | T.B. 2.2 | 9,040/= |
| C | 9,480/= | T.B. 2.3 | 9,480/= |
| D | 10,290/= | T.B. 2.5 | 10,290/= |
| E | 11,090/= | T.B. 3.6 | 11,090/= |
| F | 11,720/= | T.B. 3.7.1 | 11,720/= |
| G | 13,125/= | T.B. 5.1.2 | 13,125/= |
| H | 14,385/= | T.B. 5.3 | 14,385/= |
| I | 16,275/= | T.B. 5.6 | 16,275/= |
| IA | 17,915/= | T.B. 6.1 | 17,915/= |
| J | 18,580/= | T.B. 6.2 | 18,580/= |
| K | 19,920/= | T.B. 6.4 | 19,920/= |
| L | 23,045/= | T.B. 7.1 | 23,045/= |
| M | 28,985/= | T.B. 7.6 | 28,985/= |
| N | 47,515/= | T.B. | 47,515/= |

තවද රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවූ සියලූ අවස්ථාවල එයට සමාන ප්‍රතිශතයකින් පාර්ලිමේන්තු සේවයේ වැටුප් ද වැඩි විය. මෙම ප්‍රතිපත්තිය 2005.12.31 දක්වා අනුගමනය කරන ලදී.

-02-

2006.01.01 දින සිට තත්ත්වය:

රාජ්‍ය සේවයේ 2006.01.01 දින සිට වැටුප් වැඩි වීමක් සිදු කරන ලදී. එය පදනම් කරගෙන පාර්ලිමේන්තු සේවයේද වැටුප් වැඩි වීමක් සිදු කරන ලදී. නමුත් මෙම වැටුප් සංශෝධනයේදී පාර්ලිමේන්තු සේවයේ වැටුප් රාජ්‍ය සේවයේ වැටුප්වලට වඩා අඩු ප්‍රතිශතයකින් වැඩි කර තිබීම නොගැලපුවට කරුණකි. මේ නිසා පාර්ලිමේන්තු සේවයේ වැටුප් පරිමාණ දැඩි ලෙස අවප්‍රමාණය වී ඇත. මෙය වගු අංක II යටතේ දැක්වේ.

වගු අංක II – 2006.01.01 දින සිට (රා.ප.ව.ලේ. 2006/06 අනුව)

| පාර්ලිමේන්තු සේවය | | රාජ්‍ය සේවය | |
|---|---|---|---|
| වැටුප් කාණ්ඩය | මාසික මූලික වැටුප | වැටුප් කාණ්ඩය | මාසික මූලික වැටුප |
| A | 12,340/=<br>130/=, 145/=, 160/= | P.L.I. (step 22)<br>(පෙර T.B. 1.4) | 14,375/=<br>110/= 120/= 130/= 140/= |
| B | 13,655/=<br>115/=, 120/=, 135/= | M.N. 1 (step 12)<br>(පෙර T.B. 2.2) | 14,740/=<br>115/=, 120/=, 130/= |
| C | 14,670/=<br>185/=,225/=, 320/= | M.N. 11 (step 01)<br>(පෙර T.B. 2.3) | 15,215/=<br>240/= 320/= 360/= |
| D | 15,670/=<br>185/=, 215/=, 320/= | M.N. 11 (step 23)<br>(පෙර T.B. 2.5) | 16,680/=<br>240/= |
| E | 16,720/=<br>320/=<br>400/= | M.N. 5 (step 01)<br>(පෙර T.B. 3.6) | 16,920/=<br>300/=, 365/=, 400/= |
| F | 19,600/=<br>365/= | M.N. 7 (step 01)<br>(පෙර T.B. 3.7.1/3.7.2) | 20,030/=<br>365/=, 500/= |
| G | 21,060/=<br>365/=<br>450/= | S.L.I. (step 01)<br>(පෙර T.B. 5.1.2) | 22,935/=<br>645/=, 790/= |
| H | 22,885/=<br>365/=<br>500/= | S.L.I. (step 05)<br>(පෙර T.B. 5.3) | 25,575/=<br>645/=, 790/=, 1,050/= |
| I | 25,515/=<br>645/=<br>790/= | S.L.I. (step 07)<br>(පෙර T.B. 5.6) | 26,805/=<br>645/=,<br>790/=,<br>1,050/= |
| IA | 28,095/=<br>645/=<br>790/= | S.L.I. (step 12)<br>(පෙර T.B. 6.1) | 30,175/=<br>790/=,<br>1,050/= |
| J | 30,175/=<br>790/=<br>1,050/= | S.L.I. (step 13)<br>(පෙර T.B. 6.2) | 30,965/=<br>790/=,<br>1,050/= |
| K | 32,545/=<br>790/=<br>1,050/= | S.L.I. (step 15)<br>(පෙර T.B. 6.3) | 32,545/=<br>790/=<br>1,050/= |
| L | 36,755/=<br>1,050/= | S.I. (step 20)<br>(පෙර T.B. 7.1) | 36,755/=<br>1,050/= |
| M | 42,005/=<br>1,050/= | S.L.I. (step 25)<br>(පෙර T.B. 7.6) | 42,005/=<br>1,050/= |
| N | 47,515/=<br>1,425/= | | 47,575/=<br>1,425/= |

-03-

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රා.ප.ච.ලේ. 2006/06 පදනම් කරගෙන පාර්ලිමේන්තු සේවයේ වැටුප් පරිමාණ සැකසීමේදී A සිට IA දක්වාවූ වැටුප් කාණ්ඩවල වැටුප් පරිමාණවල අගය අවප්‍රමාණය වී ඇති බව ඉහත වගුවෙන් පෙනී යන අතර, එම චක්‍රලේඛනයේම දිගුවක් මත රා.ප.ච.ලේ. 2016/03 පදනම් කරගෙන වර්තමානයේ වැටුප් සැකසීමේදී කලින් සිදුවූ එම අසාධාරණයම නැවතත් සිදුවී ඇති බව පෙනී යයි.

එබැවින් ඉහත සඳහන් ආකාරයෙන් සිදුවූ එම විෂමතාවන් ඉවත් කරගැනීම සඳහා 2016.01.01 සිට පාර්ලිමේන්තු සේවයේ A සිට N දක්වා වූ වැටුප් කාණ්ඩ පහත සඳහන් වැටුප් පරිමාණවල පිහිටුවීමට කටයුතු කරන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමු.

03/2016

| වැටුප් කාණ්ඩය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ~~2016/03~~ |
|---|---|
| A | P.L.I. (step 22) 29,750/= 250/= 270/= 300/= |
| B | M.N. 1 (step 12) 30,490/= 350/= 495/= 660/= |
| C | M.N. 4 (step 01) 31,490/= 445/= 660/= 730/= |
| D | M.N. 1 (step 23) 34,485/= 495/= 660/= |
| E | M.N. v (step v) 34,980/= 495/= 660/= |
| F | M.N. 7 (step 01) 41,580/= 755/= 1,030/= |
| G | S.L.I. (step 01) 47,615/= 1,335/= 1,630/= 2,170/= |
| H | S.L.I. (step 05) 52,955/= 1,335/= 1,630/= 2,170/= |
| I | S.L.I. (step 07) 55,625/= 1,335/= 1,630/= 2,170/= |
| IA | S.L.I. (step 12) 62,595/= 1,630/= 2,170/= |
| J | S.L.I. (step 13) 64,225/= 1,630/= 2,170/= |
| K | S.L.I. (step 15) 67,485/= 1,630/= 2,170/= |
| L | S.I. I (step 20) 76,175/= 2,170/= |
| M | S.L. 3 88,000/= 2,700/= |
| N | S.L. 4 98,650/= 2,925/= |

පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය වෘත්තීය සමිති එකමුතුව

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.50]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම වැය ශීර්ෂ විවාදයේ පළමුවැනි දවසේ අද කථා බහට ලක්වෙන මේ වැය ශීර්ෂ ගණනාවට අදහසක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. මට ප්‍රථම කථා කළේ, අපි ගරු කරන ජ්‍යෙෂ්ඨ, බුද්ධිමත් ගරු දිනේෂ් ගුණවර්ධන හිටපු ඇමතිතුමා. වෙනදා ඉතාම හරබර වේගවත් කථාවක් එතුමා කරද්දී, අපි කොහේ හිටියත් ඔබතුමාගේ කටහඬ, ඔබතුමාගේ කාරීකත්වය පිළිබඳව නිරන්තරයෙන් අහනවා, ගරු මන්ත්‍රීතුමා. නමුත්, අද ඉතාමත්ම හඬ බාල කරලා යම්කිසි දුකක්, වේදනාවක්, කනගාටුවක් හිතේ තිබෙන විධියට තමයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කළේ. අපට ඒක තේරෙනවා. මට ඒක දැනුණා. එහෙම වෙන්න හේතුව මට දැනුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අය වැය විවාදයේ පළමුවැනි දවසේ මගේ කථාව අවසන් කළේ, "ඔබතුමන්ලාට ඉතා නුදුරුව පිහි ඇනුමක් එනවා, බලාපොරොත්තුවෙන් ඉන්න." කියලා මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාට කියලායි.

ගරු මන්ත්‍රීතුමනි, මේ කියමන තිබෙන හැන්සාඩ් වාර්තාව තවම ඇවිල්ලා නැහැ. මම ඒ හැන්සාඩ් වාර්තාව ඉල්ලුවා, ඔබතුමන්ලාට පෙන්වන්න. මා කියපු කථාව සහිත හැන්සාඩ් වාර්තාව අපේ අතට එන්නත් කලින් ඊයේ හැන්දෑ වරුවේ ඒක සිදු වුණා. එදා ආප්ප කාලා එහෙම කළා. ඊයේ ඉඳිආප්ප කාලා එහෙම කළා. ඊයේ උදේ වරුවේ පාර්ලිමේන්තුවේ ඉඳිආප්ප කෑවා ලු. කාලා, දුන්නා වැඩේ හවස් වෙන කොට. ඒක තමයි ගතිය. ඒක තමයි වැඩ පිළිවෙළ. ඒ වැඩ පිළිවෙළ මේ රටේ ඉදිරි අනාගතයට ගැළපෙන්නේ නැහැ. ඒක අපට තේරිලා තිබෙනවා. ඒක අපේ නායකත්වයට තේරිලා තිබෙනවා. හැබැයි, නායකත්වයට යම් වැඩ පිළිවෙළට යන්න බැහැ. හැබැයි, අපි යනවා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ ඉන්න ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු හැටියට, කියන දේ කරන නායකයකු හැටියට -අපි විශ්වාස කරන්නේ එහෙමයි- ඔබතුමාට පුළුවන්ද අපි ගන්න ඒ තීරණයට ආශිර්වාදය දෙන්න? ඔබතුමාට පුළුවන්ද ඒකට එකතු වෙන්න? නමුත් ඔබතුමාට ඒක කරන්න බැහැ. ඔබතුමන්ලා ඒකට එකතු වන්නේ නැහැ.

සමහර මන්ත්‍රීවරුන් අද ලණු අරගෙන පෙන්නුවා ලු. ඊයේ, ඒ ලණුවේ එල්ලෙන්න තිබුණේ ඒ ගොල්ලන්ට. ලජ්ජයි කියන්න. ඒ ගොල්ලන්ට තමයි ඒකේ එල්ලෙන්න තිබුණේ. ඒ ගොල්ලන් මේ අය වැය ආරම්භයේදී මහා උජාරුවට කිව්වේ මොකක්ද? අපි මේ අය වැය පරද්දලා නැවතත් ආණ්ඩු ගන්න වැඩ පිළිවෙළ තුළ ඉන්නවාය කියන කාරණය එතුමන්ලා කිව්වා. අවසානයේදී මොකද වුණේ? පැදුරටත් නොකියා ඒ අය ගියා. අපේ නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා දැක්කේත් නැහැ. එතුමා ඊයේ හිටියේ නැහැ. ඊයේ අය වැය පරද්දන්න එතුමන්ලා හිටියේ නැහැ. පසු පෙළේ මන්ත්‍රී කණ්ඩායම කැගහන කොට, පසු පෙළේ කණ්ඩායම යමක් කියන කොට ඒකට භය වුණා නම් අපි සන්තෝෂ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපේ වැඩ පිළිවෙළ වෙනුවෙන් යම් තීන්දු - තීරණ අරගෙන තිබෙනවා. හැබැයි, යම් වරප්‍රසාද දීලා අප යටපත් කරන්න කාටවත් බැහැ. අපි යටපත් වෙන්නේ නැහැ. අපි වරප්‍රසාද ලබන්න පාර්ලිමේන්තුවට ඇවිල්ලා නැහැ. අපි තනතුරු, නම්බු නාම ගන්න පාර්ලිමේන්තු ඇවිල්ලා නැහැ. ඒවා දෙන්නම් කියන උදවියට අපි කියනවා, ඒවා අපට එපා කියලා. අපි එදා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් කළා. මේ රටේ මූලා නීතිය ආරක්ෂා කරන්න අපි කටයුතු කළා. එම විධියට මේ රටේ සංවර්ධනය, දියුණුව සහ යහ පාලනය වෙනුවෙන් අපි කටයුතු කරන්න ඕනෑම වෙලාවක පෙනී සිටිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ වාගේම මා මේ කාරණය කියන්න ඕනෑ. 2016 අය වැය ලේඛනයට සම්බන්ධ විවාදයේදී, අපේ "පඩිපෙළේ නීතිඥතුමා" - ගම්මන්පිල මන්ත්‍රීතුමා- එතුමාගේ කථාව අවසන් කළේ කොහොමද? ජනාධිපති වැය ශීර්ෂ විවාදයේදී එතුමා මෙහෙම කියනවා.

"අතිගරු ජනාධිපතිතුමනි, එක්තරා වඳුරෙක්, රජතුමාගේ ඇඟේ මැස්සෝ වහලා ඉන්නකොට රජතුමා මැස්සන්ගෙන් බේරා ගන්න කඩුවෙන් කෙටුවා ලු. හැබැයි, අවසානයේ සිද්ධ වුණේ රජතුමා මිය යෑම පමණයි. ඒක නිසා මෙවැනි නිලධාරින්ගෙන් ඔබතුමා ප්‍රවේසම් වෙන්න."

එහෙම කියලා එදා එතුමා ඒ නිලධාරින්ට ඇඟිල්ල දික් කළා. මොකක්ද ගම්මන්පිල මන්ත්‍රීතුමන්ලා කළේ? නිලධාරින්ගේ අතේ

---

** මෙම ලියවිලි පුස්තකාලයේ ද තබා ඇත.*
** இந்த ஆவணங்கள் நூல்நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** This Documents placed in the Library.*

[ගරු චමින්ද විජේසිරි මහතා]

තිබුණු කඩුව ගත්තා. කඩුව අරගෙන රජතුමාගේ ඇඟේ වහන මැස්සෝ ටික මරන්නයි ගියේ. දැන් රජතුමා ඉතුරු වෙලා. කාවද කපාගෙන තිබෙන්නේ? ගම්මන්පිල මන්ත්‍රීතුමා ඇතුළු ඒ කල්ලිය කපා ගත්තේ නැද්ද? කැපුණේ නැද්ද? කෙටුණේ නැද්ද? ඒ නිසා අද හවස අනිවාර්යයෙන්ම අපි ගත්තු ඒ තීන්දුව තුළ ඉන්නවා. ඒ සඳහා අපට යම් බලපෑම් තිබෙනවා.

අපි කාරුණිකව ඉල්ලනවා, අපේ හෘදය සාක්ෂියට එකඟව, අපේ පාක්ෂිකයාට දුන්නු පොරොන්දුවට එකඟව, අපි එදා 2015 ජනවාරි 8වැනි දා මේ රටේ 62 ලක්ෂයක් ජනතාව වෙනුවෙන් අපි ගන්න තීන්දුවට කවුරුවත් අකුල් හෙලන්න එපා කියලා. අපි හැම දාම, හැම වෙලාවෙම පක්ෂයේ මතය එක්ක හිටියා. අදත් ඉන්නවා; හෙටත් ඉන්නවා; ඉදිරියටත් ඉන්නවා. හැබැයි, මේ රටට වින කරන, මේ රටේ අහිංසක ජනතාවට විරුද්ධව කටයුතු කරන පුද්ගලයා කවුද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ පුද්ගලයාට එරෙහිවීමේ අයිතිය, වගකීම රටේ වගකිව යුතු සෑම පුරවැසියා සතුවම තිබෙනවාය කියන කාරණය අපි මතක් කරලා දෙනවා. ඒ නිසා අපි ඒ වැඩේ කරනවා. ඒකට අපි සූදානමින් ඉන්නේ. ඒකට කවුරු සහභාගි වෙයිද, නැද්ද කියන කාරණය අපට අදාළ නැහැ. අපි විශ්වාස කරනවා, ඒකාබද්ධ විපක්ෂය කියන කණ්ඩායම අද අපට සහයෝගය දෙයි. අපිත් එක්ක එකතු වෙයි කියලා. මොකද එතුමන්ලා ඉන්නේ හැම දේම පරාජය කරන්නයි.

අපි පැහැදිලිව කියනවා, ඒ විශ්වාසය බොඳවෙමින් යනවා කියලා. අද එතුමන්ලා පාර්ලිමේන්තුව තුළ නැහැ. අද පාර්ලිමේන්තුවට එන්නේ නැහැ කියන ආරංචියක් තිබෙනවා. ඒක නිසා ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඊයේ ඡන්දය පරාජය කරන්න තමුන්නාන්සේලාට එකතු වෙනවාය කියපු අය හවස් වරුවේ ආවේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලාගේ අභිමානය, ගෞරවය පෙන්වන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. නමුත්, එහෙම වෙන්නේ නැහැ. තමුන්නාන්සේලාට එහෙම කරන්න බැහැ. [බාධා කිරීමක්] මොකක්ද, ගරු මන්ත්‍රීතුමනි? මට ඇහෙන්නේ නැහැ.

ඔබතුමාගේ කථාවේදී මේ පාර්ලිමේන්තුවේ නිලධාරින් පිළිබඳව කථා කළා. අපි ඒ ගැන සතුටු වෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩලා, පාර්ලිමේන්තු සම්ප්‍රදාය කඩලා නීති විරෝධීව මේ පාර්ලිමේන්තුව විසුරුවන්න කටයුතු කරන කොට තමුන්නාන්සේලාගේ කණ්ඩායමේ හැසිරීම එදා දැක්කේ නැද්ද? එදා හිටියේත් මේ නිලධාරින් තමයි. මේ නිලධාරින්ට ඒ ප්‍රහාර එල්ල කරපු නිසා තමයි ඔවුන් හඳුනා ගැනීමට මේ කටයුත්ත කළේ. මාත් කියනවා, අද එතුමන්ලා පැළඳ ගෙන සිටින හඳුනා ගැනීමේ කාඩ්පත වෙනස් වෙන්නට ඕනෑ, වෙනස් විය යුතුයි කියලා. ඒ වෙනස් වීම අපිත් අනුමත කරනවා. හැබැයි ඒ සිදු වීමට හේතු වුණේ තමුන්නාන්සේලාමයි කියන කාරණය අමතක කරන්න එපා.

ඒ විතරක් නොවෙයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගැන මා කථා කරන්න ඕනෑ. අපි ඒවා නිර්මාණය කළා. ඒවා වැදගත්. ඒවා අපිම හැදුවා. හැබැයි අපි හදපු දේවල් තුළත් අඩු පාඩු තිබෙනවා. අපි ආණ්ඩු පක්ෂය නියෝජනය කළත්, ඒ අඩු පාඩු පෙන්වා දීමේ යුතුකම, අයිතිය, වගකීම අපටත් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පළාත් සභාව තුළ තිබෙන ප්‍රශ්නයක් පිළිබඳව, හොරකමක් පිළිබඳව, වංචාවක් පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හතරදෙනකු එක්ක ගිහින් මා විසින්ම පැමිණිලි කළා. නමුත් අද වන තෙක් ඒ පිළිබඳව විමර්ශනය කරලා නැහැ. ඇයි ඒවා විමර්ශනය වෙන්නේ නැත්තේ? ඇයි ඒ විමර්ශනය ආරම්භ කරන්නේ නැත්තේ? එය දේශපාලනීකරණය වූ නිසායි. එහෙම නම් ඒ දේශපාලනීකරණය වන වැඩ පිළිවෙළ එදා මහින්ද රාජපක්ෂ යුගයේ තිබුණා වාගේම අදත් තිබෙනවාය කියන කාරණය අපි නොබියව කියනවා. මේ සියල්ල ඉවත් කරන්නට ඕනෑ. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අපි සියලුදෙනාම ඒ වග කීමෙන් යුක්තව කටයුතු කරන්න ඕනෑය කියන කාරණය මේ වෙලාවේ මා මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වැඩ පිළිවෙළ ගැනත් මා කියන්න ඕනෑ. හොඳ ශක්තිමත් වැඩ පිළිවෙළක් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් කරගෙන යනවා. විගණන විමසුම් සඳහා එවනු ලබන වාර්තා පිළිබඳව පසු විපරම් කිරීම සඳහා කටයුතු කරන්නේ නැහැ. ඒ ගැන මා පැහැදිලිව දන්නවා. විගණකාධිපතිතුමා විගණන විමසුම් එවනවා. ඒ විගණන විමසුම්වලට යවන පිළිතුරු තිබෙනවා. ඒ විමසුම්වලට සාර්ථක පිළිතුරු ඉදිරිපත් නොකරන අවස්ථාවලදී විගණනයට ලක් වුණු, අධිභාරයට ලක් වුණු කිසිම දෙයක් අය කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදලා නැහැ. එතැනත් දේශපාලන අතපෙවීම් තිබෙනවා. ඒවා නතර වෙන්න ඕනෑ. ඒවා නතර කළ යුතුයි කියන මතයේ අපි ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කියන කාරණා සියල්ලත් එක්ක ගත්තාම, විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමා ශක්තිමත්ව, නොබියව, එතුමාට ආපු අභියෝග සියල්ල භාරගෙන කටයුතු කළා. එතුමාට ඉදිරියෙනුත්, පිටි පස්සෙනුත් පිහියෙන් ඇනින්න උත්සාහ කළා. ඒ සියල්ල ව්‍යර්ථ කරලා, මේ රටේ අහිංසක ජනතාව වෙනුවෙන්, දුක් විඳින ජනතාව වෙනුවෙන් දැවැන්ත වැඩ පිළිවෙළක් එතුමා ගෙන යනවා. "ගම්පෙරළිය" වැඩසටහන ගමට ගෙන ගියා. දුප්පත් ජනතාවගේ වැඩ පිළිවෙළ හඳුනා ගත්තා. ව්‍යවසායකත්ව හැකියාව තිබුණාට ඒ ව්‍යවසායකත්ව හැකියාවට අවශ්‍ය කරන ප්‍රාග්ධනය, මූල්‍ය හැකියාව නොමැති අය ඉන්නවා. මේ රට දියුණු වෙන්න ඕනෑය කියන අදහස මත, ප්‍රාග්ධනය, මූල්‍ය හැකියාව නොමැති අය වෙනුවෙන් අද හොඳ වැඩ පිළිවෙළක් නිර්මාණය කර තිබෙනවා. මා හිතනවා, මෙය තමයි අපේ රටේ සාර්ථකත්වය කියලා. ශ්‍රම බලකායට අවශ්‍ය හයිය, ශක්තිය දෙන්න ඕනෑ. ශ්‍රමය තිබෙනවා, දැනුම තිබෙනවා. නමුත් ඔවුන්ට ප්‍රාග්ධනය නැහැ, මූල්‍ය හැකියාව නැහැ. ලෝකයේ දියුණු වුණු රටවල්, විශේෂයෙන්ම ශ්‍රම බලකායත් එක්ක ගොඩ නැඟුණු චීනය වැනි රටවල් අද සංවර්ධිත රටවල් බවට පත්වී තිබෙන්නේ ඒ ශ්‍රමයට අවශ්‍ය කරන දැනුම, හයිය, ශක්තිය දුන්නු නිසායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

අද දිනට අදාළ මේ වැය ශීර්ෂ පිළිබඳව කථා කරන්න කරුණු ගණනාවක් තිබුණත්, කථා කරන්න අවස්ථාවක් නැහැ. මා විශ්වාස කරනවා, මේ රටේ සමස්ත ජනතාවගේ බලාපොරොත්තු සඵල කරන වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑ, අපට යන්න වෙනවාය කියලා.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා දීර්ඝ වශයෙන් පැහැදිලි කළා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරෝධීව කටයුතු කිරීම පිළිබඳව. ඒ නිසා මා ඒ ගැන කථා කරන්නේ නැහැ. මේ රටේ කිසිම

පුරවැසියකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පිටින් යන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කර තිබෙනවාය කියා කියනවා නම් ඒකට දඬුවම කොතැනද තිබෙන්නේ? ඒකට දඬුවම් දීම සඳහා කවුරුන්ද ඉන්නේ? ඒ සඳහා කටයුතු කරන්නේ කෙසේද? මේ රටේ නීතියට ගරු කරනවා නම්, මේ රටේ නීතිය කාටත් පොදු නම්, පක්ෂ විපක්ෂ සියලුදෙනා එකතුවෙලා එකාවන්ව කටයුතු කරමුය කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි. ඊළඟට ගරු දිළුම් අමුණුගම මන්ත්‍රීතුමා.

**[අ.භා. 4.00]**

**ගරු දිළුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගෙන් පසුව කථා කරන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. විශේෂයෙන්ම අද දිනයේ සාකච්ඡා කරන මේ වැය ශීර්ෂ පිළිබඳව අපි සියලුදෙනාම කථා කළත්, මේ වැය ශීර්ෂ සඳහා රජය මුදල් සොයා ගන්නේ කොහෙන්ද කියන කාරණය ගැන අපි සාකච්ඡා කරන්නේ නැහැ. අද කොමිෂන් සභා රාශියක වැය ශීර්ෂ, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය සහ එතුමා යටතේ තිබෙන ආයතනවල වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී මේ සියලු වැය ශීර්ෂ සඳහා අද රජය මුදල් ලබා ගන්නේ කොහෙන්ද කියන කාරණය ගැන අපි කල්පනා කර බලන්න ඕනෑ. ඉතිහාසයේ මේ රටට නොයෙකුත් රාජ්‍ය ආදායම් තිබුණා. විශේෂයෙන් කර්මාන්ත හරහා, ලංකා වානේ සංස්ථාව, ටයර් සංස්ථාව, සීනි සමාගම, රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව වැනි රාජ්‍ය ව්‍යාපාර හරහා ලබාගත් මුදලුත් මේ වැය ශීර්ෂවලට යොමු කළා. හැබැයි අද දිනයේ අපි සියලුදෙනා මේ පිළිබඳව කථා කළත්, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය වේවා, කොමිෂන් සභාවල වැය ශීර්ෂ වේවා ඒ සියලු වැය ශීර්ෂවලට බහුතරයක් මුදල් වෙන් කෙරෙන්නේ මේ රටේ දුප්පත් ජනතාවගෙන් අය කර ගන්නා බදු මුදල්වලින්.

වෙනත් විධියකින් කියනවා නම් අපි දෙගොල්ලන්ටම ඡන්දය දෙන ජනතාවගෙන් අය කර ගන්නා බදු මුදල්වලින් තමයි මේ සියලුම වැය ශීර්ෂයන් සඳහා මුදල් වෙන් කෙරෙන්නේ. අද දින විවාදයට ගැනෙන වැය ශීර්ෂයන්වලට අදාළ කොමිෂන් සභා ඇතුළු අනෙකුත් ආයතන දිහා බලපුවාම, මේ ආයතනවලට මුදල් වෙන් කිරීමෙන් අපට ඡන්දය දෙන දුප්පත් ජනතාවට යම් ප්‍රතිලාභයක් ලැබෙනවාද කියන කාරණය පිළිබඳව යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා. මට පෙර කථා කළ ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාත් කිව්වේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට එතුමාත් පැමිණිලි කළා, නමුත් ඒවා පිළිබඳව විභාග කරන්නේ නැහැයි කියලා. අපි පැමිණිලි කළ ඒවාත් රාශියක් තිබෙනවා, ඒවා විභාග කරන්නෙත් නැහැ. ජනතාවගෙන් බදු අරගෙන මේ ආයතනවල වැය ශීර්ෂවලට මුදල් වෙන් කළාට, ඔබතුමන්ලා ඉදිරිපත් කරන පැමිණිලි විභාග කරන්නෙත් නැත්නම්, අපි ඉදිරිපත් කරන පැමිණිලි විභාග කරන්නෙත් නැත්නම් මේකෙන් ප්‍රතිඵලයක් තිබෙනවාද කියන කාරණය පිළිබඳව අපි කල්පනා කරලා බලන්නට ඕනෑ.

මම කියන්නේ ඔබතුමන්ලාට විතරක් නොවෙයි, අපි 225දෙනාටම duty free වාහන හම්බ වෙනවා. නමුත් ඔබතුමන්ලාගේ අය වැය දිහා බලපුවාම පෙනෙනවා, අපි 225දෙනා එකතුවෙලා සාමාන්‍ය මිනිහෙකුට ජීනයකින්වත් වාහනයක් ගන්න බැරි වෙන්න බදු ගහලා තිබෙන බව. ඊයේ පෙරේදා පමණක් නොවෙයි, ඔබතුමන්ලා ඉදිරිපත් කළ අය වැය ලේඛන පහෙන්ම වාහන මිල වැඩි කළා මිසක් අඩු කළේ නැහැ. නමුත් වාහන මිල අඩු කරන එක ඔබතුමන්ලාගේ මැතිවරණ පොරොන්දුවක්. ඔබතුමන්ලාගේ නොවෙයි, දැන් ඔය ඔබතුමන්ලා බණින ජනාධිපතිතුමා දිනවන්න දීපු පොරොන්දුවක්. හැබැයි, ඒ පොරොන්දුව පැත්තක තියලා duty free වාහන හම්බවෙන අපි 225 දෙනා Budget පහකින් වාහනවලට බදු ගහලා තිබෙනවා. ඊයේ අය වැය දෙවෙනි වර කියවීමේ ඡන්ද විමසීම ඉවරවෙලා ගෙදර යන්න හම්බ වුණේ නැහැ, ඉන්ධන මිල වැඩි කළා කියලා SMS එකක් ආවා. මේ සභාවේ ඉන්න 225 දෙනාගේම ඉන්ධන දීමනාව ලැබෙන්නේ ලීටර්වලින්. එම නිසා මිල වැඩි වුණාට ප්‍රශ්නයක් නැහැ. මිල වැඩි වෙන්න, වැඩි වෙන්න දීමනාව වැඩි වෙනවා. නමුත් අපට ඡන්දය දෙන සාමාන්‍ය ජනතාවගේ තත්ත්වය මොකක්ද? ඒ අය ගැන අපට තැකීමක් නැහැ. අපි මේ සභාවේ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරනවා, අය වැය සම්මත කර ගන්නවා. ඊයේ අය වැය දෙවෙනිවර කියවීමේ ඡන්දයත් දිනුවා. කොටසක් පැනලා ගියා, කොටසක් ඉතුරු වුණා. ඉතුරු වුණු අයට අපි ස්තුතිවන්ත වෙනවා. පැනලා ගිය අය අද වැඩේ බලාගනී. ඒ ගැන අපට ලොකු සැලකීමක් නැහැ. මේ ආකාරයෙන් කටයුතු කරනවිට ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කිව්වා වාගේ පාර්ලිමේන්තුව සහ අපි ගැන ජනතාවට විශ්වාසයක් තිබෙයිද කියන කාරණය අපි කල්පනා කරලා බලන්නට ඕනෑ.

අපි උදාහරණයක් විධියට මැතිවරණ කොමිසම ගනිමු. දහනව වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන විට ජනාධිපතිතුමාත් කිව්වා, ඔබතුමන්ලාත් කිව්වා, සියලු දෙනාම කිව්වා, **මැතිවරණ පවත්වනවා කියලා.** අපිත් එම සංශෝධනයට සහයෝගය දුන්නා. අපි දන්නේ නැහැ වැරදුණු තැන මොකක්ද කියලා. මේ රටේ ඉතාම ස්වාධීනව, ඉතාම හොඳට, වෙලාවට මැතිවරණ තිබ්බා. අපේ ගරු මාවෛ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමාත් දීර්ඝ කථාවක් කළා. උතුරේ යුද්ධය තිබෙන කාලයේ මේ රටේ මැතිවරණ තිබුණා. යුද්ධය ඉවර වුණු ගමන් උතුරේ මැතිවරණයක් තිබුණා. මම හිතන විධියට එතකොට මැතිවරණ කොමිෂන් සභාවක් තිබුණේ නැහැ. ඒ මැතිවරණයෙන් තමයි TNA එකේ ගරු මාවෛ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමා වාගේ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට ආවේ. නමුත් අද යුද්ධයක් නැහැ, ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවක් තිබෙනවා. ඒකට කොමසාරිස්වරයෙක් ඉන්නවා, එතුමා ලස්සන කථා කියනවා; කථා කියන්න දක්ෂයි. නමුත් අද වෙනකම් පළාත් සභා මැතිවරණය පවත්වන්නට මැතිවරණ කොමිසමට බැරි වුණා. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාම කියනවා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පැමිණිලි විභාග කරන්නේ නැහැ කියලා, අපි සියලුදෙනාම එකඟ වෙනවා මැතිවරණ කොමිසම මැතිවරණ පවත්වන්නේ නැහැයි කියලා.

අද දින ජාතික පොලිස් කොමිෂන් සභාවේ වැය ශීර්ෂයත් විවාදයට ඇතුළත් වෙනවා. පොලිස් කොමිසම ගැන දහනව වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඇතුළත් වුණා. පොලිස් කොමිසමට අයිති සියලු දේ කොමිසම හරහා පමණක් ක්‍රියාත්මක වන බවයි සඳහන් වුණේ. හැබැයි, දැන් අපට පේනවා එහෙම වෙන්නේ නැහැයි කියලා. අපි දන්නා විධියට අද පොලිස් ස්ථානාධිපතිවරුන් පත් කෙරෙන්නේ කොමිසමේ නිර්දේශ පිට නොවෙයි. අපට ආරංචිවෙලා තිබෙනවා, සමහර පොලිස් නිලධාරින් නොයෙකුත් මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වලට ගිහින් ලියුම් ගන්න බලාගෙන ඉන්නවා කියලා. ඒ මොකද? ඒ ලියුම හම්බ වුණොත් තමයි ඒ පළාතේ පොලිස් ස්ථානාධිපතිවරයා හැටියට පත්වෙන්න පුළුවන් වෙන්නේ.

[ගරු දිළුම් අමුණුගම මහතා]

කොළඹ අපරාධ කොට්ඨාසයේ - CCD - එකේ ස්ථානාධිපතිතුමාව පොලිස් කොමිසමේ තීන්දුවක් නොමැතිව ස්ථාන මාරු කරලා තිබෙනවා කියලා එතුමා ඉදිරිපත් කළ පැමිණිල්ල මා සතුව තිබෙනවා. මම මේ ලේඛනය සභාගත* කරනවා.

එතුමාම පොලිස් කොමිසමට ඉදිරිපත් කළ පැමිණිල්ලක් තිබෙනවා. අත් අඩංගුවට ගත් සැකකරුවෙකුට නීත්‍යානුකූල නොවන දෙයක් කිරීමට උසස් නිලධාරින් දෙදෙනෙකු ලබා දීපු උපදෙස් ක්‍රියාත්මක නොකිරීම නිසා තමයි එතුමාව ස්ථාන මාරු කරලා තිබෙන්නේ. මේක ඇත්තද කියලා සොයා බලන්න, මේ එතුමාගේ පැමිණිල්ල. සැකකරුවෙකුට කරන්නට පුළුවන් නීත්‍යානුකූල නොවන දේ මොකක්ද? නීත්‍යානුකූල නොවන දේ නම් මම හිතන විධියට එක්කෝ ඝාතනයක් කරන්නට ඕනෑ, එහෙම නැත්නම් වෙනත් දෙයක් කරන්නට ඕනෑ. ඒ නිසා licence පිට මිනී මැරුවේ නැත්නම්, ඒ අයගේ උපදෙස් පිළිපැද්දේ නැත්නම් අද පොලිස් නිලධාරින් transfer කරන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඉතින් වර්තමාන කාලයේ එහෙම කරනවා නම්, දුප්පත් ජනතාවගේ මුදලින් නම් මේ කොමිෂන් සභා නඩත්තු වෙන්නේ, මේවා හරහා අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියන කාරණය කල්පනා කරන්න අවශ්‍යයි. අද මේ බදු අය කරන්නේ දුප්පත් ජනතාවගෙන්. Duty free වාහන 225ක යන අපි දුප්පත් අයට වාහනයක් ගන්න බැරි වෙන්න, සමතලා වෙන්න බදු ගහලා තිබෙනවා. එතැනින් නවතින්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. කාබන් බද්ද කියලා බද්දක් ගහනවා. කාබන් බද්ද අලුත් වාහනවලට අඩුයි. කාබන් පිටවීම අලුත් වාහනවල අඩු ඇති; පරණ වාහනවල වැඩි ඇති. ඒක වෙනම කථාවක්. හැබැයි, අලුත් වාහන තියෙන්නේ කාටද? ලක්ෂ 300, 400, 500 වාහන තිබෙන්නේ අපි 225දෙනා ළඟ සහ ලංකාවේ ඉන්න ධනවත්ම අය ළඟ. ඒ අයගේ වාහනවලට බද්ද අඩුයි. කොහේ හරි තියෙන පරණ කාර් එකක් අරගෙන ගමේ තියාගෙන වෙසක් පෝයට විතරක් වෙසක් බලන්න යන බණ්ඩියියාගේ කාර් එක අවුරුද්ද පරණ නිසා, සමහර විට අලුත්ම වාහනයට වැඩිය බද්දක් වදිනවා ගමේ ඉන්න ඒ දුප්පත් අහිංසක මනුෂ්‍යයාගේ කාර් එකට. ට්‍රැක්ටරයට මේ බද්ද අදාළ වෙනවා; ත්‍රීරෝද රථයට අදාළ වෙනවා. වාහනය පරණ වෙන්න, පරණ වෙන්න වෙන්න මේ බද්ද වැඩි වෙනවා. දුප්පත් මිනිහා තමයි පරණ වාහනයක් ගන්නේ. සල්ලි තියෙන මිනිහා තමයි අලුත් වාහනයක් ගන්නේ. හැබැයි, බද්ද එන්න එන්න වැඩි වෙන්නේ වාහනය පරණ වෙනකොට. ගමේ නතර කරලා තිබෙන කාර් එකට බද්ද වැඩියි; දවස ගණනේ නුවර නගරය වටා, කොළඹ නගරය වටා සිය සැරයක් දුවන බෙන්ස් කාර් එකට වදින බද්ද අඩුයි. මෙහෙම ඒවා තමයි අද මේ අය වැය හරහා ඉදිරිපත් කරලා තියෙන්නේ. මේ වාගේ නොයෙකුත් දේවල් ඉදිරිපත් වෙලා තිබෙනවා.

මත්ද්‍රව්‍ය පිළිබඳවත් සඳහන් කළා. අපි හොඳ දේ ගැනත් කියන්න ඕනෑ. මේ වෙනකොට මත්ද්‍රව්‍ය විනාශ කිරීම, නැත්නම් මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයෝ නැති කිරීමේ හොඳ පිළිවෙතකට පොලීසිය අවතීර්ණ වෙලා තිබෙනවා. හැබැයි, 2015 වෙනකොටත් මේ රටේ මත්ද්‍රව්‍ය පාලනය කරලා තිබුණු බව අපි කියන්න කැමැතියි. මේ තත්ත්වයට පත් වෙලා තිබුණේ නැහැ. පාතාලය පාලනය කරලා තිබුණා. ඒ නිසා ඔය කියන යහ පාලන රජය යටතේම තමයි මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වුණේ. ඒ රජය යටතේම තමයි පාතාලය ව්‍යාප්ත වුණේ. ඒ රජය යටතේම ව්‍යාප්ත වෙච්ච පාතාලය සහ මත්ද්‍රව්‍ය තමයි අද මැඩලන්න වෙහෙසෙන්න සිද්ධ වෙලා තියෙන්නේ කියන කාරණය අපි මතක් කරන්න අවශ්‍යයි. ඒ නිසා මේක විශේෂිත කාරණයක් හැටියට සලකන්න අමාරුයි. මත්ද්‍රව්‍ය මැඩලීම සහ පාතාලය මැඩලීම කළ යුතුයි. වර්ධනයවීමට ඉඩදීම ඔබතුමන්ලාගේ වැරැද්දක්. ඒ වැරැද්ද දැන් නිවැරදි කරලා ආපසු ඒකත් විශාල දෙයක් හැටියට ප්‍රකාශ කරනවා නම්, ඒකත් ඒ තරම් හොඳ කාරණයක් නොවෙයි කියන එක මම මතක් කරන්නට අවශ්‍යයි.

මීට වඩා දීර්ඝව අදහස් දක්වන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වේවා; විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වේවා; මොන සංශෝධනයන් ගෙනැල්ලා මොන කොමිෂන් සභා පත් කළත්, පාර්ලිමේන්තුවේ සිටින අපි 225දෙනාට ගෙන්වන වාහන, අපට ගෙවන වැටුප්, නිලධාරින්ට දෙන වාහන, ඒ අයට ගෙවන වැටුප්, යන මේ සියල්ලම සඳහා වැයවන හැම රුපියලක්ම අද ලබා ගන්නේ අපව මෙතැනට පත් කරන මිනිසුන්ගෙන්. කිසිම රාජ්‍ය කර්මාන්තයක් නැති රජයක් හැටියට, එම මුදල් ලබා ගන්නේ මේ රටේ අපව මෙතැනට පත් කරන මිනිසුන්ගෙන් කියන කාරණය අපි මතක තබා ගන්න ඕනෑ. අපි ඒ මිනිසුන්ගෙන් මුදල් ලබා ගන්නවා, නමුත් ඒ මිනිසුන්ට මේකෙන් කිසිම සෙතක් නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කරන මුදලෙන් සෙතක් තියෙනවා. ඒක නැහැ කියන්න බැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කරන මුදලෙන් සෙතක් තියෙනවා. ප්‍රවාහන අමාත්‍යාංශයත් එහෙමයි. නමුත් මේ කොමිෂන් සභා පත් කළත් මැතිවරණ තියන්න බැරි නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට කළ පැමිණිලි පිළිබඳව පරීක්ෂණ නැත්නම්, - අපේ මන්ත්‍රීවරු විසි තිස් දෙනෙක් පැමිණිලි කරලා තිබෙනවා. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාත් පැමිණිලි කළා. - පොලිසියේ ස්ථාන මාරු සහ සියලු දේ සිදු වෙන්නේ පොලිස් කොමිසමේ අනු දැනුමක් නැතිව නම්, ස්ථානාධිපතිවරු පත් වෙන්නේ වෙනත් විධිවලට නම්, මේවාගේ ආයතනවල වැය ශීර්ෂ සඳහා මුදල් වෙන් කරමින් ජනතාවගේ බදු මුදල් වැඩි කරලා ඒ අය තලනවාට වැඩිය මේ සියලු දේ එක්කෝ ආපසු තිබුණු තැනටම ගෙනියන එක හොඳයි කියලා මා කියනවා. දැන් සිදුවන පත්කිරීම් කරන්නෙත් ව්‍යවස්ථාව සභාව කියලා කිව්වත්; මොන සභාව කිව්වත්, කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් ව්‍යවස්ථා සභාවේ සියලු දෙනාම එකතු වෙලා සාකච්ඡා කරලා අගමැතිතුමාට ඕනෑ කෙනාව තමයි පත් කරන්නේ. ඕක නේ වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ස්වාධීන මිනිසුන් ඉන්නේ කොහේද කියලා මම අහන්න කැමැතියි. ලංකාවේ ඉන්නවාද, ස්වාධීන මිනිසුන්? එහෙම මිනිසුන් කොහේවත් නැහැ. ඔබවාට පත් කරන හැම කෙනාම කාගේ හරි මිනිහෙක්. එක්කෝ අගමැතිතුමාගේ මිනිහෙක්; එක්කෝ ජනාධිපතිතුමාගේ මිනිහෙක්; එක්කෝ විපක්ෂනායකතුමාගේ මිනිහෙක්. ස්වාධීන මිනිසුන් නැහැ. ඒ නිසා ජනතාවගෙන් බදු අරගෙන, ජනතාවටම බොරු ස්වාධීන කමක් පෙන්වලා, අර ඌරාගේ මාළු ඌරාගේ පිට තියලා කපනවා වාගේ ජනතාව පිටම තියන වැඩේ දැන් නතර කරන්න. ඇත්ත වශයෙන්ම මෙම කොමිෂන් සභාවල ස්වාධීන බව ඔප්පු කිරීම සඳහා ඒවා මැතිවරණ ක්‍රියාවලිය ඇති කිරීම සඳහා යොදවන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසාන කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා.

---

***** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.**
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[අ.භා.4.10]

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේ පළමුවැනි දිනය අදයි. අද අපි විශේෂයෙන්ම කථා කරන්නේ ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ වැය ශීර්ෂ පිළිබඳවයි. ඊට අමතරව, ජාතික පොලිස් කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභා කාර්යාලය ඇතුළු තවත් වැය ශීර්ෂ රාශියක් ගැනත් අද අපි කථා කරනවා. විශේෂයෙන් මම අද තවත් දෙයක් සඳහන් කරන්න ඕනෑ. ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය අනුමත කිරීම ගැන අද විශාල විරෝධයක් තිබෙනවා. මමත් ඒ විරෝධයේ ඉන්නවා. ඒකට හේතුව තමයි, මේක වැඩියෙන්ම දැනෙන පුද්ගලයා පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන මම වීම. ජනාධිපතිතුමාගෙන් හිරිහැර වූ මන්ත්‍රීවරු ඉන්නවා නම්, වැඩියෙන්ම ඒ හිරිහැරයට පත්වුණු පුද්ගලයාත් මමයි. ඒ, 2014ට කලින්නුයි. පසුගිය ජනාධිපතිවරණයේදී මේ ජනාධිපතිවරයා වෙනුවෙන් වැඩියෙන්ම මහන්සි වුණු පුද්ගලයාත් මමයි. ඒ කාලයේ අපේ සමහර මන්ත්‍රීවරු අනික් පාර්ශ්වය පැත්තට ගියා, අපේ පැත්තේ හිටියේ නැහැ. ජනාධිපතිවරණයේදී වැඩියෙන්ම මහන්සි වුණු පුද්ගලයා ගත්තොත්, ඒත් මමයි. අපේ පක්ෂය ගත් තීන්දුවට, නායකත්වයට මම ඒ වෙලාවේ ගරු කළා. අපේ සමහර මිනිසුන් ජනාධිපතිතුමා දිහා බැලුවේ සතෙකු දිහා බලන විධියටයි. මොකද, ජනාධිපතිතුමා දේශපාලනය කරද්දි ඒ විධියට තමයි හැසිරුණේ.

ජනාධිපතිතුමා එදා පොළොන්නරුවේදී හැසිරුණු හැටි මිනිසුන් දැක්කා. ජනාධිපතිතුමාගේ සහෝදරයෝ අපේ මිනිසුන්ගේ කන් අඩි පැළුවා; හිරිහැර කළා. මම මුලින්ම ඉදිරිපත් වුණු, 2000 වසරේ පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේදී මගේ බාල සහෝදරයා පෝස්ටර් අලවමින් යනකොට, "අරලිය" කියන සහල් මෝල හිමි ජනාධිපතිතුමාගේ සහෝදරයා උණු පාප්ප බාල්දිය මගේ සහෝදරයාගේ ඔළුවට හැලුවා. අපි ඒ මැතිවරණය කළේ එවැනි තත්ත්වයක් යටතේයි. ඒ මැතිවරණයේදී අපේ පක්ෂයේ නායකතුමා තීන්දුවක් ගත්තා. අපි එතුමා ජනාධිපති කළේ එලෙස තීන්දුවක් අරගෙනයි. එවැනි තත්ත්වයන් තියේද්දි, පක්ෂයේ නායකත්වයට ගරු කරලා අපි ජනතාව ළඟට යනකොට ජනතාව ඇහුවා, "මෛත්‍රීපාල සිරිසේනට ඡන්දය දෙන්නේ ඇයි?" කියා. ජනතාව එහෙම අහද්දි, "අපේ පක්ෂය ගත් තීන්දුව අනුව තමයි එහෙම කළේ" කියලා තමයි අපි එතුමා ජනාධිපති ධුරයට පත් කළේ.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

Madam Chair, I rise to a point of Order.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කථාවට ඉඩ දෙන්නය කියා එතුමාට කියන්න. මට ලැබී තිබෙන්නේ කෙටි කාලයක්.

අපි අද එතුමා වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේදී විශාල මුදලක් වෙන් කරනවා. අද මම තවත් දෙයක් කියන්න ඕනෑ. අපි එතුමාට ඡන්ද ලක්ෂ 62ක් අරගෙන දුන්නා. 'රනිල් වික්‍රමසිංහත් එපා, මේ මන්ත්‍රීවරු සියලුදෙනාත් එපා' කියා අපි කියමු. හැබැයි, එතුමාට යුතුකමක් තිබෙනවා, එතුමාට ඡන්දය දුන් හැටදෙලක්ෂයක් ජනතාව වෙනුවෙන් යමක් කරන්න.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විරුද්ධව දමපු නඩුව ඉල්ලා අස් කර ගන්නය කියා ඔබතුමා ජනාධිපතිතුමා හම්බ වෙලා කථා කරලා ඉල්ලීමක් කළා නේද?

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමනි, මාස හයක් මාව බන්ධනාගාරය ඇතුළේ තැබුවේ එතුමාම තමයි කියා ඔබතුමා දන්නේ නැද්ද? එම නිසා එතුමා මාව නිදහස් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා මට කථා කළා. මට නඩුව පැවරුවේ එතුමායි. සරත් ෆොන්සේකා මැතිතුමා ජනාධිපතිවරණයට ඉල්ලූ වෙලාවේ, අපේ පක්ෂයේ කණ්ඩායම යනකොට එතුමා එදා හැසිරුණේ රස්තියාදුකාරයෙක් වාගෙයි. සියයක් පමණ පිරිසක් එක්ක ඇවිල්ලා අපි යන මහ හරස් කරලා, අපට ගහලා, ලොකු අරියාදුවක් කළාට පස්සේ තමයි අපේ පිරිසත් එක්ක එතැනදි ගැටුමක් ඇති වුණේ. ඒ ගැටුමට මාව මාස හයක් බන්ධනාගාරය ඇතුළේ තැබුවා. එහෙම මාස හයක් මාව බන්ධනාගාරයේ තැබු එතුමාම තමයි, ඒ නඩුව අයින් කර ගත්තේ. ඒ නඩුව අයින් කර ගත්තේ නැත්නම් එතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

-වෙනවා. මොකද, එතුමා ජනාධිපති විධියට පත් කළේ අපියි. මාව ඇතුළට දැම්මෙත් එතුමා තමයි. මම විතරක් නොවෙයි, මේ පාර්ලිමේන්තුවේ හිටපු සුබසිංහ මන්ත්‍රීතුමා ඇතුළු 29දෙනෙකු මාස හයක් බන්ධනාගාරයේ සිටියා. අපි ඒ සියලු දේවල් අමතක කරලා එතුමා ජනාධිපති කළා. එහෙම කරලා අපි එතුමාගෙන් සාධාරණයක් බලාපොරොත්තු වුණා.

පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන මම එතුමා ගැන කියන්නම්. අගමැතිතුමාගේ නායකත්වයෙන් යුතුව, අපි සියලුදෙනා එකතු වෙලා රුපියල් කෝටි 26,000ක් වැය කර මොරගහකන්ද ජලාශය හැදුවා. අද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරියේත් තවත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා. මේ ළඟදි අපි හාරසියදෙනෙකුට ඉඩම් දුන්නා.

ඒ පුද්ගලයන් හාරසියදෙනා අතරේ, එතුමාට ඡන්දය දුන් එක් කෙනෙකුවත් නැහැ. ගොඩින් අක්කර භාගයකුයි, මඩින් අක්කර එකහමාරකුයි දැන් දෙනවා. මේ වනවිට ඒ අලුත් ව්‍යාපාරයෙන් පුද්ගලයන් 443දෙනෙකුට ඉඩම් ලබා දීලා තිබෙනවා. එතුමාට ඡන්දය දුන් එක මිනිහෙක්වත් ඒ ඉඩම්වල නැහැ. ඒ නිසා, එතුමා කරන ඒ වැඩවලට විරුද්ධ වීමට අපට සිදු වෙනවා. ඒ දේවල් ගැන අපට වේදනාවක් තිබෙනවා. ඒකයි අප කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මෙන්න මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, එක්සත් ජාතික පක්ෂය මේ මැතිවරණය කල් දමනවාය කියා. එක්සත් ජාතික පක්ෂය නොවෙයි මැතිවරණය කල් දමන්නේ. ජනාධිපතිතුමා තමයි මේ මැතිවරණ කල් දමන්න මුල් වුණේ. අපිට මැතිවරණ කල් දමන්න ඕනෑ වුණේ නැහැ. ජනාධිපතිතුමා අපත් එක්ක සිටිද්දී ඒ දෙපැත්තේ -ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේයි, පොහොට්ටුවේයි- ප්‍රශ්නයක් තිබුණා. ඒ ප්‍රශ්නය බේරා ගන්න තුරු එතුමා ඡන්දයට යන්න කැමැති වුණේ නැහැ. ඒ නිසා ප්‍රාදේශීය සභා මැතිවරණය කල් දමන්න අපට සිද්ධ වුණා. පසුව අපි මැතිවරණයකට ගියා. ඒ දෙදෙනාගේ රණ්ඩුව බේරා ගන්නා තුරු අපව බිල්ලට දුන්නා. එම ප්‍රාදේශීය සභා මැතිවරණය නියමිත

කාලය තුළ පැවැත්වූවා නම්, එය ජයග්‍රහණය කරන්නේ එක්සත් ජාතික පක්ෂයයි.

ඊළඟට, උතුරුමැද පළාත් සභාවේ, නැඟෙනහිර පළාත් සභාවේ, සබරගමුව පළාත් සභාවේ කාලය අවසන් වීගෙන එනකොට ජනාධිපතිතුමා ඒ මැතිවරණයටත් මුහුණ දෙන්න බයෙන් හිටියා. එදා, පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ ඡන්ද විමසුමක් තිබුණා. ඒ ඡන්ද විමසුම පැවැත්වෙන කොට ජනාධිපතිතුමා ඇමෙරිකාවට ගිහිල්ලායි හිටියේ. එතුමා එදා අපේ අගමැතිතුමාගේ කාර්යාලයට කොච්චර දුරකථන ඇමතුම් දුන්නාද? ජනාධිපතිතුමාගේ වුවමනාවට තමයි පළාත් සභා මැතිවරණය කල් දැම්මේ. ඒ, එතුමාට එහි වාසිය ගන්නයි. ඒ නිසා, මීට පස්සේ පක්ෂයක් හැටියට අපිත් මැතිවරණවලට කැමැති වන්නේ අපට වාසිය එන වෙලාවට විතරයි. අපට වාසියක් නැති කිසි වෙලාවක අපි මැතිවරණවලට කැමැති වන්නේ නැහැ. [බාධා කිරීමක්] ඒවා වැහුණත් කමක් නැහැ; ඇරුණත් කමක් නැහැ. ඒ ගැන අපේ හිටපු ජනාධිපතිතුමාත් සාක්ෂි දරනවා ඇති. තමුන්නාන්සේලාත් මැතිවරණ පැවැත්වූවේ එහෙමයි නේ, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි. පළාත් සභාව අවුරුදු පහක් තිබෙන විට අවුරුදු තුනහමාරෙන් විසුරුවා හැර එක එක පළාත් සභාව තනි තනිව ගෙන මැතිවරණ පැවැත්වූවා. අපිත් ඒකට ගොදුරු වුණා. හිටපු ජනාධිපතිතුමාත් ඔය වැඩේ කළා. පක්ෂයක් හැටියට අපිත් ඒ දේ කරනවා. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇඟිල්ල දිගු කළාට අපට චෝදනා කරන්න බැහැ. මේකේ මූලිකයා, අද තමුන්නාන්සේලාත් එක්ක එකට සිටින මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාය කියන කාරණය අමතක කරන්න එපා.

අද අපේ මන්ත්‍රීතුමන්ලාට වාහනයක් දෙනකොට, වෙනත් මොනවා හෝ දෙනකොට ජනාධිපතිතුමා ඒවාට විරුද්ධ වෙනවා. මට පොඩි කාරණයක් කියන්න තිබෙනවා. මෙහි තිබෙන රාජ්‍ය නිලධාරින් සඳහා වන කුටියේ අද ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරි මහත්වරු ඇති. පොලිස්පතිතුමාත් ඇති. ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහනත් අවභාවිත වන බව මා එතුමන්ලාට කියන්න කැමැතියි. මම කියන්න යන මෙන්න මේ කාරණය හොඳට මතක තියා ගන්න. වගකීමක් ඇතිවයි මම මේ කාරණය කියන්නේ. පෙබරවාරි 22වන දා පොළොන්නරුවේ දියබෙදුම පොලීසියේදී මිනීමැරුමක් සිදු වුණා. ඒ මිය ගිය පුද්ගලයා කවුරු එක්කද සිටියේ? ඒ සිද්ධිය පිළිබඳව හොයා බලන්න. ඒ පුද්ගලයා අරගෙන ගිය වාහනය ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහනයක්. 65-0579 තමයි, ඒ වාහනයේ නොම්මරය. ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරි මහත්වරුනි, ඒ වාහනය කවුරු ළඟද තිබුණේ, එය අරගෙන ගියේ කවුද කියා තමුන්නාන්සේලා සොයා බලන්න. මේ ආකාරයට; අයුතු විධියට ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන පාවිච්චි වෙනවා. මේ සිද්ධිය පිළිබඳව හොයා බලන්න. මම වගකීමෙන් යුතුවයි මේ සිද්ධිය ගැන කියන්නේ. පෙබරවාරි 22වන දා දියබෙදුම පොලීසියේදී මිනී මැරුමක් සිදු වුණා; ඒ මිය ගිය පුද්ගලයා 65-0579 නොම්මරය සහිත වාහනය පාවිච්චි කළා; එහි කාන්තාවක් හිටියා. ඒ කාන්තාව කවුද කියා නම් මම කියන්නේ නැහැ. ඒක හොඳ නැහැ. ඒ කාන්තාවගේ සහෝදරයා කවුද කියාත් මා කියන්නේ නැහැ. ඒ සහෝදරයා බැඳපු කෙනා කවුද කියාත් මා කියන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙන්න මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්. අද පොළොන්නරුවට විශාල මුදලක් වියදම් කරනවා. රුපියලක් දෙන්න ඕනෑ තැනට රුපියල් 1,000ක් වියදම් කරනවා. මා පොළොන්නරුවේ කෙනකු හැටියට ඒවාට කැමැතියි. හැබැයි, මේ මුදල් යන්නේ සහෝදරයන් කීපදෙනෙකු අතරටයි. පොළොන්නරුවේ කරන මේ සංවර්ධනයේ නියමුවෝ කවුද? නියමුවා ජනාධිපතිතුමා නොවෙයි. මේවා යන්නේ සහෝදරයන් කීපදෙනෙකු අතරටයි. පොළොන්නරුවේ පාරවලට අතුරන ගල් කාගෙන්ද ගන්නේ? පොළොන්නරුවේ ගොඩනැඟිලි ඉදිකරනකොට ඒවාට අමු ද්‍රව්‍ය සපයන්නේ කවුද? මේවාට වෙනත් අය නැද්ද? වැලි ගන්නේ කාගෙන්ද? කළු ගල් ගන්නේ කාගෙන්ද? සිමෙන්ති supply කරන්නේ කවුද? මේවායේ කොන්ත්‍රාත් කටයුත්ත කරන්නේ යුද හමුදාවයි.

යුද හමුදාවට භාණ්ඩ ගන්නේ කාගෙන්ද? දිසාපතිවරයා සපයනවා. ඒ අණට කීකරු නොවන දිසාපතිවරු මාරු කරනවා. ජනාධිපතිවරයා පොලොන්නරුවට පැමිණි පසු දිසාපතිවරු හතර දෙනෙකු මාරු වුණා. ජනාධිපතිතුමා කියපු තැනට supply එක දුන්නේ නැති දිසාපතිවරුන්ට පොලොන්නරුවේ ඉන්න බැහැ. ඒ වාගේ පාලනයක් පොලොන්නරුවේ තිබෙන්නේ. ඒකයි අපි අද මේ වැය ශීර්ෂයට විරුද්ධ වෙන්න කටයුතු කරන්නේ. මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට, ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මන්ත්‍රීතුමා.

[අ.භා.4.20]

**ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අතිගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය හා ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත ආයතන 25ක් සම්බන්ධයෙන් සිදු කරන විවාදයට සහභාගී වීමට මටත් අවස්ථාවක් ලබා දීම පිළිබඳව පළමුවෙන්ම මා ඔබතුමියට ස්තුතිවන්ත වනවා. අද කරන කථා ටික අහගෙන හිටියාම මට කථාවක් මතක් වුණා. "කලකට රහලු - කලකට වහ වෙනවාලු." කියා පැරණි කියමනක් තිබෙනවා. මේක ඉතාම ජනප්‍රිය කථාවක්. මේ ආකාරයෙන්ම 2015 මැතිවරණ වෙලාවේ අතිගරු ජනාධිපතිතුමා සම්බන්ධව කළ ප්‍රශස්ත ගායනා අපි ඇහුවා. නමුත් අද තමුන්නාන්සේලා ඊට විරුද්ධව කථා කරන දේවලුත් අපි අහගෙන සිටිනවා. ඒ වාගේම අපිත් විපක්ෂයක් හැටියට ලොකු කැප කිරීමක් කර තිබෙන අය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තමුන්නාන්සේ ජනවාරි 10 වැනිදායින් පස්සේ තමයි ආවේ. ඔබතුමා අනික් පැත්තේ හිටියේ.

**ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு லக்ஷமன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)

ඔව්. ඒක තමයි. [බාධා කිරීමක්] හරි. මම ඒ කාරණය පිළිගන්නවා. [බාධා කිරීම්] ඉන්න පොඩ්ඩක්. හැබැයි, 2015 මැතිවරණය වෙලාවෙන් පස්සේ ඔබතුමන්ලාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 47 දෙනෙක් හිටියා. අපට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 161ක් හිටියා. ඒ 161 දෙනා සිටියදීත් ජනාධිපතිතුමා කිව්වා, "ඔබතුමාට සහාය දෙන්න" කියා. එදා රනිල් වික්‍රමසිංහ මහත්තයා අගමැතිවෙලා, එතුමාගේ නායකත්වයෙන් ඔබතුමන්ලා ආණ්ඩුව හදනකොට අපි කවදාවත් ඒවාට බාධා කළේ නැහැ. අපි ඔබතුමන්ලාගේ අය වැය දිනවලා දුන්නා. අපි ඔබතුමන්ලාගේ සියලු පනත් කෙටුම්පත් සම්මත කර දුන්නා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර දුන්නා. අපි කිසි දෙයකට බාධා කළේ නැහැ.

ඒ එක්කම ඊළඟ මැතිවරණයේදී -2015 අගෝස්තු මැතිවරණයේදී- අපේ මැතිවරණ වේදිකාවට මහින්ද රාජපක්ෂ මැතිතුමා ආපු වෙලාවේ එතුමාට අගමැතිකම දෙන්නේ නැහැ කියා කිව්වා. නමුත් ජනතාව තමුන්නාන්සේලාට බලය ලබා දුන්නා. අපි ඒවාත් ඉවසාගෙන හිටියා. නමුත් ආපසු එතුමා අපේ පක්ෂයේ නායකයා හැටියට කටයුතු කරමින් ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් හදලා, අවුරුදු දෙකක් නොවෙයි, අවුරුදු තුනහමාරක් ඒ ආණ්ඩුව අරගෙන ගියා. 2015 තිබුණු ගිවිසුම 2018 දක්වා එතුමා අරගෙන ගියා. අපි කවදාවත් ඒවාට බාධා කළේ නැහැ. අද තමුන්නාන්සේලා අපි කථා කරන්නේ රටේ විධායකය, රජයේ ප්‍රධානියා, අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියාගේ වැය ශීර්ෂ සම්බන්ධවයි. එතුමා සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති කියා අපි හිතනවා. තමුන්නාන්සේලාට වාගේම අපිටත් ප්‍රශ්න තිබුණා. මේ වැය ශීර්ෂයේදී එතුමා වෙනුවෙන් කථා කර, ඡන්දය දීමේ අදහසක් ඇතිව තමයි අද අපි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. තමුන්නාන්සේලාට පෞද්ගලික අදහස් ඇති, තමුන්නාන්සේලාට පෞද්ගලික වෛරක්කාරී චේතනාවන් ඇති. හැබැයි, ජනාධිපති වැය ශීර්ෂය පැරැද්දීමට තමුන්නාන්සේලා කටයුතු කරනවා නම් එය අග්‍රාමාත්‍යවරයාගේ වැය ශීර්ෂය ඇතුළත් අනිකුත් ආයතන 25ක වැය ශීර්ෂවලටත් බලපාවි කියන එක මගේ විශ්වාසයයි. එතුමා අද ජනාධිපති ලේකම් කාර්යාලය හරහා විශාල වැඩ කොටසක් සිදු කරගෙන යනවා. ඒ කටයුතු අපි නිරීක්ෂණය කළොත් පෙනෙනවා, අද වනකොට එතුමා ජනාධිපති ලේකම් කාර්යාලයේ වැඩසටහන් හතක් නිර්මාණය කර තිබෙන බව.

"ග්‍රාමශක්ති" වැඩසටහන, ජල පෝෂක සංවර්ධන වැඩසටහන, "වනරෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහන, "අනාගතය දිනන දරුවෝ" වැඩසටහන වාගේ වැඩසටහන් එතුමා නිර්මාණය කර, අද ඒවා වෙනම ව්‍යාපෘති වශයෙන් ක්‍රියාත්මක වනවා. මම හිතන්නේ ඒ වැඩසටහන්වලට තමයි අද මේ වැය ශීර්ෂයෙන් මුදල් වෙන් කිරීමක් කරන්න අපේක්ෂා කරන්නේ. මේ වැය ශීර්ෂය පරාජය කළොත් වන්නේ ඒ මුදල ඒ ගම්වලට යන එක නැවතීම විතරයි. අද පවුල් ලක්ෂ ගණනක් ඒකෙන් ප්‍රතිලාභ ලබනවාය කියා මම හිතනවා. ඒ ප්‍රතිලාභ ලබන පවුල්වල අනාගතය විනාශ කිරීම තමයි මේ වැය ශීර්ෂය පරාජය කිරීම තුළින් තමුන්නානේස්ලා අපේක්ෂා කරන්නේ.

අද අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගැන කථා කරන්නට ඕනෑ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්තුමිය ගැන තමුන්නාන්සේලා කථා කළා. ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි යැව්වේ කවුද කියන එකත් අපි දන්නවා. පැමිණිලි යවා, ඒ පැමිණිලි විභාග කිරීමේදී දේශපාලන වශයෙන් කටයුතු කිරීම නිසා තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, නීත්‍යානුකූල කොමිෂන් සභාවක් බවට පත් කරන්න එතුමා කටයුතු කළේ. ඒ අනුව තමයි මම හිතන විධියට නීතිපති දෙපාර්තමේන්තුවේ සිටි ඉතාම කෘතහස්ත, ඒ වාගේම වැදගත්, දේශපාලනය නොකරපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් එතුමා පත් කර තිබුණේ.

අද උදේ අපි සරත් ෆොන්සේකා මැතිතුමාගේ කථාව අහගෙන සිටියා. එතුමාට විරුද්ධව දැමූ නඩුවකට තීන්දුවක් දුන් විනිසුරුවරියකගේ උසස්වීමක් සම්බන්ධව විරෝධය දක්වමින් එතුමා කථා කළා. මම හිතන විධියට ජනාධිපතිතුමාගේ නිර්දේශය මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් කරන ලද එම පත්වීම් සම්බන්ධව විනිවිදභාවයකින් තොරව කරන එම ප්‍රකාශය එතුමා මේ අවස්ථාවේදීත් කළා. ඒ වාගේම අපිත් දන්නවා, ජනාධිපතිතුමා අගවිනිසුරු පත් කරනකොට මේ රටේ හිටපු ජ්‍යෙෂ්ඨතම විනිසුරුවරයෙක් පත් කළ බව. එතුමා කිව්වා, "එම නිර්ණායකය අනෙක් තැන්වලටත් ගෙනෙන්න." කියා. එසේ කළ නිසා තමයි මම හිතන විධියට දැනට සිටින ජ්‍යෙෂ්ඨතම විනිසුරුවරියක් අභියාචනාධිකරණයේ සභාපති ධුරයට පත් වෙන්නේ. හැබැයි, චෝදිත පක්ෂයක් හැටියට තමන්ට යම් අවාසිසහගත තත්ත්වයක් යම්කිසි විනිශ්චයකාරවරයෙක් ඇති කරනවා නම්, එතුමාට ඒ නඩුව විභාග කරන මුල්ම අවස්ථාවේම ඒකට එරෙහිව කටයුතු කරමින් ඒ නඩු විභාගයෙන් එතුමිය ඉවත් කරන්න කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරන්න තිබුණා. හැබැයි, එහෙම කළේ නැහැ. ඒ වාගේම එතුමාට තිබුණා ඒ සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කරන්න. හැබැයි, එහෙම කළෙත් නැහැ. ඒවා කිසි දෙයක් සිදු නොකර තීන්දුව දුන්නාට පසුව ඒ තීන්දුවෙන් තමන්ට වෙන අවාසිදායක තත්ත්වය මත එම විනිශ්චයකාරතුමියට අසාධාරණයක් කරනවා නම්, ඒකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ඉඩ දෙනවා නම් මම හිතන විධියට අපි ඒක ප්‍රතික්ෂේප කරන්න ඕනෑ.

අපි විශ්වාස කරනවා, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට ඇඳා තිබෙන ව්‍යවස්ථාපිත ආයතන තුළින් මේ රටේ පරිපාලනය හා මේ රටේ අධිකරණය හා උපරිමාධිකරණවල තිබෙන කටයුතු ඉදිරියට ගෙන යෑම තමයි සිදු කරන්නේ කියා. ඒ නිසා ඔබතුමන්ලාගේ මොන මොන ප්‍රශ්න තිබුණත්, මේ වැය ශීර්ෂ සම්බන්ධව, මේ අය වැය සම්බන්ධව යම් යම් ප්‍රශ්න තිබුණත් එතුමාගේ වැය ශීර්ෂය සඳහා අවශ්‍ය ඡන්දය දීමෙන් ඒකට අපි පක්ෂපාතිත්වය දක්වන බව මේ අවස්ථාවේදී සිහිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තූතියි.

මීළඟට, ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය.

[අ.භා.4.29]

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊයේ දවසේ අය වැය දෙවැනි වර කියැවීමේ විවාදයට අදාළ ඡන්දය පැවතුණා. ඒකෙන් මේ පාර්ලිමේන්තුවේ පක්ෂ-විපක්ෂ මන්ත්‍රීතුමන්ලා මේ රටේ ජනතාවට කරුණු දෙකක් ඔප්පු කර පෙන්නුවා. පළමුවැනි කරුණ තමයි මේ පවතින ආණ්ඩුවට 2025 වනතුරු ඉතාම ශක්තිමත්ව, කොන්ද කෙළින් තබාගෙන යන්න හැකියාව තිබෙනවා කියන එක අපි ඔප්පු කර පෙන්වීම. ඒ වාගේම ඊයේ පැවැති ඡන්දයෙන්

[ගරු හිරුනිකා ප්රේමචන්ද්ර මහත්මිය]

පසුව අපේ පක්ෂයේ උදවියගේ ඇඟට පොඩි ශක්තියක් ආවා. දෙවැනි කරුණ තමයි, විපක්ෂයේ උදවියට විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ විපක්ෂ නායකතුමාට තේරුම් ගියා, නයා නයාම තමයි කියන කාරණය.

ඇත්තටම මට කියන්න තිබෙන්නේ, ඔය නයා නයෙක් කියන එක අපි ඔක්තෝබර් 26 වැනි දා දැන ගත්තා කියන එකයි. ඔය නයා නයෙක් කියා අපිට කලින් ඔබතුමන්ලා දැන ගත්තා. හැබැයි, කනගාටුවට කාරණාව නම් ඊයෙත් ඔබතුමන්ලා මේ නයා නයෙක් නොවෙයි කියා විශ්වාස කරපු එකයි. ඒක තමයි කනගාටුවට කාරණාව වන්නේ. පළමුවෙන්ම මම ඉල්ලා සිටිනවා, මෙතැන සිටිනා විපක්ෂයේ උදවිය නැඟිටලා යන්න කියා. එක්කෝ විපක්ෂව මෙවර අය වැය සඳහා ඡන්දය දෙන්න, නැත්නම් නැඟිටලා යන්න. මොකද, මේ පල්ලෙවත්තේ ගමරාලගේ මෛත්‍රීපාල සිරිසේන කියන චරිතය කවදාවත් ශත පහකට විශ්වාස කරන්න පුළුවන් එකක් නොවෙයි.

ඒක මට වඩා හොඳට ඔබතුමන්ලා දන්නවා. ඒක මට වඩා හොඳට මේ ඉස්සරහ පේළිවල ඉඳගෙන ඉන්න එතුමාගේ සමකාලීනයෝ දන්නවා. ජීවිත කාලය පුරාවට හරියට යාළුවෙක් ආශ්‍රය කරලා නැහැ. කිසි දිනක තමුන්ගේ යටතේ ඉන්න මනුස්සයෙකුට හොඳින් කථා කරලා නැහැ. අමාත්‍යාංශයේ වැඩ කරන උදවියට කථා කරන්නේ නිකම් සතුන්ට වාගේ. එහෙම නොවෙයිද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් විධියට සිටිය කාලයේ කෙළින් ඉඳගෙන ප්‍රශ්නයක් විසඳලා නැහැ. මම මේ කියන දේවල් බොරුද, ගරු ෆවුසි මන්ත්‍රීතුමනි? ඇත්ත කථාව ඒක නේ. ඔබතුමන්ලා එක්ක එකට කාලා බීලා- [බාධා කිරීමක්] ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමනි, ඔබතුමා මොනවාද කියන්න හදන්නේ? ඔබතුමා මොනවා හෝ කිව්වොත් ඔබතුමාටත් කියන්න දේවල් මට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කියන්නේ, නයා නයාමයි. ඒ පුද්ගලයා ජනාධිපති කෙනෙකු විධියටවත්, මනුස්සයෙකු විධියටවත් ශත පහකට විශ්වාස කරන්න පුළුවන් කෙනෙක් නොවෙයි. විපක්ෂයේ ඔබතුමන්ලා, "මෙන්න මේ අපේක්ෂකයා ඉදිරිපත් කරනවා" කියලා යම්කිසි තීරණයක් අරගෙන ඉන්නවා නම්, ඒ තීරණයේම ඉන්න. නැතුව, "අපි ඔක්කෝම එකතු වෙලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව නැවතත් ජනාධිපති අපේක්ෂකයා විධියට පත් කරනවා" කියලා ඔබතුමන්ලා හිතනවා නම්, මම කියන්නේ, "අපි වැටිච්ච වළේ ඔබතුමන්ලා වැටෙන්න එපා" කියලායි. අපි රෑ වැටුණු වළේ ඔබතුමන්ලා දවල් වැටෙන්න එපා. ඊයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මුහුණෙන් ඒක පෙනුණා. එතුමා යන ගමන් කියාගෙන ගියේ, හෙට ජනාධිපති වැය ශීර්ෂයේදී ආණ්ඩු පක්ෂයේ කට්ටිය විපක්ෂව ඡන්දය දෙයි කියන භයට තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කට්ටිය ආවේ නැත්තේ කියලා. ඒක තනිකර ඇත්ත. මෛත්‍රීපාල ජනාධිපතිවරයා අද වනතෙක් තමුන්ගේ පෞද්ගලික දේකට හැරෙන්න පොදු දේකට කවදාවත් හිටගෙන නැහැ. තමුන්ගේ දෙයක් කර ගන්න, හැම දාම අනෙක් මිනිසුන් පාවිච්චි කරන එකයි කළේ. ඒක අදත් එහෙමයි; හෙටත් එහෙමයි. එතුමා වගකීම ගත්තේ මොන වැඩේද? තමුන් කරපු වැඩක්වත්, අඩුම ගානේ තමුන්ගේ අතින් වුණු අඩු පාඩුවකවත් අනුන්ට බෝලේ පාස් කරන්නේ නැතුව වගකීම ගත්තේ නැහැ. එතුමා වගකීම ගත්ත එක දෙයක් මට කියන්න. හැම අවස්ථාවේදීම තමුන්ගේ අතින් වෙච්ච වැරැද්දෙත් බෝලේ පාස් කළේ අනෙක් කෙනාට.

මම උදාහරණයක් කියන්නම්. ඊයේ ඔබ සියලුදෙනාටම ඔප්පු වුණා, විපක්ෂයට ඉන්නේ 71යි කියලා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ 71 තියාගෙන තමයි එදා ලණුවක් දුන්නේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට. එතුමාට කිව්වා, "අපට ආණ්ඩුව පිහිටුවන්න පුළුවන්. ඔබතුමා භය නැතුව එන්න. මම කාටත් හොරෙන් අගමැතිකම දෙන්නම්" කියලා. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා නැවත වාරයක් රැවටුණා. ඊට පස්සේ මාධ්‍යවේදීන් අහද්දී මහින්ද රාජපක්ෂ මැතිතුමාට බෝලේ පාස් කළේ කොහොමද? මහින්ද රාජපක්ෂ මැතිතුමාට විපක්ෂ නායක විධියට හෝ පොහොට්ටු පක්ෂයේ නායකයා විධියට හරි ලස්සන ගමනක් තිබ්බා. එතුමාව අරගෙන පාවෙන අගමැතිකමක් දීලා, මේ මඩ ගොඩට දාලා, මේ කුණු ගොඩට දාලා එතුමාගේ අනාගත දේශපාලන ගමන සහ එම පක්ෂයේ දේශපාලන අනාගතය තනිකරම නැති කර දැම්මා. ඊට පස්සේ මාධ්‍යවේදීන් අහනකොට ජනාධිපතිතුමා කියනවා, මන්ත්‍රීවරුන්ගේ වටිනාකම ලක්ෂ 500ට - 600ට එහෙට මෙහෙට ගියා ලු; විකිණුණා ලු. ඒ වේදිකාව - platform එක- කවුද නිර්මාණය කළේ? කෝටි 100ක්; කෝටි 200ක් කියලා කොච්චර නම් ගණන් කිව්වාද? කිව්වා. අතේ මුදු කරකවමින්, අත් දෙක අතුල්වමින් මාධ්‍යකරුවන්ට කියනවා, මන්ත්‍රීවරුන් ඉල්ලපු ගාන වැඩි වෙච්ච නිසා ආණ්ඩුව පිහිටුවන්න බැරි වුණා කියලා. ඒ බෝලෙත් පාස් කළේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට. මම හිතන්නේ නැහැ මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ ආපු ගමනත් එක්ක එතුමාට හදිසියේ අගමැතිකමක් ගන්න අවශ්‍ය වෙලා තිබුණාය කියලා. ඒකට පොළඹවා අවසානයේ කිසිම තේරුමක් නැති ආණ්ඩුවක් පිහිටුවලා එතුමා හිතුවේ, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අනෙක් හැම අවස්ථාවේම වාගේ මේ සැරෙත් briefcase එක උස්සාගෙන ගෙදර යයි කියලා. ඒත් අපි හැම කෙනාම කෙළින් හිටියා. එදා ප්‍රජාතන්ත්‍ර විරෝධීව, ව්‍යවස්ථා විරෝධීව ගිය ගමනට විරුද්ධව අපි කෙළින් හිටපු නිසා මේ ආණ්ඩුව යාන්තම් බේරා ගත්තා.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා බලයට ආපු මුල් කාලයේ කිව්වේ, තමන් නෙල්සන් මැන්ඩෙලා කියලා. නෙල්සන් මැන්ඩෙලා ජීවිත කාලයට මේ වාගේ දේවල් කළ බවක් දැක තිබෙනවාද? මහ රෑ එක පාර නින්දෙන් නැගිටලා හිතනවා, "මට රනිල් වික්‍රමසිංහ එපා. මහින්ද හොඳයි. කවුරු මොනවා කිව්වත් මම එයාට දෙනවා අගමැතිකම" කියලා. නෙල්සන් මැන්ඩෙලා කියන්නේ, ප්‍රජාතන්ත්‍රවාදයේ පියෙක්. මෙතුමා පල්ලෙවත්තේ ගමරාලගේ මෛත්‍රීපාල සිරිසේනම තමයි. මෙතුමා නෙල්සන් මැන්ඩෙලා නොවෙයි. මෙතුමාට නෙල්සන් මැන්ඩෙලා වෙන්න බැහැ. ඒක තමයි ඇත්ත කතන්දරේ. මෙතුමා කොහොමද නෙල්සන් මැන්ඩෙලා කෙනෙක් වෙන්නේ? මේ වාගේ ව්‍යවස්ථා විරෝධී වැඩ කරන ජනාධිපතිවරයෙක්ට පුළුවන්ද ඒ වාගේ පුද්ගලයෙකුට ළං වෙන්නවත්. පසුගිය කාලයේ නොබෙල් සාම ත්‍යාගය ලබා ගන්න පුළුවන් වෙයි කියන තරමට තමයි campaign එක ගෙනිච්චේ. නොබෙල් සාම ත්‍යාගය කෙසේ වෙතත් ඊළඟ සැරේ ජනාධිපතිවරණයට ticket එක හම්බ වෙයිද කියා ෂුවර් නැහැ. ඔන්න ඔය විධියට මේ රටේ මිනිසුන්ගේ සහ මේ මුළු රටේම ස්ථාවරත්වය දවස් 52ක් අනෙක් පැත්තට හැරෙව්වා. එතුමාත් එක්ක එක පෙළට එකට සිටගෙන හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට පස්සට පයින් ගහලා පැත්තට දැම්මා. ඔවුන්ව නන්නත්තාර කරලා දැම්මා. ඔවුන්ගේ දේශපාලන ජීවිතය නන්නත්තාර කරලා දැම්මා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

-ගතියක් තමයි, තමුන්ට වඩා යමක් දන්න කෙනෙක් ඉන්නවා නම් ඒ මනුස්සයාට නැඟිටින්න දෙන්නේ නැති වීම. ඇත්තද, බොරුද? ඒක තමයි ඇත්ත.

තමුන්ගේ එක වයසේ ඉන්න තමුන්ට වඩා තැනකට එයි කියලා හිතන මනුෂ්‍යයා එවෙලේම බෙල්ලෙන්ම කපලා දානවා. එක අතකින් බැලුවාම මහින්ද රාජපක්ෂ මහත්තයා හොඳයි. මොකද, ඔය වාගේ ජරා වැඩ කළේ නැහැ. එතුමා තමන්ගේ කට්ටියට අවස්ථාව දුන්නා.

නමුත් මෙතුමා තමුන් එක්ක එකට හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න දැම්මා; FCID දැම්මා; අරක දැම්මා; මේක දැම්මා. මොකක්ද, මේ? නායකයෙක් වුණාම මොනවා වුණත් ඍජු ගතියක් තිබෙන්න ඕනෑ; මෘදු ගතියක් තිබෙන්න ඕනෑ. ඒ දෙකෙන් එකක්වත් මේ ජනාධිපතිතුමාට නැහැ. මේ වාගේ පුද්ගලයෙක්ගේ වැය ශීර්ෂය වෙනුවෙන්ද අපට හිට ගන්න කියන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එදා ඔක්තෝබර් 26 වෙනිදා ආණ්ඩුව අනෙක් පැත්තට පෙරළුණු ගමන් මිනිස්සු එක පෙළට අරලිය ගහ මන්දිරය වටලෙව්වා. ඒ, අපේ මිනිස්සු. සමහර මිනිස්සු දත් මදින්නේ නැතිව, නාන්නේ නැතිව පැය ගණනක්, දවස් ගණනක් එකම ඇඳුම පිටින් හිටියා. ඒ මිනිස්සු සමහර දවස්වලට රෑට අපිත් එක්ක එකට ඇඬුවා. ඒ මිනිස්සු අදටත් කියන්නේ අපට මේ පුද්ගලයා ජනාධිපති විධියටත් එපා; අපට ආණ්ඩුවේ ප්‍රධානියා විධියටත් එපා; මේ පුද්ගලයා සත පහකට විශ්වාස කරන්නත් එපා කියලායි. අපට ඡන්දය දීපු, අපේ දුකේදී හිටපු අපේ මිනිස්සු දිහා බලාගෙන එතුමා වෙනුවෙන් හිට ගන්න අපට පුළුවන්ද? එතුමා පයින් ගැහුවේ එදා ජනවාරි 8 වෙනිදා- ඇත්තටම අපට තිබුණේ වේදිකාවල හිටගෙන කථා කරන්න විතරයි; අපේ මතය ප්‍රකාශ කරන්න විතරයි. කවුද, වේදිකා ගැහුවේ? කවුද, වේදිකාවලට කණු ගැහුවේ? කවුද, අපට plain tea එකක් හරි දුන්නේ? කවුද, පාරවල්වල අපිත් එක්ක එකට පා ගමන් ගියේ? කවුද, board උස්සන් ගියේ? කවුද, posters ගැහුවේ? කවුද රෑ තිස්සේ නිදි මරා ගෙන තිබෙන සේරම වැඩ ටික කළේ? ඒ, අපේ මිනිස්සු; එක්සත් ජාතික පක්ෂයේ මිනිස්සු. අපට තිබුණේ stage එකට ගිහිල්ලා කථා කරන එක විතරයි. ඒ මිනිසුන්ට මොන තරම් හිතට දුකක් ඇත්ද? අපි මෙච්චර මහන්සි වෙලා, අවුරුදු ගණනකට පස්සේ අපේ ආණ්ඩුවක් හදලා අපි අපේ මනුෂ්‍යයෙක් කියලා හිතා ගෙන ඉස්සරහට ගෙනිච්ච මනුස්සයා එක පාරට අනෙක් පැත්ත හැරිලා අපට නයා වාගේ පෙණේ පුප්පයි කියලා හිතුවේ කවුද?

මේ ළඟදි දවසක එක්සත් ජාතික පාක්ෂිකයන් කියනවා, "මන්ත්‍රීතුමියනි, අපි තරම් රැවටුණු පාක්ෂිකයන් මේ ලෝකේ කොහේවත් නැහැ" කියලා. ඒක තනිකර ඇත්ත. කී පාරක් නම් රැවටුණාද? මේ සැරේ තමයි හොඳම රැවටීම සිද්ධ වුණේ. ගරු අගමැතිතුමනි, ඔබතුමා කොහේ හරි තැනක ඉඳන් අහගෙන ඉන්නවා කියලා මම දන්නවා. අපි මේ කරන්න යන දෙය කිසිසේත්ම ඔබතුමාගේ මතයට පයින් ගැසිල්ලක් නොවෙයි, අපේ තනි මතයක්. ඔබතුමා අපට කවදාවත් කියලා නැහැ, අරක කරන්න, මේක කරන්න කියලා. ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, පාක්ෂිකයන් වෙනුවෙන් අපට මෙම තීරණය ගන්න දෙන්න කියලා. මොකද, අපි ගමට යන්න ඕනෑ. අපි ගමට ගිහිල්ලා එක්සත් ජාතික පාක්ෂිකයන්ට මුහුණ බලලා කියන්න ඕනෑ, "අපි උඹලා වෙනුවෙන් හිටගත්තා, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය පරද්දන්න බැරි වුණත්, අපි පරද්දන්න නැගිට්ටා" කියලා. මොකද අපි අද මෙතැනට ඇවිල්ලා ඉන්නේ ඔවුන් නිසායි. අපට ජනාධිපතිතුමාගේ මදටිය ඇට ඕනෑ නැහැ. වාහන, සල්ලි අපට ඕනෑ නැහැ. අපට ඒවා දුන්නේ නැහැයි කියලා හෝ අපේ ප්‍රතිපාදන කැපුවා කියලා හෝ නොවෙයි අපි මේ අනෙක් පැත්ත හැරෙන්නේ. ඒ වෙන මොකුත්ම නිසා නොවෙයි; අපේ කරපිටින් ඇවිල්ලා එක්සත් ජාතික පාක්ෂිකයන්වයි, මේ ආණ්ඩුවයි මේ තරම් විවේචනය කරන එකටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගුණමකු" කියන වචනයට හොඳම උදාහරණය තමයි මෛත්‍රීපාල සිරිසේන. ඉගෙන ගන්නා පොඩි ළමයින්ට ගුණමකු කියන පදයට සමාන වචනයක් අවශ්‍ය නම්, ඉස්සරහට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

-කියලා නම දා ගන්න පුළුවන්. ඒ වාගේ පුද්ගලයෙක් එක්කද අපට මේ ගමන යන්න කියන්නේ? ගරු අග්‍රාමාත්‍යතුමනි, ඒ නිසා අපි අද විරුද්ධව නැඟී සිටිනවා. ඒ විරුද්ධව නැඟී සිටින්නේ ඔබතුමාට නොවෙයි; ජනාධිපතිතුමාටයි. ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය පරාජය කරන්න හැකි වුවත්, නොහැකි වුවත් අපි අපේ මතය අනුව පාක්ෂිකයන් වෙනුවෙන් නැඟී සිටිනවා. මොකද, අපි කන බත් ඇටයක් ගානේ, අපි වාහනයක යන වාරයක් පාසා, අපි මෙතැන ඇවිල්ලා කථා කරන වාරයක් පාසා අපේ මන්ත්‍රීකම රඳා පැවතුණේ එක්සත් ජාතික පාක්ෂිකයන් අපි ගැන විශ්වාසයක් තබලා අලියා ඉස්සරහින් කතිරය ගසපු නිසායි කියන එක අපට අමතක කරන්න බැහැ. එදා අපි කියපු වචනයට ඔවුන් අපි ගැන විශ්වාසය තියලා "හංසයා" ඉස්සරහින් කතිරය ගැහුවා. ඒ නිසා අපි වෙනුවෙන් ඔවුන් හිටපු එකට, අපිත් එක්ක එකට හිටගෙන හිටියාට ඔවුන් වෙනුවෙන් කරන ප්‍රණාමයක් විධියටයි අපි මේ දේ කරන්නේ. ඒ නිසා ගරු අගමැතිතුමනි, ඔබතුමා අපිත් එක්ක තරහා වෙන්න එපා කියලායි මම ඔබතුමාට කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් දෙයක් කියන්න ඕනෑ. එස්.බී.දිසානායක මැතිතුමා මෙන්න මෙහෙම කථාවක් කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මට තව විනාඩියක් දෙන්න.

එතුමා කිව්වා, "සිරිසේනට ඉන්නවා වැලි හොරෙක්, සිරිසේනට ඉන්නවා ගල් හොරෙක්, සිරිසේනට ඉන්නවා වී මෝල් හොරෙක්" කියලා. මම ඔය පැත්තේ කණ්ඩායමෙන් අහනවා, දැන් එහෙම නැද්ද, ඒ කතාන්දර බොරුද, ඔබතුමන්ලා ඒ කියපු කථා බොරුද කියලා. ඒ නිසා මම ඔබ සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා, මේ වැය ශීර්ෂයට විපක්ෂව ඡන්දය දෙන්න බැරි නම් අඩුම ගණනේ නැඟිටලා යන්න කියලා. මොකද, මේ පුද්ගලයා තවදුරටත් විශ්වාස කරගෙන ඔබ දේශපාලනය කරනවා නම් ඔබගේ පොහොට්ටුවේ අනාගතයත්- සත පහකට විශ්වාස කරන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තවත් දෙයක් කියන්නම්. හෙට-අනිද්දා එක පාරට ඇවිල්ලා එක්සත් ජාතික පක්ෂයත් එක්ක ජනාධිපතිතුමාගේ කණ්ඩායම ඉඳ ගත්තොත් -ඉඳ ගන්නවා.- ඒකෙන් ප්‍රශ්නයක් වෙන්නේ ඔබතුමන්ලාටයි. අනිවාර්යයෙන් ඉඳ ගන්නවා නේද ලක්ෂ්මන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමනි? අනෙක් කණ්ඩායම් අපිත් එක්ක එනවා නේද?

මොකද, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එක වචනයක් තිබෙන කෙනෙක් නොවෙයි. එතුමා හෙට කිව්වොත්, "අපි ඔක්කෝම එකතු වෙලා මේ ගමන යමු" කියලා, ඔක්කෝම ඇවිල්ලා මේ පැත්තේ ඉඳ ගනීවි. එතකොට ඔබතුමන්ලාට අල්ලපු අත්තත් නැහැ; පය ගහපු අත්තත් නැහැ. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා.

[අ.භා.4.41]

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අතිගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධ කාරක සභා අවස්ථාවේදී මට කථා කිරීමට අවස්ථාව ලැබීම භාග්‍යයක් කොට සලකනවා. මේ වැය ශීර්ෂය සම්බන්ධව කථා කිරීමේදී නොයෙක් අය නොයෙක් අදහස් ඉදිරිපත් කළා. නමුත්, යහපාලන ආණ්ඩුව පිහිටුවීමත් එක්කම අතිගරු ජනාධිපතිතුමා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක මේ රටේ විශාල වෙනස්කම් ඇති කළා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලුම මන්ත්‍රීවරුන්ට එහි ප්‍රශංසාව හිමි විය යුතුයි කියා මා වගකීමකින් ප්‍රකාශ කරනවා. මේ රටේ ස්වාධීන අධිකරණයක් තිබුණේ නැහැ; ස්වාධීන රාජ්‍ය සේවයක් තිබුණේ නැහැ. හැබැයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක මේ රටේ රාජ්‍ය සේවයේ, පොලීසියේ, අධිකරණයේ ස්වාධීනත්වය ඉෂ්ට වුණු බව අපි සියලු දෙනාම දන්නවා. උදාහරණ තිබෙනවා, ආණ්ඩුවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය භය නැතිව තීන්දු දුන් අවස්ථා පිළිබඳ. ඉතිහාසය දිහා බලන කොට මාසයකට කලින් පත් වූ අග්‍ර විනිශ්චයකාරතුමා ආණ්ඩුවට විරුද්ධව භය නැතිව තීන්දු දුන් අවස්ථා තිබෙනවා. ඒ නිසා මේ රටේ අතිගරු ජනාධිපතිතුමා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම තුළින් මේ රටේ රාජ්‍ය යන්ත්‍රණය, අධිකරණයේ ස්වාධීනත්වය ශක්තිමත් කළ බව අප සියලු දෙනාම පිළිගත යුතු කරුණක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එක්සත් ජාතික පක්ෂයේ හුඟක් මන්ත්‍රීවරුන් කිව්වා, යහපාලන ආණ්ඩුවේ පළාත් පාලන ඡන්දය කල් දැම්මේ ජනාධිපතිතුමායි කියලා. මම වගකීමකින් කියනවා, මේ රටේ පළාත් පාලන ඡන්දයේදී මිශ්‍ර මන්ත්‍රී නියෝජන ක්‍රමයක් ගෙන ඒමට අපි සියලු දෙනාම ඡන්දය දුන්නා කියලා. එහිදී, අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේ සියලුම පක්ෂ එක්ක සාකච්ඡා කරලායි අපි මේ වෙනස්කම් ඇති කළේ. ඒ නිසා ඒ අවස්ථාවේදී ආණ්ඩුවේ හිටපු සියලුම මන්ත්‍රීවරු පළාත් පාලන ඡන්දය සම්බන්ධයෙන් ගත් ක්‍රියා මාර්ගයට වගකීම දැරිය යුතුයි කියලා මම වගකීමකින් යුතුව ප්‍රකාශ කරනවා.

පළාත් පාලන ඡන්දයට අදාළව මේ කාරණාව ඉදිරිපත් කරපු අවස්ථාවේදී මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක් පක්ෂව ඡන්දය දුන්නා නැවත මේ මිශ්‍ර මන්ත්‍රී නියෝජන ක්‍රමය ගෙනැල්ලා කාන්තා නියෝජනය ලබා දෙන්න කියා. ඒ නිසා මෙතුමන්ලා මේ කාරණය දේශපාලන වේදිකාවක් කරගෙන ජනාධිපතිතුමාට ඇඟිල්ල දිගු කළාට මිශ්‍ර මන්ත්‍රී නියෝජන ක්‍රමයට අපි සියලු දෙනාම එකඟ වුණා. ගරු මනෝ ගනේසන් ඇමතිතුමා, ගරු රවුෆ් හකීම් ඇමතිතුමා දැන් සභාවේ ඉන්නවා. මිශ්‍ර මන්ත්‍රී නියෝජන ක්‍රමය සම්බන්ධයෙන් සුළු ජාතික පක්ෂවල ප්‍රශ්නයක් තිබුණා. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් දීර්ඝ කථිකාවක් පැවැත්වුවා. ඒ නිසා සියලු දෙනාම තීන්දුවක් ගත්තා, නැවත පළාත් සභා ඡන්දයට යාමේදී ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන්. ඒ සම්බන්ධයෙන් මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. මේ පළාත් සභා ඡන්දය සම්බන්ධයෙන් අපට එකඟතාවක් තිබෙනවා. මේ සභාවේ සියලු දෙනාම එකඟ වෙලා තිබෙනවා පරණ ක්‍රමයට යන්න. ඒ පරණ ක්‍රමයට යාමට කෙටි සංශෝධනයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි. ඒ නිසා මේ අවස්ථාවේදී -[බාධාකිරීම්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා මට ඇඟිල්ල දිගු කරන්නේ නැතිව දැන් ඡන්දය ගෙනෙන්නකෝ. මේ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂය මට ඇඟිල්ල දිගු කළා, මම ඡන්දය කල් දමනවා කියලා. දැන් ඉන්න පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාට අවශ්‍යතාව තිබෙනවා නම් මේ කෙටි සංශෝධනය ඉදිරිපත් කරලා, පළාත් සභා ඡන්දය පැවැත්වීමේ අවස්ථාව තිබෙනවා. [බාධාකිරීම්] ඒ නිසා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඇඟිල්ල දිගු කරලා හරි යන්නේ නැහැ. පළාත් සභා ඡන්දය පවත්වන්න තමුන්නාන්සේලාට අවශ්‍යතාව තිබෙනවා නම් මේ කෙටි සංශෝධනය දැන් ඉන්න පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමාට ඉදිරිපත් කරලා මේ ඡන්දය පැවැත්වීමට වරම තිබෙනවා. ඉතිහාසයේ ෆයිසර් මුස්තාපා ඇමතිතුමා ඡන්දය කල් දැම්මා කියන චෝදනාව කරන ගමන්ම මේ අවස්ථාවේ පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමාට අවශ්‍යතාව තිබෙනවා නම් මම -

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පළාත් සභා හා පළාත් පාලන හිටපු ඇමතිතුමා සම්පූර්ණයෙන්ම වග කියන්න ඕනෑ, අපේ පක්ෂයත්, අපේ බලාපොරොත්තුත්, ඡන්ද- [බාධාකිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒක point of Order එකක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

එතුමා මට ඇඟිල්ල දිගු කළත්, තමුන්නාන්සේලාත් මේ ආණ්ඩුවේ මන්ත්‍රීකම දැරුවා. ඒ වාගේම කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීමකුත් තිබුණා. ඒ අවස්ථාවේ සියලුදෙනාම එකඟතාවකට ආවා. අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපි රැස්වීම් පැවැත්වුවා. ඒ නිසා, "ඉතිහාසයේ ෆයිසර් මුස්තාපා සහ ජනාධිපතිතුමා නිසා තමයි මේ ඡන්දය ප්‍රමාද වුණේ" කියලා චෝදනා නඟනවා නම්, දැන් සිටින පළාත් සභා පළාත් පාලන ඇමතිතුමාගෙන් මම කාරුණික ඉල්ලීමක් කරනවා, තමුන්නාන්සේලා දැන් චෝදනා කරන මේ පළාත් සභා ඡන්දයට අවශ්‍ය කරන සංශෝධනය වහාම ඉදිරිපත් කරන ලෙස. ඒ වාගේම, මේ සංශෝධනය හැකිතරම් ඉක්මනින් ඉදිරිපත් කරන්න කියලා මැතිවරණ කොමිසමත් කියා තිබෙනවා. තමුන්නාන්සේලාට බෝල පාස් කරන එක ලෙහෙසියි; ඇඟිල්ල දිගු කරන එක ලෙහෙසියි. හැබැයි තමුන්නාන්සේලාට,-

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියනවා නේ දැන් අපේ, වර්තමාන -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
That is not a point of Order. ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Hon. Member, you can point the finger at me, but the responsibility is on the Government. I submitted the Amendment, a Bill, to the Cabinet. If the present Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government and the Government are interested in holding the Provincial Councils Election, they should forthwith present that Bill to Parliament and get it passed, because it is a simple Amendment where we have gone back to the old system. We have protected the 25 per cent female representation. So, the Government, whilst pointing the finger at me, has not been giving an explanation why the Bill is not presented to Parliament. ඊට අමතරව, අපි දන්නවා මේ රටේ කුඩු ප්‍රශ්නය තිබෙන බව. [බාධා කිරීම්] අතිගරු ජනාධිපතිතුමා, අපි,-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
You are the one who brought the Bill.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
You voted for it.

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමනි, disturb කරන්න එපා. Point of Order එකක් තිබෙනවා නම්, ඉදිරිපත් කරන්න.

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
Disturb කළා නොවෙයි. ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන් නොමඟ අරින්න එපා. ඔබතුමා ගෙනා පනතට,- [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ දැවැන්ත කුඩු ප්‍රශ්නයක් තිබෙනවා. [බාධා කිරීම්] මේ ප්‍රශ්නයට විසඳුමක් හොයන්න නොයෙක් නායකයන් උත්සාහ දැරුවා. හැබැයි, බතෙන් ස්වයංපෝෂිත රටක් වෙනුවට කුඩුවලින් ස්වයංපෝෂිත රටක් බවට මේ රටේ ගමනක් ආරම්භ වුණා. [බාධා කිරීම්] ගමේ තරුණ තරුණියන් විනාශ වුණා, මේ මත් ද්‍රව්‍ය ප්‍රශ්නය නිසා. අතිගරු ජනාධිපතිතුමා පොලීසිය භාර ගත්තාට පස්සේ මේ රටේ කුඩු සම්බන්ධයෙන් ප්‍රශ්නයට දීර්ඝ කාලීන සහ කෙටි කාලීන විසඳුමක් සොයා ගෙන තිබෙනවා. මම හිතන්නේ මේ රටේ කිසිම නායකයෙක් නොගත්,-

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තනිවෙලාද?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙහෙම අසරණ වෙලා තිබෙනවා ජීවිතයටම දැකලා නැහැ. 225ක් ඉන්න පාර්ලිමේන්තුවේ ඔබතුමා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Hon. Member, මේ රටේ කුඩු සම්බන්ධයෙන් දැවැන්ත ප්‍රශ්නයක් තිබෙන බව අපි දැක්කා. එයින් ගමේ තරුණ තරුණියන් විනාශ වුණා. රට විනාශ වන තත්ත්වයක් උදා වුණා. හැබැයි, අතිගරු ජනාධිපතිතුමා මේ වගකීම භාර ගත්තාට පස්සේ; පොලීසිය භාර ගත්තාට පස්සේ මේ කුඩු ප්‍රශ්නයට දිගු කාලීන විසඳුමක් හොයලා තිබෙනවා. මේ රටේ මත් ද්‍රව්‍ය -කුඩු- සම්බන්ධයෙන් යුද්ධයක් ආරම්භ කරලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඒ වෙනුවෙන් විශාල මෙහෙවරක් කරනවා. ඒ තුළින් මම හිතනවා, මේ කුඩු සම්බන්ධ විප්ලවයෙන් විශාල ජයග්‍රහණයක් ලබා ගන්නවා කියා. දේශපාලන දෘෂ්ටිකෝණයෙන් බලන්නේ නැතිව සියලු දෙනාටම වගකීමක් තිබෙනවා, හරි දේ හරි කියන්නත්, වැරදි දේ වැරදි කියන්නත්. ඒ නිසා මම හිතන්නේ, අපේ රටේ තරුණ පරපුර - [බාධා කිරීම්]

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ point of Order එක මොකක්ද?

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
ගරු මන්ත්‍රීතුමනි, මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් ජනාධිපතිතුමා ගෙන තිබෙන පියවර ඉතාමත් හොඳයි. අපි එය අගය කරනවා. ඒ සමඟම අපි ඉල්ලීමක් කරනවා ජනාධිපතිතුමාට කියන්න කියලා, දුවට ලබා දී තිබෙන බාර් ලයිසන් එක cancel කරන්න කියලා. [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න. [බාධා කිරීම්]

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
මම කියනවා, කියනවා. ඔබතුමන්ලා මේක දේශපාලන වේදිකාවක් කරගන්න එපා.

Madam Presiding Member, His Excellency the President has taken an effort to make major differences. Obviously, in any government, in any institution, there are lapses; there are faults. But, I would like to say with responsibility that the Nineteenth Amendment, which the President has brought in, has made a change in this country; given freedom which this country never enjoyed. Hon. Members, all of you will take credit for bringing in the Nineteenth Amendment. So, His Excellency the President has taken an effort to make a change in this country. Whilst conceding that in any government, any institution, any person, there are rights, wrongs and lapses, I say that we together brought His Excellency the President to power. We collectively brought in the Nineteenth Amendment and we all are today reaping its fruits. We have a strong Judiciary; we have a strong Public Service,we have a strong police. So, I think, His Excellency the President and all of us should be given credit for bringing in the Nineteenth Amendment.

Madam Chair, once again, I am very grateful that I have been given an opportunity to speak a few words in the Committee Stage Discussion on the Vote of His Excellency the President.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය.

[අ.භා. 4.52]

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මෙම වැය ශීර්ෂ යටතේ අදහස් පළ කිරීමට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. මෙම වැය ශීර්ෂ යටතේ කොමිෂන් සභා ගැන මම අදහසක් පළ කරන්න කැමතියි. අපේ රජය පත් වෙලා මේ කොමිෂන් සභා ස්ථාපිත කිරීමත් එක්කම රටක් විධියට, ජනතාවක් විධියට අපි සැහෙන්න ඉදිරියට ඇවිත් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,මේ අවස්ථාවේ අධිකරණ කොමිෂන් සභාව ගැන මම කියන්න කැමැතියි. මේ රටේ ස්වාධීන ආයතනයක් විධියට අධිකරණ කොමිෂන් සභාව ගත් ඒ තීන්දු තීරණත් එක්ක අපි ලැබූ හොඳම අත්දැකීම තමයි, පසුගිය ඔක්තෝබර් මාසයේ 26 වැනි දා මේ රටේ ඇති කළ ආන්දෝලනාත්මක දේශපාලන තීරණය පිළිබඳ අධිකරණ තීරණය. අධිකරණය ස්වාධීන වීම නිසා ලෝකය පිළිගත් සාධාරණ තීරණයක් අධිකරණයෙන් අපට ලැබුණා. අප ලැබූ ලොකුම ජයග්‍රහණයක් තමයි මේ කොමිෂන් සභා ස්ථාපිත කර අධිකරණය ස්වාධීන ආයතනයක් බවට පත් වීම. විශේෂයෙන්ම ඒක අපි රජයක් විධියට ලැබූ ලොකු ජයග්‍රහණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මැතිවරණ කොමිෂන් සභාව ගැන කියනවා නම්, ලංකාවේ මැතිවරණ කොමිෂන් සභාව, ආසියාවේ අනෙකුත් රටවල් එක්ක බලනවිට බොහොම ස්වාධීන කොමිෂන් සභාවක් විධියට පවත්වා ගෙන යනවා. හැබැයි මා ලැබූ නරක අත් දැකීමක් තිබෙනවා. පසුගිය පළාත් පාලන මැතිවරණයේදී මැතිවරණ කොමිෂන් සභාව මේ කාරණය ගැන එච්චර බැරෑරුම්කමක් සිතන්නට නැතිව ඇති. පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵල කොට්ඨාස මට්ටමින් ප්‍රකාශ කිරීමේදී ඒ ප්‍රකාශ කළ ක්‍රමය නිසා ඊට පසුව දා අපි බොහොම පසු බෑමකට ලක් වුණා. මොකද, තේරී පත් වූ නියෝජිතයන් අනුව සමස්ත පළාත් පාලන ආයතනවල බලය පිහිටුවන්නේ කොහොමද කියන අසීරු තත්ත්වයක් ඇති වුණා. ඒ නිසා මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේදී සමස්ත ප්‍රතිඵලයම එකවර කියනවා නම් වඩා හොඳයි. ඒ වාගේම ඒ ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේදී සමහර අය සිතුවා, මේ පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵලයත් එක්ක තමයි ආණ්ඩු පිහිටුවන්නේ කියලා. එම නිසා නිලධාරින් ඇතුළු සියලු දෙනා මාස ගණනක් පස්සට ගිහින් තීන්දු තීරණ නොගෙන සිටි වාතාවරණයක් ඒ කාලය තුළ උදා වුණා.

මේ මැතිවරණ කොමිෂන් සභාවත් එක්ක කටයුතු කරන නිරීක්ෂණ ආයතන ගැන මා කියන්න ඕනෑ. ඒ සඳහා පැෆරල්, CMEV වැනි ආයතන තිබෙනවා. මේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචි වෙලා, නීත්‍යානුකූලව එතුමන්ලාත් එක්ක සම්බන්ධ වෙලා සිටින අය. පසුගිය කාලයේ රාජ්‍ය නොවන සංවිධානයක් විධියට මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමක් තිබුණා මැතිවරණ නිරීක්ෂකයෙක් කියලා ස්වාධීනව හිටපු නායකයෙක් පසුගිය ඒ දින 52 තුළ ඒකපාක්ෂිකව, එක පැත්තකට බර වෙලා කථා කළ හැටි අපි දැක්කා. ඒ අනුව අපට පෙනී ගියා, එතුමා ඉන්නේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමක ස්වාධීන පුද්ගලයකු හැටියට නොවෙයි, මේ රටේ මොකක් හෝ තනතුරක, තානාන්තරයක වරප්‍රසාදයක් ලබන්නයි කියන එක.

කියන්න කනගාටුයි, ඒ තුළින් ලබා ගත් වරප්‍රසාදත් එක්ක, මැතිවරණ නිරීක්ෂණය කරන්න ලබා ගත් ඒ අවස්ථාවත් එක්ක අද

ඒ පුද්ගලයා මේ රටේ එක් පළාතක දේශපාලන පත් වීමක් ලබා ගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපි දැක්කා බලය අයුතු විධියට පාවිච්චි කරමින් පසුගිය දිනයක රාත්‍රි කාලයේ ඇවිල්ලා විදුහල්පතිවරියකටත් බලපෑම් කරලා පාසලට දරුවන් ඇතුළත් කරගන්න කියන තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. ඒ නිසා මෙවැනි රාජ්‍ය නොවන සංවිධානවලට එක එක නිරීක්ෂණ කමිටුවලට ඇතුළත් වෙන්න අවස්ථාව දෙන්න හොඳ නැහැ. මේ ගැන විශේෂ අවධානක් යොමු කරන්න ඕනෑ. ඒ කෙසේ වෙතත්, අපි බොහොම ගෞරවය කරන මැතිවරණ කොමිෂන් සභාව, ස්වාධීන ආයතනයක් විධියට කරන ඒ මෙහෙවර අපි කවදත් දකිනවා. නමුත් සමහර රාජ්‍ය නොවන සංවිධාන විධියට ඉදිරිපත් වෙලා සිටින මේ නිරීක්ෂණ කමිටු කාන්තා නියෝජනය සඳහා සියයට 25ක කෝටා එක ලබා දීමට ලොකු කාර්ය භාරයක් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ඔවුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයත් එක්ක සම්බන්ධීකරණය වෙලා අපට අවශ්‍ය විශේෂඥ දැනුම, තාක්ෂණය ඇතුළු සියලු කරුණු කාරණාවලට උදව් ලබා දෙන්න සූදානම් වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ දැනුම යාවත්කාලීන කර ගන්න මැතිවරණ නොමැති කාලවලත් අපට ඒ සහයෝගය ලබා දෙනවා.

දැන් අපට තිබෙන ප්‍රධානම ගැටලුව තමයි, පළාත් සභා මැතිවරණය. පළාත් සභා මැතිවරණය ගැන කථා කිරීමේදී අපේ රජය චෝදනා ලැබුවත්, මම නම් දකින්නේ එහි වගකීම හිටපු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා -මේ අවස්ථාවේ එතුමා මේ සභාවේ නැහැ- භාරගත යුතුයි. පළාත් සභා සීමා නිර්ණය කිරීම සඳහා මීට කලින් භාරගන තිබූ කමිටුව එම කාර්ය භාරය හරියට ඉටු නොකළද, වර්තමාන සීමා නිර්ණ කොමිෂන් සභාව ඒ කාර්ය භාරය මාස හතරක් ඇතුළත නිම කරලා තිබෙනවා. එම නිසා ඒ ගැන කාටවත් අත දිගු කරලා, ඇඟිල්ල දිගු කරලා චෝදනා කරන එක නොවෙයි කාර්ය භාරය විය යුත්තේ. අපි සියලුදෙනාම ස්වාධීන විධියට මේ මැතිවරණයට මුහුණ දෙන්න අවශ්‍ය පසු බිම හදා ගනිමුයි කියා ඉල්ලමින්, විශේෂයෙන්ම අද මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා. 4.59]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ගරු අගමැතිතුමාගේත්, ඒ වාගේම ජනාධිපතිවරයාගේත් වැය ශීර්ෂ පිළිබඳව කථා කිරීමේදී විශේෂ අවධානයක් යොමු කරන්නට අවශ්‍යයි, අපේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ වැය ශීර්ෂයට. ඒකට හේතුව මේකයි. අග්‍රාමාත්‍ය ධුරයට පත් වෙලා මේ රටේ කිසිදු අග්‍රාමාත්‍යවරයෙකුට කරන්නට නොහැකි වුණු යෝධ සංවර්ධනයක් සඳහා කැප වූ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා ලොකු සටනක් කළ, මේ රටේ මාධ්‍ය නිදහස වෙනුවෙන් ලොකු ප්‍රයත්නයක් දරපු දේශපාලන නායකයෙක් එතුමා. තමුන් විශ්වාස කරන දේශපාලන ප්‍රතිපත්තිය උදෙසා එතුමා සටන් කළා. ඒ වාගේම, මේ රටේ සංහිඳියාව ඇති කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමා ලොකු කැපවීමක් කළා. ඒ කැපවීම හරහා මේ රටේ උතුරු නැඟෙනහිර දෙලක්ෂ පනස්දහසකට වැඩි අවතැන් වූ ජනතාවක් නැවත පදිංචි කරන්න අද අපට පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ වාගේම, ඔවුන්ට නිවාස ලබා දෙන්න, ඔවුන්ට අවශ්‍ය කරන්නා වූ සංවර්ධනය දෙන්න, පාරවල්, කාණු, බෝක්කු ඇතුළු යටිතල පහසුකම් නඟා සිටුවන්න, ඔවුන්ගේ ජන ජීවිතය නඟා සිටුවන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ගරු අග්‍රාමාත්‍යතුමාට පුළුවන්කම ලැබුණා. ඒ සඳහා රුපියල් මිලියන 3,138කට වැඩි මුදල් ප්‍රමාණයක් ගරු අග්‍රාමාත්‍යතුමා වෙන් කළා; වැය කළා.

අවුරුදු 30ක කුරිරු යුද්ධයෙන් බැට කාපු අහිංසක ද්‍රවිඩ ජනතාව උදෙසා, යුද්ධයෙන් පීඩාවට පත් වූ අහිංසක තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරීමට එතුමාගේ අමාත්‍යාංශයට හැකියාව ලැබුණා. ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමාත්, අපේ මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මහතාත් එකතු වී මේ රටේ සංවර්ධනය සඳහා, මේ රට සංවර්ධනය කළ හැක්කේ ගම සංවර්ධනය කිරීම හරහායි කියන දැඩි විශ්වාසයත් එක්ක ව්‍යාපෘති 51,000කට රුපියල් මිලියන 20,000කට වැඩි මුදල් ප්‍රමාණයක් 2018දී වෙන් කළා. මේ ව්‍යාපෘති 51,000 සිදු වුණා නම්, මේ රටේ හැම ගමකම මංමාවත් ටික, යටිතල පහසුකම් ටික, නිවාස ටික හැදෙනවා. මේ හදන්නේ කොළ පාට පාරවල් නොවෙයි; මේ හදන්නේ කොළ පාට බෝක්කු නොවෙයි. මේ හදන්නේ කොළ පාට ජනතාවගේ ගෙවල් පමණක් නොවෙයි. මේ රටේ අහිංසක දුගී දුප්පත් ජනතාවට තමයි ඒ සේවය වෙන්නේ. නමුත් දින 52 දේශපාලන කුමන්ත්‍රණය කරලා මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති වුණු ගමන්, එතුමා සහ ඒ කණ්ඩායම මොකක්ද කළේ? ගම්පෙරළිය ව්‍යාපෘතිය තහනම් කළා. එවකට සිටි අග්‍රාමාත්‍ය ලේකම්, ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ දිසාපතිවරුන්ට චක්‍රලේඛයක් එව්වා, "ගම්පෙරළිය ව්‍යාපෘතිය නතර කරන්න" කියලා. ඒ නිසා අපට මේ ගම්පෙරළිය ව්‍යාපෘතියෙන් සියයට සියයක ප්‍රතිඵල ලබා ගන්න බැරි වුණා. එහි ප්‍රතිලාභ සියයට සියයක් ගමේ සිටින අහිංසක ජනතාවට ලබා දෙන්න අපට පුළුවන්කමක් ලැබුණේ නැහැ. නමුත් ගරු අග්‍රාමාත්‍යතුමා මුදල් අමාත්‍යතුමාත් සමඟ නොසැලී කටයුතු කරලා 2019 වසරටත් ගම්පෙරළිය ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය මුදල් ටික ලබා දුන්නා.

ගරු අග්‍රාමාත්‍යතුමා, එදා 1994 පැවැති අපේ ආණ්ඩුවේ තරුණ කටයුතු අමාත්‍යතුමා හැටියට කටයුතු කරද්දී ආරම්භ කරපු තරුණ සේවා සභාව, එම ආණ්ඩුව අපෙන් ගිලිහුණාට පසුව සම්පූර්ණයෙන් දේශපාලනීකරණය වෙලා, ඒ හරහා 'නිල් බලකාය', 'තාරුණ්‍යයට හෙටක්' යන සංවිධානවලට ජාතික තරුණ සේවා සභාව පාවා දුන්නා. අපේ ආණ්ඩුව 2015 ජනවාරි මස 08වැනි දින බලයට ඇවිත් ජාතික තරුණ සේවා සභාවෙන් දේශපාලනය සම්පූර්ණයෙන් අයින් කළා. දැන් ජාතික යොවුන් පෙරමුණේ සභාපතිවරයා මමයි. අපි ජාතික තරුණ සේවා සභාවේ රාජකාරිවලට ඇඟිලි ගහන්නේ නැහැ. ජාතික තරුණ සේවා සභාව අපේ වැඩවලට ගන්නේ නැහැ.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මගේ සහෝදර මන්ත්‍රීතුමා දන්නේ නැතිව ඇති, ඔක්තෝබර් 26වැනි දින ඇති වුණු දේශපාලන පෙරළියෙන් පසුව විසිදෙදෙනෙක් මාරු කළා ඉතා දූෂ්කර -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ කාරණය point of Order එකක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ රටේ දේශපාලනය පිළිබඳව කථා කරනකොට ජාතික තරුණ සේවා සභාවේ තිබෙන වැදගත්කම පිළිබඳවත් කල්පනා කරන්නට ඕනෑ. ගමේ සිටින අහිංසක තරුණ තරුණියන්ට නායකයින් බවට පත් විය හැකි අවකාශය ලබා දෙන්නට හැකි මාර්ගය ගරු අග්‍රාමාත්‍යතුමා ආරම්භ කළා. ඒ සඳහා තමයි යොවුන් පාර්ලිමේන්තුව ස්ථාපිත කළේ. මේ හරහා යෞවන සමාජ සවිබල ගන්වලා, ඒත් එක්කම යොවුන්පුරය ආරම්භ කරලා, 2018 වසරේ පමණක් 790,000කට වැඩි තරුණ තරුණියන් පිරිසක් ජාතික තරුණ සේවා සභාවෙන් ප්‍රතිලාභ ලබා ගත්තා.

ඒ වාගේම vocational training centres පටන් අරගෙන මේ රටේ අහිංසක තරුණ තරුණියන්ට තමන්ගේ අනාගතය සුරක්ෂිත කළ හැකි වැඩ පිළිවෙළක් ගරු අග්‍රාමාත්‍යතුමා ආරම්භ කළා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. ඒ වාගේම වෘත්තීය පුහුණු වැඩසටහන් ආරම්භ කර ඔවුන්ට දිවා ආහාරය, නේවාසික පහසුකම්, රක්ෂණාවරණයක්, රුපියල් 2,500ක පැමිණීමේ ගාස්තු ලබා දී, අධ්‍යාපන කටයුතු අවසන් වීමෙන් පසු NVQ certificate එක ලබා ගන්නා තරුණ තරුණියන්ට රැකී රක්ෂා සොයා දී, රජයෙනුත් තව රුපියල් 10,000ක් ලබා දී තිබෙනවා. ඊටත් ඔබ්බට යන තරුණ තරුණියන්ට Enterprise Sri Lanka එක යටතේ රුපියල් මිලියන 1.5ක ණයක් අඩු පොලියට ලබා දීලා, ඒ තරුණ තරුණියන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙළ ගරු අග්‍රාමාත්‍යතුමා ආරම්භ කරලා තිබෙනවා. ඒත් එක්කම 2018 වසරේ යොවුන් සේනාංක හරහා සමාජ සත්කාර වැඩසටහන්, ව්‍යාපෘති 1187ක් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

මේකට රුපියල් මිලියන 177ක් අපේ ගරු අග්‍රාමාත්‍යතුමා යොමු කරලා තිබෙනවා. මේ රටේ තරුණයන්ගේ ප්‍රශ්න, මේ රටේ ජාතික ප්‍රශ්නය අතට අරගෙන ගරු අග්‍රාමාත්‍යතුමා කටයුතු කරලා තිබෙනවා කියන එක මේ අවස්ථාවේ දී මතක් කර දෙන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ වාගේම, කොමිෂන් සභා ගැන ගොඩාක් අය කථා කළා. මේ ස්වාධීන කොමිෂන් සභා පිහිටුවා තිබෙන එක ගැන අපි ආඩම්බර වෙනවා. පොලිස් කොමිසම පිළිබඳව අපි විශේෂයෙන්ම ආඩම්බර වෙනවා. මොකද, මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා දින 51ක් තිස්සේ එකතු වෙලා දේශපාලන කුමන්ත්‍රණයක් කරපු වෙලාවේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියා මාරු කරලා යවනකොට, පොලිස් කොමිසමට කොන්දක් තිබුණා ඒ මාරු කිරීම නතර කරන්න. මේ කොමිෂන් සභාවල තිබෙන ස්වාධීනත්වය ඒකයි. ඒක නිසා අද දේශපාලනඥයාට පොලීසියේ නිලධාරීන්ව මාරු කරන්න බැහැ. උසස්වීම නතර කරන්න බැහැ. බලෙන් උසස්වීම් දෙන්න පුළුවන්කමක් නැහැ. එම නිසා අද රාජ්‍ය සේවයෙන් දේශපාලනඥයාව අයින් කරලා තිබෙන්නේ ඒ, ස්වාධීන කොමිෂන් සභාවල තිබෙන ශක්තිය නිසා බව මම මේ අවස්ථාවේදී මතක් කරලා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ සහෘද පසු පෙළේ මන්ත්‍රීවරු ගණනාවක් ඉතාමත් වේදනාවෙන් කථා කළා. ඒ අය කිව්වා, ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂයට ඔවුන් එකඟ නැහැයි කියලා. මට ඒ වේදනාව තේරෙනවා. මොකද, අපි මෛත්‍රීපාල සිරිසේන මහත්මයාව 2015 ජනවාරි 8වැනි දා ජනාධිපති කරන්න අපේ කර මත තියාගෙනයි ගියේ. අපේ එක්සත් ජාතික පාක්ෂිකයෝ තමයි පෝස්ටර් ගැහුවේ; canvassing ගියේ. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය තමයි අපේ පාක්ෂිකයන්ට ගැහුවේ; අපේ පාක්ෂිකයන්ට පාප්ප හැලුවේ. අපේ රැස්වීම්වලට ඇදලා තිබුණු කොඩි ටික කඩලා දැම්මේ. නමුත්, අපි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ජනාධිපති කරන ඒ මෙහෙයුම දියත් කළා. අපේ පාක්ෂිකයොත් එක්ක එකතු වෙලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව මේ රටේ ජනාධිපති කළා. ඉන් පස්සේ කිසිදු වරදක් කරන්නේ නැතිව, කිසිදු අපරාධයක් කරන්නේ නැතිව, අබමල් රේණුවක චෝදනාවක් නැතිව අපේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාව අපි කවුරුවත් දන්නේ නැතිව නීති විරෝධීව අගමැතිකමින් ඉවත් කළා. මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා එතුමාව අයින් කළා. ඒ අවස්ථාවේ දී අපට ඇති වෙච්ච වේදනාව, අපට ඇති වෙච්ච දුක කියලා නිම කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදීව ජනතා ඡන්දයෙන් පත් වෙච්ච අපේ පක්ෂයේ නායක ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා දිවා රාත්‍රී නොබලා ආරක්ෂා කරන්න අපි එදා අරලියගහ මන්දිරයට වෙලා රෑ එළිවෙනකම් කටයුතු කළා. ගරු අගමැතිතුමාගේ ආරක්ෂාව අයින් කළා. ගරු අගමැතිතුමාගේ වැඩ කටයුතු කරන්න හිටපු නිලධාරින් සියලු දෙනාම අයින් කළා. අපි එදා අරලියගහ මන්දිරයේ පුටු උඩ ඉඳගෙන රෑ නිදි වරාගෙන අරලියගහ මන්දිරය ආරක්ෂා කළා කියන්නේ, අපි අගමැතිතුමාව ආරක්ෂා කළා කියන එකයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි. කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ඒ වාගේ ගරු අගමැතිතුමාව ආරක්ෂා කළේ, අපේ නායකයාව ආරක්ෂා කළේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නයි. එම නිසා මගේ සහෘද මන්ත්‍රීවරුන්ගේ වේදනාව මටත් දැනෙනවා. අපට ඒක හැමෙනවා. ඒක නිසා මේ කරපු වැඩේ වැරැදියි. ඒක මෛත්‍රීපාල සිරිසේන මහත්මයා තේරුම් ගන්න ඕනෑ. ඒක එතුමාත් එක්ක සිටින කණ්ඩායමත් තේරුම් ගන්න ඕනෑ. ජනාධිපතිතුමා ඒක අපට එදා කළා නම්, අද මහින්ද රාජපක්ෂ මහත්මයාට නැවත වතාවක් එවැනි දෙයක් කරන එක ආයෙත් අහන්න දෙයක් නැහැ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කර දෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා කථා කරන්න.

ඊට ප්‍රථම ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹுமான்அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA left the Chair, and THE HON. MUJIBUR RAHUMAN took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 5.10]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දවසේ වැය ශීර්ෂ ගණනාවක් මේ සභාවේ අනුමත කරන්න සාකච්ඡා කරද්දී, මම හිතන විධියට උදේ ඉඳලා මේ දක්වාම වැඩිම වාර ගණනක් මේ සභාවේ කියැවුණු වචනය තමයි "ගරු ජනාධිපතිතුමා" කියන වචනය. එතුමාට මේ සභාවේ කීප දෙනෙක්ම චෝදනා කළා. අද එතුමාගේ වැය ශීර්ෂය පැවැත්වෙන දිනයේ දී එතුමා පිළිතුරු දෙන්න මේ සභාවට පැමිණියේ නැත්තේ ඇයි කියන කාරණය විමසා සිටියා.

ගරු ජනාධිපතිතුමා මේ රටේ පරිසර අමාත්‍යවරයා හැටියට, කෙන්යාවේ නයිරෝබි අගනුවරදී හෙට සිට ආරම්භ වන එක්සත් ජාතීන්ගේ පරිසර සමුළුවට සහභාගි වෙන්න නියමිතයි. එම පරිසර සමුළුව 14වන දා සිට 16වන දා දක්වා පැවැත්වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කථික ලැයිස්තුවේ නම සඳහන් අපේ ගරු මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමාගේ කාලයත් මට ලබාගන්නය කිව්වා. එතුමා විදේශගත වෙලා ඉන්න නිසා මේ විවාදයට සහභාගි වෙන්නේ නැහැ.

ගරු ජනාධිපතිතුමා මෙම විවාදයට සහභාගි නොවෙන්න ප්‍රධානතම හේතුව මොකක්ද කියා මම කලින් කිව්වා. මේ රටේ පරිසර අමාත්‍යවරයා හැටියට, පරිසර හිතකාමී රාජ්‍ය නායකයකු හැටියට තමන්ගේ කාර්ය භාරය රට වෙනුවෙන් ඉටු කරන්න තමයි එතුමා එම සමුළුවට සහභාගි වෙන්නේ. එහෙම නැතිව, එතුමාට මේ දේවල් ගැන කිසිම බියක්, සැකයක් නැහැ. එතුමා, අද මෙතුමන්ලා කියූ සියලු කාරණාවලට උත්තර දීලා තිබෙනවා; එතුමා මේ රටට, සමාජයට ඒ දේවල් කියා තිබෙනවා. ඒ බව අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන සමහර ගරු මන්ත්‍රීතුමන්ලා, "පිබිදෙන පොළොන්නරුව" කියන වැඩසටහන දැඩි විවේචනයට ලක් කිරීම ගැන අපි කනගාටු වෙනවා. එම වැඩසටහනේ ඒ සියලු ප්‍රතිලාභ ජනතාවට ලබා දෙන අවස්ථාවට අපේ මුදල් ඇමතිතුමාත් සහභාගි වුණා. මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා ඇතුළු කැබිනට් ඇමතිවරු, නියෝජ්‍ය අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු රාශියක් ගිහින් තමයි, "පිබිදෙන පොළොන්නරුව" වැඩසටහන යටතේ ජනතාවට ඒ ප්‍රතිලාභ ලබා දුන්නේ. එය කිසිම වංචාවක්, දූෂණයක් සිදුවන වැඩසටහනක් නොවෙයි. ඒ මුදල් ප්‍රතිපාදන වෙන් කරලා, පාසල් ගොඩනැඟිලි, පාලම්, ඇතුළු ජනතාවගේ විවිධ අවශ්‍යතා වෙනුවෙන් කරන හැම ඉදිකිරීමක්ම යුද හමුදාව, ගුවන් හමුදාව, නැත්නම් නාවික හමුදාව සම්බන්ධ වෙලා තමයි කරන්නේ. එහෙම නැතිව කරන හැම වැඩක්ම විවෘත ටෙන්ඩර් පටිපාටිය යටතේ කැඳවලා, විනිවිදභාවයෙන් යුතුවයි දීලා තිබෙන්නේ. සාමාන්‍ය ඇස්තමේන්තුව අනුව ලක්ෂ 100ක් යන ගොඩනැඟිල්ල ලක්ෂ 70ට අවසන් කර තිබෙනවා. ඒ තුළින් රජයට විශාල මුදලක් ඉතිරි කරගන්න පුළුවන් වෙනවා. අපේ ජනාධිපතිතුමා ඒ සඳහා අවශ්‍ය නායකත්වය දීලා තිබෙනවා.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු මන්ත්‍රීතුමනි, ඒවා එහෙම ටෙන්ඩර් කරන්නේ නැහැ. ඔබතුමා අසත්‍ය කියන්නේ.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මම වගකීමෙන් මේ දේවල් කියන්නේ.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
මමත් වග කීමෙන් කියන්නේ. යුද හමුදාව ගොඩනැඟිලි ඉදි කරනවා. ඒ ගොඩනැඟිලිවලට අමුද්‍රව්‍ය ටික දෙන්නේ සහෝදරයෝ.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
තමුන්නාන්සේ ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන් කථා කරන්න එපා. තමුන්නාන්සේ ඒ හැම දෙයක්ම, - [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ කථාවට බාධා කරන්න එපා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ඒ ව්‍යාපාර කරන අය ඉන්නවා නම්, tender call කළාම ඒ ඕනෑම කෙනෙකුට සපයන්න පුළුවන්. පවුලේ කෙනෙකුට එහෙම සපයන්න බැහැය කියා නීතියක් නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා වාඩි වෙන්න. [බාධා කිරීමක්] දැන් ඔබතුමා කථා කළා නේ. අපි ඒවා අහගෙනත් හිටියා නේ. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, එතුමාට බාධා කරන්න එපා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ඔබතුමා අසත්‍ය දේවල් කියන කොට අපි අහගෙන හිටියා නේ. ඒක නිසා දැන් බාධා නොකර ඉන්න. [බාධා කිරීමක්]

මේ වංචා, දූෂණ සම්බන්ධයෙන් කටයුතු කරන්න ජනාධිපතිතුමා වැඩ පිළිවෙළක් යොදන්නේ නැහැය කියා ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා. දේශපාලනයෙන් පරිණත වුණු අය මේ ගරු සභාවේ ඉන්නවා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී.

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

බණ්ඩාරනායක මැතිතුමාගෙන් පස්සේ, තමන්ගේ අමාත්‍ය මණ්ඩලයේ වංචා, දූෂණ හොයන්න කොමිසමක් පත් කළ රාජ්‍ය නායකයා කවුද? එහෙම කළේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පමණයි. මන්ත්‍රීවරු ගණනාවක් අද ඔය තරම් වෛරයෙන්, තරහෙන් කෑ ගහන්න ප්‍රධාන හේතුව මොකක්ද? තමන්ගේම කැබිනට් මණ්ඩලයේ හිටපු සමහර අය ඒ තනතුරුවලින් ඉවත්වන තෙක්ම කටයුතු කරන්න සිදු වුණේ, එතුමා ඒ වංචා, දූෂණවලට එරෙහිව කටයුතු කළ නිසාය කියන කාරණය මම ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමන්ලාට කියන්න කැමැතියි.

එතුමා පසුගිය ආණ්ඩුවේ වංචා, දූෂණ සොයන්නත් කොමිසමක් පත් කළා. ඒ වාගේම බැඳුම්කර වංචාව සම්බන්ධයෙනුත් කොමිසමක් පත් කළා. වංචාවට, දූෂණයට එරෙහිව යන, කොන්දක් ඇති රාජ්‍ය නායකයකු හැටියට එතුමා ඉතිහාසගත වෙලා ඉවරයි කියන එක මම බොහොම පැහැදිලිව මතක් කර දෙන්න කැමැතියි.

මම මේ කාරණයත් විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. වත්මන් ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය සඳහා වර්ෂයෙන් වර්ෂය මුදල් ප්‍රතිපාදන වැඩියෙන් වෙන්කර දීලා තිබෙනවාය, වැඩියෙන් වෙන්කර ගෙන තිබෙනවාය කියා අය වැය දෙවනවර කියවීමේ විවාදය අවස්ථාවේදීත් ගරු මන්ත්‍රීතුමන්ලා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා. එතුමා ඒ මුදල් වෙන්කරගෙන තිබෙන්නේ අනවශ්‍ය බලයක් පාවිච්චි කරලා නොවෙයි. එතුමා මුදල් අමාත්‍යතුමා එක්ක සාකච්ඡා කරලා, ඒ මුදල් වෙන් කර ගත්තේ ඇයි කියන කාරණය මම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. විශේෂයෙන්ම මෙතෙක් කල් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් පත්කිරීම්, උසස් කිරීම් සහ අනිකුත් ව්‍යවස්ථාපිත කටයුතු කරනවා හැර, මහජන ශුභ සිද්ධිය වෙනුවෙන් වෙනම වැඩසටහන් ක්‍රියාත්මක කළේ නැහැ. 2015 මැතිවරණ වේදිකාවලදී, "වකුගඩු රෝගය සම්බන්ධයෙන් මේ රටේ දැවෙන ප්‍රශ්නයක් තිබෙනවා, ඒ නිසා මට ලැබෙන මුදලෙන් වකුගඩු අරමුදලක් හදනවා, ඒ වාගේම ජනාධිපති ධුරයට පත් වුණාට පස්සේ වකුගඩු රෝගය නිවාරණය කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කරනවා" කියලා එතුමා කිව්ව බව තමුන්නාන්සේලාට මතක ඇති. ඒ කිව්වා වාගේම, එතුමා ජනාධිපති ලේකම් කාර්යාලයේ වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකායක් ඇති කළා. ඒ වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය ඇති කළේ කවුරු වෙනුවෙන්ද?

පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ දැන් ඉන්නවා. පුත්තලම දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන් ඉන්නවා. මා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය, ගල්ගමුව, යාපහුව යන ප්‍රදේශවල සම්පූර්ණයෙන්ම ඉන්නේ වකුගඩු රෝගීන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියන්න කනගාටුයි, ගල්ගමුව හා ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල හැම පවුලකම වකුගඩු රෝගීන් එක් කෙනෙක් හෝ ඉන්නවා. ඒ නිසා මේ මුදල්වලින්, වකුගඩු රෝගය නිවාරණය කිරීම සම්බන්ධයෙන් ඒ ප්‍රදේශවල අද RO plant ජල පෙරන 500ක් හදලා තිබෙනවා. 500වන ජල පෙරනය විවෘත කළේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ ළඟයි. පිරිසිදු ජලය කළ ගෙඩි 50කින් ශ්‍රී මහා බෝධීන් වහන්සේ නාවා, වකුගඩු රෝගය අපේ රටින් තුරන් කරගන්න අවශ්‍ය වැඩ පිළිවෙළට එතුමා නායකත්වය දුන්නා. එක පැත්තකින්, වකුගඩු රෝගය නිවාරණය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා වාගේම අනික් පැත්තෙන්, වකුගඩු රෝගය වැළඳී තිබෙන අයට ප්‍රතිකාර ලබා ගන්න අවශ්‍ය නවීන පහසුකම් සහිත නව රෝහල් ඉදිකරන්න කටයුතු කරනවා. ආසියාවේ තිබෙන හොඳම වකුගඩු රෝහල පොළොන්නරුවේ ඉදි කරන්න කටයුතු කරනවා. ඒ වකුගඩු රෝහල පොළොන්නරුවේ ඉදි කරන්නේ ජනාධිපතිතුමා පොළොන්නරුවේ නිසා නොවෙයි, වකුගඩු රෝගීන්ට එය මධ්‍යස්ථානයක් වන නිසාය කියන කාරණය ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමාට මම කියන්න කැමැතියි. අම්පාර පැත්තෙන්, ත්‍රිකුණාමලයෙන්, අනුරාධපුරයෙන්, කුරුණෑගලින් එන හැම කෙනකුටම කේන්ද්‍රස්ථානයක් වශයෙන් තමයි රුපියල් මිලියන 1,200ක ආධාරයක් ලබාගෙන පොළොන්නරුවේ මේ වකුගඩු රෝහල ඉදිකිරීමේ කටයුත්තට අතිගරු ජනාධිපතිතුමා අතගසා තිබෙන්නේ. වකුගඩු රෝග නිවාරණයට තමුන්නාන්සේලා කැමැති නැත්නම්, මේවාට විරුද්ධව කථා කරන්න, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා මා කියන්න කැමැතියි.

විශේෂයෙන්ම වකුගඩු රෝග නිවාරණය සම්බන්ධයෙන් ජනාධිපති කාර්යාලයෙන් කරගෙන යන වැඩසටහන පිළිබඳව කථා කරන්න මට ලැබී තිබෙන කාල වෙලාව මදි. ඒ නිසා, වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් නිකුත් කරන ලද "වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන", "මූලය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය නිවාරණය සඳහා වූ ජාතික සැලැස්ම 2016 - 2018", වකුගඩු රෝගය සම්බන්ධයෙන් නිකුත් කර තිබෙන "දිනමිණ දැන්වීම් අතිරේකය - පෙබරවාරි මස 25 සඳුදා" හා වකුගඩු රෝග නිවාරණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද අත් පත්‍රිකා දෙකක් සහිත ගොනුව මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, "ග්‍රාම ශක්ති" වැඩ පිළිවෙළ ගැනත් මම කියන්න ඕනෑ. ග්‍රාම ශක්ති වැඩ පිළිවෙළ තුළින් ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කරනවා. අපි නිෂ්පාදන ආර්ථිකය ගැන කථා කරනවා. නමුත් නිෂ්පාදනයට අවශ්‍ය ශක්තියක් ලබාදෙන වැඩ කටයුතු අඩුයි. ඒ නිසා පසුගිය අවුරුද්දේ ආරම්භ කළ ග්‍රාම ශක්ති වැඩසටහන මේ වර්ෂයේ සියයට 300කින් වැඩි කරලා ආරම්භ කරන්න අවශ්‍ය කටයුතු අතිගරු ජනාධිපතිතුමා මේ වන විට කරගෙන යනවා. හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම එක පැත්තකින්, අඩු ආර්ථිකයක් තිබෙන ග්‍රාම සේවා වසම් තෝරාගෙන, අනික් පැත්තෙන්, නිෂ්පාදන හැකියාවන් තිබෙන පාරම්පරික නිෂ්පාදන ගම්මාන තෝරාගෙන, ග්‍රාම ශක්ති වැඩ පිළිවෙළ හරහා රට තුළ අලුත් පිබිදීමක් ඇති කරන්න පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ නිසා ජනාධිපති ලේකම් කාර්යාලයට වෙන්කරන මුදල් ජනාධිපතිතුමාගේ පෞද්ගලික සුඛ විහරණයට වෙන් කරන මුදල් නොවෙයි කියන එක බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. මේ අවස්ථාවේදී "ග්‍රාම ශක්ති" නමැති කුඩා පොතක්, "ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය" නමැති කුඩා පොතක්, ග්‍රාම ශක්ති වැඩසටහන සම්බන්ධයෙන් වූ අත් පත්‍රිකාවක් සහ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන සම්බන්ධයෙන් වූ අත් පත්‍රිකාවක් ඇතුළත් ගොනුවක්ද මා **සභාගත*** කරනවා.

අද අපේ රටේ ප්‍රධානම ප්‍රශ්නය මොකක්ද? අපේ තරුණ පරම්පරාව විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම. විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම කියන කාරණය ගත්තාම ඉතාම කනගාටුදායකයි. අද මේක තරුණ පරපුරේ විශාල පිළිලයක් බවට පත් වෙලා තිබෙනවා. මේකට අත ගහන්නට කවුරුත් භයයි. ඇයි භය? මේකට අත ගහන කෙනාව මරලා දමනවා. මේ සඳහා රාජ්‍ය

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නිලධාරින්, පොලිස් නිලධාරින් සෘජුව මැදිහත් වෙන්නට අකැමැතියි. ඒකට හේතුව පෞද්ගලික තර්ජන එනවා. මේ සඳහා හයියක් දෙන්න නායකත්වයක් ඕනෑවෙලා තිබුණා. ජනාධිපතිතුමා මේ රටේ රාජ්‍ය නායකයා වුණාට පසුව මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකාය හැදුවා. ඒ බලකාය හදලා එතැනට ත්‍රිවිධ හමුදාව, පොලීසිය, අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන් සියලුදෙනා කැඳවලා කිව්වා, "භය නැතිව මේ වැඩේට අත ගහන්න." කියා. මුලින්ම මේ වැඩ පිළිවෙළ ගම්මානවල ආරම්භ කරද්දී සමහර අය හිනා වුණා, සමහර දේශපාලනඥයෝ හිනා වුණා. ඇහුවා, "ඕක කරන්න පුළුවන් වැඩක්ද? කියා. ගම දැනුවත් කළා, රාජ්‍ය නිලධාරින් දැනුවත් කළා, පාසල් දරුවන් ඇතුළු මේ රටේ සමස්තය දැනුවත් කළා. ඒ වාගේම නීතියෙන් ඉතාමත්ම දැඩිව, සෘජුව ගත යුතු වැඩ පිළිවෙළ හා ක්‍රියාමාර්ග සඳහා නායකත්වය ලබා දුන්නා. මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන නිසා තමයි අද මේ රටේ තොග පිටින් මත්ද්‍රව්‍ය අහුවෙන්නේ, නිලධාරින් භය නැතිව කටයුතු කරන්නේ. ඒ තත්ත්වය තුළ අද අතිගරු ජනාධිපතිතුමාට විශාල ප්‍රසාදයක් ඇතිවෙලා තිබෙනවා. තමන්ගේ දරුවා වෙනුවෙන් මේ කරන කැප කිරීම ගැන ගම්බද ජනතාව තුළ එතුමාට විශාල සහයෝගයක්, ගෞරවයක් ඇතිවෙලා තිබෙනවා. තමුන්නාන්සේලා කියනවා නම් මේවා නවත්වන්නට එතුමා ලැහැස්ති වෙයි. මේ මුදල් ප්‍රතිපාදන ජනාධිපති ලේකම් කාර්යාලයට වෙන් කරන්නේ නිකම් නොවෙයි කියන්නට තවත් සාධකයක් තමයි මම මේ ඉදිරිපත් කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකාය විසින් විෂ මත්ද්‍රව්‍ය මර්දනය සඳහා ගන්නා ලද සියලු ක්‍රියාමාර්ග ඇතුළත් ලිපි ගොනුවක් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට බලපාන තවත් දැවැන්ත ප්‍රශ්නයක් තිබෙනවා. අද මේ ගරු සභාවේ සිටින මන්ත්‍රීවරුන් 225 දෙනාම වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කළොත්, බොහෝ දෙනෙකු බෝ නොවන රෝගවලට ගොදුරුවෙලා සිටින බව පෙනෙයි. ඕනෑම ගමක ජනතාව, රජයේ නිලධාරින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කළොත් පෙනෙයි, අද ඒ අය බෝ නොවන රෝග විශාල ප්‍රමාණයකට ගොදුරුවෙලා සිටින බව. මේකට ප්‍රධානම හේතුව මොකක්ද? මේකට ප්‍රධානම හේතුව තමයි අපි ගන්නා ආහාර සහ පාවිච්චි කරන ජලය. අමාරු වැඩක් වුණත් මේක නිවැරදි මඟට හරවන්නට ජනාධිපතිතුමාට ඕනෑකම තිබුණා. එම නිසා වස විසෙන් තොර ජාතික ආහාර නිෂ්පාදන වැඩ පිළිවෙළක් නිර්මාණය කළා. දැන් මේක ගම් දනව්වලට ගිහින් තිබෙනවා. ගොවි ජනතාව මේක වැළඳගනිමින්, ටිකෙන් ටික මේ සඳහා අවතීර්ණ වෙමින් සිටිනවා. මේ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ජනාධිපති ලේකම් කාර්යාලයෙන් තමයි වෙන් කර තිබෙන්නේ. ජනාධිපති වැය ශීර්ෂය යටතේම තමයි ජාතික ආහාර වැඩසටහනත් තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපති ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක කෙරෙන "ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන"ට අදාළ විස්තර ඇතුළත් ලිපි ගොනුවක් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දරුවන්ට වන හිංසන, පීඩන ගැන අපි පසුගිය දවස්වලත්, අද මාධ්‍යවලත් දැක්කා. අවුරුදු 5ක දරුවෙකුටත් වැඩිහිටියෙක් මත් පැන් පොවලා තිබුණා. සේයා කියන දැරියගේ වයස අවුරුදු 5යි. පාපතරයෙක් ඇයව දූෂණය කර ඝාතනය කළා. යාපනයේ විද්‍යා දැරිය පාසල් යනකොට එකොළොස් දෙනෙකු එකතුවෙලා දූෂණය කර, අන්තිමට මරලා දැම්මා. ඒ සිද්ධියට අදාළ වීඩියෝ දකුණු ඉන්දියාවේ වෙළෙඳ පොළට යැව්වා. ඔන්න බලන්න අපේ රටේ තත්ත්වය! එම නිසා ජනාධිපතිතුමා කල්පනා කළා තනි කෙනෙකුට මේක කරන්නට බැරි නිසා අමාත්‍යාංශ ගණනාවක් එකතු කරලා, ඒ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සියල්ලත් සමඟ "දරුවන් සුරකිමු" කියන ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරන්නට. ඒ සඳහා විවිධ දැනුවත් කිරීම් සහ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් දරුවන් ආරක්ෂා කර ගැනීමට ඇති දෙමවුපියන්ගේ වගකීම, වැඩිහිටියන්ගේ වගකීම සහ වග කිව යුත්තන්ගේ වගකීම් ඉටු කරමින් අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් විශාල කාර්ය භාරයක් ක්‍රියාත්මක වෙනවා. ඒ තමයි "දරුවන් සුරකිමු" කියන ජාතික වැඩසටහන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය - ජනාධිපති කාර්යාලය හරහා ක්‍රියාත්මක කෙරෙන "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහනට අදාළ "අනාගතය දිනන දරුවෝ" කියන පොත මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

පරිසරය පිළිබඳ ප්‍රශ්නය අද මේ රටේ විතරක් නොව ලෝකයේ ප්‍රධාන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. දේශගුණික, කාලගුණික විපර්යාසයන්වලට මුහුණ දෙන්න බැරි වුණොත් ලෝකයේ අනික් රටවලට අත්වෙලා තිබෙන ඉරණමම අපේ රටටත් අත් වෙනවා. ඒ නිසා ජනාධිපතිතුමා කල්පනා කළා, මේ පිළිබඳවත් විශේෂ වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ කියා. ඒ අනුව අද ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් පරිසර සංරක්ෂණ ජාතික වැඩ පිළිවෙළ හදලා "පුනරුදය" නමින් රට පුරාම දැවැන්ත විධියට ක්‍රියාත්මක කරනවා. ජනාධිපති වැය ශීර්ෂය හරහා මේවාට තමයි මුදල් ප්‍රතිපාදන වෙන් වන්නේ කියන එක ඉතාම ගෞරවයෙන් අපි මතක් කරන්න කැමැතියි. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන සිටින අපි ඔක්කෝම මහජන නියෝජිතයෝ. නමුත් අපි හැමදාම බොරුවක් කරනවා. මහජන දිනයේදී අපි ළඟට ඉල්ලුම්පත්‍ර කොච්චර එනවාද? ඒ ඉල්ලුම්පත්‍රවලට අපි දෙන උත්තර මොනවාද? මේ රටේ තරුණ විරැකියාව පිළිබඳව දැවැන්ත ප්‍රශ්නයක් තිබුණා. තරුණයන්ගේ දක්ෂතාවයට, සුදුසුකමට, තමන්ට ගැළපෙන තැන, තමන්ගේ ඉදිරි දැක්ම අනුව යන තැන සොයා ගැනීම පිළිබඳව දැවැන්ත ප්‍රශ්නයක් තිබුණා. ඒ නිසා මේ ප්‍රශ්නයටත් වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අත ගැහුවා. මේ පිළිබඳව විශේෂඥ දැනුම තිබෙන අයගෙන් සහ විදේශ රටවල් මේ ප්‍රශ්නය විසඳා තිබෙන ආකාරය එතුමා හොයලා බලලා මේ රටේ "Smart Sri Lanka" වැඩ පිළිවෙළ ආරම්භ කළා. ඒ නිසා "Smart Sri Lanka" වැඩසටහන යටතේ ලංකාව පුරාම ආයතන 50ක් ඇති වෙනවා. ශ්‍රී ලංකා වෘත්තීය මාර්ගෝපදේශන ආයතන 50ක් ලංකාව පුරාම ඇති වෙනවා. ඒක තවත් එක් මධ්‍යස්ථානයක් විතරක් නොවෙයි. ඒ ස්ථානයට එන ඕනෑම තරුණයෙකුට, ඕනෑම තරුණියකට තමන්ට යන්න ඕනෑ ක්ෂේත්‍රය කුමක්ද කියා හඳුන්වා දෙනවා විතරක් නොවෙයි, ඒ ක්ෂේත්‍රයේ ඉදිරියටම යන වැඩ පිළිවෙළ තමයි "Smart Sri Lanka" වැඩසටහන යටතේ ක්‍රියාත්මක වෙන්නේ. ඒ වැඩසටහනත් අද ජනාධිපතිතුමාගේ විශේෂ ව්‍යාපෘතියක් හැටියට ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම මේ ව්‍යාපෘති සියල්ලම ජනාධිපති ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක වෙන්නේ ආයතන ගණනාවක් එකට තියෙන නිසයි.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

මම යෝජනාවක් කරන්න කැමැතියි. අතිගරු ජනාධිපතිතුමාට මම යෝජනා කරනවා, ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරින්ට මම යෝජනා කරනවා, අපේ රටේ තව දැවෙන ප්‍රශ්නයක් තිබෙන බව. ඒ දැවෙන ප්‍රශ්නය තමයි වන අලි ප්‍රශ්නය. මම හිතන්නේ ඒ කාරණයට පාලිත තෙවරප්පෙරුම මැතිතුමා මාත් සමඟ එකඟ වෙනවා ඇති. වන අලි ප්‍රශ්නය වනජීවී අමාත්‍යාංශයට විතරක් විසඳන්න බැහැ, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පමණක් විසඳන්න බැහැ. ඒ නිසා මේකට කාර්ය සාධක බලකායක් හැදෙන්න ඕනෑ. ප්‍රවාහන අමාත්‍යාංශයේ සහයෝගය, ඉඩම් අමාත්‍යාංශයේ සහයෝගය, මහවැලි අධිකාරියේ සහයෝගය, මාර්ග සංවර්ධන අධිකාරියේ සහයෝගය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතුළු ආයතන ගණනාවක සහාය ඕනෑ. ඒ නිසා ජනාධිපති කාර්ය සාධක බලකායක් හදලා තමයි වන අලි ප්‍රශ්නය විසඳන්න පුළුවන් වන්නේ. ඒකට අවශ්‍ය ව්‍යාපෘති වාර්තාවත් ඕනෑ නම් දෙන්න පුළුවන්. ඒකත් අපි හදලා තිබෙනවා. ඒ කාර්ය භාරයටත් නායකත්වය දෙන්න කියා අපි ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මෙතැනදී ජයම්පතී වික්‍රමරත්න මැතිතුමා ඇතුළු,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තත්පරයක් දෙන්න, මම අවසන් කරන්නම්.

ජයම්පති වික්‍රමරත්න මැතිතුමා කිව්වා, "විධායක ජනාධිපතිකම අහෝසි කරන්න ජනාධිපතිතුමා ආවා. හැබැයි, අහෝසි කරන්නේ නැහැ." කියා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ලංකා ඉතිහාසයේ නොවෙයි, ලෝක ඉතිහාසයේම සිටින තමන්ට තිබුණු බලය "ආ ගන්න." කියා දුන්නු එකම නායකයායි. එතුමා ඒක කිව්වා විතරක් නොවෙයි, අවසාන වශයෙන් පාර්ලිමේන්තුවට පැමිණි දවසෙත් කිව්වා, "මගේ මේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ කාර්ය භාරය කරන්න තියෙන්නේ ජනාධිපති කාර්යාලයට නොවෙයි, ඒක කරන්න තියෙන්නේ මේ උත්තරීතර පාර්ලිමේන්තුවට. තමුන්නාන්සේලා ඒක කරන්න. මම ඒකට එකඟයි." කියා. ඒ ප්‍රතිඥාව ජනාධිපතිතුමා දීලා තියෙන්නේ. ඒ නිසා එතුමා බලලෝභියෙක් නොවෙයි කියන එක අපි බොහොම පැහැදිලිව මතක් කරන්න කැමැතියි. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා.

[අ.භා. 5.30]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන සිටියේ ටිකක් භයෙන්. මොකද, මෛත්‍රී ගුණරත්න ආණ්ඩුකාරතුමාගේ සංවිධායකතුමාට ගැහුවා කියලා ප්‍රශ්නයකුත් මේ කාල පරිච්ඡේදයේ තිබෙන නිසා. මගේ නම කියන කොට මටත් දෙකක් නෙළයිද කියලා මට භය හිතුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා කියපු කාරණාත් එක්ක මගේ කථාව පටන් ගන්න මම බලාපොරොත්තු වනවා. වංචාව, දූෂණය පිළිබඳවත්, වකුගඩු රෝග පිළිබඳවත්, ඒ වාගේම කාර්ය සාධක බලකායන් පිළිබඳවත් එතුමා කථා කළා. එතුමා අවසානයට කියපු විධියට වනජීවීන් සම්බන්ධයෙන් කාර්ය සාධක බලකායන් පිහිටුවනවා නම්, අධිකරණ කටයුතු සඳහාත් කාර්ය සාධක බලකායක් පිහිටුවන්න වෙයි. මොකද, පොලීසිය නඩු ගේනවා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නඩු ගේනවා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නඩු ගේනවා, සුරාබදු දෙපාර්තමේන්තුවෙන් නඩු ගේනවා, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙන් නඩු ගේනවා. එම නඩු අධිකරණය අහනවා. එතකොට මේ සියල්ලම එකතු කරලා අධිකරණ ක්‍රියාවලිය සඳහාත් කාර්ය සාධක බලකායක් පිහිටුවන්න ඕනෑ, වනජීවීන් සම්බන්ධව කාර්ය සාධක බලකායක් පිහිටුවනවා නම්. එහෙම නේද, සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමනි? මම හිතන්නේ එහෙනම් ඒකටත් කාර්ය සාධක බලකායක් පිහිටුවන්න ඕනෑ.

අනික් කාර්යයන් ගත්තත් එනම් වෘත්තීය පුහුණුව ගත්තොත්, NAITA එකෙන් එකක් කරනවා, වෘත්තීය පුහුණු අධිකාරියෙන් එකක් කරනවා, සාගර විශ්වවිද්‍යාලයෙන් තව එකක් කරනවා, තාක්ෂණික විද්‍යාලයෙන් තව එකක් කරනවා, ඒ වාගේම ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස විද්‍යාලයෙන් තව එකක් කරනවා, ඉංජිනේරු තාක්ෂණ ආයතනයෙන් තව එකක් කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගෙන එන මතවාදයත් එක්ක බලන කොට මේ සියල්ලටත් කාර්ය සාධක බලකායන් පිහිටුවන්න ඕනෑ.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මට පොඩි අවස්ථාවක් දෙනවාද?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
නැහැ, ඔබතුමාට අවස්ථාවක් දෙන්න බැහැ. ඔබතුමා කථා කළා. මට ලැබී තිබෙන්නේ පොඩි වෙලාවක්.

එහෙම බලනවා නම්, මේ හැම කාර්යයකටම කාර්ය සාධක බලකායක් හදන්න ඕනෑ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් වැව් හදනවා; ඇළ මාර්ග හදනවා. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් වැව් හදනවා; ඇළ මාර්ග හදනවා; ගොවිතැන් කටයුතුවලට උදව් කරනවා, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් තව දෙයක් කරනවා, මහවැලියෙන් තව එකක් කරනවා. එහෙමනම්, මහවැලියයි, කෘෂිකර්මයයි, ගොවිජන සේවායි, වාරිමාර්ගයි කියන මේ සියල්ලම එකතු කරලාත් කාර්ය සාධක බලකායක් හදන්න ඕනෑ. මේ කියන තර්ක අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියයි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයයි කියන මේ සියල්ලමත් එකතු කරලා තවත් කාර්ය සාධක බලකායක් හදන්න ඕනෑ, මේ කියන තර්ක අනුව. මේ විගඩම් මොනවාද කියලා මම දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම දූෂණය, වංචාව පිළිබඳව එතුමා කථා කළා. ඒ පිළිබඳව පියවර ගත්තා කිව්වා. මේ රටේ උත්තරීතර පාර්ලිමේන්තුවත් එක්ක බොහොම පැහැදිලි විවෘත දූෂණ ගනුදෙනු සිද්ධ වූ අවස්ථාව ඔක්තෝබර් මාසයේ 26 වෙනි දාය කියලා මම මතක් කරන්න කැමැතියි. ඒ ඔක්තෝබර් මාසයේ 26 වෙනි දා රටේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් කර

ගෙන ගිය කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළත් එක්ක, තනතුරු ලබා දීම සහ මුදල් ලබා දීමට යෝජනා කිරීම සම්බන්ධව- ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා සභාවෙන් යනවාද? මේ අවස්ථාවේදී ඔබතුමා සභාවේ සිටියා නම් හොඳයි. ඔබතුමා කියපු එකටයි මම මේ උත්තර දෙන්නේ. එතැන බොහොම පැහැදිලිවම ප්‍රසිද්ධියේ -හෙලුවෙන්- වංචාව දූෂණය සිද්ධ වුණා. මන්ත්‍රීවරයෙකුට මුදල් දීලා මේ පැත්තේ ඉඳලා ඒ පැත්තට එන්න කියලා ආණ්ඩුවක් හදන්න යෝජනා කරනවා; ආරාධනා කරනවා. අනික් පැත්තෙන් තනතුරක් දෙන්නම්, අපි වෙනම ආණ්ඩුවක් හදමු කියලා ආරාධනා කරනවා. එතකොට මේක දූෂණයක් නොවෙයිද? මේක වංචනික ක්‍රියාවක් නොවෙයිද? මේක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යටතට ගැනෙන්නා වූ වරදක් වෙන්නේ නැද්ද? ඒ සඳහා මුදල් ගන්නවා නම්, ඒක බොහොම පැහැදිලිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යටතේ සිදු කරනු ලබන විමර්ශනයක් බවට පත්වන්න ඕනෑ; වරදක් වෙන්න ඕනෑ. එම නිසා තමයි Transparency International ආයතනය බොහොම පැහැදිලිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ගිහිල්ලා පැමිණිලි කර තිබෙන්නේ. ඒ පැමිණිල්ලට මමත් සහාය වුණා; CD පට දුන්නා; ලිඛිත සාක්ෂි දුන්නා; හඬ පට දුන්නා. මේ සියල්ල දීලා මාත් ඒ විමර්ශනයට සහාය වෙලා තිබෙනවා. මම පොලීසියේ හිටපු කාලයේ ඒ inquiry එක කළා නම්, මට ඒකට යන්නේ සති දෙකයි. දැන් මාස තුනකට ආසන්න වෙලා තිබෙනවා, මේ මාස තුනක කාලය ඇතුළතත් මේ විමර්ශනයට කුමක් වුණාද කියන එක මම දන්නේ නැහැ. මේ වැය ශීර්ෂය යටතේම තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවත් ක්‍රියාත්මක වන්නේ. එහෙම නම්, මේ කුමන්ත්‍රණය කරපු පුද්ගලයෝ සම්බන්ධවත් යම් විමර්ශනයක් අපි බලාපොරොත්තු වනවා. මේ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය බොහොම පැහැදිලි තීන්දුවක් දීලා තිබෙනවා, තුන්දෙනෙකුගෙන් යුක්ත විනිශ්චයකාර සභාවක් ප්‍රමාණවත් නැහැයි කියලා. එහෙනම් ඒ සඳහා හත්දෙනෙකුගෙන් යුක්ත විනිශ්චයකාර සභාවක් පත්කර තිබුණා. ඒ හත්දෙනෙකුගෙන් යුක්ත විනිශ්චයකාර සභාව විසින් ඒකමතික තීන්දුවක් දීලා තිබෙනවා. ඒ තීන්දුව අනුව රටේ ව්‍යවස්ථාව උල්ලංඝනය කළාය කියලා තිබෙනවා. එහෙම නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට බොහොම පැහැදිලිව මේ පිළිබඳව ක්‍රියාත්මක වෙන්න පුළුවන්කම තිබෙනවා. මේ දූෂණය ඇති කළේ කවුද, මේ කුමන්ත්‍රණය කළේ කවුද, මෙය දූෂිත ක්‍රියාවලියක්ද යන්න සොයා බලා ඒ සම්බන්ධව මහාධිකරණයේ නඩු පැවරිය යුතුද කියන කාරණයත් නිගමනය කර, ඒ සම්බන්ධයෙන් පියවර ගැනීමට තවත් ප්‍රමාද නොකළ යුතුයි කියන එක මම බොහොම පැහැදිලිව කියනවා.

ශාන්ත බණ්ඩාර මැතිතුමා ජාතික වකුගඩු රෝහල, වකුගඩු රෝගය ගැනත් සඳහන් කළා. ඇත්ත වශයෙන්ම පිළිකාව වාගේම දැවැන්ත විධියට මිනිසුන් පීඩා විඳින රෝගයක් තමයි, වකුගඩු රෝගය. අපේ ප්‍රදේශවල ජනතාවට දවසින් දවස වකුගඩු රෝගයෙන් පීඩනයට ලක් වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ සඳහා රජය සුවිශේෂී ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන තිබෙනවා. ඒ අතරතුර ජනාධිපතිතුමා විශේෂයෙන්ම වකුගඩු රෝහලක් ඉදිකිරීමට කටයුතු කළා. ඒකත් ඉතාම හොඳ කටයුත්තක්. වකුගඩු රෝගය සුව කරන්න රෝහලක් ඉදි කළා වාගේම පපුවල කුණු සුද්ධ කිරීම සඳහාත් පියවර ගත්තා නම් ඉතාම හොඳයි. ඒ සඳහාත් රෝහලක් ආරම්භ කළා නම් වඩාත් වටිනවා කියන එක මම කියන්නට කැමැතියි. මොකද, පසුගිය ඔක්තෝබර් 26 වනදා සිදු වූ කුමන්ත්‍රණය පිළිබඳව සාක්ෂි සාධක ඇතිව අපි මේ රටට කරුණු කිව්වා; ලෝකයට කරුණු කිව්වා. මුළු ලෝකයම පිළිගත්තා, එය දූෂිත ක්‍රියාවලියක් කියලා. ඒ දූෂිත ක්‍රියාවලිය හෙළිදරව් කිරීම නිසා අදටත් - මාස තුනක් ගත වෙලා තිබෙද්දීත්,- මේ පාලන තන්ත්‍රය තුළ රංගෙ බණ්ඩාර දඬුවම් විඳිනවා. අන්න ඒ නිසා තමයි මා බොහොම පැහැදිලිවම කිව්වේ, පපුවල කුණු සුද්ධ කිරීම සඳහාත් වෙනම රෝහලක් ආරම්භ කරන්න කියා. එය පොළොන්නරුවේ ආරම්භ කරන්න බැරි නම් ඊට අල්ලපු අනුරාධපුරය දිස්ත්‍රික්කයේ හෝ ආරම්භ කරලා, පපු කුණු පිරිසිදු කිරීමේ පිරිපහදුවක් සහිත රෝහලක් ආරම්භ කළා නම් වඩාත් හොඳයි කියන කාරණය මා සිහිපත් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මිත්‍ර දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අය වැය දෙවන වර කියවීමේ විවාදයට සහභාගි වෙලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳව දැඩි විවේචනයක් සිදු කළා. එම සභාව නියෝජනය කරන, මේ සභාවෙන් ඉහළ සිටින උදවියත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට දිගින් දිගටම පහර ගැහුවා. මේ සභාවට ඇවිල්ලාත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පහර ගැහුවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නම් 5ක් විතර එව්වොත්, vacancy එකයි නම් තිබෙන්නේ, ඒ පුරප්පාඩුව සඳහා නිර්දේශ කරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට යවන්න පුළුවන් වන්නේ එක්කෙනකු පමණයි. ඉතිරි නම් හතරට මොකද කරන්නේ? ඒ නම් නිර්දේශ කරන්න පුළුවන්ද, ගරු කුමාර වෙල්ගම මැතිතුමනි? ඒක කරන්න පුළුවන්කමක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඔබතුමා සිටියත්, මා සිටියත්, කවුරු සිටියත්, එක පුරප්පාඩුවයි නම් තිබෙන්නේ, නම් දෙකක් ආවත්, තුනක් ආවත් අපට නිර්දේශ කර යවන්න වෙන්නේ එක නමයි. එහෙම නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එහිදී යුක්තිය ඉෂ්ට කර තිබෙනවා; නිවැරැදිව නීතිය ක්‍රියාත්මක කර තිබෙනවා. එහෙම කර තියෙද්දීත් නිකඩ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට අප පන්නා පන්නා පහර ගහනවා. මෙතැනදී පහර ගහනවා; වේදිකාවට ගිහින් පහර ගහනවා; පන්සලට ගිහින් එනකොට voice cut එකක් දෙන විට පහර ගහනවා. හැම තැනකදීම ඒ අය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පහර ගහගෙන ගියා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අසරණ වෙලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගමන ඉදිරියට ඇවිත් මගේ මිත්‍ර දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අය වැය දෙවන වර විවාදයට සහභාගි වෙමින් ගරු කරු ජයසූරිය කථානායකතුමාටත්, උපුල් ජයසූරිය මැතිතුමාටත්, අද වැය ශීර්ෂයට අදාළ ක්ෂේත්‍රයක ප්‍රධානියකුටත් දිගින් දිගටම පහර ගැහුවා, "ඊළඟ උසස් වීම ලබා ගැනීම සඳහා උපුල් ජයසූරිය ජනාධිපති නීතිඥතුමාගේ නිවසේ සාදයක් පැවැත්වුවා. දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීන්දු තීරණ ගන්නේ උපුල් ජයසූරිය මහත්මයාගේ ගෙදර ඉඳලායි. කථානායකතුමා එතැනට ගියා." කියා. 50දෙනෙක් විතර ඒ උත්සවයට සහභාගි වෙලා තිබෙනවා. ඒ උත්සවයට 50දෙනකු විතර සහභාගි වෙලා සිටින විට ඒ 50දෙනා අතර ඉඳගෙන මෙවැනි දෙයක් කථා කරන්න පුළුවන්ද? මේ පිළිබඳ හඬ පට ඔවුන් ළඟ තිබෙනවා කියලා එතුමා කිව්වා. අපි නම් හඬ පට එළියට දාලා මුළු රටටම, ලෝකයටම අහන්න දුන්නා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ඉතාම පැහැදිලිව පුළුවන්, ඒ තිබෙන හඬ පට ගෙනැල්ලා එළියට දාලා "මෙන්න මෙවැනි සාකච්ඡාවක් කර තිබෙනවා. ව්‍යවස්ථා සභාවේ තීන්දු ගන්නේ උපුල් ජයසූරියගේ ගෙදරයි" කියා ඔප්පු කරන්න. එහෙම නැත්නම් එය ප්‍රසිද්ධියේ එළියේ කියන්න පුළුවන්. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා නීතිඥවරයෙක්. ඒ නිසා එතුමාට පුළුවන් මෙය ප්‍රසිද්ධියේ එළියේ කියන්න. පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවා වෙලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා වන ගරු කථානායකතුමාටත්, රටේ ප්‍රසිද්ධ නීතිඥවරයකුටත්, රටේ ප්‍රධානම ආයතනයක, නීතිඥ වෘත්තියේ ප්‍රධාන පෙළේ තනතුරකට -ඉහළම තනතුරකට,- පහර දීම සඳහා මේ ගරු සභාවේ වරප්‍රසාදවලට මුවාවෙලා කටයුතු කිරීම ඉතාම අනුචිත ක්‍රියාවක් කියන එක මා කියන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා තවත් විනාඩියකින් මගේ කථාව අවසන් කරන්නම්. නීති විරෝධි මත්පැන් ප්‍රශ්නය වෙසක් පෝයට පෙර අවසන් කරන්න කියා ජනාධිපතිතුමා නියෝගයක් දීලා ක්‍රියාත්මක කරගෙන යනවා. අපි ඒ පිළිබඳව අපේ ප්‍රශංසාව පුද කරනවා. මොකද, මත් ද්‍රව්‍ය, නීති විරෝධි මත්පැන් මේ සමාජයෙන් තුරන් කරන්න පුළුවන් නම්, දැඩි පාලනයකට ලක් කරන්න පුළුවන් නම්, සෞඛ්‍යය ආරක්ෂා කිරීමටත්, සමාජමය තත්ත්වය ආරක්ෂා කිරීමටත් එය ඉතාම වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික පොලිස් කොමිෂන් සභාවත් මේ වැය ශීර්ෂවලින් ආවරණය වන නිසා මා මේ කාරණයත් සඳහන් කරනවා. මගේ මැතිවරණ කොට්ඨාසය පොලිස් ස්ථාන නවයකින් සමන්විතයි. මගේ මැතිවරණ කොට්ඨාසයේ සාලියවැව නමින් පොලිස් ස්ථානයක් තිබෙනවා. එතැනට පොලිස් ස්ථානාධිපතිවරයකු පත් කර එවා තිබෙනවා. මම රඹෑව විද්‍යාලයට ගියාම කාන්තාවන් 50දෙනෙකු විතර ඇවිත් මාව වට කර ගත්තා. "ගම්පෙරළිය" වැඩසටහන යටතේ මේ ක්‍රීඩාංගණය හදා දුන්නාට ඔබතුමන්ලාට බොහොම ස්තුතියි. අනේ මොන සංවර්ධනයක් කළත් වැඩක් නැහැ. හැබැයි, ප්‍රශ්නයක් වෙලා තිබෙන මේ ගමේ කෙරෙන අරක්කු ව්‍යාපාරය නතර කර දෙන්න" කියා ඔවුන් මට කිව්වා. මම පොලිස්පති පූජිත ජයසුන්දර මහත්මයාට මේ කාරණය කිව්වා.

මා එතැන ඉඳලාම පොලිස්පතිතුමාට දුරකථනයෙන් කථා කළා. එතුමා මට දුරකථන අංකයක් දුන්නා. ඒ අංකයට fax කරන්න කියලා කිව්වා. අනේ! අර ගමේ කාන්තාවන් ලියුම් ලියාගෙන ගිහිල්ලා, fax කළා. පොලිස් ස්ථානාධිපතිතුමා බලාගෙන ඉන්නවා. මුළු ගම -වසම- පුරාම මත් ද්‍රව්‍ය ව්‍යසනයක් බවට පත්වෙලා තිබෙනවා; මත්පැන් ව්‍යසනයක් බවට පත්වෙලා තිබෙනවා. එහෙම නම් මේ කොමිෂන් සභාවෙන් පත් කිරීමේ ක්‍රමවේදය,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. මේ කොමිෂන් සභාවෙන් පත් කිරීමේ ක්‍රමවේදයේදීත් යම් යම් උදවියගේ performance බැලීමේ ක්‍රමවේදය පිළිබඳවත් යම් ගැටලුවක් තිබෙනවාය කියන කාරණය මා මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. මට කථා කරන්න වේලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිය පුද කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 5.41]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அதிமேதகு ஜனாதிபதி அவர்களின் காரியாலயத்திற்கு கூடுதலான நிதி ஒதுக்கீடு செய்யப்பட்டதாக, இன்றைய வரவு செலவுத்திட்டக் குழுநிலை விவாதத்தில் விமர்சனங்கள் செய்யப்பட்டாலும், ஜனாதிபதி காரியாலயத்தின் ஊடாக, ஜனாதிபதி விசேட செயலணிமூலம் எமது பகுதிகளில் செய்யப்படுகின்ற பாரிய வேலைத்திட்டங்களைப் பார்க்கும்போது, இந்த நிதிகூடப் பற்றாக்குறையாக இருக்கும் என்றுதான் நான் நினைக்கின்றேன். இன்று எமது பகுதிகளில் சிறுநீரக நோயைத் தடுக்குமுகமாக பலநூறு RO Plants பொருத்தப்பட்டிருப்பது உங்களுக்குத் தெரியும். அங்கு இன்னும் பல தேவைகள் நிறைவேற்றப்பட வேண்டியிருக்கின்றன. அதிகளவுக்கு எமது பகுதிகளின் தேவைகள் அதிமாக இருக்கின்றன. இன்று நாடடின் பல பகுதிகளில் போதைவஸ்து ஒழிப்புக்கான ஜனாதிபதி விசேட செயலணிமூலம் இதுவரை இல்லாத அளவு போதைவஸ்துகள் கண்டுபிடிக்கப்பட்டு வருகின்றன. வடக்கு பகுதிகளில் சிறுவர்கள்கூட போதைவஸ்து பாவிக்கக்கூடிய அளவுக்கு நிலைமை இருக்கின்றது. அங்கு எவ்வாறு போதைஸ்து கிடைக்கின்றது என்பது பற்றித் தெரியவில்லை. இருந்தாலும், இதில் விசேட கவனம் செலுத்த வேண்டியிருக்கின்றது. ஜனாதிபதி செயலணிக்கூடான செயற்பாடுகளின்மூலம் அல்லது வேறு ஏதாவது வழிகளில் அங்கு மிக விரைவாகப் போதைவஸ்துப் பாவனை ஒழிக்கப்பட வேண்டும். இந்த வகையில் ஜனாதிபதிக்கான நிதி ஒதுக்கீடுகள் சரியானது என்று நான் நினைக்கின்றேன்.

அதேபோல் எமது பகுதிக்குரிய "கிராம சக்தி" செயற்றிட்டத்தின் ஊடான தேவைப்பாடுகளைப் பூர்த்திசெய்வதற்காக இன்னும் நிதி ஒதுக்கீடு செய்யப்பட வேண்டியிருக்கின்றது. குறித்த நிதி ஒதுக்கீடு எமது பகுதியிலும் சரியான முறையில் பயன்பட வேண்டும். இந்த நிதி ஒதுக்கீடுகள் பற்றிச் விமர்சிப்பவர்கள் அதைச் செய்வது தமது அரசியல் நோக்கத்துக்காகவே தவிர, வேறு எதற்காகவும் இல்லை. இந்த ஒதுக்கீடு நியாயமானது; அதில் பிழை இல்லை என்பதை சம்பந்தப்பட்ட உறுப்பினர்கள் தெரிந்து கொள்ளவேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று சுயாதீன ஆணைக்குழுக்களுக்குத் தகுதியற்றவர்களை நியமிக்கும் போது ஏற்படும் பிரச்சினைகள் பாரியன. மாகாண சபைத் தேர்தலைக்கூட எங்களால் நடத்தமுடியாமல் இருக்கின்றது. அதற்குக் காரணம், எல்லை நிர்ணய ஆணைக்குழுவுக்கு அன்று நியமிக்கப்பட்ட உறுப்பினர்களின் செயற்பாடுகளாகும். இன்று இலங்கையில் சிறுபான்மையினர் எல்லா இடங்களிலும் பரந்து வாழ்கின்றார்கள். அவர்களை உள்வாங்கக்கூடிய அளவுக்கு எல்லைகள் நிர்ணயிக்கப்படவேண்டிய காலகட்டத்தில், அந்த எல்லைகள் அவ்வாறு நிர்ணயிக்கப்படவில்லை. எல்லை நிர்ணயக் குழுவில் நில அளவை மாத்திரம் தெரிந்த குறித்த தவிசாளர், புள்ளிவிபர சராசரிக்குள் மாத்திரம் முடங்கிப்போன ஒரு சில உறுப்பினர்களுடன் இணைந்து, புவியியல் பேராசிரியரான மர்ஹூம் ஹஸ்புல்லாஹ் அவர்களின் அனைத்து இன மக்களையும் உள்வாங்கிய களநிலை யதார்த்தங்களுடனான ஆலோசனை களையும் முன்மொழிவுகளையும் வாதங்களையும் புறக்கணித் தமையே இவ்விடயம் இங்கு எதிரொலித்தமைக்குக் காரணம் என்பதை இந்தப் பாராளுமன்றம் அறிய வேண்டும். சுயாதீன ஆணைக்குழுவின் நடவடிக்கைகளில் ஜனநாயகம் துளியேனும் பேணப்படவில்லை என்பதே யதார்த்தம்.

பன்மைத்துவமிக்க யதார்த்தபூர்வமான ஓர் அறிக்கையை முன்வைக்க பேராசிரியர் எடுத்த முயற்சிகள் அனைத்தும் தவிசாளர் உள்ளிட்ட ஒரு சில உறுப்பினர்களின் குறுகிய எண்ணப்பாடு அல்லது சிறுபிள்ளைத்தனமான நொண்டிச் சாட்டுக்கள் காரணமாக நிராகரிக்கப்பட்டன. இந்தக் குழு தமக்குக் கிடைக்கப்பெற்ற புலமைச்சொத்தைப் புறம்தள்ளிவிட்டு, மக்கள் பிரதிநித்துவத்தைப் புறக்கணித்து அர்த்தசூனியமான ஓர் அறிக்கையையே சமர்ப்பித்தது. அதில் பேராசிரியர் மர்ஹூம் ஹஸ்புல்லாஹ் அவர்கள் கையொப்பமிட நிர்ப்பந்திக்கப்பட்டார். இருப்பினும், அவர் மிகத் தைரியமான முறையில் தனது மறுப்பறிக்கைமூலம் இந்த அறிக்கையிலுள்ள குறைபாடுகளை விபரமாக முன்வைத்தார். விருப்பு வாக்கு வேட்கை மற்றும் ஊழல் வன்முறைகளை ஒழிக்கும்

வகையில் சில எண்கணிதக் கணிப்பீடுகளை மாத்திரம் கவனத்தில் கொண்டு ஓர் அவசர நிலையில் தயாரிக்கப்பட்ட ஒரு சட்டமாகவே, உள்ளூராட்சி மற்றும் மாகாண சபைத் தேர்தல்கள் சீர்திருத்தச் சட்டத்தைக் கருத முடியும். ஏனெனில், சட்டங்களிலும் குறித்த எல்லை நிர்ணய செயன்முறையிலும் நாட்டின் பல பாகங்களிலும் சிதறிவாழும் பலதரப்பட்ட சிறுபான்மை மக்களின் நியாயமான பிரதிநிதித்துவம் தொடர்பாகக் கவனத்தில் கொள்ளப்படவில்லை என்பது கசப்பான உண்மையாகும். இதன் காரணமாகவே பல மில்லியன் ரூபாய் மக்கள் நிதியைச் செலவு செய்து திரு. தவலிங்கம் தலைமையிலான குழு தயாரித்த எல்லை நிர்ணய அறிக்கைக்கு ஆதரவாகப் பாராளுமன்றத்தில் ஒரு வாக்கையேனும் பெறமுடியாது போய்விட்டது. அது முழுமையாகவே நிராகரிக்கப் பட்டதுடன், இன்று நாட்டில் மாகாண சபைத் தேர்தலைக்கூட நடாத்த முடியாத ஒரு துர்ப்பாக்கிய நிலை தோன்றியுள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இவ்வாறு தோற்கடிக்கப்பட்ட அறிக்கையைத் தயாரித்த குறித்த எல்லை நிர்ணயக் குழுவின் அதே உறுப்பினர்களின் பணிகளை அங்கீகரித்து, சபாநாயகர் தலைமையிலான அரசியலமைப்புக் குழு மீண்டும் அதே உறுப்பினர்களை எல்லை நிர்ணய ஆணைக்குழு உறுப்பினர்களாக நியமித்துள்ளது. இது முழுமையாக தோல்வி யுற்ற ஒரு திட்டமாகும். நாட்டில் பல மட்டங்களிலும் சிறந்தவர்கள் இருக்கும்போது மீண்டும் இவர்களையே நியமிப்பதென்பது ஜனநாயக விரோதச் செயலாகும். இவ்வாறான முறைகேடான விடயங்களை இந்தப் பாராளுமன்றத்தில் நாம் எதிர்பார்க்க வில்லை. இங்கு பல விடயங்கள் புலப்படுகின்றன. மாகாண சபைத் தேர்தலை நடாத்த முடியாதபடி பல சிக்கல்களைத் தோற்றுவித்திருக்கின்ற இந்த அறிக்கை அரசாங்கத்தின் ஒரு திட்டமிட்ட சதியா? என்றுகூட நினைக்கத் தோன்றுகின்றது. ஏனெனில், இந்த அரசாங்கம் எந்தவொரு தேர்தலையும் எதிர்கொள்ளத் தயாரில்லை. அதனால் தமது ஆதரவாளர்களை ஆணைக்குழுக்களில் புகுத்தி முழுமையான ஜனநாயக முயற்சிகளை முடக்க நடவடிக்கை எடுக்கின்றது. இது எந்த வகையான ஜனநாயகம்? இந்தச் சுயாதீன ஆணைக்குழுவுக்கான நியமனத்தின்போது முறையாக விண்ணப்பம் கோரப்படுவதில்லை. முறைசாரா வகையில் விண்ணப்பித்த தகுதிவாய்ந்தவர்களின் விண்ணப்பங்கள் மாயமாக மறைகின்றன. இதன் மர்மம் என்ன? நாம் அறிந்த வகையில் அரசியலமைப்புப் பேரவை உறுப்பினர் களின் தனிப்பட்ட விருப்பின் அடிப்படையிலேயே ஏனைய ஆணைக்குழுக்களுக்கான உறுப்பினர்கள் நியமிக்கப் படுகின்றனர்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இவ்வாறான ஜனநாயக விரோதச் செயற்பாடுகளை நிறுத்தி, நாட்டில் உண்மையான ஜனநாயகத்தை நிலைநாட்ட முழு முயற்சி யுடன் செயற்பட வேண்டுமென்று வேண்டிக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிந்துவிட்டது.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
சரி, நன்றி.

[අ.භා.5.51]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අය වැය පිළිබඳ කාරක සභා අවස්ථාවේදී ආයතන 25ක් ගැන කථා කරනවා. ඒ අතර තිබෙනවා, අතිගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය සහ අග්‍රාමාත්‍ය කාර්යාලය, අමාත්‍ය මණ්ඩල කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වාගේ සුවිශේෂී ආයතන රාශියක වැය ශීර්ෂ. පාර්ලිමේන්තුවේ පසු පෙළ මන්ත්‍රීවරයකු වන මට කාරක සභා අවස්ථාවේ පළමු දිනයේදීම අදහස් දක්වන්න අවස්ථාවක් ලැබීම ගැන සතුටු වනවා.

මේ ඉදිරිපත් වෙලා තිබෙන්නේ අපේ රජයේ පස් වන අය වැයයි. මේ වෙලාවේ රටේ සුවහසක් ජනතාව බලාගෙන ඉන්නේ, පසුගිය වසර හතරට සාපේක්ෂව ගත්තාම මේ අය වැය රටේ ජන ජීවිතයට සහනයක් ලැබෙන ජනතාවාදී අය වැයක් වෙයිද කියලායි. විශේෂයෙන්ම අප නියෝජනය කරන දුෂ්කර ප්‍රදේශවල ආර්ථික දුෂ්කරතා තිබෙන අහිංසක මිනිසුන් සහනයක් බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ වාගේම තවත් පිරිසක් බලාගෙන ඉන්නවා, සාම්ප්‍රදායික අය වැයවලින් ඔබ්බට ගිහින් රටේ ආර්ථිකය හා දිශානතිය වෙනස් කරන්න ශක්තිය මුසු කරන්න පුළුවන් අය වැයක් බවට මේ අය වැය පත් වෙයිද කියලා. මේ අරමුණු තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 8 වන දා මේ රටේ තීරණාත්මක ජන මතයකින් නව ජනාධිපතිවරයෙක් බිහි කරන තැනට ආවේ. ඒ තීරණය ඉස්සරහ කෙළින් සිට ගත්තේ ප්‍රජාතන්ත්‍රවාදය අගයන, මේ රටට ආදරය කරන දේශ ප්‍රේමී ජනතාව. එදා පක්ෂ, පාට භේදයකින් තොරව 162,000කට අධික ජනතාවගේ ජන මතයක් එක තැනකට එකතු වුණා. මේ රටේ කීර්තිය විනාශ වෙලා, අගාධයට යමින්, ජාත්‍යන්තරය ඉදිරියේ මේ රට කොන් වෙලා තිබෙන වෙලාවක තමයි ජනතාව තීන්දුවක් ගත්තේ, ඒ පැවැති ඒකාධිපති පාලනයෙන් මේ රට මුදා ගන්න. ඒ ජනාධිපතිවරණය සඳහා අපි පොදු අපේක්ෂකයෙක් ඉදිරිපත් කළා. එදා අපි ඇතුළු රටේ ජනතාව ඉදිරියට ඇවිල්ලා පොරොන්දු වුණා, මේ රටේ ඉදිරි ගමන් මාර්ගය භාර දෙන්න ඒ පොදු අපේක්ෂකයා ජයග්‍රහණය කරවන බවට. ඒ පොදු අපේක්ෂකයා ජයග්‍රහණය කරවීමේ මහා දැවැන්ත මෙහෙයුමක් ක්‍රියාත්මක වුණා. එදා තිබුණු දේශපාලන වියරුව පරදවමින්, එදා තිබුණු දේශපාලන ඒකාධිපතිත්වය පරදවමින්, මේ රටේ පොදු ජනයාගේ අපේක්ෂාව වූ "පොදු අපේක්ෂකයා ජයග්‍රහණය කරවන්න" දුක් වින්දේ මේ රටේ අහිංසක, දුප්පත් මිනිස්සු. ඒ නිසා වෙනත් දේශපාලන අරමුණුවලින් තොරව, පෞද්ගලික අරමුණුවලින් තොරව, වෙන වෙන හැඟීම්වලට ඉඩ නොදී මේ රටේ පොදු ජනතාව බලාපොරොත්තු වූ ඒ අරමුණ කරා යන්න අපට වගකීමක් තිබෙනවා.

එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා වුණාම, පක්ෂ පාට භේදයකින් තොරව මිනිස්සු සතුටු වුණ බව අද එතුමාගේ වැය ශීර්ෂය පිළිබඳ කාරක සභා අවස්ථාවේදී විශේෂයෙන්ම කියන්න ඕනෑ. ජනතාව එතුමා කෙරෙහි ලොකු විශ්වාසයක් ඇති කර ගත්තා. එතුමා කළ ප්‍රකාශවලින් ඒ විශ්වාසය ජනතාව තවදුරටත් තහවුරු කර ගත්තා. තමන්ගේ ප්‍රතිරූපය වර්ධනය කර ගන්න සහ සුඛවිහරණය වෙනුවෙන් මේ රටේ පොදු ජනතාවගේ මුදල් වෙන් කර ගැනීම වෙනුවට, සරල ජීවිතයක් ගෙවන, වචනයේ පරිසමාප්තයෙන්ම සරල විධියට ජනාධිපති ධුරයේ කටයුතු කරන ජනාධිපතිවරයකු වන බවත්, මේ රටේ දේශපාලනඥයා සාමාන්‍ය සරල මනුස්සයෙක් බවට පරිවර්තනය කරන බවත් එතුමා පුන පුනා කිව්වා.

ඒ විශ්වාසය තරුණ දේශපාලනඥයෙකු විධියට, ආධුනික දේශපාලනඥයෙකු විධියට මටත් තිබුණා. හැබැයි, බලයට පත්වෙලා අවුරුදු පහකට ආසන්න වන මේ වෙලාවේ අද අපි ඒ කාරණා යළිත් කථා කරනවා. එදා අපේ පළමුවැනි අය වැය ඉදිරිපත් කරන වෙලාවේ අපි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාට පලු පැළෙන්න ගැහුවා අපට මතකයි. මොකද, ජනාධිපතිවරයා විධියට එතුමාගේ වැය ශීර්ෂයට ඒ කාලයේ -

[ගරු හේෂා විතානගේ මහතා]

2014 අවුරුද්දේ - රුපියල් මිලියන 8,567ක් වෙන් කරගෙන තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මා ළඟ ඒ තොරතුරු තිබෙනවා. මේ සා විශාල මුදලක් ඇයි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා වෙන් කර ගත්තේ? තමන්ට අවශ්‍ය දේශපාලන ගමන් මගේ යන්න, තමන්ගේ හෙංචයියන්ට සලකන්න, තමන්ට හිතැති පරිදි ජනාධිපති තනතුර මෙහෙයවලා වැඩ කරන්න තමයි මේ සා මුදලක් වෙන් කර ගත්තේ කියලා අපි එතුමාට චෝදනා කළා.

හැබැයි, 2015දී අපි පත් කර ගත්ත ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂයට රුපියල් මිලියන 2,564ක් තමයි වෙන් කරලා තිබුණේ. ඒ සම්බන්ධයෙන් මේ රටේ සියලු ජනතාව සතුටු වුණා. ඒ ගැන අවබෝධයක් තිබෙන හැම මිනිහෙක්ම තේරුම්ගත්තා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ පළමුවැනි පොරොන්දුව ඉටු කළා කියලා. රුපියල් මිලියන 9,562ක් වෙච්ච මුදල එදා එතුමා රුපියල් මිලියන 2,564කට -සියයට 75කින්- අඩු කර ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කෙරෙහි මේ රටේ ජනතාවට ලොකු බලාපොරොත්තුවක්, විශ්වාසයක් ඇති වුණා. අපි මේ වෙලාවේ මේ කාරණයත් සිහිපත් කරන්න ඕනෑ. මාදුළුවාවේ සෝභිත නාහිමියන්ගේ දෙණ ළඟදී එතුමා සපථ කරලා කිව්වා, "නැවත වතාවක් මේ රටේ ජනාධිපති කෙනෙකු පත් කරන්න ඉඩ තියන්නේ නැහැ, ජනාධිපති ධුරය අහෝසි කරන්න අවශ්‍ය කටයුතු කරනවා"ය කියලා. අපි අද මේ කථා කරන මොහොත වනකොට, මේ රටේ එදා නිර්මාණය වෙලා තිබුණු ඒ තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස්වෙලා තිබෙන්නේ. එදා සතුටු වෙච්ච මිනිස්සු සියලුදෙනා අද එතුමාගේ පිටු පස්සෙන් පාරා වළල්ලක් වාගේ එනවා. මේ රටේ ඉතිහාසයේ බිහි වෙච්ච සියලු ජනාධිපතිවරුන්ට අවමන් කරන ජනාධිපති කෙනෙකු බවට එතුමා අද පත්වෙලා තිබෙනවා. එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට චෝදනා කරන්න කාටවත් බැහැ; එදා රණසිංහ ප්‍රේමදාස මැතිතුමාට චෝදනා කරන්න කාටවත් බැහැ. අපි අදටත් චෝදනා කරන මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාත් මේ තරම් ජනාධිපති ධුරය හැල්ලු කරන්න කටයුතු කළේ නැති බව මම මේ අවස්ථාවේදී කියනවා. අද ඒ දුන් පොරොන්දු ඔක්කොම කනපිට හැරිලා, සරල ජනාධිපතිවරයාගේ මෙවර වැය ශීර්ෂයට වෙන් කර ගෙන මුදල රුපියල් මිලියන 13,560ක් වෙලා. එතුමා ජනාධිපති කරන්න හෘදය සාක්ෂියට එකඟව වැඩ කරපු අහිංසක මිනිසුන් ගුටි කාලා, වෙඩි කෑවා. එතුමා ජනාධිපති කරන්න වැඩ කරපු, මගේ දිස්ත්‍රික්කයේ අහිංසක මනුස්සයෙක් කහවත්තේදී වෙඩි කාලා මැරුණා. එතුමා ජනාධිපතිවරයා බවට පත් කරන්න වැඩ කරලා වෙඩි කාලා මැරිච්ච ඒ මනුෂ්‍යයාට සාධාරණය ඉටු කිරීමේ වගකීම රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු විධියට තිබෙනවා. අපට එතුමා එක්ක වෙනත් ප්‍රශ්න නැති බව මා මේ අවස්ථාවේ කියනවා. එතුමාත් එක්ක අපට පෞද්ගලික ප්‍රශ්න නැහැ. අපි දේශපාලනයට ආධුනිකයන්. හැබැයි, අපට එතුමා සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒක, ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක්. අවුරුද්දක් යනකොට එතුමාට එතුමා ආපු ගමන සම්පූර්ණයෙන් අමතක වුණා. එතුමාගේ දේශපාලන ගමනේ වෙනත් විකල්ප හොයන්න පටන් ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විකල්පවල තරම කොපමණද කිව්වොත්, පසුගිය ඔක්තෝබර් 26 වැනි දා වනකොට තමන්ගේ ගමන යන්න මේ රටේ කවුරු හෝ මොන විධියට හෝ එකතු කර ගන්න ඕනෑ කියලා ආපසු ගිහිල්ලා රාජපක්ෂ මහත්මයලා එක්ක එකතු වුණා. පාර්ලිමේන්තුවේ මම කථා කරන මේ වෙලාවේ මට සියුම් සතුටක් දැනෙනවා. ගරු මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ඇමතිතුමනි, පැත්තක් නැති, පාටක් නැති, ජනාධිපති තනතුර හැල්ලු කරන්න පුළුවන් ජනාධිපතිවරයා මම තමයි -මෛත්‍රීපාල සිරිසේන- කියලා ඊයේ හැන්දෑවේ ආපසු එතුමා පෙන්නුවා.

මෙච්චර "ගේම්" ගහන්න පුළුවන් කියන, මෙච්චර හයිය තිබෙනවාය කියන ඔය මහින්දානන්ද අලුත්ගමගේ මහත්මයාගේ පැත්තේ සිටින මහින්ද රාජපක්ෂ මහත්මයාට එකපිට දෙසැරයක් කොකා පෙන්නුවා නම්, එසේ කොකා පෙන්නුවේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විතරයි කියන සතුට මට තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න, මම කථාව අවසන් කරන්නම්. මම මේ වෙලාවේදී කාරණයක් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කරුණ විතරක් කියන්න ඉඩ දෙන්න. එතුමා ප්‍රකාශයක් කර තිබෙනවා මා දැක්කා. "කඳු නොකපා අධිවේගය හදන හැටි කිව්වත්, නුවර මහත්තයායි, කොළඹ මහත්තයායි දෙදෙනා මට මේක කරන්න දුන්නේ නැහැ" කියලා. මම හිතන විධියට කොළඹ මහත්තයා කියලා කියන්න ඇත්තේ, අපේ අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට. නුවර මහත්තයා කියලා කියන්න ඇත්තේ කිරිඇල්ල ඇමතිතුමාට කියලා මා විශ්වාස කරනවා. මම එක දෙයක් කියනවා. කඳු නොකපා, ගස්වැල් කපන්නේ නැතුව අධිවේගී මාර්ගය හදන්න පුළුවන් නම් හොඳයි. ඒ ප්‍රාර්ථනාව එතුමාට තිබෙන්නේ එතුමා පරිසර ඇමතිවරයා නිසා වෙන්න ඇති. හැබැයි, මම මතක් කර දෙන්න කැමැතියි, විල්පත්තුවේ කැලෑ අක්කර ගණන් කපනවා කියලා අවුරුදු ගණනක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඒ ගැන කෑ ගහනවා; මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් කෑ ගහනවා. උමා ඔය ව්‍යාපෘතිය නිසා ජන ජීවිතවලට මහ විශාල හානි සිදුවෙලා තිබෙනවා. ඒ සම්බන්ධව එක වචනයක් කියන්නේ නැති ජනාධිපතිවරයා, මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කිරිඇල්ල ඇමතිතුමාට එලව එලවා ගහන්න තිබෙන ඕනෑකමට, කුහක විධියට කිරිඇල්ල ඇමතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමාට ඇඟිල්ල දිගු කරනවා. ඒ නිසා මෙතැන තිබෙන්නේ රට හදන දේශප්‍රේමීත්වයක් නොවෙයි කියලා මම කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා තමන්ගේ දේශපාලන කුහක අරමුණ වෙනුවෙන්, නැවත ජනාධිපති වීමේ හීනය වෙනුවෙන් මේ රටේ ඕනෑම පාවා දීමක් කරනවා. ඒ හැඟීමත් එක්කයි එතුමා සෙල්ලම් කරන්නේ.

ගරු අගමැතිතුමනි, අපි හෘදය සාක්ෂියට එකඟව එක්සත් ජාතික පක්ෂයේ අහිංසක පුංචි මිනිස්සු වෙනුවෙන් හිටගන්නා දේශපාලනඥයෝ. අන්න ඒ පුංචි මිනිසුන්ගේ පස්සට පයින් ගසා, මේ රටේ ජනතාව ලෝකය ඉදිරියේ දණ ගස්සන්න සූදානම් වෙන මේ ජනාධිපතිතුමාට මේ සා විශාල මුදලක් වෙන් කරගෙන කටයුතු කරන්න සදාචාරාත්මක අයිතියක් නැහැ කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 6.03]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය විවාදයේ ප්‍රථම කාරක සභා අවස්ථාවේ දී, විශේෂයෙන් ඔබතුමා මූලසුනේ සිටින අවස්ථාවේ, මේ අවසාන මොහොතේ හෝ කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂයට පත් වෙනවා. ජනාධිපතිවරයා, අගමැතිවරයා, කොමිෂන් සභා ඇතුළු වැය ශීර්ෂ 25ක් පිළිබඳව අද සාකච්ඡාවට භාජන කරනවා. අද සාකච්ඡා කරන මේ මාතෘකා අතරේ, ප්‍රධාන ස්ථාන දෙකක් හැටියට තිබෙන්නේ ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය සහ අගමැතිවරයාගේ වැය ශීර්ෂයයි.

2015 ජනවාරි 08 වැනි දා, මේ රටේ යහපාලන ආණ්ඩුවක් ඇති කරලා මේ රටේ තිබුණු දුර්දාන්ත පාලන ක්‍රමය අයින් කරලා අපි අපේම ජනාධිපතිවරයෙක් පත් කරගත්තා. මට මතකයි, මැතිවරණ ප්‍රතිඵල අහලා ජනවාරි 09 වැනිදා අපි බොහොම සතුටට පත් වුණු බව. අපි සිරිකොත ඉස්සරහා විනෝද වුණා; සිංදු කිව්වා. මේ රටේ නිදහස විනාශ කරලා, ප්‍රජාතන්ත්‍රවාදය වළ පල්ලට දමා, ජනතාවට නිදහසේ කථා කරන්න තිබුණු අයිතිය විනාශ කර තිබුණු වේලාවක, එසේ ජයග්‍රහණයක් ලැබීමෙන් මේ රටට නිදහස ලබා ගත් මොහොතක දැනෙන හැඟීම් තමයි අපට ඇති වුණේ. ඒ අවස්ථාවේ අපි කල්පනා කළේ, අපේ රටේ නැත්නම් මේ කලාපයේ මැන්ඩෙලා ඉපදුණා කියලායි. ඔබතුමන්ලා දන්නවා, දකුණු අප්‍රිකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න නෙල්සන් මැන්ඩෙලා කරපු කාර්ය භාරය ගැන. අපේ "මැන්ඩෙලා" හැටියට අපි පිළිගත්තේ, ජනාධිපතිවරයා හැටියට පත් වුණු අපේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේ කාරණයක් මතක් කර දෙන්න කැමතියි. 2016 වර්ෂයේ දී ජපානයේ පැවති G7 Summit එකට ගරු ජනාධිපතිවරයාට ආරාධනා ලැබුණා. සාමාන්‍යයෙන් මෙම G7 Summit එකට ආරාධනා ලැබුණේ ලෝකයේ ප්‍රධාන රටවල නායකයින්ට අමතරව, දියුණු වෙමින් පවතින රටවලින් අපේ රටත් තවත් රටකුත් විතරයි. එතකොට 2016 G7 Summit එකට අපේ ජනාධිපතිවරයා ගියාම එතුමාව පිළිගත්තේ ආසියාවේ මැන්ඩෙලා හැටියටයි. මා ඔබතුමාට මතක් කර දෙනවා, ජනාධිපතිවරයා පැත්තකට වෙලා ඉන්නකොට එතැනට ඇමෙරිකාවේ ජනාධිපති ඔබාමා ඇවිල්ලා කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අහලා තිබෙනවා අපේ රටේ හිටපු ජනාධිපතිවරු එම summitsවලට ගියාම corridors එකේ හිට ගෙන ඉඳලා, ජනාධිපතිවරු යනකොට මහ රැකලා ඉඳලා, බලෙන් අතට අත දීලා, ඒ photos අරගෙන තමයි මාධ්‍යයට දැම්මේ, "මෙන්න මාත් එක්ක සාකච්ඡා කළා" කියලා. නමුත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට තිබුණු ඒ පිළිගැනීම අපි දැක්කා. අපි දැක්කේ එතුමා අපේ මැන්ඩෙලා විධියටයි. ජර්මන් චාන්සලර් ඇන්ජෙලා මර්කල් ඇවිල්ලා අතට අත දුන්නා. ජපානයේ අගමැති ශින්ෂෝ අබේ මැතිතුමා ජනාධිපතිතුමාගේ ළඟට ඇවිල්ලා අතට අත දීලායි පිළිගත්තේ. මේක තමයි 2015 ජනවාරි 08 වෙනිදා ලියවුණු ඉතිහාසය. මේ ඉතිහාසය ලියවෙනකොට එහි යම් කාර්යභාරයක් කරපු මන්ත්‍රීවරයකු හැටියට මා එදා හෘද සාක්ෂියෙන්ම සතුටට පත් වුණා. එසේ සතුටට පත්වෙමින් අපි බලාපොරොත්තු වුණේ "ජනාධිපති තාත්තා" පොත ලියන්න නොවෙයි, ලංකාවේ නෙල්සන් මැන්ඩෙලා ගැන පොතක් ලියන්නයි. මට අදටත් ඒ ගැන බලාපොරොත්තුවක් තිබෙනවා. ඒ විධියේ බලාපොරොත්තු රාශියක් අද අපට තිබෙනවා. අපි ලෝක නායකයින්ගේ ආදර්ශමත් කථා කියවනවා. අපි වෙනත් රටකට ගියාමත් නෙල්සන් මැන්ඩෙලා ගැන කියවෙන පොත් අරගෙන එනවා. ඊයේ-පෙරේදා මම මැලේසියාවට ගිය වෙලාවේ Dr. Mahathir Mohamad ගැන ලියවුණු පොත් අරගෙන ආවා. අපි ආසයි මේ ලෝක නායකයින්ගේ හැසිරීම ගැන ලියන්න, කථා කරන්න. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා නැවතත් අපිත් එක්ක එකතු වෙලා මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු තැනට නැවත රට ගෙන යන්න පුළුවන්කම තිබෙනවා නම්, තවමත් කාලය තිබෙනවා. මම හිතනවා, මේක අපි හැමෝගේම හෘද සාක්ෂිය තුළින් පැන නඟින ප්‍රශ්නයක් බව. අද ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේ දීත් අප හද තුළින් අන්න ඒ ප්‍රශ්නාර්ථය නඟනවා.

මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු පරිදි ස්වාධීන කොමිෂන් සභාවන් පිහිටෙව්වා. ඒ ස්වාධීන කොමිෂන් සභා හරහා තම ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් රැක ගැනීමට තවමත් රටේ ජනතාව බලාපොරොත්තු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා යම්තාක් දුරට විධායක බලතල අඩු කර ගත්තා. අපි ඒ ගැන සතුටු වෙනවා. නමුත් අද අපට තේරෙනවා, මේ විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන බලපෑම. ඒ නිසා විධායක ජනාධිපති ක්‍රමය මේ රටට අනවශ්‍යයි කියන මතවාදය තුළයි එදා ඉඳලා අපි හිටියේ. ඒ, විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන ප්‍රශ්න ටික තමයි අදත් අපි මේ දකින්නේ. ඒ හේතුව නිසා තමයි ඔක්තෝබර් 26 වැනි දින රාජ්‍ය ද්‍රෝහී කුමන්ත්‍රණයක් සිදු වුණේ. එදා රාජ්‍ය ද්‍රෝහී කුමන්ත්‍රණයක් සිදුවුණත්, ගරු මංගල සමරවීර ඇමතිතුමාගේ අය වැය එතුමා නිර්මාණශීලීව කළමනාකරණය කර ගත් විධිය අපි දැක්කා. ඔබතුමන්ලා දකින්න ඇති, එම දින 52ක කාලය තුළ ජාත්‍යන්තර ratingsවලින් අපේ ලංකාව කඩා වැටුණු ආකාරය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ දත්ත අරගෙන බැලුවොත්, ඒ දින 52ක කාලය තුළ ජාත්‍යන්තර ratingsවලින් අපේ රට කඩා ගෙන වැටුණු ආකාරය දැක ගැනීමට පුළුවන්.

එහෙම වෙලාවක, මේ රාජ ද්‍රෝහී කුමන්ත්‍රණය ක්‍රියාත්මක වුණේ 2019 වසර සඳහා නිසි කලට අය වැය සම්මත කර ගන්න නොහැකි වෙන්නයි. ඒ ගොල්ලෝ මේ අය වැයට භය වුණා. ඒක තමයි, අපි දැකපු මේ රටේ සිද්ධ වුණු අසාධාරණම, අයුක්තිසහගතම රාජ ද්‍රෝහී කුමන්ත්‍රණය. ඒ නිසා, මම මේ වෙලාවේ මතක් කර දෙන්න කැමැතියි, මේ විධායක ජනාධිපති ක්‍රමය තිබුණොත් මින් ඉදිරියට මෙවැනි රාජ ද්‍රෝහී කුමන්ත්‍රණ සිද්ධ වෙන්න ඉඩ තිබෙන බව. මේ සිද්ධ වුණු රාජ ද්‍රෝහී කුමන්ත්‍රණය ගැන පරීක්ෂණ පවත්වන එක අනිවාර්යයෙන්ම සිදු විය යුතුයි කියා අපි කියන්නේ ඒ නිසායි.

පසුගිය ඔක්තෝබර් 26වන දා වුණු සිද්ධීන් එක්ක, මාස දෙකක කාලය තුළදී වුණු හානිය නිසා මේ රටේ කඩා වැටුණු ආර්ථිකය නැවත නඟා සිටුවන්න අපට විශාල කැප කිරීමක් කරන්න සිද්ධ වුණා. ආණ්ඩුවක් හැටියට අපි ඒ කැප කිරීමේ අභියෝගය භාර ගත්තා. ඒ අභියෝගය භාර ගෙන තමයි ඉතාම සහනදායී වැඩසටහන් සහිත භාරදූර කර්තව්‍යයක් හැටියට, වගකීමක් හැටියට මේ රටට මෙම අය වැය ඉදිරිපත් කළේ.

ඔබතුමන්ලාට මතක ඇති, ජනාධිපතිවරයා කටාර් සංචාරයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ වකුගඩු රෝග නිවාරණ හා පර්යේෂණ ඒකකයට ප්‍රදානයක් ඉල්ලා සිටි බව. අහන්න සන්තෝෂයි, ඊයේ අපි දැන ගත්තා ඇමෙරිකානු ඩොලර් මිලියන 73ක ප්‍රදානයක් අපට කටාර් රාජ්‍යයෙන් ලැබී තිබෙන බව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
හොඳයි.

කටාර් රාජ්‍යයෙන් ලැබුණු ඒ ප්‍රදානය ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට වෙන් කර තිබෙන මුදලට සමානයි. අපි ආඩම්බර වෙනවා, මෙවැනි තත්ත්වයක් ජාත්‍යන්තරය තුළ අපිට හදා ගැනීමට හැකි වීම ගැන. ඒ නිසා අපට හැකියාව ලැබුණා ජාත්‍යන්තරයත් එක්ක අපට තිබුණු කීර්තිය වැඩි කර ගන්න. අපි ඉල්ලා සිටිනවා, ඒ සල්ලි ටික රටේ සෑම තැනකම සිටින වකුගඩු රෝගීන්ට සහන සැලසීම සඳහා යොදා ගන්නය කියා. එහෙම නැතිව, ඒක වෙනත් තැනකට ගිහිල්ලා, එතැන හරහා එක් දිස්ත්‍රික්කයකට පමණක් බෙදුණොත් ඒක හරි යන්නේ නැහැ. ඒ නිසා, එය රට පුරා සිටින වකුගඩු රෝගීන් වෙනුවෙන් බෙදන්නය කියා අප ඉල්ලා සිටිනවා. කථා කරන්න ගොඩක් දේවල් තිබුණත් කාල වේලාව මදි. අපි දැමූ මේ අඩිතාලම එක්ක මේ කාර්යයත් ඉදිරියට කරගෙන යා යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ඔක්තෝබර් 26 දින සිදුවූ රාජ ද්‍රෝහී කුමන්ත්‍රණය පිළිබඳ පැමිණිල්ල" යන මාතෘකාවෙන් යුතුව මගේ අතේ තිබෙන මේ ලිපිය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ පැමිණිල්ල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තිබෙනවා. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු විය යුතුයි, මේ රටේ ඒ රාජ ද්‍රෝහී කුමන්ත්‍රණයට සම්බන්ධ සියලුදෙනාට නිසි දඬුවම් ලබා දිය යුතුයි කියමින්, මම කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.13]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක්සත් ජාතික පක්ෂය "හා හා පුරා" කියා ගෙන එනු ලැබූ අය වැය පිළිබඳ විවාදයේදී, අද දවසේ අපට ඉස්සෙල්ලාම කථා කරන්න සිද්ධ වෙන්නේ අපේ නොවන, කලකදී අපේ වුණු ජනාධිපතිවරයකු පිළිබඳවයි. 2015 ජනවාරි 08වන දා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එළියට පැමිණි මෛත්‍රීපාල සිරිසේන පක්ෂ මහ ලේකම්තුමා එක්සත් ජාතික පාක්ෂිකයන් සියයට 98කගේ බහුතර ඡන්දයෙන්, ඒ අයගේ දහඩිය මහන්සියෙන්, ඒ වාගේම අපේ පුදුමාකාර කැප කිරීමකින් මේ රටේ ජනාධිපතිවරයා බවට පත් කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.
*அதன்பிறகு, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MUJIBUR RAHUMAN *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු සභාපතිතුමනි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඒ වෙලාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බොහෝ අය කිව්වේ, එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලක්ෂ 58කට ද්‍රෝහි වුණාය කියායි. හැබැයි, ටික දවසක්; ටික කාලයක් යනකොට පසුගිය ජනාධිපතිවරණයේදී එතුමාට පක්ෂව ඡන්දය දුන් ලක්ෂ 62කට එතුමා ඊළඟ වතාවේ ද්‍රෝහි වුණා. පළමුව එතුමා ලක්ෂ 58කට ද්‍රෝහි වුණා. දෙවනුව ලක්ෂ 62කට ද්‍රෝහි වුණා. සමස්තයක් හැටියට ගත්තාම, ඒ ජනාධිපතිවරණයේදී ඡන්දය භාවිත කළ සියලුදෙනාට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ද්‍රෝහි වුණා.

ඒ විතරක් නොවෙයි, එතුමා වෙනුවෙන් බර ඇද්ද, කොට ඇද්ද, අය වෙනුවෙන් එතුමා මොනවාද කළේ? ගරු සභාපතිතුමනි, මම නියෝජනය කරන්නේ පඩුවස්නුවර ආසනයයි. ජනාධිපතිවරණය වෙලාවේ ඒ වෙනුවෙන් රැස්වීමක් සූදානම් කරන්න මට හදිසියෙනුයි දිනය ලැබුණේ. මම බොහොම අමාරුවෙන් ඒ නගරයේ තිබුණු පිට්ටනිය ජනාධිපතිතුමා වෙනුවෙන්; ඒ රැළිය වෙනුවෙන් සූදානම් කරද්දී, ඒ වෙනකොට ඒ ආසනයේ හිටපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලවතා ඒ රැස්වීම පැවැත්වීමට තිබුණු පිට්ටනිය තහනම් කළා. රැස්වීමට තිබුණේ දින හතරයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු බලවතා ඒ රැස්වීම පවත්වන්න තිබුණු පිට්ටනිය තහනම් කරද්දී, මම මහ රෑ පාළු වත්තක් හොයා ගත්තා. ඒක මඩ වගුරක්. ට්‍රැක්ටර් ගෙනැල්ලා ඒ මඩ වගුරට බොරලු දමලා, වැලි දමලා, කුඩුපස් දමලා, පස් දමලා, පාවාඩ එළලා තමයි එතුමා වෙනුවෙන් වේදිකාවක් හැදුවේ. එහෙම තමයි, අපි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිවරයා බවට පත් කළේ. නමුත්, ගත වුණේ බොහොම ටික දවසයි. ඒ රැළිය තහනම් කළ; ඒ පිට්ටනිය තහනම් කළ ඒ දේශපාලන බලවතාට මෙන්න, ඇමතිකමක් හම්බ වෙනවා! එතුමා වෙනුවෙන් කඩේ ගිය අපි, නිකම්ම නිකම් මන්ත්‍රීවරු විතරක් වුණා. රජයේ වාහන, මුළු ආසනය පුරා හැම තැනම යනවා. ඒ විධියට තමයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා කෙරෙහි මගේ කළකිරීම එතුමා ආරම්භ කළේ.

එතුමා වෙනුවෙන් මහන්සි වුණු, ඇප කැප වුණු එක්සත් ජාතික පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට එතුමා ද්‍රෝහි වුණා; කෙනහිලිකම් කළා; දේශපාලනිකව අතරමං කළා.

අපේ මහින්ද අමරවීර මැතිතුමා මේ ගරු සභාවේ දැන් ඉන්නවා. ටී.බී. ඒකනායක මැතිතුමා ඉන්නවා. දයාසිරි ජයසේකර මහත්මයාත් ඉන්නවා. එතුමන්ලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙනුවෙන්, මහින්ද රාජපක්ෂ මහත්මයාව අතහැරලා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා තනි නොකර එතුමා ළඟ හිටගත්තා. හැබැයි, ඒ අයට මොකක්ද වුණේ? මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙනුවෙන් හිටගත්ත ඒ අය වෙනුවෙන් එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ශක්තිමත් කළාද? එතුමා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දවසින් දවස දියාරු කරමින්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයන් අමු අමුවේ පොහොට්ටුවට බඳවා ගන්නා ආකාරය බලා සිටිමින්, මෙතුමන්ලා දේශපාලනිකව සම්පූර්ණයෙන් නන්නත්තාර කළා. අපිව නන්නත්තාර කළා විතරක් නොවෙයි, මහින්ද රාජපක්ෂ මහත්මයාව අතහැරලා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා විශ්වාස කරලා, එතුමා වෙනුවෙන් හිටගත්ත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද අමරවීර මහත්මයා ඇතුළු කණ්ඩායමත් එතුමා දේශපාලනිකව විනාශ කරනු ලැබුවා.

ශාන්ත බණ්ඩාර මහත්මයා අද බොහොම වේගයෙන් කථා කළා. එතුමා එහෙම කථා කළාට, එතුමාට සිද්ධ වෙලා

තිබෙන්නේත් ඒ දෙයමයි. ඒ, හොඳ ප්‍රතිරූපයක් තිබුණු මිනිස්සු. එතුමන්ලා ඒ ප්‍රතිරූපය සම්පූර්ණයෙන් නැතිකර ගත්තේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ළඟ හිටගත් නිසායි. අද මේ සිද්ධ වෙන්නේ මොකක්ද? අද ඒ සියලුදෙනාත්, මේ පැත්තේ ඉන්න අපිත්, ඒ පැත්තේ ඉන්න සියලුදෙනාත් සම්පූර්ණයෙන් මේ සූදුවට ගොනු කරගත්ත ජනාධිපතිවරයෙක් වෙනුවෙන් තමයි අපට කථා කරන්න සිද්ධ වෙන්නේ. තමන් ජනාධිපති වුණාට පස්සේ, මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තමන්ට පිරිත් කියූ, තමන්ට පිරිත් නූල් බැඳපු, අපේ ආසනවල විහාරස්ථානවල හාමුදුරුවන්ව පැත්තකට දමලා, එතුමාට වෛර කළ, එතුමාගේ ප්‍රතිවාදියා වෙනුවෙන් පිරිත් නූල් බැඳපු, එතුමාට වස් කවි කියූ විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලා ජනාධිපති මන්දිරයට වැඩම කරවලා සිව්පසය පූජා කර, ඒ විහාරස්ථානවලට විශාල වශයෙන් තෑගි භෝග දුන්නා. ඒ විධියට කටයුතු කළේ, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා වෙනුවෙන් පිරිත් නූල් බැඳපු, ආශීර්වාද කළ අපේ ස්වාමීන් වහන්සේලා පැත්තක සිටිද්දීයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
හොඳයි, ගරු සභාපතිතුමනි.

මෛත්‍රීපාල සිරිසේන මහත්මයා වෙනුවෙන් ආශිර්වාද කළ අපේ ගම්වල සිටින අහිංසක දුගී-දුප්පත් මිනිසුන්ට එක සමෘද්ධි සහනාධාරයක් ලැබුණේ නැහැ. හැබැයි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට විරුද්ධව වැඩ කළ සියලුදෙනාගේ සමෘද්ධි සහනාධාර එතුමා තහවුරු කළා.

විශේෂයෙන් වැලි මංකඩවල්, වැලි තිප්පොළවල් බොරළු permits අයිතිකරුවන් සියලුදෙනා; එතුමාට විරුද්ධව වැඩ කළ සියලුදෙනා - පරිසරයට ආදරෙයි කියන ජනාධිපතිතුමා- එතුමා ආරක්ෂා කළාය කියන කාරණයත් මම කියන්න ඕනෑ. ඒ සම්බන්ධව එතුමා කථා කළා. "මම සරල මිනිහෙක්. මම ජනාධිපති පත් වුණාට පස්සෙත් මට වාහන දෙකක් ඇති. මට පරිවාර සේනා නැත. මට කිසිවක් අවශ්‍ය නැත." කියා. අද කොහොමද යන්නේ? අද මොනවාද සිද්ධ වෙන්නේ? ගරු සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා ඒ සියල්ල කිව්වා. ඒ සමඟම අපේ ආණ්ඩුව ශක්තිමත් වෙන්න, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු පිරිසක් අපිත් සමඟ ඉඳ ගත්තා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා බොහොම පුරාජේරුවට කියන්න පටන් ගත්තා, "මන්ත්‍රීවරු වැඩි මිල ගණන්වලට විකිණෙන්න ගිය නිසා තමයි මම මේ පාර්ලිමේන්තුව විසුරුවා හරින්න තීරණය කළේ." කියා. කවුද මන්ත්‍රීවරුන්ට මිලක් ඇති කළේ? අපේ මන්ත්‍රීවරුන් එහා පැත්තට ගිහින් ඉඳ ගන්නකොට ඒක හොඳයි. මේ අසාධාරණය බලාගෙන ඉන්න බැරිව අපේ පැත්තට ආ මන්ත්‍රීවරුන් - තමන් වෙනුවෙන් ශක්තියක් දුන් මන්ත්‍රීවරුන් මෙතැන ඉන්නේ.- වෙනුවෙනුත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා තමන්ට කරන්නට පුළුවන් ඉහළම පළිගැනීම් ටික කළාය කියා මම මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

පසුගිය රජයන් තුළ බරපතළ වංචා සෙවීමේ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තා 34ක් තිබෙනවා. ඒ වාර්තා වෙනුවෙන් කරන පරීක්ෂණ දවසින් දවස එතුමා යට ගසමින් එතුමාට නායකත්වය ලබා දුන් මේ ආණ්ඩුව වෙනුවෙනුත් කොමිෂන් සභා පත් කරන්නට එතුමා කටයුතු කළා. හොඳයි. අපි පිළිගන්නවා. ජනාධිපති කාර්යාලයේ හෝ වෙනත් තැන්වල මේ කොමිෂන් සභා වාර්තා ගොඩ ගසා ගෙන ඉන්න අවශ්‍ය වන්නේ නැහැ. [බාධා කිරීමක්] මේ සියල්ල සිදුවෙමින් පවතිද්දී ගරු සභාපතිතුමනි, අපි කනගාටු වෙනවා. රෝමය ගිනි ගනිද්දී නීරෝ වීනා වාදනය කළා වාගෙයි. මේ වාගේ අර්බුදයක් පාර්ලිමේන්තුව තුළ තිබෙද්දී ගරු ජනාධිපතිතුමා මේ වෙනකොට කෙන්යාව බලා පියාසර කර ගිහින්.

අපේ අගමැතිතුමා මේ මොහොත වනවිටත් පිටිපස්සෙන් ඉඳගෙන, "මේ වැඩය කරන්න එපා. මේකට විරුද්ධ වෙන්න එපා. ඡන්දය දෙන්න." කිය කියා ඇවිටිලි කරමින් සිටිනවා. අපේ ජනාධිපතිතුමාට ඡන්දය දුන් සියලු දෙනා වෙනුවෙන් තමයි අපි පසුපෙළ මන්ත්‍රී කණ්ඩායම පෙළ ගැසී ඉන්නේ. මේ වෙනකොටත් අපි දෝලනයක ඉන්නේ. අගමැතිතුමා අපට ඡන්දය දෙන්න කියනවා. අපේ ජනතාව වෙනුවෙන් අපි සිට ගෙන සිටිනවා, "අපි ඡන්දය දෙන්නේම නැහැ." කියා. මරන්න බලෙන් මස් මඩුවකට අරගෙන යන හරකෙක් වාගෙයි. අපේ බෙල්ලට බලෙන් දමා ගෙන අදිනවා. මේ පිළිබඳව විරෝධතාවය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තුතියි. ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා.6.22]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු සභාපතිතුමනි, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. පාර්ලිමේන්තුවේ නවක මන්ත්‍රීවරයෙක් හැටියට අද දවසේදී මම මුහුණ දෙන හතර වන අය වැය ලේඛනයයි මෙය. එම අය වැය ලේඛනයේ කාරක සභා අවස්ථාවේ විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු කථානායකතුමා ප්‍රමුඛ කර ගත් පාර්ලිමේන්තුව සහ කොමිෂන් සභා ඇතුළු අනෙකුත් ආයතන 25ක් සම්බන්ධයෙන් වූ ඉතාම වැදගත් වැය ශීර්ෂයන් තමයි අද මේ සාකච්ඡාවට අරගෙන තිබෙන්නේ. මේ වැය ශීර්ෂයන් සාකච්ඡාවේදී පළමුවෙන්ම සිහිපත් කරන්නට ඕනෑ, අප නවක මන්ත්‍රීවරුන් හැටියට කථානායකතුමා මෙම පාර්ලිමේන්තුවේදී කියා දුන් පාඩම සම්බන්ධව. මම පාර්ලිමේන්තු ඉතිහාසයේ අසා තිබෙන කරුණු කාරණා ගත්තාම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න වැඩිපුරම බැට කාපු කථානායකවරයෙක් එතුමා. එතුමාගේ ධෛර්යවන්ත භාවය, එතුමාගේ ශක්තිය ඒ වාගේම එතුමා අභියෝගවලට මුහුණ දුන් ආකාරය දැකලා අපිට පාර්ලිමේන්තුවේදී යම්කිසි දෙයක් ඉගෙන ගන්නට ලැබුණා. එම නිසා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී අප දකින්නේ සමස්ත ශ්‍රී ලංකා ජනතාව වෙනුවෙන් වැඩ කටයුතු කරනකොට, ඒ වැඩ කටයුතු කරන ආකාරය සම්බන්ධව අපි යම්කිසි දෙයක් මෙතැනදී ඉගෙන ගන්නට ඕනෑ කියන එකයි. මෙතැනින් දෙයක් අරගෙන ගිහින් ජනතාව ඉදිරියේ කරන වැඩ කටයුත්ත නිසි ලෙස අපි ඉෂ්ට කරන්න ඕනෑ. එසේ නම් උත්තරීතර පාර්ලිමේන්තුව තමයි නීතිමය මුදල්මය ව්‍යවස්ථා සියල්ලම රට වෙනුවෙන් සම්පාදනය කරන්නේ, ඒ පනත් කෙටුම්පත් සියල්ලම අනුමත කරන්නේ. එසේ නම් ඒ අනුමත කරන උත්තරීතර ස්ථානයේදී විශේෂයෙන්

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ජනතාවට වැඩ කරනවා වෙනුවට පාර්ලිමේන්තුව තුළ අපට දැක ගන්නට ලැබුණේ ජනතාවගේ අයිතීන් උදුරාගත් අවස්ථාවක්. ඒ අවස්ථාවේදී ශක්තිමත් කථානායකවරයෙකුගෙන්, ඒකට නිර්භීතව මුහුණ දී ජනතාවගේ පරමාධිපත්‍යය ආරක්ෂා කළ කථානායකවරයෙකුගෙන් අපට යමක් ඉගෙන ගන්නට ලැබුණා. ඒකත් එක්ක ඒ පාඩම අරගෙන ගියාට පස්සේ,- විශේෂයෙන්ම අපේ ගරු අග්‍රාමාත්‍යතුමා කාලයක් තිස්සේ මේ රටේ දේශපාලනයේ නියැලිලා, ඒ දේශපාලන පන්නරය අතට අරගෙන කටයුතු කළ නිසා රටේ ජනතාව වෙනුවෙන් වැඩ කටයුතු කරන්නේ කොහොමද කියන එක හොඳින් දන්නවා. එතුමා කාලයක් තිස්සේ මේ රටේ ආණ්ඩුවල තිබුණු වැරැදි සියල්ල හරියට හඳුනාගෙන, ඒවා නිවැරදි කරගෙන, සැලසුම් සහගතව සහ නිර්මාණශීලීව අලුත් වැඩසටහනක් රට තුළ ක්‍රියාත්මක කර තිබෙනවා. එතුමාගේ පෞද්ගලික කාලයත්, එතුමාගේ දැනුමත්, එතුමාගේ පළපුරුද්දත් ප්‍රයෝජනයට අරගෙන එතුමා ඒ වැඩසටහන ක්‍රියාත්මක කරද්දී, විශේෂයෙන්ම අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරි මහත්වරුත් රටේ සමස්ත ජනතාව වෙනුවෙන් ඒ සඳහා විශාල දායකත්වයක් සපයනවා. විශේෂයෙන් මම ඒ ගැන සිහිපත් කරන්න ඕනෑ. මොකද, එතුමන්ලා වෙනුවෙන් ලබා දෙන මුදල් රටේ ජනතාව වෙනුවෙන් කරන ආයෝජනයක් හැටියට මා දකිනවා.

ඒ හා සමානවම අපි කොමිෂන් සභා ටික හරියට පත් කර, ඒවාට අවශ්‍ය කරන මුදල් ප්‍රතිපාදන ලබා දීලා, ඒවාට අවශ්‍ය කරන නීති හදලා දීලා, අවශ්‍ය කෙටුම්පත් සකස් කර දී තිබෙනවා. අපි ඒවා නිසි පරිදි ලබා නොදී සිටියා නම්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට හෙණ ගහනවා. මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් එදා ගෙවී ගිය දින 52 තුළ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ වුණු අවස්ථාවේදී ඒක බේරාගන්න හැකි වුණේ, විශේෂයෙන්ම අපි මේ රටේ පත් කරපු ස්වාධීන කොමිෂන් සභා නිසයි. එම නිසා ඒ සඳහා මුදල් වෙන් කිරීම ගැන ගෞරවයෙන් යුතුව සිහිපත් කරන්න ඕනෑ. ඒ වාගේම එම කොමිෂන් සභාවලට අවශ්‍ය කරන ශක්තිය අපි ලබා දෙන්න ඕනෑ.

අතිගරු ජනාධිපති වැය ශීර්ෂය පිළිබඳව කථා කරන මේ වෙලාවේ ඒ ගැනත් පුංචි වචනයක් කියන්න ඕනෑ. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා ලෙස පත් කළේ අපි. මේ රටේ සමස්ත එක්සත් ජාතික පාක්ෂිකයෝ දුක් විඳලා, කඳුළු හලලා, දහඩිය හලලා, ලේ හලලා තමයි එතුමාව ජනාධිපති පුටුවේ වාඩි කෙරෙව්වේ. එතුමා එම පුටුවේ වාඩි කරද්දී, එතුමා අවුරුදු ගණනක් තිස්සේ මේ රටේ කරපු දේශපාලනය ගැනත් කථා කළ යුතුයි. පසු ගිය ආණ්ඩුව තුළ සිටියදී විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා හැටියට පමණක් නොවෙයි, තවත් තනතුරු රාශියක් දරලා, අමාත්‍යධුර රාශියක් දරලා තිබෙනවා. නමුත්, පසු ගිය ආණ්ඩුවෙන් එතුමාට ලැබුණු කෙනෙහිලිකම් මොනවාද කියා එතුමා අපිත් සමඟ කථා කර තිබෙනවා. ඒ වාගේම එතුමාට ලබා නොදුන් මුදල කොච්චරද කියන එක පිළිබඳවත් එතුමා අපිත් සමඟ කථා කර තිබෙනවා. විශේෂයෙන්ම අතිගරු ජනාධිපති වැය ශීර්ෂය පිළිබඳව කථා කරද්දී මම මේ කාරණය පිළිබඳවත් සිහිපත් කරන්න ඕනෑ. එතුමාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එතුමාට කෙනෙහිලිකම් කරනකොට, විශේෂයෙන්ම හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ ඒ සියලු දෙනාත්, ඒ පවුලේ සියලුදෙනාත් එතුමාව නෙරපලා, එතුමාට වැඩ කටයුතු කරන්න නොදෙනකොට, අපි එතුමාව ගෙනැල්ලා නායකත්වය දීලා ජනාධිපති පුටුවේ වාඩි කර, සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාවට වැඩ කටයුතු කරන්න අපේ රජයෙන් එතුමාට විශාල මුදල් ප්‍රමාණයක් දීලා තිබෙනවා. 2015 ඉඳලා 2019 වන තෙක් එතුමාට වෙන් කළ මුදල් ප්‍රමාණය ගත්තොත්, ඒ මුදලින් එතුමාට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එක පවුලකට රුපියල් 483,000ක් දෙන්න පුළුවන්. පොලොන්නරුවේ එක් පුද්ගලයෙකුට රුපියල් ලක්ෂයක් දෙන්න පුළුවන්. ජනාධිපතිතුමා වෙනුවෙන් වැය කරන මුදල් පෞද්ගලිකව ජනතාවට දෙන්න ලැබුණා නම්, ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමාටත් රුපියල් ලක්ෂයක්, එහෙම නැත්නම් ඒ පවුලට රුපියල් 483,000ක් අරගන්න තිබුණා. ඒ මුදල් දුන්නේ අපි. එම නිසා, "පිබිදෙන පොළොන්නරුව" වැඩසටහන ක්‍රියාත්මක කරද්දී, ඒ සඳහා මුදල් ප්‍රතිපාදන දමනකොට,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
බොහොම ස්තුතියි ඔබතුමාට. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාට ඒ මුදල් කන්දරාව දුන්නේ මේ රටේ අහිංසක, දුක් විඳින ජනතාවගේ මුදල්වලින් කියන එක අපි සිහිපත් කරනවා. හැබැයි, ඒ මුදල් ටික දුන්නත්, එතුමාව ඒ පුටුවේ වාඩි කර එතුමාට ඒ මුදල්වල අයිතිය ලබා දුන්නේ අපේ රටේ දුක් විඳපු එක්සත් ජාතික පාක්ෂිකයින්. එම නිසා "පිබිදෙන පොළොන්නරුව" වැඩ පිළිවෙළ හරහා කරන හැම වැඩක් සඳහාම පොලොන්නරුවේ ජනතාව එක්සත් ජාතික පක්ෂයට ණයයි. ඉදිරි අනාගතයේදී ඒ සියලුමදෙනා එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙයි කියා අපි විශ්වාස කරනවා. මොකද, ආණ්ඩුවක් හැටියට මේ වැඩ කටයුතු ටික මේ ආකාරයෙන් මේ රට තුළ සිද්ධ කරනකොට තමයි ඒ මුදල් ටික ලැබුණේ. අතිගරු ජනාධිපතිතුමා සමඟ පෞද්ගලික වෛරයක් නොවෙයි අපි ළඟ තිබෙන්නේ. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා මේ රටේ නායකයා හැටියට එතුමාගේ රාජකාරිය සිද්ධ කරද්දී, එතුමා යටතේ සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපට එතුමාගෙන් විශාල ආදර්ශයක් ගන්න පුළුවන් වෙන්න ඕනෑ. හැබැයි, ලංකා ඉතිහාසය ගත්තාම අපි දේශපාලනඥයෝ හැටියට සමාජයට පිළිකුල් වුණේ කුමන කාරණයක් නිසාද කියා මම දැක්කා.

එතුමා අතිගරු ජනාධිපතිතුමා හැටියට පත්වීමට පෙර දේශපාලන පොර පිටියට එනකොට, එතුමාට බැනපු, එතුමාට එක එක වචන කියලා අපහාස කරපු අය එතුමා ළඟට ඇවිත්, දෙකට නැමිලා එතුමාගෙන් අමාත්‍යධුරය භාර ගනිද්දී මේ රටේ ජනතාව, දේශපාලනඥයින් කොන්ද පණ නැති අය හැටියට තමයි දැක්කේ. ඒක තමයි තිබෙන වැරැද්ද. එහෙම දේවල් කථා කරලා, අපිත් එක්ක ආණ්ඩු කරලා, අර දින 52දී නැවත වතාවක් එතුමාට ඒ දේවල් කියපු අයත් එක්ක වාඩි වෙලා නැවත වැඩ කටයුතු කරන්න පුළුවන් නම්, දේශපාලනඥයින් හැටියට අපි සමාජයට යනකොට පුංචි දරුවා පවා අපිව පිළිකුල් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු සභාපතිතුමනි, මට තත්පර දෙක තුනක් දෙන්න.

විශේෂයෙන් ජනතාව අපිව පිළිකුල් කරන්න පටන් ගත්තේ මේ කරුණු කාරණා නිසායි. අපේ රටේ ජනතාව අපට ඡන්දය දුන්නා නම් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු හැටියට අපට වගකීමක් තිබෙනවා, ජනතාවට ආදර්ශවත් විධියට, රටේ ජනතාවට දේශපාලනය ගැන හැඟීමක් ඇති වන ආකාරයට, ආශාවක් ඇති වන ආකාරයට, බලාපොරොත්තුවක් ඇති වන ආකාරයට කටයුතු කිරීමට. එම නිසා අපි සියලුදෙනා එකතු වෙලා සමාජය මේ ආකාරයෙන් නිර්මාණය කළ යුතුයි කියා අද මේ වැය ශීර්ෂ පිළිබඳ විවාද කරන මේ අවස්ථාවේ සඳහන් කරමින්, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තුතිය පළ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! සභාවේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යාම සඳහා සියලුදෙනා කාරුණිකව තම තමන්ගේ ස්ථානවල අසුන් ගන්න.

වැය ශීර්ෂ අංක 01 කාරක සභාව එකඟද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු සභාපතිතුමනි, බෙදීමක් අවශ්‍යයි. [බාධා කිරීමක්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
බෙදීමක් අවශ්‍ය නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
විරෝධය සටහන් කරන්නද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒක වුවමනා නැහැ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
අවශ්‍ය නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මම විරෝධය සටහන් කර ගන්නම්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අවශ්‍ය නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අර මන්ත්‍රීතුමාගේ විරෝධය සටහන් කර ගන්නම්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
කවුරුත් ඉල්ලා නැහැ. අපට වුවමනා නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Then, there is no Divison. Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"1 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,829,880,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

1 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 2,517,300,000

"1 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 2,517,300,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

1 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 100,000,000

"1 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 100,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

1 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 8,110,000,000

"1 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 8,110,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

1 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**2 වන ශීර්ෂය.- අග්‍රාමාත්‍ය කාර්යාලය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 901,970,000

"2 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 901,970,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

2 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 719,000,000

"2 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 719,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

2 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**4 වන ශීර්ෂය.- උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 209,830,000

"4 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 209,830,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

4 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 67,900,000

"4 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 67,900,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

4 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**5 වන ශීර්ෂය.- අමාත්‍ය මණ්ඩල කාර්යාලය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 109,670,000

"5 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 109,670,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

5 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 29,000,000

"5 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 29,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

5 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**6 වන ශීර්ෂය.- රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 212,970,000

"6 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 212,970,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

6 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 38,600,000

"6 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 38,600,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

6 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**7 වන ශීර්ෂය.- අධිකරණ සේවා කොමිෂන් සභාව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 73,980,000

"7 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 73,980,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

7 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 9,600,000

"7 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 9,600,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

7 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**8 වන ශීර්ෂය.- ජාතික පොලිස් කොමිෂන් සභාව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 120,670,000

"8 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 120,670,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

8 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 3,700,000

"8 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 3,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

8 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**9 වන ශීර්ෂය.- පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 27,900,000

"9 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 27,900,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

9 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 1,075,000

"9 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,075,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

9 වන ශීර්ෂයෙහි 01 වනවැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**10 වන ශීර්ෂය.- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 428,800,000

"10 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 428,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

10 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 86,000,000

"10 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 86,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

10 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**11 වන ශීර්ෂය.- මුදල් කොමිෂන් සභා කාර්යාලය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 74,100,000

"11 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 74,100,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

11 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 118,500,000

"11 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 118,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

11 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**12 වන ශීර්ෂය.- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 41,370,000

"12 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 41,370,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

12 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 9,350,000

"12 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 9,350,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

12 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**13 වන ශීර්ෂය.- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 213,400,000

"13 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 213,400,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

13 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 14,400,000

"13 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 14,400,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

13 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**16 වන ශීර්ෂය.- පාර්ලිමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 2,776,250,000

"16 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,776,250,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

16 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 813,050,000

"16 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 813,050,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

16 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**17 වන ශීර්ෂය.- පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 43,890,000

"17 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 43,890,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

17 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 1,600,000

"17 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,600,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

17 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**18 වන ශීර්ෂය.- පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 77,160,000

"18 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 77,160,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

18 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 2,850,000

"18 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 2,850,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

18 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**19 වන ශීර්ෂය.- පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 86,915,000

"19 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 86,915,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

19 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 8,800,000

"19 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 8,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

19 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**20 වන ශීර්ෂය.- මැතිවරණ කොමිෂන් සභාව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 4,717,800,000

"20 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 4,717,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

20 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 122,350,000

"20 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 122,350,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

20 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**21 වන ශීර්ෂය.- ජාතික විගණන කාර්යාලය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 1,785,470,000

"21 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,785,470,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

21 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 291,500,000

"21 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 291,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

21 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**22 වන ශීර්ෂය.- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 24,485,000

"22 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 24,485,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

22 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 650,000

"22 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 650,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

22 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**23 වන ශීර්ෂය.- විගණන සේවා කොමිෂන් සභාව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 56,070,000

"23 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 56,070,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

23 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 4,500,000

"23 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 4,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

23 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**24 වන ශීර්ෂය.- ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 74,330,000

"24 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 74,330,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

24 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 23,550,000

"24 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 23,550,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

24 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**25 වන ශීර්ෂය.- සීමා නිර්ණය කොමිෂන් සභාව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 15,055,000

"25 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 15,055,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

25 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 820,000

"25 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 820,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

25 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 2,829,880,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 2,517,300,000

"தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 2,517,300,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 100,000,000

"தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 100,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 8,110,000,000

"தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 8,110,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 2.- பிரதம அமைச்சர் அலுவலகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 901,970,000

"தலைப்பு 2, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 901,970,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 2, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 719,000,000

"தலைப்பு 2, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 719,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 2, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச்செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 4.- உயர் நீதிமன்ற நீதிபதிகள்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 209,830,000

"தலைப்பு 4, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 209,830,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 4, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 67,900,000

"தலைப்பு 4, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 67,900,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 4, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 5.- அமைச்சரவை அலுவலகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 109,670,000

"தலைப்பு 5, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 109,670,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 5, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 29,000,000

"தலைப்பு 5, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 29,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 5, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 6.- அரசாங்க சேவைகள் ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 212,970,000

"தலைப்பு 6, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 212,970,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 6, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 38,600,000

"தலைப்பு 6, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 38,600,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 6, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 7.- நீதிச்சேவைகள் ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 73,980,000

"தலைப்பு 7, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 73,980,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 7, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 9,600,000

"தலைப்பு 7, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 9,600,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 7, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 8.- தேசிய பொலிஸ் ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 120,670,000

"தலைப்பு 8, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 120,670,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 8, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 3,700,000

"தலைப்பு 8, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 3,700,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 8, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 9.- நிருவாக மேன்முறையீட்டு நியாயசபை**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 27,900,000

"தலைப்பு 9, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 27,900,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 9, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,075,000

"தலைப்பு 9, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 1,075,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 9, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 10.- இலஞ்சம் அல்லது ஊழல்கள் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 428,800,000

"தலைப்பு 10, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 428,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 10, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 86,000,000

"தலைப்பு 10, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 86,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 10, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 11.- நிதி ஆணைக்குழு அலுவலகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 74,100,000

"தலைப்பு 11, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 74,100,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 11, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 118,500,000

"தலைப்பு 11, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 118,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 11, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 12.- தேசிய கல்வி ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 41,370,000

"தலைப்பு 12, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 41,370,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 12, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 9,350,000

"தலைப்பு 12, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 9,350,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 12, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 13.- இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 213,400,000

"தலைப்பு 13, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 213,400,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 13, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 14,400,000

"தலைப்பு 13, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 14,400,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 13, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 16.- பாராளுமன்றம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 2,776,250,000

"தலைப்பு 16, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 2,776,250,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 16, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 813,050,000

"தலைப்பு 16, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 813,050,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 16, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 17.- பாராளுமன்ற முதல்வரின் அலுவலகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 43,890,000

"தலைப்பு 17, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 43,890,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 17, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,600,000

"தலைப்பு 17, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 1,600,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 17, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 18.- பாராளுமன்ற பிரதம அரசாங்க கொறடாவின் அலுவலகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 77,160,000

“தலைப்பு 18, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 77,160,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 18, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 2,850,000

“தலைப்பு 18, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 2,850,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 18, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 19.- பாராளுமன்ற எதிர்க்கட்சித் தலைவர் அலுவலகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 86,915,000

“தலைப்பு 19, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 86,915,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 19, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 8,800,000

“தலைப்பு 19, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 8,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 19, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 20.- தேர்தல்கள் ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 4,717,800,000

“தலைப்பு 20, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 4,717,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 20, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 122,350,000

“தலைப்பு 20, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 122,350,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 20, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 21.- தேசிய கணக்காய்வு அலுவலகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 1,785,470,000

“தலைப்பு 21, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,785,470,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 21, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 291,500,000

“தலைப்பு 21, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 291,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 21, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 22.- நிருவாகத்திற்கான பாராளுமன்ற ஆணையாளர் அலுவலகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 24,485,000

“தலைப்பு 22, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 24,485,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 22, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 650,000

“தலைப்பு 22, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 650,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 22, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 23.- கணக்காய்வு சேவை ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 56,070,000

“தலைப்பு 23, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 56,070,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 23, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 4,500,000

“தலைப்பு 23, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 4,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 23, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 24.- தேசிய கொள்வனவு ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 74,330,000

“தலைப்பு 24, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 74,330,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 24, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 23,550,000

“தலைப்பு 24, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 23,550,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 24, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 25.- எல்லை நிர்ணய ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 15,055,000

“தலைப்பு 25, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 15,055,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 25, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ்செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 820,000

“தலைப்பு 25, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 820,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 25, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச்செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 2,829,880,000, for Head 1, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 1, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 2,517,300,000

Question, "That the sum of Rs.2,517,300,000 for Head 1, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 1, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 100,000,000

Question, "That the sum of Rs. 100,000,000, for Head 1, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 1, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 8,110,000,000

Question, "That the sum of, Rs. 8,110,000,000, for Head 1, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 1, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 2.- OFFICE OF THE PRIME MINISTER

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 901,970,000

Question, "That the sum of Rs. 901,970,000, for Head 2, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 2, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 719,000,000

Question, "That the sum of Rs. 719,000,000, for Head 2, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 2, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 4.- JUDGES OF THE SUPERIOR COURTS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 209,830,000

Question, "That the sum of Rs. 209,830,000, for Head 4, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 4, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 67,900,000

Question, "That the sum of Rs. 67,900,000, for Head 4, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 4, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 5.- OFFICE OF THE CABINET OF MINISTERS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 109,670,000

Question, "That the sum of Rs. 109,670,000, for Head 5, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 5, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 29,000,000

Question, "That the sum of Rs. 29,000,000, for Head 5, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 5, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 6.- PUBLIC SERVICE COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 212,970,000

Question, "That the sum of Rs. 212,970,000, for Head 6, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 6, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 38,600,000

Question, "That the sum of Rs. 38,600,000, for Head 6, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 6, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 7.- JUDICIAL SERVICE COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 73,980,000

Question, "That the sum of Rs. 73,980,000, for Head 7, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 7, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 9,600,000

Question, "That the sum of Rs. 9,600,000, for Head 7, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 7, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 8.- NATIONAL POLICE COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 120,670,000

Question, "That the sum of Rs. 120,670,000, for Head 8, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 8, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 3,700,000

Question, "That the sum of Rs. 3,700,000, for Head 8, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 8, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 9.- ADMINISTRATIVE APPEALS TRIBUNAL

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 27,900,000

Question, "That the sum of Rs. 27,900,000, for Head 9, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 9, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 1,075,000

Question, "That the sum of Rs. 1,075,000, for Head 9, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 9, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 10.- COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 428,800,000

Question, "That the sum of Rs. 428,800,000, for Head 10, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 10, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 86,000,000

Question, "That the sum of Rs. 86,000,000, for Head 10, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 10, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 11.- OFFICE OF THE FINANCE COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 74,100,000

Question, "That the sum of Rs. 74,100,000, for Head 11, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 11, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 118,500,000

Question, "That the sum of Rs. 118,500,000, for Head 11, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 11, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 12.- NATIONAL EDUCATION COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 41,370,000

Question, "That the sum of Rs. 41,370,000, for Head 12, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 12, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 9,350,000

Question, "That the sum of Rs. 9,350,000, for Head 12, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 12, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 13.- HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 213,400,000

Question, "That the sum of Rs. 213,400,000, for Head 13, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 13, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 14,400,000

Question, "That the sum of Rs. 14,400,000, for Head 13, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 13, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 16.- PARLIAMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs 2,776,250,000

Question, "That the sum of Rs 2,776,250,000, for Head 16, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 16, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 813,050,000

Question, "That the sum of Rs. 813,050,000, for Head 16, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 16, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 17.- OFFICE OF THE LEADER OF THE HOUSE OF PARLIAMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 43,890,000

Question, "That the sum of Rs. 43,890,000, for Head 17, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 17, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 1,600,000

Question, "That the sum of Rs. 1,600,000, for Head 17, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 17, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 18.- OFFICE OF THE CHIEF GOVT. WHIP OF PARLIAMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 77,160,000

Question, "That the sum of Rs. 77,160,000, for Head 18, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 18, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 2,850,000

Question, "That the sum of Rs. 2,850,000, for Head 18, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 18, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 19.- OFFICE OF THE LEADER OF THE OPPOSITION OF PARLIAMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 86,915,000

Question, "That the sum of Rs. 86,915,000, for Head 19, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 19, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 8,800,000

Question, "That the sum of Rs. 8,800,000, for Head 19, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 19, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 20.- ELECTION COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 4,717,800,000

Question, "That the sum of Rs. 4,717,800,000, for Head 20, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 20, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 122,350,000

Question, "That the sum of Rs. 122,350,000, for Head 20, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 20, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 21.- NATIONAL AUDIT OFFICE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,785,470,000

Question, "That the sum of Rs. 1,785,470,000, for Head 21, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 21, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 291,500,000

Question, "That the sum of Rs.291,500,000, for Head 21, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 21, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 22.- OFFICE OF THE PARLIAMENTARY COMMISSIONER FOR ADMINISTRATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 24,485,000

Question, "That the sum of Rs.24,485,000 for, Head 22, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 22, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 650,000

Question, "That the sum of Rs.650,000, for Head 22, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 22, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 23.- AUDIT SERVICE COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 56, 070,000

Question, "That the sum of Rs. 56,070,000, for Head 23, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 23, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 4,500,000

Question, "That the sum of Rs. 4,500,000, for Head 23, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 23, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 24.- NATIONAL PROCURMENT COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 74, 330,000

Question, "That the sum of Rs. 74, 330,000, for Head 24, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 24, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs.23,550,000

Question, "That the sum of Rs. 23,550,000, for Head 24, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 24, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 25.- DELIMITATION COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 15,055,000

Question, "That the sum of Rs.15,055,000, for Head 25, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 25, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 820,000

Question, "That the sum of Rs. 820,000, for Head 25, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 25, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

"කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයිද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය"යිද මම යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අ. භා. **6.33** ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.*

*කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම **2019** මාර්තු **14**වන බ්‍රහස්පතින්දා.*

*நேரம் பி.ப. 6.33 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2019 மார்ச் 14, வியாழக்கிழமை.*

*At 6.33 p.m., the Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on on Thursday, 14th March, 2019.*

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය : පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ වැටුප සහ දීමනා
## அரசியலமைப்பின் கீழான தீர்மானம்: நிருவாகத்திற்கான பாராளுமன்ற ஆணையாளரின் சம்பளம் மற்றும் படிகள்
## DETERMINATION UNDER THE CONSTITUTION: SALARY AND ALLOWANCES OF THE PARLIAMENTARY COMMISSIONER FOR ADMINISTRATION

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development, Vocational Training and Skills Development and Youth Affairs, I move,

"Whereas the salary and allowances of the Parliamentary Commissioner for Administration (Ombudsman) shall be determined by Parliament, in terms of Article 156(3) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka as amended by the Nineteenth Amendment to the Constitution and Section 3(4) of the Parliamentary Commissioner for Administration Act, No. 17 of 1981;

And whereas the Cabinet of Ministers has granted approval to revise the monthly salary to be Rs.135,000.00, the monthly telephone allowance to be Rs. 10,000.00 and the monthly fuel allowance to be 225 liters with effect from 01.06.2018;

Accordingly, that this Parliament determines that the monthly salary and allowances of the Parliamentary Commissioner for

Administration (Ombudsman) be revised as aforementioned in terms of Article 156(3) of the Constitution and Section 3(4) of the Parliamentary Commissioner for Administration Act, No. 17 of 1981."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා.

## ආක්‍රමණික ජලජ පැළෑටි පාලනයට ජාතික වැඩ පිළිවෙළක්
## நீரகத் தாவரங்களின் ஆக்கிரமிப்பைக் கட்டுப்படுத்தும் தேசிய வேலைத்திட்டம்
## NATIONAL PROGRAMME FOR CONTROL OF INVASIVE AQUATIC PLANTS

[අ.භා.6.34]

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"කෘෂි කාර්මික දිස්ත්‍රික්කයක් වන අනුරාධපුර දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍යම ප්‍රමාණයේ වැව්, ජපන් ජබර ප්‍රමුඛ ජලජ පැළෑටිවලින් ශීඝ්‍රයෙන් ආක්‍රමණය කරගෙන යාම නිසා වැව් පද්ධතියට විශාල තර්ජනයක් වී ඇත. මෙය මර්දනය කිරීමට වැඩ පිළිවෙළක් ඉතා ඉක්මනින් නොම යෙදුවහොත්, දිස්ත්‍රික්කයේ වැව් පද්ධතිය විනාශ වීම වැළැක්වීම නොහැකිය. මේ හේතුකොටගෙන අනාගතයේ වී ගොවිතැනට හා පානීය ජලය ලබා ගැනීම පිළිබඳව විශාල අර්බුදයකට මුහුණදීමට සිදු වේ. එය අනාගත පරම්පරාවට දැඩි සේ බලපෑ හැක. ඒ නිසා මෙම ජල පැළෑටි වැව් ආක්‍රමණය කිරීම සම්බන්ධව ජනතාව දැනුවත් කර මේ සම්බන්ධව ජාතික වැඩ පිළිවෙළක් වහාම දියත් කළ යුතු බව මම මේ ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ රටේ කෘෂිකර්ම ඇමතිවරයා අපේ ප්‍රදේශයේ ඇමතිවරයෙක්. එතුමාගේ පියාත්, මගේ පියාත් ගොවිතැනින් තමයි අපව පෝෂණය කළේ. අද රටේ වැදගත් තැනකට ඇවිල්ලා තිබෙන ඒ ගොවීන්ගේ පුතුන් වන අපට යුතුකමක් තිබෙනවා, කෘෂි කර්මාන්තයට බලපාන මෙවැනි කාරණා සම්බන්ධයෙන් සොයා බැලීමට. අද ඉතා ශීඝ්‍ර ලෙස මේ ජපන් ජබර වැනි ජලජීවී පැළෑටි වැව් අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශාල වැව් ආක්‍රමණය කරගෙන යනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්න "කටියා වැව" සාමාන්‍යයෙන් මධ්‍යම ප්‍රමාණයේ වැවක්. ගරු ඇමතිතුමනි, පරිසරය අතිනුත් එය හරි ලස්සන තැනක්. හැබැයි, අද වැව් බන්ඩ් එකේ ඉඳන් වැව දිහා බැලුවාම පෙනෙනවා, වැවේ අක්කර 10කට, 15කට වැඩි ප්‍රමාණයක් මේ ජපන් ජබරවලින් වැසිලා තිබෙන අන්දම. අද වැව්වල ජපන් ජබර හැදිලා, දූපත් ඇති වෙලා ඒ දූපත් පා වෙනවා. ඔබතුමා එම ප්‍රදේශය ගැන දන්නවා. විශේෂයෙන්ම ඉලුක්පල්ලම ප්‍රදේශයේ, ගන්තිරියාගම වැවේ මේ දූපත් සුළඟ හමන හමන ආකාරයට වෙනවා. මේක රටේ ජනතාවගේ සල්ලිවලින්, ආණ්ඩුවේ සල්ලිවලින් කොන්ත්‍රාත් ක්‍රමයට මේ වැව් ශුද්ධ කරන්න යනවාට වඩා, මෙම ප්‍රදේශයේ ගොවි ජනතාව මේ සම්බන්ධයෙන් දැනුවත් කරලා, ගොවි ජනතාවට මේ කෙරෙහි කැක්කුමක් ඇති කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා.

ඩෙංගු, මැලේරියා වාගේ දේවල් ජාතික ව්‍යාපාර බවට පරිවර්තනය කරලා මර්දනය කරන්න පුළුවන් නම්, අපිත් ගොවි ජනතාව දැනුවත් කරලා, ගොවි සංවිධාන දැනුවත් කරලා, මේක සහමුලින්ම මර්දනය කිරීමට වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයි. අපේ යෝධ ඇළ දුල්ලෑවේ ඇනිකට් එක ළඟට එනකොට කිලෝමීටර් 26.05ක් තිබෙනවා. ගොවි සංවිධාන විසි ගණනක් මේ ඇළෙන් වතුර ගන්නවා. සාමාජිකයෝ 3,000කට අධික ප්‍රමාණයක් ඉන්නවා. අපි මේ 3,000කට අධික ප්‍රමාණය දැනුවත් කරලා යම් වැඩ පිළිවෙළක් සැලසුම් සහගතව ඇති කළොත්, ජපන් ජබර එක්ක යම්කිසි සටනක් කරලා මේක සහමුලින්ම නැති කරන්න අපට පුළුවන් වෙනවා.

යෝධ ඇළ මහවැලියට අයිති කැල්ලක්. අපට මේක හම්බ වෙනවා අඩුයි. හැබැයි, අපේ දිස්ත්‍රික්කයේ කුඩා වැව් තුන්දහස් ගණනක් තිබෙනවා. ගොවි සංවිධාන එක්දහස් ගණනක් ඉන්නවා. මිනිස්සු වැවේ නාන්න යනකොට, අත් දෙකින් ජපන් ජබර දෙපැත්තට කරලා නානවා. වතුර යට ගිහිල්ලා නැවත උඩට එනකොට ජපන් ජබර ඔළුවේ වදිනවා. නාන පුද්ගලයෝ ජපන් ජබර එක අහුරක් බැගින් අරගෙන දැම්මා නම්, යම් ප්‍රමාණයකට ඒ වැවේ ජපන් ජබර විනාශ කරන්න පුළුවන්, ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කරලා තිබුණා නම්.

ඒ නිසා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින්නේ අනුරාධපුර දිස්ත්‍රික්කය ආදර්ශයට අරගෙන ගොවියකුගේ පුතෙක් වශයෙන්

[ගරු එස්. සී. මුතුකුමාරණ මහතා]

මේ සම්බන්ධයෙන් යම් වැඩ පිළිවෙළක් සාකච්ඡා කරලා, කොන්ත්‍රාත් ක්‍රමයෙන් බැහැර වෙලා, ගොවියා නිරන්තරයෙන්ම මේ ජපන් ජබර විනාශ කිරීමේ සටනට යොමු කරන්න කියලායි. මේ වැව් ටික පිරිසිදු කරලා, මේ වැව් අපේ අනාගත පරම්පරාවට බාර දෙන්න පුළුවන් නම් තමයි, අපේ කාලයේ අපේ යුතුකමක් හරියට කළා වෙන්නේ. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා.6.40]

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද සභාව කල් තැබීමේ යෝජනාව ස්ථිර කරමින්, ගොවි ජනතාව නියෝජනය කරන මහජන නියෝජිතයෙක් විධියට මමත් ඒ ගැන වචන කීපයක් කථා කරන්න කැමැතියි. සත්‍ය ලෙසම මේ රට වැව් රාජ්‍යයක්. වැවෙන් උපන් සංස්කෘතියකින් තමයි අපේ සංස්කෘතිය පෝෂණය වෙලා තිබෙන්නේ. වැව අම්මා වාගෙයි; වැව පියා වාගෙයි. වැවෙන් අපට කුඹුරට වතුර දෙනවා. නාන්නේ, බොන්නේ අපේ ජීවිතය පණ ගස්වන්නේ මේ පණ ගැහෙන ජීවිතවලට ජීවිතය දෙන්නේ වැව. ඒ නිසා වැව් ආරක්ෂා කර ගැනීම අපි සියලු දෙනාගේම වගකීමක්. මේ විෂය භාර ඇමතිතුමා අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් බැඳි රාජ්‍යයේ වන්නි හත්පත්තුවේ ඈත පිටිසර, අතේ කරගැට තිබෙන ගොවීන්ගේ ඡන්දයෙන් පත් වුණු කෙනෙක්. එතුමා ගොවියාත්, ගොවිතැනත් දන්නා කෙනෙකු විධියට අපි හඳුනාගෙන ඉන්නවා. ඒ නිසා එතුමා මේ කාරණය පිළිබඳව විශේෂ අවධානයකින් කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. අපි හැමෝම ජීවත් වෙන මේ රට කෘෂිකාර්මික රටක්. වැව් දහස් ගණනක් තිබුණු, වැවෙන් උපන් සංස්කෘතියක පුරවැසියෝ විධියට සම්ප්‍රදායිකව පරම්පරාගතව පරිවර්තනය වෙච්ච රටක ජීවත් වෙන අපි මේ වැව් ටික ආරක්ෂා කර ගත යුතුයි. මේ කාරණා ටික මම නියෝජනය කරන අම්පාර දිස්ත්‍රික්කයට එසේම අදාළ නොවුණත්, අපේ මුතුකුමාරණ මන්ත්‍රීතුමා කියන පාසි සහ ජපන් ජබරවලින් -ජලජ පැළෑටිවලින්- වැව් ගොඩවෙමින් තිබෙනවා. වැව්වල ජල ධාරිතාව දිගින් දිගටම අඩු වෙමින් තිබෙනවා. සතියක් වැස්සොත් වැව් වාන් දානවා. සති දෙකක් පැච්චොත් වැව් හිඳෙනවා. ඇයි? වැව් ගොඩවීම නිසා ජලය රඳවා තබා ගැනීමේ හැකියාව නැති වෙලා, වැව්වල ජල ධාරිතාව ඉතාම අඩු මට්ටමකයි තිබෙන්නේ. මම දිගටම මේ සම්බන්ධයෙන් කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. මම හිතනවා, ගරු ඇමතිතුමාගේ අවධානය මේ ගැන යොමු වෙයි කියලා. එතුමාට මේ ගැන අවබෝධයක් තිබෙනවා. එතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ ජනතාව විතරක් නොවෙයි, මේ රටේ එසේ විනාශ වී යන දේශීය සම්ප්‍රදායික ගොවියාත්, ගොවි තැනත්, ආරක්ෂා කොට ගැනීම සඳහා එතුමා ක්‍රියා කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

එතුමා "සේනා" දළඹුවා සම්බන්ධයෙන් ඉක්මනින් ක්‍රියා මාර්ග ගන්නවා කිව්වා. ඒ වගේම එතුමා ඉක්මනින් ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. හැබැයි, මේ ගත් ක්‍රියා මාර්ග එතුමා කෙසේ වෙතත් නිලධාරීන්ගේ යම් අඩු පාඩුකම් නිසා සාධාරණය බොහෝ තැන්වලට ඉෂ්ට වෙලා නැහැ. අම්පාර දිස්ත්‍රික්කයේ විශාල පිරිසකට මේ "සේනා" දළඹුවාගෙන් වෙච්ච හානියෙන් ලැබුණු වන්දි ප්‍රමාණය කිසිසේත්ම සාධාරණ නැහැ. බොහෝ දෙනෙකුට සත පහකවත් වන්දියක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා එතුමා ඒ ගැනත් අවධානය යොමු කරලා කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා. මුතුකුමාරණ මන්ත්‍රීතුමා කාලීන, කාලෝචිත, ගොවියාගේ නියෝජිතයෙක් විධියට එතුමා යුතුකම ඉෂ්ට කරන්න ගෙනාපු යෝජනාව නැවතත් ස්ථිර කරමින්, ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කොට ඉතා ඉක්මනින් මේ සඳහා වැඩ පිළිවෙළක් යොදන්න කියලා ඉල්ලා සිටිමින් මම නතර වෙනවා. බොහෝම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාව.

[අ.භා 6.44]

**ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මුතුකුමාරණ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු, ඒ වාගේම අපේ අම්පාර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා ස්ථිර කරපු යෝජනාව ඉතාමත්ම කාලෝචිත වාගේම, ප්‍රායෝගික යෝජනාවක්. සමස්තය ගත්තාම අද රටේ තිබෙන මහා පරිමාණ ලොකු ජලාශ ඇරෙන්න ඉතිරි මධ්‍ය වාරිමාර්ග සහ ගොවිජන සේවා වාරිමාර්ගවලට සැල්වීනියා සහ ජපන් ජබර කියන ශාක නිසා එක පැත්තකින් වැව්වල අලුත් ගොඩවීමක් වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන් මේ ශාක ගහනය වර්ධනයවීම නිසා ධීවර කර්මාන්තයටත්, කෘෂි කර්මාන්තයටත් මේක සෘජුවම බලපාන කාරණයක් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ කෘෂි කර්මාන්තයට කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිත කිරීමත් එක්ක තමයි, ජපන් ජබර සහ සැල්වීනියා ශීඝ්‍රයෙන් වර්ධනය වෙන්න පටන් ගත්තේ. අපි වාගේම ගොවි ජනපදයක් නියෝජනය කරන ගරු මන්ත්‍රීවරයකු හැටියට ඔබතුමා දන්නවා, ඉතිහාසයේ මෙවැනි තත්ත්වයන් අපට මෙතරම් දකින්න ලැබුණේ නැහැයි කියලා. නමුත් අවුරුදු 15ක්, 20ක් වැනි කාලයක් අතර තුරදී තමයි ජපන් ජබර සහ සැල්වීනියා බෝ වීම ඉතාමත් වේගවත්ව සිදු වුණේ. මේ සඳහා දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත්, ජලජීවී ආයතන ගණනාවකුත් එකතුවෙලා ජෛව විවිධත්ව ක්‍රම අනුගමනය කරලා තිබෙනවා. සැල්වීනියා විනාශ කිරීම සඳහා ජෛව විවිධත්ව ක්‍රම මඟින් කෘමීන් හඳුන්වා දුන්නා. ඒ තුළින් සියයට 75ක් පමණ සාර්ථක ප්‍රතිඵල ඇති කරගෙන තිබුණත්, ඒ තුළින් ජපන් ජබර කියන ශාකය විනාශ කිරීම අපහසුවෙලා තිබෙනවා.

අපේ එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා කිව්වා, මේ සම්බන්ධයෙන් ගොවීන් උනන්දු කරන්න ඕනෑය, ගොවීන් දැනුවත් කරන්න ඕනෑය කියලා. ගොවීන් මේ කාර්ය භාරය දන්නවා. ප්‍රායෝගිකව අපි ඒ අය දැනුවත් කරලාත් තිබෙනවා. හැබැයි, මුතුකුමාරණ මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට එක උදාහරණයක් කියන්නම්. ඔබතුමාත්, මමත් නියෝජනය කරන අනුරාධපුරය දිස්ත්‍රික්කයේ ගන්තිරියාගම වැව හැම කන්නයකම වාගේ ශුද්ධ කරනවා. ඒ වැව සම්පූර්ණයෙන්ම පිළිසකර කළා.

හැබැයි එක කන්නයක් ඉවර වෙනකොට නැවතත් වැවෙනවා. ඒවා ඉතාමත් ශීඝ්‍රයෙන් වර්ධනය වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් රුපියල් බිලියන ගණනක් වැය කරලා, වැවෙන් ඉවත් කරන ජපන් ජබරවලින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා වැඩසටහනක් කරගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම ඇමතිවරයා හැටියට මා පත්වුණු වහාම 2019.01.31වන දින මේ සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. මා පත්වුණේ ජනවාරි මාසයේදීයි. මාසයක් ඇතුළත කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවා, පින්ලන්ත රජයේ ආධාර යටතේ වසර 5ක්, වසර 7ක් ඇතුළත මේ කටයුතු කරන්න. එක පැත්තකින්, මේ වාගේම ඔවුන්ට ඇති වුණු තත්ත්වයන් නිසා ඒ අයට හොඳ අත් දැකීම් තිබෙනවා. ඒ ගොල්ලන්ගේ තාක්ෂණය උපයෝගී කරගෙන මේ ජපන් ජබර සහ සැල්විනියා කියන ශාක වර්ග විනාශ කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමටත් අවශ්‍ය කටයුතු දැන් අපි කරගෙන යනවා. රට තුළ මේ තත්ත්වය තිබුණොත් කෘෂි කර්මාන්තය ඉතාමත් පසු බෑසීමකට ලක්වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්තයක් හැටියට අවුරුද්දක් ඇතුළත මේ ශාකය ශීඝ්‍රයෙන් වර්ධනය වීම නිසා වැව්වල තිබෙන ධාරිතාව ඉතාමත්ම අඩුවෙනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වුණු අස්වැන්න ලබා ගන්නත් බැරි වෙනවා. මොකද, වර්ෂා කාලයට මේ වැව් පිටාර ගලනවා හැරෙන්න වැව්වල වතුර රඳවා ගැනීමේ හැකියාව ඉතාමත් අඩුවෙලා තිබෙනවා. අවුරුදු 15ක්, අවුරුදු 20ක් වැනි කාලයක් ඇතුළත දෛනිකව ඉතාමත් වේගයෙන් ජලාශයේ ජලය මතුපිට මේ ශාක වර්ධනය වෙනවා. මේ තත්ත්වය ඉතාමත් භයානක තත්ත්වයක්. මේ විධියට ගියොත් එතුමා පෙන්වා දුන්නා වාගේම කෘෂි කර්මාන්තය ඉතාමත් අභාග්‍ය සම්පන්න තත්ත්වයකට පත්වෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම විෂය භාර ඇමතිවරයා හැටියට මා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට පෙලඹිලාත් තිබෙනවාය කියන එකත් මතක් කරනවා.

ඒ විතරක් නොවෙයි. අම්පාර දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ විමලවීර දිසානායක මන්ත්‍රීතුමා සේනා දළඹුවා සම්බන්ධයෙන් කිව්වා. මා ඒ ගැනත් වචනයක් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සේනා දළඹුවා නිසා වගා හානි සිදු වූ අයට කෘෂි රක්ෂණ මණ්ඩලයෙන් වන්දි ලබාදීම සිදු වුණේ, ඒ ප්‍රදේශවල දිසාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ඒ වාගේම කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් සහ ගොවි සංවිධාන එකතුවෙලා දීපු නිර්දේශ අනුවයි.

අපට මුදල් ගෙවීමේ කිසිදු ගැටලුවක් නැහැ. මේ සඳහා රුපියල් මිලියන 250ක් අපට කැබිනට් මණ්ඩලයෙන් වෙන් කරලා දීලා තිබෙනවා. හැබැයි, ඒ ඒ දිස්ත්‍රික්කවල මා කලින් කියපු නිලධාරින් සහ සංවිධාන එකතුවෙලා තමයි සේනා දළඹුවාගෙන් වුණු හානිය නිර්ණය කරලා අපට ලැයිස්තු දුන්නේ. කවුරුන් හෝ කෙනෙකු කියනවා නම් අපට මේ වාගේ අසාධාරණයක් වෙලා තිබෙනවා කියලා, ඒ ගැන බලන්න අපි ඒ ප්‍රදේශයේ දිසාපතිවරයා, ප්‍රාදේශීය ලේකම් සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කෘ.ප.නි.ස. නිලධාරී මඩුල්ලෙන් සමන්විත කමිටුවක් ග්‍රාම නිලධාරි වසම් මට්ටමෙන් පත් කරලා තිබෙනවා. ඒ කමිටුවල නිර්දේශය අනුව තමයි අම්පාර දිස්ත්‍රික්කයට රුපියල් එක්කෝටි හැටලක්ෂයක් - රුපියල් මිලියන දාසයක්- පසුගිය 10වෙනි දා ගෙව්වේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තවත් කාගේ හෝ අභියාචනා තිබෙනවා නම්, දිසාපතිවරයා ඒක අනුමත කරලා එව්වොත් ඒ අවශ්‍ය මුදල් ප්‍රතිපාදන දෙන්න අපට පුළුවන්. හැබැයි, මේ තක්සේරු කිරීම කෘෂිකර්ම අමාත්‍යාංශය හැටියට කොළඹින්වත්, පෞද්ගලිකව මමවත් මැදිහත්වෙලා නොවෙයි සිද්ධ කරන්නේ. ඒ අදාළ දිස්ත්‍රික්කවල දිසාපතිවරු සහ මා කලින් සඳහන් කළ කමිටුව තමයි අපට ඒ නිර්දේශ ලබා දුන්නේ. මා දන්නා විධියට අම්පාර දිස්ත්‍රික්කයේ තමයි වැඩිම අස්වනු හානියකට ලක් වුණේ. ඉන් පසුව ගරු නියෝජ්‍ය කථානායකතුමා නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කයට හානි වුණා. ඉන් පසුව මා නියෝජනය කරන අනුරාධපුරය දිස්ත්‍රික්කයට හානි වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සේනා දළඹුවාගේ හානිය ගැන කියනවා නම්, කියන තරම්ම යකා කළු නැහැ. ලංකා ඉතිහාසයේ වැඩිම බඩ ඉරිඟු අස්වැන්න ලැබිලා තිබෙන්නේත් මේ අවුරුද්දේ. දැනට අපට වාර්තාවෙලා තිබෙන හැටියට මෙට්‍රික්ටොන් ලක්ෂ 3කට වැඩි ප්‍රමාණයක අස්වැන්නක් ලැබිලා තිබෙනවා. අපි සේනා දළඹුවාගේ හානිය සංඛ්‍යාලේඛන අනුව ගණනය කළේ, අනුමාන කළේ, සියයට 19කට වැඩිය අඩුයි කියලා. හැබැයි, දැන් වන කොට ලැබෙන තොරතුරු අනුව සියයට 10ක පමණ හානියක් තමයි සිද්ධවෙලා තිබෙන්නේ කියලා වාර්තා වෙනවා. විශේෂයෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, ගොවි සංවිධාන, කෘ.ප.නි.ස. මහත්වරු, අපේ දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඇතුළු සියලුදෙනාගේම අවධානය ඒ සම්බන්ධයෙන් යොමු කළා. ඒ සඳහා අපට සෑම මාධ්‍ය ආයතනයක්ම උදවු කළා. ඒ වාගේම, ප්‍රාදේශීය වශයෙන් ඒ කොට්ඨාසවල ඉන්න දිසාපතිවරුන්ගේ ඉඳලා සියලු ක්ෂේත්‍ර නිලධාරින් එකතුවෙලා කළ මෙහෙයුමේ ප්‍රතිඵලයක් ලෙස අපට මේ සේනා දළඹුවා ඉක්මනටම පාලනය කර ගැනීමේ හැකියාවක් ලැබිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඊළඟ කන්නයේ වගා කරද්දී මේ කන්නයේ ලබා ගත් අත්දැකීම් උපයෝගි කරගෙන ක්‍රමවත්, හොඳ වැඩ පිළිවෙළක් සහිතව වගාව ආරම්භ කළොත් මීටත් වඩා සාර්ථකත්වයක් ලබා ගන්නට පුළුවන් වේවි කියලා මා හිතනවා.

ගරු එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමනි, මම මේ කාරණා ටික ඔබතුමාට කිව්වේ ඔබතුමා අම්පාර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව වෙනුවෙන් නිතර කථා කරන, ලොකු හැඟීමකින් කටයුතු කරන කෙනෙක් නිසායි. මා ඔබතුමාට කියන්න කැමැතියි, යම්කිසි කෙනෙකුට අසාධාරණයක් සිද්ධවෙලා තිබෙනවා නම්, ඒ කොට්ඨාසයේ දිසාපතිවරයාට, ප්‍රාදේශීය ලේකම්වරයාට, ගොවිජන සේවා කොමසාරිස්වරයාට ඒ සිදු වූ හානිය සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කරන්න කියලා. අසාධාරණයක් වෙලා තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් සාධාරණය ඉෂ්ට කරන්න අපි කටයුතු කරනවාය කියන එකත් මේ අවස්ථාවේදී මතක් කර සිටිනවා.

විශේෂයෙන්ම ගරු එස්. සී. මුතුකුමාරණ මැතිතුමා කෘෂිකාර්මික ප්‍රදේශයක මන්ත්‍රීවරයකු හැටියටත්, ගොවි ජනතාවත් සමඟ උරෙන් උර ගැටිලා තමන්ගේ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න මේ ගරු සභාවට ඉදිරිපත් කරන මන්ත්‍රීවරයකු හැටියටත් මේ කාලෝචිත යෝජනාව ගෙන ඒම ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, විෂය භාර ඇමතිවරයා හැටියට කළ හැකි උපරිම කාර්ය භාරය ඉටු කරන්නට මා ඇප කැප වෙලා වැඩ කරන බව ප්‍රකාශ කරමින්, මේ කාලය ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.54ට, 2019 මාර්තු 09 වන දින සභා සම්මතිය අනුව, 2019 මාර්තු 14 වන බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 6.54 மணிக்குப் பாராளுமன்றம், அதனது 2019 மார்ச் 09 ஆந் திகதியத் தீர்மானத்திற்கிணங்க, 2019 மார்ச் 14, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 6.54 p.m. until 9.30 a.m. on Thursday, 14th March, 2019 pursuant to the Resolution of Parliament of 09th March, 2019.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා කොළඹ 5 කිරුළපන මාවතේ**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත කළ හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை கொழும்பு 5, கிருலப்பனை மாவத்தையிலுள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
Kirulapone Avenue, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.